2022 ජූලි 25
2022 யூலை 25
25th July 2022

NAOSL

# 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාව

## 2018 இன் 19 ஆம் இலக்க தேசிய கணக்காய்வு அதிகாரச்சட்டத்தின் 14 ஆவது பிரிவின் பிரகாரம் பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கப்படுகின்ற கணக்காய்வாளர் தலைமை அதிபதியின் மூன்றாண்டு அறிக்கை

## Triennial Report of the Auditor General presented in parliament in terms of Section 14 of the National Audit Act, No. 19 of 2018

එකොළොස් වන කාණ්ඩය - 01
பதினோராவது தொகுதி - 01
Eleventh Volume - 01

අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ
அமைச்சுக்கள் மற்றும் இராஜாங்க அமைச்சுக்கள்
Ministries & State Ministries

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



# 2018, 2019 සහ 2020 වර්ෂයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා වූ

# විගණකාධිපති ත්‍රෛවාර්ෂික තත්ත්ව වාර්තා

## පටුන


| අනු අංකය | ශීර්ෂය | අමාත්‍යාංශයේ නම | පිටු අංකය |
|---|---|---|---|
| විධායක සාරාංශය | | | 05-06 |
| 1. | 101 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 07-20 |
| 2. | 103 | ආරක්ෂක අමාත්‍යාංශය | 21-27 |
| 3. | 105 | ජනමාධ්‍ය අමාත්‍යාංශය | 28-31 |
| 4. | 110 | අධිකරණ අමාත්‍යාංශය | 32-38 |
| 5. | 111 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 39-115 |
| 6. | 112 | විදේශ අමාත්‍යාංශය | 116-121 |
| 7. | 114 | ප්‍රවාහන අමාත්‍යාංශය | 122-128 |
| 8. | 115 | බලශක්ති අමාත්‍යාංශය | 129-139 |
| 9. | 116 | වෙළෙඳ අමාත්‍යාංශය | 140-141 |
| 10. | 117 | මහාමාර්ග අමාත්‍යාංශය | 142-160 |
| 11. | 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 161-182 |
| 12. | 119 | විදුලිබල අමාත්‍යාංශය | 183-186 |
| 13. | 122 | ඉඩම් අමාත්‍යාංශය | 187-195 |
| 14. | 123 | නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය | 196-197 |
| 15. | 126 | අධ්‍යාපන අමාත්‍යාංශය | 198-209 |
| 16. | 130 | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 210-216 |
| 17. | 135 | වැවිලි අමාත්‍යාංශය | 217-220 |
| 18. | 149 | කර්මාන්ත අමාත්‍යාංශය | 221-232 |
| 19. | 151 | ධීවර අමාත්‍යාංශය | 233-237 |
| 20. | 159 | සංචාරක අමාත්‍යාංශය | 238-240 |
| 21. | 160 | පරිසර අමාත්‍යාංශය | 241-248 |
| 22. | 161 | වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය | 249-251 |
| 23. | 166 | ජල සම්පාදන අමාත්‍යාංශය | 252-259 |
| 24. | 176 | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය | 260-267 |
| 25. | 192 | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | 268-269 |
| 26. | 193 | කම්කරු අමාත්‍යාංශය | 270-279 |
| 27. | 194 | තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය | 280-291 |

| | | | |
|---|---|---|---|
| 28. | 198 | වාරිමාර්ග අමාත්‍යාංශය | 292-307 |
| 29. | 121 | ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | 308-311 |
| 30. | 401 | ජාතික උරුම, ප්‍රාසාංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | 312 |
| 31. | 402 | ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන | 313 |
| 32. | 403 | කාන්තා හා ළමා සංවර්ධන පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන , පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | 314-316 |
| 33. | 404 | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 317-319 |
| 34. | 405 | විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන , බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය | 320-322 |
| 35. | 406 | සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 323 |
| 36. | 408 | වේවැල් , පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | 324 |
| 37. | 409 | අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය | 325-330 |
| 38. | 410 | සමාගම් වතු ප්‍රතිසංස්කරණ , තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණ හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 331 |
| 39. | 411 | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | 332-342 |
| 40. | 412 | විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය | 343 |
| 41. | 414 | සමෘද්ධි, ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 344-352 |
| 42. | 415 | ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 353-361 |
| 43. | 416 | දේශීය වෙදකම් ප්‍රවර්ධන ,ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය | 362-366 |

| | | | |
|---|---|---|---|
| 44. | 417 | වතු නිවාස යටිතල හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය | 367-379 |
| 45. | 418 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශය | 380-383 |
| 46. | 419 | කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | 384 |
| 47. | 420 | පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | 385-398 |
| 48. | 421 | නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය | 399-411 |
| 49. | 422 | දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය | 412 |
| 50. | 423 | ඖෂධ නිෂ්පාදන, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය | 413 |
| 51. | 424 | වනජීවී රැකවරණය,අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැළෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 414-415 |
| 52. | 425 | වී හා ධාන්‍ය කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය | 416 |
| 53. | 426 | පොහොර නිෂ්පාදන සැපයුම් රසායන පොහොර හා කෘමිනාශක භාවිතා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය | 417 |
| 54. | 427 | පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | 418-425 |
| 55. | 428. | මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 426-427 |
| 56. | 429 | ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 428-431 |
| 57. | 430 | ඉඩම් කළමනාකරණ කටයුතු , රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපල සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 432-433 |
| 58. | 431 | පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය | 434-435 |
| 59. | 432 | උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 436-437 |

| | | | |
|---|---|---|---|
| 60. | 433 | ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 438-445 |
| 61. | 434 | ගුදම් පහසුකම්, බහාලුම් අංගන,වරාය සැපයුම් පහසුකම් සහ බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 446-448 |
| 62. | 435 | ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය | 449-451 |
| 63. | 436 | වාහන නියාමනය, බස්රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | 452 |
| 64. | 437 | ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | 453-455 |
| 65. | 438 | සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය | 456 |
| 66. | 439 | බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය | 457 |
| 67. | 440 | මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | 458-464 |

**විධායක සාරාංශය**

<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ සම්බන්ධයෙන් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව 2018-2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල ත්‍රෛවාර්ෂික විගණකාධිපති තත්ත්ව වාර්තාව</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ සම්බන්ධයෙන් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වෙනි වගන්තිය ප්‍රකාරව 2018 වර්ෂය සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් මෙම ත්‍රෛවාර්ෂික විගණකාධිපති තත්ත්ව වාර්තාව නිකුත් කෙරේ. මෙම කාලපරිච්ඡේදය තුළ රජයේ අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ වෙත නිකුත් කරන ලදුව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද විගණන නිරීක්ෂණ වල සාරාංශයක් මෙම වාර්තාවේ දැක්වේ. එම නිරීක්ෂණ සම්බන්ධයෙන් විගණකාධිපති නිර්දේශ , එක් එක් විගණිත ආයතනය විසින් නිරීක්ෂණවලින් පෙන්වා දී ඇති අඩුපාඩු, වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ග හා එම නිරීක්ෂණ වල වර්තමාන තත්ත්වයද සාරාංශ ගත කර මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

2020 වර්ෂය සඳහා අනුමත ඇස්තමේන්තු අනුව රජයේ අමාත්‍යාංශ 28 ක් සහ රාජ්‍ය අමාත්‍යාංශ 40 ක් වශයෙන් පැවති මුළු අමාත්‍යාංශ සංඛ්‍යාව 68 ක් විය. 2018 වර්ෂයේ දී අමාත්‍යාංශයක්ව පැවති නීතිය හා සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය 2019 සහ 2020 වර්ෂවල නොපැවතුණි. එසේ මුදල් අමාත්‍යාංශය හා මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයට අදාල ත්‍රෛවාර්ෂික තත්ව විගණකාධිපති වාර්තාව මෙම වාර්තාව තුළ අඩංගු නොවන අතර එය වෙනමම පාර්ලිමේන්තුවේ සභාගත කෙරේ. රාජ්‍ය අමාත්‍යාංශ 40 න් 03 ක් 2018 වර්ෂයේ සිට පැවතුනද ඉතිරි රාජ්‍ය අමාත්‍යාංශ 37 ම ආරම්භ කර ඇත්තේ 2020 වර්ෂයේ දීය. මෙම රාජ්‍ය අමාත්‍යාංශ බොහෝමයක් 2020 වර්ෂයේ අගභාගයේ හඳුන්වාදීම හේතුවෙන් ප්‍රමාණවත් විගණන නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට නොහැකි විය. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා 2020 වර්ෂයේ වෙන්කළ ප්‍රතිපාදන සහ ඒවායේ උපයෝජනය පිළිබඳ තොරතුරු ද මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇත.

රජයේ අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ නිරන්තරයෙන් වෙනස්වීමට ලක්වන විගණන අස්ථිත්වයන් වේ. ඒවායේ විෂය පථය විටින් විට වෙනස්වීමත්, අමාත්‍යාංශ ඒකාබද්ධ කිරීමත් සහ නැවත ඒවා වෙන්කිරීමෙන් පැවතීමත් වැනි කරුණු හේතුවෙන් ජාතික විගණන පනතේ සහ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව විගණන අස්ථිත්වය නිශ්චිතවම හඳුනාගැනීමට අපහසු

වූ අවස්ථා බොහෝමයක් පැවතුණි. ඒසේම එවැනි අමාත්‍යාංශවල ගණන්දීමේ නිලධාරීන් සහ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හඳුනාගැනීමට දුෂ්කර වූ අවස්ථා ද විය.

තවද අමාත්‍යාංශ නිරන්තරයෙන් වෙනස්වීම්වල ලක්වන විගණන අස්ථිත්වයන් වන හෙයින් ඉහත කාලපරිච්ඡේදය තුළ සියළුම අමාත්‍යාංශ සඳහා වෙන්කර තිබූ ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනත්, ශුද්ධ ප්‍රත්පාදනත්, ඒවායේ තත්‍ය උපයෝජනත් හා , ඉතිරිකිරීම් යනාදිය පිළිබඳව සතුටුදායක ලෙස ඇඟයීමක් කළ නොහැකි විය. ඒසේම එම ඉතිරිකිරීම් තුළින් ජාතික අයවැය කෙරෙහි ඇතිවන අහිතකර බලපෑම පිළිබඳවද විග්‍රහයක් කළ නොහැකි විය.

## 01. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

**ශීර්ෂය - 101**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය

2019 - තත්ත්වාගණනය නොකළ මතය

2020 - තත්ත්වාගණනය නොකළ මතය

| විගණන නිරීක්ෂණය | | විගණකාධිපති නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධ වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | ස්වාමින් වහන්සේලා වෙනුවෙන් සෞඛ්‍ය ආරක්ෂණ වැඩ පිළිවෙලක් ලෙස 'බුදුපුත් සුරක්ෂා' නමින් සෞඛ්‍ය ආධාර වැඩසටහනක් ආරම්භ කර තිබූ අතර ඒ යටතේ භික්ෂූන් වහන්සේලා 8,515 ක් ලියාපදිංචි කරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පළාත් 9 ආවරණය වන පරිදි මෙම වැඩ සටහන සම්බන්ධ උත්සව පැවැත්වීම සඳහා රු.මිලියන 22.3 ක් වැයකර තිබුණද 2020 දෙසැම්බර් විගණන දින වනවිටත් ආධාර ලබාදීම සඳහා නිර්දේශ වූ ස්වාමින් වහන්සේලා 30 නමකගෙන් 5 නමක් සඳහා පමණක් රු.376,108 ක් ගෙවීම් කර තිබුණි. | අරමුදල් නිසි පරිදි කළමණාකරනය කර ගෙවීම් කටයුතු කඩිනමින් සිදු කළ යුතු වීම. | 2020 ඔක්තෝබර් 01 දින සිට නිවැරදි යාන්ත්‍රනයක් ඔස්සේ මෙම වැඩසටහනේ ගෙවීම් කටයුතු ක්‍රියාත්මක වන බව සහ මූල්‍යාධාර ගෙවිම කටයුතු නිවැරදිව සිදු කරමින් පවතින බව. | 2020 වසර අවසන් වන විට ස්වාමීන් වහන්සේලා 8634 ක් ලියාපදිංචි වී ඇත. 2020 වර්ෂයේ අවසානය වන විට ගෙවීම් කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව 2021 වර්ෂය අවසාන වන විට හිමිකම් ඉල්ලීම් 111 ක් සඳහා රු.4,012,562 ක මුදලක් ගෙවා ඇත. |
| 02. | රු.මිලියන 312.49 ක් වැය කර ඉදිකර තිබූ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පවත්වා ගෙන යනු ලබන ගොඩනැඟිල්ලේ වර්ග | නිෂ්කාර්යව පවත්නා වත්කම් උපරිම ආකාරයෙන් | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිහිටි ගොඩනැඟිල්ල වෙතට අමාත්‍යාංශය හා | ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ හා අභ්‍යන්තර වෙන් කිරීම් සිදු කිරීමට දැනට අවශ්‍ය කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | අඩි 33547 ක විශාල ඉඩකඩ ප්‍රමාණයක් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණද අමාත්‍යාංශය යටතේ පවතින ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව හා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිළිවෙලින් රු.4,200,000 ක හා රු.6,816,000 ක වාර්ෂික කුලී පදනම මත පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වා ගෙන යමින් පැවතුණි. | භාවිතයට ගත යුතු බව. | අමාත්‍යාංශය යටතේ පිහිටි දෙපාර්තමේන්තු රැගෙන යාමට සැලසුම් කර ඇති බව, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ප්‍රතිපාදන අනුමත කර ගෙන ඇති බව සහ ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ හා අභ්‍යන්තර වෙන් කිරීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | සිදු කරමින් පවතින බව. එම කටයුතු නිම වූ පසු අමාත්‍යාංශය හා අමාත්‍යාංශයේ යටතේ පිහිටි දෙපාර්තමේන්තු එම ගොඩනැගිල්ලට රැගෙන යන බව. |
| 03. | පිළියන්දල ප්‍රදේශයෙහි පිහිටි අමාත්‍යාංශයට භුක්තිය හිමි ඉඩමක පෞද්ගලික ආයතනයක අරමුදල් යොදවා ශාක්‍ය ජනපදය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර 2017 මාර්තු 30 දින දෙපාර්ශවය විසින් අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | | |
| | (අ) අදාල ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් එම ඉඩම සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට 2020 නොවැම්බර් 03 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 3 දින දක්වා අමාත්‍යාංශය විසින් ආරක්ෂක හා වෙනත් වියදම් ලෙස | ව්‍යාපෘති ආරම්භ කිරීමේදී හා පවත්වා ගෙන යෑමේදී මනා සැලැස්මක් සහිතව කටයුතු කල යුතු වීම. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව ඉඩම පැවරීමේ කටයුතු රජයට අවාසිදායක නොවන ලෙස සිදුකිරීමට කටයුතු කරනු ලබන බව. | 2017 වර්ෂයේ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමකට අනුව මෙම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කල ද ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් අදාල අවබෝධතා ගිවිසුම අහෝසි කර ඇති අතර අමාත්‍ය මණ්ඩල |

| | | | | |
|---|---|---|---|---|
| | රු.11,784,405 ක් ද විගණනයට ලබා ගත හැකි තොරතුරු අනුව පෞද්ගලික ආයතනය විසින් රු.51,815,514 ක් ද දරා තිබුණු බැවින් එම වියදම් නිෂ්කාර්ය වියදම් බව නිරීක්ෂණය විය. | | | තීරණයක් අනුව එම ඉඩමෙන් අක්කර 05ක් මෙම අමාත්‍යාංශය යටතේ තබා ගනිමින් ඉතිරිය ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට පවරා දීමට අනුමැතිය ලැබී ඇති බව සහ ඒ අනුව අක්කර 05 හි අයිතිය මෙම අමාත්‍යාංශයට ලැබී ඇති බව. |
| (ආ) | දෙපාර්ශවය අතර එළඹි අවබෝධතා ගිවිසුමෙහි 10වන වගන්තිය ප්‍රකාරව අරමුදල් රැස් කිරීම හා වියදම් දැරිම සඳහා රාජ්‍ය බැංකුවක ගිණුමක් විවෘත කර එම ගිණුමේ අත්සන්කරුවකු ලෙස බුද්ධශාසන අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයෙකු නම් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. තවද, භාර ඔප්පුවෙහි 7A(iii) ප්‍රකාරව පෞද්ගලික ආයතනය විසින් රැස් කරනු ලබන එම අරමුදල් උපයෝජනය කිරීම සම්බන්ධයෙන් ගිණුම් පවත්වා ගත යුතු බවත්, 7A(v) ප්‍රකාරව මාසික ව්‍යාපෘති තත්ත්ව වාර්තා සහ විගණනය කරන ලද මූල්‍ය | ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදි හා පවත්වාගෙන යෑමේදි මනා සැලැස්මක් සහිතව කටයුතු කළ යුතු වීම සහ ගිවිසුම් ගත කරුණු අනුව සිදු වන්නේද යන්න පිළිබඳ නිරන්තර පසුවිපරම් කටයුතු සිදු කළ යුතු වීම. | 2017 වර්ෂයේ අවබෝධතා ගිවිසුම හා භාර ඔප්පුව අත්සන් කර තිබුණද එම ගිවිසුමට හා ඔප්පුවට අනුව සිදු කළ යුතු කටයුතු විධිමත්ව සිදු වී නොමැති බව. | පැවති ගිවිසුම අවලංගුව ඇති බව සහ ඉදිරියේදී මෙවැනි ඌනතා ඇති නොවීමට කටයුතු කරන බව. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු බවත් දක්වා තිබුණද ඒ අනුව ද කටයුතු කර නොතිබුණි. එමෙන්ම පෞද්ගලික ආයතන විසින් රැස්කළ අරමුදල් සම්බන්ධයෙන් හා ඒවා උපයෝජනය කිරීම සම්බන්ධයෙන් ද අමාත්‍යාංශය විසින් විධිමත් පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | | | |
| 04. | සංස්කෘතික අංශයේ විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 05 කට වැඩි කාලයක සිට පවතින රු.127,522 ක ණය ශේෂය, මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.101,300 ක් වූ ණය ශේෂය හා බුද්ධශාසන අංශයේ විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ වර්ෂ 02 ට වැඩි කාලයක සිට පැවත එන රු.167,055 ක ණය ශේෂය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.5, 4.2.5, 4.5 හා 4.6 උප වගන්ති ප්‍රකාරව, අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අදාළ ණය ශේෂ නිරවුල්කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව. | සංස්කෘතික අංශයේ විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනාගෙන් එක් නිලධාරියෙකුගේ ණය ශේෂය නිරවුල් කර ඇති අතර අනෙක් නිලධාරියාගේ ණය ශේෂය විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. බුද්ධශාසන අංශයේ විශ්‍රාම ගිය නිලධාරියාගේ ණය ශේෂය විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. |
| 05. | සංස්කෘතික අංශයේ වැඩ තහනම් කර ඇති නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.623,090 ක් වූ ණය ශේෂය හා | -එම- | -එම- | සංස්කෘතික අංශයේ වැඩ තහනම් කර ඇති නිලධාරීන් 8 දෙනාගෙන් |

| | | | | |
|---|---|---|---|---|
| | බුද්ධශාසන අංශයේ වැඩ තහනමකට ලක් වූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු වර්ෂ 04 ට වැඩි කාලයක සිට පැවත එන රු.32,155 ක ණය ශේෂ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 4.2.3 උප වගන්තිය සහ 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PED/RED/2015/08පොදු (i) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 4.3(ඉ) ඡේදය ප්‍රකාරව, අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | දෙදෙනෙකු සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් හතරදෙනෙකුගේ ණය ශේෂ ඇපකරුවන්ගෙන් අයකර ගැනිමටත් කටයුතු කරමින් පවතින බව, එක් නිලධාරියෙකුගේ ණය, වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කර ඇති බව සහ වැඩ තහනම් කළ එක් නිලධාරීයෙකු සම්බන්ධයෙන් තොරතුරු සෙවීමට කටයුතු කරමින් පවතින බව. බුද්ධශාසන අංශයේ වැඩ තහනමට ලක්වූ නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීම සඳහා නීති ප්‍රකාරව කටයුතු කරන මෙන් දන්වා නීති අංශයට යොමුකර ඇති බව. |
| 06. | 2020 වර්ෂයට අදාලව සංස්කෘතික අංශයේ පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් රාජ්‍ය සේවා නිර්මාණ තරඟාවලිය ආශ්‍රිත ක්‍රියාකාරකම් හා යාපනය | අදාල ක්‍රියාකාරකම්, නියමිත කාලසීමාව තුළ සැලසුම් කරන | රාජ්‍ය සේවා නිර්මාණ තරඟාවලිය හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් - 2020 වැඩසටහන සඳහා මූලික කාර්යයන් ආරම්භ කර | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පැවැත්වීමට නොහැකි වූ 2020 තරගාවලිය 2021 දී |

| | | | | |
|---|---|---|---|---|
| | සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම යන ව්‍යාපෘති සඳහා පිළිවෙලින් රු.3,500,000 ක් හා රු.28,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණද අදාල කාර්යයන් වර්ෂය තුළදී ඉටුකර නොතිබුණි. රාජ්‍ය සේවා නිර්මාණ තරඟාවලිය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය සියයට 37 ක් ලෙස කාර්යසාධන වාර්තාවේ දක්වා තිබූ අතර යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වෙන්කර තිබූ රු.28,000,000 න් රු.27,960,000 ක් ග්‍රාමීය නිවාස ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය වෙත ලබාදීම නිසා මූල්‍ය ප්‍රගතිය සියයට 100 ක් හා භෞතික ප්‍රගතිය සියයට 0 ක් වී තිබුණි. | ලද ආකාරයට සම්පූර්ණ කළ යුතු බව. | තිබූ නමුත් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වර්ෂය දක්වා කල් දැමීමට සිදු වූ බව, 2021 වර්ෂයේ නිර්මාණ තරඟාවලියේ සහ යාපනය සංස්කෘතික මධ්‍යස්ථායේ ඉදිකිරීම් කටයුතු අවසන් කරමින් පවතින බව. | පවත්වා ඇති බව, 2021 වර්ෂයේ තරඟාවලියට අදාල තරඟ පවත්වා ජයග්‍රාහකයින් තෝරා අවසන් කර ඇති බව සහ 2021 සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් පවතින බව. යාපනය සංස්කෘතික ඉදිකිරීම් කටයුතු සියල්ල අවසන් කර ඉන්දීය රජය විසින් ශ්‍රී ලංකා රජය වෙත භාරදීමටත් ඉන්පසුව යාපනය මහනගර සභාව වෙත භාරදීමටත් නියමිත ව තිබේ. ඒ සඳහා වන අවබෝධතා ගිවිසුම ඉදිරියේ දී අත්සන් කිරීමට නියමිත බව. |
| 07. | රු.මි.145.7 ක මුළු ඇස්තමේන්තුවක් මත 2016 සැප්තැම්බර් 16 දින වැඩ ආරම්භ කර 2020 සැප්තැම්බර් 30 දින වැඩ නිම කළ යුතුව තිබූ බුද්ධශාසන අංශය මඟින් ක්‍රියාත්මක ශ්‍රී දළදා මාළිගාවට අනුයුක්ත පල්ලෙකැලේ ප්‍රාසාංගික පුහුණු ආයතනයේ ඉදිකිරීම් කටයුතු | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කළ යුතු බව. | ව්‍යාපෘතිය නිම කිරීමට නිශ්චිත දිනයක් සහ අපේක්ෂිත වැඩ සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස කොන්ත්‍රාත්කරුට දන්වා ඇති බව සහ ව්‍යාපෘතියේ අවබෝධතා ගිවිසුම අනුව ගිවිසුම් ගත වීම | මෙම ව්‍යාපෘතියට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට වියදම රු.මි.5.3 ක් වන අතර ඉන්දියානු රජය රු.මි.34.33 ක් වැය කොට ඇත. එදිනට භෞතික ප්‍රගතිය - 83% ක් බව. |

| | | | | |
|---|---|---|---|---|
| | විගණන දිනය වූ 2021 අගෝස්තු 11 දින වන විටත් අවසන් කර නොතිබුණි. වැඩ නිම කළ යුතු කාලය ඉක්මවා අවුරුද්දකට ආසන්න කාලයක් ගත වුවද එහි මූල්‍ය ප්‍රගතිය සියයට 41 ක් සහ භෞතික ප්‍රගතිය සියයට 56 ක් විය. | | ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය මඟින් සිදු කර ඇති බැවින් කොන්ත්‍රාත්කරුට සෘජු මැදිහත් වීමක් සිදු කිරීමට මෙම අමාත්‍යාංශයට නොහැකි බව. | එසේම 2021 ඔක්තෝබර් 31 දක්වා දින දීර්ඝ කිරීමක් සඳහා වරලත් වාස්තු විද්‍යාඥ විසින් එකඟතාවය පළ කර ඇති බව. |
| 08. | සංස්කෘතික අංශය විසින් ක්‍රියාත්මක කර තිබූ දේශීය දැනුම හා සංස්කෘතික අගයන් පිළිබඳ පර්යේෂණ ක්‍රියාකාරකම් ව්‍යාපෘතිය මඟින් පුත්තලම දිස්ත්‍රික්කයේ ජනකලා සම්බන්ධ පර්යේෂණාත්මක ග්‍රන්ථයක් මුද්‍රණය කිරීමට සැලසුම් කර අදාල ග්‍රන්ථ පිටපත් 1000 ක් මුද්‍රණය කර තිබුණ ද 2021 මැයි 31 දින වන විටත් ඉන් පිටපත් 17 ක් පමණක් අමාත්‍යාංශයෙහි විවිධ අංශ වෙත ලබාදී ඉතිරි පිටපත් අපේක්ෂිත කාර්ය සඳහා යොදා නොගෙන ගබඩාවෙහි රඳවාගෙන තිබුණි. | -එම- | පුත්තලම දිස්ත්‍රික්කයේ ජනප්‍රවාද සම්බන්ධ පර්යේෂණ ග්‍රන්ථයක් සහ එම දත්ත ඔස්සේ ගවේශණය හා පර්යේෂණය පිළිබඳ සමාජ සංස්කෘතික උරුමය පිළිබඳ ග්‍රන්ථයක් එළි දැක්වීමට කටයුතු කර ඇති බව, ඉන් පළමු ග්‍රන්ථය පමණක් පිටපත් 1000 ක් මුද්‍රණය කර අමාත්‍යාංශ ගබඩාව වෙත ලබා ගෙන ඇති බව සහ පුත්තලම දිස්ත්‍රික්කයේ ජනප්‍රවාද සම්බන්ධ පර්යේෂණ ග්‍රන්ථය, ඉදිරියේදී ජනගත කිරීමට කටයුතු කරමින් පවතින බව. | පුත්තලම දිස්ත්‍රික්කයේ ජනප්‍රවාද සම්බන්ධ ග්‍රන්ථ 02 ක් එළි දැක්වීමට කටයුතු කර තිබූ අතර ඉන් පළමු ග්‍රන්ථය පමණක් පිටපත් 1000ක් මුද්‍රණය කර අමාත්‍යාංශ ගබඩාව ලබා දී ඇති බවත් ඉතිරි ග්‍රන්ථය පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ජනගත කිරීමට නොහැකි වී ඇති බවත් 2022 මාර්තු මස අවසාන සතියේ දී එම වැඩසටහන පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවත් වාර්තා කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 09. | රු.21,383,325 ක පිරිවැයක් ඇස්තමේන්තු කර තිබූ උහණ සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමේ කාර්යය සඳහා 2015 වර්ෂයේ සිට 2018 දක්වා වරින්වර රු.21,850,000 ක ප්‍රතිපාදන අම්පාර දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී තිබුණි. ඉදිකිරීම් ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කිරීමක්ද අමාත්‍යාංශය විසින් සිදු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නිම කර නොතිබුණි. | -එම- | දිස්ත්‍රික් ලේකම් විසින් ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් කිරීමෙන් පසු අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන නිදහස් කර ඇති බව, එහි ප්‍රගතිය මුදල් අමාත්‍යාංශයේ මාසික ප්‍රගති වාර්තාවෙන්ද අමාත්‍යාංශය මඟින්ද අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නිරීක්ෂණ මගින් ද අධීක්ෂණය කර ඇති බව. මේ වන විට දෙසතියකට වරක් ඉදිකිරීම් ව්‍යාපෘති සම්බන්ධ ප්‍රගති සමාලෝචනය අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන බව. | දිස්ත්‍රික්කය තුළ පැවති අක්මුදල් හිඟය හේතුවෙන් ව්‍යාපෘතියට අදාළ ව 2021 දෙසැම්බර් මස අගභාගයේ ඉදිරිපත් වූ ගෙවීම් කිරීමට නොහැකි වූ බවත්, ඒවා CIGAS වැඩසටහනෙහි අතැති බිල්පත් යටතේ සඳහන් කර මහා භාණ්ඩාගාරය වෙත වාර්තා කළ බවත් අම්පාර දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇත. ඒ අනුව, එම අතැති බිල්පත් ගෙවීම සඳහා රු. 2,381,536.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් අම්පාර දිස්ත්‍රික් ලේකම් වෙත 2022 පෙබරවාරි 15 වන දින නිදහස් කර ඇති බව. |
| 10. | බුද්ධශාසන අංශයට අදාලව 2005 වර්ෂයේ ආරම්භ කර තිබූ විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාවේ ඉදිකිරීම් කටයුතු රු.මිලියන 1,204.33 ක පිරිවැයක් දරා අදියර 05 ක් දක්වා පමණක් 2019 වර්ෂයේදී අවසන් | අදාල ඉදිකිරීම්, සැලසුම් කළ පරිදි සම්පූර්ණ කර භාවිතයට ගත යුතු බව. | මෙම ව්‍යාපෘතියේ v වන අදියරේ ඉදිකිරීම් 2019 වර්ෂයේදී නිම කර ඇති අතර vi වන අදියරේ ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලෙස මුදල් අමාත්‍යාංශයේ ලේකම් | 2021 වර්ෂයට අදාළව අමාත්‍ය මණ්ඩල තීරණ වලට අනුව V වන අදියරෙහි ඉදිකිරීම් වලට අදාල විචලනය සඳහා රු.මි.48.076 ක |

| | | | | |
|---|---|---|---|---|
| | කර තිබුණු අතර 06 වන අදියරේ ඉදිකිරීම් කටයුතු මෙතෙක් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | | වෙතින් ඉල්ලීමක් කර ඇති බවත්, ඇස්තමේන්තුවක් සකස් කර ඉදිරිපත් කරන ලෙස මුදල් අමාත්‍යාංශය විසින් දන්වා ඇති බවත්, ඒ අනුව ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම කාර්යාංශය මගින් ඇස්තමේන්තු සකස් කිරිම මේ වන විට සිදු කරමින් පවතින බවත් දන්වා ඇත. | ප්‍රතිපාදන ලැබී ඇති බව, එමඟින් මේ වන විට රු.මි.15.67 ක් සහ විචලන නියෝග 2 සඳහා රු.මි.23.28 ක් ගෙවා ඇති බව, ව්‍යාපෘතිය අමාත්‍යාංශය වෙත භාර ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව. සම්මන්ත්‍රණ ශාලා ගොඩනැගිල්ලේ 3,4,5 මහල් වලට අදාළ භාණ්ඩ ලේඛණය පරීක්ෂා කර විද්‍යාලංකාර භාරය වෙත භාර දී ඇති බව සහ එම පරීක්ෂා වලදී හඳුනා ගන්නා ලද අඩුපාඩු සකස් කිරීමට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) වෙත දන්වා යවා ඇති බව. |
| 11. | ඇප තැබිය යුතු යැයි හඳුනාගෙන තිබූ සංස්කෘතික අංශයට අදාල නිලධාරීන් 25 දෙනෙකුගෙන් නිලධාරීන් 22 ක් සහ බුද්ධශාසන අංශයේ නිලධාරීන් 35 දෙනෙකු ඇප තබා නොතිබුණි. | මු.රෙ 880 යටතේ ඇප තැබිය යුතු රජයේ නිලධාරීන්, මුදල් රෙගුලාසි විධිවිධාන | ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් සම්බන්ධයෙන් අනොන්‍ය ඇපකාර සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අදාල | සංස්කෘතික අංශයේ මේ වන විටත් ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් වෙනුවෙන් අනොන්‍ය ඇපකාර සංගමයේ |

| | | | | |
|---|---|---|---|---|
| | | අනුගමනය කරමින් ඇප තැබීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතු බව. | ලේඛන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති බවත්, සාමාජිකත්වය ලද වහාම ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතින බවත්, ඇප තැන්පත් කළ යුතු මාණ්ඩලික නිලධාරීන් නොවන නිලධාරීන් සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ගිණුම් විවෘත කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇති බවත් වාර්තා කර ඇත. | සාමාජිකත්වය ලබා ගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු වෙමින් පවතින බව. බුද්ධශාසන අංශයේ ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තැබීම් සම්බන්ධව කටයුතු කරමින් පවතින බව. |
| 12. | මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැගිලි සහ ඉදිකිරීම් යටතේ තක්සේරු වටිනාකම රු.2,893,409,044 ක් ලෙස සඳහන් ගොඩනැගිලි, අමාත්‍යාංශයේ සංස්කෘතික අංශයට අයත් ලෙස දක්වා තිබුණද ඒවා ඉදිකර තිබූ ඉඩම්වල අයිතිය අමාත්‍යාංශයට පවරා ගෙන නොතිබුණි. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු බව. | මේ වන විට සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටි ඉඩම්වලින් ඉඩම් 70 ක අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගෙන ඇති බව සහ අනෙකුත් ඉඩම්වල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | අනෙකුත් ඉඩම්වල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. |
| 13. | අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය සතු වාහන 12 ක් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත මුදා හැර තිබුණද එම වාහනවල හිමිකම හා අයිතිය පවරාදීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | වෙනත් අමාත්‍යාංශ වෙත මුදා හැර ඇති වාහනවල අයිතිය හා හිමිකම පවරා දීමට කටයුතු කළ යුතු බව. | වාහන 12 න් 09 ක් තාවකාලිකව නිදහස් කර ඇති අතර වාහන 02 ක් මේ වන විට පවරා දීමට කටයුතු කර ඇති බව. | වාහන 09 ක් සේවා අවශ්‍යතාවය සලකා ජාතික උරුම අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත තවකාලිකව |

| | | | | |
|---|---|---|---|---|
| | | | | නිදහස් කර ඇති බවත් වාහන 02 ක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත පවරා දිමට කටයුතු කර ඇති බවත් වාර්තා කර ඇත. මේ වන තෙක් ඒවා නැවත ලබාගැනීමට හෝ පවරාදීමට කටයුතු කර නොතිබුණි. |
| 14. | අපහරණය කළ යුතු බවට හඳුනා ගෙන තිබූ සංස්කෘතික අංශය සතු රු.16,300,000 ක් පිරිවැය වූ වාහන 4 ක් සහ පිරිවැය සඳහන්ව නැති වාහන 11 ක් 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 13.2(ආ) ඡේදය ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කළ යුතු බවට හඳුනාගෙන තිබූ වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු බව. | භාවිතයට ගත හැකි වාහන වෙනත් රජයේ ආයතන වෙත පවරා දීම හා භාවිතය සඳහා යෙදවිය නොහැකි වාහන අපහරණය සඳහා කටයුතු කරන බව. | රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 2/2015 හි 6 ඡේදය අනුව කටයුතු කිරීමට පෙර, අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි මෙම අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර තිබූ වෙරළ සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය, ඖෂධ නිෂ්පාදන හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා නාවික හමුදාව යන ආයතන වෙත පිළිවෙලින් වාහන 3ක් ,1ක් හා 05 ක් බැගින් වාහන 09ක හිමිකම පවරා දීමට කටයුතු කර ඇති බව. ඉතිරි වාහන 06, අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පුහුණු |

| | | | | |
|---|---|---|---|---|
| | | | | කටයුතු සඳහා වෘත්තීය පුහුණු අධිකාරිය වෙත මුදාහැරීමට ලිපියක් මගින් දැන්වූවත් ඉන් වාහන 02 ක් පමණක් ලබාගැනීමට එම ආයතනය කැමැත්ත පළකර තිබූ බැවින් එම වාහන යුගලේ ලියාපදිංචිය අවලංගු කර දෙන ලෙස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට දන්වා ඇති බව. ඉතිරි ත්‍රිරෝද රථ 04 ධාවනයට යෙදවිය නොහැකි නිසා අපහරණය කිරීම සඳහා කටයුතු කරමින් සිටින බව. |
| 15. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින සංස්කෘතික කටයුතු අංශයේ අභ්‍යන්තර විගණක තනතුර පිරවීමට හා අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබූ අතර එම අංශය සඳහා අභ්‍යන්තර විගණනයක් ද සිදු කර නොතිබුණි. | ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අමාත්‍යාංශය සඳහා අනුමත ගණකාධිකාරී තනතුරු දෙක, පවතින රාජකාරී කටයුතු සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් තවත් ගණකාධිකාරී තනතුරක් අනුමත කර ඇති බවත්, ඒ සඳහා නිලධාරියෙක් අනුයුක්ත කළ පසු අභ්‍යන්තර විගණක තනතුර සඳහා | අමාත්‍යාංශ විෂය පථයන් වෙනස්වීමත් සමඟ එක් නිලධාරියෙකු පමණක් අදාළ අංශයට අනුයුක්තව සිටින අතර අභ්‍යන්තර විගණක තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබූ පසුව අභ්‍යන්තර විගණන අංශය වෙත |

| | |
|---|---|
| අනුයුක්ත කිරීමට අපේක්ෂා කරන බව. අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශය තුළ ස්ථාපිත ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ක්‍රියාත්මක අභ්‍යන්තර විගණන අංශය මගින් සංස්කෘතික කටයුතු අංශයේ අභ්‍යන්තර විගණන කටයුතු අධීක්ෂණය කරනු ලබන බව. | නිලධාරීන් අනුයුක්ත කරන බව. දැනට සංස්කෘතික කටයුතු අංශයේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ තනතුරක පුරප්පාඩුවක් පවතින බැවින් අභ්‍යන්තර විගණක තනතුර සඳහා අනුයුක්ත කිරීමට සුදුසු නිලධාරියෙකු ලබා දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බව සහ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරිවරයෙකු යොදවා අභ්‍යන්තර විගණක තනතුරේ රාජකාරි කටයුතු ඉදිරියට කරගෙන යාමට කටයුතු කරමින් පවතින බව. |

## 16. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2018<br>රු. | 2019<br>රු. | 2020<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | | | | |
| පුනරාවර්තන වියදම් | 207,360,000 | 273,000,000 | 1,111,200,000 | 1,591,560,000 |
| මූලධන වියදම් | 696,610,000 | 1,465,500,000 | 605,400,000 | 2,767,510,000 |
| මුළු වියදම | 903,970,000 | 1,738,500,000 | 1,716,600,000 | 4,359,070,000 |
| ශුද්ධ ප්‍රතිපාදන | | | | |
| පුනරාවර්තන වියදම් | 245,194,736 | 299,932,500 | 1,095,861,000 | 1,640,988,236 |
| මූලධන වියදම් | 1,078,512,264 | 1,837,682,846 | 633,938,000 | 3,550,133,110 |
| මුළු වියදම | 1,323,707,000 | 2,137,615,346 | 1,729,799,000 | 5,191,121,346 |
| සත්‍ය වියදම් | | | | |
| පුනරාවර්තන වියදම් | 217,265,438 | 287,873,339 | 1,029,457,686 | 1,534,596,463 |
| මූලධන වියදම් | 867,786,547 | 887,053,912 | 78,292,863 | 2,333,133,322 |
| මුළු වියදම | 1,085,051,985 | 1,174,927,251 | 1,607,750,549 | 3,867,729,785 |
| වසර අග ඉතිරි වීම් | | | | |
| පුනරාවර්තන වියදම් | 27,929,298 | 12,059,161 | 66,403,314 | 106,391,773 |
| මූලධන වියදම් | 210,725,717 | 950,628,934 | 55,645,134 | 1,216,999,788 |
| මුළු වියදම | 238,655,015 | 962,688,095 | 122,048,451 | 1,323,391,561 |

## 02. ආරක්ෂක අමාත්‍යාංශය

**ශීර්ෂය - 103**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| 01. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2021 වර්ෂයේ සිට ඉදිරියට නිසි පරිදි ඉදිරිපත් කරන ලෙස අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇති බව. | 2021 වර්ෂය සිට ඉදිරියට නිසි පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. |
| 02. | ආදායම් ශීර්ෂ 103-2003-06-00 යටතේ ආරක්ෂක අමාත්‍යාංශය විසින් ගණන්දියයුතු එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් රාජකාරි වෙනුවෙන් අයවියයුතු ආදායම අයකර ගැනීමේ ප්‍රමාදයක් නිරීක්ෂණය වීය. | හිඟ ආදායම් නිසි පරිදි අයකරගැනීමට කටයුතු කිරීම හා ඒ සම්බන්ධ පසුවිපරම් | හිග ආදායම අයකර ගැනීම සඳහා එක්සත් ජාතින්ගේ නිත්‍ය නියෝජිත කාර්යාලය | ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අදාලව අයවිය යුතු එක්සත් ජනපද ඩොලර් 2,092,446 ක් හැර |

| | | | | |
|---|---|---|---|---|
| | | කටයුතු අඛණ්ඩව සිදු කල යුතුවේ. | දැනුවත් කර ආරක්ෂක අමාත්‍යාංශය මඟින් පසු විපරම් හා අධීක්ෂණ කටයුතු සිදු කරන බව. | සියලුම හිඟ මුදල් අය කරගෙන ඇත. |
| 03. | **01/2015** හා **2015** ජුනි **20** දිනැති රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය හා මුල්‍ය රෙගුලාසි **128(2)(එ)** හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව **1996** අංක **22** දරන තුවක්කු (සංශෝධන) පනත යටතේ අයකරනු ලබන තුවක්කු බලපත්‍ර ගාස්තු කාලීනව සංශෝධනය කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ගාස්තු සංශෝධනයට කටයුතු කල යුතුය. | 1996 අංක 22 දරණ ගිනි අවි පනතෙහි සංශෝධන සඳහා කෙටුම්පත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව. | වාර්තා කර නැත. |
| 04. | සමාලෝචිත කාලපරිච්ඡේදය තුල අමාත්‍යාංශය වෙත සලසා තිබුණු පුනරාවර්තන ප්‍රතිපාදනයන්ගෙන් සියයට 2.7 ක් හෙවත් රු.මිලියන 1,131.7 ක් ද ප්‍රාග්ධන ප්‍රතිපාදනයන්ගෙන් සියයට 17.7 ක් හෙවත් රු.මිලියන 4402.34 ක්ද ඉතිරිවීම් පැවතුණි. මේ අනුව සමාලෝචිත කාලය තුල සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් 8.3 ක් හෙවත් රු.මිලියන 5534 ක් ඉතිරි වී පැවතුණි. | අවශ්‍යතා නිසිලෙස හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කලයුතුය. | වැය විෂය භාර නිලධාරීන් දැනුවත් කර ඇති බව. . | ඉදිරියේදී මු.රෙ. 66 සහ 69 සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීමේදී ලඟා කරගත හැකි ඉලක්ක සළකා බළා නිවැරදි ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලෙසට දැනුවත් කරන ලද බව. |
| 05. | වැය විෂයයන් තුනක් සඳහා සලසා තිබුණු රු.6,476,000 ක ප්‍රතිපාදනය මෙන් සිව් ගුණයකට අධික ප්‍රතිපාදන හෙවත් රු. 26,025,465 ක් මු.රෙ. 66 යටතේ එම වැය විෂයයන්ට මාරු කරගෙන ඇතත් එයින් සියයට 48 ක් හෙවත් රු. 15,503,187 ක ප්‍රතිපාදන | අවශ්‍යතා නිසිලෙස හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කල යුතුය. | වැය විෂය භාර නිලධාරීන් දැනුවත් කර ඇති බව. . | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | ඉතිරිව පැවතුණි. මූලධන වැය විෂයන් 09 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන එකතුව රු.27,575,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරිවී පැවතුනි. රු. 10,504,800 ක ප්‍රතිපාදන සලසා තිබුණු මූලධන වැය විෂයයන් 03 ක් සඳහා මු.රෙ. 66 යටතේ රු.11,761,800 ක ප්‍රතිපාදන මාරු කර ගෙන ඇතත් රු. 13,719,362 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | | | |
| 06. | 2016 මැයි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව විශේෂ කාර්ය බලකායට අයත් සංග්‍රාමික බල ඇණියක් මාලි රාජ්‍ය තුල ස්ථාපිත කිරීම සඳහා නිලධාරීන් 320 කට පුහුණුව ලබාදී තිබුණු අතර 2017 – 2019 කාලය තුල රු.මිලියන 880.73 ක උපකරණ මිලදීගෙන තිබුණු නමුත් සමාලෝචිත කාලය තුල මාලි රාජයේ බල ඇණි ස්ථාපිත කර නොතිබුණි. තවද මිලදී ගත් උපකරණ නිෂ්ක්‍රීයව පැවතුණි. | එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකාය සම්බන්ධ වීමට ඇතිකරගත් මූලික එකඟතා පරිදි කටයුතුකර එම අරමුණු ඉටුකිරීමට කඩිනමින් කටයුතු කල යුතුය. | ප්‍රසම්පාදන කටයුතු සඳහා අදාල අනුමැතිය ලැබීමේ ප්‍රමාද, ප්‍රතිපාදන නොලැබීම හා ප්‍රසම්පාදන කටයුතුවල පැවැති ප්‍රමාදයන් බලපා ඇති බව. | වාර්තා කර නැත. |
| 07. | නාවික හමුදාව විසින් බාහිර පාර්ශවයන් වෙත සේවා සැපයීමෙන් උපයනු ලබන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැරකලයුතු ආකාරය හා වාර්තාකිරීම පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | 2016 ඔක්තොබර් මස 26 පැවැති විගණන හා කලමණාකරණ රැස්වීමේදී එලැබි තීරණයන්ට අනුව කටයුතු කරන බවට සහතික විය යුතුය. | මේ පිළිබඳව ශ්‍රී ලංකා නාවික හමුදාව දැනුවත් කර ඇති බව. | ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් උපයනු ලබන එවැනි ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කරන්නේද යන්න වාර්තා කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 08. | 2014 වර්ෂයේදී නිමකිරීමට අපේක්ෂා කර තිබුණු ආරක්ෂක හමුදා මුලස්ථාන සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතුවල සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. සමාලෝචිත කාලපරිච්ඡේදය අවසන් වනවිට මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාර්යයන්හි සමස්ථ ප්‍රගතිය සියයට 74ක්ව පැවතුණි. | සැලසුම්කල පරිදි කොන්ත්‍රාත් කාර්යයන් ක්‍රියාත්මක කල යුතුය. | ඉල්ලුම් කළ ප්‍රතිපාදනයන් ගෙන් කොටසක් පමණක් ලැබී ඇති බැවින් සේවා අවශ්‍යතාවයේ ප්‍රමුඛතාවය මත කොන්ත්‍රාත් ප්‍රදානය කරන බව. | ඉදිරියේදී ඉදිකිරීමේ ප්‍රගතිය, ප්‍රමුඛතාවය අනුව සහ ලැබෙන මූල්‍ය ප්‍රතිපාදන අනුව ඉදිරි කාර්යයන් සැලසුම් කිරීමට කටයුතු කරනු ලබන බව. |
| 09. | ආරක්ෂක සේවාවන් අතර පොදු සන්නිවේදන යාන්ත්‍රණයක් ඇති කරවීම සඳහා ක්‍රියාත්මක කර තිබුණු උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය වර්ෂ 2014 - 2016 දක්වා කාලය තුල අවසන් කිරීමට සැලසුම් කර තිබුණු අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2020 දෙසැම්බර් 31 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණි. 2020 ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.මිලියන 882.75 ක් උපයෝජනය කර සන්නිවේදන කුලුණු ඉදි කිරීම, මයික්‍රෝ තරංග ගුවන් විදුලි ප්‍රතියෝජක පද්ධති ස්ථාපනය සහ ක්‍රියාත්මක කිරිම, අකුරේගොඩ දක්වා ප්‍රකාශ තන්තු ඇදීම සහ කොළඹ නගර ආරක්ෂක සන්නිවේදන ජාලය සම්පූර්ණයෙන් නිම කිරිමට සැලසුම් කළද මෙම ඉදිකිරීමට අදාල ප්‍රසම්පාදන ප්‍රමාදයන් හේතුවෙන් තවදුරටත් ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබුණි. එම නිසා ව්‍යාපෘතියේ අරමුණු කාලීනව ඉටුකරගත නොහැකිව තිබුණි. තවද ඉදිකිරීම් නිමකර ඇති කුළුණු , උපාංග | සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කල යුතුය | ප්‍රසම්පාදන කටයුතු නැවත සිදු කිරීම සඳහා 2022.12.31 දක්වා ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කර ගැනීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | මයික්‍රෝ තරංග ගුවන් විදුලි ප්‍රතියෝජක පද්ධතිය ස්ථාපනය කිරීමට අදාල ප්‍රසම්පාදනය මේ වන විට ලංසුකරුවන්ගේ අභියාචනා ක්‍රියාවලියේ පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | මැදිරි හා 2016 හා 2017 වර්ෂයන් හිදී මිලදීගෙන තිබුණු විදුලි ජනක යන්ත්‍ර 22 ඇතුළු උපකරණ අදාල අරමුණු සඳහා උපයෝගී කර ගැනීම තවදුරටත් ප්‍රමාද වෙමින් පැවැතිණි. | | | |
| 10 | අපේක්ෂිත කාලය තුල කොන්ත්‍රාත් නිමකිරීමට නොහැකිවීම හේතුවෙන් කාලසීමාව දීර්ඝකල කොන්ත්‍රාත් 07 වෙනුවෙන් සැපයුම් කරුවන් පස් දෙනෙකු ඉදිරිපත් කළ රු.1,008,548,800 ක හා ඇමරිකන් ඩොලර් 4,445,076 ක කාලය දීර්ඝ කිරිමේ හිමිකම් පෑම් (Claims for EOT) 24 ක් පැවති අතර ඉන් කොන්ත්‍රාත් කරුවන් දෙදෙනකු වෙත රු.8,640,502 ක් ගෙවා තිබුණි. | අනවශ්‍ය ප්‍රමාදයන් හේතුවෙන් ඇතිවන අතිරේක හිමිකම්පෑම් අවමකර අනාර්ථික වියදම් වලකා ගැනීමට කටයුතු කල යුතුය. | කාලය දීර්ඝ කිරීම් **(EOT)** අවම කර ගැනීම සඳහා සමගාමී කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට ප්‍රථම විධිමත් අධ්‍යනයකින් යුතුව කටයුතු කිරීමට කටයුතු කරන බව. | කොන්ත්‍රාත් කාර්යයන් 07 කට අදාළව සැපයුම්කරුවන් 05 දෙනෙකු ඉදිරිපත් කල කාලය දීර්ඝ කිරීමේ හිමිකම් පෑම් අගය වෙනස් නොවී තවදුරටත් පවතී. |
| **11** | සමාලෝචිත කාලපරිච්ඡේදය තුල අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය තුල සැලකියයුතු පුරප්පාඩු සංඛ්‍යාවක් පැවති අතර 2020 වර්ෂයේ අනුමත මුළු කාර්ය මණ්ඩලය 481 න් තනතුරු 74 ක ඌනතාවයක් නිරීක්ෂණය විය. ඉන් පුරප්පාඩු 13 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. | ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් පවත්වාගත යුතුය. | පුරප්පාඩු ඉදිරියේදී සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරන ලබන බව. | පිළිතුරු ලබා දී නැත. |
| **12.** | ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය ස්ථාපනය කිරීමට අනුමැතිය ලබාදී එහි කටයුතු පවත්වාගෙන යමින් තිබුණද එම ආයතනයට අදාල පනතක් 2020 වර්ෂයේ අවසානය දක්වාත් අනුමතවී නොතිබුණි. | ආයතනය පිහිටුවීමට අදාල පනත සම්මතකර ගැනීමට කටයුතු කළ යුතුය. | පනත් කෙටුම්පත 2021දෙසැම්බර් 29 වන දින නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකර ඇති බව. | 2022.02.28 වනවිටත් පනත සම්මතවී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 13. | දිස්ත්‍රික් සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක කාර්යාලවල පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රශස්ත පාලනයක් ඇතිකල හැකිවන පරිදි පුපුරණ ද්‍රව්‍ය නිකුත් කිරීම් තොරතුරු/ලේඛන නිසි පරිදි පවත්වාගෙන යාම සිදු නොවන බව දිස්ත්‍රික් කාර්යාල තුනක සෝදිසි විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. තවද සිවිල් ආරක්ෂක අංශයේ යාවත්කාලීන පරිගණක දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය විගණනයේදී පෙන්වා දී තිබුණද සමාලෝචිත කාලපර්ච්ඡේදය තුළ එම අවශ්‍යතාවය ඉටුවී නොතිබුණි. | 2005 අංක 18 දරන පුපුරන ද්‍රව්‍ය (සංශෝධිත) පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කලයුතු පුපුරන ද්‍රව්‍ය භාවිතා කිරීමේ දී සුරක්ෂිත භාවය තහවුරු කිරීම සඳහා කටයුතු සිදුකල යුතුය. | මේ පිළිබඳව පිලියෙල කල පරිගණක මෘදුකාංගය පිලිබඳව 2021.12.07 සාකච්ඡා කිරීම. | 2022.02.28 දින වනවිටත් දත්ත පද්ධතිය ස්ථාපිත වී නොමැත. |

## 14. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2018 වර්ෂය | 2019 වර්ෂය | 2020 වර්ෂය | එකතුව |
|---|---|---|---|---|
| ---------- | --------------- | --------------- | ---------------- | ----------- |
| <u>ශුද්ධ ප්‍රතිපාදනය</u> | | | | |
| පුනරාවර්තන | 6,964,605,292 | 22,285,043,900 | 12,326,540,335 | 41,576,189,527 |
| මූලධන | 11,633,099,708 | 7,178,694,100 | 6,051,480,665 | 24,863,274,473 |
| එකතුව | **18,597,705,000** | **29,463,738,000** | **18,378,021,000** | **66,439,464,000** |
| <u>සත්‍ය වියදම්</u> | | | | |
| පුනරාවර්තන | 6,663,755,322 | 21,670,844,472 | 12,109,818,499 | 40,444,418,293 |
| මූලධන | 9,741,188,940 | 5,916,077,922 | 4,803,663,767 | 20,460,930,629 |
| එකතුව | **16,404,944,262** | **27,586,922,394** | **16,913,482,266** | **60,905,348,922** |
| <u>වසර අග ඉතිරිවීම්</u> | | | | |
| පුනරාවර්තන | 300,849,970 | 614,199,428 | 216,721,836 | 1,131,771,234 |
| මූලධන | 1,891,910,768 | 1,262,616,178 | 1,247,816,898 | 4,402,343,844 |
| එකතුව | **2,192,760,738** | **1,876,815,606** | **1,464,538,734** | **5,534,115,078** |

## 03. ජනමාධ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය - 105**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | අමාත්‍යාංශය සතු වාහන 28 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර නොතිබුණි. | අමාත්‍යාංශය සතු වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට පියවර ගත යුතුය. | ඉදිරි වසර වල ගිණුම යාවත්කාලීන කිරීමට කටයුතු සලසනු ලබන බව. | මෙතෙක් නිවැරදි කර නොමැත. |
| 02. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 කට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කළයුතු වුවත් ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළයුතුය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) පරිදි අදාළ නිලධාරීන්ට කටයුතු කිරීමට දැනුවත් කරන ලද බව. | මාර්ගෝපදේශ ප්‍රකාරව ක්‍රියා කර නොමැත. |
| 03. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) අනුව ප්‍රසම්පාදන කටයුත්තක් ආරම්භ කරන අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවරයන් ක්‍රමානුකූලව විස්තර කරමින් සකස් කළයුතු විස්තරාත්මක ප්‍රසම්පාදන | -එම- | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) පරිදි අදාළ නිලධාරීන්ට කටයුතු කිරීමට දැනුවත් කරන ලද බව. | 2021වර්ෂය සඳහා ඉදිරිපත් කළ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම මාර්ගෝපදේශ ප්‍රකාරව සකස් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | සැලැස්මක් 2020 වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් සකස් කර නොතිබුණි. | | | |
| 04. | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙම නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබේ. | පනත ප්‍රකාරව මෙතෙක් කටයුතු කර නොමැත. |
| 05. | 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පෞද්ගලික මාධ්‍ය ආයතන 02 කින් අයවිය යුතු බදු ආදායම දඩ මුදල්ද සමඟ රු.53,157,130 ක් නැවත අයකරගෙන නොතිබුණි. | හිඟ බදු මුදල් හැකි ඉක්මනින් අයකරගත යුතුය. | මෙම හිඟ මුදල් අයකර ගැනීම සඳහා පියවර ගනු ලබන බව. | අදාළ හිඟ මුදල් මෙතෙක් අයකරගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 06. | ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම සඳහා වූ පනත 2019 වර්ෂයේ සම්මත කිරීමට සැලසුම් කර තිබූ නමුත් 2019 වර්ෂය අවසන් වන විටද එම ඉලක්කය ළඟා කර ගෙන නොතිබුණි. | සැලසුම් කළ පරිදි කටයුතු ඉටු කර ගත යුතුය. | මෙම පනත් කෙටුම්පතට 2020 මාර්තු 04 වන දින අමාත්‍ය මණ්ඩලය ලබාදුන් තීරණ පරිදි ක්ෂේත්‍රයේ පළපුරුදු අයගෙන් යුතු විද්වත් කමිටුවක් පත් කිරීමෙන් අනතුරුව සකස් කරන ලද දළ කෙටුම්පත සමාලෝචනය කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. | මෙම පනත් කෙටුම්පත සම්මත කර නොමැත. |

## 07. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2019 | 2020 | එකතුව රු. |
|---|---:|---:|---:|
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | | | |
| පුනරාවර්තන | 612,350,000 | 1,400,174,000 | 2,012,524,000 |
| මූලධන | 788,450,000 | 546,293,000 | 1,337,743,000 |
| මුළු ප්‍රතිපාදනය | 1,400,800,000 | 1,946,467,000 | 3,347,267,000 |
| ශුද්ධ ප්‍රතිපාදනය | | | |
| පුනරාවර්තන | 642,950,000 | 1,391,122,000 | 2,034,072,000 |
| මූලධන | 793,510,000 | 555,345,000 | 1,348,855,000 |
| එකතුව | 1,436,460,000 | 1,946,467,000 | 3,382,927,000 |
| සත්‍ය වියදම | | | |
| පුනරාවර්තන | 598,174,133 | 1,368,803,921 | 1,966,978,054 |
| මූලධන | 346,257,644 | 379,031,479 | 725,289,123 |
| එකතුව | 944,431,777 | 1,747,835,400 | 2,692,267,177 |
| වසර අග ඉතිරිවීම් | | | |
| පුනරාවර්තන | 44,775,867 | 22,318,079 | 67,093,946 |
| මූලධන | 447,252,356 | 176,313,521 | 623,565,877 |
| එකතුව | 492,028,223 | 198,631,600 | 690,659,823 |

*මෙම වර්ෂය තුළ මෙම අමාත්‍යාංශය “මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය” ලෙස මුදල් අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ කර තිබීම හේතුවෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශය විගණනය වෙනුවෙන් වෙනම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකෙරුණි.

**04. අධිකරණ අමාත්‍යාංශය**

**ශීර්ෂය - 110**

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය | 2018 | - තත්ත්වාගණනය කළ මතය |
| | 2019 | - තත්ත්වාගණනය කළ මතය |
| | 2020 | - තත්ත්වාගණනය කළ මතය |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ104(1) අනුව 2017,2018, 2019 හා 2020 වර්ෂවලදී සිදු වූ වාහන අනතුරු 04 කට අදාළ හානිය 2020 දෙසැම්බර් 31 දින වන විටත් තක්සේරු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අනතුරු වලට අදාල මු.රෙ. 104 පරීක්ෂණ පවත්වා එම අලාභයන් සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට පියවර ගනු ලබන බව. | 2017, 2018, 2019 හා 2020 වර්ෂවල සිදුව ඇති රිය අනතුරු 04කට අදාල මු.රෙ. 104 පරීක්ෂණ මේ වනවිටත් සිදු කර නොමැත. |
| 02. | 2012 සිට 2020 දක්වා අවස්ථා 10 කදී සිදු වී තිබුණු අලාභ හා හානි සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් මුදල් රෙගුලාසි සංග්‍රහයේ 109 (1) හා (2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අනතුරු වලට අදාල මු.රෙ. 104 පරීක්ෂණය සිදු කර මු.රෙ. 104(3) අවසාන පරීක්ෂණ වාර්තා අනුව ඊට අදාල අයකර ගැනීම් සිදු කර හානි පාඩු ලේඛණයෙන් කපා හැරීමට කටයුතු කරන බව. | 2020 වර්ෂයට පසු සිදුව ඇති අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 104 ප්‍රකාර කටයුතු කරමින් පවතී. 2020 වර්ෂයට පෙර වර්ෂ වල මු.රෙ. 104 පරීක්ෂණ සිදු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 03. | වැඩ තහනමට ලක්වූ නිලධාරීන්/ සේවකයන් හා සේවය හැරගිය නිලධාරීන් 07 දෙනෙකුගේ එකතුව රු.624,602 ක ණය ශේෂ වසර 06 සිට 23 දක්වා කාල පරාසයක සිට අය නොවී පැවතුණි. | හිඟණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වසර 05ට වැඩි අයකර ගත නොහැකි වැඩ තහනමට ලක් වූ නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂ දෙකක් භාණ්ඩාගාර අනුමැතිය යටතේ කපා ඇති බව. | මේ වන විට රු. 63,010/- ණය ශේෂයන් කපා හැර ඇත. |
| 04. | 2016 වර්ෂයේ සමථ දින වියදම් පියවීම සඳහා **UNDP**ආයතනයෙන් 2017 වර්ෂයේ ලැබී තිබුණු රු.1,316,041 ක මුදල් අදාළ අරමුණට නොයොදා තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ලැබුණු මුදල් අදාල කාර්යයට යෙදවිය යුතු අතර එසේ නොවේ නම් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | තැන්පතු මුදල් අදාල කාර්යය සඳහා උපයෝජනය කිරීමට හෝ නොඑසේ නම් මුදල් ලබා දුන් පාර්ශවයේ එකඟතාවය මත වෙනත් කාර්යයක් සඳහා ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කරන ලෙස අදාල නිළධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | අදාල මුදල තැන්පත් ගිණුමේ රඳවාගෙන ඇත. |
| 05. | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 වගන්තිය අනුව හදිසි ප්‍රසම්පාදන සම්බන්ධ විධිවිධාන අනුගමනය නොකර කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිල්ලක වර්ග අඩි 2000 ක බිම් මහලක් රු.265,000 ක මාසික කුලියකට අවුරුදු 02 ක් බදු කුලී පදනම මත ලබාගෙන සමාලෝචිත වර්ෂයේ වර්ෂයක කුලිය ලෙස රු.3,180,000 ක් හා ආරක්ෂක තැන්පතු ලෙස රු.795,000 ක් ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කළ යුතුවේ. | විශේෂ ඒකකයේ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා සුදුසු ස්ථානයක් කඩිනමින් ලබා ගැනිම සඳහා දවස ගොඩනැගිල්ලේ බිම් මහල කුලී පදනම මත ලබාගෙන ඇත. මින් ඉදිරියට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | ඉදිරියේ නිවැරදිව කටයුතු කිරීමට සටහන් කර ගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 06. | වෙළඳපල වටිනාකම රු.5,000,000 ක් වූ කැබ් රථයක් 2017 වර්ෂයේ අනතුරකට පත් වී 2019 වර්ෂයේ අධිකරණ අමාත්‍යාංශයට ගෙනවිත් දමා තිබුණි. අමාත්‍යාංශයට වාහනය විධිමත්ව භාරදීමකින් තොරව මෙම වාහනය පරිහරණය කළ පාර්ශවය 2018 වර්ෂයේ තනතුරෙන් ඉවත්ව තිබුණි. අනතුර සම්බන්ධයෙන් 2017 ජුනි 07 දින පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව, පොලිස් පැමිණිල්ලේ පිටපත, රියදුරුගේ ප්‍රකාශය ගොනුවේ නොතිබුණු අතර 2021 පෙබරවාරි වන විටත් වාහනය අළුත්වැඩියා කිරීමට හෝ අනතුරට වගකිව යුතු පාර්ශවය හඳුනාගෙන රජයට වූ අලාභය අයකර ගැනීමට හෝ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පරීක්ෂණ කඩිනමින් අවසන් කළ යුතුවේ. | මු. රෙ. 104 පරීක්ෂණ මණ්ඩලය විසින් අතුරු වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර නිර්දේශ සහිත මුදල් රෙගුලාසි 104 (3) අවසාන වාර්තාව ලද පසු අලාභ අයකර ගැනීම සහ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට අදාල ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව. | මු. රෙ. 104 පරීක්ෂණ මණ්ඩලය මේ සම්බන්ධව අතුරු වාර්තාවක් ඉදිරිපත් කර ඇත. අනතුරට වගකිව යුතු පාර්ශවය හඳුනාගෙන රජයට වූ අලාභය මෙතෙක් අයකර ගෙන නොතිබුණි. |
| 07. | ජාත්‍යන්තර වාණිජ ගිවිසුම් සහ වෙනත් ජාත්‍යන්තර සබඳතා ආශ්‍රයෙන් පැන නඟින ආරවුල් නිරාකරණය සඳහා කලාපීය මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකා ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානයක් ඇති කර එය ස්ථිර ස්ථානයක ස්ථාපිත කරන තෙක් 2013 වර්ෂයේ සිට කුලී පදනම මත ලබාගත් ස්ථානයක පවත්වාගෙන ගොස් තිබුණි. 2016 දී එය ඇපයෙන් සීමිත සමාගමක් | මෙම පරිපාලන ගැටළුව කඩිනමින් නිරාකරණය කර, පිහිටුවීමේ අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම මධ්‍යස්ථානය වඩාත් ඵලදායී අන්දමින් පවත්වාගෙන යාම සඳහා 2021.04.06 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර ඇති අතර ඒ අනුව සුදුසු කළමනාකරණ ක්‍රමවේදයක් යෝජනා කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශයේ අතිරේඛ | අරමුණ ලඟාකර ගෙන නොතිබුණි. මධ්‍යස්ථානය සඳහා කුලී ගෙවීම සිදුකරගෙන යනු ලබයි. |

| | | | | |
|---|---|---|---|---|
| | ලෙස ස්ථාපිත කර ඇති නමුත් සමාගමට අවශ්‍ය මූලධනය සපයාදීම සම්බන්ධයෙන් තීරණයක් ගෙන නොමැති වීම හා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොමැතිවීම යන හේතු නිසා එම සමාගම අක්‍රීයව පැවැතුණි. එම ස්ථානය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී 2019 ජුලි සිට 2020 දෙසැම්බර් දක්වා කුලිය ලෙස රු.41,702,018 ක් ද පරිපාලන වියදම් රු.64,800 ක් ද, ආපසු ගෙවන ආරක්ෂක තැන්පතුව රු.273,420 ක් ද වශයෙන් රු.42,040,238 ක් ගෙවා තිබුණත් මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණ ඉටුකර ගෙන නොතිබුණි. | | ලේකම් (ප්‍රතිසංස්කරණ)ගේ ප්‍රධානත්වයෙන් පස් දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත් කරන ලද බව. | |
| 08. | (අ) මහල් 02 කින් යුතුව පුත්තලම නීති ආධාර හා ප්‍රජා විශෝධන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තය 2010 සැප්තැම්බර් 15 දින බාහිර පාර්ශවයකට රු.5,583,770 ක කොන්ත්‍රාත්තු වටිනාකමකට පිරිනමා තිබුණු අතර 2011 මාර්තු 27 දින වැඩ අවසන් කල යුතුව තිබුණි. එහෙත් 2019 ඔක්තෝබර් 04 දින වන විටත් වැඩ අවසන් නොකර ඉදිකිරීම් අතර මඟ නතර කර තිබුණි. ඉදිකිරීම් අවසන් කිරීම සඳහා 2014 වර්ෂයේදී ද වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු.මිලියන | ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කර ගත යුතු වේ. | අතරමඟ නතර කර දමා තිබූ මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු සමගින් පැවති ගිවිසුම තුළ තවදුරටත් ඉදකිරීම් කටයුතු කළ නොහැකි බැවින් නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා ගෙන නව ව්‍යාපෘතියක් ලෙස ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කරනු ලබන බව. | නව ව්‍යාපෘතියක් ලෙස ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | 5ක් වෙන් කර තිබුණත්, එම වර්ෂය තුළ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. මේ හේතුවෙන් ප්‍රජා විශෝධන වරදකරුවන් උපදේශනයට ලක් කිරීම හා කාර්යාල කටයුතු කිරීම සඳහා වෙනම කාර්යාලයක් ස්ථාපිත කිරීමේ අරමුණ ඉටු කර නොතිබුණි. | | | |
| | (ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුවෙකුට 2010 ඔක්තෝබර් 21 දිනැතිව ගෙවා තිබුණු වැඩ ඇරඹීමේ අත්තිකාරම් මුදලින් රු.254,691 ක්ද, කාර්යසාධන ඇපකරයෙන් අයවිය යුතු රු.339,595 ක් ද වශයෙන් එකතුව රු.594,286 ක් අය කර ගෙන නොතිබුණි. එම මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් 2017 ජුනි 28 දින සිට 2018 පෙබරවාරි 15 දක්වා අවස්ථා 4 කදී නීති අංශයෙන් උපදෙස් ඉල්ලා තිබුණත් 2019 ඔක්තෝබර් 04 දින වන විටත් අවශ්‍ය උපදෙස් ලැබී නොතිබුණි. | අයකර ගත යුතුව ඇති මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතු වේ. | කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර ඇති අත්තිකාරම් ඇපකර හා කාර්යසාධන ඇපකර කල්ඉකුත් වන දිනයන් පැහැදිලිව හඳුනාගත හැකි වන පරිදි ලේඛණය නඩත්තු කිරීමටත්, එම ඇප කර කල් ඉකුත් විමට මාසයකට ප්‍රථම කොන්ත්‍රාත්කරුවන් වෙත දන්වා දින දීර්ඝ කිරීමටත් කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | අදාල මුදල අයකර ගෙන නොතිබුණි. |
| 09. | අමාත්‍යාංශය විසින් නඩු තීන්දු සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීම 2004 අගෝස්තු 01 දින සිට ආරම්භ කර තිබුණත්, 2019 ඔක්තෝබර් 29 දින වන විට එම පරිවර්තන | අවශ්‍යතාවය හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතු වේ. | අවශතාවයට සරිලන ප්‍රමාණයට පමණක් නිති වාර්තා මුද්‍රණය කිරීමට කටයුතු කරන ලෙස නිලධාරීන්ට දන්වා ඇති බව. | පරිවර්තන ඒකකය ක්‍රියාත්මකව නොපවතී.මුද්‍රණය කටයුතු අවසන් කරවාගෙන පිටපත් ලබා |

ඒකකය ක්‍රියාත්මකව නොතිබුණි. එමෙන්ම ඒ වන විට 2004 වර්ෂයේ I වෙළුම සිට 2011 වර්ෂයේ I වෙළුම දක්වා නීති වාර්තා සිංහල භාෂාවට පරිවර්තනය හා සංස්කරණය කිරීමට රු.4,064,441 ක් වැය කර තිබුණත්, ඒවායේ මුද්‍රණ කටයුතු අවසන් කර නොතිබුණි. 2004 වර්ෂයේ Iවෙළුමෙහි කොටස් 03ක් දෙවන සෝදුපත් කියවීම සඳහා පිටපතක් ලබාගැනීමට රජයේ මුද්‍රණාලයට භාරදී තිබුණත් 2019 ඔක්තෝබර් 29 දි වන විටත් ඒවා ආපසු භාර ගෙන නොතිබුණි.

ගැනීමට කටයුතු කර නොමැත.

## 10. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **ඇස්තමේන්තු ප්‍රතිපාදනය** | | | | |
| පුනරාවර්තන | 922,600,000 | 973,805,000 | 1,568,963,000 | 3,465,368,000 |
| මූලධන | 144,350,000 | 161,110,000 | 1,428,522,000 | 1,733,982,000 |
| එකතුව | **1,066,950,000** | **1,134,915,000** | **2,997,485,000** | **5,199,350,000** |
| **ශුද්ධ ප්‍රතිපාදනය** | | | | |
| පුනරාවර්තන | 922,600,000 | 1,022,108,837 | 1,573,623,000 | 3,518,331,837 |
| මූලධන | 166,010,500 | 181,606,163 | 1,439,522,000 | 1,787,138,663 |
| එකතුව | **1,088,610,500** | **1,203,715,000** | **3,013,145,000** | **5,305,470,500** |
| **සත්‍ය වියදම** | | | | |
| පුනරාවර්තන | 902,427,390 | 935,869,959 | 1,450,471,714 | 3,288,769,063 |
| මූලධන | 80,142,191 | 104,343,313 | 1,084,093,233 | 1,268,578,737 |
| එකතුව | **982,569,581** | **1,040,213,272** | **2,534,564,947** | **4,557,347,800** |
| **වසර අග ඉතිරිවීම්** | | | | |
| පුනරාවර්තන | 20,172,610 | 86,238,878 | 123,151,286 | 229,562,774 |
| මූලධන | 85,868,309 | 77,262,850 | 355,428,767 | 518,559,926 |
| එකතුව | **106,040,919** | **163,501,728** | **478,580,053** | **748,122,700** |

**05. සෞඛ්‍ය අමාත්‍යාංශය**

ශීර්ෂය -111

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය
2019 - තත්ත්වාගණනය නොකළ මතය
2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ගය | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 4.1 ඡේදය ප්‍රකාරව හිමිකම් ලබන වාහන ප්‍රමාණය ඉක්මවා අමාත්‍යවරයාට සහ එහිකාර්යමණ්ඩලය හා අමාත්‍ය කාර්යාලය වෙත මෝටර් රථ 16 ක්ද, නියෝජ්‍ය අමාත්‍යවරයාට සහ එහි කාර්ය මණ්ඩලය හා නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය වෙත මෝටර් රථ 8 ක්ද වෙන්කරදී තිබුණි. තවද, අමාත්‍යවරයාට හා නියෝජ්‍ය අමාත්‍යවරයාට හිමි ඉන්ධන දීමනාව ඉක්මවා 2017 වර්ෂය තුළදී පමණක් පිළිවෙලින් රු.මිලියන 2 ක හා රු.මිලියන 4 ක ඉන්ධන අමාත්‍යාංශය විසින් ලබාදී තිබුණි. | ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 4.1 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වර්තමානයේදී අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුව පමණක් ගරු අමාත්‍යවරුන් වෙත වාහන නිකුත් කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් විමර්ෂනයක් සිදුකර වැඩිපුර ගෙවූ ඉන්ධන දීමනා ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 02. | කුරුණෑගල මහ රෝහලෙහි ආපනශාලාව බඳු දීමේ ප්‍රසම්පාදනය රෝහල විසින් | රජයේ දේපළවලින් ලැබෙන ආදායම් බාහිර පාර්ශවයක් | රෝහල් කාර්ය මණ්ඩල සුභ සාධක සංගමය, සමුපකාර | රජයට අයවිය යුතු මුදල රු.25,579,440 ක් |

| | | | | |
|---|---|---|---|---|
| | සිදුකළ යුතු නමුත් ඒ වෙනුවට රෝහල් සේවක සුහසාධක සංගමය විසින් සිදුකර මාසික කුලිය රු.621,000 ක් ගෙවීමට එකඟවී තිබුණු පුද්ගලයෙකු වෙත 2015 අප්‍රේල් 20 දින සිට බදුදී තිබුණි. එදින සිට 2016 අප්‍රේල් 20 දින දක්වා වූ වර්ෂය තුළදී ලැබී තිබුණු රු.මිලියන 7.45 ක් වූ කුලී ආදායම රජයේ ආදායමට බැර නොකර සේවක සුහසාධක සංගමයේ ගිණුමකට බැර කර තිබුණි.2016 වර්ෂයේ මාස 03 ක් සඳහා බදුකරු සුහසාධක සංගමයට හෝ රජයේ ආදායමට බැර පිණිස හෝ රු.මිලියන 1.86 ක කුලී ගෙවා නොතිබුණි. මාසික කුලිය අඩුකර දෙන ලෙස බදුකරු විසින් කර තිබුණු ඉල්ලීමකට අනුව, 2017 ජුනි සිට 2018 සැප්තැම්බර් දක්වා වූ මාස 16 ක කාලය තුළදී රජයට ලැබිය යුතු ආදායම රු.මිලියන 7.94 කින් කපාහැරීමට කටයුතු කර තිබුණු නමුත් ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | වෙත ලබා ගැනීමට ඉඩකඩ සලසා තිබීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හා නිසි අනුමැතියකින් තොරව හිඟ ආදායම් කපාහැරීමට කටයුතු කළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතු වේ. | සමිතියක් ලෙස සමූපකාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති බව හා සමූපකාර අණ පනත්වලට අනුකූලව රෝහලේ ගොඩනැගිල්ලක් කුලියට ලබාගනිමින් ආපන ශාලාව පවත්වාගෙනයාම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරාපත්කර ගෙන ඇති බව. | ලෙස ගණනය කර ඇතත් 2022 ජනවාරි 31 දින වන විටත් එම මුදල අයකරගෙන නොතිබුණි. |
| 03. | මාලඹේ වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශ්‍රී ලංකා රුසියානු මිත්‍රත්ව රෝහලේ ගොඩනැගිලි ඇතුළු දේපලවල භෞතික භුක්තිය අනු කල්බදු පදනම මත වර්ෂ 10 කට ශ්‍රී ලංකා රජය වෙත මාරු කිරීමට එකඟතාවයකට පැමිණීමටත්, | පළමු අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අනුකල්බදු ගිවිසුමට එළඹීමට කඩිනමින් පියවර ගත යුතුය. | වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල, ලංකා බැංකුව සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2019 ඔක්තෝබර් 31 දින ත්‍රෛයිපාර්ශවික | 2022 ජනවාරි 31 දින වන විටත් අනුකල්බදු ගිවිසුමට එළඹීමට අපොහොසත්වී තිබුණු අතර එදින වන විට මෙම |

රෝහල ස්ථාපනය කිරීම සඳහා සයිටම් ආයතනය රාජ්‍ය බැංකුවකින් ලබා ගෙන තිබුණු රු.මිලියන 1,013 ක ණය මුදල ගෙවා නිමවන තෙක් එකී දේපලවල අයිතිය හා නීත්‍යානුකූලභාවය සයිටම් ආයතනය වෙත එලෙසම පවත්වා ගැනීමටත්, ණය මුදල ගෙවා අවසානයේදී රෝහලේ අයිතිය හා සියළු දේපල වටිනාකම ශ්‍රී ලංකා රජය වෙත මාරු කිරීමටත් යෝජනා කරමින් ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය සලකා බලමින් එම රෝහල රජයට පවරා ගැනීම සඳහා 2017 ජූලි 05 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී වර්ෂ දෙකකට වැඩි කාලයක් ගතව තිබුණද රෝහලේ ගොඩනැගිලි ඇතුළු දේපලවල භෞතික භුක්තිය රජයට පවරා ගැනීමට අනුකල්බඳු ගිවිසුමකට ඇතුළත්වී නොතිබුණි. එවැනි ගිවිසුමකට එළඹීමෙන් තොරව 2017 අගෝස්තු 01 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළදී මෙම රෝහලේ අයහාර වියදම් පියවා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් රු.මිලියන 583 ක් වැයකර තිබුණි.

ගිවිසුමකට එළඹී ඇති බව, අදාළ පාර්ශවයන් විසින් එළඹ ඇති අවබෝධතා ගිවිසුමට අනුව කටයුතු ඉටු නොකිරීමට එරෙහිව අභියාචනාධිකරණ යේ ගොනුකර ඇති නඩුව විභාග වෙමින් පවතින බව හා නඩුවේ තීන්දුව ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකරන බව.

රෝහලේ වියදම් පියවා ගැනීම වෙනුවෙන් අමාත්‍යාංශය විසින් වැයකර තිබුණු මුළු මුදල රු.මිලියන 2,177 ක්විය.

| | | | | |
|---|---|---|---|---|
| 04. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXVIII පරිච්ඡේදයේ 1.1 ඡේදයේ දක්වා ඇති විධිවිධාන හා 2006 මැයි 30 දිනැති අංක 09/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව, වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යාල වේලාවන් නියම කරමින් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පොදු චක්‍රලේඛයක් නිකුත්කර තිබුණි.<br>එම චක්‍රලේඛය පදනම් කරගෙන අමාත්‍යාංශ ප්‍රධාන කාර්යාලයේ විවිධ අංශවල සේවය කරන සෞඛ්‍ය සේවාවන්ට අදාළ පොදු පරිපාලන කටයුතුවල නියැලෙන නමුත් සෘජුවම සායනික සේවාවන් ඉටු නොකරන වෛද්‍යවරුන්ට, සායනික සේවාවන් ඉටු කරන වෛද්‍යවරුන්ට පමණක් ගෙවිය හැකි දිනකට පැයක හෝ පැය දෙකක කාලයක් සඳහා අතිකාල දීමනා ගෙවා තිබුණි. 2018 වර්ෂයේ මාස 06 ක් සඳහා පමණක් එසේ ගෙවා තිබුණු දීමනා රු.මිලියන 6 ක් වී තිබුණි.මෙම දීමනාව ලබා ගත් වෛද්‍ය නිලධාරීන්, ආයතන සංග්‍රහයේ XXVIII පරිච්ඡේදයේ 1.3 වගන්තිය සමඟ කියවිය යුතු 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ දැක්වෙන රජයේ | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. | 2019 මැයි මාසයේ සිට මෙම අතිකාල දීමනා ගෙවීම තාවකාලිකව අත්හිටුවා ඇති බව. | අතිකාල දීමනා ගෙවීම තාවකාලිකව අත්හිටුවා ඇති නමුත් දැනට ගෙවා ඇති මුදල් ආපසු අයකර ගැනීමට 2022 ජනවාරි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් වූ ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර භාවිත කර නොතිබුණි. ඒ වෙනුවට මාසයකට වරක් පමණක් අධීක්ෂණ නිලධාරියකු විසින් අත්සන් කරනු ලබන දින පොතක සටහන් කළ පැමිණීම් වාර්තා පදනම් කරගෙන අතිකාල දීමනා ගෙවා තිබුණි. | | | |
| 05. | කිසිදු අධිකාරී බලයකින් තොරව, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයාට උපහාර පිරිනැමීමේ උත්සවයක් පැවැත්වීම සඳහා රාජ්‍ය ආයතන 04 කින් රු.මිලියන 3 ක් ඇතුළුව මුළු මුදල රු.මිලියන 5 ක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් නමින් වූ බැංකු ගිණුමකට රැස්කර එම උත්සවයේ වියදම් සඳහා රු.මිලියන 7 ක් වැය කර තිබුණි. මෙම උපහාර උළෙලේ ඉසව් කළමනාකරණ කටයුතු (Event Management) සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව පූර්ව නිශ්චිත ආයතනයක් ඉලක්ක කර ගනිමින් රු.මිලියන 6 ක අවම ලංසුව ඉදිරිපත් කළ ආයතනය ඉදිරිපත් කර තිබුණු ව්‍යාජ ලිපි ලේඛන මත පදනම්ව ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. | අධිකාරී බලයකින් තොරව මුදල් රැස් කිරීම හා වියදම් කිරීම සිදු නොකළ යුතු අතර මිලදී ගැනීම්වලදී හා සේවා සපයා ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගතව කටයුතු කළ යුතුය. | ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මෙම වැඩසටහන සඳහා මූල්‍යමය දායකත්වය දැක්වීමේදී එම මුදල් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ගිණුමක් වෙත පමණක් ලබා දිය හැකි බව දන්වා සිටි බැවින් එම මුදල් හා අනෙකුත් ආයතනවලින් ලද පරිත්‍යාගද පොදු තැන්පත් ගිණුමේ තැන්පත්කර ඉන් අදාළ වියදම් පියවීම සඳහා යොදා ගැනීමට කටයුතු කළ බව. | අධිකාරී බලයකින් තොරව මුදල් රැස්කිරීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව වියදම් කිරීම සම්බන්ධයෙන් 2022 ජනවාරි 31 දින වන විටත් විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 06. | අමාත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු ලෙස පත්කර නොතිබුණු නමුත් අමාත්‍ය කාර්ය මණ්ඩලයේ මාධ්‍ය ලේකම්, ඉසව් සංවිධායක හා උත්සව සම්බන්ධීකාරක ලෙස ව්‍යාජ ලෙස පෙනී සිටි රජයේ නිලධාරියෙකු නොවූ පුද්ගලයෙකු 2018 සැප්තැම්බර් 26 හා 27 දිනවලදී ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක් නුවර පවත්වා තිබුණු සමුළුවකට හා 2018 ඔක්තෝබර් 01 දින සිට 06 දින දක්වා ස්විස්ටර්ලන්තයේ පවත්වා තිබුණු සමුළුවකට සහභාගීකරවීම සඳහා යානාපත්‍ර සඳහා රු.487,500 ක් ද අනියම් දීමනා හා සංයුක්ත දීමනා ලෙස රු.685,545 ක්ද වශයෙන් රු.මිලියන 1.17 ක මුදලක් අමාත්‍යාංශය විසින් වැයකර තිබුණි. | මේ සම්බන්ධව වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතු වීම. | මේ සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනයකින් පසුව රු.98,444 ක් අයකර ගත් බව හා ඉතිරි මුදල අය කර ගැනීමට ඉදිරියේදී පියවර ගනු ලබන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ඉතිරි මුදල අය කර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| 07. | 2016/2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික රෝහල විසින් සකස් කරන ලද ආහාර ද්‍රව්‍ය සපයා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදනය සඳහා පත්කර තිබුණු තාක්ෂණික ඇගයීම් කමිටුවට පෝෂණ අතිරේක පිළිබඳ දැනුමක් සහිත පෝෂණවේදියෙකු පත්කර නොතිබුණි. Impact පෝෂණ අතිරේකය ග්‍රෑම් 74 කුඩා සැෂේ පැකට් 05 ක් අන්තර්ගත ටින් එකක් සඳහා රු.1,390 ක ලංසුවක් | -එම- | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් විසින් මේ සම්බන්ධයෙන් මූලික විමර්ශණයක් ආරම්භ කර ඇති බව, මේ වන විට තාක්ෂණික ඇගයීම් කමිටුවට පෝෂණ අතිරේක පිළිබඳ දැනුමක් සහිත | 2022 ජනවාරි 31 දින වන විටත් විමර්ශණය අවසන් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරු වෙත එම සැෂේ පැකට් 23,304 ක් සඳහා එකකට රු.1,390 ක් බැගින් ගෙවා තිබීම හේතුවෙන් සැපයුම්කරු වෙත රු.මිලියන 25.91 ක් වැඩියෙන් ගෙවා තිබුණි. Impact පෝෂණ අතිරේකය ග්‍රෑම් 74 කුඩා සැෂේ පැකට් එකක සාමාන්‍ය වෙළඳපොල සිල්ලර මිල රු.365 ක් විය. නමුත් එම එක් පැකට්ටුවක් සඳහා රු.1,390 ක් බැගින් පැකට් 23,304 ක් සඳහා ගෙවීම් කර තිබීම හේතුවෙන් සාමාන්‍ය වෙළඳපොල සිල්ලර මිලට වඩා වැඩියෙන් රු.මිලියන 23.89 ක් ගෙවා තිබුණි. අධිශක්ති අධි ප්‍රෝටීන් පෝෂණ අතිරේක වූ Pentasure 2.0 හා Pentasure Renal අතිරේකයක් සැපයීම සඳහා සැපයුම්කරු විසින් එකඟවී තිබුණු පිළිවෙලින් රු.1,060 ක් හා රු.839 ක් වෙනුවට රු.1,390 ක් හා රු.1,100 බැගින් ගෙවා තිබීම හේතුවෙන් වැඩියෙන් රු.280,833 ක් ගෙවා තිබුණි. | | පෝෂණවේදියෙකු පත් කර ඇති බව හා මේ වන විට පෙර වර්ෂවල අත්දැකීම් අනුසාරයෙන් පෝෂණ අතිරේක ටින් හා පැකට් වශයෙන් නිශ්චිතව සඳහන් කරමින් මිලදී ගනු ලබන බව. | |
| 08. | යාපනය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂකවරයා හා එම රෝහල් සංවර්ධන සංගමය විසින් රෝහල සඳහා අක්ෂි ඒකකයක් ස්ථාපිත කිරීමට ඉඩමක් මිලදී ගැනීම පිළිබඳව යාපනය දිස්ත්‍රික් ලේකම්වරයා සමඟ ලිපි ගනුදෙනු සිදුකර තිබුණි. එම ලිපිවලට අනුව ඉඩම මිලදී ගැනීමට | -එම- | යාපනය රෝහල් අධ්‍යක්ෂ නමින් ඉඩම පවරා ගැනීමේ මූලික කටයුතු ආරම්භ කර ඇති බව හා මේ වන විට ඉඩම රෝහල විසින් භාවිතා කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ඉඩම රෝහල වෙත පවරා ගෙන නොතිබුණු අතර විගණකාධිපතිගේ නිර්දේශය ප්‍රකාරව කටයුතු කරද නොතිබුණි. |

අපේක්ෂාවෙන් පසුවන්නේ යාපනය ශික්ෂණ රෝහල් සංවර්ධන සංගමය නැමැති රාජ්‍ය නොවන සංවිධානයක් වන බව තහවුරුවී තිබුණි. නමුත් ඒ බව නොසලකා දිස්ත්‍රික් ලේකම්වරයකු හා රෝහල් අධ්‍යක්ෂකවරයකු සතු බලතල අභිබවායමින් වෙනත් කිසිදු අධිකාරී බලයකින් හෝ අනුමැතියකින් තොරව ඉඩම මිලදී ගැනීම සඳහා රජයේ මුදල් රු.මිලියන 12.5 ක් දිස්ත්‍රික් ලේකම්වරයා විසින් රෝහල වෙතත් ඉන් පසුව රෝහල් අධ්‍යක්ෂකවරයා විසින් රෝහල් සංවර්ධන සංගමය වෙතත් මුදාහැරීමට කටයුතු කර තිබුණි. රෝහල් සංවර්ධන සංගමය විසින් රු.මිලියන 12.5 ක් ගෙවා එම සංගමය නමින් ඉඩම මිලදී ගෙන තිබුණි. ඉඩමේ අයිතිකරු වෙත සෘජුවම මුදල් ගෙවා ඉඩම මිලදී ගැනීම වෙනුවට වක්‍රකාරව මුදල් ගෙවා ගනුදෙනුවේ අවිධිමත් බව යටපත් කර තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ඉඩම මිලදී ගැනීම සඳහා මුදල් මුදාහැරීමට පෙර මිලදී ගැනීමට යෝජිත පත්ඉරු මගින් සනාථ කර ගත යුතු ඉඩමේ ඉතිහාසය, ඉඩමේ සැලැස්ම හා ඉඩමේ තක්සේරු වටිනාකම ආදී තොරතුරු ලබා ගෙන

| | | | | |
|---|---|---|---|---|
| | ගනුදෙනුවේ සාධාරණ බව හා විනිවිදභාවය සම්බන්ධයෙන් සෑහීමකට පත්විය යුතු වුවත්, එපරිදි කටයුතු නොතිබුණි. ඉඩම මිලදී ගෙන තිබුණු 2011 අගෝස්තු 02 දිනට පසු එනම් 2011 සැප්තැම්බර් 19 දින ඉඩමේ හිමිකරු බලාපොරොත්තු වූ වටිනාකම ඔහු වෙත ලබාදීම අරමුණු කර ගනිමින් ඉඩමේ තක්සේරු වටිනාකම රු.මිලියන 14 ක් වන බවට තක්සේරු වාර්තාව නිකුත් කර තිබුණි. තවද මෙම ඉඩම වාණිජ වටිනාකමක් සහිත ඉඩමක් ලෙස සලකා තක්සේරු කර තිබුණු නමුත් ඉඩමේ පිහිටීම අනුව වාණිජ වටිනාකමක් නොවීය. | | | |
| 09. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 හා 3.9.2 මාර්ගෝපදේශයන්ට පටහැනිව, යාපනය ශික්ෂණ රෝහලේ විශේෂඥ වෛද්‍යවරුන් 06 දෙනෙකු පමණක් සාමාජිකත්වය දරන, රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ලියාපදිංචි කර තිබුණු, ප්‍රජා පාදක සංවිධානයක් ලෙස සැලකිය නොහැකි හා ඉදිකිරීම්, පුහුණු හා සංවර්ධන ආයතනයේ (ICTAD)M8 ශ්‍රේණියේ හෝ ඊට ඉහළ ශ්‍රේණියක ලියාපදිංචිය ලබා නොතිබුණු යාපනය රෝහල් සංවර්ධන සංගමය වෙත 2016 | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 මාර්ගෝපදේශය නිවැරදි නොවන ලෙස අර්ථකථනය කර හා එම මාර්ගෝපදේශයේ සඳහන් කොන්දේසිවලට අනුකූල නොවන සේ කටයුතු කිරීම සම්බන්ධයෙන් යාපනය ශික්ෂණ රෝහලේ ප්‍රාදේශීය | රෝහල සංවර්ධනය කිරීමේ අරමුණින් පමණක් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.9.1 සහ 3.9.2 ප්‍රකාරව රුපියල් මිලියන 2ට නොවැඩි වැඩ, රෝහල් සංවර්ධන සමිතියට පැවරීමට කටයුතු කළ බව හා විගණන පරීක්ෂාවෙන් පසුව මෙම ක්‍රියාවලිය නවතා දැමූ බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් විමර්ශනයක් කිරීමට හා විගණකාධිපතිගේ නිර්දේශය ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි. |

වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 170 ක් වූ රු.මිලියන 2 ට අඩු කොන්ත්‍රාත් 310 ක් ප්‍රදානය කර තිබුණි. රජයේ ප්‍රසම්පාදන අත්පොතේ 3.9.1 ට පටහැනිව, යාපනය රෝහල් සංවර්ධන සංගමය වෙත ප්‍රදානය කර තිබුණු කොන්ත්‍රාත් 310 යාපනය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂවරයාගේ සභාපතීත්වයෙන් යුක්ත රෝහල් සුභසාධක සංගමය වෙත නැවත උප කොන්ත්‍රාත් ලබාදී තිබුණි. එපරිදි උප කොන්ත්‍රාත් ලබාගත් රෝහල් සුභසාධක සංගමය, ඉදිකිරීම්, පුහුණු හා සංවර්ධන ආයතනයේ (ICTAD) ලියාපදිංචි නොවූ, පූර්ව කොන්ත්‍රාත් පළපුරුද්දක් රහිත හා අදාළ වෘත්තීය දක්ෂතාවයකින් යුක්ත සේවකයන් රහිත ආයතනයක් වූ බැවින්, උපකොන්ත්‍රාත් 310 පෞද්ගලික මට්ටමින් වෘත්තිකයන් යොදවාගෙන නිමකර තිබුණි. ඉටුකළ සත්‍ය වැඩ ප්‍රමාණය මත (measure & pay) ගෙවීම් කළ යුතුව තිබුණු නමුත්, ඒ වෙනුවට ඇස්තමේන්තුගත ප්‍රමාණයන්ට හා රේටයන්ට අනුකූලවන ලෙස බිල්පත් පිළියෙල කර, එම බිල්පත් රෝහල් සංවර්ධන සංගමය මාර්ගයෙන් ඉදිරිපත් කර රෝහල්

ප්‍රසම්පාදන කමිටුව භාවගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය.

සුභසාධක සංගමය විසින් මුදල් ලබාගෙන තිබුණි.

අදාළ කාර්යය සඳහා Drawings පිළියෙල නොකර තීරණය කර තිබුණු ප්‍රමාණයන් පැහැදිළිව හඳුනාගත නොහැකි වූ අවස්ථා පැවති අතර ඇතැම් ප්‍රමාණයන්වල නිවැරදිතාවය තහවුරු කළ නොහැකි විය. ගොඩනැගිලි දෙපාර්තමේන්තු රේටයන් භාවිත නොකර වෙනත් රේටයන් භාවිතා කර පිළියෙල කර තිබුණු ප්‍රමාණ පත්‍රයන් නිවැරදි හා තාත්වික නොවීය. ප්‍රසම්පාදන කමිටුව විසින් යාපනය රෝහල් සංවර්ධන සංගමය වෙත ප්‍රජාපාදක සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ලබාදී තිබුණු සියළු කොන්ත්‍රාත් යාපනය රෝහල් සුභසාධක සංගමය වෙත කිසිදු ලාභාන්තිකයක් තබා ගැනීමකින් තොරව උප කොන්ත්‍රාත් ලබාදී තිබීම නිසා, ප්‍රසම්පාදන කමිටුවේ සභාපතීත්වය දරන රෝහල් අධ්‍යක්ෂවරයා විසින් තමා සභාපතීත්වය දරන රෝහල් සුභසාධක සංගමය වෙත වක්‍රාකාරව රෝහල් කොන්ත්‍රාත් ලබාගැනීමට කටයුතු කර තිබුණු බව තහවුරු විය.

| | | | | |
|---|---|---|---|---|
| 10. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් | වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් | මේ වන විට ප්‍රධාන ආපන ශාලා 03න් ලැබෙන ආදායම | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | තොරව යාපනය ශික්ෂණ රෝහලේ ගොඩනැගිලි ස්ථාන 08 ක් සුහසාධක සංගමය වෙත ලබාදී තිබුණි. ඉන් ස්ථාන 05 ක් සුහසාධක සංගමය විසින් පෞද්ගලික අංශය වෙත බදුදී ආදායම් උපයාගෙන තිබුණි. රෝහල වෙත අයවිය යුතු බදු ආදායම් සුහසාධක සංගමයට අයකර ගැනීමට ඉඩහැරීම නිසා රජයට අහිමි වී තිබුණු මුළු ආදායම රු.මිලියන 4.21 ක් වී තිබුණි. ඉතිරි ගොඩනැගිලි ස්ථාන 03 හි සුබසාධක සංගමය විසින් පවත්වා ගෙන යන ව්‍යාපාරික කටයුතු වලින් ලබන මාසික ආදායම් පරාසය රු.30,000 ත් රු.300,000 ත් අතර වුවද, රජයට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. තවත් ගොඩනැගිලි ස්ථාන 02 ක් යාපනය රෝහල් සංවර්ධන සංගමය වෙත හා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ යාපනය ශාඛාව වෙත ලබාදී තිබුණි. එම සංගම් විසින් උප බදුදී ආදායම් උපයා තිබුණු නමුත් රජයට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. | රජයේ ආදායමට බැර කරන බව හා අනෙකුත් කුඩා ව්‍යාපාර කටයුතු සුභ සාධක සංගමය විසින් සෙවකයින් හා රෝගීන් ඇතුළු අනෙකුත් පුද්ගලයනගේ සුභ සාධනය සඳහා පවත්වාගෙන යන බව. | |
| 11. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව අනුමත කර තිබුණු රු.මිලියන 40 ක මූල්‍ය සීමාව ඉක්මවා එකක් සඳහා රු.මිලියන 10.6 ක් බැගින් රු.මිලියන 53 ක් වැය කර වායු සමීකරණය කරන ලද | -එම- | ඉතා නුදුරු කාලයකදී සියළු වාහන භෞතිකව පරීක්ෂා කර තත්ත්ව වාර්තාවක් ලබා | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | සුඛෝපභෝගී ආසන 54 ක් සහිත බස් රථ 05 ක් හෙද විදුහල් 05 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණි. ශක්‍යතා අධ්‍යනයකින් තොරව මිලදී ගෙන තිබුණු මෙම බස් රථ හෙද විදුහල් පිහිටි පළාත්වල මාර්ගවල ධාවනය කිරීමේ අපහසුතාවය නිසාද, හෙද විදුහල් පරිශ්‍රවලට ඇතුළත් කළ නොහැකිවීම නිසාද, විවිධ තාක්ෂණික දෝෂ නිසාද ඌන උපයෝජිතව එම හෙද විදුහල්වල ගාල් කර තිබුණි. | | ගැනීමට කටයුතු කරන බව. | |
| 12. | අමාත්‍යාංශයේ ලේකම් නමින්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් නමින් හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අයත් විවිධ තනතුරු නාම නමින් ලියාපදිංචි වාහන 5,556 ක් පවතින බවට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත අනුව තහවුරු විය. නමුත් අමාත්‍යාංශයේ වාහන ලේඛනය අනුව එම ප්‍රමාණය 5,792 ක් වී තිබුණි. ඉන් වාහන 1,794 ක භෞතික පැවැත්ම තහවුරු කරගෙන නොතිබුණි. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අනුව අමාත්‍යාංශය සතු වුවද, අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ වාහන ලේඛනයේ ඇතුළත්ව නොතිබුණු වාහන 202 කින් භෞතික පැවැත්ම සනාථ නොවූ මෝටර් රථ හා යතුරු පැදි | අමාත්‍යාංශය සතු නමුත් පැවැත්ම හඳුනාගත නොහැකිවීම තුළ අස්ථානගතව ඇතැයි සැලකෙන වාහන සොයා ගැනීම සඳහා විධිමත් පියවර ගත යුතු අතර අදාළ පරිදි නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය. බාහිර පාර්ශවයන් වෙත පවරන ලද වාහන වල පැවරීමේ නීත්‍යානුකූලභාවය තහවුරු කිරීමට ස්වාධීන හා විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතුය. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | සත්‍යාපනය කර ගත යුතුව පැවති වාහන හා යතුරු පැදිවල ආදායම් බලපත්‍ර නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවා ඇති බව හා ශ්‍රී ලංකා පොලීසිය වෙත දැනුම්දී ඇති බව, හඳුනා ගැනීමට පැවති වාහනවල ලියාපදිංචි සහතික වල පිටපත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් කාර්යාලය වෙතින් ලබා ගත් බව, වාහන 08 ක් වෙනත් පාර්ශවයන් වෙත පවරාදී | භෞතික පැවැත්ම සනාථ නොවූ මෝටර් රථ හා යතුරු පැදි සියල්ල හඳුනාගැනීමට 2022 ජනවාරි 31 දින වන විටත් අපොහොසත්වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව 171 ක් විය. අමාත්‍යාංශය ඉදිරිපත් කළ වාහන ලේඛනයේ ඇතුළත්ව තිබුණු නමුත් බාහිර පාර්ශව වෙත පවරා තිබුණු බවට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් තහවුරු කළ මෝටර් රථ හා යතුරු පැදි 177 ක් එම පාර්ශව වෙත කුමන පදනමකින් පැවරුවේද යන්න තහවුරු කර නොතිබුණි. භෞතික පැවැත්ම සත්‍යාපනය කර ගැනීමට නොහැකි වූ මෝටර් රථ 584 ක් ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා 2017 මාර්තු 24 දින අමාත්‍යාංශ ලේකම් විසින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර තිබුණද එම ඉල්ලීම සඳහා අනුමැතිය ලබාදී නොතිබුණි. | විසින් ලබාදී තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. | ඇති ආකාරය පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහා මෝටර්රථ දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇති බව. | |
| 13. | 2018 වර්ෂයේදී වෛද්‍ය සැපයීම් අංශය විසින් හදිසි මිලදී ගැනීම් ලෙස දේශීය වෙළඳපලින් මිලදී ගැනීම් සිදු නොකළද, 2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා දේශීය මිලදී ගැනීම්වලදී දැරූ අතිරේක පිරිවැය වූ රු.මිලියන 5,358 ක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වෛද්‍ය සැපයීම් සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර එළඹී ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අතිරේක පිරිවැය අදාළ සැපයුම්කරුවන්ගෙන් අයකර වෛද්‍ය සැපයීම් අංශය වෙත එවීමට කටයුතු කරන ලෙස වාර්ෂිකව දැනුම් දී ඇති බව, 2016 සැප්තැම්බර් මාසයේ සිට සැපයුම්කරුවන්ගේ කාර්යසාධන ඇපකර අවලංගුවීමට පෙර දේශීය මිලදී ගැනීම් පිළිබඳ විස්තර මාස් | 2022 ජනවාරි 31 දින වන විට අතිරේක පිරිවැය වූ රු.මිලියන 5,358 කින් රු.මිලියන 83 ක් පමණක් අයකර තිබුණු අතර 2018-2020 කාලය තුළදී වැයකර තිබුණු අතිරේක පිරිවැය රු.මිලියන 678.9 කින් රු.මිලියන 94.9 ක් පමණක් අයකර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පතා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත යැවීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අධික අතිරේක පිරිවැයක් සහිතව වෛද්‍ය සැපයුම් දේශීය වෙළඳපලින් මිලදී ගනිමින් පැවතුණි. |
| 14. | 2018 වර්ෂයේදී වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩා 08 ක් තුළ පිරිවැය රු.මිලියන 31 ක හා අමාත්‍යාංශය යටතේ පවත්නා රෝහල් හා ආයතන 50 ක් තුළ පිරිවැය රු.මිලියන 95 ක වශයෙන් මුළු පිරිවැය රු.මිලියන 126 ක් වූ වෛද්‍ය සැපයීම් කල් ඉකුත්වී තිබුණු බව Pronto පරිගණක පද්ධතියෙන් ලබාගත් තොරතුරු අනුව තහවුරු විය. | විචලතාවයන් අවම වන ආකාරයට තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර ඒ මත පදනම්ව ඇණවුම් ඉදිරිපත් කිරීමටත්, සෙමින් චලනය වන අයිතමයන්හි ඉල්ලුම අඩුවීම සම්බන්ධව නිරන්තර අධ්‍යයනයන් සිදු කර කල් ඉකුත්වීම් හැකිතාක් අවම කර ගැනීමටත් කටයුතු කළ යුතුය. කෙටි ජීවකාලයක් සහිත අයිතම මිලදී ගැනීම හැකිතාක් සීමා කළ යුතු අතර කල් ඉකුත් වීමට වගකිවයුතු පාර්ශවයන් ගෙන් පාඩුව අයකළ යුතුය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් කල් ඉකුත්වීම් අවම කර ගැනීමට නොහැකිවී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 15. | සියළුම රජයේ රෝහල් හා ආයතන සඳහා ඉහළ වටිනාකමින් යුක්ත වෛද්‍ය උපකරණවල සමස්ථ අවශ්‍යතාවය ඇස්තමේන්තු කර, ලැබී ඇති ප්‍රතිපාදන අනුව ප්‍රමුඛතා ලැයිස්තු පිළියෙල කර එකවර ප්‍රසම්පාදනය කිරීම තුළින් වට්ටම් හා පිරිවැය අවමවීම් වැනි වාසි ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.<br>ඒ වෙනුවට ඒ ඒ රෝහල් වෙත ප්‍රතිපාදන බෙදාහැර ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු මගින් වෛද්‍ය උපකරණ මිලදී ගැනීමට ඉඩකඩ සලසා තිබුණි.<br>2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වාවූ වර්ෂ 05 තුළදී අමාත්‍යාංශය විසින් ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය වෙත සලසා තිබුණු සමස්ථ ප්‍රතිපාදනයවූ රු.මිලියන 20,163.29 න් සියයට 49 ක් වූ රු.මිලියන 9,885.18 ක ප්‍රතිපාදන ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් කිසිදු අධිකාරී බලයකින් තොරව රෝහල් වෙත බෙදා දී තිබුණි. | සියළුම රජයේ රෝහල් හා ආයතන සඳහා ඉහළ වටිනාකමින් යුක්ත වෛද්‍ය උපකරණවල සමස්ථ අවශ්‍යතාවය ඇස්තමේන්තු කර, ලැබී ඇති ප්‍රතිපාදන අනුව ප්‍රමුඛතා ලැයිස්තු පිළියෙල කර අවශ්‍යතාවය එකවර ප්‍රසම්පාදනය කළ යුතුය. ඒ වෙනුවට ඒ ඒ රෝහල් වෙත ප්‍රතිපාදන බෙදාහැර ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු මගින් වෛද්‍ය උපකරණ මිලදී ගැනීමට කටයුතු කිරීම නවතා දැමිය යුතුය. සුළු පිරිවැයක් සහිත උපකරණ හදිසි අවශ්‍යතාවය මත මිලදී ගැනීමට පමණක් රෝහල් වෙත ප්‍රතිපාදන ලබාදිය යුතුය. | ඇතැම් රෝහල්වල ප්‍රමුඛ අවශ්‍යතා ඉතා ඉක්මනින් ඉටුකළ යුතු බැවින් හා හදිසියේ ඇති වන ආපදා තත්ව, වසංගත තත්ත්ව හෝ හදිසි මිලදී ගැනීම් හා රෝහල්වලට කාලීනව අවශ්‍ය වන වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදන සැළැස්මට ඇතුළත් කිරීමට නොහැකි වන නිසා එම රෝහල්වලට ප්‍රතිපාදන ලබාදීම සාමාන්‍ය ක්‍රමවේදය බව. | 2022 ජනවාරි 31 දින වන විටත් සමස්ථ රෝහල් අවශ්‍යතාවය හඳුනාගෙන ප්‍රසම්පාදනයන් සිදු නොකරන අතර විවිධ ආයතන හා ව්‍යාපෘති විසින් අදාළ ප්‍රසම්පාදනයන් සිදුකරනු ලැබේ. |
| 16. | ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් එකිනෙක ජීව වෛද්‍ය උපකරණ සඳහා නිශ්චිත තාක්ෂණික පිරිවිතර පිළියෙල කර නොතිබුණි. ඒ වෙනුවට වෙළඳපොලේ පවතින උපකරණවල තාක්ෂණික | එකිනෙක ජීව වෛද්‍ය උපකරණ සඳහා නිශ්චිත තාක්ෂණික පිරිවිතර පිළියෙල කළ යුතුය. | 2019 වසරේ සිට ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයේ වෙබ් අඩවියෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර ඇති | 2022 ජනවාරි 31 දින වන විටත් සියළු වෛද්‍ය උපකරණවලට අදාළ තාක්ෂණික පිරිවිතර සකස් කර අනුමත කිරීමක් |

| | | | | |
|---|---|---|---|---|
| | පිරිවිතර භාවිතා කිරීමට හෝ වෛද්‍යවරුන්ගේ නිර්දේශ මත පිරිවිතර පිළියෙල කිරීමට කටයුතු කර තිබුණි. Anaesthetic Machine with Ventilators මිලදී ගැනීමේදී ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය හා කළුතර දිස්ත්‍රික් රෝහල විවිධ පිරිවිතර භාවිතා කර තිබුණු බැවින් පිළිවෙලින් ඒකකයකට රු.මිලියන 3.07 ක් හා රු.මිලියන 6.10 ක් ගෙවීමට සිදුවී තිබුණි. එසේම වෙළඳපොලේ පවතින උපකරණවල තාක්ෂණික පිරිවිතර භාවිතා කර ලංසු කැඳවා තිබීම හේතුවෙන් 2016 වර්ෂයේදී ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් මිලදී ගෙන තිබුණු Neuro Navigator System & O-arm එකක් සඳහා පිළියෙල කර තිබුණු පිරිවිතර හා 2018 වර්ෂයේදී කළුතර මූලික රෝහල විසින් මිලදී ගෙන තිබුණු Anaesthetic Machine With Ventilator 04 ක් සඳහා පිළියෙල කර තිබුණු පිරිවිතර එක් ලංසුකරුවෙකු පමණක් සම්පූර්ණ කර තිබුණි. | | Stranded technical specification තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා භාවිතා කළ හැකි බව. | හෝ සකස් කර අනුමත කර ඇති තාක්ෂණික පිරිවිතර යොදා ගැනීම අනිවාර්ය කිරීම හෝ සිදුකර නොතිබුණි. |
| 17. | ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් හෝ රෝහල් විසින් මිලදී ගන්නා ජීව වෛද්‍ය උපකරණ සම්බන්ධයෙන් Manufacturer Certificate ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් මිලදී ගන්නා | ITB 11.1 (e) මගින් Manufacturere Authorisation ඉල්ලා තිබුණු නමුත් Manufacturer Certificate ඉල්ලා නොතිබුණු බැවින්, | මෙම සහතිකය, ටෙන්ඩර් ඇගයීම් ක්‍රියාවලියේදී මූලිකවම සලකා බලන නිර්නායකයක් වන බව හා ITB 11.1 (e) මගින් | 2022 ජනවාරි 31 දින වන විටත් ITB 11.1 (e) **මගින්** Manufacturere Authorisation **ඉල්ලා තිබුණු** |

| | | | | |
|---|---|---|---|---|
| | උපකරණ, අදාළ නිෂ්පාදකයා විසින් අදාළ රටේ නිෂ්පාදනය කරන ලද ඒවාද යන්න තහවුරු කර ගැනීමකින් තොරව වරායෙන් නිෂ්කාශණය කර තිබුණි. මහරගම අපේක්ෂා රෝහල සඳහා මිලදී ගෙන තිබුණු පිරිවැය රු.මිලියන 192.33 ක් වූ පෙට් සීටී ස්කෑනර් (Pet CT Scanner)යන්ත්‍රය හා ජාතික රෝහලේ ස්ථාපිත ජාතික අපස්මාර ඒකකය සඳහා මිලදී ගෙන තිබුණු පිරිවැය රු.මිලයන 732.76 ක් වූ ජීව වෛද්‍ය උපකරණ 4 ක් සඳහා Manufacturer Certificate ලබා ගෙන නොතිබීම නිදසුනක් ලෙස දැක්විය හැකි වේ. | මිලදී ගනු ලබන සෑම ජීව වෛද්‍ය උපකරණයක් සම්බන්ධයෙන් Manufacturer Certificate ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | Manufacturer certificate ලබාදීම පිළිබඳ උපදෙස් ලබාදී ඇති බව. | **නමුත්** Manufacturer Certificate **ඉල්ලා නොතිබුණි.** |
| 18. | 2015 අංක 05 දරන ජාතික නියාමන අධිකාරිය පනතේ 83(4)(ආ) වගන්තිය ප්‍රකාරව, ආනයනය කිරීමට යෝජිත ජීව වෛද්‍ය උපකරණ ලංකාවේ භාවිතය සඳහා සුදුසුද නැද්ද යන්න පිළිබඳව ඇගයීම් කොට ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිකුත් කරන සහතිකය (NMRA Certificate), ජීව වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටියේදී සලකා බැලිය යුතු අත්‍යාවශ්‍ය ලියකියවිල්ලක් වේ. සමහර අවස්ථාවලදී ලංසු කැඳවීම් කරනු ලබන දිනට එම සහතිකයේ වලංගුතාවය පමණක් | Bidding data sheet ITB 4.1 හි **ඉතා පැහැදිලිව සඳහන්** කර තිබුණද ලංසු ඇගයීමේදී ඒ බව සලකා නොතිබුණු බැවින් ලංසු ඇගයීමේදී උපකරණ මාදිලිය සමගින් NMRA සහතිකයේ වලංගුතාවය පිළිබඳව සලකා බලා තීරණ ගත යුතුය. | ලංසු ඇගයීමේදී ප්‍රධාන වශයෙන් NMRA සහතිකය උපකරණයේ මාදිලිය, සහතිකයේ වලංගුතාවය පිළිබඳව සලකා බලන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් රු.මිලියන 3.05 ක මූල්‍යමය පාඩුවක් සිදුවීමට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන එම පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඇගයීමට ලක්කර එහි ඇතුළත් විය යුතු උපකරණ මාදිලිය පිළිබඳව සලකා බලා නොතිබුණි. තවත් සමහර අවස්ථාවලදී එම සහතිකයේ ඇතුළත් විය යුතු උපකරණ මාදිලිය සමගින් එහි වලංගුතාවය පිළිබඳව සලකා බලා තිබුණි. නිදසුනක් ලෙස 2014 වර්ෂයේදී ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් Ultra Sound Scanner එකක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට ඉදිරිපත් කර තිබුණු NMRA සහතිකයේ උපකරණ මාදිලිය දක්වා නොතිබුණු නමුත් ඒ බව නොසලකා අදාළ ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබීමත්, 2018 වර්ෂයේදී එම අංශය විසින් Ultra Sound Scanner එකක් ප්‍රසම්පාදනයේදී NMRA සහතිකයේ මාදිලිය දක්වා නොතිබීම මත අදාළ ලංසුව ප්‍රතික්ෂේප කර තිබීමත් දැක්විය හැකි වේ. NMRA සහතිකයේ මාදිලිය දක්වා නොතිබීම සැලකිල්ලට ගෙන ලංසුව ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් රු.මිලියන 3.05 ක මූල්‍යමය පාඩුවක් සිදුවී තිබුණි. | | | |
| 19. | ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් 2012 වර්ෂයේදී ආරම්භකර තිබුණු ICU Ventilators 64 ක ප්‍රසම්පාදනය | තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශය හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය | ICU Ventilators සඳහා standard technical specification ජීව | 2022 ජනවාරි 31 දින වන විටත්මේ පිළිබඳව ස්වාධීන විධිමත් |

2017 ජූලි 05 දින අවලංගු කර, 2017 හා 2018 වර්ෂවලදී රු.මිලියන 211.69 ක් වැයකර ICU Ventilators 76 ක් මිලදී ගෙන තිබුණි. ICU Ventilators 76 ප්‍රසම්පාදනයට පෙර, 2012 වර්ෂයේදී ආරම්භ කර තිබුණු ICU Ventilators 64 ක ප්‍රසම්පාදනයේ පළමු අවම ලංසුව වූ එකකට රු.මිලියන 1.55 ක් ඉදිරිපත් කර තිබුණු ලංසුකරු විසින් තීරණාත්මක අවශ්‍යතා (''C'' /Critical Requirements) ලෙස සඳහන් කර තිබුණු සියළු තාක්ෂණික පිරිවිතර සපුරා තිබියදී හා ලංසුකරුවන් සඳහා වූ උපදෙස් (Instructions to Bidders /ITB Clauses) උල්ලංඝනය කර නොතිබියදී, සාධාරණ හා පිළිගත හැකි පදනමකින් තොරව වැඩි දියුණු නොවූ මාදිලියක් (Model) යැයි සඳහන් කරමින් එම ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි. දෙවන අවම ලංසුව සහිත ලංසුකරු වෙත ප්‍රසම්පාදනය පිරිනැමීමේ නිර්දේශය හා අනුමැතිය ලබාදීමෙන් පසුව සම්පූර්ණ ප්‍රසම්පාදනය 2017 ජූලි 05 දින අවලංගු කර තිබුණි. ඒ අනුව ICU Ventilators 64 ක් රු.මිලියන 99.46 කට මිලදී ගැනීමට තිබුණු අවස්ථාව අහිමි වී තිබුණි. ඉන් පසුව පිරිවිතර වෙනස්කර නැවත ලංසු කැඳවමින්, අවලංගු කළ

නිවැරදි නොවන බැවින් ICU Ventilators 64 හි ප්‍රසම්පාදනය අවලංගු කිරීම පිළිබඳව ස්වාධීන විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන රු.මිලියන 92.88 ක මූල්‍ය පාඩුව අයකර ගත යුතු වීම.

වෛද්‍ය ඉංජිනේරු අංශය විසින් සකස් කර වෙබ් අඩවියේ පල කර ඇති බව හා මෙම උපකරණ මිලදී ගැනීමේදී එම පිරිවිතර භාවිතා කිරීමට කටයුතු කිරීම මඟින් ඉදිරියේදී මෙවැනි ගැටළු සහගත සිදුවීම් ඇති වීම වලක්වා ගත හැකි බව.

පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන රු.මිලියන 92.88 ක මූල්‍ය පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ප්‍රසම්පාදනයේ දෙවන අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරුගෙන් සමාන මාදිලියක (Model) ICU Ventilators 76 ක් එකක් රු.මිලියන 2.78 ක් බැගින් මිලදී ගෙන තිබීමෙන් රජයට දැරීමට සිදුවී තිබුණු මූල්‍ය පාඩුව රු.මිලියන 78.80 ක් විය.

පිරිවිතර වෙනස් කිරීම හේතුවෙන් ICU Ventilators හි සංදර්ශන තිරයේ (Display Screen) හි විකර්ණය අඟල් 3 කින් පමණක් වැඩිවී තිබුණු අතර ඒ සඳහා එකකට රු.මිලියන1.23 ක් වැඩියෙන් ගෙවීම සාධාරණ නොවන බව නිරීක්ෂණය විය.

එසේම ICU Ventilators 64 සඳහා අවම ලංසුව ඉදිරිපත්කර තිබුණු ලංසුකරු විසින් අවශ්‍යතා පිරිවිතරයට අනුකූලව අඟල් 12 ක විකර්ණයකින් යුක්ත සංදර්ශන තිරයක් (Display Screen) සැපයීමට ඉදිරිපත්වී තිබුණු අතර අවශ්‍ය නම් අමතර උපාංගයක් ලෙස අඟල් 15 ක විකර්ණයක් සහිත සංදර්ශන තිරයක් එකක් රු.40,000 කට සැපයිය හැකි බව දන්වා තිබුණි. නමුත් ඒ පිළිබඳව නොසලකා පළමු ප්‍රසම්පාදනය අවලංගු කර දෙවන ප්‍රසම්පාදනයේදී එකකට රු.මිලියන 1.23 ක් වැඩියෙන් ගෙවා මිලදී ගෙන තිබුණු

උපකරණයේ සංදර්ශන තිරයේ විකර්ණය අඟල් 5.5 ක් වූ අතර අමතර උපාංගයක් ලෙස අඟල් 15 කින් යුක්ත විකර්ණයක් සහිත සංදර්ශන තිරයක් සපයා තිබුණි.

ICU Ventilators 64 හි තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයින් දෙදෙනෙකුවූ නිර්වින්දන විශේෂඥවරුන්ගේ සංගමයේ එවකට සභාපති හා ලේකම් විසින් ඉදිරිපත් කර තිබුණු වාර්තාවක් පදනම් කර ගනිමින් පළමු අවම ලංසුව ප්‍රතික්ෂේප කර දෙවන අවම ලංසුව සහිත ලංසුකරු වෙත ප්‍රසම්පාදනය පිරිනැමීමේ නිර්දේශය හා අනුමැතිය ලබාදී තිබුණි. වාර්තාව පිළියෙල කිරීමට මැදිහත්වූ නිර්වින්දන විශේෂඥවරුන්ගේ සංගමයේ සාමාජිකයින් විසින් එම වාර්තාවට අත්සන් තබා නොතිබීමත්, එම ලංසුකරුවන් දෙදෙනා විසින් ඉදිරිපත්කර තිබුණු උපකරණවල මාදිලියට සම්පූර්ණයෙන් පටහැනි මාදිලි දෙකක් සසඳමින් එම වාර්තාව පිළියෙල කර තිබීමත් හේතුවෙන් නීත්‍යානුකූල නොවූ හා පදනමක් ලෙස ගත නොහැකි වාර්තාවක් පදනම් කර ගෙන එම නිර්දේශය හා අනුමැතිය ලබාදී තිබුණි.

ICU Ventilators 76 හි සැපයුම්කරු පෙර ප්‍රසම්පාදනයකදී ව්‍යාජ ලේඛන

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිරිපත් කිරීම මත ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබුණි. නමුත් එම නෛතික ක්‍රියාමාර්ග අවසන් කර නොතිබියදීත් ලංසු ඇගයීම් කර කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | | | |
| 20. | ඩෙංගු අධි වසංගත තත්ත්වයට මුහුණදීම සඳහා 2017 අප්‍රේල් 20 දිනට පෙර මඩකලපුව, කරාපිටිය, දකුණු කොළඹ හා උතුරු කොළඹ ශික්ෂණ රෝහල්වලත්, ත්‍රිකුණාමලය, මාතර හා හම්බන්තොට මහ රෝහල්වලත් සහ පානදුර මූලික රෝහල තුළත් ඩෙංගු දැඩි සත්කාර ඒකක පිහිටුවීමට රු.මිලියන 186.15 ක පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේඋපදෙස් ප්‍රකාරව, හදිසි අවශ්‍යතාවය මත තොග ඇතැති (Ex-stock)ලංසුකරුවන්ට ප්‍රමුඛතාවය ලබාදී Multipara Monitors 300 ක් මිලදී ගැනීමට තීරණය කර තිබුණි. තාක්ෂණික ඇගයීම් වාර්තාවට අනුව තොග ඇතැති (Ex-stock) එක් ලංසුකරුවකු පමණක් Multipara Monitors එකක් සඳහා රු.324,000 ක් වූ 09 වන ලංසුව ඉදිරිපත් කර තිබුණු අතර පළමු | තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය හා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය නිවැරදි නොවන බැවින් Multipara Monitors 100 ක් මිලදී ගැනීම පිළිබඳව ස්වාධීන විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන රු.මිලියන 20.72 ක මූල්‍ය පාඩුව අයකර ගත යුතු වීම. | මෙම වකවානුවේ පැවති ඩෙංගු අධි වසංගත තත්ත්වය හේතුවෙන් පිරිවිතර සපුරාලන අතැති තොග පවතින එකම සැපයුම්කරු NextagenHealth care පමණක් වීම නිසා එම ආයතනයෙන් Multypara Monitors මිලදී ගැනීමට සිදුවූ බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මේ පිළිබඳව ස්වාධීන විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන රු.මිලියන 20.72 ක මූල්‍ය පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අවම ලංසුව රු.116,750 ක් විය. 09 වන ලංසුකරු විසින් ඉදිරිපත් කළ Multipara Monitors වල තාක්ෂණික පිරිවිතර සම්පූර්ණ කර නොතිබියදී එකක් රු.324,000 ක් බැගින් 100 ක් මිලදී ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබුණි. ඵලදායී තරඟකාරී බවක් නොමැති බව පැහැදිලිව පෙනෙන විට ඇගයීම් නොකළ යුතු වුවත් පැවති තොග මත එක් ලංසුකරුවකු ඇගයීම් කර අවම ලංසුව වූ රු.116,750 මෙන් සියයට 173 කින් වැඩි මිලකට කොන්ත්‍රාත්තුව පිරිනැමීම නිසා සිදු වූ පාඩුව රු.මිලියන 20.72 ක් විය. | | | |
| 21. | මහනුවර ජාතික රෝහල් පරිශ්‍රය ජාලගත කිරීම හා සෞඛ්‍ය තොරතුරු කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 59.49 ක වැට් බදු සහිත මුදලකට පිරිනමා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමට පටහැනිව දින 230 ක කාල ප්‍රමාදයකින් පසුව 2019 ජනවාරි 25 දින වැඩ නිමකර තිබුණු නමුත් 2016 නොවැම්බර් 07 දින වන විට කොන්ත්‍රාත්තුවේ අවසන් බිල්පත සඳහා ගෙවීම් සිදුකර තිබුණු අතර දින 230 ක් සඳහා රු.මිලියන 6.49 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කිරීමට පෙර අවසන් බිල්පත සඳහා ගෙවීම් සිදුකිරීමහා ප්‍රමාද ගාස්තු අය නොකිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකළ යුතුය. පද්ධතිය පිහිටුවීමේ අරමුණු හා අපේක්ෂිත නිමවුම ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. | කොන්ත්‍රාත් මුදලින් සියයට 5 ක රඳවුම් මුදල වන රු.2,825,901 ක් 2019 අගෝස්තු 07 දින රජයේ ආදායමට බැර කළ බව හා සෞඛ්‍ය තොරතුරු කළමනාකරණ පද්ධතිය පියවරෙන් පියවර ක්‍රියාත්මක කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මේ පිළිබඳව පරීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර රඳවුම් මුදල් රජයේ ආදායමට බැර කිරීම පමණක් සිදුකර තිබුණි. තවද චර්ම රෝග සායනය හා දියවැඩියා සායනය හැරුණු කොට අනෙකුත් ඒකක 04 හි පද්ධතිය |

| | | | | |
|---|---|---|---|---|
| | රසායන ව්‍යාදීවේදී රසායනාගාරය, බාහිර රෝගී රසායනාගාරය, බාහිර රෝගී පරීක්ෂණ ඒකකය, රෝගීන් සඳහා ඖෂධ නිකුත් කරන ස්ථානය, චර්ම රෝග සායනය හා දියවැඩියා සායනය යන ස්ථානවල 2019 නොවැම්බර් 11 සහ 2019 නොවැම්බර් 27 දිනවල සිදුකළ ස්ථානීය පරීක්ෂාවන්හිදී එම අංශවල සෞඛ්‍ය තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක නොවන බවත්, පද්ධතිය පිහිටුවීමේ අරමුණ හා අපේක්ෂිත නිමවුම ලඟාකර ගෙන නොතිබුණු බවත් නිරීක්ෂණය විය. සෞඛ්‍ය තොරතුරු කළමනාකරණ පද්ධතිය සඳහා රෝහලෙන් මිලදී ගෙන තිබුණු හා අමාත්‍යාංශයෙන් ලබාදී තිබුණු තීරු කේතකකියවන යන්ත්‍ර 125 ක් සහ තීරු කේතක මුද්‍රණ යන්ත්‍ර 03 ක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව රෝහල් ගබඩාව තුළ පැවති අතර, අංශ 04 ක් වෙත නිකුත් කර තිබුණු තීරු කේතක මුද්‍රණ යන්ත්‍ර 02 ක් හා ලැප්ටොප් පරිගණක 07 ක්ද නිෂ්කාර්යව පැවතුණි. | | | ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. |
| 22. | වෛද්‍ය පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥ, විකිරණ ශිල්පී, භෞත චිකිත්සක සහ විද්‍යුත් ඛන්තු රේඛන ශිල්පී යන තනතුරු දරන පරිපූරක වෛද්‍ය සේවයේ | වර්තමාන තාක්ෂණික වෙනස්කම් හා අදාළ අනෙකුත් කරුණු සැලකිල්ලට ගෙන සේවා මුර ක්‍රමය | අමාත්‍යාංශ විසින් පරිපූරක වෛද්‍ය සේවයේ නිලධාරින් වෙනුවෙන් ප්‍රායෝගිකත්වයෙන් | 2022 ජනවාරි 31 දින වන විටත් විගණන නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

නිලධාරීන් වෙනුවෙන් සාමාන්‍ය රාජකාරී වේලාවෙන් පරිබාහිරව සිදුකරනු ලබන වෛද්‍ය පරීක්ෂණ සඳහා නිදර්ශක දීමනා ගෙවීම ඉතා පැරණි චක්‍රලේඛයක් පදනම් කර ගනිමින් සිදුකර තිබුණි. තවද, වර්තමානයේදී රසායනාගාර, විකිරණ අංශ හා භෞත චිකිත්සක අංශ ඉතා පුළුල් වීම, නවීන උපකරණ මගින් පරීක්ෂණ සිදු කිරීම හා අදාළ අංශවලට පරිපූරක වෛද්‍ය සේවයේ නිලධාරීන් වැඩියෙන් යොදවා තිබීම යන කරුණු පිළිබඳව සලකා බලා වැඩ මුර ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් අතිකාල හා නිදර්ශක දීමනා අවම කිරීමට කටයුතු කර නොතිබුණු බවත්, වෛද්‍යවරයා විසින් ලියන ලද පරීක්ෂණයේ අන්තර්ගත සංයුක්තයන් (compounds/constituents) කිහිපයක්, වෙන වෙනම පරීක්ෂණ ලෙස දක්වා නිදර්ශක දීමනා ගෙවීම හේතුවෙන් වැඩිපුර මුදල් ගෙවා තිබුණු බවත්, සාමාන්‍ය රාජකාරී වේලාව සහ සාමාන්‍ය රාජකාරී වේලාවෙන් පරිබාහිරව සිදුකරනු ලබන පරීක්ෂණ සඳහා වෙන වෙනම වාර්තා පවත්වා නොතිබුණු බවත්, විවිධාකාරයෙන් ව්‍යාජ සටහන් හා වාර්තා පවත්වා ගනිමින් නිදර්ශක දීමනා වැඩියෙන් ක්‍රියාත්මක කිරීම තුළින් අතිකාල හා නිදර්ශක දීමනා සඳහා ස්ථිර පොදු නිර්ණායකයන් ස්ථාපිත කිරීමටත් ඒ අනුව චක්‍රලේඛය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුය. වැඩිපුර ගෙවා තිබුණු දීමනා ආපසු අය කළ යුතුය.

හා සධාරණත්වයෙන් යුත් අතිකාල දීමනා ගෙවීමේ පදනමක් අනුමත කර රෝහල් වෙත දන්වන්නේ නම් එය ක්‍රියාත්මක කළ හැකි බව.

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගෙවන බවත්, සාමාන්‍ය රාජකාරි කාලය තුළ සිදුකර තිබුණු පරීක්ෂණ ගණන මෙන් තුන් ගුණයක පමණ පරීක්ෂණ ප්‍රමාණයක් සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පසුව සිදුකර නිදර්ශක දීමනා ලබා ගෙන තිබුණු බවත් හා සමහර පරීක්ෂණයන් පිළිබඳ තොරතුරු ඇතුළත් කිසිදු ලේඛනයක් පවත්වා නොතිබුණු නමුත් නිදර්ශක දීමනා ගෙවා තිබුණු බවත් මාතර, පොළොන්නරුව, බදුල්ල හා යාපනය යන මහ රෝහල් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණයකදී අනාවරණය විය. | | | | |
| 23. | මානව සම්පත් තොරතුරු පද්ධතියේම කොටසක් වශයෙන්, රාජකාරි විදේශ ගමන් සඳහා යාවත්කාලීනව මධ්‍යගත තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ජාත්‍යන්තර සෞඛ්‍ය අංශය තුළ රු.මිලියන 4.75 ක් වැය කර ස්ථාපනය කර තිබූණු Fellowship Information System දත්ත පද්ධතියට යාවත්කාලීනව නිසි පරිදි දත්ත ඇතුළත් කර නොතිබුණි. ඒ හේතුවෙන් එකී දත්ත පද්ධතිය ස්ථාපිත කිරීමෙන් අමාත්‍යාංශය අපේක්ෂා කළ අරමුණු ඉටුවී නොතිබුණි. | දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතුය. | විගණන නිරීක්ෂණය නිවැරදි බව. වැළැක්වීමේ ක්‍රියාමාර්ග දක්වා නැත. | 2022 ජනවාරි 31 දින වන විටත් විගණන නිර්දේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | |

| | | | | |
|---|---|---|---|---|
| 24. | 2017 නොවැම්බර් 24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, නිවාස හා ඉදිකිරීම් කටයුතු අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතියට යටත්ව පිරිමැවුම්කර ඉදිකිරීමේ පදනම මත බදු සහිත රු.මිලියන 1,330.40 ක පිරිවැය ඇස්තමේන්තුවකට හොරණ මූලික රෝහලේ ශල්‍යාගාර සහිත සය මහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත 2017 නොවැම්බර් 27 දින ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපියට අනුව කොන්ත්‍රාත් ප්‍රදානය කළ දින සිට දින 14 ක් ඇතුළත වැඩ ආරම්භ කර එදින සිට මාස 24 ක් ඇතුළත එනම් 2019 නොවැම්බර් 27 දින ව්‍යාපෘතිය අවසන් කළ යුතු විය. නමුත් මාස 10 ක ප්‍රමාදයකින් පසුව වැඩබිම නිසි පරිදි භාරදී තිබුණි. ව්‍යාපෘතිය අදියර වශයෙන් නිම කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී නොතිබුණු නමුත්, රු.මිලියන 1,330.40 ක් වූ පිරිවැය ඇස්තමේන්තුව යෝජිත ගොඩනැගිල්ලේ පළමු අදියර සඳහා පමණක් වන බවත්, සම්පූර්ණ ගොඩනැගිල්ල සඳහා රු.මිලියන 2,400 ක් ආසන්න | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව වැඩ අවසන් කරවා ගැනීමට නිසි අධීක්ෂණයකින් යුතුව කටයුතු කළ යුතුය. | -එම- | 2022 ජනවාරි 31 දින වන විටත් ඉදිකිරීම්වල සතුටුදායක ප්‍රගතියක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ලබාදුන් අත්තිකාරම් මුදලටවත් ප්‍රමාණවත් වන පරිදි ව්‍යාපෘතියේ වැඩ නිමකර නොතිබුණි. ඒ අනුව එදිනට ආවරණය කර නොගත් අත්තිකාරම් මුදල රු.187,482,549 ක් විය. |

| | | | | |
|---|---|---|---|---|
| | වශයෙන් වැයවන බවත් ඒ අනුව දෙවන අදියර සඳහාද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු බවත් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් යෝජනා කර තිබුණි. පැන නැගී ඇති ගැටළු නිරාකරණය කර ගැනීමට අමාත්‍යාංශය විසින් විගණන දිනය වූ 2020 මැයි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණු අතර 2019 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 10 ක් පමණ විය. | | | |
| 25. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (iv) හා 5.3.1 (ඇ) මාර්ගෝපදේශ හා රජයේ ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයේ 2.11.3, 2.12 හා 6.3.6 හි සඳහන් විධිවිධාන අනුගමනය නොකර මහරගම අපේක්ෂා රෝහල විසින් 2018 වර්ෂයේ දී රු.මිලියන 5.44 ක් වැය කර විශේෂිත පිළිකා නාශක ඖෂධ ගබඩාකර තැබීමට නොසුදුසු පිරිවිතර සහිත ශීත කන්ටේනරයක් මිලදීගෙන වර්ෂයකට වඩා වැඩි කාලයක සිට නිශ්කාර්යව තබා තිබුණු අතර එහි වගකීම් කාලයද ඉකුත්වී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6. (අ) හා ලංසු ලියවිලිවල 2.8.2 ඡේදය ප්‍රකාරව, කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 05 ක් වූ | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශසංග්‍රහයේ මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ 2 කොටසේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. | -එම- | 2022 ජනවාරි 31 දින වන විටත් ඖෂධ ගබඩා කිරීමේ ශිත කන්ටේනරය භාවිතයට ගෙන නොතිබුණු අතර ආයතන සංග්‍රහයේ 2 කොටසේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.මිලියන 0.27 ක රැඳවුම් මුදල වර්ෂයකින් එළඹෙන සෑහීමකට පත් සේවා කාලයකින් පසුව නිදහස් කළ යුතු වුවත් එපරිදි කටයුතු නොකර සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි. ප්‍රමාද ගාස්තු අයකිරීම් සම්බන්ධයෙන් වගන්තියක් ගිවිසුමට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් මාස 09 ක ප්‍රමාද ගාස්තු අයකළ නොහැකිවී තිබුණි. | | | |
| 26. | කොළඹ ජාතික රෝහලේ රෙදි පිරිසිදු කිරීමේ සේවාව සපයන විදුලි ලොන්ඩ්‍රිය වෙත රු.මිලියන 2.98 ක් වැය කර 2018 මැයි 23 දින මිලදී ගෙන තිබුණු විදුලි අයන් රෝල පරිහරණය කිරීමේ අපහසුතාවය හේතුවෙන් පාවිච්චියට නොගෙන නිෂ්කාර්යව තබා තිබුණි. | විදුලි අයන් රෝල පාවිච්චියට ගැනීමට කටයුතු කළ යුතුය. | -එම- | 2022 ජනවාරි 31 දින වන විටත් විදුලි අයන් රෝල පාවිච්චියට නොගෙන නිෂ්කාර්යව තබා තිබුණි. |
| 27. | කන්තලේ මූලික රෝහල විසින් රු.මිලියන 110.22 ක් වැය කර මිලදී ගෙන තිබුණු වෛද්‍ය උපකරණ 30 ක් හා ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් මිලදී ගෙන එම රෝහල වෙත ලබාදී තිබුණු වටිනාකම හෙළිදරව් නොකෙරුණු වෛද්‍ය උපකරණ 49 ක් එම රෝහලේ ස්ථාපිත දැඩිසත්කාර ඒකකය වෙත ලබාදී තිබුණු නමුත් නිර්වින්දන වෛද්‍යවරුන් නොමැතිවීම හේතුවෙන් 2016 දෙසැම්බර් සිට | නිර්වින්දන වෛද්‍යවරුන් රෝහල වෙත ලබා දීමට කටයුතු කර රෝගී සත්කාර සේවාව සඳහා දැඩි සත්කාර ඒකකය යොදා ගැනීමට කටයුතු කළ යුතුය. | -එම- | 2022 ජනවාරි 31 දින වන විටත් දැඩි සත්කාර ඒකකය ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | 2018 ජූලි මාසය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ එම ඒකකය වරින් වර වසා දමා තිබුණි. 2018 අගෝස්තු මාසයෙන් පසු එම ඒකකය දැඩි උපස්ථාන ඒකකයක් ලෙස පවත්වාගෙන ගොස් තිබුණි. | | | |
| 28. | වකුගඩු රෝගීන්ගේ සංඛ්‍යාව ඉහල යාමේ ප්‍රවනතාවයට පිළියම් ලෙස වකුගඩු රෝගී සත්කාර සේවාව ප්‍රාදේශීයව ලබාදීමේ අරමුණින් 2015 වර්ෂයේදී රු.මිලියන 3.78 ක් වැයකර කන්තලේ මූලික රෝහල තුළ රුධිරය කාන්දු පෙරණ ඒකකයක් ඉදිකර තිබුණි. 2017 වර්ෂයේදී රු.මිලියන 11.94 ක් වැයකර ඩයලිසීස් (Dialysis) යන්ත්‍ර 03 ක් හා මල්ටි පැරා මොනිටර්ස් ( multi Para monitors ) 03 ක් ඇතුළුව එම ඒකකය සඳහා උපකරණ 44 ක් මිලදී ගෙන තිබුණි. ඒකකයට අවශ්‍ය සියළුම උපකරණ හා කාර්ය මණ්ඩලය අනුයුක්ත කර තිබුණු නමුත් 2020 දෙසැම්බර් මාසය වන විටත් මෙම ඒකකය තුළ රෝගී සත්කාර කටයුතු ආරම්භ කර නොතිබුණි. මෙම ඒකකය නිශ්කාර්යව පැවති වර්ෂ 02 තුළදී දළ වශයෙන් වාර 6,570 ක් පමණ රුධිරය කාන්දු පෙරණය (Dialysis) කිරීමට තිබුණු හැකියාව මගහැරී තිබුණි. | විශේෂඥ වෛද්‍යවරයෙකු අනුයුක්ත කර ගෙන වකුගඩු රෝගීසත්කාරසේවාව ආරම්භ කිරීමට කටයුතු කළ යුතු අතර උපකරණ ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියාකළ යුතුය. | -එම- | 2022 ජනවාරි 31 දින වන විටත් රුධිරය කාන්දු පෙරණ ඒකකය ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 29. | අංගොඩ ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය හා මහරගම අපේක්ෂා රෝහල සඳහා අමු ආහාර සැපයීම වෙනුවෙන් 2018 පෙබරවාරි සිට 2019 ජනවාරි දක්වා කාලයට අදාළව ගෙවීම් කිරීමේදී ප්‍රසම්පාදන තීරණයන්ට අනුකූල නොවන පරිදි ගෙවීම් කිරීම හේතුවෙන් රු.මිලියන 8.14 ක් වැඩිපුර ගෙවා තිබුණි. ඉන් රු.මිලියන 1.32 ක් නැවත අයකර තිබුණද රු.මිලියන 6.81 ක් 2020 අගෝස්තු 31 දින වන විටත් අයකර නොතිබුණි. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය නියමිත පරිදි ගිවිසුම් කොන්දේසිවලට ඇතුළත් නොකිරීම මත එම මුදල අයකර ගැනීම ගැටළුකාරී වී තිබුණි. | ප්‍රසම්පාදන තීරණයන්ට අනුකූලවන පරිදි ගෙවීම් සිදු කළ යුතු අතර ගිවිසුම් කොන්දේසි නියමිත පරිදි සකස් කළ යුතුය. වගකීම් නිසි ලෙස ඉටුනොකළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ 2 කොටසේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. | -එම- | 2022 ජනවාරි 31 දින වන විටත් විගණන නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| 30. | පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වීමෙන් පසු නැවත සේවයට වාර්තා නොකිරීම, සේවයට වාර්තා කිරීමෙන් පසු අනිවාර්ය සේවා කාලය තුළ රජයට සේවය ලබා නොදීම හා රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු ලබා විදේශගත වීමෙන් පසු නැවත සේවයට වාර්තා නොකිරීම ආදී කරුණු හේතුවෙන් රජය සමඟ අත්සන් කළ ගිවිසුම් බැඳුම්කර කඩකළ වෛද්‍යවරුන් 95 ක ගෙන් රජයට අයකර ගත යුතු මුදල රු.මිලියන 81.91 ක් විය. වෛද්‍යවරුන් සේවය හැර ගිය දින සිට මාස 01 | රජයට අය විය යුතු මුදල් අයකර ගැනීමට සුදුසු හා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීමට, ගිවිසුම් කඩකිරීම අධෛර්යට පත්වන පරිදි කොන්දේසි ඇතුළත් කරමින් ගිවිසුම් පිළියෙල කිරීමට ඇති හැකියාව පිළිබඳ සොයා බලා කටයුතු කිරීමට හා එම වගකීම් පැහැර හරින නිලධාරීන් | -එම- | 2022 ජනවාරි 31 දින වන විටත් සේවය හැර යාමේ ලිපි නිකුත් කිරීමේ සැලකිය යුතු ප්‍රමාදයන් පැවති අතර හිඟ මුදල් අය කිරීමේ ප්‍රගතිය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ත් මාස 57 ත් අතර ප්‍රමාද කාලයකින් පසුව සේවය හැර යාමේ ලිපි නිකුත් කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට සේවය හැර ගිය වෛද්‍යවරුන්ගේ වර්තමාන ලිපිනයන් සොයා ගැනීමට නොහැකිවීම මත ඔවුන්ගෙන් අයවිය යුතු රු.මිලියන 53 ක් සම්බන්ධයෙන් ඉදිරි නිතිමය පියවර ගැනීමට නොහැකිවී තිබුණි. | සම්බන්ධයෙන් පියවර ගැනීමට කටයුතු කළ යුතුය. | | |
| 31. | අමාත්‍යාංශය යටතේ ඇති හෙද පුහුණු පාසැල් 16 කින් ලබාගත් තොරතුරු අනුව, 1999 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ වර්ෂ 18 ක කාලපරිච්ඡේදය තුළදී බඳවාගෙන තිබුණු හෙද සිසුන් අතරින් පුහුණුව හැර ගිය සිසුන් සංඛ්‍යාව 861 ක් වූ අතර ඉන් සිසුන් 706 දෙනෙකුගෙන් අයකර ගත යුතු මුළු මුදල රු.මිලියන 281.99 ක් විය. නමුත් විගණනයට වරින්වර ඉදිරිපත්වී තිබුණු තොරතුරු අනුව මෙම කාලය තුළ පුහුණුව අතහැර ගිය හෙද සිසුන් සංඛ්‍යාව 1,000 කට වඩා වැඩි බවත්, ඔවුන්ගෙන් අයවියයුතු මුදල රු.මිලියන 325.33 ක් පමණ වන බවත් තහවුරු විය. මේ අනුව පුහුණුව හැර ගිය සිසුන් සංඛ්‍යාව හා අයකර ගත යුතු මුදල් පිළිබඳ සම්පූර්ණ හා නිවැරදි තොරතුරු අමාත්‍යාංශය සතුව නොතිබුණු බව නිරීක්ෂණය විය. | -එම- | විගණන නිරීක්ෂණ නිවැරදි බව. වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අයවිය යුතු සම්පූර්ණ මුදල නිවැරදිව හඳුනා ගැනීමට හා එම මුදල කඩිනමින් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 32. | වෛද්‍ය සැපයීම් වට්ටෝරු සමාලෝචන කමිටුවේ නිර්දේශයකින් තොරව කිසිම වෛද්‍ය සැපයීමක් මිලදී නොගත යුතු බව අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණු නමුත්, 2019 දෙසැම්බර් 31 දින වන විට භාවිතයේ පවතින වෛද්‍ය සැපයීම් අයිතම 20,698 ක් අතරින් ඖෂධ අයිතම 483 ක්, ශල්‍ය ද්‍රව්‍ය අයිතම 4,611 ක් හා රසායනාගාර ද්‍රව්‍ය අයිතම 2,043 ක් වශයෙන් මුළු අයිතම 7,137ක් හෙවත් සියයට 34 ක් වෛද්‍ය සැපයීම් වට්ටෝරු සමාලෝචන කමිටුවේ නිර්දේශයකින් තොරව භාවිතා කරමින් පැවතුණි.<br>වෛද්‍ය සැපයීම් වට්ටෝරු සමාලෝචන කමිටුවේ නිර්දේශයකින් තොරව භාවිතා කරන වෛද්‍ය සැපයීම් අයිතම 190 ක් 2019 වර්ෂය වෙනුවෙන් ඇණවුම් කර තිබුණු අතර ඒ සඳහා 2020 ජූලි 09 දින වන විටරු.මිලියන 1,711.21 ක් ගෙවා තිබුණි. එසේම 2020 ජුනි 29 දින වන විට 2020 හා 2021 වර්ෂ සඳහා වෛද්‍ය සැපයීම් වට්ටෝරු සමාලෝචන කමිටුවේ නිර්දේශයකින් තොරව භාවිත කරන ඖෂධ මිලදී ගැනීම සඳහා පිළිවෙලින් රු.මිලියන 3,507.28 ක් හා රු.මිලියන 564.79 ක් වූ ඇණවුම් නිකුත් කර තිබුණි. | 2012 දෙසැම්බර් 13 දිනැති අංක අමප/12/1602/509/005/-11 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව වෛද්‍ය සැපයීම් වට්ටෝරු සමාලෝචන කමිටුවේ නිර්දේශයකින් තොරව කිසිම වෛද්‍ය සැපයීමක් මිලදී නොගත යුතුය. | වර්ෂ 03 කට වරක් වට්ටෝරු සමාලෝචන කමිටු පැවැත්වීම යෝග්‍ය බව නිර්දේශ කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇති බව හා වට්ටෝරු සමාලෝචන කමිටු නිර්දේශයකින් තොරව ඖෂධ මිලදී නොගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් වට්ටෝරු සමාලෝචන කමිටු වාර්ෂිකව පවත්වා නොතිබුණු අතර 2019 ජුනි 06 දිනැති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නියෝගය ප්‍රකාරව, සංශෝධිත නව කැබිනට් පත්‍රිකාව 2021 නොවැම්බර් 17 දින වන විටත් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර නොතිබුණි. තවද 2022 ජනවාරි 31 දින වන විටත් වට්ටෝරු සමාලෝචන කමිටු නිර්දේශයකින් තොරව ඖෂධ මිලදී ගනිමින් පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 33. | වෛද්‍ය සැපයීම් අංශය විසින් ඇස්තමේන්තුගත අයිතම මිලදී ගැනීම සඳහා මාස 11 ක සැපයුම් කාලයක් සහිතව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ඇණවුම් නිකුත් කිරීම ප්‍රතිපත්තිය වී තිබුණු නමුත් ප්‍රමාදයකින් තොරව වෛද්‍ය සැපයීම් සපයා දීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව අපොහොසත් වී තිබුණි. 2017 හා 2018 වර්ෂවල අවශ්‍යතාවය වෙනුවෙන් වෛද්‍ය සැපයීම් අංශය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් ඇණවුම් කර තිබුණු පිළිවෙලින් පිරිවැය රු.මිලියන 4,059.06 ක් වූ වෛද්‍ය සැපයීම් අයිතම 474 ක් හා පිරිවැය රු.මිලියන 13,620.14 ක් වූ වෛද්‍ය සැපයීම් අයිතම 1,884 ක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් වර්ෂ 01 ත් වර්ෂ 02 ත් අතර කාලයක ප්‍රමාදයකින් පසුව 2019 වර්ෂය තුළදී සපයා තිබුණි. තවද 2017 හා 2018 වර්ෂ 02 සඳහා ඇණවුම් කළ සම්මත පිරිවැය පිළිවෙලින් රු.මිලියන 7,075.48 ක් වූ වෛද්‍ය සැපයීම් අයිතම 2,377 ක් හා රු.මිලියන 11,978.19 ක් වූ වෛද්‍ය සැපයීම් අයිතම 4,158 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් සපයාදී නොතිබුණි. | ප්‍රමාදයට බලපාන හේතු සමාලෝචනය කර ප්‍රමාදය අවම කිරීමට පිළියම් යෙදීමටත්, ඒ සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අවධානය යොමු කිරීමටත් හා අවශ්‍යතාවය පරිදි උපායමාර්ග හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය. | වෛද්‍ය සැපයුම් අංශය විසින් රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව වෙත ප්‍රමාදයකින් තොරව ඇණවුම් නිකුත් කරන නමුත් නියමිත කාලරාමුව තුළ සැපයුම් නොලැබෙන අවස්ථා පවතින බව, තාක්‍ෂණික ඇගයීම් කමිටු වාර්තා ප්‍රමාදවීම, ප්‍රසම්පාදන තීරණ අභියෝගයට ලක්වීම සහ අභියචනා ඉදිරිපත්වීම හා සැපයුම්කරුවන්ගේ අඩුපාඩු වැනි හේතු මත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දිගු කාලයක් ගතවන අවස්ථා පවතින බව හා ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය සඳහා වෙන් වෙන් වූ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු පත් කිරීම හා නිරන්තරයෙන් ප්‍රගති සමාලෝචනය කිරීම තුළින් මෙම තත්ත්වය හැකිතාක් දුරට මඟහරවා ගැනීමට කටයුතු කර ඇති බව. | අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු මට්ටමේ ඇණවුම් සඳහා මාස 11-12 ත් අතර කාලයක් ගතකළ හැකි වුවද, පරීක්ෂා කළ අයිතම 11 ක් සඳහා මාස 15-49 ත් අතර කාලයක් ගතකර තිබුණි. එසේම තාක්ෂණික කමිටු හා ප්‍රසම්පාදන තීරණ ලබාදීමේ ක්‍රියාවලිය සඳහා මාස 06-13 ත් අතර කාලයක් ගතකර තිබුණි. මෙවැනි කරුණු හේතුවෙන්, 2018 දී පිරිවැය රු.මිලියන 5,241 ක් වූ, 2019 දී පිරිවැය රු.මිලියන 8,220 ක් වූ හා 2020 දී පිරිවැය රු.මිලියන 6,265 ක් වූ වෛද්‍ය සැපයීම් දේශීය වෙළඳපලෙන් මිලදී ගැනීමට සිදුවී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 34. | තත්ත්වය පරීක්ෂා කිරීමකින් තොරව රෝහල් වෙත නිකුත් කර තිබුණු වෛද්‍ය සැපයීම්වල තත්ත්වය පිළිබඳව පසුකාලීනව ගැටළු උද්ගත වී තිබුණු අවස්ථාවලදී පමණක් ඒවා තත්ත්ව පරීක්ෂණ රසායනාගාරය වෙත යවා තිබුණු අතර වෛද්‍ය සැපයීම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් තත්ත්වයෙන් අසමත් වී ඇති බව පසුකාලීනව හඳුනාගෙන තිබුණි. 2019 වර්ෂය තුළදී මෙසේ තත්ත්වයෙන් අසමත්වීම මත භාවිතයෙන් ඉවත් කළ වෛද්‍ය සැපයීම්වල පිරිවැය රු.මිලියන 1,209.7 ක් විය. 2019 දෙසැම්බර් 31 දිනට තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයීම් වෙනුවෙන් වෛද්‍ය සැපයීම් අංශය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන්, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙන් හා වෙනත් සැපයුම්කරුවන්ගෙන් අයකළ යුතු මුළු මුදල රු.මිලියන 2,105.41 ක් විය. 2019 වර්ෂයේදී තත්ත්වයෙන් අසමත්ව භාවිතයෙන් ඉවත් කළ වෛද්‍ය සැපයීම් අතර ප්‍රතිජීවක ඖෂධ, වේදනා නාශක ඖෂධ, බැන්ඩේජ් හා ගෝස් වර්ග විය. එලෙස තත්ත්වයෙන් අසමත් වූ වෛද්‍ය සැපයීම් භාවිතයෙන් ඉවත් කරන ලෙසට නියෝග ලැබෙන අවස්ථාව වන විටත් එම අයිතම | වෛද්‍ය සැපයීම් ලද වහාම නියැදියක තත්වය පරීක්ෂා කළ හැකි වන පරිදි ක්‍රමවේදයක් හඳුන්වාදී ක්‍රියාත්මක කළ යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් පහසුකම් ඇතිකර ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගත යුතුය. සියළු වෛද්‍ය සැපයීම් ප්‍රමිති තත්ත්වයෙන් ගබඩා කර තැබීමට කටයුතු කළ යුතුය. තත්ත්වයෙන් උසස් ඖෂධ මිලදී ගැනීමටත්, තත්ත්වය පරීක්ෂා කිරීමෙන් පසුව පමණක් රෝහල් වෙත නිකුත් කිරීමටත් හා තත්ත්වයෙන් බාල ඖෂධ රෝගීන් වෙත නිකුත් කිරීමේ අවදානම ඉවත් කිරීමටත් කටයුතු කළ යුතුය. තත්ත්වයෙන් අසමත්ව තාවකාලිකව අත්හිටුවන ලද ඖෂධ කඩිනමින් පරීක්ෂා | 2020 ජුනි 25 දින සිට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ රසායනාගාරය මඟින් නියැදි පරීක්ෂාව ආරම්භ කළ බව, එම රසායනාගාර තුළ ඖෂධ වර්ග 316 ක් සඳහා පමණක් පහසුකම් පවතින බව, සියළුම පරීක්ෂණ පරාමිතීන් (Testing Para Meter) සඳහා පහසුකම් නොමැති බැවින් ඉදිරියේදී ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත නියැදි යවා පිළිගත් (Accredited) රසායනාගාර මඟින් පරීක්ෂාවන් සිදු කිරීමට සැළසුම් සකස් කරමින් පවතින බව, තත්ත්වයෙන් අසමත් අයිතමවල පිරිවැය හා සියයට 25 ක පරිපාලන වියදම් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් අය | වර්ෂයෙන් වර්ෂය ඉහළ යන තත්ත්වයෙන් අසමත් ඖෂධ ප්‍රමාණය අඩු කර ගැනීම සඳහා 2022 ජනවාරි 31 දින වන විටත් නිසි හා ප්‍රමාණවත් ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රෝගීන්ට නිකුත් කර තිබුණි. මෙම වෛද්‍ය සැපයීම්වලින් සැලකිය යුතු ප්‍රතිශතයක් රෝගීන් වෙත නිකුත් කිරීමෙන් පසුව මෙම වෛද්‍ය සැපයීම් තත්ත්වයෙන් අසමත් බව තීරණය කර තිබුණි. 2019 වර්ෂයේදී තත්ත්වයෙන් අසමත්ව භාවිතය අත්හිටුවා තිබුණු පිරිවැය රු.මිලියන 33.73 ක් වූ වෛද්‍ය සැපයීම් අයිතම 10 ක් සම්බන්ධයෙන් ඉදිරි පරීක්ෂණ කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් එම අයිතම 10 භාවිතයෙන් ඉවත් කිරීමට ප්‍රථම කල් ඉකුත්වී තිබුණි. | කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. | කරන බව හා ඒ මත පදනම්ව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් එය අදාළ සැපයුම්කරුගෙන් අයකරන බව. | |
| 35. | 2012 වර්ෂයේ ඖෂධ ප්‍රසම්පාදනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ඖෂධයක, ශල්‍ය අයිතමයක හෝ වෙනත් වෛද්‍ය සැපයීමක ඉල්ලුම වෙනස් වන්නේ නම් හෝ සෙමින් චලනය වන(Non moving/Slow moving) අයිතමයක් වන්නේ නම් ඒ පිළිබඳව වෛද්‍ය සැපයීම් වට්ටෝරු සමාලෝචන කමිටුවට ඉදිරිපත් කර (Formulary Revision Committee) එම අයිතමය භාවිතයෙන් ඉවත් කරන්නේද නැද්ද යන්න තීරණය කළ යුතුය. එසේම නව තාක්ෂණය හේතුවෙන් සිදුවන ඉල්ලුමේ වෙනස්වීම් සඳහා කාලීනව පිරිවිතර වෙනස් කිරීමටත්, ඒ සඳහා ස්වාධීන | කාලීනව පිරිවිතර වෙනස් කිරීමටත්, ඒ සඳහා ස්වාධීන පිරිවිතර පාලන අංශයක් පිහිටුවීමටත්, වට්ටෝරු සමාලෝචන කමිටු නියමිත කාලයට රැස් කිරීමටත් කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණය නිවැරදි බව. වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | 2022 ජනවාරි 31 දින වන විටත් විගණන නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පිරිවිතර පාලන අංශයක් පිහිටුවීමටත්, වට්ටෝරු සමාලෝචන කමිටු නියමිත කාලයට රැස් කිරීමටත්, පිරිවිතර වෙනස්වීම මත ඇතිවන තොග අතිරික්තවීම් හා තොග කල් ඉකුත්වීම් වැළැක්වීමටත්, එමගින් නවීන තාක්ෂණය තුළ ඉල්ලුමේ සිදුවන අඩු වැඩි වීම් පිළිබඳ ක්ෂණිකව හඳුනාගෙන අදාළ ඇණවුම් ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටීමටත් හැකියාව තිබුණද එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන්, පිරිවැය රු.මිලියන 44.83 ක් වූ හදවත් රෝග ආශ්‍රිත ශල්‍ය කර්ම සඳහා භාවිතා කරනු ලබන coronary Stent bare metal ශල්‍ය අයිතමයන් 2019 හා 2020 වර්ෂයේ මුල් කාර්තුව තුළදී කල් ඉකුත්වී තිබුණු බව සිදුකළ නියැදි විගණන පරීක්ෂණයකිදී අනාවරණය විය. | | | |
| 36. | ගැබ් ගැනීම වළක්වන ඖෂධයක් ලෙස ලබා දෙන Depogestin I (Depot Medroxy Progesterone Acetate) ඖෂධයෙන් ඒකක මිලියන 1.2 ක් මිලදී ගැනීමට 2011 මාර්තු 30 දින වෛද්‍ය සැපයීම් අංශය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ගැනුම් අධියාචනාවක් නිකුත් කර තිබුණි. පෙර සැපයුම්කරුවන් සපයන ලද මෙම ඖෂධය භාවිතයෙන් පුද්ගල | පූර්ණ විමර්ශනයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන සිදුවී ඇති මූල්‍ය පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | -එම- | 2022 ජනවාරි 31 දින වන විටත් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණි. |

මරණ හා සංකූලතාවයන් සිදුවූ බව තාක්ෂණික ඇගයීම් කමිටුව දැනුවත් කර තිබියදී හා ඇණවුම් කොන්දේසි පිළිබඳව සැලකිල්ලට නොගෙන අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරුට මුළු පිරිවැය රු.මිලියන 87.03 ක් වූ ඇණවුම ප්‍රදානය කිරීම සඳහා 2011 නොවැම්බර් 21 දින රැස්වූ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබාදී තිබුණි.

පළමු ඒකක 600,000 ක තොගය 2012 මාර්තු 13 දින ලැබී තිබුණු අතර භාවිතා කළ පළමු සතිය තුළදීම දැඩි අසංරක්ෂිත ප්‍රතික්‍රියා (severe anaphylactic reaction) සිදුවූ බව වාර්තාවී තිබුණි. ඒ හේතුවෙන් එම නිෂ්පාදන කාණ්ඩය භාවිතයෙන් ඉවත් කිරීමටත් (withdraw) ඉතිරි ඒකක 600,000 ක ප්‍රසම්පාදනය නැවැත්වීමටත්, ජාත්‍යන්තරව පිළිගත් නිෂ්පාදනයක් ලබාදීම සිදුකරන ලෙසත් පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ මාතෘ හා ළමා සෞඛ්‍ය අධ්‍යක්ෂ විසින් සෞඛ්‍ය ලේකම් වෙත නිර්දේශ කර තිබුණි.

2012 දෙසැම්බර් 12 දින රැස්වූ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් යහපත් නිෂ්පාදන පරිචයන් පිළිබඳ (Good Manufacturing Product)) වාර්තාව මත තාක්ෂණික උපදේශක කමිටුවේ

තීරණය ලබා ගැනීමට නිර්දේශ කර තිබියදී ඒ අනුව කටයුතු නොකර 2013 අප්‍රේල් 02 දින රැස්වූ ප්‍රසම්පාදන B කමිටුව විසින් සියළු කරුණු සලකා බැලූ බවට සඳහන් කරමින් ඇණවුමේ ඉතිරි ඒකක 600,000 සඳහා වූ ඇණවුම එම සැපයුම්කරුටම ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණි. රෝගී ජීවිත අවදානමට ලක්කරමින් ඖෂධ ප්‍රසම්පාදනයේ මූලික අරමුණ වූ එන්නතෙහි ගුණත්වය, ආරක්ෂාව හා ප්‍රත්‍යක්ෂ බව (quality, safety, efficacy) පිළිබඳව තාක්ෂණික ඇගයීමේදී සැලකිල්ලට නොගෙන මෙම ඖෂධය නැවත පණගැන්වීමේ පහසුකම් සහිත (resuscitation facilities) රෝහල් වෙත නිකුත් කිරීමටත් සමීප අධීක්ෂණයක් පවත්වා ගැනීමටත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව 2013 අප්‍රේල් 02 දින තීරණය කර තිබුණි. දෙවනුව ඇණවුම් කළ ඒකක 600,000 ක තොගය 2013 අගෝස්තු 05 දින පවුල් සෞඛ්‍ය කාර්යාංශයට ලැබී තිබුණි. නමුත් මෙම ඖෂධයේ පැවති ව්‍යාකූලත්වය පිළිබඳව 2012 සැප්තැම්බර් 18 හා 19 යන දිනයන්හි සිදු කර තිබුණු යහපත් නිෂ්පාදන පරිචයන් පිළිබඳ නිරීක්ෂණ වාර්තාවෙන්ද (GMP Inspection Report), 2014

සැප්තැම්බර් 09 දිනැති පවුල් සෞඛ්‍ය ජාතික කමිටුවේ 16 වන රැස්වීමේදීද, 2016 ජනවාරි 22 දිනැති ජාතික ඖෂධ නියාමන අධිකාරියේ තුන්වන ආරක්ෂිත හා අවදානම් ඇගයීම් උප කමිටු (Safety & Risk Evaluation sub committee) රැස්වීමේදීද සහ 2018 අප්‍රේල් 24 දිනැති ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 25 වන ඖෂධ ඇගයීම් කමිටු රැස්වීමේදීද මෙම ඖෂධය භාවිතයෙන් ඉවත් කිරීමට දැනුම් දී තිබුණි. අදාළ වගකිව යුතු නිලධාරීන් විසින් මෙම තොගය කල් ඉකුත් වීමට පෙර, තත්ත්වයෙන් අසමත් කළ බව දැක්වෙන චක්‍රලේඛය නිකුත් කිරීම පැහැර හැර තිබුණි. 2018 ජුනි මාසයේදී පවුල් සෞඛ්‍ය කාර්යාංශය තුළදීම බෙදා නොහැර මෙම තොගය කල් ඉකුත් වීමෙන් මාස 14 ක කාල ප්‍රමාදයකින් යුතුව වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂක විසින් 2019 ජුනි 17 දිනැති චක්‍රලේඛය නිකුත් කරමින් මුළු නිෂ්පාදනයම භාවිතයෙන් ඉවත් කර තිබුණි. මේ හේතුවෙන් සැපයුම්කරුගෙන් අදාළ පාඩුව අයකිරීමේ හැකියාව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට අහිමි වී තිබුණි. මෙම මිලදී ගැනීම තුළින් රජයට සිදුවූ පාඩුව රු.මිලියන 91 ඉක්මවන බව නිරීක්ෂණය විය.

| | | | | |
|---|---|---|---|---|
| | මෙම ඇණවුමට හා මීට පෙර ඇණවුමකට අදාළව තත්ත්වයෙන් අසමත්වීම මත භාවිතයෙන් ඉවත් කරන ලද ඒකක 1,131,800 කින් සිදු වූ අලාභය වූ රු.මිලියන 96.4 ක් වෛද්‍ය සැපයීම් අංශය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් අයකර තිබුණද, ඉන් රු.මිලියන 60.4 ක් 2020 සැප්තැම්බර් 01 දින දක්වාම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සැපයුම්කරුගෙන් අයකර ගත නොහැකිවී තිබුණි. | | | |
| 37. | වෛද්‍ය සැපයීම් අංශ පරිශ්‍රයේ පිහිටි ගබඩාවන්හි ඖෂධ, ශල්‍ය හා රසායනික ද්‍රව්‍ය තොග විශාල ප්‍රමාණයක් පැවතියද එහි ඇති වායුසමීකරණ පද්ධතිය වසර ගණනාවක සිට අක්‍රීයව තිබුණි. වායුසමීකරණ පද්ධතිය නවීකරණය කිරීම සඳහා එළඹ තිබුණු ගිවිසුම ප්‍රකාරව, 2016 ඔක්තෝබර් මාසය වන විට අළුත්වැඩියා කටයුතු අවසන් කළ යුතු වුවත් 2020 සැප්තැම්බර් 30 දින වන විටත් වායුසමීකරණ නවීකරණය කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. සෙල්සියස් අංශක 25 ට අඩු උෂ්ණත්වයක තැබිය යුතු බවට ඇසුරුම්වල සටහන් කර තිබුණු පිරිවැය රු.මිලියන 32.21 ක් වූ ඖෂධ අයිතම 09 ක් සෙල්සියස් අංශක 25 ට වැඩි උෂ්ණත්වයන් සහිත ගබඩාවන්හි තබා තිබුණු බව | වෛද්‍ය සැපයීම් අයිතම ගබඩා කිරීම නියමිත ප්‍රමිතීන්ට අනුකූලවන ආකාරයට සිදු කළ යුතුය. | මධ්‍යගත වායුසමන පද්ධතියක් ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව 2021 ජුනි 14 දින ප්‍රදානය කළ බව හා කොන්ත්‍රාත් කාලය දින 60 ක් වන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මධ්‍යගත වායුසමීකරණ පද්ධතිය ස්ථාපිත කිරීමේ කාර්යය අවසන් කර නොතිබුණු අතර ප්‍රාදේශීය ගබඩාවලට අවශ්‍ය වායුසමීකරණ පද්ධති පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. |

සිදුකළ නියැදි විගණන පරීක්ෂණයකදී අනාවරණය විය. මෙම අයිතම නියමිත උෂ්ණත්වයේ නොතිබුණු කාල සීමාව දින 12 ත් දින 190 ත් අතර කාල පරාසයක විය. මෙම ඖෂධ අතර ප්‍රතිජීවක ඖෂධ මෙන්මහෘදය ආශ්‍රිත රෝග සඳහා භාවිතා කරන ඖෂධ පැවති බවද, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් මෙම ඖෂධ තොග සාමාන්‍ය උෂ්ණත්වය යටතේ ප්‍රවාහනය කර ඇති බවද, වෛද්‍ය සැපයීම් අංශය විසින් අංක 06 ශීත ගබඩාවේ ප්‍රමාණවත් ඉඩකඩක් නොමැති බවට සටහන් යොදා සාමාන්‍ය ගබඩාවල ගබඩා කර තිබුණු බවද නිරීක්ෂණය විය. එසේම සෙල්සියස් අංශක 25 ට අඩු උෂ්ණත්වයක ගබඩා කළ යුතු පිරිවැය රු.මිලියන 15.58 ක් වූ ඖෂධ වර්ග 87 ක් අනුරාධපුර ශික්ෂණ රෝහල, අනුරාධපුර ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශය, නොච්චියාගම ප්‍රාදේශීය රෝහල හා රාජාංගනය යාය 11 ප්‍රාදේශීය රෝහල යන සෞඛ්‍ය ආයතන ගබඩා තුළ නියමිත උෂ්ණත්වයට වඩා වැඩි උෂ්ණත්වයක් යටතේ ගබඩා කර තිබුණි. සියළුම රජයේ රෝහල් සඳහා වෛද්‍ය සැපයීම් සපයනු ලබන වෛද්‍ය සැපයීම් අංශයේ මෙන්ම ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් මධ්‍යස්ථාන හා

| | | | | |
|---|---|---|---|---|
| | රෝහල්වල ඖෂධ ගබඩා නියමිත උෂ්ණත්වයන්ගෙන් තොරව පැවතීම නිසා ඖෂධ තත්ත්වයෙන් අසමත් වීමට ඉඩ ඇති බවටත්, මෙම ඖෂධ භාවිතා කිරීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබී යා හැකි බවටත් වූ මතය විගණනයේදී බැහැර කළ නොහැකි විය. | | | |
| 38. | මහරගම අපේක්ෂා රෝහලේ පිළිකා රෝගීන් සඳහා නිකුත් කරන අත්‍යාවශ්‍ය ඖෂධ හා එන්නත් වර්ග 26 ක් 2019 වර්ෂය තුළදී දින 06 ත් දින 316 ත් අතර කාලයක් හිඟව තිබුණි. එසේම ඇතැම් පිළිකා රෝගීන්ගේ නමින් ගෙන්වනු ලබන ඖෂධ හා එන්නත් වර්ග 07 ක් 2019 අවසන් මාස 06 තුළදී දින 02 ත් දින 180 ත් අතර කාලයක් හිඟව තිබුණි. තවද වෛද්‍ය නිර්දේශය අනුව නොකඩවා මාස 06 ක් අඛණ්ඩව ලබාදිය යුතු සමහර ඖෂධවල හිඟය හේතුවෙන් වෛද්‍ය නිර්දේශයට අනුව කටයුතු කළ නොහැකිවී තිබුණි. | රෝගීන් සඳහා ලබා දෙනු ලබන අත්‍යවශ්‍ය බෙහෙත් වර්ග හිඟයකින් තොරව පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ නිවැරදි බව. වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | 2022 ජනවාරි 31 දින දක්වා විගණන නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි |
| 39. | නිලධාරීන් හා සේවකයින් ස්ථාන මාරුවී යන අවස්ථාවේදීම ණය ශේෂ නිරවුල් කර ගැනීමට පියවර නොගැනීම හේතුවෙන් ස්ථාන මාරුවන ආයතන අතර ණය ශේෂ ගලපා ගත නොහැකිවීම, ණය ගෙවීම පිළිබඳ ණය කාඩ්පත් හා ණය ලිපිගොනු ඇතුළු තොරතුරු | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිලධාරියා ස්ථාන මාරු වී ගොස් මාස 03 ක් ඇතුළත ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බව හා අදාළ නිලධාරීන් ස්ථාන මාරුවී ගිය ස්ථාන පිළිබඳ නිසි තොරතුරු සොයා ගැනීමේ අපහසුතාවය, ණය | 2022 ජනවාරි 31 දින වන විටත් විගණන නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොමැතිවීම වැනි හේතු මත අමාත්‍යාංශයෙන් වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අමාත්‍යාංශයට අයත් රෝහල් හා වෙනත් ආයතන හා පළාත් සභාවලට ස්ථාන මාරුවී ගිය නිලධාරීන් හා සේවකයින් 218 දෙනෙකුගෙන් රු.මිලියන 12.83 ක් අයවිය යුතුව තිබුණු අතර ඉන් 170 දෙනෙකුට අදාළව අයවිය යුතු රු.මිලියන 9.29 ක් හෙවත් සියයට 72 ක් වර්ෂ 05 ඉක්ම වූ ණය ශේෂ විය. | | ශේෂ නොසැසඳීම වැනි හේතු නිසා මෙම ණය ශේෂයන් පියවා ගැනීමට මෙතෙක් හැකියාව ලැබී නැති බව. | |
| 40. | සේවය හැරගිය නිලධාරීන් හා සේවකයින් වෙත සේවය හැරයාමේ නියෝග නිකුත්කිරීම ප්‍රමාදවීම, නිලධාරීන්ගේ වර්තමාන ලිපිනයන් සොයාගැනීමට නොහැකිවීම, ණය ලිපිගොනු ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය, වර්ෂ 10 ක සේවාකාලයක් ඉක්මවා ඇති බැවින් ඇපකරුවන් නොමැතිවීම හා නීතිමය කටයුතු කඩිනමින් සිදුනොවීම වැනි හේතු මත අමාත්‍යාංශයේ සේවයේ නියුක්තව සිට මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ සහ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් හා සේවකයින් 713 දෙනෙකුගෙන් රු.මිලියන 17.29 ක් අයවිය යුතුව තිබුණු අතර ඉන් 290 දෙනෙකුට අදාළව අයවිය යුතු රු.මිලියන | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | පොලීසිය, ග්‍රාම නිලධාරි හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කර ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් විගණන නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | 9.58 ක් හෙවත් සියයට 55 ක් වර්ෂ 05 ඉක්ම වූ ණය ශේෂ විය. | | | |
| 41. | පොළොන්නරුව දිස්ත්‍රික් මහ රෝහල් අධ්‍යක්ෂවරයාගේ ලිඛිත ඉල්ලීමක් පදනම් කර ගනිමින් ඉතා හදිසි මිලදී ගැනීමක් ලෙස සලකා සීමිත මිල කැඳවීම් ක්‍රමය අනුගමනය කරමින් 2020 නොවැම්බර් 05 දින පොළොන්නරුව කෝවිඩ් – 19 විශේෂ ප්‍රතිකාර මධ්‍යස්ථානය සඳහා Mine Portable DigitalX-Ray යන්ත්‍රයක් රු.මිලියන 9.95 කට මිලදී ගෙන තිබුණි. තාක්ෂණික ඇගයීම සඳහා විකිරණ විද්‍යා තාක්ෂණවේදියෙකු පත්කර නොතිබුණු අතර රජයේ විකිරණ විද්‍යා තාක්ෂණවේදීන්ගේ සංගමය විසින් මෙම යන්ත්‍රය භාවිතා කරන්නන්ට හා රෝගීන්ට අවධානමක් පවතින බැවින් භාවිතා කළ නොහැකි බවත් මෙම මිලදී ගැනීම තුළින් මුදල් නාස්තියක් සිදුවී ඇති බවත් දන්වා තිබුණි. ඒ බව සනාථකරමින් 2021 පෙබරවාරි 19 දින වන විටත් යන්ත්‍රය භාවිතයට නොගෙන නිශ්කාර්යව තබා තිබුණි. | මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතුපාර්ශවයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් අභ්‍යන්තර විමර්ෂණයක් සිදුකරමින් පවතින බව. | පරීක්ෂා කළ යුතු මෘත ශරීරවල X-Ray ලබා ගැනීම සඳහා මෘත ශරීරාගාරය වෙත ලබාදී තිබුණි. 2022 ජනවාරි 31 දින වන විටත් භාවිතා කර නොතිබුණු අතර ඒ සඳහා පුහුණුවක් ලබාදීමටද කටයුතු කර නොතිබුණි. |
| 42. | චීනයේ CETC International Com Ltd වෙතින් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් කර තිබුණු ව්‍යාපෘති | සෑම විටම රජයට අවාසි නොවන පරිදි ව්‍යාපෘති තෝරා | විගණන නිරීක්ෂණයන් සමඟ එකඟ වන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් |

| | | | |
|---|---|---|---|
| යෝජනාවක් පිළිගෙන, ඒ සඳහා The Hongkong and Shanghai Banking Corporation Limited වෙතින් එක්සත් ජනපද ඩොලර් මිලියන 72.25 ක් හා මහජන බැංකුවෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 12.75 ක් ලෙස එක්සත් ජනපද ඩොලර් මිලියන 85 ක ණය මුදලක් ලබාගෙන තෝරාගත් රෝහල්වල සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතිය යටතේ සපයා ගනු ලබන එක් එක් උපකරණ පිළිබඳව වෙළඳපල සමීක්ෂණයන් සිදුකර පූර්ව අනුකූල තාක්‍ෂණික පිරිවිතර හා වර්තමාන වෙළඳපල මිල පිළිබඳව නිසි තක්සේරුවක් සඳහා කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු වුවද, එවැනි එකඟතාවයකට එළඹී නොතිබුණු බැවින් පහතින් විස්තර සඳහන් පාඩු සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.<br>(i) මෙම ව්‍යාපෘතිය යටතේ 2019 ඔක්තෝබර් මාසයේදී එකක් එක්සත් ජනපද ඩොලර් 88,445.56 ක් බැගින් High Pressure Stetilizer 29 ක් මිලදී ගෙන තිබුණි. නමුත් 2020 වර්ෂයේදී ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් සිදුකර තිබුණු | ගැනිමට කටයුතු කළ යුතුය. මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. ඉදිරි මිලදී ගැනීම්වලදී රජයට උපරිම ප්‍රතිලාභ හිමිවන ආකාරයට කටයුතු කළ යුතුය. ව්‍යාපෘතියේ වෙනස්කම් සිදු කිරිම සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. ශ්‍රී ලංකාවේ බලයලත් දේශීය නියෝජිතයින් සමඟ සේවා හා නඩත්තු ගිවිසුම්වලට කඩිනමින් එළඹිය යුතුය. ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිකුත් කරන උපකරණය ලියාපදිංචි සහතිකය සහ ආනයන බලපත්‍රය රහිත උපකරණ මිලදි ගැනීමෙන් වැලකිය යුතුය. උපකරණ ස්ථාපිත කිරිමේ සහතික කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර සියලුම | වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | විධිමත් පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| | ප්‍රසම්පාදනයකදී මෙම වර්ගයේ High Pressure Stetilizer එකක් සඳහා එක්සත් ජනපද ඩොලර් 67,685.79 ක ලංසුවක් ඉදිරිපත්වී තිබුණි. ව්‍යාපෘතියෙන් High Pressure Stetilizer 29 ක් මිලදී ගැනීම හේතුවෙන් රජයට සිදුව තිබුණු පාඩුව එක්සත් ජනපද ඩොලර් 602,033.33 ක් හෙවත් රු.මිලියන 109 ක් විය. | නිකුත් කිරීම් සඳහා නිකුත් කිරීමේ නියෝග ලබාදීමෙන් අනතුරුව ඒ සඳහා භාණ්ඩ ලැබීම් නියෝග ලබා ගැනීමට කටයුතු කළ යුතුය. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. ව්‍යාපෘතිය යටතේ මිලදී ගන්නා ලද සියලුම උපකරණ භාවිතයට ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | මෙම ව්‍යාපෘතිය යටතේ 2019 නොවැම්බර් මාසයේදී එකක් එක්සත් ජනපද ඩොලර් 955.79 ක් බැගින් ECG Recorder 154 ක් මිලදී ගෙන තිබුණි. නමුත් 2020 වර්ෂයේදී ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් සිදුකර තිබුණු ප්‍රසම්පාදනයකදී මෙම වර්ගයේ ECG Recorder එකක් සඳහා එක්සත් ජනපද ඩොලර් 620.64 ක ලංසුවක් ඉදිරිපත් වී තිබුණි. ව්‍යාපෘතියෙන් ECG Recorder 154 ක් මිලදී ගැනීම හේතුවෙන් රජයට සිදුව තිබුණු පාඩුව එක්සත් ජනපද ඩොලර් 51,613.10 | |

ක් හෙවත් රු.මිලියන 9.36 ක් විය.

කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, මිලදී ගැනීමට එකඟවී තිබුණු වෛද්‍ය උපකරණ වර්ග හා ප්‍රමාණයන්ට අමතරව වෛද්‍ය උපකරණ අයිතම 6 ක ඒකක 36 ක් එක්සත් ජනපද ඩොලර් 1,713,017 ක අතිරේක වියදමක් දරමින් මිලදී ගෙන තිබුණු නමුත් ඒ සඳහා වූ අවශ්‍යතාවය හා අධිකාරී බලය තහවුරු නොකෙරුණු අතර ප්‍රසම්පාදනය කළ යුතු වෛද්‍ය උපකරණවල පැවතිය යුතු තාක්ෂණික පිරිවිතරවලට නොගැලෙපන තාක්ෂණික පිරිවිතරයන් සහිත පිරිවැය එක්සත් ජනපද ඩොලර් 10,341,390.57 ක් වූ වෛද්‍ය උපකරණ අයිතම 11 ක ඒකක 732 ක් මිලදී ගෙන තිබුණි. තවද කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, වෛද්‍ය උපකරණ 18 ක් සඳහා වගකීම් කාලයෙන් පසුව වර්ෂ 07 ක් සඳහාද, අනෙකුත් වෛද්‍ය උපකරණ සඳහා ස්ථාපන සහතික නිකුත් කළ දින සිට වර්ෂ 01 ක් සඳහාද, නිෂ්පාදකයින් සහ ඔවුන්ගේ ශ්‍රී ලංකාවේ බලයලත් දේශීය නියෝජිතයින් සමඟ සේවා හා නඩත්තු ගිවිසුම්වලට එළඹී නොතිබුණි. එසේම ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිකුත්

කරන උපකරණය ලියාපදිංචි සහතිකය සහ ආනයන බලපත්‍රය ලබා නොගත් කොන්ත්‍රාත්කරුවෙකු වෙතින් පිරිවැය එක්සත් ජනපද ඩොලර් 448,957.25 ක් වූ Mortuary Cooler 25 ක් හා ආනයන බලපත්‍රය කල් ඉකුත්වූ කොන්ත්‍රාත්කරුවෙකු වෙතින් පිරිවැය එක්සත් ජනපද ඩොලර් 414,173.84 ක් වූ Pulse Oximeter 436 ක් මිලදී ගෙන තිබුණි. 2019 නොවැම්බර් 01 දින සිට 2020 දෙසැම්බර් 28 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී රෝහල් වෙත බෙදාහැර තිබුණු පිරිවැය එක්සත් ජනපද ඩොලර් 20,858,277.81 ක් වූ වෛද්‍ය උපකරණ අයිතම 22 ක ඒකක 1,681 ක් විධිමත් ලෙස ස්ථාපනය කළ බව තහවුරු නොකෙරුණු අතර 2020 ජනවාරි 09 දින සිට 2021 ජනවාරි 18 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී රෝහල් වෙත බෙදාහැර තිබුණු පිරිවැය එක්සත් ජනපද ඩොලර් 3,653,709.83 ක් වූ වෛද්‍ය උපකරණ අයිතම 17 ක ඒකක 517 ක් අදාළ රෝහල් වෙත ලද බව ලැබීම් නියෝග මගින් තහවුරු කර ගෙන නොතිබුණි. එසේම නිකුත් කිරීමේ නියෝග නිකුත් නොකර පිරිවැය එක්සත් ජනපද ඩොලර් 9,244,757.86 ක්

| | | | | |
|---|---|---|---|---|
| | වූ වෛද්‍ය උපකරණ ඒකක 155 ක් රෝහල් වෙත බෙදාහැර තිබුණි.<br>කුරුණෑගල ශික්ෂණ රෝහලේ හෘද රෝග අංශය වෙත ලබාදී තිබුණු පිරිවැය එක්සත් ජනපද ඩොලර් 75,027.91 ක් වූ Echo Cardiography යන්ත්‍රයේ ප්‍රමිතිය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බව රෝහල් කළමනාකරණය විසින් තහවුරු කර තිබුණි.<br>ව්‍යාපෘතිය යටතේ මිලදී ගෙන රෝහල් වෙත නිකුත් කර තිබුණු එක්සත් ජනපද ඩොලර් 1,211,948.14 ක් වූ උපකරණ 2021 මැයි 31 දින වන විටත් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. | | | |
| 43. | 2016 වර්ෂයේදී, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන නියෝජිත ආයතනය (Information and Communication Technology Agency of Sri Lanka(ICTA))විසින් ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1,805 ක් වූ ශ්‍රී ලංකා රජයේ රෝහල්වල ඉලෙක්ට්‍රොනික වෛද්‍ය වාර්තා ක්‍රියාත්මක කිරීමේ (Implementation of Electronic Medical Recodes in Sri Lankan | වැය කරන ලද සමස්ථ වියදම හඳුනාගැනීමට, සියළු වත්කම් අමාත්‍යාංශ වෙත පවරා ගැනීමට හා වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.<br>මෙම ව්‍යාපෘතියට සම්බන්ධ සියලු පාර්ශවයන් සාමූහිකව එකතුවී ව්‍යාපෘතියේ කටයුතු | -එම- | 2022 ජනවාරි 31 දින වන විටත් විගණන නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි |

Government Hospitals)ව්‍යාපෘතිය සඳහා 2016 ඔක්තෝබර් 05 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට දිවයිනේ සියළුම වර්ගයේ රෝහල් ආවරණය වන පරිදි රජයේ රෝහල් 300 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් සෞඛ්‍ය සේවාවේ ගුණත්වය හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට සැලැසුම් කර තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වන විට රෝහල් 300 න් රෝහල් 41 ක Hospital Health Information Management System (HHIMS)මෘදුකාංගය ස්ථාපිත කරමින් පැවතියදී, 2018 වර්ෂයේ සිට ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පැවරීමට මුදල් අමාත්‍යාංශය කටයුතු කර තිබුණි.

මෙම ව්‍යාපෘතිය සඳහා ICTA වෙත විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් 2016 වර්ෂයේදී රු.මිලියන 355 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව, ඉන් දෘඩාංග සඳහා රු.මිලියන 147.61 ක් වැය කර තිබුණු නමුත් මෘදුකාංග, මානව සම්පත්, නඩත්තු හා සේවා සහ අනෙකුත් දෑ සඳහා වැයකළ මුදල්

සාර්ථකව අවසන් කළ යුතුය.

ව්‍යාපෘතිය යටතේ මිලදීගත් සියලුම උපකරණ භාවිතයට ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර රජයට සිදුවූ පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතු අතර කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.

පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. 2018 වර්ෂයේ සිට ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පැවරීමෙන් පසුව ව්‍යාපෘතිය ඉදිරියට සිදුකරන ආකාරය පිළිබඳව හා ස්ථාපිත කර ඇති පද්ධති නඩත්තුව හා පවත්වා ගෙන යාම පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය හා විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය අතර එකඟතාවයකට එළඹ නොතිබුණු අතර එකිනෙක අමාත්‍යාංශයේ වගකීම් නිශ්චය කරද නොතිබුණි. තවද ICTA විසින් ස්ථාපිත කර තිබුණු HHIMS මෘදුකාංගයේ Source Code හා System Administrator හි අයිතිය සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් HHIMS මෘදුකාංගය ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණු රෝහල්වල එම මෘදුකාංගය ස්ථාපිත නොකර Health Information Management System (HIMS) මෘදුකාංගය සංවර්ධනය කිරීමට හා ස්ථාපිත කිරීමට කාලය ගත කර තිබුණි. 2018 වර්ෂයේ සිට තෝරාගත් රෝහල් 63 ක HIMS මෘදුකාංගය ස්ථාපිත කිරීම ආරම්භ කර තිබුණද ව්‍යාපෘතිය සැලැසුම් කර තිබුණු

පරිදි සම්පූර්ණ කිරීමට නොහැකිවී තිබුණි.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා 2018, 2019 හා 2020 වර්ෂවලදී මුළු මුදල රු.මිලියන 245.21 ක් වැයකර තිබුණි. මෙම වියදම තුළ ඇතුළත් තෝරා ගත් රෝහල් 15 ක් සඳහා ලබාදී තිබුණු පිරිවැය රු.මිලියන 23.68 ක් වූ Laptop 384 ක්ද, පිරිවැය රු.මිලියන 1.25 ක් වූ මුද්‍රණ යන්ත්‍ර (Brother Printer) 32 ක්ද, පිරිවැය රු.මිලියන 4.52 ක් වූ Bixolon POS Printers & Bixolon Sticker Printers 80 ක්ද, පිරිවැය රු.මිලියන 1.57 ක් වූ Barcode Reader 395 ක්ද 2021 මැයි 10 දින වන විට භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. තවද මෙම ව්‍යාපෘතිය යටතේ මිලදී ගෙන රෝහල් 43 ක් වෙත ලබාදී තිබුණු පිරිවැය රු.මිලියන 55.51 ක් වූ Laptop 900 ක්ද, පිරිවැය රු.මිලියන 3.36 ක් වූ මුද්‍රණ යන්ත්‍ර (Brother Printer) 86 ක්ද, පිරිවැය රු.මිලියන 6.20 ක් වූ Bixolon POS Printers & Bixolon Sticker Printers 215 ක්ද හා පිරිවැයරු.මිලියන 4.17 ක් වූ Barcode Reader 1,045 ක්ද අවශ්‍ය සර්වර් (Server)පහසුකම් සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ඌන උපයෝජිතව පැවතුණි.

මෙම ව්‍යාපෘතිය යටතේ Server හා උපාංග සපයා, ගෙනවිත් භාරදී, ස්ථාපිත කිරීම සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් 2018 සැප්තැම්බර් 06 දින ලංසු කැඳවා තිබුණු අතර කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 147.94 කට කොන්ත්‍රාත්තුව පැවරීමේ 2018 නොවැම්බර් 28 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණය අදාළ අංශය වෙත දැනුම්දීම සඳහා දින 47 ක් ගත කර තිබුණි.ඒ හේතුවෙන් ලංසු කැඳවූ දින සිට දින 172 ක් ප්‍රමාදව කොන්ත්‍රාත්තුව 2019 පෙබරවාරි 25 දින ප්‍රදානය කර තිබුණි. ගිවිසුම ප්‍රකාරව 2019 ජූලි 30 දිනට පෙර භාණ්ඩ සැපයිය යුතු නමුත් කාර්යසාධන බැඳුම්කරයේ කාලය 2019 දෙසැම්බර් 25 දින කල් ඉකුත් වන විටත් භාණ්ඩ සපයා නොතිබුණු අතර කාර්යසාධන බැඳුම්කරයේ කාලය දීර්ඝ කරවා ගැනීමට හෝ කල් ඉකුත්වීමට පෙර එය මුදල් කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම ප්‍රසම්පාදනය අවසන් කිරීමටත් කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමටත් 2020 සැප්තැම්බර් 10 දින තිරණය කර තිබුණද 2021 සැප්තැම්බර් 15 දින වන විටත් ඒ

| | | | | |
|---|---|---|---|---|
| | සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | | |
| 44. | සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 04 කදී වෙළෙඳපල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කර කුරුණෑගල ශික්ෂණ රෝහලට අවශ්‍ය මුළු පිරිවැය රු.මිලියන 19.39 ක් වූ පාරිභෝජ්‍ය භාණ්ඩ හා ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. අවස්ථා 04 දීම, පාරිභෝජ්‍ය භාණ්ඩ හා ද්‍රව්‍ය සඳහා ලියාපදිංචිවී තිබුණු සැපයුම්කරුවන් 24 දෙනාගෙන් සැපයුම්කරුවන් 10 දෙනෙකුගෙන් පමණක් මිල කැඳවීම් සිදුකර තිබීම නිසා ලියාපදිංචි සියළුම සැපයුම්කරුවන්ට එම ප්‍රසම්පාදනයන්ට සාධාරණව හා සමාන ලෙස සහභාගිවීමට පැවති අවස්ථා අහිමි කර තිබුණි. ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතික පත්‍ර අනුව එකම පවුලකට අයත් ආයතන දෙකකින් ඉදිරිපත් කර තිබුණු ලංසු හා තවත් එක් සැපයුම්කරුවකුගේ ලංසුවක් පමණක් ඇගයීම් කර එම පවුලට අයත් ආයතන දෙකෙන් පමණක් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය මිලදීගෙන තිබීම හා මෙම ප්‍රසම්පාදනය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.12, 2.11.2, 3.4.2 (අ) (i), 4.2, 6.1, 6.3, 6.3.6, සහ 8.9.1 (ආ) යන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදුකර නොතිබීම නිසා | මේ සම්බන්ධයෙන් විධිමත් පරික්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය | රෝහලේ කඩිනම් අවශ්‍යතා සඳහා භාණ්ඩ ලබාගැනීමේ පහසුව සලකා රෝහල අවට ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමට කටයුතු කළ බව, දෙවන මිල කැඳවීමේ සිට ඉදිරි සියළු මිල කැඳවීම් අවස්ථා වන විට පැවති වසංගතතත්වය මත රටෙහි ප්‍රදේශ ගණනාවක් වසා තැබීම හා තැපැල ක්‍රියාත්මක නොවීම යන කරුණු මත කුරුණෑගල අවට සැපයුම්කරුවන් පමණක් තෝරා මිල කැඳවීම් ලිපි යැවීමට සිදු වූ බව, ඉදිරිපත් කර ඇති අවම මිලට හෝ ඇගයීම් මණ්ඩල වාර්තාවෙන් ලැබෙන නිර්දේශ මත රජයට උපරිම වාසි සැලසෙන පරිදි භාණ්ඩ මිලදී ගන්නා බව. | 2022 ජනවාරි 31 දින වන විටත් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පාරිභෝජ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සඳහා තරඟකාරි අවම මිලක් ලබාගැනීමට තිබුණු අවස්ථාවන් අහිමිකර ගෙන තිබුණු බවත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විශ්වාසවන්තභාවය සහ විනිවිදභාවය ආරක්ෂා කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය. විගණන නිලධාරීන් විසින් සී/ස රජයේ වානිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් ලබාගන්නා ලද මිල ගණන් සමඟ සැසඳීමේදී සැපයුම්කරුවන් දෙදෙනා වෙත රු.මිලියන 1.94 ක් වැඩියෙන් ගෙවා තිබුණු බවත්, වෙළඳපොලේ පවතින උපරිම සිල්ලර මිල ගණන් සමඟ සැසඳීමේදී සැපයුම්කරුවන් දෙදෙනා වෙත රු.මිලියන 1.47 ක් වැඩියෙන් ගෙවා තිබුණු බවත් නිරීක්ෂණය විය. | | | |
| 45. | කුරුණෑගල ශික්ෂණ රෝහල ලිපිද්‍රව්‍ය ක්ෂේත්‍රයට අදාළ නොවන සැපයුම්කරුවන් වන පරිගණක හා උපාංග සැපයුම්කරුවන්, රෝහල් අවශ්‍යතාවය සපුරාලීමට හැකියාවක් නොමැති සැපයුම්කරුවන් හා ව්‍යාජ සැපයුම්කරුවන් ලියාපදිංචි කර තිබුණු බව ලිපිද්‍රව්‍ය සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛණය පරීක්ෂා කිරීමේදී හා ක්ෂේත්‍ර | -එම- | විවිධ භාණ්ඩ වර්ග ලබා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීමේදී ලැබෙන මිල ගණන් පදනම් කර ගනිමින් ප්‍රසම්පාදන කටයුතු කරන බව, ඉදිරිපත් කර ඇති අවම මිලට හෝ ඇගයීම් මණ්ඩල වාර්තාවෙන් ලැබෙන නිර්දේශ මත රජයට උපරිම වාසි සැලසෙන පරිදි | 2022 ජනවාරි 31 දින වන විටත් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණි. |

පරීක්ෂණයේදී අනාවරණය විය. එපරිදි ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් ලංසු කැඳවා සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 02 කදී එකම සැපයුම්කරුවෙකු වෙතින් මුළු පිරිවැය රු.මිලියන 9.10 ක් වූ ලිපි ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. එසේම පළමු ප්‍රසම්පාදනයේදී ලැබී තිබුණු ලංසු 03 න් ලංසු 02 ක් සහ දෙවන ප්‍රසම්පාදනයේදී ලැබී තිබුණු ලංසු 03 න් ලංසු 01 ක් ලිපිද්‍රව්‍ය ක්ෂේත්‍රයට අදාළ නොවන පරිගණක හා උපාංග සැපයුම්කරුවන්ගෙන් ලැබී තිබීම හා තවත් ලංසුවක් ව්‍යාජ ලංසුවක් බව තහවුරුවීම නිසාත්, මෙම ප්‍රසම්පාදනය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.12, 2.11.2, 3.4.2 (අ) (i), 3.4.3 (ඇ) 4.2, 5.6.1 (අ), 6.1, 6.3, 6.3.6, සහ 8.9.1 (ආ) යන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවීම නිසාත් තරගකාරි අවම මිලක් ලබාගැනීමට පැවැති හැකියාව අහිමිවී තිබුණු බවත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විශ්වාසවන්තභාවය සහ විනිවිදභාවය ආරක්ෂා කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

විගණන නිලධාරීන් විසින් සී/ස රජයේ වානිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් ලබාගන්නා ලද මිල ගණන් සමඟ සැසඳීමේදී

භාණ්ඩ මිලදී ගන්නා බව.

| | | | | |
|---|---|---|---|---|
| | සැපයුම්කරු වෙත රු.මිලියන 3.60 ක් වැඩියෙන් ගෙවා තිබුණු බවත්, වෙනත් පෞද්ගලික ආයතනයකින් ලබා ගන්නා ලද මිල ගණන් සමඟ සැසඳීමේදී සැපයුම්කරු වෙත රු.මිලියන 2.71 ක් වැඩියෙන් ගෙවා තිබුණු බවත්, වෙළඳපොලේ පවතින උපරිම සිල්ලර මිල ගණන් සමඟ සැසඳීමේදී සැපයුම්කරු වෙත රු.778,417 ක් වැඩියෙන් ගෙවා තිබුණු බවත් නිරීක්ෂණය විය. | | | |
| 46. | ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද රජයේ රෝහල්වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය මගින් 2018 වර්ෂයේදී කුරුණෑගල ශික්ෂණ රෝහලට ලබාදී තිබුණු එක්සත් ජනපද ඩොලර් මිලියන 0.71 ක වටිනාකමකින් යුක්ත වූ මෙටාමයිසර් යන්ත්‍රය වර්ෂයක පමණ කාලයක් ප්‍රයෝජනයට ගැනීමෙන් අනතුරුව මෙම වාර්තාවේ දිනය වන විටත් ක්‍රියාවිරහිතව පවතින බව නිරීක්ෂණය. | මෙම ව්‍යාපෘතිය යටතේ මිලට ගත් උපකරණ භාවිතය සම්බන්ධයෙන් පැනනැගී ඇති ගැටළු නිරාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බව. වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | 2022 ජනවාරි 31 දින වන විටත් යන්ත්‍රය ක්‍රියාවිරහිතව පවතුණි. |
| 47. | අමාත්‍යාංශය හා ඒ යටතේ වූ ආයතන 16 කින් පමණක් ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව, පිරිවැය රු.මිලියන 22.27 ක් වූ රථවාහන, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ නිල නිවාස 18 ක්ද, පිරිවැය | සමස්ථ රෝහල් පද්ධතිය තුළ පවතින නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම් හදුනා ගැනීමටත් එම වත්කම් ඵලදායි පරිදි | -එම- | 2022 ජනවාරි 31 දින වන විටත් නිෂ්ක්‍රිය වත්කම් හදුනා ගැනීමට හා ඵලදායී ලෙස උපයෝජනය |

| | | | | |
|---|---|---|---|---|
| | පිළිබඳ තොරතුරු සඳහන් නොකළ රථවාහන, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ 13 ක්ද කාර්යක්ෂමව හා සඵලදායීව උපයෝජනය නොකර නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. ආයතන 38 ක් විසින් කාර්යක්ෂමව හා සඵලදායීව උපයෝජනය නොකර නිෂ්කාර්යව පවතින වත්කම් පිළිබඳ තොරතුරු, 2021 මැයි 15 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුය. | | කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| 48. | අමාත්‍යාංශය විසින් 2010 වර්ෂයේ සිට ගරු අමාත්‍යවරුන්ට, නියෝජ්‍ය හා රාජ්‍ය අමාත්‍යවරුන්ට, අධීක්ෂණ මන්ත්‍රීවරුන්ට, උපදේශකයින්ට, අමාත්‍ය කාර්ය මණ්ඩලවලට හා රජයේ නිලධාරීන්ට ලබාදී තිබුණු ඩෙක්ස්ටොප් හා ලැප්ටොප් පරිගණක, නෝට්බුක්, ජංගම දුරකතන සහ කැමරා ආදී වූ උපකරණ පිළිබඳ සියළු හා සම්පූර්ණ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. 2015 අගෝස්තු සිට තනතුර දරමින් 2019 නොවැම්බර් මාසයේදී ඉන් ඉවත්ව තිබුණු රාජ්‍ය අමාත්‍යවරයකු වෙත නිකුත් කර තිබුණු පිරිවැය රු.මිලියන 1.09 ක් වූ උපකරණ වර්ග 09 කට අයත් ඒකක 10 ක් ආපසු ලබා ගැනීමට අපොහොසත්වී තිබුණි. | මෙම තොරතුරු කඩිනමින් ඉදිරිපත් කළ යුතු අතර නියමිත පරිදි නැවත භාරදී නොමැති උපකරණ සම්බන්ධයෙන් විධිමත් ලෙස කටයුතු කළ යුතුය. | -එම- | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම උපකරණ ආපසු ලබා ගැනීමට අපොහොසත්වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 49. | මහනුවර ජාතික රෝහලේ හිමිකම් නොපෑ මළ සිරුරු, අජීවී ශරීර අවයව කොටස්, අජීවී දරු උපත් හා බිළිඳු මළ සිරුරු ඉවත් කිරීම හා භූමදානය කිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, එම ද්‍රව්‍ය ඉවත් කිරීම හා භූමදානය කිරීමේ කාර්යයන් රෝහලේ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ පූර්ණ අධීක්ෂණය යටතේ කොන්ත්‍රාත්කරු විසින් සිදුකළ යුතු වුවද, කිසිදු අවස්ථාවකදී මහජන සෞඛ්‍ය පරීක්ෂක සහභාගීවී නොතිබුණි.<br>2020 සැප්තැම්බර් 14 දින අධීශීතකරණයේ තැන්පත් කර තිබුණු මව්වරුන්ගේ වැදෑමහවල අයිස් මිශ්‍රිත බර ප්‍රමාණය හා අදාළ මවුවරුන් සංඛ්‍යාව අනුව බරෙහි සාමාන්‍ය ග්‍රෑම් 979 ක් වූ නමුත්, 2019 ජනවාරි 01 දින සිට 2020 අප්‍රේල් 30 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත්කරු විසින් ගාස්තු අයකර තිබුණු බර ප්‍රමාණ හා මවුවරුන් සංඛ්‍යාව අනුව බරෙහි සාමාන්‍ය කිලෝග්‍රෑම් 1.7 සිට 4.7 දක්වා වූ ඉහල පරාසයක් ගෙන තිබුණි.<br>අන්තර්ජාලයේ පවතින තොරතුරු හා වෛද්‍ය වාර්තා අනුව මවකගේ පැවතිය හැකි වැදෑමහක බර පරාසය ග්‍රෑම් 500 සිට ග්‍රෑම් 800 ක් දක්වා විය. එම සංඛ්‍යා ලේඛන | මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම කාර්ය සිදුකළ යුතුය.<br>මේ සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදුකර වැඩිපුර ගෙවන ලද මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතු අතර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ හා වාට්ටු භාර හෙද සොයුරියන්ගේ අධීක්ෂණය යටතේ සිදු කරන බව හා පූර්ණ පරීක්ෂණයක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ විමර්ශන අංශයෙන් සිදුකරන බව. | 2022 ජනවාරි 31 වන විටත් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන වැඩිපුර ගෙවන ලද මුදල අයකර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මත පදනම් වෙමින් හා විගණිත දිනය වූ 2020 සැප්තැම්බර් 14 දිනට පැවති එම ද්‍රව්‍යවල අයිස් මිශ්‍රිත සාමාන්‍ය බර වූ ග්‍රෑම් 979 කිලෝග්‍රෑම් 01 ක උපරිමයක් ලෙසත්, 2019 ජනවාරි 01 දින සිට 2020 අප්‍රේල් 30 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ මවුවරුන් සංඛ්‍යාවත් සැලකීමේදී එම ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 24,877 ක් වැඩියෙන් ලේඛනගත කර තිබුණු බවත්, එදින වන විට ඉන් ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 22,246 ක් සඳහා රු.මිලියන 9.36 ක් වැඩිපුර ගෙවා තිබුණු බවත් නිරීක්ෂණය විය. | | | |
| 50. | අම්පාර මහ රෝහල තුළ ක්‍රියාත්මකව තිබුණු රෝහල් සෞඛ්‍ය තොරතුරු කළමනාකරණ පද්ධතියේ (Hospital Health Information Management System (HHIMS)) උප ඒකකයක් (Sub Module) ලෙස රසායනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතියක් (Laboratery Information Management System (LIMS) රු.මිලියන 3.5 ක් වැය කර 2018 වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණි.<br>ඒ වන විටත් HHIMS පද්ධතිය තුළ LIMS මෘදුකාංගය ඇතුළත් බව තහවුරු වූ බැවින් අවශ්‍යතාවයකින් තොරව එම | අවශ්‍යතාවය නිශ්චිතව හඳුනා ගැනීමෙන් පසුව හා නියමිත අනුමැතීන් ලබා ගැනීමෙන් පසුව සියළුම ප්‍රසම්පාදනයන් ආරම්භ කළ යුතුය. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය.<br>මේ සම්බන්ධයෙන් පූර්ණ පරික්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් නිශ්චය | පළමු ලංසුකරු වෙත ප්‍රසම්පාදනය පිරිනැමීම මගින් මූල්‍ය පාඩුවක් සිදුවී නොමැති බව හා ලංසුකරුවන් ලබාදී ඇති ලංසු අනුව හා ලබාගන්නා සැපයීමට අදාළ ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්‍ෂණික ඇගයීම් කමිටුවේ තීරණ අනුව ලංසු ප්‍රදානය කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පූර්ණ පරික්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් නිශ්චය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. |

මෘදුකාංගය මිලදී ගැනීමට තීරණය කර තිබුණු බව නිරීක්ෂණය විය. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 (අ) හා 2.8.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව, මෙම ප්‍රසම්පාදන දැන්වීම අදාළ වෙබ් අඩවිවල පළකර නොතිබුණු අතර මෙම ප්‍රසම්පාදනයේ තාක්ෂණික ඇගයීම් කමිටුවට විෂය පිළිබඳ විශේෂඥයකු පත්කර නොතිබුණි. ලංසුකරුවන් දෙදෙනෙකු විසින් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර මෘදුකාංගයේ මිලට ඉදිරි වර්ෂ 04 සඳහා නඩත්තු වියදම්වල ශුද්ධ වර්තමාන වටිනාකම (Net Present Value) එකතුකර ලංසු ඇගයීම සිදුකළ යුතු නමුත්, ඒ වෙනුවට පළමු අවම ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබුණු මෘදුකාංගයේ මිල වූ රු.මිලියන 3.50 සමඟ, දෙවන අවම ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබුණු මෘදුකාංගයේ මිල වූ රු.මිලියන 2.33 ට ඉදිරි වර්ෂ 04 ක නඩත්තු වියදම් වූ රු.මිලියන 1.74 ක් එකතුකර ලබා ගත් රු.මිලියන 4.07 ක් සසඳා ලංසු ඇගයීම සිදුකර තිබුණි. ඒ අනුව, පළමු අවම ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබුණු ලංසුව, දෙවන අවම ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබුණු ලංසුවට වඩා අඩු ලංසුවක් බවට ව්‍යාජ සටහන් යොදා පළමු

කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

ලංසුකරු වෙත ප්‍රසම්පාදනය පිරිනැමීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලබාදී තිබුණි. එම නිර්දේශය ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින්ද තහවුරු කර ප්‍රසම්පාදනය පළමු ලංසුකරු වෙත පිරිනමා තිබීම හේතුවෙන් රජයට සිදුවී තිබුණු මූල්‍යමය පාඩුව රු.මිලියන 1.17 ක් විය.

භාණ්ඩ ඇණවුමෙහි ප්‍රමාද කාලය වෙනුවෙන් අයකළ යුතු ප්‍රමාද ගාස්තු පිළිබඳ කොන්දේසි කිසිවක් ඇතුළත් කර නොතිබීම හේතුවෙන් ප්‍රමාද කාලය මාස 07 ක් සඳහා ප්‍රමාද ගාස්තු අය කිරීමට නොහැකිවී තිබුණි.

සැපයුම්කරු LIMS මෘදුකාංගය ස්ථාපිත කිරීම සඳහා ගිවිසුම් ගතවී තිබුණු නමුත්, සත්‍ය වශයෙන් HHIMS තුළ Middle Ware මෘදුකාංගයක් පමණක් ස්ථාපිත කර තිබුණු බවත්, එය ආසන්න වශයෙන් රු.500,000 පමණ වියදමකින් ස්ථාපනය කර ගත හැකි බැවින් සැපයුම්කරු වෙත ආසන්න වශයෙන් රු.මිලියන 3 ක් පමණ වැඩිපුර ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

විගණිත දිනය වන විට ස්ථාපිත කර තිබුණු මෘදුකාංගය, රෝහල තුළ පවතින OPD, Wards සහ Clinic යන අංශ සමඟ සම්බන්ධ කර නොතිබුණි. ඒ හේතුවෙන්

මෘදුකාංගය හරහා ලබා ගැනීමට අපේක්ෂා කරන ලද පරීක්ෂණ වාර්තා අතින් පිළියෙල කරන බවත්, ඒ හේතුවෙන් දත්ත ද්විත්වකරණය වීම, ලිපිගොනු භාවිතය ඉහළ යෑම, පරිවර්තන දෝෂ ඇතිවීම, වැඩි කාලයක් ගතවීම, නියැදි අස්ථාන ගතවීම, නියැදියක් ලබා ගැනීමේ දුෂ්කරතාවය, පවතින දත්ත මත පර්යේෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම අපහසුවීම හා සංඛ්‍යා දත්ත උත්පාදනය අපහසුවීම වැනි අඩුපාඩු හා දුර්වලතා ඇති විය හැකි බවත් නිරීක්ෂණය විය.

නව මෘදුකාංගය ස්ථාපිත කිරීමෙන් අනතුරුව 2017 අප්‍රේල් මස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) විසින් ස්ථාපිත කර තිබුණු පද්ධතිය හරහා රසායනාගාර වාර්තා ඉලෙක්ට්‍රොනිකව වෛද්‍යවරුන් වෙත ලබාදීම ඇතුළු දත්ත හුවමාරු කිරීමේ ක්‍රියාවලිය 2018 ඔක්තෝබර් 20 දින සිට ක්‍රියාවිරහිත වී ඇති බවත්, FBC වාර්තා ලබා ගැනීමේ හැකියාව අහිමිවී ඇති බවත් හා එම පද්ධතිය වඩාත් සංකීර්ණවී ඇති බවත් වාර්තාවී තිබුණි. ඒ අනුව නව මෘදුකාංගය මිලදී ගැනීම සඳහා වැයකර තිබුණු රු.මිලියන 3.5 ක මුදල නිශ්කාර්ය වියදමක්වී තිබුණු

| | | | | |
|---|---|---|---|---|
| | අතරම පැවති පද්ධතිය අක්‍රියවී තිබුණි.<br><br>රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව, සැපයුම්කරුගෙන් ලබා ගෙන තිබුණු රු.50,000 ක කාර්ය සාධන සුරක්ෂණය 2018 ඔක්තෝබර් 02 දින කල් ඉකුත්වී තිබුණු නමුත් එහි කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br><br>ස්ථාපිත කර තිබුණු මෘදුකාංගය නියමිත පිරිවිතර අනුව ස්ථාපනය කර තිබෙන බවට විෂය පිළිබඳ විශේෂඥයෙකුගෙන් වාර්තාවක් ලබා ගෙන නොතිබුණු අතර මෘදුකාංගය නිවැරදි පරිදි භාවිතයට ගත හැකිද යන්න තහවුරුකර ගැනීමකින් තොරව හා මුදල් රෙගුලාසි 136, 137, 138 හා 139 උල්ලංඝනය කරමින් 2018 දෙසැම්බර් 31 දින සැපයුම්කරු වෙත රු.මිලියන 3.44 ක් ගෙවා තිබුණි. | | | |
| 51. | 2021 ජනවාරි 02 දින සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පොළොන්නරුව මහ රෝහලේ සිදු කර තිබුණු සංචාරයට පෙර පරිත්‍යාග ලෙස නිමකරදී තිබුණු, විශේෂඥ වෛද්‍ය නිල නිවාස (Villa) අසල සිට ඇමදුම් හා අරක්ෂක අංශ සඳහා ඉදිකර ඇති ගොඩනැඟිල්ල දක්වා වූ මාර්ගය | මේ සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් නිශ්චය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් විමර්ශනයක් සිදුකරමින් පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පූර්ණ පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් නිශ්චය කර අවශ්‍ය ක්‍රියාමාර්ග |

| | | | | |
|---|---|---|---|---|
| | අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් ගල් අතුරා නවිකරණය කිරීම හා පැරණි, අබලන් විදුලි හා ආරක්ෂක අංශ පවත්වාගෙන ගොස් තිබුණ ගොඩනැඟිල්ල කඩා ඉවත්කිරීම සඳහා පිළිවෙලින් රු.මිලියන 1.580 ක් හා රු. 699,290 ක (බදු රහිත) ඇස්තමේන්තු මත 2021 ජනවාරි 24 දින ලංසු කැඳවා තිබුණි. 2021 පෙබරවාරි 11 දින ලංසු විවෘත කිරීමට පෙර එම ව්‍යාපෘති දෙකෙහි වැඩ අවසන් කර තිබීමෙන් අක්‍රමිකතාවක් සිදු කිරීමට කටයුතු කර තිබුණු බව 2021 පෙබරවාරි 10 දින සිදුකළ භෞතික පරික්ෂව මඟින් අනාවරණය විය. | | | ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 52. | පවිත්‍රතා සේවා කර්මාන්තයේ නියැලි සේවකයින් සඳහා 2016 මාර්තු 24 දින සිට රජය විසින් වැඩි කරන ලද වැටුප් පවිත්‍රතා සේවා සපයන ලද ආයතනවල ඉල්ලීම් අනුව ගෙවීමටත්, ගෙවීම් කිරීමට පෙර, වැඩිකරන ලද වැටුප් සේවකයින්ටත්, වැඩිවූ වැටුප් අනුව දායක මුදල් සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලටත් ගෙවා ඇති බව ආදී වූ කරුණු තහවුරු කර ගත යුතු බවටත් 2016 අගෝස්තු 05 දින ලබාදී තිබුණු අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. නමුත් එම කොන්දේසි තහවුරු කර ගැනීමකින් තොරව | මේ සම්බන්ධයෙන් පූර්ණ පරික්ෂණයක් සිදුකර වැඩිපුර ගෙවන ලද මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතු අතර වගකිව යුතු නිලධාරින්සම්බන්ධ යෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බව. වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | 2022 ජනවාරි 31 දින වන විටත් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණි. |

2016 ජනවාරි සිට 2016 සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් කොළඹ ජාතික රෝහල විසින් ආයතන 04 ක් වෙත එකතුව රු.මිලියන 26.57 ක හිඟ වැටුප් හා අතිකාල දීමනා ගෙවා තිබුණි.

සේවයේ යොදවා තිබුණු කම්කරුවන් 63 දෙනෙකු වෙනුවෙන් සේවා වැඩමුර 1,254 ක් හා දින 375 ක් සඳහා වැටුප් ලෙස කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු රු.879,660 ක් කොන්ත්‍රාත්කරු විසින් කම්කරුවන් වෙත ගෙවා නොතිබුණු බවත්, එම කම්කරුවන් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් වෙනුවෙන් රු.131,949 ක් කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවා තිබුණු බවත්, මෙම කාලපරිච්ඡේදයට අදාළ නව අතිකාල රේටයන් අනුව කම්කරුවන්ගේ අතිකාල දීමනා ලෙස එකතුව රු.මිලියන 25.31 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණද ඉන් රු.මිලියන 7.15 ක් කොන්ත්‍රාත්කරු විසින් කම්කරුවන් වෙත ගෙවා නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

මෙම කාලපරිච්ඡේදය වෙනුවෙන් වැඩ පරීක්ෂකවරු 24 දෙනෙකුගේ වැටුප් හා අතිකාල දීමනා ලෙස

| | | | | |
|---|---|---|---|---|
| | රු.මිලියන 1.92 ක් කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවා තිබුණු බවත්, කොන්ත්‍රාත්කරුවන් තුන්දෙනෙකු වෙත එකතු කළ අගය මත බදු රු.714,983 ක් වැඩිපුර ගෙවා තිබුණු බවත්, එක් කොන්ත්‍රාත්කරුවෙකුට නව රේටරයන්ට අනුව සත්‍ය ලෙස නොයෙදූ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය වෙනුවෙන් රු.81,320 ක් වැඩිපුර ගෙවා තිබුණු බවත් නිරීක්ෂණය විය. | | | |
| 53. | පවිත්‍රතා සේවා කර්මාන්තයේ නියැලි සේවකයින් සඳහා 2018 අගෝස්තු 01 දින සිට රජය විසින් වැඩි කරන ලද වැටුප් පවිත්‍රතා සේවා සපයන ලද ආයතනවල ඉල්ලීම් අනුව ගෙවීමටත්, ගෙවීම් කිරීමට පෙර, වැඩිකරන ලද වැටුප් සේවකයින්ටත්, වැඩිවූ වැටුප් අනුව දායක මුදල් සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලටත් ගෙවා ඇති බව ආදී වූ කරුණු තහවුරු කර ගත යුතු බවට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් 2018 දෙසැම්බර් 17 දින තීරණය කර තිබුණි. නමුත් එම කොන්දේසි තහවුරු කර ගැනීමකින් තොරව මහරගම අපේක්ෂා රෝහල විසින් පවිත්‍රතා සේවා සැපයුම්කරු වෙත සේවකයින්ට වැඩිකරන ලද වැටුප් ලෙස රු.මිලියන 8.40 ක් ගෙවා | මේ සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදුකර වැඩිපුර ගෙවන ලද මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතු අතර වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ නොවන බව, මෙම රෝහලේ පවිත්‍රතා සේවා සපයන ලද ආයතනය වෙත රජය මගින් වැඩිකළ වැටුප් ගෙවීම 2018 දෙසැම්බර් 17 දිනැති අමාත්‍යාංශ ප්‍රසම්පාදන සි 1 කමිටුව ගත් තීරණයට අනුකූලව හා අදාළ ආයතනය කළ ඉල්ලීම අනුව සිදුකළ බව. | 2022 ජනවාරි 31 දින වන විටත් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. තවද සේවා වැඩමුර 4,342 ක් හා දින 4,002 ක් සඳහා වැටුප් ලෙස ගෙවිය යුතු පිළිවෙලින් රු.මිලියන 3.21 ක් හා රු.මිලියන 2.96 ක් කොන්ත්‍රාත්කරු විසින් එම කම්කරුවන් වෙත ගෙවා නොතිබුණු බවත්, එම කම්කරුවන් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් වශයෙන් රු.926,184 ක්, නව අතිකාල රේටරයන් අනුව අතිකාල දීමනා ලෙස රු.මිලියන 6.39 ක් හා වැඩ පරීක්ෂකවරු 06 දෙනෙකුගේ වැටුප් හා අතිකාල ලෙස රු.373,287 ක් කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. | | | |
| 54. | 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, සියළුම රජයේ ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මගින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීමට පියවර ගත යුතු අතර 2017 මැයි 12 දිනැති අංක DMS/0016 දරන භාණ්ඩාගාර ලේකම්වරයා විසින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නිකුත් කර තිබුණු ලිපිය ප්‍රකාරව, සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධ වාර්තා තබා ගැනීමටත්, ඊට අනුකූල වන පරිදි නිලධාරීන්ගේ අමතර රාජකාරී දීමනා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වා ගෙන යාමටත් කටයුතු කළ යුතුය. | 2017 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීම අනිවාර්යය බව සියළුම අංශ ප්‍රධානීන් දැනුවත් කරමින් අමාත්‍යාංශය මගින් ගතයුතු සියළුම ක්‍රියා මාර්ග ගෙන ඇති නමුත්, ඒ සම්බන්ධයෙන් මතු වූ වෘත්තීය සමිති විරෝධතා හේතුවෙන් | 2022 ජනවාරි 31 දින වන විටත් ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සනාථ කළ හැකි පරිදි ඇඟිලි සළකුණු යන්ත්‍ර 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක නොකරන්නේ නම් වර්තමාන වැටුපට අනුව අතිකාල දීමනා නොගෙවීමට වගබලා ගත යුතු විය. නමුත් අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශයට, එයට අයත් රෝහල් හා ආයතන සඳහා රු.මිලියන 31.08 ක් වැය කර ස්ථාපිත කර තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍ර 213 ක් භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පැවති අතර වර්තමාන වැටුප පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් සඳහා රු.මිලියන 34,868.54 ක්ද අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා රු.මිලියන 27,703.08 ක්ද වශයෙන් මුළු මුදල රු.මිලියන 62,571.62 ක් ගෙවා තිබුණි. එසේම අතිකාල හා නිවාඩු දින වැටුප් වෙනුවෙන් වැයකර තිබුණු මුළු මුදල වැටුප් පිරිවැයෙන් සියයට 79 ක් පමණවී තිබුණි. | | එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බව. | |
| 55. | රජයේ නිලධාරීන්ගේ රාජකාරි වේලාවන්, අමතර සේවා මුර රාජකාරීන් හා සති විවේක දින රාජකාරීන් සඳහා යොදවා ගැනීම සහ ඒ වෙනුවෙන් ගෙවීම් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක විවිධ චක්‍රලේඛ විධිවිධාන හා ආයතන සංග්‍රහයේ ඇතුළත් විධිවිධාන අභිබවා, අමාත්‍ය මණ්ඩල | විවිධ ගෙවීම් සම්බන්ධයෙන් චක්‍රලේඛ නිකුත් කිරීමට පෙර අදාළ බලධාරීන්ගේ අනුමැතිය ලබා ගත යුතු අතර නියමිත අධිකාරීන් විසින් ලබාදෙන අනුමැතින් | හෙද සංගම් විසින් විසින් 4(x) වගන්ති ඉවත් කර අනෙකුත් හෙද නිලධාරීන්ට ලබා ගන්නා ආකාරයටම කෘත්‍ය ලේඛනය අනුව සේවයේ යෙදෙන හෙද නිලධාරීන්ගේ | 2022 ජනවාරි 31 දින වන විටත් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කර නොතිබුණි. |

අනුමැතියකින් තොරව, ඒ සම්බන්ධයෙන් 2009 මාර්තු 27 දිනැති අංක 02/19/2009 දරන පොදු චක්‍රලේඛය නිකුත් කර තිබුණි. විධිමත් අනුමැතියකින් තොරව වර්ෂ දෙකකට අධික කාලයක් මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමෙන් පසුව මෙම චක්‍රලේඛය සඳහා අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතිය ලබා ගැනීමේ අරමුණින් 2011 අප්‍රේල් 05 දින සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණි. මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්, ආයතන අධ්‍යක්ෂ ජනරාල් සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමුකර එම ආයතනවල නිර්දේශ ලබාගෙන සංශෝධනයන් 05 කට යටත්ව චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2011 සැප්තැම්බර් 14 දින ලබාදී තිබුණි. ඉහත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව සෞඛ්‍ය ලේකම් විසින් 2012 ජනවාරි 02 දින අංක 02/19/2009(1) දරන පොදු චක්‍රලේඛය නිකුත් කර තිබුණු නමුත් සෞඛ්‍ය ලේකම් විසින් 2012 ජනවාරි 13 දින නිකුත් කරන ලද අංක 01(11)/16/20

නොපමාව ක්‍රියාත්මක කළ යුතුය. තවද මෙම අවිධිමත්බාවය විධිමත් කර ගැනීමට පියවර ගත යුතුය. නිත්‍යානුකූල නොවන පරිදි සිදුකර ඇති ගෙවීම් ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතුය.

අමතර දීමනා ලබා ගැනීමට ඉඩකඩ ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව, එම ඉල්ලීම සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා සහ 02/19/2009 චක්‍රලේඛයෙහි පවතින අඩුපාඩු මඟහරවා ගෙන කටයුතු කිරීම සඳහා නිර්දේශ ලබා දීමට විශේෂ කමිටුවක් පත් කර ඇති බව.

| | | | | |
|---|---|---|---|---|
| | දරන ලිපිය මගින් චක්‍රලේඛය තාවකාලිකව අත්හිටුවා තිබුණි. මේ අනුව 2009 අප්‍රේල් 01 දින සිට 2021 අගෝස්තු 15 දින දක්වා වර්ෂ 12 කට වඩා වැඩි කාලයක් විධිමත් අනුමැතියකින් තොරව හෙදකාර්ය මණ්ඩල සඳහා අමතර දීමනා ගෙවා තිබුණු අතර එවැනි අවිධිමත් හා නිත්‍යානුකූල නොවූ ගෙවීම් සිදුකිරීම සඳහා අවස්ථාව සලසා තිබුණි. | | | |
| 56. | ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ තනතුරු 33 කට අදාළව පුරප්පාඩු 2,454 ක් හා තනතුරු 03 කට අදාළව අතිරික්ත 49 ක්ද, තෘතීයික මට්ටමේ තනතුරු 67 කට අදාළව පුරප්පාඩු 446 ක් හා එක් තනතුරකට අදාළව අතිරික්ත 02 ක්ද, ද්විතීක මට්ටමේ තනතුරු 78 කට අදාළව පුරප්පාඩු 6,010 ක් හා තනතුරු 14 කට අදාළව අතිරික්ත 134 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු45 කට අදාළව පුරප්පාඩු 8,899 ක් හා තනතුරු 06 කට අදාළව අතිරික්ත 3,371 ක්ද පැවැතුණි. එම පුරප්පාඩු තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රයටම අනන්‍ය තනතුරු වූ වෛද්‍ය නිලධාරීන් 2,268 ක්ද, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් 44 ක්ද, හෙද නිලධාරීන් 2,668 ක්ද, හෙද සොයුරු/සොයුරි 626 ක්ද, ඖෂධවේදීන් 129 ක්ද, විකිරණ | ඒ ඒ රෝහල් හා ආයතනවලට අනුමත කාර්ය මණ්ඩලය නොඉක්මවා නිලධාරීන් හා සේවකයින් අනුයුක්ත කළ යුතුය. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බව. වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | 2022 ජනවාරි 31 දින වන විටත් සේවක ඌනතා හා අතිරික්තයන් පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ශිල්පීන් 249 ක්ද, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් 526 ක්ද හා බන්තු රේඛණ සටහන්කරු 150 ක්ද පුරප්පාඩුවී තිබුණි. තවද ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන තනතුරු සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටියෙන් පරිබාහිරව සෞඛ්‍ය කාර්ය සහායක තනතුරට අනියම් පදනමින් බඳවා ගත් සේවක සංඛ්‍යාව 663 ක් විය. | | | |
| 57. | ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ සේවයේ නියුක්ත විදුලි වෛද්‍ය යාන්ත්‍රික නිලධාරීන් 45 දෙනෙකු අතරින් නිලධාරීන් 10 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කිරීමේදී, නිලධාරීන් 09 දෙනෙකු, 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට හා ඉන් පසුව නිකුත් කර තිබුණු අදාළ චක්‍රලේඛවල විධිවිධාන ප්‍රකාරව පිළියෙල කර තිබුණු නව බඳවා ගැනීමේ පටිපාටිවලට පටහැනිව, අදාළ වැටුප් පියවරයන්ට අන්තර්ග්‍රහනයකිරීමට හා වැටුප්පරිවර්තනයකිරීමට කටයුතු කර තිබුණු බවත්, දීර්ඝ කාලයක සිට එම නිලධාරීන්ට හිමි වැටුපට වඩා වැඩි වැටුපක් හා ඒ මත අතිකාල හා වෙනත් දීමනා සහ නිවාඩු දින වැටුප් වැඩියෙන් | මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර වැඩිපුර ගෙවන ලද වැටුප් අදාළ නිලධාරීන්ගෙන් හෝ ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතුය. | -එම- | 2022 ජනවාරි 31 දින දක්වා වැඩිපුර ගෙවන ලද මුදල් අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙවමින් පවතින බවත් නිරීක්ෂණය විය. වැඩිපුර ගෙවා ඇති මුදල් අදාළ ආදායකයින්ගෙන් හෝ ඊට වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර වාර්තා කරන ලෙසත්, අනෙකුත් සියළුම නිලධාරීන්ගේ බඳවා ගැනීම්, අන්තර්ග්‍රහණය කිරීම් හා වැටුප් පරිවර්තනයන්පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත් 2020 ජූලි 29දින ප්‍රධාන ගනන්දීමේ නිලධාරී වෙත ඉල්ලීමක් කළ නමුත් 2021 අප්‍රේල් 22 දින දක්වාම ඊට ප්‍රතිචාර දක්වා නොතිබුණි. | | | |
| 58. | ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ සේවයේ නියුතු විධායක නිලධාරී ගණයේ ජීව වෛද්‍ය ඉංජිනේරු තනතුරු සඳහා අනුමත නව සේවා ව්‍යවස්ථාවට සමගාමීව නව බඳවා ගැනීමේ පරිපාටියක් 2013 දෙසැම්බර් 20 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර තිබුණි.<br>1998 දෙසැම්බර් 02 දින සහකාර ජීව වෛද්‍ය ඉංජිනේරු (විදුලි) තනතුරට බඳවා ගෙන තිබුණු නිලධාරියෙකු සම්බන්ධයෙන් තහවුරුවී තිබුණු අසතුටුදායක සේවා කාලය සතුටුදායක සේවා කාලයක් ලෙස සලකා 2013 දෙසැම්බර් 20 දින II ශ්‍රේණියට | මේ සම්බන්ධයෙන් පරික්ෂා කර විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. | -එම- | 2022 ජනවාරි 31 දින දක්වා අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකර නොතිබුණි. |

අන්තර්ග්‍රහණය කර තිබුණු අතර I ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාගත යුතු අදාළ ක්ෂේත්‍රයේ පශ්චාද් උපාධි සුදුසුකම ලබා නොතිබුණු එම නිලධාරියා සමත්ව තිබුණු විද්‍යා උපාධිය එම ක්ෂේත්‍රයේ පශ්චාද් උපාධියට සමාන බව සාවද්‍ය ලෙස සලකා 2016 දෙසැම්බර් 11 දින සිට I ශ්‍රේණියට උසස් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිර්දේශ කර යවා තිබුණි.

1997 මැයි 16 දින සහකාර ජීව වෛද්‍ය ඉංජිනේරු (විදුලි ) තනතුරට බඳවා ගෙන තිබුණු නිලධාරියෙකු වර්ෂ 07 ක වැටුප් විලම්භනයකට ලක්වී තිබියදී හා ඉකුත් වර්ෂ 12 කදී අසම්පූර්ණ කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කර තිබියදී වර්ෂ 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවට හා 1998 දෙසැම්බර් 07 දින සිට සහකාර ජීව වෛද්‍ය ඉංජිනේරු (විදුලි) තනතුරට බඳවා ගෙන තිබුණු නිලධාරියෙකුගේ අසම්පූර්ණ කාර්ය සාධන වාර්තා පදනම් කර ගෙන සේවා කාලය සතුටුදායක ලෙස සලකා 2013 දෙසැම්බර් 20 දින සිට එම නිලධාරීන් දෙදෙනා II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර තිබුණි.

බඳවා ගැනීමේ පාරිපාටියෙහි 10.1.1.1(iii) ඡේදය අනුව කාර්ය සාධනය පිළිබඳ සුදුසුකම් සපුරා

නොතිබුණු නිලධාරීන් දෙදෙනෙකු III ශ්‍රේණියෙන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිර්දේශකර යවා තිබීම හේතුවෙන් එම නිලධාරීන් දෙදෙනා II ශ්‍රේණියට උසස් කර තිබුණි.

59. **ප්‍රතිපාදන උපයෝජනය**

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය | | | | |
| පුනරාවර්තන(රු.) | 137,592,550,000 | 158,567,140,000 | 127,606,000,000 | 423,765,690,000 |
| මූලධන(රු.) | 46,998,688,000 | 39,913,400,000 | 43,190,820,000 | 130,102,908,000 |
| **එකතුව(රු.)** | 184,591,238,000 | 198,480,540,000 | 170,796,820,000 | 553,868,598,000 |
| සත්‍ය වියදම | | | | |
| පුනරාවර්තන(රු.) | 134,448,816,751 | 159,355,689,597 | 126,567,719,791 | 420,372,226,139 |
| මූලධන(රු.) | 32,534,934,022 | 28,575,250,101 | 42,520,518,649 | 103,630,702,772 |
| **එකතුව(රු.)** | 166,983,750,773 | 187,930,939,698 | 169,088,238,440 | 524,002,928,911 |
| වසර අග ඉතිරි වීම් | | | | |
| පුනරාවර්තන(රු.) | 3,143,733,249 | (788,549,597) | 1,038,280,209 | 3,393,463,861 |
| මූලධන(රු.) | 14,463,753,978 | 11,338,149,899 | 670,301,351 | 26,472,205,228 |
| **එකතුව(රු.)** | 17,607,487,227 | 10,549,600,302 | 1,708,581,560 | 29,865,669,089 |

## 06. විදේශ අමාත්‍යාංශය

**ශීර්ෂය - 112**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| විගණන නිරීක්ෂණය | | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | අංක 7002-0-0-035/13 දරන අග්‍රිම ගිණුමෙන් අවස්ථා 179 කදී ලබා දෙන ලද රු. 39,550,728 ක් වූ අත්තිකාරම් කුමන කරුණක් සඳහා ලබා දී තිබේද යන්න හඳුනාගෙන නොතිබුණි. | අත්තිකාරම් ලබා දුන්නේ කුමන කරුණක් සඳහාද යන්න නිශ්චිතව හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම. | අත්තිකාරම් දෙන ලද කරුණ නිශ්චිතව හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අදාළ කරුණ නිරවුල් වී නැත. |
| 02. | අංක 7002-0-0-035/13 දරන අග්‍රිම ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 91,530,099 ක් වූ අතර, ඉන් රු. 51,979,371 ක් විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු 173 කින් සමන්විත විය. එම වටිනාකමින් රු. 4,285,061 ක් වර්ෂ 20 ඉක්මවා තිබුණු අතර, රු. 44,284,956 ක් වර්ෂ 10 ක සිට වර්ෂ 20 ක කාල පරාසයක් තුළද, ඉතිරි තැන්පතු ශේෂය රු. 3,409,354 ක් වර්ෂ 07 ක් ඉක්මවා තිබුණි. මෙම තැන්පතුවලින් 165 කට අදාළ රු. 47,954,750 ක් මේ වන විට විදේශ දූත මණ්ඩල කාර්යය මණ්ඩලය විසින් භාවිතා නොකරන නිවාස සඳහා | නොපියවූ අත්තිකාරම් කඩිනමින් අය කර ගැනීමට හෝ විධිමත් අනුමැතියකින් කපා හැරීමට කටයුතු කළ යුතු වීම. | නැවත අයකර ගැනීම සඳහා ඉදිරියේදී නිසි පියවර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අදාළ කරුණ නිරවුල් වී නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | තබා ඇති ආරක්ෂිත තැන්පතු වී තිබුණි. එම තැන්පතු සම්බන්ධයෙන් විදේශ දූත මණ්ඩල පාලන අංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක 250 හා 2009 සැප්තැම්බර් 01 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය මගින් උපදෙස් දී තිබුණද මුදල් ආපසු ලබා ගෙන නොතිබුණි. | | | |
| 03. | අංක 7002-0-0-035/20 දරන අග්‍රිම ගිණුම් ශේෂය තුළ නොපියවූ අත්තිකාරම් රු. 355,085,724 ක් වූ අතර එම වටිනාකම තුළ ඇතුළත් විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු රු. 20,464,959 ක් වර්ෂ 10 ඉක්මවා තිබුණු අතර රු. 49,112,123 ක් වර්ෂ 05 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක වටිනාකම් වී තිබුණි. තවද මෙම ආරක්ෂිත තැන්පතු වලින් දූත මණ්ඩල කාර්යය මණ්ඩල පදිංචි වී නොමැති නිවාස සඳහා තබා තිබුණු තැන්පතු 56 ක වටිනාකම රු. 21,275,938 ක් විය. | විදේශ දූත මණ්ඩල නිලධාරීන්ගේ සේවය අවසන් වන අවස්ථාවේදී නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු අය කර ගැනීමට ක්‍රමවේදයක් පිළියෙල කළ යුතු වීම. | නැවත අයකර ගැනීමට ඉදිරියේදී විධිමත් වැඩපිළිවෙළක් සකස් කිරීමට බලාපොරොත්තු වන බව. | විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 04. | දූත මණ්ඩලවල නොපියවූ අත්තිකාරම් රු. 23,293,715 ක් තත්කාර්යය අතුරු අග්‍රිම වූ අතර, එම අත්තිකාරම් තුළ 2018 වර්ෂයට පෙර කාලයට අදාළ රු. 9,168,655 ක් ද 2018 වර්ෂයට අදාළ රු. 813,741 ක් හා 2019 වර්ෂයට අදාළ රු. 3,912,255 ක් ද විය. ඒ අනුව මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව තත්කාර්යය අතුරු අග්‍රිම එම කාර්යය නිමකළ වහාම පියවිය යුතු නමුත් එම රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කාර්යය නිම කළ වහාම අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතු වීම. | නිරවුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු යොදා ඇති බව. | දූත මණ්ඩලවල නොපියවූ අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 05. | 2020 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුම් පිළිබඳ ප්‍රකාශය අනුව තැන්පතු ගිණුම් 5ක භාණ්ඩාගාර පොත් අනුව ආරම්භක ශේෂයන් හා අමාත්‍යාංශ පොත් අනුව ආරම්භක ශේෂයන් අතර රු. 4,521,094 ක වෙනසක් පැවතුණි. | භාණ්ඩාගාර පොත් අනුව ශේෂයන් හා අමාත්‍යාංශ පොත් අනුව වෙනසක් නොපැවතිය යුතු වීම. | වෙනස හඳුනා ගැනීමට කටයුතු කර එය නිරවුල් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | වෙනසට බලපෑ හේතු හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 06. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව වර්ෂ 01 ක සිට වර්ෂ 09 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණු රු. 3,990,669 ක් වූ වාහන අනතුරු 13ක් සම්බන්ධයෙන් හා 2010 වර්ෂයේදී සිදුව තිබූ රු. 1,991,695 ක් වූ වාහන සොරකම් කිරීම් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | හානි පාඩු අයකර ගැනීමට / පොතෙන් කපා හැරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කරමින් පවතින බව. | හානි හා පාඩු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන කර නොතිබුණි. |
| 07. | විදේශ දූත මණ්ඩල 3 කට අදාළව නැතිවූ මුදල් රු.1,017,626 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 106 ප්‍රකාරව අනුව කටයුතු කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව නැති වූ මුදල් වහාම පූර්ණය කිරීමට කටයුතු කළ යුතු වීම. | තොරතුරු දූත මණ්ඩලවලින් ලබා ගෙන අවශ්‍ය කටයුතු කඩිනම් කිරීමට පියවර ගනු ලබන බව. | අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |
| 08. | ලොස්ඇන්ජලිස් දූත මණ්ඩලයෙහි 2011 වර්ෂයේදී සොරකම් කරන ලද ඇ. ඩො 1583 ක් ද මොස්කව් දූත මණ්ඩලයෙහි 2002 වර්ෂයේදී හා 2003 වර්ෂයන්හීදී තැන්පත් නොකරන ලද මුදල් ලෙස ඇ.ඩො 155 ක් ද බැංකු සැසඳුම් ප්‍රකාශන තුළ පැවතියද නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බැංකු සැසඳුම් ප්‍රකාශන තුළ පවතින ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දූත මණ්ඩල දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව. | නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| 09. | 2020 දෙසැම්බර් 31 දිනට දූත මණ්ඩලයන්හි සිද්ධීන් 50 කට අදාළව තවදුරටත් අයකර ගැනීමට, කපාහැරීමට | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ | කාල විශ්ලේෂණය අනුව ප්‍රමුඛතා පදනම මත අවශ්‍ය | පාඩු හා අත්හැරීම් නිරවුල් කිරීමට |

| | | | | |
|---|---|---|---|---|
| | හෝ අත්හැරීමට ඇති රු. 27,545,100 ක පාඩු සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ කාල විශ්ලේෂණය අනුව එම වටිනාකමින් රු.1,334,669 ක් වර්ෂ 10 ඉක්මවා තිබුණු අතර රු.21,626,285 ක් වර්ෂ 05 ත් වර්ෂ 10 ත් අතර කාල පරාසයක ශේෂයන්ව පැවතුණි. | කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල අංශ දැනුවත් කිරීමට සටහන් කර ගන්නා ලද බව. | කටයුතු කර නොතිබුණි. |
| 10. | අමාත්‍යාංශය විසින් කොළඹ 08, ඇල්විටිගල මාවත, 117 වත්ත මහල් නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 20 ක් මිලදී ගැනීම වෙනුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත රු. 70,638,545 ක මුදලක් ගෙවා තිබුණද ඉන් නිවාස ඒකක 17 ක් වෙනුවෙන් හිමිකම් ඔප්පු ලබා ගෙන නොතිබුණි. | හිමිකම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවට වාර්තා කර ඇතත් මේ දක්වා සාර්ථක ප්‍රතිචාරයක් ලැබී නොමැති බව. | හිමිකම් ඔප්පු ලැබී නොතිබුණි. |
| 11. | කුලී නිවසට අදාළව කුලී හිමියා සමඟ එළැඹී ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන්, දූත මණ්ඩල කාර්යාලයක් විසින් 2018 මාර්තු 05 දින කුලී හිමියා වෙත රු.724,482 (ඇ.ඩො.4622) ක් ගෙවා තිබුණි. | අදාළ මුදල වගකිව යුතු නිලධාරියාගෙන් අයකරගත යුතු වීම. | සොයා බලා වාර්තා කිරීමට සටහන් කර ගන්නා බව. | වගකිව යුතු පාර්ශවයක් හඳුනාගෙන නොතිබුණි. |
| 12. | දූත මණ්ඩල ඉටුකරනු ලබන කොන්සියුලර් කාර්යයන් වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු 2018 මාර්තු 01 දින සිට සංශෝධනය කර ගැසට් මඟින් ප්‍රකාශයට පත්කර තිබුණි. එහෙත් එම ගැසට් නිවේදනයේ සඳහන් මුදල් ඒකක භාවිතා කරනු නොලබන රටවල්වල අදාළ මුදල් ඒකකවලට පරිවර්තනය කළ යුතු ආකාරය පිළිබඳ පොදු ක්‍රමවේදයක් නිශ්චයකර නොතිබීම හේතුවෙන් විවිධ | පොදු ක්‍රමවේදයක් අනුව පරිවර්තිත අනුපාතය නිශ්චය කළ යුතු වීම. | අයකරනු ලබන ගාස්තු සඳහා පොදු ක්‍රමවේදයක් සකස් කිරීමට අදාළ කටයුතු කරගෙන යනු ලබන බව. | පොදු ක්‍රමවේදයක් අනුව පරිවර්තිත අනුපාතය නිශ්චය කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නිර්ණායක පදනම් කරගෙන පරිවර්තිත අනුපාත තීරණය කර තිබුණි. | | | |
| 13. | අමාත්‍යාංශයට අයත් ගොඩනැඟිලි පැවතියද ප්‍රතිසංස්කරණය කිරීමට හෝ නැවත ඉදිකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2020 වර්ෂයේදී පහත පරිදි ගොඩනැඟිලි කුලී ගෙවීම් කර තිබුණි. | | | |
| (i). | ස්වීඩනයේ ශ්‍රී ලංකා තානාපති නිල නිවාස ගොඩනැඟිල්ල 2011 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත්කර තිබුණු අතර එම හේතුවෙන් ගොඩනැඟිලි කුලී ලෙස රු. 20,826,523 ක් ගෙවීම් කර තිබුණි. | වත්කම් ප්‍රශස්ථ අන්දමින් උපයෝජනය කළ යුතු වීම. | විශේෂඥ උපදෙස් පරිදි එම ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් නැවත ඉදිකළ යුතු අතර ඊට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා මේ දක්වා අනුමැතිය ලැබී නැති බව. | ප්‍රතිසංස්කරණය කිරීම හෝ නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම සිදුකර නොතිබුණි. |
| (ii). | ඕස්ට්‍රේලියාවේ කැන්බරා හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සතු ගොඩනැඟිලි 02 ක් 2007 හා 2012 වර්ෂවල සිට භාවිතයෙන් ඉවත්කර තිබුණු අතර එම හේතුවෙන් ගොඩනැඟිලි කුලී ලෙස රු. 6,609,300 ක් ගෙවීම් කර තිබුණි. | -එම- | කොවිඩ් වසංගතය හේතුවෙන් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අත්‍යාවශ්‍ය නිරීක්ෂණ චාරිකාවක් සූදානම් කිරීමට නොහැකි වී ඇති බව. | ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණය කර නොතිබුණි. |
| (iii). | කෙන්යාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් නිල නිවස ලෙස භාවිතා කළ ගොඩනැඟිල්ල 2014 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත්කර තිබුණු අතර එම | -එම- | නිල නිවසේ ඉදිකිරීම් කටයුතු කොවිඩ් වසංගත තත්ත්වය හා දැනට පවතින ආර්ථික | කොමසාරිස් නිල නිවස ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කර නොතිබුණි |

| | |
|---|---|
| හේතුවෙන් ගොඩනැඟිලි කුලී ලෙස රු. 3,361,960 ක් ගෙවීම් කිරීමට සිදුව තිබුණි. | දුෂ්කරතා හේතුවෙන් මේ සම්බන්ධව ඉදිරි පියවර ගැනීමට නොහැකි වී ඇති බව. |

## 14. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---:|---:|---:|---:|
| ශුද්ධ ප්‍රතිපාදනය | | | | |
| පුනරාවර්තන | 11,178,063,500 | 12,130,766,400 | 11,912,680,000 | 35,221,509,900 |
| මූලධන | 1,650,521,000 | 854,072,600 | 259,890,000 | 2,764,483,600 |
| එකතුව | **12,828,584,500** | **12,984,839,000** | **12,172,570,000** | **37,985,993,500** |
| සත්‍ය වියදම | | | | |
| පුනරාවර්තන | 11,140,655,725 | 12,062,914,233 | 10,372,292,229 | 33,575,862,187 |
| මූලධන | 1,294,952,540 | 415,776,929 | 203,743,135 | 1,914,472,604 |
| එකතුව | **12,435,608,265** | **12,478,691,162** | **10,576,035,364** | **35,490,334,791** |
| වසර අග ඉතිරිවීම් | | | | |
| පුනරාවර්තන | 37,407,775 | 67,852,167 | 1,540,387,771 | 1,645,647,713 |
| මූලධන | 355,568,460 | 438,295,671 | 56,146,865 | 850,010,996 |
| එකතුව | **392,976,235** | **506,147,838** | **1,596,534,636** | **2,495,658,709** |

## 07. ප්‍රවාහන අමාත්‍යාංශය

ශීර්ෂය - 114

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතන විසින් ගනුලැබූ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| **01.** | 2020 වර්ෂය හා ඉකුත් වර්ෂ දෙක සඳහා ප්‍රවාහන වැය ශීර්ෂය යටතේ පුනරාවර්තන වැය විෂයයන් සඳහා රු.බි 27.85 ක්ද මූලධන වැය විෂයයන් සඳහා රු.බි 39.67 ක්ද වශයෙන් රු.බි. 67.52 ක මුළු ප්‍රතිපාදන සලසා තිබූ අතර ඉන් පුනරාවර්තන වැය විෂයයන් ගෙන් රු.බි.1.08 ක්ද මූලධන වැය විෂයයන්ගෙන් රු.බි. 12.33 ක්ද වශයෙන් රු.බි 13.41 ක ප්‍රතිපාදන වැය නොකර ඉතිරිව පැවැතුනි. මෙය පුනරාවර්තන මුළු ප්‍රතිපාදනයෙන් 4% ක් හා මුළු මූලධන ප්‍රතිපාදනයෙන් 32% ක් විය. | අවශ්‍යතා නිසි පරිදි හඳුනාගෙන අයවැය ඇස්තමේන්තු සකස් කලයුතු වීම හා ඇස්තමේන්තු සකස් කිරීමේදී මුදල් රෙගුලාසි 50 හි විධිවිධාන අනුගමනය කලයුතු වීම. | රජය විසින් ක්‍රියාත්මක කර ඇති ප්‍රතිපත්තිමය තීරණය අනුව මූලධන වියදම් පාලනය කිරීම නිසා එම වැය විෂයන් වල ප්‍රතිපාදන ඉතිරිවීම් හා අපේක්ෂිත ආකාරයට වියදම් පැන නොගැනීම හේතුවෙන් එලෙස ප්‍රතිපාදන ඉතිරිවූ බව. | ඉකුත් වර්ෂ මෙන්ම 2020 වර්ෂයද ප්‍රතිපාදන ඉතිරිව පවතී. |
| **02.** | භාණ්ඩාගාරයට වාර්තා නොකල බැරකම් කිසිවක් ඉකුත් වර්ෂ වලදී නිරවුල් නොකල යුතු වුවද එයට පටහැනිව 2020 වර්ෂයේදී එසේ වාර්තා නොකල බැරකම්වල වටිනාකම රු.මිලියන 25.8 කි විය. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කලයුතු වීම. | ප්‍රතිපාදන සලසා නොගැනීම මත සියළු බැරකම් සිගාස් වලට ඇතුලත් කිරීමට නොහැකිවූ බව හා සිදු වූ අතපසුවීම් නිසා බව. | බැරකම් හෙළිදරව් නොකිරීම සෑම වර්ෂයකදීම දක්නට ලැබීම. |

| | | | | |
|---|---|---|---|---|
| **03.** | සේවයඅතහැර ගොස් ඇති නිලධාරීන් 03 දෙනෙකුගෙන් වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ අය නොවී පැවති රු. 398,702 ක ණය ශේෂයක් හා 2012 වර්ෂයේදී වැඩ තහනමට ලක් වී සිටි නිළධාරියකුගෙන් අයවීමට පැවති රු. 121,945 ක ණය ශේෂය අයවී නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කලයුතු වීම. | කඩිනමින් හිඟ ණය ශේෂ අයකර ගැනීමට පියවර ගෙන ඇති බව. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට පියවර ගෙන ඇත. 2020.12.31 දිනවන විටත් අයවී නොතිබුණි |
| **04.** | වාහන අනතුරු 06කට අදාලව මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව පරීක්ෂණ කටයුතු නිම නොකිරීම හේතුවෙන් එම විස්තර 2020 මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. ඉකුත් වර්ෂ හතක් තුළ වාහන 8 ක් සඳහා අයවිය යුතු රු.368,819ක්, හානියට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පැවතියදී මූල්‍ය ප්‍රකාශනයෙන් කපා හල ශේෂ ලෙස දක්වා තිබුණි. තවද නියමිත වෙලාවට අදාල වාර්තා නිකුත් නොකිරීම නිසා 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ පාඩු හා හානි සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වී තිබුණි. | මුදල් රෙගුලාසි හා ලැබී ඇති අනුමැතිය ප්‍රකාරව කටයුතු කලයුතු වීම. | ප්‍රවාහන විෂය අයත් අමාත්‍යංශය අවස්ථා කිහිපයකදී වෙනත් අමාත්‍යංශ සමඟ ඒකාබද්ධ වීම, නැවත වෙන්වීම ආදී හේතුන් මත 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාම නියමිත රෙගුලාසි වලට අනුව කාර්යයන් සිදු වී නොතිබු බව, මේ හේතුවෙන් 2016 වර්ෂයේ සිට ඉදිරියට වූ වර්ෂ වලදී සිදු වී ඇති වාහන අනතුරු සම්බන්ධයෙන් නියමිත රෙගුලාසි වලට අනුව කටයුතු කිරීමේදී බාධාවන් සිදුවී ඇති බව. | ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| **05.** | කුරුණෑගල හබරණ දුම්රිය ව්‍යාපෘතිය යටතේ 2010 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුල දේශීය අරමුදල් මූල්‍යකරණය යටතේ වාර්ෂික ඇස්තමේන්තු මගින් රු. 1,332,757,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද කාලසීමාව තුල එම මුදලින් රු.144,433,309 ක් එනම් සමස්ත ප්‍රතිපාදනවලින් සියයට 13.08 ක් පමණක් වැයකර තිබුණි. | ව්‍යාපෘතිය කාර්යක්ෂමව ඉටුකලයුතු වීම සහ ඇස්තමේන්තු ඌන උපයෝජනය අවම කරගත යුතුවීම. | ජල විද්‍යාත්මක අධ්‍යයනය සහ පස් පරීක්ෂා කිරීමේ කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් වුවද,රජයට වැය බරක් නොවන ලෙස එම කාර්යයන් බැඳීමකින් තොරව විදේශීය සමාගමක් මඟින් ඉටු කිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වූ බව. ඉඩම් පවරා ගැනීම් කටයුතු 2018 වර්ෂයේ ආරම්භ කර ඇති බව සහ වන්දි ගෙවීම් කටයුතු සඳහා වන්දි පරීක්ෂණ පැවැත්වීමට 2020 වර්ෂයේ කොවිඩ් වසංගත තත්ත්වය නිසා ඉටුකිරීමට නොහැකි වූ බව. | 2021 වර්ෂය සඳහා ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසා නොතිබූ බව සහ 2021 ජූලි මසදී ප්‍රතිපාදන සලසා ඇති බව. |
| **06.** | මාතර කතරගම දුම්රිය ව්‍යාපෘතිය යටතේ විධිමත් ආකාරයට පවරාගත් ඉඩම්වලට අමතරව පැවරුම් ඔප්පු 62 ක් යටතේ එකතුව රු.57,580,854 ක් වූ අක්කර 4 පර්චස් 31.37ක ඉඩම් ප්‍රමාණයක් අතරමැදි ගැණුම්කරුවන්ගෙන් ලබාගෙන තිබුණු අතර, ඒවා ව්‍යාපෘති කටයුතු සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතීමට කටයුතු කර තිබුණි. | ඉඩම් පවරා ගැනීමට හේතු වූ කාර්යයන් කොන්ත්‍රාත්කරු ලවා ඉටුකරවා ගැනීම කඩිනම් කිරීම. | දෙපාර්තමේන්තුවේ ඉඩම් නිලධාරීන් හා විමර්ශන නිලධාරීන් යොදවා වහාම පරීක්ෂණයක් සිදුකරන බව. | තවදුරටත් පරීක්ෂණ කටයුතු කෙරෙමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| **07.** | මාතර කතරගම දුම්රිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී දේශීය ආර්ථිකයට උපරිම අගයක් එකතුකළ හැකිවනසේ මෙම ව්‍යාපෘතිය සිදුකල යුතු වුවත් ව්‍යාපෘතිය සඳහා යොදාගත් අමුද්‍රව්‍ය විදේශ රටවල්වලින් ආනයන කරන ලද එවාබව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී රජයට වඩාත් වාසිසහගත වන පරිදි කටයුතු කලයුතු වීම. | ව්‍යාපෘතියට අවශ්‍ය වන අමුද්‍රව්‍ය ලබා ගැනීමේදී දේශීයව ලබාගත යුත්තේ කුමන අමුද්‍රව්‍යද යන්න පිළිබඳව හදුනා ගැනීමක් සිදුකර නොතිබූ බැවින් කොන්ත්‍රාත්කරුට බලපෑමක් කල නොහැකි වූ බව. | ලබාගතව හැකිව තිබූ වාසිසහගත තත්වයන් පිලිබඳ අවදානය යොමුකර නොතිබුණි. |
| **08.** | මාතර කතරගම දුම්රිය ව්‍යාපෘතිය සඳහා ඇතිකර ගත් ණය ගිවිසුම අනුව 2013 අප්‍රේල් සිට 2017 අප්‍රේල් දක්වා වු කාලසීමාව තුලදී ණය ලබාගෙන අවසන් කලයුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් රු.මිලියන 2,207.6 ක විදේශ විනිමය අලාභයක් සිදුවී තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරිම තුලින් රජයට සිදුවිය හැකි අලාභ තත්වයන් අවම කරගැනීමට කටයුතු කලයුතු වීම. | මුල් සැලැස්ම සංඥා හා විදුලි පද්ධති ඇතුලත් වී නොතිබූ බැවින් 2017 වර්ෂයේ සිට ව්‍යාපාති කාලසීමාව වෙනස්කර ඇතිබව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම තුලින් මූල්‍ය අලාභයක් සිදුව ඇත. |
| 09. | භාණ්ඩ සමීක්ෂණයේ දී ඇති වූ ඌනතා සහ අතිරික්ත සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් විසින් කරුණු පැහැදිලි කරගෙන ඉදිරි පියවර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධව ද පියවර ගෙන නොතිබුණි. | මුදල්රෙගුලාසි හා ලැබී ඇති අනුමැතිය ප්‍රකාරව කටයුතු කලයුතු සේම වත්කම් වල ආරක්ෂාව සැලසීමට අවශ්‍ය පියවර ගත යුතු වීම. | ඌනතාවන් සහ අතිරික්ත සම්බන්ධ මේවන විට විමසීම් සිදුකර ඒ සඳහා පිළිතුරු ලබාගෙන ඇති බව හා ඒ අනුව නිවැරදි කිරීම් සිදුකර ඇති බව. ඇති වූ කොවිඩ් -19 තත්ත්වය මත වෙන්දේසි කටයුතු මදක් ප්‍රමාද වුවද හැකි ඉක්මනින් | 2022 ජනවාරී මාසයේදී කොටසක් අපහරනය කිරීමට කටයුතු කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අපහරණය කිරීමට කටයුතු කරන බව. | |
| **10.** | 2019 පෙබරවාරි මස 28 දින කුරුණෑගල සාරිගම මාර්ගයේදී අනතුරකට ලක්වී තිබූ වාහනය සඳහා රු.1,300,000 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුනද රක්ෂණය කල වටිනාකම වෙළඳපල වටිනාකම වඩා අඩුවීම හේතුවෙන් ඌන රක්ෂණ දඩමුදල වන රු.366,666 ක මුදල ප්‍රතිපූර්ණය කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතු වීම. | රජයට අවාසිදායක නොවන පරිදි කටයුතු කරන බව. | අළුත්වැඩියා කටයුතු සඳහා ලක්දිව ඉංජිනේරු කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙත යොමු කිරීමට 2021.10.13 දිනැති ලිපිය පරිදි කටයුතු කර ඇත. |
| **11.** | තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා අමාත්‍යාංශය විසින් අදාළ ඉලක්කයන් හඳුනාගැනීමට හා ඒවා මැනීමට අවශ්‍ය නිර්ණායක හඳුනාගැනීමට නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්ට ළඟා වීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම හා ඊට අදාල නිර්නායක හඳුනාගෙන සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කලයුතු වීම හා ඊට අදාල දත්ත පදනමක් ඇතිකර ගතයුතු වීම. | අමාත්‍යාංශය මගින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොකරන බව, අනුබද්ධිත ආයතන මගින් සිදුකරන සංවර්ධන වැඩසටහන් නියාමනය, අධීක්ෂණය සහ ප්‍රගති සමාලෝචනය සිදු කරනු ලබන බව, අමාත්‍යාංශය සඳහා සකසන ලද ක්‍රියාත්මක සැලැස්මේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහන් කර නොමැති බව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අමාත්‍යාංශයේ | 2021 ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී හා අයවැය ඇස්තමේන්තු සැකසීමේදී කාර්ය සාධන දර්ශක ඇතුලත් කිරීමට පියවර ගෙන ඇත. |

අනුබද්ධිත ආයතන සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ව්‍යාපෘති කාර්යාල මගින් සකස් කර ඇති ක්‍රියාත්මක සැලැස්මේ අදාල තිරසාර සංවර්ධන ඉලක්කයන් සඳහන් කර ඇති බව සහ 2021- ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමේදී, ඉහත අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර ඇති අතර කාර්ය සාධන දර්ශක (key performance indicators ) ඇතුලත් කර ඇත.

## 12. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| ශුද්ධ ප්‍රතිපාදනය | පුනරාවර්තන | 12,342,887,000 | 14,563,700,000 | 942,878,000 | 27,849,465,000 |
| | මූලධන | 9,872,513,000 | 13,770,800,000 | 16,026,292,000 | 39,669,605,000 |
| | එකතුව | 22,215,400,000 | 28,334,500,000 | 16,969,170,000 | 67,519,070,000 |
| සත්‍ය වියදම | පුනරාවර්තන | 11,899,221,864 | 14,176,254,523 | 692,237,491 | 26,767,713,878 |
| | මූලධන | 7,345,671,653 | 6,794,354,855 | 13,195,619,979 | 27,335,646,487 |
| | එකතුව | 19,244,893,517 | 20,970,609,378 | 13,887,857,470 | 54,103,360,365 |
| වසර අග ඉතිරිවීම් | පුනරාවර්තන | 443,665,136 | 387,445,477 | 250,640,509 | 1,081,751,122 |
| | මූලධන | 2,526,841,347 | 6,976,445,145 | 2,830,672,021 | 12,333,958,513 |
| | එකතුව | 2,970,506,483 | 7,363,890,622 | 3,081,312,530 | 13,415,709,635 |

**08. බලශක්ති අමාත්‍යාංශය**

**ශීර්ෂය - 115**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය කළ මතය

| විගණන නිරීක්ෂණය | | විගනකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ගය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව හිමිකම් නොලබන නිලධාරින් සඳහා මහා භාණ්ඩාගාරයේ විශේෂිත අනුමැතිය ලබාගැනීමකින් තොරව ප්‍රවාහන දීමනා ලබා දීම වෙනුවෙන් 2017 ජනවාරි මාසයේ සිට 2018 ඔක්තොම්බර් මාසය අවසානය දක්වා රු.3,419,246 ක් වියදම් කර තිබුණි. | රජයේ චක්‍රලේඛ, මාර්ගෝපදේශ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවීම. | 2021 අංක 21 දරණ ඛනිජ තෙල් සම්පත් පනත ප්‍රකාරව ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය (PRDS), ශ්‍රී ලංකා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අධිකාරිය (PDASL) ලෙස 2021.10.08 දින ස්ථාපනය කරන ලද බව PDASL ට අදාල සේවක සැකැස්ම (Cadre) සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව සහ නුදුරේදීම කාර්ය මණ්ඩලයේ වැටුප් හා වේතන සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා වැටුප් කොමිසම සමඟ එකඟතාවයකට පැමිණ නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | නිරීක්ෂණයන් මගින් මගින් දක්වා ඇති කරුණු පිළිබඳව ඉදිරියේ දී ඇති ඇති විය හැකි ගැටලු නිරාකරණය සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබුණද නිරීක්ෂණය මගින් පෙන්වා දී ඇති කරුණු මේ දක්වා නිවැරදි කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 02. | 2018 වර්ෂය තුළ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අංශය විසින් රු. 2,000,000 ක් වූ හිග ආදායම්, අතහැර තිබූ අතර ඒ සඳහා මුදල් රෙගුලාසි 113 (3) (ආ) සහ (ආ) ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම්ගේ අවසරය ද ලබා ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අත්හැරීම් සඳහා මුදල් රෙගුලාසි 113(3) (ආ) හා (ඇ) ප්‍රකාරව අනුමැතිය ලබාගත යුතුය. | 2018 වර්ෂය තුළ රු. 2,000,000 ක් වූ හිඟ ආදායම අත්හැරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා භාණ්ඩාගාර ලේකම් වෙත 2019.12.03 දින ලිපියක් යොමු කර ඇති බව. | මුදල් රෙගුලාසි 113 (3) (ආ) සහ (ආ) ප්‍රකාරව මේ දක්වා භාණ්ඩාගාර ලේකම්ගේ අවසරය ලබා ගෙන නොතිබුණි. |
| 03. | ඉන්ධන සැපයුමේ ගුණාත්මක තත්ත්වය ආරක්ෂාකිරීමට හා විශ්වාසනීයත්වය ඇතිකිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය, පසුවිපරම් කිරීම හා ඇගයීම අමාත්‍යාංශයේ කාර්යයක් වුවද CPC සහ LIOC ආයතන දෙකම ආවරණය වන පරිදි විධිමත් වැඩපිළිවෙලක් අමාත්‍යාංශය මගින් හඳුන්වා දී ක්‍රියාත්මක කෙරෙන බවට තහවුරු නොවුණි. | අමාත්‍යාංශයේ අරමුණු කරා ළඟා වන පරිදි ප්‍රමාණාත්මක අධීක්ෂණයක් සිදු කළ යුතු වීම | ඉන්ධන සැපැයුමේ ගුණාත්මත තත්ත්වය හා විශ්වාසනීයත්වය ඇතිකිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගෙන ඇති බවට වාර්තා කර ඇත.<br>1) පිරවුම්හල් වෙත ඉන්ධන සැපයීමේ දී එහි සවිකර ඇති භූගත ටැංකි වලට පිරවීමට පෙර නියදි ලබා ගැනීම හා එම නියදි ඉන්ධන තොග විකුණා අවසන් වන තුරු ආරක්ෂිතව තබා ගැනීම. මෙතුලින් ඉන්ධන සම්බන්ධයෙන් යම් පාරිභෝගික පැමිණිල්ලක් ලැබුනහොත් පෙර ලබා ගත් ඉන්ධන නියදි රසායනාගාර වෙත යොමු කර පරික්ෂා කිරීම | මෙහිදී ගෙන ඇති පියවර බොහොමයක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කටයුතු අධීක්ෂණය සඳහා පමණක් ඉලක්ක ගත වී ඇති අතර සමස්ත රටෙහිම ඉන්ධන සැපයුම කෙරෙහි ම අවධානය යොමු කොට නැති බව නිරීක්ෂණය වේ. |

2) ඉන්ධන පිරවුම්හල් මාසිකව සංස්ථාවට අනුබද්ධ ප්‍රාදේශිය පරිපාලකවරුන්ගේ අධීක්ෂණයට ලක් කිරීම.

3) කිරුම් මිණුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ඉන්ධන පිරවුම්හල් වල භාවිතා කරනු ලබන ඉන්ධන මනු කරන යන්ත්‍ර වාර්ෂික නිරීක්ෂණයකට ලක් කිරිම.

4) සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් අහඹු ලෙස තෝරාගත් ඉන්ධන පිරවුම්හල් හා පිරවුම් යන්ත්‍ර පරික්ෂාවට ලක් කිරිම.

5) සංස්ථාවට අනුබද්ධ ප්‍රාදේශිය පරිපාලකවරුන් විසින් ලබා ගන්නා ඉන්ධන නියදි රසායනාගාර පරීක්ෂණ වලට භාජනය කර ඉන්ධනවල තත්ත්වය පරික්ෂා කිරීම.

| | | | | |
|---|---|---|---|---|
| 04. | භූගෝලීය පිහිටීම අනුව මුළු ලෝකයේ ම අවධානය යොමු වී ඇති ලෝකයේ දෙවන ගැඹුරුතම වරාය වන ත්‍රිකුණාමලය වරාය තුළ 1930 වර්ෂයේ සිට ස්ථාපිත කර ඇති තෙල් ටැංකි පද්ධතිය ඝණ මීටර් 12,500 ක ධාරිතාවකින් යුත් ටැංකි 102 කින් හා අනෙකුත් ආශ්‍රිත පහසුකම්වලින් සමන්විත වේ. දැනට පවතින මුළු ටැංකි 99 කින් පහළ කොටසේ ටැංකි 14 ක් ලංකා ඉන්දියානු තෙල් සමාගම භාවිතා කරනු ලැබේ. අතහැර දමා තිබෙන ඉහළ කොටසේ ටැංකි 84 නවීකරණය සඳහා මූලික තීරණ ගැනීමේ කටයුතු 2015 අප්‍රේල් 29 දින ආරම්භ කර තිබුණ ද, ටැංකි සංකීර්ණයේ සංවර්ධනය හා පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකර භාවිතයට ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශයේ අරමුණු කරා ළඟා වන පරිදි ප්‍රමාණාත්මක අධීක්ෂණයක් සිදු කළ යුතු වීම. | ත්‍රිකුණාමල තෙල් ටැංකි සංවර්ධන ව්‍යාපෘතිය 2022.01.10 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් ප්‍රකාශයට පත්කරන ලදී. ඒ අනුව ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) ලංකා ඉන්දියන් තෙල් සමාගම (Lanka IOC PLC) ඒකාබද්ධව Trinco Petroleum Terminal (Pvt) Ltd සමාගම පිහිටුවා ඇත. 2022.01.06 දිනැති ශ්‍රී ලංකා ආණ්ඩුව , ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) ලංකා ඉන්දියන් තෙල් සමාගම (Lanka IOC PLC) Trinco Petroleum Terminal (Pvt) Ltd සිව් පාර්ශවීක ගිවිසුමක් අත්සන් කර ඇති අතර ඒ අනුව ඉදිරි සංවර්ධන කටයුතු කරගෙන යාමට නියමිතය. | ත්‍රිකුණාමල තෙල් ටැංකි සංවර්ධන ව්‍යාපෘතිය අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් ප්‍රකාශයට පත්කර තිබුණද යෝජිත සංවර්ධන සැලස්මක් මේ දක්වා පිළියලකර නොතිබුණි. |
| 05. | සපුගස්කන්දේ තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීමට මෙන්ම දේශීය අවශ්‍යතාවය සලකා නව පිරිපහදුවක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් විද්වත් කමිටුවක් පත් කර තිබුණද තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් | අමාත්‍යාංශයේ අරමුණු කරා ළඟා කර ගැනීම සඳහා වන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව ඉටු කළ යුතු වීම. | දිනකට බැරල් 100,000 කින් යුතු නව පිරිපහදුවක් සපුගස්කන්දේ පිහිටුවීම සඳහා අවශ්‍ය ශක්‍යතා අධ්‍යයනය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ | තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීමට හෝ නව පිරිපහදුවක් ස්ථාපිත කිරීමට මේ දක්වා |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීමට හෝ නව පිරිපහදුවක් ස්ථාපිත කිරීමට මේ දක්වා නොහැකිවී තිබේ. | | (CPC) මූලා දායකත්වයෙන් සිදුකරන ලද අතර ඒ අනුව ඉදිකරනු ලැබීමට නියමිත නව පිරිපහදුවට සමගාමීව පවත්නා පිරිපහදුව සංවර්ධනය කිරීමටද සැලසුම් කර ඇති බව. | නොහැකිවී තිබේ. |
| 06. | කන්කසන්තුරේ පිහිටි ඉන්ධන තොග ගබඩාව එම ස්ථානයෙන් ඉවත් කර ගන්නා ලෙසට 2011 වර්ෂයේදී සිමෙන්ති සංස්ථාව විසින් ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වෙත දන්වා තිබූ දින සිට මේ දක්වා උතුරු පළාත සඳහා තොග ගබඩාව ස්ථාපිත කිරීමට නොහැකිවී තිබේ. තවද, 2016 ඔක්තෝබර් 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සුදුසු ඉඩමක් සොයාගන්නා තෙක් පවතින තොග ගබඩාවම නවීකරණය හා පුළුල් කිරීම සිදු කර පවත්වාගෙන යාම සඳහා අනුමැතිය ලැබී තිබුණද මේ දක්වා එම ව්‍යාපෘතිය ඉටු කිරීමටද නොහැකි වී තිබුණි. | අදාල කටයුතු කඩිනමින් සිදුකර හිග මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | මායිම් සලකුණු කිරීමේ ක්‍රියාවලියේ දී තෙල් ටැංකි සහ බෙදාහැරීමේ පොම්ප එකිනෙකට දුරස්ව පිහිටා තිබීමත්, දැනට සියලු පහසුකම් සියල්ල අක්කර 06 ක භූමි භාගය තුළ ඇතුලත් කිරීමට නොහැකිවීමත් නිසා ස්ථානය වෙනස් කිරීමට සිදුවී ඇති බැවින් සිමෙන්ති සංස්ථාවට ගෙවිය යුතු රු. මිලියන 142.98 ගෙවා නොමැත. ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ඉඩම් කොටසක් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා සමාගම වෙත දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දීම සඳහා අනුමැතිය ලැබී ඇති බව. | මේ දක්වා එම ව්‍යාපෘතිය ඉටු කිරීමට නොහැකි වී තිබුණි. |
| 07. | 2020 දෙසැම්බර් 31 දිනට අවම වශයෙන් වසර 3 ක කාලයක් ඉක්ම වී තිබුණ කපා නොහල | හානි හා පාඩු කාලීනව ආවරණය කිරීමට හෝ පොත් වලින් | 2020 වර්ෂය සඳහා පිළියෙළ කරන ලද මූලා ප්‍රකාශනයේ පාඩු | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිරියට ගෙන යන පාඩු හා අත්හැරීම් වශයෙන් එකතුව රු. 1,064,226ක් වූ රිය අනතුරු 17ක් වාර්තා කර තිබුණු අතර මේ වන විටත් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර පාඩුව ආපසු අයකර ගැනීමට හෝ පොත්වලින් කපාහැරීමට කටයුතු කර නොතිබුණි. | ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. | හා අත්හැරීම් පිලිබඳ ප්‍රකාශය යටතේ රු. 25,000 ට අඩු වටිනාකමින් යුතු සිදුවීම් 12 ක් වාර්තා වී ඇති අතර මෙම සිදුවීම් 12 සම්බන්ධයෙන් පරික්ෂාකර බලා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය යටතේ පොත්වලින් කපාහැරීමට හැකියාවක් පවතී නම් එසේ සිදුකිරීමටත්, රු. 25,000 ට වැඩි හානි සම්බන්ධයෙන් වූ සිද්ධි 05 සඳහා ඉදිරියේදී පරික්ෂාකර බලා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරන බවක් දන්වා ඇත. | පාඩුව ආපසු අයකර ගැනීමට හෝ පොත්වලින් කපාහැරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. |
| 08. | ශ්‍රී ලංකා සමුද්‍රීය ප්‍රදේශ ඉලක්ක කර ගෙන දීප ව්‍යාප්ත සමුද්‍රීය පාරසරික දත්ත එකතු කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීම සඳහා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය හා නාරා අතර 2015.09.30 දින ගිවිසුමට එලඹ 2018.09.28 දින වන විට ව්‍යාපෘතියේ මුළු කොන්ත්‍රාත් මිල වූ රු.37,165,283 ක් නාරා ආයතනය වෙත ගෙවා | අදාළ වෙබ් සර්වර් යන්ත්‍රය ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු කඩිනම් කළ යුතුය | ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ප්‍රදේශ ඉලක්ක කරගෙන දීප ව්‍යාප්ත සමුද්‍රීය පාරිසරික දත්ත එකතු කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීම සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ නියෝජිතායතනය හා එලඹී ගිවිසුමට සමගාමීව අදාල දත්ත පද්ධතිය | දත්ත ඇතුළත් වෙබ් සර්වර් යන්ත්‍රය ස්ථාපිත කිරීමට මේ දක්වා නොහැකි තිබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. නමුත් දත්ත පිළිබඳ නිසි අවබෝධයකින් තොරතුරු පද්ධතිය මෙහෙයවිය හැකි පුහුණු නිලධාරීන් නොමැති වීම සහ අවශ්‍ය යටිතල පහසුකම් නොමැතිවීම හේතුවෙන් මෙම දත්ත ඇතුළත් වෙබ් සර්වර් යන්ත්‍රය ස්ථාපිත කිරීමට මේ වන විටත් නොහැකි වී තිබේ. | | නඩත්තු කිරීමට හා වෙබ් සර්වර් යන්ත්‍රය (Server) පවත්වාගෙන යාමට උප ගිවිසුමකට එළැඹීමට අවශ්‍ය සාකච්ඡා කටයුතු ආරම්භ කර ඇති බව. | |
| 09. | 2007 වසරේ දී සිදුකරන ලද ජාත්‍යන්තර ලංසු කැඳවීම අනුව මණ්නාරම් ද්‍රෝණියේ M2 ගවේෂණ බිම් කොටසේ ඛනිජ තෙල් ගවේෂණ කටයුතු සඳහා තෝරාගත් කෙයාර්න් ලංකා පුද්ගලික සමාගම 2011 දී සිදුකල කැනීම් අනුව ස්වභාවික වායු නිධි දෙකක් ඇති බවට සොයා ගෙන තිබුණි. මෙම සමාගම මණ්නාරම් ද්‍රෝණියේ පර්යේෂණ කටයුතු අතරමග නවතා 2015.10.15 දින ගිවිසුම අවසන් කර තිබුණි.<br>තවද මෙහි ගවේෂණ කටයුතු සහ ස්වභාවික වායු වාණිජමය වශයෙන් නිපදවීම සඳහා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට 2016 වර්ෂයේ දී ජාත්‍යන්තර තරගකාරි ලංසු කැඳවීම මගින් IHG Global සමාගම තෝරාගෙන 2016 දෙසැම්බර් මස සිට 2018 අගෝස්තු දක්වා අළෙවිකරන ව්‍යාපාරයක් දියත් කිරීම සඳහා | ඛනිජ තෙල් ගවේෂණය සිදු කිරීමට ප්‍රමුඛතාවය ලා සිදු කිරීමේ වැදගත් වැදගත්කම අදාළ අංශ වෙත දැනුවත් කලයුතු බව හා වියදම් සිදු කිරීමට පෙර අපේක්ෂිත ප්‍රතිඵල පිළිබඳ නිසි ඇගයීමක් හා විශේෂඥ දැනුමක් සහිත පුද්ගලයකුගේ නිර්දේශය මත සැලසුමක් සහිතව සිදු කළ යුතු වීම | 2019 වසරේ කුඩා ලංසු වටයක් M2 බිම් කොටස වෙනුවෙන් නිවේදනය කරනු ලැබූ අතර ඒ සඳහා ඉදිරිපත් කර තිබූ එකම සමාගම අදාළ යෝග්‍යතා නිර්ණායක අනුව සුදුසු මට්ටමක නොපැවති බැවින් අදාළ කමිටු මගින් එම සමාගම සුදුසු ආයෝජකයකු ලෙස තෝරා නොගන්නා ලදී. 2021 අංක 21 දරණ ඛනිජතෙල් සම්පත් පනතේ විධිවිධාන ප්‍රකාරව මේ වනවිට M2 බිම් කොටස ගවේෂණ හා ස්වභාවික වායු වාණිජමය වශයෙන් නිපදවීම සඳහා අදාළ වැඩපිළිවෙලක් සකස් කරමින් පවතී. M2 බිම් කොටස සංවර්ධනය කිරීමේ විකල්ප යෝජනා ඉදිරිපත් කොට | මෙම බිම් කොටසේ ගවේශණ කටයුතු සිදුකිරීමට හෝ හඳුනාගත් නිධි දෙකෙහි ස්වභාවික වායු වාණිජමය වශයෙන් නිපදවීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස්කිරීමට අමාත්‍යංශය මේ වනවිටත් අපොහොසත් වී තිබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | ඇ.ඩො. 300,000 ක් එනම් රු. 46,610,853 ක දරා තිබුණි.<br><br>එතැන් සිට මේ දක්වා අමාත්‍යාංශය විසින් මෙම බිම් කොටසේ ගවේශණ කටයුතු සිදුකිරීමට හෝ හඳුනාගත් නිධි දෙකෙහි ස්වභාවික වායු වාණිජමය වශයෙන් නිපදවීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස්කිරීමට අපොහොසත් වි තිබේ. | | වාර්තාවක් සකස් කිරීමට ක්ෂේත්‍රයේ විශේෂඥයකු උපදේශකවරයෙකු වශයෙන් මාස 3 ක කාලයක ගිවිසුමකට යටත්ව මෙම අධිකාරියට බඳවාගෙන ඇති අතර එම වාර්තාව ඔහු විසින් සකස් කොට නිමකිරීමට නියමිතය. ඒ තුලින් M2 බිම් කොටසෙහි ගවේෂණ හා නිෂ්පාදන කටයුතු ක්‍රමවත්ව සිදුකිරීමට අවශ්‍ය පියවර ගනු ඇති බව.<br>2018 වසරේ අගෝස්තු මස IHS Global සමාගම සමග පැවති අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා වු ගිවිසුම අවසන් වී ඇති අතර ඉන්පසු එම සමාගම කිසිදු අලෙවි ප්‍රවර්ධන කටයුත්තක් සඳහා යොදාගෙන නැති බව. | |
| 10. | 2012 වර්ෂයේ දී ආරම්භ කළද, මණ්නාරම් ද්‍රෝණිය ආශ්‍රිතව ගුවන් ගතව සිදුකරන ගුරුත්ව හා චුම්බක සමීක්ෂණ මඟින් දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතිය කඩිනමව නිමකිරීමට අවශ්‍ය පියවර ගැනීමට අමාත්‍යාංශය අසමත්ව තිබූ අතර 2019 අගෝස්තු මස 15 වන දින Bell Geospace සමාගම | අදාල සම්පත් හඳුනා ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතුය | 2019 අගෝස්තු මස 15 වන දින එළඹි ගුවන් ගතව සිදු කරන ගුරුත්ව හා චුම්භක ක්ෂේත්‍ර සමීක්ෂණ මගින් දත්ත එක්රැස් කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ ගිවිසුම් ප්‍රකාරව Bell Geospace සමාගම | මේ දක්වා ගුරුත්ව හා චුම්බක සමීක්ෂණ මඟින් දත්ත රැස්කිරීමේ කටයුතු අවසන්කර ඇති බවට තහවුරු නොවුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | එළඹී ගිවිසුම් ප්‍රකාරව එහි කටයුතු 2020 තුළ අවසන් වියයුතුව තිබුණද මේ දක්වා එම කටයුතු අවසන්කර ඇති බවට තහවුරු නොවුණි. | | විසින් 2021 අගෝස්තු මස 23 දින අදාල දත්ත රැස්කිරීමේ කටයුතු කාවේරි හා මන්නාරම් ද්‍රෝණියේ ආරම්භ කරන ලද බව හා මේ වන විට එම දත්ත අර්ථ නිරූපණය, සැකසීම යනාදි කටයුතු සිදු කරමින් පවතින බව. | |
| 11. | අමාත්‍යාංශයට සෘජුවම අදාල වන තිරසර සංවර්ධන අරමුණ ලෙස “දැරිය හැකි පිවිතුරු බලශක්තිය” හඳුනාගෙන තිබුණ ද එම තිරසර සංවර්ධන අරමුණ ඉටුවන ආකාරයට කිසිදු ව්‍යාපෘතියක් සැලසුම් කර හෝ ක්‍රියාත්මක කර ඇති බවට තහවුරු නොවුණි. | තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක ළඟාවිය යුතු සංධිස්ථානයන් ද ඉලක්කම මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනාග ගැනීමට කටයුතු කළ යුතු අතර මේ පිළිබඳව අභ්‍යන්තර චක්‍රලේඛ /මගපෙන්වීම් මගින් උනන්දුවක් දක්වන පාර්ශව දැනුවත් කිරීමත්, දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමත් කළ යුතු වේ. | 2019 වර්ෂයේ දී තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන තිබූ අතර 2020 හා 2021 වර්ෂවලදී අමාත්‍යාංශය මඟින් සකස්කරන ලද ක්‍රියාකාරී සැලැස්ම තුළ එම අරමුණු වලට අදාලව ව්‍යාපෘති ඇතුලත් කර ක්‍රියාත්මක කරන ලද බව සහ 2022 වර්ෂයේ දී ද ක්‍රියාකාරී සැලැස්ම තුළ ව්‍යාපෘති ඇතුලත් කර ක්‍රියාත්මක කෙරෙමින් පවතින බව. | තිරසර සංවර්ධන අරමුණ ඉටුවන ආකාරයට කිසිදු ව්‍යාපෘතියක් සැලසුම් කර හෝ ක්‍රියාත්මක කර ඇති බවට තහවුරු නොවුණි |
| 12. | අමාත්‍යාංශය විසින් ඉහත කාර්යය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හඳුනාගෙන නොතිබුණු අතර අමාත්‍යාංශයේ දැනට පවතින භෞතික සම්පත් හා කාර්ය | තිරසර සංවර්ධන ඉලක්ක ළඟා වීම සඳහා අවශ්‍යය මූල්‍ය ප්‍රතිපාදන සහ මානව හා භෞතික සම්පත් | අමාත්‍යාංශය තිරසර සංවර්ධන ඉලක්ක ලෙස හඳුනාගෙන ඇති ව්‍යාපෘති සඳහා 2019 වර්ෂයේ අයවැය | මේ දක්වා මූල්‍ය ප්‍රතිපාදන හඳුනාගෙන නොතිබුණු අතර අමාත්‍යාංශයේ |

| | | | | |
|---|---|---|---|---|
| | මණ්ඩලය ඒ සඳහා යොදවා ගැනීමේ ක්‍රමවේදයක් හා තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකරගැනීමට අදාල කාර්යයන් නියාමනය සඳහා ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. | හඳුනාගත යුතු අතර එම සම්පත් යොදා ගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය | ඇස්තමේන්තු සකස් කර තිබුණද ඒ සඳහා ප්‍රතිපාදන ලැබී නොමැති බව. | දැනට පවතින භෞතික සම්පත් හා කාර්ය මණ්ඩලය ඒ සඳහා යොදවා ගැනීමේ ක්‍රමවේදයක් හා තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකරගැනීමට අදාල කාර්යයන් නියාමනය සඳහා ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. |
| 13. | තාත්ත්වික සේවා මට්ටමක් පවත්වාගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් සිදු කිරීමට නොහැකිවීම හේතුවෙන් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණි, තෘතීය මට්ටම, ද්විතීක මට්ටම ඇතුලු සියලුම මට්ටම්වල අඛණ්ඩව පුරප්පාඩු පැවතුණි. | කාර්යයමණ්ඩල ඌනතාවය අමාත්‍යාංශයේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපායි නම් එම පුරප්පාඩු පිරවීමට හෝ එසේ නොවේ නම් කාර්යය මණ්ඩල සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුවීම. | 87 දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලය අත්‍යවශ්‍ය කාර්යය මණ්ඩලයක් වන අතර, ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීමේ හේතුවෙන් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී ඇති බව. අමාත්‍යාංශය ඉඩකඩ සහිත වෙනත් ස්ථානයකට රැගෙන යාමට සුදුසු ස්ථානයක් සොයා බලමින් පවතින බව. | සියලුම මට්ටම්වල පුරප්පාඩු තව දුරටත් පවතී. |

## 14. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය පුනරාවර්තන | 243,930,000 | 190,600,000 | 165,700,000 | 600,230,000 |
| මූලධන | 84,100,000 | 62,600,000 | 4,200,000 | 150,900,000 |
| මුළු වියදම | 328,030,000 | 253,200,000 | 169,900,000 | 751,130,000 |
| සත්‍යවියදම -පුනරාවර්තන | 217,103,227 | 156,927,715 | 163,661,308 | 443,364,535 |
| මූලධන වියදම | 59,856,631 | 12,470,038 | 2,627,403 | 74,954,072 |
| මුළු වියදම | 276,959,858 | 169,397,753 | 166,288,712 | 518,318,608 |
| වසර අග ඉතිරිවීම් -පුනරාවර්තන වියදම | 26,826,773 | 33,672,284 | 2,038,691 | 62,537,748 |
| මූලධන වියදම | 24,243,369 | 50,129,961 | 1,572,596 | 75,945,926 |
| මුළු වියදම | 51,070,142 | 83,802,245 | 3,611,287 | 138,483,674 |
| ප්‍රමාණාත්මක ආදායම් -ඇස්තමේන්තුගත ආදායම | 100,700,000 | 92,000,000 | 115,800,000 | 308,500,000 |
| සත්‍ය ආදායම | 124,000,069 | 123,418,859 | 113,595,168 | 361,014,096 |

**09. වෙළෙඳ අමාත්‍යාංශය**

ශීර්ෂය - 116

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - 2020 - තත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| 01. | මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ බැදීම් සහ බැරකම් නොමැති බව සඳහන් කර තිබුණද , 2021 වර්ෂයේ ගෙවීම් සම්බන්ධ නියැදි පරීක්ෂාවේදී 2020 වර්ෂයට අදාල රු. 4,416,559 ක ගෙවීම් 2021 වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාස තුළදී ගෙවා ඇති බව නිරික්ෂණය විය. | බැදීම් සහ බැරකම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දැක්විය යුතු වේ. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නැත. | 2021 වර්ෂයේදී ද බැදීම් සහ බැරකම් හඳුනාගෙන නොතිබුණි. |
| 02. | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, 2020 වර්ෂය තුළ නිකුත් කල විගණන විමසුම්වලට පිළිතුරු ලබා දි නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග පිළිබඳ දන්වා නැත. | විගණන විමසුම් සඳහා මේ දක්වාත් පිළිතුරු ලබා දී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 03. | 2020 දෙසැම්බර් 31 දිනට පැවති වාහන 19 ක අයිතිය අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබුණි. | අමාත්‍යාංශය පරිහරණය කරන වාහන අමාත්‍යාංශය වෙත පවරාගත යුතු වේ. | පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතියි. | වාහන 17 ක අයිතිය මේ දක්වාත් අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබුණි. |

## 04. ප්‍රතිපාදන උපයෝජනය

| | 2020<br>------- | එකතුව |
|---|---|---|
| | රු. | රු. |
| ශුද්ධ ප්‍රතිපාදනය | | |
| - පුනරාවර්තන | 682,220,000 | 682,220,000 |
| - මූලධන | 2,837,880,000 | 2,837,880,000 |
| එකතුව | 3,520,100,000 | 3,520,100,000 |
| සත්‍ය වියදම | | |
| - පුනරාවර්තන | 588,475,069 | 588,475,069 |
| - මූලධන | 2,225,656,938 | 2,225,656,938 |
| එකතුව | 2,814,132,007 | 2,814,132,007 |
| වසර අග ඉතිරිවීම් | | |
| - පුනරාවර්තන | 93,744,931 | 93,744,931 |
| - මූලධන | 612,223,062 | 612,223,062 |
| එකතුව | 705,967,993 | 705,967,993 |

## 10. මහාමාර්ග අමාත්‍යාංශය

ශීර්ෂය - 117

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

| | |
|---|---|
| 2018 | - තත්ත්වාගණනය කළ මතය |
| 2019 | - තත්ත්වාගණනය කළ මතය |
| 2020 | - තත්ත්වාගණනය නොකළ මතය |

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ පියවර | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | අමාත්‍යාංශයේ ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා හේතුවෙන් මුලික වියදම් ඇස්තමේන්තු හා සංශෝධන වියදම් ඇස්තමේන්තු අතර විචලතාවය වසර 3කදී පහත පරිදි වර්ධනය වී තිබුණි. 2020 වර්ෂයේදී සියයට 25 සිට සියයට 1750 දකවා පරාසයක පැවතුණි. | නිතිපතා සංශෝධනයන්ට ලක් නොවන සේ වර්ෂයේ වියදම් ඇස්තමේන්තු නිසි පුරෝකථනයකින් යුක්තව සැකසිය යුතුය. | සියළුම අංශ වෙත හැකි සෑම අවස්ථාවකදී නිවැරදි තොරතුරු දත්ත පදනම් කර ගනිමින් ඇස්තමේන්තු සකස් කරන ලෙස දැන්වීම. | අනෙකුත් වර්ෂ සමග සසදා බැලීමේදී පහත සදහන් පරිදි 2021 වර්ෂයේදී සමස්ත වාර්ෂික විචලතාවය අවම මට්ටමක පවත්වා ගැනීමට හැකිවී ඇත.<br>වර්ෂය — සමස්ථ විචලතාවය<br>2018 — 53.50<br>2019 — 57.22<br>2020 — 18.93<br>2021 — 12.96 |
| 02. | අමාත්‍යාංශය විසින් නිසි පුරෝකථනයකින් තොරව ඇස්තමේන්තු සැකසීම හේතුවෙන් | නිසි පුරෝකථනයකින් යුක්තව වැය ඇස්තමේන්තු සැකසිය යුතුය. | යාවත්කාලීනව අක්මුදල් නොලැබීම නිසා සැලසුම් කල පරිදි කාර්යයන් සිදු | ලැබෙන සීමිත අක්මුදල් ප්‍රමුඛතාවය ලබා දිය යුතු කර්යයන් පදනම් කර ගනිමින් අක්මුදල් නිකුත් කරන බව. |

| | | | | |
|---|---|---|---|---|
| | 2018 සහ 2019 වර්ෂ වලදී පිළිවෙලින් වැය විෂයන් 57 කට සහ 72 කට අදාලව සියයට 25 සිට සියයට 99 දක්වාද 2020 වර්ෂයේදීද වැය විෂයන් 17 කට අදාලව සියයට 25 සිට සියයට 72 දක්වාද ශුද්ධ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | | කිරීමට නොහැකි වීම මත ඇතැම් වැය විෂයන්ගේ ඇස්තමේන්තු ගත වැඩ සම්පූර්ණයෙන් ඉටුකර ගැනීමට නොහැකි වී ඇති බව සහ වර්ෂය අතරතුර නැවත සලකා බලමින් ප්‍රමුඛතාවය ලබා දිය යුතු කාර්යයන් සඳහා ප්‍රතිපාදන මු.රෙ.66 යටතේ ගලපමින් සීමිත ප්‍රතිපාදන උපරිමයෙන් කළමණාකරණය කරගැනීමට කටයුතු කිරීම. | |
| 03. | අමාත්‍යාංශය මගින් 2018 සහ 2019 වසර වල පිලිවෙලින් වැය විෂයන් 15 කට අදාලව රු.මිලියන 3,174.50 ක් සහ වැය විෂයන් 11 කට අදාලව රු.මිලියන 9,166.70 ක් අයවැය ප්‍රතිපාදන සලසා ගෙන එකී වැය | නිවැරදිව හඳුනාගත් වියදම් අවශ්‍යතාවයන්ට පමණක් අයවැය ඇස්තමේන්තු සකස් කල යුතුය. | වාර්ෂික ඇස්තමේන්තු මගින් හඳුනාගනු ලැබූ වැඩ සේවා හා සැපයීම් සඳහා ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම මත සැලසුම්ගත පරිදි කටයුතු කිරීමට නොහැකි වීම මත | 2021 වර්ෂයේදී ඇස්තමේන්තු කර තිබුණු ප්‍රතිපාදන වැඩි ප්‍රමාණයක් වෙනත් වැය විෂයන්ට මැරු කිරීම අනෙක් වර්ෂයන්ට සාපේක්ෂව අඩු වී ඇත.<br>2021 වර්ෂයේ වැය විෂයන් පහක පමණක් මුළුමනින්ම ප්‍රතිපාදන වෙනත් වැය විෂයන්ට මාරුකර තිබූ අතර එහි වටිනාකම රු.මිලියන 51 කි. එමෙන්ම වෙන්වූ ප්‍රතිපාදන සියයට 60 කට වැඩි ප්‍රතිශතයක් |

| | | | | |
|---|---|---|---|---|
| | විෂයන් තුල කිසිදු වියදමක් නොදරා සම්පූර්ණයෙන්ම මුදල් රෙගුලාසි 66/69 මඟින් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. තවද, 2020 වර්ෂයේදී වැය විෂයන් 20 ක් වෙනුවෙන් වෙන්කර තිබූ රු.මිලියන 51,575.99 ක ප්‍රතිපාදන තුලින් රු.මිලියන 45,388.06 ක ප්‍රතිපාදන එනම් සියයට 88 ක් මුදල් රෙගුලාසි 66/69 මඟින් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. | | කලින් හඳුනාගත් වැඩ/සේවා සැපයීම 100% ඉටුකිරීමට නොහැකි බව සහ අත්‍යාවශ්‍ය නොවැළැක්විය හැකි ගෙවීම් හා සැපයීම් සඳහා පමණක් ඇස්තමේන්තුගත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම හා ඒකකවලට උපදෙස් ලබා දී ඇති බව. | වෙනත් වැය විෂයන්ට මැරු කිරීම සැලකීමේදී එය වැය විෂයන් 12 කදී රු.මිලියන 604 ක් පමණි. |
| 04. | 2019 වර්ෂයේදී වැය විෂයයන් 12 කට අදාලව මුදල් රෙගුලාසි 66/69 මාරු කිරීම් යටතේ සලසාගෙන තිබූ රු.මිලියන 5,076.6 ක එකතු වටිනාකමින් යුත් අතිරේක ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම | -එම- | නිවැරදිව හඳුහාගත් වියදම් අවශ්‍යතාවයන්ට පමණක් අය වැය ඇස්තමේන්තු සකස් කරන ලෙස සියළුම ගිණුම් ඒකක දැනුවත් කර ඇති බව. | හැකිතාක් නිවැරදි අවශ්‍යතාවයන්ට පමණක් ඇස්තමේන්තු කලද ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම හා ගෙවීම් සඳහා ඉදිරිපත් කරනු ලබන විදේශ වැය විෂයන්ගේ බිල්පත් ගිණුම්ගත නොවීම , වසංගත තත්ත්වයන් වැනි අමාත්‍යංශයේ පාලනයෙන් බැහැර කරුණු හේතු කොට ගෙන ඇතැම් වැය විෂයන්ගේ ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුවන බව. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉතිරි වී තිබූ අතර 2020 වර්ෂයේ දී වැය විෂයයන් 17 කට අදාලව රු.මිලියන 22,838.64 ක අතිරේක ප්‍රතිපාදන වලින් රු.මිලියන 19,296.68 එනම් සියයට 84 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | | | |
| 05. | දක්ෂිණ අධිවේගි මාර්ග ව්‍යාපෘතියේ ශක්‍යතා වාර්තාවේ 8.33 වගන්තියට අනුව, සේවා ප්‍රදේශයන් කිහිපයක් හඳුනාගෙන තිබුණද සේවා සැපයුම් ප්‍රදේශයක් ඉදිකිරිම සම්බන්ධයෙන් කිසිඳු සැලැස්මක් හෝ මුල්‍ය ප්‍රතිපාදනයන් සිදු කර නොතිබුණි. ඒ අනුව දක්ෂිණ අධිවේගි මාර්ගයේ 46 වන කිලෝමීටරයෙහි පිහිටි වැලිපැන්න සේවා මධ්‍යස්ථානයෙන් අනතුරුව හම්බන්තොට දක්වා කි.මී.176 ක් ගමන් | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය සඳහා සේවා ප්‍රදේශයන් සකස්කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගත යුතුය. | සේවා ප්‍රදේශයක් යනු අධිවේගී මාර්ගයක ප්‍රධානම අයිතමයක් බැවින් නව සේවා ප්‍රදේශය ඉදි කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු සිදු කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දී ඇති බව. | අධිවේගි මාර්ග පද්ධතියම සලකා බලා හා ඒ පිළිබඳව විශේෂ අධ්‍යයනයක් කර සේවා අවශ්‍ය වන ස්ථාන පිළිබඳ සොයා බැලීමේ කටයුතු සිදුවෙමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | කරන මඟී ජනතාවට සේවා සැපයුම් සැලසීම ගැටළු සහගත තත්ත්වයක් පැවතුණි. | | | |
| 06. | දක්ෂිණ අධිවේගි මාර්ග දිගුව ව්‍යාපෘතියේ 03 සහ 04 අදියරයන්හි අධිවේගි මාර්ගයේ ජාත්‍යන්තර රළු බව පිළිබඳ දර්ශකය කිලෝමීටරයකට මීටර් 1.5 – 2.3 ක පරාසයක පැවතිය යුතු අතර තාක්ෂණික පරික්ෂණ අනුව එම දර්ශකයන් ලබා කරගෙන තිබුණද, අධිවේගි මාර්ගයේ සමහර කොටස්වල මාර්ගයේ සුමටතාවය ධාවනය වන මෝටර් රථ වල යහපත් ධාවන තත්ත්වය පවත්වා ගැනිම සඳහා ප්‍රමාණවත් වි නොතිබුණි. | තාක්ෂණික පිරිවිතර සැකසීමේදී මාර්ගවල ධාවනය වන වාහනවල ධාවන තත්ත්වය සහතිකවීමට අවශ්‍ය විධිවිධාන සලසා ගත යුතුය. | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය අදියර 03 හා 04 හි මාර්ග වල ගමන් කිරීමේ ගුණාත්මකභාවය පරික්ෂා කිරීමේ පරික්ෂාව වන ජාත්‍යන්තර රළු බව දර්ශකයේ මිනුම් (IRI) තාක්ෂණික පිරිවිතරයේ සඳහන් සීමාව තුල පවතින බව. | ගමන් කිරීමේ ගුණාත්මකභාවය පරික්ෂා කිරීමේ පරික්ෂාව වන ජාත්‍යන්තර රළු බව දර්ශකයේ මිනුම් (IRI) තාක්ෂණික පිරිවතරයේ සඳහන් සීමාව තුල පවති. |
| 07. | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව අදියර 01 යටතේ දෝෂ දැනුම්දීමේ කාලය සහ ණය කාලය 2020 | ඉදිරි ව්‍යාපෘති සැලසුම්කරනයේ දී සියළු අවශ්‍යතා සළකා බැලිය යුතුය. | ව්‍යාපෘති සැළසුම් කිරීමේදී එහි මුලික අවධියේදීම විෂය පථය හඳුනාගෙන ප්‍රතිපාදන වෙන්කර | මුල් ගිවිසුමේ සඳහන් රේට් ගනන් පදනම් කරගෙන කොන්ත්‍රාත් අයතනය වෙත ගෙවීම කිරීම නිසා අමතර පිරිවැයක් දැරීමට සිදුවී නොමැති බව. |

| | | | | |
|---|---|---|---|---|
| | නොවැම්බර් 08 දිනෙන් අවසන් වුවද, ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ අන්තර් හුවමාරුවක් ඉදිකිරීමේ ස්ථානයක් ලෙස හඳුනා නොගත් කපුදූව ප්‍රදේශයේ අර්ධ අන්තර් හුවමාරුවක් රු. මිලියන 459.8 ක පිරිවැයකට ඉදිකිරීමට 2020 නොවැම්බර් 10 දිනැති තීරණ මත පදනම්ව ආරම්භ කර තිබුණි. සැලසුම් අදියරේදී මෙම හුවමාරුව හඳුනාගෙන තිබුණේ නම්, මේ සඳහා වන පිරිවැය අවම කර ගත හැකිව තිබුණි. | | ගැනීමේ අවශ්‍යතාවය ඉදිරිපත් කල යුතු බව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දැනුවත් කරන බව. | |
| 08. | ඉහත ව්‍යාපෘතියට අදාල දෝෂ වගකීම් කාලයෙන් පසුව වුවද නව අන්තර් හුවමාරුව ඉදිකිරීමේ විෂය පථය වෙනස් කිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දක්වා උපදේශන සේවා සඳහා රු. මිලියන 21.38 ක සහ ව්‍යාපෘති කළමණාකරනය | අපේක්ෂිත කාලය තුල ඉදිකිරීම් නිම කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සලසා ගත යුතුය. | දෝෂ වගකීම් කාලයෙන් පසුව ඉටුකල යුතු අතවශ්‍ය කාර්යයන් සඳහා උපදේශන ආයතනය හා ව්‍යාපෘති කාර්යාලය ක්‍රියාත්මක විය යුතු බව සහ එම කාලය තුල මෙම අන්තර් හුවමාරුව ඉදිකර ඇති බැවින් | ව්‍යාපෘතියේ දෝෂ වගකීම් කාලය 2020 නොවැම්බර් 08 දින අවසන් වුවත් ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා තවත් පියවරයන් රාශියක් පසුකල යුතුය කොන්ත්‍රාත් ගිවිසුමෙහි මේ සම්බන්ධයෙන් ලබාදී ඇති කාල සීමවන් හා කොන්දේසි අනුව කොන්ත්‍රාත් බැදීම් ඉදිකිරීම අප්‍රේල් 30 දිනට පෙර සම්පූර්ණකල යුතුව පැවතුණු බව. කපුදූව අන්තර් හුවමාරුව 2021 අප්‍රේල් මස මුල් |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා රු. මිලියන 17.05 ක අමතර පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. | | උපදේශන හා පොදු කාර්යය වියදම් වෙනුකවන් අමතර වියදමක් දැරීමට සිදුවී නොමැති බව. ඒසේම මෙවැනි අවශ්‍යතාවයන් සඳහා අමතර ප්‍රතිපාදන සලසා ගැනීමට සටහන් කරගෙන ඇති බව. | සතිය තුල අවසන් කරන ලද බව, මෙම සියළු කටයුතු සඳහා කොවිඩ් 19 තත්ත්වය අහිතකර ලෙස බලපෑ අතර එම තත්ත්වය 2021 මාර්තු අවසන් සතියේ සිට ව්‍යාපෘතියේ කටයුතු වලට දැඩිව බලපාන ලද බව සහ අමතර කාර්යය මණ්ඩලයක් යොදවා ගැනිමකින් තොරව මෙම අන්තර් හුවමාරුවේ ඉදිකිරිම් කටයුතු උපදේශන ආයතනය හා ව්‍යාපෘති කාර්යාලය මගින් නිම කරන ලද බව. |
| 09. | පහසුකම් සපයන ගොඩනැගිලි රු.මිලියන 185 ක පිරිවැයක් යටතේ ස්ථිර පදනමින් ඉදි කර තිබුණද, එම ගොඩනැගිලි වල අපේක්ෂිත භාවිතය පිළිබඳ මූලික සැලැස්මක් හෝ ව්‍යාපෘතිය අවසානයේ ඒවායෙහි අපේක්ෂිත උපයෝජනය පිළිබඳ නිසි සැලැස්මක් සකස් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමේදි ව්‍යාපෘතිය අවසානයේ එම ගොඩනැගිලිවල අපේක්ෂිත භාවිතය පිළිබඳ මූලික සැලැස්මක් තිබිය යුතුය. | කොන්ත්‍රාත් පිරිවිතර පිළියෙළ කිරිමේදි ඒ සඳහා මනා නිපුණත්වයක් යුත් කාර්යය මණ්ඩලයක් පිහිටුවීම හා දැනට ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල ඇති පිරිවිතර දෝෂ හදුනාගෙන පිරිවිතර පිළියෙළ කරන බව. | දක්ෂිණ අධිවේගි මාර්ග දිගුව ව්‍යාපෘතිය - අදියර 1ට අයත්ව තිබූ ගොඩනැගිලි සංකිර්ණය අධිවේගි මාර්ග මෙහෙයුම් නඩත්තු කළමණාකරණ අංශය වෙත භාරදී ඇති අතර එම අංශය මගින් මෙම වත්කම් පූර්ණ උපයෝජනයකට යොදවා ඇති බව. |
| 10. | කොන්ත්‍රාත් ලියකියවිලි වල සහ කොන්ත්‍රාත්කරුට සපයන ඉංජිනේරු උපදෙස් වල | ව්‍යාපෘතිය කළමනාකරණය සහ අධීක්ෂණය මනා ලෙස විය යුතුය. | කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් ක්‍රමවේදයන් අනුව මෙම ගෙවීම් සිදුකර ඇත. කෙසේ | තාක්ෂණික පිරිවිතර නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | අපැහැදිලි අර්ථ දැක්වීම් නිසා ජම්බාර (Piling) සහ ජම්බාර නොවන ව්‍යුහාත්මක කටයුතු සඳහා භාවිතා කරන කොන්ක්‍රීට් පන්තිය පිළිබඳ පිරිවිතරයන් වෙනස් වීම හේතුවෙන්, ආරවුල් විනිශ්චය මණ්ඩලයේ තීරණය අනුව එය පිරිවැය ඉහළ යාමක් සහ ගෙවීම් ප්‍රමාදයක් හෝ අතපසු කිරීම වෙනුවෙන් වූ පොලී මුදලක් ලෙස කොන්ත්‍රාත්කරුට රු.මිලියන 129.11 ක අතිරේක ගෙවීමක් කිරීමට සිදු වී තිබුණි. | | වෙතත් තාක්ෂණික පිරිවිතර සකස් කිරීමේදී ඒවා තවදුරටත් පරික්ෂාකර සියළු දෝෂ නිවැරදිකරණ ලෙස දැනුම් දී ඇති බව. | |
| 11. | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව අදියර 02 යටතේ අධිවේගී මාර්ගය සාමාන්‍ය ජනතාවට විවෘත කරන අවස්ථාවේදී, ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ අන්තර් හුමමාරුවක් ඉදි කරනු ලබන ස්ථානයක් ලෙස හඳුනා නොගත් බැදිගම ප්‍රදේශයේ | ඉදිරි ව්‍යාපෘති සැලසුම්කරනයේ දී සියළු අවශ්‍යතා සළකා බැලිය යුතුය. | නව බැදිගම අන්තර්හුවමාරුව ඉදිකිරීම සඳහා වැඩි කාලයක් ගතවනු ඇති බැවින්, මාර්ග භාවිතා කරන්නන්ට සේවය සැපයීම සඳහා බැදිගම හි තාවකාලික අන්තර් හුවමාරුවක් ඉදිකිරීම සඳහා මාර්ග හා මහාමාර්ග | ඉදිරි ව්‍යාපෘතින් සඳහා අන්තර් හුවමාරු ඉදිකිරිමෙදි මුලික යෝජනාවෙහිදීම අදාළ කටයුතු සිදුකිරිමට පියවර ගැනීම |

| | |
|---|---|
| තාවකාලික අන්තර් හුවමාරුවක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 100.83 ක් දරා තිබුණි. | අමාත්‍යාංශයේ ලේකම්තුමන්ගේ අනුමැතිය ලබා ගන්නා ලද බව, EXIM බැංකුවේ එකඟතාවයට යටත්ව කොන්ත්‍රාත් ඉතුරුම් යොදා ගනිමින් බැදිගම ප්‍රදේශයේ අන්තර් හුවමාරුවක් ඉදිකිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති බව, නව බැදිගම අන්තර් හුවමාරුව ඉදිකිරීමට සැලසුම් කිරීම සහ ඉඩම් අත්පත් කර ගැනීම කටයුතු සඳහා වැඩි කාලයක් ගතවන බැවින්, අධිවේගී මාර්ග භාවිතා කරන්නන්ගේ පහසුව සලකා තාවකාලික අන්තර් හුවමාරුවක් බැදිගම ප්‍රදේශයේ මත පවතින කොරිඩෝව තුළ ඉදිකර ඇති බව. |

| | | | | |
|---|---|---|---|---|
| 12. | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ තෙවන අදියර මඟින් ආනයනය කර තිබූ හා ව්‍යාපෘති අවසානයේ අපනයනය කළයුතු එ.ජ.ඩො. 10,363,385 ක් වටිනා උපකරණ නැවත අපනයනය කිරීමෙන් හෝ බදු ගෙවීමෙන් තොරව කොන්ත්‍රාත්කරු විසින් රඳවා තබාගැනීමෙන් කොන්ත්‍රාත්කරුට අසාමාන්‍යය වාසි හිමි වී තිබුණි. | නැවත අපනයනය කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට හෝ අදාල බදු ගෙවීමට කටයුතු කළ යුතුය. | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - අදියර 02 නිම කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරු ඉන්වොයිස් දෙකකට අදාල යන්ත්‍රෝපකරණ 12ක් නැවත අපනයනය හා අදාළ බදු ගෙවීමට කටයුතු කර ඇති බව සහ ඊට අමතරව කොන්ත්‍රාත්කරු විසින් උපදේශන සමාගමේ නිර්දේශය සමග අදාල බදු ගෙවීමෙන් පසු ඉතිරි යන්ත්‍රෝපකරණ මෙරට රඳවා තබා ගැනීමට අවසර ඉල්ලා ඇත. එම ඉල්ලීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් හා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් අවසර ලබා දී ඇති බව හා ඒ අනුව එක් ඉන්වොයිසියකට | අදාල බදු මුදල් ලබා ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව වෙත දන්වා ඇත. තවදුරටත් මෙම ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා විශේෂ සාකච්ඡාවක් ද ඉල්ලා ඇති බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අදාල යන්ත්‍රෝපකරණ 14 ක් සඳහා අදාල බදු කොන්ත්‍රාත්කරු විසින් ගෙවා නිම කර ඇති බව. | |
| 13. | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - අදියර 04 ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 106 ක වටිනාකමින් යුත් ගොඩනැගිලි ස්ථිර පදනමක් මත ඉදි කර තිබුණද, ව්‍යාපෘතිය අවසානයේ එම ගොඩනැගිලි වල උපයෝජනය පිළිබඳ මූලික සැලැස්මක් සකස් කර නොතිබුණි. 2019 වර්ෂයේදී එම පරිශ්‍රය මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතා වර්ධන මධ්‍යස්ථානක් ලෙස යොදා ගැනීමට යෝජනාවක් ඉදිරිපත් කර තිබුණද එය 2020 වර්ෂය අවසන් වන තෙක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමේදී ව්‍යාපෘතිය අවසානයේ එම ගොඩනැගිලිවල අපේක්ෂිත භාවිතය පිළිබඳ මූලික සැලැස්මක් තිබිය යුතුය. | මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ඉහත සඳහන් ගොඩනැගිලි ධාරිතා සංවර්ධන මධ්‍යස්ථානක් ස්ථාපිත කිරිම. | දැනට මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා ධාරිතා සංවර්ධන මධ්‍යස්ථානක් ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් අධ්‍යක්ෂ ජනරාල් ගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් මත සිදුකරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| 14. | ඉහත ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 509 ක් වූ ආරවුල් හිමිකම් පෑම් තුනක් බේරුම්කරණය සඳහා තවමත් විවෘතව පැවතුණු අතර ව්‍යාපෘතියේ අඩුපාඩු නිවැරදි කිරිමට බැඳි සිටිමේ කාලය අවසන් වි තිබියදීත් කොන්ත්‍රාත්කරුගේ හිමිකම්පෑම අවසන් කල නොහැකි වි තිබුණි. | අතෘප්තිය පිළිබඳ දැනුම් දීමක් නිකුත් කිරීමෙන් පසු බේරුම්කරණය ආරම්භ කිරීම සඳහා නිශ්චිත කාල සීමාවක් විශේෂිත කොන්දේසි වලට ඇතුලත් කළ යුතුය. | කොන්ත්‍රාත්තු කොන්දේසි මත ගෙවීම දින 56 ක් ඇතුලත සිදුකල යුතු අතර හැකියාව සොයා බලා අවම වන පරිදි කටයුතු කිරිම. ඉදිරි කොන්ත්‍රාත් කටයුතුවලදී බේරුම්කරණය ආරම්භ කිරීම සඳහා නිශ්චිත කාල සීමාවන් විශේෂිත කොන්දේසි වලට ඇතුලත් කිරීමට සියළු ව්‍යාපෘති දැනුවත් කරන ලද බව. | තවම කොන්ත්‍රාත්කරු බේරුම්කරණ ක්‍රියාවලිය ආරම්භ කරන බවත් දැනුම් දී නොමැත. |
| 15. | ඉහත ව්‍යාපෘතියට අදාලව විචලතා නියෝගයක් යටතේ මත්තල සහ මාගම්පුර අන්තර් හුවමාරු ස්ථානවල ගාස්තු අය කිරීමේ දොරටු සඳහා අමතර පාලම් තරාදි දෙකක් රු.1,873,300 ක් වැය කර ඉදිකිරීම් සිදු කර තිබුණද 2020 වර්ෂය අවසන් වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | සියළුම ඉදිකිරීම් උපයෝජනයට ගැනීමට පියවර ගත යුතුය. | මෙය ඉදිරියෙදි මාර්ග සුදුසු පරිදි සංවර්ධනය විම තුලින් බර වාහන ඇතුළු කිරිමේදි අවශ්‍ය පරිදි භාවිතා කිරීම. | අධිවේගි මාර්ග නඩත්තු ඒකකය විසින් අවශ්‍ය පරිදි ඉදිරියෙදි භාවිතා කරනු ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 16. | අදියර 04 කින් සමන්විත මධ්‍යම අධිවේගී මාර්ගයේ ශක්‍යතා අධ්‍යනය සිදු කිරීම පිණිස ඔස්ට්‍රේලියානු සමාගමක් වෙත රු.මිලියන 1,759 ක් ගෙවා තිබුණි. අදාල ශක්‍යතා අධ්‍යයනය එකී සමාගමෙන් සිදු කරවා ගෙන අවසන් ශක්‍යතා අධ්‍යයනය වාර්තාවක් ලබා ගැනීමට කටයුතු නොකොට සම්බන්ධිත ශක්‍යතා අධ්‍යයනයක් සඳහා දේශිය ආයතන කිහිපයක් සමඟ රු.මිලියන 97 ක අගයකට ගිවිසුම් ගත වි තිබුණි. | ශක්‍යතා අධ්‍යනය සම්බන්ධයෙන් වූ වාර්තා කාල පමාවකින් තොරව ලබා ගැනිමට කටයුතු කල යුතුය. ශක්‍යතා අධ්‍යනය සංශෝධනයකට යටත් කල යුතු නම් අදාල පාර්ශවය මඟින්ම එය නිවැරදි කර ගැනිමට කටයුතු කල යුතුය. | 2015 වසරේදී රජය ගත් ප්‍රතිපත්තිමය තීරණයන්ට අනුව මාර්ග පථයේ මුල් කොටසේ සිදු කල වෙනස්වීමක් මත SMEC සමාගම සිදු කල ශක්‍යතා අධ්‍යයනයට සංශෝධනයක් කල යුතු වූ බව, එම අවස්ථාව වන විට SMEC සමාගම තම කොන්ත්‍රාත්තුව නිම කිරීමෙන් අනතුරුව දිවයිනෙන් බැහැර වී තිබුණු බව සහ එම සංශෝධනය SMEC සමාගම සමඟ පැවති කොන්ත්‍රාත්තුවට අදාල විෂය පථයට අයත් නොවූ අතර අමතරව සිදු කල යුතුව තිබූ කාර්යයක් බැවින් එම අමතර කාර්යයන් වෙනත් රාජ්‍ය ආයතන මගින් සිදු කර ගැනීමට ව්‍යාපෘතියට සිදු වූ බව. | වෙනස්වීම්වලට අදාලව සිදු කරන ලද පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සහ ආර්ථිකමය ශක්‍යතා අධ්‍යයනය නිම කර අවසන් වාර්තා ලැබී ඇති බව. |

| | | | | |
|---|---|---|---|---|
| 17. | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව අදියර 03 යටතේ 2013 සිට 2020 වර්ෂය අවසන් වන තෙක් සිවිල් වැඩ කොන්ත්‍රාත් ප්‍රදානය කර නොතිබුණු අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා රු.මිලියන 833.33 ක් වැය කර තිබුණි. | ඉදිකිරීම කඩිනම් කිරීමට සෑම පියවරක් ම ගත යුතුය. | 3වන කොටසෙහි කි.මී.0+840 සිට කි.මී.12+890 දක්වා වූ කොටසෙහි ඉදිකිරීම් 2020 දෙසැම්බර් මස සිට ආරම්භ කරන ලද බව සහ ඉතිරි කොටසවන කි.මී.12+890 සිට කි.මී.32+500 දක්වා වූ කොටසෙහි ඉදිකිරීම් කටයුතු කඩිනමින් ආරම්භ කිරීම සඳහා DBFOMT ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇති බව. | කි.මී.0+840 සිට කි.මී.12+890 දක්වා වූ කොටසෙහි ඉදිකිරීම් කටයුතු 5% ක පමණ ප්‍රගතියකින් යුතුව සිදු කරන බව හා<br>කි.මී12+890 සිට කි.මී.32+500 දක්වා වූ කොටසෙහි ප්‍රසම්පාදන කටයුතු අවසන් අදියරේ පවතින අතර එම කටයුතු නිම වූ වහාම ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිත බව. |
| 18. | 2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 දරන රාජ්‍ය වියදම් කළමනාකරණය සහ මූල්‍ය විනය පවත්වාගෙන යාම යන මැයෙන් නිකුත් කල අයවැය චක්‍රලේඛ ප්‍රකාරව වියදම් ඒකක වලට ලබාදී තිබූ සම්පත් නිකරුණේ තැබීමෙන් වන පිරිවැය වැලැක්විම සඳහා සෑම පියවරක්ම | දේපල පිරියත උපකරණ සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට ක්‍රියා කල යුතුය. | අලුත්වැඩියා කර භාවිත කිරීම සඳහා තීරණය කර ඇති වාහන 03 අමාත්‍යාංශයේ කාර්මික දැනුම සහිත නිලධාරීන් නොමැති බැවින් අලුත්වැඩියා කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ ඇති මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යොමු කිරීමට කටයුතු කර ඇති | අමාත්‍යාංශය සතු වාහන 06ක් අපහරණය සඳහා හඳුනාගෙන තිබූ බැවින් එම වාහන ධාවනය සඳහා යොදාගෙන නොමැත. ඒ අතරින් වාහන 03ක් අපහරණය කිරීම සඳහා කටයුතු සිදු කළ නමුත්, අලුතින් වාහන දීර්ඝ කාලයකට ආනයනය සිදු නො කරන බැවින් ඉදිරි අවශ්‍යතා සඳහා අලුත්වැඩියා කර භාවිත කිරීම සඳහා තීරණය කර ඇත.<br>කෙසේ වෙතත් 2020 වර්ෂය තුළ රටේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ වාහන භාවිත |

| | | | |
|---|---|---|---|
| ගත යුතු බව සඳහන් වූවද, අමාත්‍යාංශය සතුව පැවති වාහන වලින් භාවිතා කළ හැකි තත්ත්වයේ පවතින වාහන 07ක් 2019 වර්ෂයේදීත් වාහන 11 ක් 2020 වර්ෂයේදීත් භාවිතයෙන් තොරව අනාරක්ෂිතව ගාල් කර තිබුණි. | | බව. එම වාහන අලුත්වැඩියා කිරීම සඳහා දැනට මිල ගණන් කැඳවා ප්‍රසම්පාදන ක්‍රියාවලිය වෙත යොමු කර ඇති නමුත්, අදාළ දේශීය නියෝජිත ආයතනවල අමතර කොටස් නොමැති බැවින් එම අලුත්වැඩියා කටයුතු ප්‍රමාද වීමට ඉඩ ඇති බව, එතෙක් එම වාහන මාර්ග සංවර්ධන අධිකාරියේ ආරක්ෂක අංශයේ සුපරීක්ෂාව යටතේ ආරක්ෂාකාරීව මාර්ග සංවර්ධන අධිකාරියට අයත් රථගාලේ ගාල්කර ඇති බව, අපහරණය සඳහා හඳුනාගත් වාහන අතරින් WP KG-5555 අංක දරන වාහනය 2021-01-10 දින අපහරණය කිරීම සඳහා කටයුතු කර ඇති අතර WP KO-8807 අංක | කිරීම පෙරට වඩා අවම මට්ටමකින් සිදුව ඇත. ඒ වන විට ධාවනය නො කළ සියලු වාහන මාර්ග සංවර්ධන අධිකාරියේ රථගාල තුළ මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් යොදවා ඇති ආරක්ෂක නිලධාරීන්ගේ සුපරීක්ෂාව යටතේ ආරක්ෂිතව ගාල්කර ඇත. අමාත්‍යාංශය සතු අනෙකුත් සියලු වාහන අවශ්‍යතාවන් අනුව රාජකාරි කටයුතු සඳහා භාවිත කරයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | දරන වාහනය අලුත්වැඩියා කර භාවිත කිරීම සඳහා ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යාංශය වෙත නිදහස් කිරීමට කටයුතු කර ඇති බව. තවද එක් වාහනයක් රජයේ ආයතනයක් වෙත භාවිත කිරීම සඳහා ලබා දීමට කටයුතු කරනු ලබන ලබන බව හා දැනට ආයතන කිහිපයකින් එම වාහනය පරීක්ෂා කර බැලීමට ද පැමිණි බව. | |
| 19. | 2019 සහ 2020 වර්ෂයන්හි වාර්ෂික වැඩ සටහන් වල තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කල යුතු වැඩ සටහන් ඇතුලත් කර නොතිබුණු නමුත් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන අරමුණු 03 කට අදාලව පමණක් ඉලක්කයන් සහ දර්ශකයන් සඳහන් | වාර්ෂික වැඩසටහනෙහි තිරසර සංවර්ධන අරමුණු ඉටුකරගැනීම සඳහා ක්‍රියාත්මක කල යුතු වැඩසටහන් නිශ්චිතව ඇතුලත් කර ඒවා ළඟාකර ගැනීමට නිසි පරිදි ඇගයීමක් කළ යුතුය. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් 2021 වර්ෂය සඳහා සකසන ලද වාර්ෂික වැඩසටහනට ඇතුළත් කර ඇති බව හා ඉදිරියේදී සකසනු ලබන වාර්ෂික වැඩසටහන් සඳහා ද එය අඛණ්ඩව කරන බව. | 2021 වර්ෂය සඳහා සකසමින් පවතින වාර්ෂික කාර්යසාධන වාර්තාවෙහි උක්ත වැඩසටහන් සඳහා 2021 වර්ෂයේ දී වාර්තා වූ ප්‍රගතීන් පැහැදිලිව ඇතුලත් කිරීමට කටයුතු යොදා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කර තිබුණද එම දර්ශකයන්ට අදාලව ප්‍රගතියක් නිශ්චිතව සඳහන් කර නොතිබුණි. | | | |
| 20. | පසුගිය වසර 3ක කාලයක් පුරා ද්විතීයික මට්ටමේ තනතුරක් වන සංවර්ධන නිලධාරී තනතුර සඳහා පුරප්පාඩු පැවතියද 2018 දී නිලධාරීන් 158 ක් ද 2019 දී නිලධාරීන් 87 ක් ද සහ 2020 දී නිපධාරීන් 79 ක් වශයෙන් අමාත්‍යාංශයේ කාර්යභාරයට සෘජු සම්බන්ධතාවයක් නොමැති මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශිය කාර්යාලයන්හි රාජකාරි සඳහා අමාත්‍යාංශයට බඳවා ගන්නා ලද සංවර්ධන නිලධාරීන් නිදහස් කර තිබුණි. | අමාත්‍යාංශයේ සැබෑ සේවක අවශ්‍යතාවය නිරූපණය වන පරිදි අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කරගැනීම හා ඊට අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. | රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත 2013 වර්ෂයේදී සංවර්ධන නිලධාරීන් 365 දෙනකු මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇති අතර ඒ සඳහා කාර්ය මණ්ඩල අනුමැතියද ලැබී ඇත.මෙම නිලධාරීන් සියළුදෙනා අමාත්‍යාංශය තුල රඳවා ගැනීමට නොහැකි බැවින් ඔවුන්ගේ පදිංචි ස්ථාන ආශ්‍රිත මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වෙත අනුයුක්ත කර ඇති බව එසේ මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වෙත අනුයුක්ත කර ඇති සංවර්ධන | මේ වන විට මාර්ග සංවර්ධන අධිකාරී ප්‍රාදේශීය කාර්යාල වෙත ඉතිරිව ඇති සංවර්ධන නිලධාරීන් ගණන 77 දෙනකු පමණි. තවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් වරින් වර සිදුකරන ලද ඉල්ලීම් මත, මේ වන විට එම සංඛ්‍යාව 210 දක්වා අඩු කර ගැනීමට හැකිවී ඇත. |

නිලධාරීන් හට වෙනත් රජයේ කාර්යාල වෙත අනුයුක්ත වීම සඳහා අනුප්‍රාප්තිකයකු රහිතව අමාත්‍යාංශයේ සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කර ඇති බව, අමාත්‍යාංශය වෙත අනුමත සංවර්ධන නිලධාරී තනතුරු සංඛ්‍යාව අඩුකර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව සහ

එම ඉල්ලීම් මත, මේ වන විට එම සංවර්ධන නිලධාරී අනුමත තනතුරු සංඛ්‍යාව 210 දක්වා අඩු කර ගැනීමට හැකිවී ඇති බව.

## 21. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | | 2018<br>රු. මිලියන | 2019<br>රු. මිලියන | 2020<br>රු. මිලියන | එකතුව<br>රු. මිලියන |
|---|---|---|---|---|---|
| ---------- | | -------- | ------------ | ----------- | --------- |
| ශුද්ධ ප්‍රතිපාදනය | පුනරාවර්තන | 2,118.11 | 469.00 | 196.38 | 2,783.49 |
| | මූලධන | 210,353.18 | 256,115.00 | 254,826.85 | 721,295.03 |
| | එකතුව | 212,471.29 | 256,584.00 | 255,023.23 | 724,078.52 |
| තත්‍ය වියදම් | පුනරාවර්තන | 1,735.24 | 411.27 | 195.89 | 2,342.40 |
| | මූලධන | 176,785.92 | 156,432.33 | 226,070.21 | 559,288.46 |
| | එකතුව | 178,521.16 | 156,843.60 | 226,266.10 | 561,630.86 |
| වසර අග ඉතිරි වීම් | පුනරාවර්තන | 382.87 | 57.73 | 0.49 | 441.09 |
| | මූලධන | 33,567.26 | 99,682.67 | 28,756.64 | 162,006.57 |
| | එකතුව | 33,950.13 | 99,740.40 | 28,757.13 | 162,447.66 |

## 11. කෘෂිකර්ම අමාත්‍යාංශය

ශීර්ෂය - 118

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - 2018 තත්ත්වාගණනය කළ මතය
- 2019 තත්ත්වාගණනය කළ මතය
- 2020 තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| **01.** | ආනයනය කරනු ලබන පොහොර වල තත්ත්ව සහතික කිරීමේ පරීක්ෂාවන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විද්‍යාගාරයෙන් හෝ කාර්මික තාක්ෂණ ආයතනයේ විද්‍යාගාරයෙන් පමණක් ලබා ගත යුතු වුවත් නියැදි සාම්පල් පුද්ගලික විද්‍යාගාර 04 කින් සිදු කර ගෙන තිබුණි. | අනුමත කර ඇති ආයතන වලින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පුද්ගලික විද්‍යාගාර 4කින් නියැදි පරීකෂා කිරීම තවදුරටත් සිදු කරණු ලබයි. |
| **02.** | කැබිනට් පත්‍රිකාව පරිදි අනෙකුත් භෝග වගාවන් සඳහා පොහොර ආනයනය සඳහා එක් එක් සමාගම වෙත පොහොර සහනාධාර සලාක ලබා දීම සඳහා කමිටුවක් පත්කළ යුතු බව දක්වා ඇතත් එවැනි කමිටුවක් පත්කර නොතිබුණි. | කැබිනට් පත්‍රිකාව ප්‍රකාරව කටයුතු කළ යුතුය. | -එම- | නිර්දේශ පරිදි කටයුතු කර නොතිබුණි. |
| **03.** | සහනාධාර මුදල් ගෙවීමේදී අමාත්‍යාංශය විසින් පරිගණක දත්ත පද්ධතිය ආරම්භ කර තිබුණු අතර එය වැඩිදියුණු කිරීමට රුපියල් 800,000 ක් වැය කර තිබුණ ද පොහොර සහනාධාරය ගෙවීමේදී | පවත්නා පද්ධතියට අනුකූලව සහ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | -එම- | පරිගණක දත්ත පද්ධතිය වැඩි දියුණු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අඩුපාඩු සිදුවී තිබුණි. එම පද්ධතියේ අඩුපාඩු සකස් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| **04.** | පොහොර ආනයනය කිරීමේදී රාජ්‍ය සහ පෞද්ගලික සමාගම් වෙත දෙනු ලබන සහනාධාර මුදල් ගෙවීම් කිරීමේදී විශාල මූල්‍ය වටිනාකමක් සහිත ගෙවීම් සිදු වන බැවින් එහි අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා විධිමත් පරිදි කාර්ය බෙදීමක් හා ගණකාධිකාරී තනතුර පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුව පැවතුණි. | පවත්නා පද්ධතිය වැඩි දියුණු කළ යුතුය. | -එම- | ගණකාධිකාරි තනතුර මේ වනතෙක් පුරවා නොමැත. |
| **05.** | වාරිමාර්ග කළමනාකරණ අංශයට අයත් නේවාසික කාර්යාල 25 ක, නිල නිවාස 10 ක සහ සංචාරක බංගලාවක වටිනාකම තක්සේරු කර නොතිබුණු අතර එම වටිනාකම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. | වාරිමාර්ග කළමනාකරණ අංශයේ මෙම නේවාසික කාර්යාල, නිල නිවාස 10 සහ සංචාරක බංගලාව තක්සේරු කිරීමට උපදෙස් ලබා දී තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. |
| **06.** | ධීවර හා ජලජ සම්පත් අංශයේ මූල්‍ය ප්‍රකාශනවල රු.21,959,713 ක් වටිනා කාර්යාල ගොඩනැඟිලි 2019 වර්ෂය තුළ හුවමාරු වූ (TRANSFER) අයිතම වශයෙන් අපහරණයන් යටතේ දක්වා තිබුණද අපහරණය කර තිබුණු ගොඩනැඟිලි පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අපහරණය කර තිබුණු ගොඩනැඟිලි පිළිබඳ එක් එක් අයිතමයේ වටිනාකම සහිත ලේඛනයක් ඉදිරිපත් කළ යුතුය. | ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග විගණනය වෙත දන්වා නොමැත. | 2020 අගෝස්තු 09 දින ධීවර අංශය ශීර්ෂ 151ට මාරු වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| **07.** | ධීවර හා ජලජ සම්පත් අංශය විසින් 2019 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරි සැලැස්ම යටතේ සංවර්ධන ව්‍යාපෘති 5 ක් වෙනුවෙන් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත රු.මිලියන 295 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම ප්‍රතිපාදනවලින් ඒ ඒ වැය විෂයය සඳහා වැය කර තිබුණු රු.මිලියන 277 කට අදාළව අධිකාරිය විසින් ඉදිරිපත් කර තිබුණු මාසික සාරාංශ පදනම් කරගෙන අමාත්‍යාංශය විසින් ගිණුම්ගත කිරීම පමණක් සිදුකර තිබුණද ලිපිගොනු නඩත්තු කර නොතිබුණු හෙයින් ව්‍යාපෘතිවල ප්‍රගතිය සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට නොහැකි විය. එසේම ධීවර හා ජලජ සම්පත් අංශය විසින් අධිකාරිය හරහා ක්‍රියාත්මක කරනු ලබන මෙම සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් අධීක්ෂණයක් හෝ පසුවිපරම් කිරීමක් හෝ සිදුකර නොතිබුණි. | සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන්කළ ප්‍රතිපාදනවල උපයෝජනය සම්බන්ධයෙන් ධීවර හා ජලජ සම්පත් අංශය විසින් අධීක්ෂණයක් හා පසුවිපරම් කිරීමක් සිදුකළ යුතු අතර අදාල තොරතුරු ද පවත්වා ගත යුතුය. | -එම- | -එම- |
| **08.** | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/ මු. රෙ. 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි වාරිමාර්ග අංශයේ ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. | -එම- | 2020 අගෝස්තු 09 දින ශීර්ෂ 198 ට මාරු වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| **09.** | වාරිමාර්ග අංශය විසින් මු. රෙ. 891(i) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. | මු.රෙ.891(i)සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු සියලු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | -එම- | -එම- |
| **10.** | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 වගන්තිය ප්‍රකාරව ස්ථාන මාරු වී පැමිණි හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ මාස 03 ක් ඇතුළත පවරා ගැනීම හෝ නිරවුල් කිරීම හෝ කළයුතු අතර එම කාලයෙන් පසු එම ශේෂ ගිණුම්ගත නොකළ යුතු බවද දන්වා තිබුණි. එහෙත් අමාත්‍යාංශයේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අංශයේ සිට වෙනත් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු හා පළාත් සභා වෙත ස්ථාන මාරු වී ගොස් ඇති නිලධාරීන් 14 දෙනෙකුගේ වර්ෂ 05 කට වැඩි කාලයක් ගත වී තිබූ රු.153,526 ක් වූ අය විය යුතු ණය ශේෂ 2019 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | -එම- | 2020 අගෝස්තු 09 දින ධීවර අංශය ශීර්ෂ 151 ට මාරු වී ඇත. |
| **11.** | මු.රෙ. 371 (5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්යය නිමකර අතුරු අග්‍රිම නිරවුල් කළයුතු වුවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ | මු.රෙ. 371 (5) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2021 වර්ෂයේ අතුරු අග්‍රිම පරීකෂාවේදී ද මෙම තත්වය නිරීක්ෂණය විය. |

| | | | | |
|---|---|---|---|---|
| | නිලධාරීන් 50 දෙනෙකු විසින් අවස්ථා 105 කදී ලබාගෙන තිබුණු රු.2,212,254 අතුරු අග්‍රිම පියවීමට දින 01 සිට දින 80 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. | | | |
| **12.** | කෘෂිකර්ම අමාත්‍යාංශයේ අංක අංක 118-1-10-1-1409 දරන වැය විෂය යටතේ වී මිලදී ගැනීම සඳහා ග්‍රාමීය සංවර්ධන අංශය වෙත රු.3,118,000,000ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණු අතර ඉන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 20 ක් සඳහා රු.1,959,912,319 ක් වී මිලදී ගැනීම සඳහා වැයකර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල 08 ක් මඟින් එයට අදාළව අංක 118-2003-07-00 දරන ආදායම් සංකේතය යටතේ මහාභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණේ රු. 299,814,540 ක් පමණි. මෙ අනුව වී විකිණීමෙන් රජයට ලැබිය යුතු සැලකිය යුතු හිඟ ආදායමක් ගණනය කර ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | සමාලෝචිත වර්ෂයට අදාළ හිඟ ආදායම් ගණනය කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ස.තො.ස ආයතනයෙන් හිග ආදායම් අය කර ගෙන ආදායමට බැර කරන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කර තිබුණි. | අයවිය යුතු රු.97,551,892 ක් ස.තො.ස ආයතනයෙන් අයකර ආදායමට බැර කර ගත යුතුව ඇත. |
| **13.** | වාරිමාර්ග අංශයේ වර්ෂ 2 කට වඩා පැරණි කොන්ත්‍රාත් රැඳවුම් මුදල් රු.1,779,234 ක තැන්පත් ගිණුමෙහි පවතින නමුත් මු.රෙ. | මු.රෙ. 570 අනුව කටයුතු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ශේෂ එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | 570 ප්‍රකාරව ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| **14.** | අමාත්‍යාංශයේ ග්‍රාමීය සංවර්ධන අංශය විසින් ඇමරිකන් ඩොලර් 73,954,055 ක ණය මුදලකට ඕස්ට්‍රේලියාවේ පෞද්ගලික බැංකු 2ක් සමඟ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ගිවිසුම්ගතව කිරි ගවයින් 20,000 ක් ආනයනයට ඕස්ට්‍රේලියාවේ වෙලාඩ් රූරල් එක්ස්පොර්ට් (WELLAED RURAL EXPORT) ආයතනය සමඟ ගිවිසුමක් ඇති කර ගෙන තිබුණි. එම ගිවිසුම අනුව ව්‍යාපෘතිය අදියර දෙකකින් ක්‍රියාත්මක කිරීමටත්, ඉන් පළමු අදියර යටතේ සතුන් 5,000 ක් ආනයනය කර එම සතුන් සාර්ථක නම්, පමණක් දෙවන අදියර යටතේ අත්තිකාරම් ලබාදී සතුන් 15,000 ක් ආනයනය 2020 වර්ෂය අවසන් වන විට නිම කිරීමටත් එකඟවී තිබුණි. නමුත් අමාත්‍යාංශය වෙත 2018 පෙබරවාරි 27 හා 2018 මැයි 04 දින ඉදිරිපත් කළ විගණන වාර්තා මඟින් හා ප්‍රසිද්ධ ජනමාධ්‍ය විසින් පෙර ගෙනා සතුන් අසාර්ථක බව පෙන්වා දී තිබුණි. තවද, 2018 වර්ෂය තුළ අමාත්‍යාංශය යටතේ මෙම ව්‍යාපෘතියට වැය දැරීමට විසර්ජන පනතින් ප්‍රතිපාදනද නොතිබියදී ඉතිරි සතුන් 15,000 | ගෙවන ලද මුදලට අදාළ සතුන් කඩිනමින් ලබාගෙන ව්‍යාපෘතිය සාර්ථකව නිම කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සතුන් ආනයනය සිදු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ආනයනය සඳහා ඇමරිකන් ඩොලර් 55,465,541 ක මුළු මුදලින් සියයට 20 ක අත්තිකාරම් ලෙස 2018 මැයි 08 දින ඇමරිකන් ඩොලර් 11,093,108 ක් එනම් රු1,749,672,697 ක් ගෙවා තිබුණි. නමුත් ඉහත යෝජිත කිසිම සතෙකු 2018 සිට 2020 අගෝස්තු දක්වාම ආනයනය කර නොතිබුණි. | | | |
| **15.** | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව වෙරළ පුනරුත්ථාපනය සහ සම්පත් කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ධීවර සමාජ සංවර්ධන අංශය වෙත වෙන්කර තිබුණු රු.මිලියන 70 ක ප්‍රතිපාදනය, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත මත්ස්‍ය රැකුම් හල් (HATCHERY) ඉදිකිරීම සඳහා පවරා දී තිබුණු අතර එයින් රු.57,288,684 ක් වැය කර තිබුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂා කළ නිමැවුම් ලෙස නව තාක්ෂණය හඳුන්වාදීමට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, කිවුල්දිය හා වෙරළ ජලජීවීන් සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසුගිය වර්ෂය හා සැසඳීමේ දී මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කරගැනීමට | අපේක්ෂිත නිමැවුම් ලබාගැනීම සඳහා අදාළ කාර්යයන් කරවීමට අරමුදල් යෙදවිය යුතුය. | ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග විගණනය වෙත දන්වා නොමැත. | 2020 අගෝස්තු 09 දින ධීවර අංශය ශීර්ෂ 151ට මාරු වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | අදාළ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යනාදි වශයෙන් හඳුනාගෙන තිබුණත් වර්ෂ ගණනාවක සිට අපේක්ෂිත නිමැවුම් ලබාගැනීමට අදාළ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් යොදවා ඇති බව නිරීක්ෂණය නොවුණු අතර එම මුදල් වෙනත් කාර්යයන්වලට යෙදවීම අඛණ්ඩව සිදුවී තිබුණි. | | | |
| **16.** | වාර්ෂික ඇස්තමේන්තු මගින් රු.මිලියන 100 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු හම්බන්තොට, යාපනය සහ මඩකලපුව ඇතුළත් මුහුදුබඩ දිස්ත්‍රික්ක 10 ක ගම්මාන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. එම ප්‍රතිපාදනය උපයෝගී කරගෙන දෙපාර්තමේන්තුව හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ඉකුත් වර්ෂයක දී ආරම්භ කළ දියවර පියස ධීවර නිවාස හා සනීපාරක්ෂක පහසුකම් ලබාදීමේ ආධාර වැඩසටහන ක්‍රියාත්මක කර ඒ වෙනුවෙන් රු.මිලියන 46 ක් වැයකර තිබුණි. | ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහාම යොදාගත යුතුය. | -එම- | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| **17.** | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අංශයේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමට මිරිදිය ජලාශ සඳහා මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීමේ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත රු.මිලියන 30 බැගින් අරමුදල් සැපයීම 2008 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණි. තවද, 2019 වර්ෂය දක්වා අඛණ්ඩව ඒ වෙනුවෙන් මුදල් වෙන්කර වියදම් දරා තිබුණි. 2008 ජූලි මස 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් මෙම ව්‍යාපෘතියට රු.මිලියන 30 බැගින් වාර්ෂික ඇස්තමේන්තුවට ඇතුළත් කිරීමට අනුමැතිය ලබාදී තිබුණ ද අංක 08/1248/351/016 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට ශ්‍රී ලංකා මහා බැංකුව සිදුකර තිබූ අදහස් දැක්වීම අනුව වසර 5 කදී ධීවර කර්මාන්තයේ යෙදෙන්නන්ගේ ආදායම වැඩිවීම හේතුවෙන් ස්වයං මූල්‍යකරණයකට යොමු වීම අවශ්‍ය බව දක්වා තිබුණි. එහෙත් අමාත්‍යාංශය විසින් මෙම වැය විෂයය සඳහා වර්ෂ 05 ක් ඉක්මවා තවත් වර්ෂ 07 ක් අඛණ්ඩව රු.මිලියන 30 බැගින් අධිකාරිය වෙත අරමුදල් වෙන්කර දී තිබුණි. එහෙත් ධීවර කර්මාන්තයේ යෙදෙන්නන්ගේ ආදායම | මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීමේ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත වාර්ෂිකව ප්‍රතිපාදන ලබාදීම නවතා ස්වයං මූල්‍යකරණයකට යොමු කළ යුතුය. | -එම- | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | වැඩිවීම සලකා ස්වයං මූල්‍යාකරණයකට යොමු කිරීමක් පිළිබඳව පසුවිපරම් කිරීමක් හෝ අධිකාරියේ ක්‍රියාකාරකම් පිළිබඳ අධීක්ෂණයක් හෝ කළ බවට තොරතුරු නොතිබුණි. | | | |
| **18** | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අංශයේ 2019 වර්ෂය සඳහා ධීවර වරායන් හා නැංගුරම් පොළවල් ඉදිකිරීම ඇතුළු ක්‍රියාකාරකම් 20 ක් සඳහා රු.මිලියන 1587 ක මුදලක් වෙන්කර තිබුණු අතර වර්ෂය තුළ ධීවර වරායන් 05 ක් ඉදිකිරීම ඇතුළුව ක්‍රියාකාරකම් 11 ක් සඳහා රු.මිලියන 1067 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ. | | | |
| **(අ)** | කළමැටිය ධීවර වරාය ඉදිකිරීම 2014 වර්ෂයේආරම්භකර 2017 වර්ෂයේ දී අවසන් කළ යුතුව තිබුණ ද 2019 වර්ෂයේදීද රු.මිලියන 105 ක් මේ සඳහා වැයකර තිබියදීත් මෙහි ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබුණි. | අපේක්ෂිත කාලපරිච්ඡේදය තුළ කාර්යයන් අවසන් කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග විගණනය වෙත දන්වා නොමැත. | 2020 අගෝස්තු 09 දින ධීවර අංශය ශීර්ෂ 151 ට මාරු වී ඇත. |
| **(ආ)** | 2017 වර්ෂයේ අවසන් කළ යුතුව තිබුණු හලාවත හරිත ධීවර වරාය ඉදිකිරීම වෙනුවෙන් 2019 වර්ෂයේ දී ද රු.මිලියන 28 ක් වැය කර තිබුණි. එහෙත් වර්ෂ 2 කට වඩා කාලයක් ප්‍රමාද වී ඇතත් ව්‍යාපෘතිය නිම කිරීමට අපොහොසත්ව තිබුණි. | අවසන් කළ යුතුව පවතින ඉදිකිරීම් කටයුතු නිමකරවාගෙන භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | -එම- | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | රු.මිලියන 350 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ 2018 ජුනි අවසන් කළ යුතුව තිබුණු මිරිස්ස හරිත ධීවර වරාය ඉදිකිරීමේ ඉතිරි වැඩ වෙනුවෙන් 2019 වර්ෂය සඳහා රු.මිලියන 18 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද ඒ සඳහා කිසිදු මුදලක් වැය කර නොතිබුණි. | ඉදිකිරීම් නිමකරවාගෙන භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | -එම- | -එම- |
| (ඈ) | මුළු ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 392 ක් වූ මයිලිඩ්ඩි වරාය, ධීවර වරායක් බවට පත්කිරිම හා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය 2019 මැයි වන විට අවසන් කළ යුතුව තිබුණි. 2019 වර්ෂයේ ඒ වෙනුවෙන් රු.මිලියන 88 ක් වැය කර තිබුණ ද දියකඩනය ඉදිකිරීම සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් එහි ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි. | -එම- | -එම- | -එම- |
| (ඉ) | 2018 ජුනි හා 2017 ජුලි අවසන් කළ යුතු ව්‍යාපෘති වූ පැරළිය නැංගුරම්පළ ඉදිකිරීම හා ගාල්ල ජැටිය ධීවර වරාය ඉදිකිරීම වෙනුවෙන් 2019 වර්ෂයේ දී පිළිවෙලින් රු.මිලියන 17 ක් හා රු.මිලියන 22 ක් වැය කර තිබුණ ද එම ඉදිකිරීම් අවසන් කර භාරදීම සිදුකර නොතිබුණි. | -එම- | -එම- | -එම- |
| (ඊ) | 2018 ජනවාරි අවසන් කළ යුතුව තිබුණු කරෙයිනගර් යාත්‍රාංගනය ඉදිකිරීම I, II, III අදියරයන් සඳහා 2019 වර්ෂයට | තවදුරටත් ප්‍රමාදයකින් තොරව නිමකරවාගෙන | -එම- | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | රු.මිලියන 39 ක් වෙන්කර ඉන් රු.මිලියන 13 ක් පමණක් වැය කර තිබුණ ද අතර වැඩ අවසන් කර නොතිබුණි. | භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | | |
| (උ) | 2019 මාර්තු සිට 2019 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ මීගමු කලපු සංවර්ධන ව්‍යාපෘතියේ III වන අදියර අවසන් කළ යුතු වුවත් 2019 වර්ෂයේ දී රු.මිලියන 63 ක් වැය කර තිබුණ ද 2019 දෙසැම්බර් 31 දිනට එහි ප්‍රගතිය සියයට 38 ක් පමණ විය. | නියමිත කාලපරිච්ඡේදය අවසානයේදී ව්‍යාපෘති කාර්යයන් නිම කළ යුතුය. | -එම- | -එම- |
| **19.** | කෘෂිකර්ම අමාත්‍යාංශයට ගොඩනැගිල්ලක් කුලියට ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් ඉදිරිපත් කරනු ලැබේ. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට හා චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව රජයට උපරිම වාසි ලැබෙන අයුරින් කටයුතු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කෘෂිකර්ම අමාත්‍යාංශය 2020 ජනවාරි 31 දින සිට පෞද්ගලික ගොඩනැගිල්ලෙන් ඉවත්කර බත්තරමුල්ලේ පිහිටි “ගොවිජන මන්දිරය“ තුළ නැවත ස්ථාපිත කරන ලදී. |
| (අ) | පාර්ලිමේන්තු කාරකසභා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම හා අතිරේක කාර්යාල ඉඩකඩ අවශ්‍යතාවය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය ස්ථාපිත කර ඇති “ගොවිජන මන්දිරය” යොදා ගැනීමට තීරණය කර තිබුණි. එම නිසා කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා රාජගිරියේ මහල් 09 කින් යුතු පෞද්ගලික සමාගමකට අයත් ගොඩනැඟිල්ලක් 2016 අප්‍රේල් 08 දින සිට මසකට රු.මිලියන 21 ක බදු කුලියක් හා රු.මිලියන 6 ක සේවා ගාස්තු ගෙවීමේ පදනම මත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | | | |

| | | | | |
|---|---|---|---|---|
| | සංග්‍රහයේ 3.2.1 සහ 3.2.2 වගන්තිවලට අනුකූලව කටයුතු කිරීමකින් තොරව ලබාගෙන තිබුණි. | | | |
| (ආ) | සමස්ථ කාර්ය මණ්ඩලය 300 ක් පමණ වූ කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා ගොඩනැඟිලි අවශ්‍යතාවය වර්ග අඩි 66,500 ක් වුවද බදු පදනම මත ලබාගෙන තිබූ මහල් 09 කින් යුතු ගොඩනැඟිල්ලේ වර්ග ප්‍රමාණය වර්ග අඩි 103,000 ක් විය. තවද මු.රෙ.835(2) (ඉ) ප්‍රකාර බදු කාලසීමාව උපරිමය වර්ෂ 03 ක් විය යුතු වුවද බදුකරුගේ ඉල්ලීම මත එය අවුරුදු 05 ක් ලෙස දක්වා තිබීම හා වසර 03 කින් පසු බදු කුලිය සියයට 15 කින් වැඩි කිරීමට හා වසර 02 ක බදු කුලිය වූ රු.මිලියන 504 ක මුදල එකවර ගෙවීමේ කොන්දේසි පිළිගෙන තිබුණි. | පවත්නා නීති රීති හා මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කළ යුතුය. | -එම- | -එම- |
| (ඇ) | රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවට අනුව ගොඩනැඟිල්ලේ වෙළඳපළ කුලිය මාසිකව රු.මිලියන 13.5 ක් වුවද එය ඉක්මවා රු.මිලියන 21 ක කුලියක් ගෙවීමට එකඟ වී තිබුණි. ඒ අනුව 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන1,229.58 ක බදු මුදල් (VAT හා NBT ඇතුළුව), සේවා ගාස්තු රු.මිලියන 229.20 ක්, විදුලි | -එම- | -එම- | -එම- |

බිල්පත් සඳහා රු.මිලියන 63.64 ක් සහ ජල බිල්පත් සඳහා රු.මිලියන 2.017 ක් ලෙස එකතුව රු.මිලියන1,524.44 ක මුදලක් වැයකර තිබුණි. ඊට අමතරව මෙම ගොඩනැඟිල්ල කාර්යාල සංකීර්ණයක් ලෙස භාවිතා කිරීමට අවශ්‍ය කාමර බෙදා වෙන් කිරීම, බුමුතුරුණු ඇතිරීම්, තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම කාර්යාල ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු.මිලියන 342.7 ක්ද වැය කර තිබුණි. මෙසේ ගෙවීම් කර තිබුණද ගිවිසුම් ගත දිනයේ සිට මුල් මාස 15 තුළ අවශ්‍ය කාර්යාලීය පහසුකම් (කාමර බෙදා වෙන් කිරීම, බුමුතුරුණු ඇතිරීම්, තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම ) නොමැති වීම මත ගොඩනැඟිල්ල කාර්යාලීය කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. එහෙත් කාරක සභා ක්‍රමය ස්ථාපිත කිරීමේ කාර්යය සඳහා පූර්ණ වශයෙන් යොදාගෙන නොමැති බැවින් අමාත්‍ය මණ්ඩල තීරණයක් මත 2020 ජනවාරි මස 31 දින සිට නැවතත් අමාත්‍යාංශය පැරණි කාර්යාල සංකීර්ණය වූ “ගොවිජන මන්දිරය” වෙත රැගෙන ගොස් තිබුණි. එහෙත් 2020 ජනවාරි මස සිට 2020 අගෝස්තු මස දක්වා ගිවිසුම

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාරව රු.මිලියන 28.05 ක මුදලක් බදු කුලී හා සේවා ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. එමෙන්ම 2021 අප්‍රේල් 01 දින දක්වාම ගිවිසුම ප්‍රකාරව බදු කුලී හා සේවා ගාස්තු ගෙවීමට අමාත්‍යාංශය බැඳී පවතී. | | | |
| **20** | ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් ජාතික පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ගුණාත්මක පොහොර ආනයනය කිරීම පිළිබඳ සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | | |
| **(අ)** | ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් වී සඳහා පොහොර අවශ්‍යතාවය තීරණය කිරීමේදී කන්නයේ ඉතිරි පොහොර තොග, යාවත්කාලීන පොහොර නිර්දේශ හා යාවත්කාලීන තොරතුරු පද්ධතියක් පවත්වාගෙනයාමක් සිදුකර නොතිබුණි. | එක් එක් කන්න වල වගා කරනු ලබන කුඹුරු ඉඩම් අනුව පොහොර අවශ්‍යතාවයන් තීරණය කිරීම සඳහා යාවත්කාලීන තොරතුරු පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි. |
| **(ආ)** | තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව රසායනික පොහොර ආනයනය කිරීම සඳහා සමාගම් තෝරාගෙන තිබුණි. | තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. | -එම- | නිවැරදි කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ආනයනික රසායනික පොහොරවල ගුණාත්මක බව පරීක්ෂා කිරීම සඳහා නියැදි ලබාගැනීම වරාය තුළදී සිදු කළයුතු වුවද පොහොර ආනයනය කරනු ලබන සමාගම් සතු විවෘත ගබඩා වලින් නියැදි ලබා ගැනීම සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය. | අභ්‍යන්තර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | -එම- | ආනයනකරුවන්ගේ ගබඩා වලින්ම නියැදි ලබා ගැනීම තවදුරටත් සිදු කරයි. |
| (ඇ) | ආනයනික රසායනික පොහොර පරීක්ෂා කිරීම සඳහා රසායනාගාර තෝරා ගැනීම, රසායනාගාර වෙත සාම්පල් යැවීම, රසායනාගාර වාර්තා භාරගැනීම, පරීක්ෂා කිරීම හා වෙළඳ අනුමැතිය ලබාදීමේ ක්‍රමවේදය පිළිබඳව පොහොර ලේකම් කාර්යාලයේ විධිමත් හා ප්‍රමාණවත් නියාමනයක් හා සුපරීක්ෂණයක් සිදු නොවීම. | පොහොර ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. | -එම- | විගණනය සිදු කළ අවස්ථාවේදී වූ පරිදිම ක්‍රියාවලිය සිදු කරණු ලබයි. |
| (ඉ) | ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් 2018 සහ 2019 වර්ෂයේ ආනයනික රසායනික පොහොර වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා ලබාගනු ලබන නියැදි වලට අදාළ රසායනාගාර වාර්තා වලට අදාළව සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී ව්‍යාජ ලෙස සකස් කරන ලද රසායනාගාර වාර්තා 55 කට ආසන්න ප්‍රමාණයක් නිරීක්ෂණය විය. ඒ අනුව පොහොර වර්ග 9 කට අදාළ මෙ.ටො.81,655 ක | ව්‍යාජ රසායනාගාර වාර්තා පිලියෙල කර ඇති නම් අදාල නිලධාරීන් සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් පවත්වා නීත්‍යානුකූලව කටයුතු කළ යුතු වීම. | ජාතික පොහොර ලේකම් කාර්යාලයේ නිලධාරීන් තිදෙනෙකුගේ සේවය අත්හිටු වීම. | අමාත්‍යාංශ මට්ටමින් හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයන් සිදු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ගුණාත්මකභාවයෙන් අඩු ප්‍රමිතියෙන් තොර පොහොර වෙළඳපලට නිකුත්කර තිබූ බව විගණනයට නිරීක්ෂණය විය. | | | |
| **21** | 2019 දෙසැම්බර් 31 දිනට වැය විෂය අංක 118-2-3-20-2509 යටතේ රු.83,973,934 ක වියදමින් කෘෂි ගම්මාන ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහන නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. මේ සඳහා කහත්තෙවෙල ගම්මානය තෝරාගෙන තිබුණි. එම ව්‍යාපෘතිය පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | | |
| **(අ)** | 2015 මැයි 20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2015 හි 06 ඡේදය ප්‍රකාරව මහජන මුදල් වැයකර රාජකාරී උත්සව පැවැත්වීම සීමා කළයුතු බවත් වියදම අවම වන සේ සංවිධානය කළයුතු බවත් සඳහන් කර තිබුනද රු.1,486,083 ක් වැයකර වැඩසටහන හඳුන්වාදීමේ උත්සවයක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | උත්සවය සඳහා වූ වියදම අවම වන පරිදි කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ගොවි සංවිධාන කිහිපයක එකමුතුවකින් ඉතා සංවිධානාත්මක කෘෂි සමාගමක් බිහිකරගත හැකි වුවද කහත්තෙවෙල ලිමිටඩ් නමින් අමාත්‍යාංශයේ සෘජු මැදිහත් වීමකින් හා අධීක්ෂණයකින් තොරව ජනතා සමාගමක් පිහිටුවා තිබුණි. එම සමාගම පිහිටුවීමේ අරමුණින් කිහිපදෙනෙකුගේ එකතුවෙන් 2018 වර්ෂයේදී ගොවි සංවිධානයක් පිහිටුවාගෙන තිබුණද එම ගොවි සංවිධානය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. | ප්‍රදේශයේ ගොවි සංවිධාන වල එකමුතුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | -එම- | ගොවිජන සංවිධානය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොමැත. |
| (ඇ) | සියලුම ප්‍රතිලාභ එම සමාගමට ලැබෙන සේ කටයුතු සලසා තිබුණි. සමාගමේ කාර්යාලීය ලී බඩු සහ යන්ත්‍රෝපකරණ සඳහා රු.1,406,217 ක් සහ ගොවීන් සඳහා රු.45,914,600 ක් වැයකර ආරක්ෂිත ගෘහ ලබා දී තිබු අතර එම ආරක්ෂිත ගෘහ වටිනාකමින් සියයට 50 ක් ප්‍රතිලාභීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙම වැඩසටහන යටතේ අදාළ ප්‍රතිලාභ ගොවීන් වෙත ලැබෙන සේ කටයුතු කළ යුතුය. | ප්‍රතිලාභීගෙන් සියයට 50 දායකත්වය අයකර ගැනීමට උපදෙස් ලබා දීම. | මුදල් අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| **(ඇ)** | එමෙන්ම රු.770,000 ක වටිනාකමැති විද්‍යුත් පරිපථ 35 ක් ජනතා සමාගම වෙත ලබාදී තිබූ අතර එකක් මසකට රු.1,000 ක මුදලකට ගොවීන්ට කුලී පදනම මත ලබාදී සමාගමට ආදායමක් ලබාගත යුතු වුවද එම ආදායම රැස්කර නොතිබුණි. යන්ත්‍රසූත්‍ර ගබඩා කිරීමට හා එළවළු සහ පළතුරු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් සහිතව ආදර්ශ ගොවිපලක් ලෙස වැඩි දියුණු කළ සංඝරාජ පිරිවෙන් පරිශ්‍රය මසකට රු.1,000 ක් වැනි අඩු කුලියකට ජනතා ගොවි සමාගම වෙත බදු පදනම මත ලබාදීමට කටයුතු කර තිබුණි. | අදාළ ආදායම් ලබාගැනීමට කටයුතු කළ යුතුය. | විද්‍යුත් පරිපථ ගොවීන්ට රු.1000ක කුලී පදනම මත ලබා දී සමාගමට ආදායම ලබා ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දීම. | ආදායම් ලබාගෙන නොතිබුණි. |
| **(ඉ)** | එසේම රු.මිලියන 10 කට ආසන්න වටිනාකමැති ආරක්ෂිත ගෘහ, පළතුරු පැළ, කෘෂි උපකරණ හා මී මැසි පාලනය සහ උපකරණ ඉහත ජනතා ගොවි සමාගමේ කොටස්කරුවන් වෙත නොමිලේ කිසිදු පදනමකින් තොරව ලබාදී තිබුණි. | සියලුම ගොවි ජනතාවට අදාළ ප්‍රතිලාභ ලැබෙන සේ කටයුතු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිවැරදි කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| **22.** | 2020 වර්ෂය සඳහා ආදායම් සංකේතය 2003.07.00 දරන රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ රැස්කරගැනීමට ඇස්තමේන්තුකර තිබුණු ආදායම රු.1,500,000,000 ක් වුවත් රැස්කළ ආදායම රු.1,235,912,505 ක් වීම හේතුවෙන් ඇස්තමේන්තු ගත ආදායමෙන් රැස්කර ගැනීමට නොහැකි වූ ආදායම රු.264,087,495 ක් හෙවත් ඇස්තමේන්තුවෙන් සියයට 18ක් විය. | සමාලෝචිත වර්ෂයට අදාළ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ ආදායම් අයවිය යුතු සියලු දිස්ත්‍රික්ක දැනුවත් කිරීම. | 2021 වර්ෂයේදී හිඟ ආදායම ලෙස රු.මිලියන 347.3ක මුදලක් අයවී ඇති අතර තවදුරටත් අයවීමට ඇති හිඟ ආදායම රු.මිලියන 97.55කි. |
| **23.** | අමාත්‍යාංශය යටතේ ඇති කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන යන අංශ වල සේවය කර සේවය අතහැර ගිය නිලධාරීන් 29 දෙනෙකුගේ එකතුව රු.793,931 ක් වූ අය විය යුතු ණය ශේෂයන් වර්ෂ 05 ක කාලයක් ඉක්මවා ගොස් තිබුණද එම ණය ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.6 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම ශේෂයෙන් රු.85,704.20ක් කෘෂිකර්ම අංශයට අයත් වන අතර රු.44,596.20ක් කපා හැර ඇත. ඉතිරි රු.41,108ක ශේෂය අය කර ගෙන නොමැත. |
| **24.** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ.104(4) ප්‍රාරම්භක පරීක්ෂණය සිදු | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | -එම- | වරදවා දැක්වීම එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීමෙන් පසු අලාභ හානි සිදු වූ දිනයේ සිට තෙමසක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් ගිණුම් වර්ෂය තුළ පොත්වලින් ලියාහරින ලද එකතු වටිනාකම රු.6,302,461 ක් පමණ වන වාහන අනතුරු 09 ක් සම්බන්ධයෙන් පූර්ණ වාර්තාව අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කිරීමට මාස 06 සිට මාස 33 ක් දක්වා කාලයක් ගෙන තිබුණි. | | | |
| **25.** | අමාත්‍යාංශය විසින් 2016 අප්‍රේල් 08 දින බදු පදනම මත ලබාගත් රාජගිරියේ පිහිටි ගොඩනැගිල්ලේ බදු කාලය 2021 අප්‍රේල් 07 දක්වා තිබියදී කැබිනට් මණ්ඩල තීරණයයක් මත අමාත්‍යාංශය නැවතත් 2020 ජනවාරි 31 දින සිට ගොවිජන මන්දිරයේ ස්ථාපිත කරන ලදි. වර්ෂ 3 ක් අවසානයේ මාසික බදු කුලිය 15% කින් වැඩි කිරීමට එකඟ වී තිබුණි. ඒ අනුව 2020 ජනවාරි සිට 2021 මාර්තු 31 දක්වා වැඩි වූ බදු කුලී හා සේවා ගාස්තු ලෙස රු.44,239,137 ක් ගෙවා තිබුණි. | පවතින නීතිරීති හා මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. | -එම- | අනාර්ථික වැයක් දරා තිබුණි. |

26. **ප්‍රතිපාදන උපයෝජනය**

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
| --- | --- | --- | --- | --- |
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | | | | |
| පුනරාවර්තන | **33,062,352,700** | **46,506,185,000** | **4,112,900,000** | **83,681,437,700** |
| මූලධන | **8,557,073,940** | **37,143,522,370** | **6,552,400,000** | **52,252,996,310** |
| එකතුව | **41,619,426,640** | **83,649,707,370** | **10,665,300,000** | **135,934,434,010** |
| සත්‍ය වියදම් | | | | |
| පුනරාවර්තන | **31,320,680,110** | **44,702,495,808** | **4,041,684,028** | **80,064,859,946** |
| මූලධන | **4,228,943,699** | **20,244,012,451** | **6,066,542,302** | **30,539,498,452** |
| එකතුව | **35,549,623,809** | **64,946,508,259** | **10,108,226,330** | **110,604,358,398** |
| වසර අග ඉතිරි වීම් | | | | |
| පුනරාවර්න | **1,741,672,590** | **1,803,689,192** | **71,215,972** | **3,616,577,754** |
| මූලධන | **4,328,130,241** | **16,899,509,919** | **485,857,698** | **21,713,497,858** |
| එකතුව | **6,069,802,831** | **18,703,199,111** | **557,073,670** | **25,330,075,612** |

12. විදුලිබල අමාත්‍යාංශය

**ශීර්ෂය - 119**

මූලා‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය නොකළ මතය

2020 - තත්ත්වාගණනය නොකළ මතය

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය (2022 ජනවාරි 31 දිනට) |
|---|---|---|---|
| 01. 2008.02.06 දිනැති අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව මහජනයාට ලබාදෙන සේවාවන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ලබා දීමට අවශ්‍ය වන පසුබිම සැකසීමට අමාත්‍යාංශය සඳහා පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වේ. | එක් එක් අංශ වෙතින් තොරතුරු ලබා ගැනිමට කටයුතු කර ඇති බව. | අමාත්‍යාංශයේ පුරවැසි සේවා ප්‍රඥප්තිය කෙටුම්පත් කර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනිමට නියමිත බව. |
| 02. 2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයට සුවිශේෂී වූ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතු වුවත් චක්‍රලේඛය අනුව අන්තර්ගත විය යුතු කරුණු ඇතුළත් වන පරිදි සැලසුම සකස් කර නොතිබූ අතර අමාත්‍යාංශයේ සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව අන්තර්ගත විය යුතු කරුණු ඇතුළත් වන පරිදි මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතු අතර කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කලයුතු විම. | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් 2021.12.03 දින ''රාජ්‍ය අංශය තුළ මානව සම්පත සංවර්ධනය කිරිම'' වැඩමුළුව පවත්වන ලද අතර එහිදි එකී චක්‍රලේඛය සංශෝධනය කිරිමට බලාපොරොත්තු වන බැවින් ඒ සඳහා මානව | කෙටුම්පත් කරන ලද නව මාර්ගෝපදේශ සංග්‍රහය අනුව අමාත්‍යාංශය සඳහා මානව සම්පත් සැලැස්මක් සකස් කරමින් ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සම්පත් සැලැස්මක් සකස් කිරීම උදෙසා වන නව මාර්ගෝපදේශ සංග්‍රහයක් ඇතුළත් කෙටුම්පතක් පිළියෙල කර ඇති බව දැනුම් දී ඇත. | |
| 03. | මුදල් රෙගුලාසි 756 (6) ප්‍රකාරව සියලුම භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලවල වාර්තා විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවද, අමාත්‍යාංශයේ වාහන වලට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණකාධිපති වෙත යොමු කර නොතිබුණි. | අමාත්‍යාංශය සතු සියලු වත්කම් පිළිබද භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කළ යුතු විම. | - | 2021.12.31 දිනට වාහනවලට අදාල සමීක්ෂණ වාර්තා සිදු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කර ඇති අතර ඉදිරියටත් අදාල සමීක්ෂණ වාර්තා සිදු කිරීමට කටයුතු යොදා ඇත. |
| 04. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තු ගත කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්ද, සෑම ප්‍රසම්පාදනයක් ආරම්භයේ සිට අවසානය දක්වා වූ එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාල සටහනක්ද පිළියෙල කල යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. | මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කලයුතු වේ. | විදුලිබල අමාත්‍යාංශය සහ විදුලිබල අමාත්‍ය කාර්යාලය සඳහා අවශ්‍ය කරනු ලබන මිලදී ගැණුම් ඔවුන්ගේ අවශ්‍යතාවයන් සොයා බලා වර්ෂ 03 ක කාලය සඳහා අපේක්ෂිත ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම විධිමත්ව සකස් කළ අතර, ප්‍රසම්පාදන කාල සටහන ක්‍රමානුකූලව සකස් කර නොමැත. ඉදිරි වර්ෂයේ සිට නිසි ආකාරව ක්‍රමාණුකූල | 2021 වර්ෂයට අදාල වර්ෂ 03 ක කාලසීමාව සඳහා අපේක්ෂිත ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම විධිමත්ව සකස් කර තිබුණද, ප්‍රසම්පාදන කාල සටහන ක්‍රමානුකූලව සකස් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රසම්පාදන කාල සටහනක්ද සකස් කිරීමට කටයුතු කරනු ලබයි. | |
| 05. | 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති කාර්යාලීය රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛයේ 2.2 ඡේදය ප්‍රකාරව ගරු අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සඳහා රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනයක නිළධාරියෙකු අනුයුක්ත කරගන්නේ නම් ඔහුට ගෙවිය යුත්තේ ඔහු එම ආයතනයේ ලබමින් සිටින වැටුප නොව අනුයුක්ත කරන ලද තනතුරට අදාල වැටුප් වේ. නමුත් ඉහත චක්‍රලේඛයට පටහැනිව අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ රියදුරු මහතෙකුගේ සේවය ලබාගෙන ඔහු වෙනුවෙන් ඉහල වැටුපක් එනම් 2017 දෙසැම්බර් මාසය සඳහා රු.167,392 ක වැටුපක් සහ 2018 වර්ෂය සඳහා රු.1,834,801ක වැටුපක් අමාත්‍යාංශය විසින් ගෙවා එය ප්‍රතිපූර්ණය කර තිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | දැනට අමාත්‍ය ධූරයේ සිටින අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය වෙත වැටුප් ගෙවීමේ දිනැති අංක14/සීඒ 1/17/1 දරන රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව වැටුප් ගෙවනු ලබන බව. | වර්තමාන තත්ත්වය වාර්තා කර නොමැත. |
| 06. | අමාත්‍ය කාර්යය මණ්ඩලයෙහි අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන ආරක්ෂක නියාමක තනතුරු 2 ක් සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට අනුයුක්ත සේවකයන් | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | - | අමාත්‍යතුමාගේ මාධ්‍ය ඒකකයේ පවතින තනතුරක රාජකාරි අවරණය කිරීම සඳහා සේවා අවශ්‍යතාවය මත දත්ත සැකසුම් |

| | | |
|---|---|---|
| දෙදෙනෙකු 2020 සැප්තැම්බර් මස සිට සේවයේ යොදවා ගෙන තිබුණි. | ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ක්‍රියාකාරූ තනතුර දරන්නා අනුයුක්ත කර ගන්නා ලද අතර, ලංකා විදුලිබල මණ්ඩලයට අයත් කාර්යාල සේවකයින් දෙදෙනෙකු හා අමාත්‍යාංශයේ ආරක්ෂාව සම්බන්ධයෙන් ආරක්ෂක නිලධාරීන් 16 දෙනෙකු මෙම අමාත්‍යාංශය සඳහා අනුයුක්ත කර ගැනීමට කටයුතු කර ඇත. |

## 07. ප්‍රතිපාදන උපයෝජනය

| **විස්තරය** | **2018** | **2019** | **2020** | **එකතුව** |
|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය | | | | |
| පුනරාවර්තන | 507,890,000 | 775,015,000 | 217,235,000 | 1,500,140,000 |
| මූලධන | 667,431,000 | 727,400,000 | 58,060,950,000 | 59,455,781,100 |
| **එකතුව** | **1,175,321,000** | **1,502,415,000** | **58,278,185,000** | **60,955,921,000** |
| | ========= | ========= | ========== | ========== |
| සත්‍ය වියදම් | | | | |
| පුනරාවර්තන | 487,684,337 | 510,329,659 | 170,705,874 | 1,168,719,870 |
| මූලධන | 505,334,932 | 253,024,449 | 57,908,701,973 | 58,667,061,354 |
| **එකතුව** | **993,019,269** | **763,354,108** | **58,079,407,846** | **59,835,781,224** |
| | ======== | ======== | ========== | ========== |
| වසර අග ඉතිරි වීම් | | | | |
| පුනරාවර්තන | 20,205,663 | 264,685,341 | 46,529,126 | 331,420,130 |
| මූලධන | 162,096,068 | 474,375,551 | 152,248,027 | 788,719,646 |
| **එකතුව** | **182,301,730** | **739,060,892** | **198,777,153** | **1,120,139,776** |
| | ======== | ======== | ======== | ========= |

## 13. ඉඩම් අමාත්‍යාංශය

**ශීර්ෂය - 122**

මූලාා ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය
2019 - තත්ත්වාගණනය නොකළ මතය
2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වයන් |
|---|---|---|---|---|
| 01. | බිම්සවිය ව්‍යාපෘතිය ආරම්භ කර සමාලෝචිත වර්ෂය අවසානය වන විට වසර 22ක කාලයක් ගත වී තිබුන ද දිස්ත්‍රික්ක 18 කට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 58 ක පමණක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ඉතිරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 273ක් සඳහා වැඩසටහන ආරම්භ කිරීමට සැලසුම් කර නොතිබුණි. | ක්‍රියාත්මක කිරීමට පවතින ගැටලු හා අභියෝග හඳුනාගෙන ඒ සඳහා නිසි පියවර ගැනීමට හා වැඩසටහන පුළුල් කිරීමට කටයුතු කළ යුතුය. | බිම්සවිය වැඩසටහන නව ප්‍රාදේශීය ලේකම් කොට්ධාස 09 ක ආරම්භකර ඇති බව. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 264ක මෙම වැඩසටහන ආරම්භකර නොමැත |
| 02. | දෙපාර්තමේන්තු අතර තොරතුරු ජාලගත කිරීම මඟින් හිමිකම් සහතිකය නිකුත් කිරීමේ ක්‍රියාවලිය මාර්ගස්ථ ක්‍රමයට(Online) සිදු කිරීමට ක්‍රියාකාරී සැලස්මෙහි ඇතුළත් කර තිබුණ ද, එය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | සැලසුම් කළ ක්‍රියාකාරකම ඉටු කිරීමට කටයුතු කළ යුතුය. | මාර්ගස්ථ ක්‍රමයට(Online) හිමිකම් සහතිකය නිකුත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භකර නොමැත. | ක්‍රියාවලිය නතරවී ඇත |

| | | | | |
|---|---|---|---|---|
| 03. | දිනෙන් දින පුළුල්වන මානව අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමටත්, ජාතික ආර්ථික සංවර්ධන උපායමාර්ග ක්‍රියාවට නැංවීම සඳහාත් පාරිසරික සංතුලනය පවත්වා ගැනීම සඳහාත් වඩාත් විද්‍යාත්මක භූමි පරිහරණ ප්‍රතිපත්තියක අවශ්‍යතාව හඳුනාගෙන 2018 වර්ෂයේ දී ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණ ද, ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය වර්තමාන සංවර්ධන අවශ්‍යතාවලට ගැලපෙන ලෙස සංශෝධනය කර සැකසීමේ කටයුතු 2020 වර්ෂය අවසානය වන විටත් නිම කර ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය නිකුත් කර නොතිබුණි. | යෝජිත ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු කඩිනමින් අවසන්කළ යුතුය. | ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය කෙටුම්පත් සකස් කර ඇත. | ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය මේ දක්වා සංශෝධනය කර නොමැත. |
| 04. | අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු යටතේ ජාතික ඉඩම් ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම හා ක්‍රියාත්මක කිරීම දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එය ඉටුකර නොතිබුණි. | ජාතික ඉඩම් ප්‍රතිපත්තිය සකස්කර ක්‍රියාත්මක කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ජාතික ඉඩම් ප්‍රතිපත්තිය සකස්කර නොමැත. |
| 05. | අමාත්‍යාංශයේ ඉඩම් ප්‍රතිපත්ති අංශය මඟින් ඉඩම් සංවර්ධන ආඥා පනත, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ පනත, සභාධිපත්‍ය යන පනත් සංශෝධනයට අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් සහ නීති කෙටුම්පත් හා නීතිපති | ක්‍රියාකාරී සැලැස්ම පරිදි යෝජිත ක්‍රියාකාරකම ඉටු කළ යුතුය. | - 1993 අංක 19 දරන ඉඩම් සංවර්ධන සංශෝධිත පනත් කෙටුම්පත අනුමැතිය ලබාගැනීම සඳහා පාර්ලිමේන්තුව | අදාළ පනත් සංශෝධනය කර නොමැත |

| | | | | |
|---|---|---|---|---|
| | නිරීක්ෂණ ලබාගෙන සංශෝධන කිරීම සහ ගැසට් මඟින් ප්‍රසිද්ධ කිරීම 2019, 2020 යන වර්ෂ දෙකේදී ම සැලසුම් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ කාර්යය නිමකර නොතිබුණි. | | වෙත ඉදිරිපත් කර ඇති බව.<br>- ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ පනත සංශෝධන කටයුතු සිදුකර නොමැති බව.<br>- 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත අධිකරණ අමාත්‍යාංශයේ අනුකමිටුවක් වෙත යොමුකර ඇති බව.<br>- සහාධිපත්‍ය පනත සංසෝධනයකර නොමැති බව. | |
| 06. | ඉඩම් අත්පත් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ දී ඉඩම් හිමියන්ට ගෙවූ වන්දි මුදල් පිළිවෙළින් රු.2,033,713,527 ක් හා රු.2,410,374,671 ක් වූ අතර පොලී ලෙස එම වර්ෂ වලදී පිළිවෙළින් රු. 1,261,901,450 ක් හා රු.920,543,193ක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ ගෙවූ පොලී මුදලින් රු. 479,522,551 ක් හෙවත් සියයට 38 ක් වර්ෂ 40 ත් 23 ත් අතර | කාර්යක්ෂම අත්පත් ක්‍රියාවලියක් හඳුන්වාදීම හා ප්‍රමාදයකින් තොරව වන්දි මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය. | ඉඩම් අත්කරගැනීමේ පනත සංශෝධනය මගින් අත්කර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට කටයුතු කිරීම, තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම හා මෙම ක්‍රියාවලියට දායකවන අනෙකුත් ආයතන දැනුවත් කිරීම් සිදු කිරීම. | තවදුරටත් ඉඩම් අත්කරගැනීමේ ප්‍රමාදයන් සඳහා පොලී ලෙස අධික මුදලක් ගෙවමින් පවතී |

| | | | | |
|---|---|---|---|---|
| | කාලයකට වැඩි ඉඩම් අත්පත් කරගැනීම් සඳහා ගෙවා තිබුණි. ඒ අනුව අමාත්‍යාශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදය මත ගෙවනු ලබන වන්දියට අමතරව විශාල මුදලක් පොලී ලෙස ගෙවීමට සිදුව ඇති බව නිරීක්ෂණය විය. | | | |
| 07. | 1950 අංක 09 දරන ඉඩම් පනතේ 38(අ) ආඥාව පරිදි රජයේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ඉඩම් පුද්ගලික අංශයෙන් අත්කර ගැනීම, ඒ සඳහා වන්දි ගෙවීම, අත්කර ගැනීමේ නිලධාරීන් නියාමනය කිරීමේ කාර්යභාරයන් ඉඩම් අත්පත් අංශය සතු වුවද, 2020 වර්ෂය අවසානය වන විට ක්‍රියාත්මක ගොනු ගණන වූ 8648 න් වැඩ අවසන් කර තිබූ ගොනු ගණන 25 ක් පමණක් විය. | කාර්යක්ෂම අත්පත් ක්‍රියාවලියක් හඳුන්වාදීම හා ප්‍රමාදයකින් තොරව වන්දි මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය. | අත්පත් ගොනු අවසන්කිරීමේ කටයුතු ප්‍රමාදවීම වළක්වා ගැනීමට පියවර ගෙන නොමැත. | අත්පත්කර ගැනීමේ ප්‍රමාදයන් තවදුරටත් පවතී. |
| 08. | පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් විසින් අක්කර 21 ක භූමි ප්‍රමාණයක් ලෙස දැක්වෙන වැල්ලම්පිටිය වත්ත නැමැති ඉඩම නාගරික සංවර්ධන අධිකාරියේ අවශ්‍යතාවය වෙනුවෙන් අත්පත් කර ගැනීමේ යෝජනාව 1980 වර්ෂයේදී අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබූ අතර , අදාළ යෝජනාව ඉදිරිපත් | ඉඩම් පවරා ගැනීම හා ඊට අදාළ නඩු කටයුතු සඳහා සක්‍රියව දායක වීම මෙන්ම වන්දි මුදල් පියවීම යන කාර්යයන් කඩිනමින් අවසන් කළ යුතුය. | මෙවැනි ප්‍රමාදයන් වැළක්වීමේ පියවර ගෙන නොමැත. | මෙම අඩුපාඩු තවදුරටත් පවතී. |

වීමට පෙර මෙම ඉඩමෙන් අක්කර 13ක් ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධානපනත යටතේ කොළඹ දිසාපතිවරයා විසින් ජනතාව අතර බෙදා දී තිබුණි. එම ඉඩමෙන් ඉතිරිව පැවති ප්‍රමාණය සඳහා රු.4,074,685 ක මුදලක් ගෙවා නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රයෝජනයට පවරා ගෙන තිබු අතර, ජනතාව අතර බෙදා දුන් අක්කර 13 පවරාගැනීම වෙනුවෙන් වන්දී ලෙස රු.මි. 323.37 ක මුදලක් සහ පොලිය ලෙස රු.මි.779.85ක් තක්සේරු කර තිබුණි. මුළු වන්දි මුදල සහ පොලී මුදලින් රු.මි.673.85 ක් මුල් අයිතිකරු වෙත අමාත්‍යාංශය ගෙවා තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ පැවති අකාර්යක්ෂම ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය හේතුවෙන් අක්කර 13ක් පවරා ගැනීමට රු.මි.1,103.22 ක් තරම් විශාල මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

| | | | | |
|---|---|---|---|---|
| 09. | වයඹ පළාතේ කුරුණෑගල කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි අවසාන ගම් පිඹුර (අ.ග.පි.) 1578 හි අංක 09 හි කැබලි අංක 116 ට අයත් අක්කර 5 පර්.2.22 ක ඉඩම තෙලහැර පාසල් ක්‍රිඩාපිටිය වෙනුවෙන් අත්කර ගැනීම 1988 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. අදාළ අත්කර ගැනීමේ ක්‍රියාවලිය 2012 මැයි 10 දින අවසන් කර තිබුණි. ඒ අනුව ඉඩම අත්කර ගැනීම සඳහා වර්ෂ 23 කට වැඩි කාලයක් ප්‍රමාද වීම හේතුවෙන් අත්කර ගැනීමේ වන්දිය 3,500,000 ක් 2014 වර්ෂයේදී ගෙවා තිබූ අතර ඒ වෙනුවෙන් පොලිය ලෙස රු.4,309,930ක් සමාලෝචිත වර්ෂයේදි ගෙවා තිබුණි. | ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කළ යුතු අතර වන්දි ගෙවීම් කාලීනව සිදුකළ යුතුය. | වළක්වාගැනීම සඳහා ඉඩම් අත්කරගැනීමේ පනත සංශෝධනයට අවශ්‍ය පියවරගෙන ඇති අතර අත්කර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ගද මේ වන විට ගෙන ඇති බව. | අත්පත්කරගැනීමේ ක්‍රියාවලියෙහි සහ වන්දි ගෙවීම් ක්‍රමවේදයේ දුර්වලතා තවදුරටත් පවතී |
| 10. | ඉඩම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බිම් සවිය වැඩසටහන සඳහා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව දායක වී තිබුණි. අමාත්‍යාංශය වැය විෂය අංක 122 -2-3-4 -2509 යටතේ 2007 වර්ෂයේ සිට සමාලෝචිත | බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී සැලැස්ම පරිදි යෝජිත ක්‍රියාකාරකම ඉටු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ගගෙන නොමැත. | අපේක්ෂිත ඉලක්ක ලඟාකරගැනීම මන්දගාමීව සිදුවෙමින් පවතී |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂය දක්වා රු.5,396,484,927 ක් වැය කර තිබූ අතර මිනින්දෝරු දෙපාර්තමේන්තුව ඉඩම් කැබලි 1,665,087 ක් මැන අවසන් කර තිබුනද, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් එයින් 801,256 ක් හෙවත් සියයට 48 නිරවුල් කර තිබුණි. රෙජිස්ටර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ඉඩම් කැබලි 669,484 ක් හෙවත් සියයට 40කට පමණක් හිමිකම් සහතික නිකුත් කර තිබුණි. ඒ අනුව මෙම වැඩසටහන ආරම්භ කර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 23කට වැඩි කාලයක් ගත වී තිබුනද අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගැනීම මන්දගාමීව ක්‍රියාත්මක වී තිබුණි. | | | |
| 11. | කළුතර වලතර කනිටු විදුහලට ක්‍රීඩාපිටියක් ඉදිකිරීම සඳහා ඉඩමක් අත්කර ගැනීම<br>ඩෝරා ජයසූරිය යන අයට අයත් අක්කර 01 රූඩ් 03 පර්චස් 34.5 ක් මහජන කාර්යයක් සඳහා පවරා ගන්නා බවට දැන්වීම 2005 ජූලි මාසයේදී දැන්වීම් පළ කර තිබුණි. එසේ වුවද 2005 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වර්ෂ14 ක පමණ කාලයක් ගත වුවත් ඉඩම අත්පත් කර ගැනීමේ ඉදිරි කටයුතු කිසිවක් සිදු කර නොතිබූ අතර | අත්පත්ක්‍රියාවලිය අවසන් කර ප්‍රමාදයකින් තොරව වන්දි මුදල් ගෙවිය යුතු වීම. | -එම- | ඉඩම අත්පත්කර වන්දි ගෙවීම සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කළුතර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක විසින් යෝජිත ඉඩම දැනටමත් පාසලේ කටයුතු සඳහා පරිහරණය කරන බැවින් තවදුරටත් පාසල සඳහා ඉඩම අවශ්‍ය බවට දන්වා තිබුණි. | | | |
| 12. | ගාල්ල බැද්දේගම තොරතුරු තාක්ෂණය පිළිබඳ වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන සඳහා ඉඩම් අත්පත් කරගැනීම<br>ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අක්කර 05 ක් පමණ වූ මෙම ඉඩම අත්පත් කර ගැනීමට අදාළව මහජන කාර්යයක් සඳහා පවරා ගන්නා බව ප්‍රසිද්ධ කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 2 වගන්තිය යටතේ 2000 වර්ෂයේදී දැන්වීම පළකර 2001 වර්ෂයේ 38 අතුරු විධානය යටතේ ආඥාව නිකුත් කර බුක්තිය පවරා දී තිබුණි. නමුත් විගණිත දිනය වූ 2020 ජනවාරි දක්වාම රු 8,000,000 ක වන්දි මුදල් ගෙවීමට කටයුතු කර නොතිබී හේතුවෙන් 2001 වර්ෂයේ සිට වර්ෂ 18 ක් සඳහා සියයට 7 බැගින් රු 10,080,000ක් පොළී මුදලක් ගෙවීමට සිදු වන බවද නිරීක්ෂණය විය. | අත්පත්ක්‍රියාවලිය අවසන් කර ප්‍රමාදයකින් තොරව වන්දි මුදල් ගෙවිය යුතු වීම. | -එම- | අත්පත්කර ගැනීමේ ක්‍රියාවලියේදී සිදු වූ ප්‍රමාදය හේතුවෙන් ප්‍රමාද පොලී සමග වන්දි ගෙවා ඇත. |

## 13. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|
| ඇස්තමේන්තුගත | රු. | රු. | රු. | රු. |
| ප්‍රතිපාදනය | | | | |
| පුනරාවර්තන | 1,114,010,000 | 1,088,000,000 | 321,400,000 | 2,523,410,000 |
| මූලධන | 2,712,500,000 | 3,007,000,000 | 3,102,400,000 | 8,821,900,000 |
| එකතුව | 3,826,510,000 | 4,095,000,000 | 3,423,800,000 | 11,345,310,000 |
| ශුද්ධ ප්‍රතිපාදනය | | | | |
| පුනරාවර්තන | 1,117,520,000 | 1,117,200,000 | 331,710,000 | 2,566,430,000 |
| ප්‍රාග්ධන | 2,745,838,000 | 3,875,155,000 | 3,102,425,000 | 9,723,418,000 |
| එකතුව | 3,863,358,000 | 4,992,355,000 | 3,434,135,000 | 12,289,848,000 |
| සත්‍ය වියදම - | | | | |
| පුනරාවර්තන | 995,878,017 | 944,960,565 | 328,075,460 | 2,268,914,042 |
| ප්‍රාග්ධන | 2,383,877,207 | 2,755,433,198 | 3,048,167,116 | 8,187,477,521 |
| එකතුව | 3,379,755,224 | 3,700,393,763 | 3,376,242,576 | 10,456,391,563 |
| වසර අග ඉතිරි වීම් | | | | |
| පුනරාවර්තන | 121,641,983 | 172,239,435 | 3,634,540 | 297,515,958 |
| ප්‍රාග්ධන | 361,960,793 | 1,119,721,802 | 54,257,884 | 1,535,940,479 |
| එකතුව | 483,602,776 | 1,291,961,237 | 57,892,424 | 1,833,456,437 |

## 14. නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය

**ශීර්ෂය - 123**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය කළ මතය

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්වය |
|---|---|---|---|
| 01. **<u>ශීර්ෂය 162 - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය</u>**<br>මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති ආයතන සහ ව්‍යාපෘති මගින් ඉටු කරනු ලබන සමාජීය හා ආර්ථිකමය කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරිමේ ප්‍රචාරණ වැඩසටහනක් 2019 වර්ෂයේදී පුද්ගලික ආයතන දෙකක් සමග රු.148,680,879 කට ගිවිසුම්ගත වී ක්‍රියාත්මක කර තිබුණු අතර ජනතාව දැනුවත් කිරීම වෙනුවට ‘‘පන්නරය ’’ යන තේමාව යටතේ රටේ සිටින එක් එක් වෘත්තීන් වල යෙදෙන වෘත්තිකයින්ගේ පින්තූර සහිත ප්‍රදර්ශන පුවරු ප්‍රදර්ශනය කිරීම හා ඒ සම්බන්ධ රූපවාහිනි ප්‍රචාරණ දැන්වීම් ඉදිරිපත් කර තිබුණු බැවින් මෙම වැඩසටහන සඳහා | අමාත්‍යාංශය මගින් ඉටුකරනු ලබන කාර්යයන් පිළිබඳ මහජනතාව දැනුවත් කළ යුතුද යන්න පිළබඳ විශ්ලේෂණය කර ප්‍රචාරක වියදම් කළ යුතුවේ. | මහජනතාව දැනුවත් කිරීම සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛ පරිදි රජයේ ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කර සියලු ව්‍යාපෘතින් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහනක් සැලසුම් කර ප්‍රසම්පාදන ක්‍රමය මගින් තෝරාගත් ආයතනය මගින් කරන ලද කටයුතු වල ප්‍රගතිය අනුව අදාල ආයතනය වෙත මේ වන විට රු. මිලියන 78 කට ආසන්න මුදලක් ගෙවා ඇත. එසේ වෙතත් නව රජයට බලයට පත්වීමෙන් පසුව මේ පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් | එම කටයුතු පිළිබඳ පරීක්ෂණය කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බාරදී තිබුණි. |

| | |
|---|---|
| වැයකර තිබුණු මුදල මඟින් මහජනයාට ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. මෙම ප්‍රචාරණ දැන්වීම් වෙනුවෙන් රු. 53,899,098 ක මුදලක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අදාල ආයතන වලට ගෙවිය යුතුව පැවති අතර මෙම ප්‍රචාරණ වැය ආර්ථික නොවන වැයක් ලෙස නිරීක්ෂණය කෙරේ | පරීක්ෂණයක් සිදු කෙරෙමින් පවතී |

## 02. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය | පුනරාවර්තන | 909,190,000 | 733,890,000 | 219,149,000 | 1,862,229,000 |
| | මූලධන | 60,172,910,000 | 58,009,140,000 | 21,939,696,000 | 140,121,746,000 |
| | එකතුව | 61,082,100,000 | 58,743,030,000 | 22,158,845,000 | 141,983,975,000 |
| සත්‍ය වියදම | පුනරාවර්තන | 705,048,186 | 44,983,130,215 | 19,021,006,860 | 64,709,185,261 |
| | මූලධන | 31,416,272,152 | 45,313,195,615 | 19,057,289,710 | 95,786,757,477 |
| | එකතුව | 32,121,320,338 | 45,313,195,615 | 19,057,289,710 | 96,491,805,663 |
| වසර අග ඉතිරිවීම් | පුනරාවර්තන | 204,141,814 | 403,824,600 | 182,866,150 | 790,832,564 |
| | මූලධන | 28,756,637,848 | 13,026,009,785 | 2,918,689,140 | 44,701,336,773 |
| | එකතුව | 28,960,779,662 | 13,429,834,385 | 7,122,518,210 | 7,122,518,210 |

## 15. අධ්‍යාපන අමාත්‍යාංශය

**ශීර්ෂය - 126**

මූලා‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 දරන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් නිශ්චිත ක්‍රමවේදයක් යෝජනා කර නොතිබීම හේතුවෙන් පාසල්වල විදුහල්පතිවරුන් තමන්ට අභිමත පරිදි ලකුණු ලබාදීමේ නිර්නායක සකස් කර පාසල් වලට සිසුන් බඳවා ගෙන තිබුණි. | පාසැල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් බඳවා ගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කළයුතුය. | 2008/37 චක්‍රලේඛය සංශෝධනය කරමින් පවතින බව. | 2008/37 චක්‍රලේඛය සංශෝධනය අවසන් කර නොමැත. නිවැරදි වී නොමැත. |
| 02. | 2008 අප්‍රේල් 30 දිනැති අංක 2008/17 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව පහසුකම් හා සේවා ගාස්තු හා පාසල් සංවර්ධන සමිති ගාස්තු හැර වෙනත් කිසිදු මුදලක් අය කළ නොහැකි වුවද, ඊට අනුකූල නොවී කටයුතු කර තිබුණි. | පවතින ලිඛිත උපදෙස් අනුව කටයුතු නොකිරීම පිළිබඳව පියවර ගැනීමට කටයුතු කළයුතුය. | 2019.04.09 දිනැති 19/2019 හා 05/2015 චක්‍රලේඛ මගින් මුදල් අය කිරීම තහනම් කරන විධිවිධාන බලාත්මක කර ඇත. සිසුන්ගෙන් අවිධිමත් ලෙස මුදල් එකතු කිරීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි අනුව ජාතික පාසල් විදුහල්පතිවරුන් දැනුවත් කර ඇත. | විදුහල්පතිවරුන්ව දැනුවත් කළද නිවැරදි වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 03. | 2018 වර්ෂයේ සංඛ්‍යා ලේඛන වාර්තා අනුව දිස්ත්‍රික් 21 ක පාසැල් 101 ක් වසා දමා ඇති අතර එයින් 31 ක් ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති වීම හේතුවෙන්ද, 45 ක් රටේ පවත්නා තත්ත්වය අනුවද, 21 ක් හේතුව වාර්තා නොවන තත්ත්වයක් යටතේද, 4 ක් අනෙකුත් හේතු යටතේද වසා දමා තිබුණි. | නව පාසැල් ආරම්භ කිරීමට මෙන්ම පාසැල් වසා දැමීම සඳහාද නිශ්චිත නිර්නායකයන් හඳුන්වාදීමට කටයුතු කළ යුතු වේ. | වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2019, 2020 වර්ෂවලදී ද පාසල් නිශ්චිත නිර්නායකයන් නොමැතිව පාසල් 58 ක් පමණ වසා දමා තිබුණි. |
| 04. | වෘත්තිකයින්ගේ හෝ නිලධාරීන්ගේ දරුවන්ව ජනප්‍රිය පාසැල්වලට ඇතුළත් කිරීම සම්බන්ධ නිශ්චිත නිර්නායක, ක්‍රමවේද හෝ උපදෙස් නොතිබුණු බැවින් ඇතැම් වෘත්තිකයින්ට හා නිලධාරීන්ට පමණක් ඒ සඳහා අවස්ථාව ලැබී තිබුණි ඒ සම්බන්ධයෙන් පොදු ප්‍රතිපත්තියක් හඳුන්වාදී නොතිබුණි . | පාසැල්වලට සිසුන් ඇතුළත් කිරීම සඳහා පොදු ක්‍රම වේදයක් හා ප්‍රතිපත්තියක් සැලසීම තුළින් සියළු සිසුන්ට සම අවස්ථා නිර්මාණය කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | වර්තමානයේදී ද පොදු ප්‍රතිපත්තියක් නොමැතිව ජනප්‍රිය පාසැල්වලට සිසුන් ඇතුලත් කිරීම සිදුකරයි. |
| 05. | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 දරන චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, ජාතික පාසැලක ප්‍රාථමික ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 40 ක් හා ද්විතීයික ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 45 ක් යන සීමාවන් සඳහන් කර තිබුණු අතර, 2016 මැයි 16 දිනැති අංක 17/2016 දරන සංශෝධිත චක්‍රලේඛයට අනුව පලමු ශ්‍රේණියේ පන්තියක සිටිය යුතු මුළු සිසුන් සංඛ්‍යාව 39 ක් දක්වා අඩුකර තිබුණද, | පාසැල්වල පවතින පහසුකම් අභිබවා සහ චක්‍රලේඛ උපදෙස්වල සඳහන් සීමාවන් ඉක්මවා අතරමැදි ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීමට ඇති ඉඩකඩ අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගතයුතු වේ. | 2019 වර්ෂයේ අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීම අධ්‍යාපන අමාත්‍යතුමාගේ නියෝගය මත තාවකාලිකව අත්හිටුවීමටද කටයුතු කර ඇත. | සිසුන් ඇතුලත් කිරීම තාවකාලිකව අත්හිටුවා තිබුණද, වර්තමානයේදී සීමාවන් ඉක්මවා දරුවන් ඇතුලත් කිරීම සිදුවන බැවින්, නිවැරදි කිරීමට කටයුතු කර නොමැත |

| | | | | |
|---|---|---|---|---|
| | මෙම සීමාවන් ඉක්මවා සිසුන් ඇතුලත් කර තිබුණි. | | | |
| 06. | 2018.12.31 දින වන විට විද්‍යාපීඨවලට, අමාත්‍යාංශයට හා කොළඹ දිස්ත්‍රික් පාසැල්වලට අදාල විසඳා අවසන් නොවූ විනය ගැටළු 333 ක්වූ අතර, ඉන් 09 ක් වර්ෂ 7 ක්ද, 30 ක් වර්ෂ 05 ක්ද, 128 ක් වර්ෂ 2 ත් 5 ත් කාලයක්ද ඉක්මවා තිබුණි. | ඉතා විශාල වශයෙන් එකතුවෙමින් පවතින විනය ගැටළු විසඳා අවසන් කරගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. | අප්‍රමාදව විසඳාගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දිගින් දිගටම විනය ගැටළු විසඳීමේ ප්‍රමාදයක් පවතී. |
| 07. | 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්ති මූලධර්මවලට අනුව, මහජන සේවා අවශ්‍යතා සහ ආයතනය සතු ධාරිතාවය සැලකිල්ලට ගනිමින් සේවා ප්‍රමිතීන් නියම කිරීම, මහජනතාවට නිවැරදි කරුණු හා තොරතුරු විවෘතව සැපයීමට සහතික වීම හා සියල්ලන්ට ආචාරශිලිව, මිත්‍රශිලිව හා සාධාරණව සැලකීම මෙන්ම වරදක් සිදුවූ විට නිවැරදි කිරීම ප්‍රමාණවත් අයුරින් සිදුකර නොතිබුණි. | මහජන අවශ්‍යතා කඩිනමින් හා විශ්වාසදායක අන්දමින් ඉටුකිරීමට නිවැරදි විසඳුම් ලබාදීමට කටයුතු කළයුතු වීම. | වැළැක්වීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කර නොමැත. |
| 08. | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට පටහැනිව අමාත්‍යාංශයේ විවිධ තනතුරුවල සේවයේ නියුතු නිලධාරීන් 242 දෙනෙකු ස්ථානමාරු නොලබා වර්ෂ 6 ක සිට වර්ෂ 20ක් දක්වා කාලයක් සේවය කරන බව අනාවරණය විය. | නියමිත සේවා කාල සීමාවන් තුල විධිමත් ස්ථාන මාරු ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු වීම. | වැළැක්වීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමානයේද දීර්ඝ කාලයක් ස්ථානමාරු නොලබා සේවය කරන නිලධාරීන් සිටින බව. |

| | | | | |
|---|---|---|---|---|
| 09. | 2015 අගෝස්තු 21 දිනැති අංක 1928/28 අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් පරිදි ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවට අනුව ලැයිස්තුගත ඇතැම් ජාතික පාසැල් සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් විදුහල්පතිවරු වශයෙන් පත්කර නොතිබුණි. | අදාල නිලධාරීන් පත්කිරීමට කටයුතු කළයුතු වීම. | 2019 හා 2020 වර්ෂවල පුරප්පාඩු වූ ජාතික පාසල් 71ක් සඳහා විදුහල්පතිවරුන් 28 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබාදී ඇත. පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවා ඇත. | ජාතික පාසැල් 32 කට සුදුසු නිලධාරීන් පත්කර නැත. |
| 10. | 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය අනුව වයස අවුරුදු 5 ත් අවුරුදු 14 ත් අතර වයස් සීමාවල දරුවන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා පෞද්ගලික පාසැල් ආරම්භ නොකළ යුතු වුවද, පනතට පටහැනිව ආරම්භ කර තිබුණු ජාත්‍යන්තර හා පෞද්ගලික පාසැල් අධීක්ෂණය අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි. | වර්තමානයේ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ඇති පුද්ගලික හා ජාත්‍යන්තර පාසැල් පිළිබඳ විධිමත් අධීක්ෂණයක් සහ නියාමනයක් සිදුවිය යුතු වීම. | මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්ති රාමුවක් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව තුළ ඇතුළත් කර ඇත. ජාත්‍යන්තර පාසැල්වලට තත්ත්ව පාලනය සඳහා ක්‍රමවේදයක් සැකසීමට අවශ්‍ය වූ මූලික අධ්‍යයනයක් ආරම්භ කර ඇත. | ජාත්‍යන්තර හා පෞද්ගලික පාසැල් අධීක්ෂණය අමාත්‍යාංශය සිදු නොකරන අතර මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්ති රාමුවක් 2020-30 ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව තුළ ඇතුලත් කර ඇතත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| 11. | ක්‍රීඩා දක්ෂතා සහිත ජාතික හා ජාත්‍යන්තර තලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කිරීමේ අරමුණු පෙරදැරිව 1989 වර්ෂයේදී ආරම්භ කර තිබුණු ක්‍රීඩා පාසැල් 22 ක් පසුගිය වර්ෂ 5 | ක්‍රීඩා පාසැල් ඵලදායී ලෙස ක්‍රියාත්මක තත්ත්වයෙන් පවත්වාගෙන | 1. නව ක්‍රීඩා සංවර්ධන වැඩසටහනක් පිළිබඳව සාකච්ඡා කර ඇත. යෝජනා 12 ක් අඩංගු | වර්තමානය වන විටද ක්‍රීඩා පාසල් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | තුළදී ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. ඒ හේතුවෙන් එම පාසැල්වල පැවති නේවාසිකාගාර, ක්‍රීඩා උපකරණ හා කාය වර්ධන උපකරණ ඌණ උපයෝජිතව පැවතුණි. මෙම පාසල් අතුරින් ක්‍රීඩා කිරීමට සුදුසු ස්ථාන නොමැති පාසැල් 10 ක්,විදුලි අඩුපාඩු සහිත පාසැල් 08 ක්, අවදානම් සහිත නේවාසිකාගාර පවතින පාසැල් 04 ක් හා සනීපාරක්‍ෂණ පහසුකම් අඩු පාසැල් 12 ක් පැවතුණි. | යාමට කටයුතු කළයුතු වීම. | වාර්තාවක් එළි දක්වා ඇත.<br>2. ක්‍රීඩා සිසුන්ට නියමිත පුරප්පාඩු තබාගැනීමට කටයුතු කරන ලෙස දැනුවත් කර ඇති බව.<br>3. ක්‍රීඩා පාසැල් සඳහා 8 ශ්‍රේණියේ සිසුන් බඳවාගැනීම පිණිස එක් සමාන්තර පන්තියක් ආරම්භ කිරීම සඳහා පාසල් ව්‍යුහ කමිටුවේ නිර්දේශ අනුමැතිය ලැබී ඇත. | |
| 12. | පාසැල් මට්ටමින් ක්‍රීඩා සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ පාසැල් ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම අරමුණු කරගෙන පිහිටුවා තිබුණු ක්‍රීඩා සභාවේ ක්‍රියාකාරිත්වය වර්තමානය වන විට අක්‍රිය වී තිබුණි. ඒ හේතුවෙන්, පාසැල් ක්‍රීඩා සංගම්වල මූල්‍ය කටයුතු පාලනය සහ අධීක්‍ෂණය, ක්‍රීඩකයින් විදේශ තරඟ සඳහා සහභාගී කරවීමට ප්‍රමාණවත් මැදිහත්වීම, සියළුම ක්‍රීඩා සංගම්වල තරඟ හා ක්‍රීඩා සංගම් වැඩසටහන් පිළිබඳව අධීක්‍ෂණය හා නියාමනය සහ පාසැල් ක්‍රීඩා සංගම් මඟින් පවත්වනු ලබන අනුමත දේශිය හා විදේශිය තරඟවලට අනුග්‍රාහකත්වය ලබාදීම සඳහා සාධාරණ මැදිහත්වීම ආදිය සිදුවී නොතිබුණි. | පාසැල් ක්‍රීඩා සංවර්ධනය සඳහා ශක්තිමත් සහයෝගයක් ලබාදීමට හැකි වන අයුරු ක්‍රීඩා සභාව සහ ක්‍රීඩා සංගම් සංවර්ධනය කර පවත්වාගෙන යා යුතු වීම. | ක්‍රීඩා සභාව ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නැත. | ක්‍රීඩා සභාවේ ක්‍රියාකාරීත්වය අක්‍රීය වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 13. | මුදල් රෙගුලාසි 571 පටහැනිව වර්ෂ 2 ක් ඉක්ම වූ රාජ්‍ය ආදායමට බැර නොකල තැන්පතු ගිණුම් 6 ක වටිනාකම රු. 392,352,040 ක් වූ අතර, වර්ෂ 5 ක් ඉක්මවූ රු.15,362,919ක් ද එහි ඇතුලත් වී තිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වර්ෂ දෙකක් ඉකුත් වූ තැන්පත් ශේෂ පිළිබඳව කටයුතු කල යුතු වීම. | ශේෂයන් නිරවුල් කිරීමට පළාත් දෙපාර්තමේන්තු හා විද්‍යාපීඨ වෙත දැනුම් දී ඇත. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. |
| 14. | 1986 අංක 30 දරණ අධ්‍යාපනික විද්‍යායතන පනතෙහි 7 වන වගන්තියට අනුව මණ්ඩලයේ ප්‍රධාන කොමසාරිස්වරයා විසින් විද්‍යායතනවල පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම, කාර්ය මණ්ඩලය පාලනය කිරීම සහ බලතල, කාර්ය හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම කළයුතු වුවද පනත ප්‍රකාරව මණ්ඩල පිහිටුවීම මෙන්ම මෙම කටයුතු ක්‍රියාත්මක කිරීමද ප්‍රශස්ථ අයුරින් සිදුවී නොතිබුණි. | පනතේ සඳහන් ආකාරයට අදාල මණ්ඩල පිහිටුවීම මෙන්ම එම කටයුතු ක්‍රියාත්මක කිරීමද සිදුකල යුතුවීම. | නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පනත ප්‍රකාරව මණ්ඩල පිහිටුවා නොමැත. |
| 15. | 2009 නොවැම්බර් 17 දිනැති අංක 2009/35 දරණ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3 වන ජේදය ප්‍රකාරව රජයේ අනුමත පෞද්ගලික පාසල් විසින් අදාළ චක්‍රලේඛ උපදෙස් හා විධිවිධාන පිළිපදින්නේද යන්න සොයා බැලීම සඳහා අමාත්‍යාංශය විසින් විධිමත් හා අඛණ්ඩ නියාමනයක් ක්‍රියාත්මකර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුවීම | නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කර නොමැත |
| 16. | 2020 දෙසැම්බර් 03 දිනැති අංක 37/2020 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ උපදෙස් හා සංග්‍රහයේ 12 වැනි පරිච්ජේදය අනුව | -එම- | ඉදිරියේදී විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේ යෙදවීම සඳහා උපදෙස් ලබා දී ඇත. | නිවැරදි වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා පත්වීම් ලැබූ ගුරුභවතුන් එම ක්ෂේත්‍රයෙහිම පූර්ණ කාලීනව සේවයේ යෙදිය යුතු වුවද විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුරුවරුන් 207 දෙනෙකු එම ක්ෂේත්‍රයේ ඉගැන්වීම් කටයුතුවල නොයෙදෙන බව නිරීක්ෂණය විය. | | | |
| 17. | අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යභාරය අනුව ලෝක තරඟකාරීත්වයට ආත්ම විශ්වාසයකින් හා සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ප්‍රවේශ වීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීමේ කාර්යය සම්පූර්ණයෙන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | ලංකාවේ අධ්‍යාපනය සඳහා නොවෙනස් ජාතික ප්‍රතිපත්තියක් වර්තමානයට ගැලපෙන අයුරින් සකස් කල යුතුවීම. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීමේ කාර්ය සම්පූර්ණයෙන් ඉටුකර නොමැති බව. |
| 18. | 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ III වන පරිශිෂ්ඨයේ අධ්‍යාපනයට අදාලව 2 වන ව්‍යවස්ථාව අනුව පෙර පාසල් අධීක්ෂණය හා කළමනාකරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයට පවරා තිබූ අතර, අධ්‍යාපන අමාත්‍යාංශයේ ද ප්‍රධාන කාර්යයක් වශයෙන් හඳුනාගෙන තිබුණ පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සිදු කර නොතිබුණි. | පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම කල යුතුවීම. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර නොමැත. |
| 19. | කරාපිටිය රෝහලේ මහාචාර්ය ඒකකයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය රු.මිලියන 1300 ක පිරිවැය ඇස්තමේන්තුවකින් යුතුව 2018 වර්ෂයේ ආරම්භ කර 2022 මැයි 31 දින වනවිට නිම කළ යුතුව තිබූ අතර | නියමිත කාලපරිච්ඡේදය තුළ දී ව්‍යාපෘති කටයුතු නිම කර ගැනීමට | ඉදිකිරීම් කටයුතු කිරීමට යෝජිත ඉඩම සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් පවරා ගත යුතු වූ බැවින් එම කටයුතු 2019 ඔක්තෝබර් 28 දින | 2021 දෙසැම්බර් 31 දින වන විට සියයට 30 ක පමණ භෞතික ප්‍රගතියක් පමණක් ළඟා |

| | | | | |
|---|---|---|---|---|
| | රු.මිලියන 131.7ක අත්තිකාරම් මුදලක් ද කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ව්‍යුහාත්මක කටයුතු පමණක් ආරම්භ කර තිබුණි. | ක්‍රියාමාර්ග ගත යුතුය. | වනවිට නිම කිරීමට හැකි වූ බව. ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම වෙනුවෙන් 2019 දෙසැම්බර් 17 දින කොන්ත්‍රාත්කරු වෙත වැඩබිම භාරදෙන ලද අතර 2020 වර්ෂයේදී මූලිකව භූමිය සැකසීම ආදී කටයුතු පමණක් සිදුකරන ලදි. 2021 දෙසැම්බර් පමණ වනවිට සියයට 20 ක පමණ භෞතික ප්‍රගතියක් ළඟාකරගෙන ඇති බව. | කරගෙන තිබුණි. |
| 20. | ඇස්තමේන්තු ගත වටිනාකම රු.මිලියන 1,180 ක් වූ රුහුණු විශ්වවිද්‍යාලයේ මහල් 12 කින් යුත් වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2018 මුල් කාර්තුව තුළ ආරම්භ කර 2020 ජනවාරි 10 දින වනවිට නිමකළ යුතුව තිබුණි. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස 2018 ජනවාරි 17 දින රු.මිලියන 195.5 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණ ද ඉදි කිරීමේ කටයුතු වල තිබූ අඩු ප්‍රගතිය හේතුවෙන් 2019 දෙසැම්බර් 23 දින කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත වෙනත් ඉදිකිරීම් ආයතනයකට නැවත ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. ගිවිසුම අවලංගු කර | ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී ඔවුන්ගේ පූර්ව කොන්ත්‍රාත් ඉටු කිරීමේ සාර්ථකභාවය පිළිබඳ නිසි අවබෝධයකින් යුතුව කටයුතු කළ යුතු අතර ගෙවා ඇති අත්තිකාරම් මුදල් අත්තිකාරම් සුරක්ෂණයෙන් පියවා ගැනීමට | ව්‍යාපෘතිය කරගෙන යාමේ අඩු ප්‍රගතිය හේතුවෙන් 2019 දෙසැම්බර් 23 වන දින කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර 2020.05.06 දින ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යංශය වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද බව. අත්තිකාරම් සුරක්ෂණය මුදල් කිරීම සඳහා 2019.12.30 දින ලංකා බැංකුව වෙත යවා තිබූ නමුත් එම අත්තිකාරම් | මේ වනවිට ඉදිකිරීම් කටයුතු වෙනත් ඉදිකිරීම් ආයතනයක් මගින් සිදුකරගෙන යනු ලබන බව සහ පෙර කොන්ත්‍රාත්කරුගෙන් අයකරගත යුතුව ඇති අත්තිකාරම් මුදල සම්බන්ධව අධිකරණ කටයුතු ක්‍රියාත්මක |

| | | | | |
|---|---|---|---|---|
| | කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතුව තිබූ රු.මිලියන 155.3 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල අදාළ බැංකු සුරක්ෂණය මුදල් කරන ලෙස බැංකුව වෙත දැනුම් දීම ප්‍රමාද වීම හේතුවෙන් පියවා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. | අදාළ ක්‍රියාමාර්ග ප්‍රමාදයකින් තොරව ගත යුතුය. | ඇපකරන සහ කාර්යයසාධන ඇපකරය ලබා ගැනීමට විරුද්ධව අතුරු තහනම් නියෝගයක් කොළඹ වාණිජ මහ අධිකරණය විසින් නිකුත් කර තිබූ අතර ඒ අනුව විශ්වවිද්‍යාලය විසින් කර ඇති ඉල්ලීම් ඉටු කළ නොහැකි බව ලංකා බැංකුව විසින් 2020 ජනවාරි 16 දින දන්වා ඇති බව. | වෙමින් පවතින බව. |
| 21. | 2008 සැප්තැම්බර් 24 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ අංක අමප/08/1742/316/086 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පිහිටුවා තිබුණු ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාවට අදාළ කෙටුම්පත් පනත 2008 ඔක්තෝබර් 29 දින නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණු නමුත්, පනතේ කටයුතු අවසන් කර නොතිබුණි. එසේ තිබියදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ගෙවීම් කර තිබුණි. තවද, පැරිස් නුවර යුනෙස්කෝ කාර්යාලයේ සම්බන්ධීකරණ නිලධාරියෙකු වෙත පාරිශ්‍රමික වශයෙන් 2020 වර්ෂය දක්වා එකතුව රු. මිලියන 45.85 ක ප්‍රතිපාදන අමාත්‍යාංශය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි. | කඩිනමින් පනත් කෙටුම්පත සඳහා නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා ගත යුතුවීම. පනත සම්මත කර එහි ඇතුලත් ආකාරයට කටයුතු කල යුතුවීම | මෙම කාර්යය කඩිනම් කර ගැනීම සඳහා ලිඛිතව ඉල්ලීමක් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. වැළැක්වීමට ක්‍රියාමාර්ග ගෙන නැත. | පනත සම්මත කරගෙන නොතිබුණි. නිවැරදි කිරීමට කටයුතු කර නැත 2021 රු. මිලියන 806 ක් ප්‍රතිපාදන මුදාහැර ඇත |

| | | | | |
|---|---|---|---|---|
| 22. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් වාහන 11 ක් අමාත්‍යාංශය භාවිතයට ගෙන තිබුණු අතර, අමාත්‍යාංශයට අයත් වාහන 22 ක් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත පවරා තිබුණි.. | අමාත්‍යාංශය විසින් භාවිතාකරන වෙනත් ආයතන සතු වාහන හා වෙනත් ආයතන භාවිතාකරන අමාත්‍යාංශ වාහන නීත්‍යානුකූලව පවරා ගැනීමට හෝ පවරා දීමට කටයුතු කල යුතුවීම. | පවරා ගැනීමට හා පවරා දීමට කටයුතු කරන බව. | නිවරදි වී නොමැත |
| 23. | අමාත්‍යාංශය සතුව පැවති මූල්‍ය නොවන වත්කම් අතුරින් වාහන 40 ක් රාජ්‍ය අමාත්‍යාංශය වෙත තාවකාලිකව පවරා දී තිබුණද, රාජ්‍ය අමාත්‍යාංශ වෙත ලබාදීමට යෝජිත අනෙකුත් මූල්‍ය නොවන වත්කම් තවදුරටත් හඳුනා ගනිමින් පැවතීම නිසා එම වත්කම් විගණන දිනය වන විටත් පවරා දී නොතිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රාජ්‍ය අමාත්‍යංශ වෙත ලබා දුන් විධිමත් පරිදි වත්කම් පවරා දිය යුතුවීම. | වත්කම් පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | නිවරදි වී නොමැත. |
| 24. | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පද්ධතියේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක සංවර්ධනය සඳහා විධිමත් මාර්ගෝපදේශයක් වශයෙන් විද්‍යාපීඨ සංග්‍රහයක් 2020 වර්ෂය වන විටද නිකුත් වී නොතිබුණි. | මාර්ගෝපදේශය ක් වශයෙන් විද්‍යාපීඨ සංග්‍රහයක් නිකුත් කල යුතුවීම. | විශ්වවිද්‍යාල උපාධියක් දක්වා උසස් කිරීමේ යෝජනාවක් ඉදිරිපත් වී ඇති බැවින් කෙටුම්පත් විද්‍යාපීඨ සංග්‍රයේ වෙනස්කම් සිදු වේ යැයි අපේක්ෂිත නිසා එම කෙටුම්පත් විද්‍යාපීඨ සංග්‍රහය අවසන් කර නොමැති බව. | නිවැරදි වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 25. | අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ශික්ෂණලාභීන් වාර්ෂිකව ඇතුලත් කරගැනීමේදී අ.පො.ස උසස් පෙළ විභාගය පවත්වා වර්ෂ 3 කට ආසන්න කාලයක් ගත වන අතර, 2018 හා 2019 වර්ෂවල පැවැත්වූ විභාගවලින් ශිෂ්‍යලාභීන් ඇතුලත් කරගැනීමට 2020.12.31 කටයුතු කර නොතිබුණි. | ප්‍රමාදයකින් තොරව ගුරු ශික්ෂණලාභීන් විද්‍යාපීඨවලට ඇතුලත් කරගැනීමට කටයුතු කල යුතුවීම. | Z ලකුණු තීරණය කිරීමේ දි මතුවන ගැටළු මත අධිකරණ ක්‍රියාවන්ට යොමු වීම නිසා අදාල බඳවා ගැනීම් කාලපරාසය වෙනස්වීමට හේතුවී ඇති බව | ශික්ෂණලාභීන් ඇතුලත් කර ගැනීමේ ප්‍රමාදය වර්තමානයේද පවතී. |
| 26. | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් දැනුවත් වී තිබුණු නමුත්, එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවීමේ වැඩ පිළිවෙල සැලසුම්වලට ඇතුළත් කර එම ඉලක්ක කරා ළඟ විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන එම ඉලක්ක කරා ලගා විය යුතුවීම. | ක්‍රියාමාර්ග ගෙන නැත | නිවැරදි කිරීමට කටයුතු කර නැත |
| 27. | ජ්‍යෙෂ්ඨ සහ ද්විතීයික මට්ටමේ නිලධාරීන් පුරප්පාඩු 1,664 ක් පැවතීම හේතුවෙන් කළමනාකරණ තීරණ ගැනීමේදීද අනෙකුත් පුරප්පාඩු හේතුවෙන් අමාත්‍යාංශ කටයුතු වලදී ද අවහිරතා ඇති වීමට ද ඉඩකඩ තිබුණු බව නිරීක්ෂණය විය | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පුරවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතුවීම. | ගුරු අධ්‍යාපනඥ සේවයේ හා අධ්‍යාපන පරිපාලන සේවයේ පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. |

## 28. ප්‍රතිපාදන උපයෝජනය

| | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|
| **ඇස්තමේන්තුගත ප්‍රතිපාදන** | | | | |
| පුනරාවර්තන | 58,680,370,000 | 56,175,000,000 | 43,204,880,000 | 158,060,250,000 |
| මූලධන | 39,297,950,000 | 43,730,000,000 | 15,681,595,000 | 98,709,545,000 |
| මුළු වියදම් | 97,978,320,000 | 99,905,000,000 | 58,886,475,000 | 256,769,795,000 |
| **ශුද්ධ ප්‍රතිපාදන** | | | | |
| පුනරාවර්තන | 59,160,270,000 | 57,689,900,000 | 43,204,880,000 | 160,055,050,000 |
| මූලධන | 41,879,950,000 | 43,930,000,000 | 16,891,595,000 | 102,701,545,000 |
| මුළු ශුද්ධ ප්‍රතිපාදන | 101,040,220,000 | 101,619,900,000 | 60,096,475,000 | 262,756,595,000 |
| **සත්‍ය වියදම** | | | | |
| පුනරාවර්තන | 46,711,812,393 | 56,013,861,330 | 41,829,127,304 | 144,554,801,027 |
| මූලධන | 25,644,439,508 | 17,400,256,559 | 15,739,052,248 | 58,783,748,315 |
| මුළු වියදම් | 72,356,251,901 | 73,414,117,889 | 57,568,179,552 | 203,338,549,342 |
| **වසර අග ඉතිරි වීම්** | | | | |
| පුනරාවර්තන | 12,448,457,607 | 1,676,038,670 | 1,375,752,696 | 15,500,248,975 |
| මූලධන | 16,235,510,492 | 26,529,743,441 | 1,152,542,752 | 43,917,796,685 |
| මුළු වියදම් | 28,683,968,099 | 28,205,782,111 | 2,528,295,448 | 59,418,045,658 |

## 16. රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**ශීර්ෂය - 130**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | රජයේ නිල නිවාසවල බදු කාලය වර්ෂ 5 කට සීමා වුවද, 2004 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා නිලධාරියෙකු නිවාසයක පදිංචි වී සිටී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතු වීම. | නිවස නැවත අමාත්‍යාංශයට භාරදෙන ලෙස දිගින් දිගටම දැනුම් දීම, හා ඉදිරියේදී මෙවැනි ගැටලු ඇති නොවීම සඳහා ලේකම්ගේ අනුමැතිය මත නිවාස වෙන්කිරීමේ කොන්දේසි සඳහා නිවාසලාභියා එකඟවන බවට ගිවිසුම්ගතව පමණක් වෙන්කරදීම සිදුකරනු ලබන බව. | නිවස මෙතෙක් භාරදී නැත. |
| 02. | 2018 වර්ෂයේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III,II,I සහ විශේෂ ශ්‍රේණිවල නිලධාරීන් 110 ක් වසර 5 කට වඩා කාලයක් එකම ස්ථානයේ සේවයේ නියුක්ත කර තිබුණි. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටි සංග්‍රහයේ 195 සහ 203 අනුව කටයුතු කළ යුතු වීම. | එකම ස්ථානයේ වසර 05 කට වඩා වැඩි කාලයකට අනුයුක්ත කිරීම් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ ඉල්ලීම මත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා බව. | තවදුරටත් නිළධාරීන් එකම සේවා ස්ථානයේම සේවය කරනු ලැබේ. |
| 03. | 2018 වර්ෂයේදී ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ **III,II,I** සහ විශේෂ ශ්‍රේණිවල | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටි | 2019, 2020, 2021 හා 2022 වාර්ෂික ස්ථාන මාරු යටතේ සහ වාර්ෂික | 2021 දෙසැම්බර් 31 දිනට නිළධාරින් 282 ක් එකම සේවා |

| | | | | |
|---|---|---|---|---|
| | නිලධාරීන් 482 ක් මාරුවීම් ලබා නොදී වසර 5 කට වඩා කාලයක් එකම ස්ථානයේ සේවයේ නියුක්ත කර තිබුණි. | සංග්‍රහයේ 195 සහ 203 අනුව කටයුතු කළ යුතු වීම. | නොවන ස්ථාන මාරු යටතේ එකම සේවා ස්ථානයේ වසර 06කට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් ස්ථාන මාරු කිරීමට කටයුතු කරන බව. | ස්ථානයේ වසර 06 ඉක්මවා සේවය කරනු ලබන අතර ඉන් නිලධාරීන් 26 ක් 2022 වර්ෂයේදී ස්ථාන මාරු කිරීමට කටයුතු කර ඇත. |
| 04. | 2018 වර්ෂයේදී ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III පංතියේ නිලධාරීන් 148 කට හා II පංතියේ නිලධාරීන් 148 කට උසස්වීම් ලබා දී නොතිබුණි. | සැලැසුම් කළ පරිදි කටයුතු කළ යුතු වීම. | 2018, 2019 හා 2020 වර්ෂවල දී ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීම. | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා I ශ්‍රේණියට උසස්වීම් ලබා දී නැත. |
| 05. | පොලොන්නරුව නිලපියස ව්‍යාපෘතිය 2018 වර්ෂය අවසානයේදී නිම කල යුතුව තිබුණද එසේ කර නොතිබුණි. | ඉලක්ක කළ පරිදි කටයුතු කල යුතු වීම. | පළමු කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුගේ කොන්ත්‍රාත් ගිවිසුම 2019.03.21 අත්හිටුවා නව කොන්ත්‍රාත්කරුවකු වෙත 2019.11.19 දින කොන්ත්‍රාත්තුව පවරන බව. | නව කොන්ත්‍රාත්තුව 2021.09.12 දින වන විට ඉදිකිරීම් නිමකල යුතු වුවද ඒ දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 30%කි. |
| 06. | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය දැනුවත් වී නොතිබුණි. | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 07. | 2019 වර්ෂයේ වාහන 06 කට සිදුවී තිබූ අලාභයන්ගේ එකතුව රු. 3,550,083 ක් විය. එම වාහන අමාත්‍යවරයාගේ කාර්යාලයට හා කාර්ය මණ්ඩලය වෙත ලබා දී තිබූ වාහන වන අතර මෙම අනතුරු නොසැලකිලිමත් සහ අධික වේගයෙන් ධාවනය නිසා සිදුවී තිබුණි. | අපරීක්ෂාකාරීව හෝ අන්තරාදායක ලෙස මහාමාර්ගය පාවිච්චි කරන තැනැත්තන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතු වීම. | අමාත්‍ය මණ්ඩලයේ පෞද්ගලික රියදුරන්ගෙන් ද යම් ඇප මුදලක් අය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | මෙතෙක් අදාල ක්‍රියාමාර්ග ගෙන නැත. |
| 08. | සමුළු නිවාස 2 ක් 1983 හා 2001 වර්ෂවලදී මාසිකව පිළිවෙලින් රු.275ක සහ රු.1,000ක කුලියකට ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයට ලබා දී තිබුණි. | නිවාස වෙන් කර දීම සම්බන්ධයෙන් විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම | වර්තමානයේ ආයතනයක් සඳහා නිල නිවාසයක් වෙන්කර දීමේදී, එම නිවසෙහි මාසික නිදහස් වෙළෙඳපල කුලිය තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ලබාගෙන නිවාස කුළිය ලෙස අයකිරීමට කටයුතු සිදුකරමින් පවතින බව. | අදාල නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නැත. |
| 09. | 2012 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රජයේ බංගලා හා නිල නිවාසවලින් කුලි ලෙස අය විය යුතුව තිබූ මුදල රු.337,948,472 ක් විය. | හිඟ කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | හිඟ කුලී අයකර ගැනීමට අදාල ආයතන හා පුද්ගලයින් වෙත නිරන්තර දැනුම් දීම. ඊට අමතරව ජයවඩනගම නිවාස සංකීර්ණයෙහි පිහිටි නිවාසයන්හි අනවසරයෙන් පදිංචිව සිටි නිලධාරින්ගෙන් අයවිය යුතු රු. 8,755,183 ක් අය කර ගැනීමේ හැකියාව | 2021 දෙසැම්බර් 31 දිනට රු.230,494,200 ක් තවදුරටත් අයවිය යුතුව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පිළිබඳ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් විමසීම. | |
| 10. | 2015 මැයි 15 දිනැති අංක MF/01/ 2015/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 (ආ) (1) වගන්තියට අනුකූල නොවන ලෙස දීප ව්‍යාප්ත සේවා නිලධාරීන් 30 දෙනෙකු විදේශ පුහුණු පාඨමාලාවකට සහභාගිවීමේදී රාත්‍රී ආහාර වියදම් අදාළ පුහුණු ආයතනයෙන් ගෙවා තිබියදී ගෙවන ලද රු. 1,707,200 ක් ආපසු අයකර නොතිබුණි. | මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු බව | ශ්‍රී ලංකා රජයට මූල්‍යමය පාඩුවක් සිදු නොවන ලෙස අදාල ද්විත්ව ගෙවීම නිවැරදි කිරීමට කටයුතු යොදා ඇති අතර, මින් ඉදිරියට මෙවැනි ප්‍රමාදදෝෂ සිදු නොවීමට කටයුතු කර ඇති බව. | අතිරේකව ගෙවන ලද මුදල අදාල නිලධාරීන්ගෙන් අයකර ගෙන නැත. |
| 11. | ඒකාබද්ධ සේවා අංශය විසින් 2019 වර්ෂය තුල බඳවා ගැනීමේ විභාග 6ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද එම විභාග පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි උපරිම කාර්යසාධනයක් සහිතව කාර්යයන් ඉටු කළ යුතු වීම. | බඳවාගැනීමේ විභාග කඩිනමින් පැවැත්වීම සඳහා විභාග දෙපාර්තමේන්තුවේ අවධානය යොමුකිරීමට සෑම විටම කටයුතු කර ඇති බව. | බඳවා ගැනීමේ තරඟ විභාග මෙතෙක් පවත්වා නැත. |
| 12. | 2019 ජූනි මාසයේදී රුසියාවේ පැවති ප්‍රදර්ශනයක් සඳහා අමාත්‍යවරයා සහභාගී වීමේදී ලබාගත් ගුවන් ටිකට්පත් සඳහා රු. 324,975 ක වැඩි මිලක් ගෙවා තිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී එවැනි දෝෂ සිදු නොවීමට වග බලාගන්නා බව. | වැඩිපුර ගෙවා ඇති මුදල සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නැත. |
| 13. | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත වාර්තා නොකර ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ 1 | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුව වැටුප් සහිත විදේශ නිවාඩු ලබා දිය නොහැකි බවත් වැටුප් රහිත විදේශ නිවාඩු | මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් මෙතෙක් අවශ්‍ය කටයුතු කර නොමැති අතර |

| | | | | |
|---|---|---|---|---|
| | ශ්‍රේණියේ නිලධාරියෙකුට 2019 අගෝස්තු සිට 2022 ජූලි දක්වා විදේශ නිවාඩු ලබා දී තිබුණි. තවද, උක්ත නිළධාරියා රජයේ නිවාසය ආපසු භාරදීමටද කටයුතු කර නොතිබුණි. | | ලබා දීමට අදාළ ලේඛන ඉදිරිපත් කරන ලෙසත් 2020.09.22 සහ 2021.04.23 දිනැති ලිපි මගින් මුදල් අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර ඇති බව. | රජයේ නිවාසද ආපසු භාර දී නොමැත. |
| 14. | ආදායම් ශීර්ෂය යටතේ ගැනෙන ගොඩනැගිලි ආදායම හඳුනා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් 2020 වර්ෂයේදී දත්ත පද්ධතියක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | දත්ත පද්ධතියක් සකස් කර ගොඩනැගිලි ආදායම නිවැරදිව එකතු කිරීමට කටයුතු කළ යුතු වීම. | අදාල තොරතුරු එවන ලෙස සියලුම ආයතන ප්‍රධානීන්ට දැනුම් දී ඇත | මෘදුකාංගය වැඩිදියුණු කිරීමේ කටයුතු මෙතෙක් නිමකර නැත. |
| 15. | රජයේ නිවාසවල පදිංචි නිළධාරීන් 03 දෙනෙකුගෙන් දණ්ඩන කුලී අයකිරීම් කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව දණ්ඩන කුලී අයකරගත යුතු වීම. | නිවාස හිමියන්ගේ පදිංචි කාලසීමාව අවසන් වන දින සිටම දණ්ඩන කුළී අයකිරීම සඳහා අදාල අනුමැතීන් ලබාගැනීම සඳහා මේ වනවිට කටයුතු කරනු ලබන බව. | මෙතෙක් අයකර නැත. |
| 16. | 2020 දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය නිලධාරීන් 09 දෙනෙකුගෙන් රු.995,768 ක ණය ශේෂයක් අයවිය යුතුව පැවතිණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. | පුද්ගලයන් 7 ක් සඳහා නීතිමය පියවර ගැනීම. එක් අයෙකුගෙන් කොටස් ලෙස හා ඇපකරුවකුගෙන් වාරික ලෙස මුදල් අයකරන බව. | අයවිය යුතු ශේෂයෙන් රු.59,000ක් පමණක් අය කර ගෙන ඇත. |
| 17. | ජාතික භාෂා සමානාත්මතා ප්‍රවර්ධන වැඩසටහන සඳහා 2020 වර්ෂයේදී කැනේඩියන් ඩොලර් 1,991,672 ක් හෙවත් රු. 285,914,474 ක් ඍජු ප්‍රදාන ලෙස ලැබී තිබුණ ද එම | ඍජු ප්‍රදාන ලැබීම් නිවැරදි ක්‍රමවේදයන් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. | 2022 අයවැය ඇස්තමේන්තුව තුලින් මෙම වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන් කර නොමැති බව. | ප්‍රදාන ලෙස ඍජුව ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමට කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | මුදල භාණ්ඩාගාරය හරහා නොලැබීම හේතුවෙන් ගිණුම් ගත කර නොතිබුණි. | | | |
| 18. | අමාත්‍යාංශයට අයත් මහියංගනය, පොළොන්නරුව, මිහින්තලය, මුලතිව්, යාපනය, කතරගම හා මොනරාගල නිවාඩු නිකේතන පිහිටි ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිවාඩු නිකේතන පිහිටි ඉඩම් පවරා ගැනීම නොපමාව සිදුකල යුතු වීම. | ඉඩම් පවරා ගැනීම සඳහා අදාල ආයතන වෙත හා පුද්ගලයන් වෙත වරින් වර දැනුම් දීම හා ඉල්ලීම් සිදු කර ඇති බව. | ඉඩම් පවරා ගැනීමේ ගැටළු මෙතෙක් නිරවුල් කර නොමැත. |
| 19. | 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලය තුල 8A දරන නිවසේ කිසිවෙකුට වෙන්කර දී නොමැති කාලය සඳහා රු.**228,976** ක විදුලි බිලක් ලැබී තිබුණි. | අදාල ගැටලුව කඩිනමින් නිරවුල් කල යුතු වීම. | හිඟ විදුලි බිල කඩිනමින් නිරාකරණය කිරීමට කටයුතු කරන ලෙස 2021.09.13 දිනැති ලිපිය මඟින් ප්‍රධාන විදුලි ඉංජිනේරු කාර්යාලය වෙත දැනුම් දී ඇති බව. | ගැටළුව නිරාකරණය කර නොමැත. |
| 20. | 2020 වර්ෂයේ දෙසැම්බර් **31** දිනට පුරප්පාඩු **171** ක් පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. | බඳවාගැනීම් හා උසස් කිරීම් මඟින් තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතින බව. | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ අධ්‍යක්ෂ, භාෂා පරිවර්තක උද්‍යාන කම්කරු හා කා.කා.ස 6ක් පමණක් බඳවාගෙන ඇත. |

## 21. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදන | | | | |
| පුනරාවර්තන | 1,106,246,300 | 2,667,783,000 | 10,039,047,000 | 13,813,076,300 |
| මූලධන | 1,025,758,700 | 9,164,052,000 | 960,053,000 | 11,149,863,700 |
| එකතුව | | | | |
| | 2,132,005,000 | 11,831,835,000 | 10,999,100,000 | 24,962,940,000 |
| සත්‍ය වියදම | | | | |
| පුනරාවර්තන | 1,053,153,023 | 2,295,160,803 | 8,431,161,940 | 11,779,475,766 |
| මූලධන | 791,049,868 | 5,396,806,163 | 726,085,650 | 6,913,941,681 |
| එකතුව | | | | |
| | 1,844,202,891 | 7,691,966,966 | 9,157,247,590 | 18,693,417,447 |
| වසර අග ඉතිරි වීම් | | | | |
| පුනරාවර්තන | 53,093,277 | 372,622,197 | 1,607,885,060 | 2,033,600,534 |
| මූලධන | 234,708,832 | 3,767,245,837 | 233,967,350 | 4,235,922,019 |
| එකතුව | | | | |
| | 287,802,109 | 4,139,868,034 | 1,841,852,410 | 6,269,522,553 |

17. වැවිලි අමාත්‍යාංශය

**ශීර්ෂය - 135**

මූලාා ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | 1992 වර්ෂයේදී රජයට අයත් එකතුව හෙක්ටයාර් 249,843 ක් වූ ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් වෙත අවුරුදු 53 ක කාලයක් සඳහා බදු කුලී පදනම මත පවරා දී තිබුණි. හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනය අනුව 2020 දෙසැම්බර් 31 දිනට එම සමාගම් අතුරින් සමාගම් 11 කින් රු.890,475,674 ක බදු ආදායම හිඟහිටව තිබුණු අතර, 2021 ජූනි මාසය වන විට එයින් රු.245,242,616 ක් අයකර ගෙන ඇති බව විගණනයට වාර්තාකර ඇතත් ශේෂය වන රු.645,233,058 ක් මු. රෙ. 176 (2) හා (3) ප්‍රකාරව අප්‍රමාදව එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ බදු ආදායම් අයකර ගැනීමට පියවර ගත යුතු වීම. | හිඟ ආදායම ගෙවන ලෙස අදාළ වැවිලි සමාගම් වෙත දන්වා ඇති බව. | 2021 දෙසැම්බර් 31 දිනට සමාගම් 11 කින් රු.573,454,759 ක් අයවීමට ඇත. |
| 02. | 1995 වර්ෂයේ නොවැම්බර් 27 දින කුරුණෑගල වැවිලි සමාගම සමඟ ඇතිකරගත් අංක 1558 දරන කල් බදුකුලී සංශෝධිත ගිවිසුම අනුව එදිනට පැවති ශුද්ධ | හිඟ බදු ආදායම් අයකර ගැනීමට පියවර ගත යුතු වීම. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PE/PL/KPL/GEN/2017 | මේ දක්වා හිඟ බදු මුදල් අයවී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | වත්කම් ප්‍රමාණය මත ගණනය කළ බදු මුදල වසර 53 ක් තුළ වසරකදී සමාන වාරික හතරකින් ගෙවිය යුතුය. එහෙත් එපරිද්දෙන් නියමිත බදු මුදල් නොගෙවීම නිසා 2009 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා රු.242,596,454 ක හිඟයක් පැවතිණි. සමාගම විසින් පාලනය කරනු ලබන ඉඩම්වලින් පොදු කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම හේතුවෙන් එම සමාගමේ ශුද්ධ වත්කම්වල වටිනාකම අඩුවී ඇති බැවින් වාර්ෂික බදුකුලී මුදල් සංශෝධනය කරන ලෙස එම සමාගම විසින් ඉදිරිපත් කරන ඉල්ලීමට එකඟතාවයක් ලබා නොදීම මෙයට එක් හේතුවක් බව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් විගණනයට වාර්තාකර තිබුණි. | | හා 2018/08/02 දිනැති ලිපිය මගින් මෙතෙක් ගෙවා නොමැති බදු මුදල් පැහැර හැරීමකින් තොරව ගෙවන ලෙස අපටද පිටපතක් සහිතව කුරුණෑගල වැවිලි සමාගම වෙත ලිඛිතව දන්වා ඇත. එසේම මේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සියලු පාර්ශව සමඟ සාකච්ඡාවක් සිදුකර ඇති බව. | |
| 03. | කොටගල වැවිලි සමාගමෙන් 2017 වර්ෂයේ සිට 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා රු.309,111,059 ක් හලාවත සහ මස්කෙළිය වැවිලි සමාගම් වලින් 2019 සහ 2020 වර්ෂ 02 ක තුළ රු.145,803,191 ක් වශයෙන් බදු කුලි ආදායමක් හිඟව පැවති අතර, 2021 වර්ෂයේ ජූනි මාසය වන විට හලාවත සහ මස්කෙළිය වැවිලි සමාගම් වලින් රු.41,156,706 ක් අයකර ගෙන | හිඟ බදු ආදායම් අයකර ගැනීම සඳහා ගිවිසුම් විධිවිධාන පරිදි ක්‍රියා කළ යුතු වීම. | සංශෝධිත බදු ගිවිසුමේ 5C වගන්තියෙහි පවතින ප්‍රතිපාදන ප්‍රකාරව බදු මුදල් නොගෙවීමේ කොන්දේසි කඩකිරීම සම්බන්ධයෙන් බදු ගිවිසුම් අවලංගු කිරීමේ හැකියාව සොයා බලා කටයුතු කරන ලෙස, බදු ගිවිසුම්හි සඳහන් නීතිමය ප්‍රතිපාදන ක්‍රියාත්මක කරන ලෙස බදු | බදු දීමනාකරු වන ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී.ල.රා.වැ.ස විසින් අපටද පිටපතක් සහිතව මේ පිළිබඳව ගරු. නීතිපති වෙතින් උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ඇති බව විගණනයට වාර්තාකර තිබුණි. එහෙත් එම වැවිලි සමාගම් 03 වෙතින් රු.413,757,544 ක් තවදුරටත් හිඟව පැවති අතර ගිවිසුමේ 5 **(c)** ඡේදයේ ප්‍රකාරව අදාළ කාලසීමාව තුළ බදු පැහැර හැරීමේ වරදට බදු ගිවිසුම අවලංගු කළයුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | | දීමනාකරු වන ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී.ල.රා.වැ.ස වෙත දන්වා ඇති බව. | |
| 04. | 2020 දෙසැම්බර් 31 දින වන විට වාහන අනතුරු සිදු වී වසර 04 ත්, වසර 09 ත් අතර කාලයක් ගත වී ඇති රු.මිලියන 4.9 ක් වූ වාහන අනතුරු 5 ක් පොත් වලින් කපා හැර නොතිබුණි. | වාහන සඳහා වූ අලාභ අයකර අනතුරු පොත්වලින් කපාහැරීම පිළිබඳව අවධානය යොමුකළ යුතු වීම. | වාහන අනතුරු සම්බන්ධයෙන් වන රු.මි.4.9 ක පාඩුව මුදල් රෙගුලාසි අනුව පොත්වලින් කපා හැරීම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත්කර ඇත. මෙහි සඳහන් ඇතැම් අනතුරු සම්බන්ධයෙන් අධිකරණයේ නඩු පවරා ඇත. එසේම මෙම අලාභ මු.රෙ. ප්‍රකාරව කපා ගැනීමට ඇති හැකියාව සලකා බලමින් පවතින බව. | එම කමිටුව විසින් ගනු ලබන තීරණ අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

05. **ප්‍රතිපාදන උපයෝජනය**

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| ශුද්ධ ප්‍රතිපාදනය - පුනරාවර්තන | 3,125 | 3,231 | 1,084 | 7,440 |
| - මූලධන | 4,672 | 4,676 | 338 | 9,686 |
| එකතුව | 7,797 | 7,907 | 1,422 | 17,126 |
| සත්‍ය වියදම් - පුනරාවර්තන | 2,972 | 3,076 | 1,040 | 7,088 |
| - මූලධන | 3,133 | 3,395 | 327 | 6,855 |
| එකතුව | 6,105 | 6,471 | 1,367 | 13,943 |
| වසර අග ඉතිරි වීම් - පුනරාවර්තන වියදම් | 154 | 155 | 44 | 353 |
| - මූලධන | 1,538 | 1,281 | 11 | 2,830 |
| එකතුව | 1,692 | 1,436 | 55 | 3,183 |

18. කර්මාන්ත අමාත්‍යාංශය

**ශීර්ෂය - 149**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්ත්වාගණනය නොකළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | අමාත්‍යාංශ පුස්තකාලයෙහි පවතින පොත් වටිනාකම අගය කර වත්කමක් ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | අමාත්‍යාංශය සතු වත්කම් අගය කර මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතුය. | අමාත්‍යාංශයේ පුස්තකාලයෙහි පවතින පොත් වටිනාකම අගය කිරීමට කටයුතු කිරීම. | මේ සඳහා සංවර්ධන නිලධාරීන් 4 දෙනෙකු යොදා දැනට පවතින පොත් වල නාම ලේඛනයක් සකස් කරමින් පවතියි. 2022 මර්තු 11 වන විට එම කාර්යය අවසන් කිරීමට අපේක්ෂා කරන බව. |
| 02. | මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ රු.18,940,000 ක් වටිනා මෝටර් රථ 3ක කල්බදු ගිවිසුම 2020 දෙසැම්බර් 31 දින වන විට අවසන්ව තිබුණද එය වත්කමක් ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අමාත්‍යාංශය සතු වත්කම් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතුය. | අමාත්‍යාංශය වෙත පැවරීමට අවශ්‍ය ලිපි ලේඛණ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට බාර දී ඇත. | මූල්‍ය කල්බදු වාරික සම්පූර්ණයෙන් ගෙවා ඇති බවට ජාතික අයවැය දෙපාර්තුමේන්තුව දන්වා ඇතත් අදාල වාරික ප්‍රේෂණය කරන ලද බැංකු වලින් ලිපි ප්‍රමාද වීම මත පූර්ණ ලෙස අප අමාත්‍යාංශය වෙත පැවරීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අවශ්‍ය ලිපි ලේඛණ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | බාර දී ඇත. ඒ අනුව පවරා ගැනීමට අදාල ඉදිරි කටයුතු කර එම වාහන අමාත්‍යාංශයේ වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. |
| 03. | කර්මාන්ත අමාත්‍යාංශය නමින් ලියාපදිංචි රු.13,400,000 ක වටිනාකමැති මෝටර් රථ 3ක් වත්කමක් ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | අමාත්‍යාංශය සතු වත්කම් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතුය. | -එම- | -එම- |
| 04. | අමාත්‍යාංශය විසින් වැය දරා ඉදිකරන ගොඩනැගිලි වටිනාකම එහි මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කළ යුතු වුවත් 1997 වර්ෂයේ සිට කර්මාන්තපුර 30ක ඉදිකළ පරිපාලන ගොඩනැගිලි 14ක වටිනාකම වූ රු.මිලියන 105.878 ක ප්‍රමාණය අමාත්‍යාංශය විසින් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ප්‍රාග්ධනිත වියදම් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුය. | 2021.08.04 දින රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ පැවැත්වූ රැස්වීමේදී සාකච්ඡා කල පරිදි අදාල වටිනාකම ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | එක් එක් කර්මාන්තපුර අයත් වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා අනෙකුත් රජයේ කාර්යාල සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව කර්මාන්තපුර ස්ථාපිත කර ඇති ඉඩම් සම්බන්ධව වැය කර ඇති වටිනාකම වත්කම් ලෙස හදුනා ගැනීම සඳහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගෙන |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ඉදිරියේදී එම වත්කම් අමාත්‍යාංශයේ වත්කම් ලෙස හෝ අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු කරන බව. |
| 05. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.104(1)- 104 (4) ප්‍රකාරව 2019 හා 2020 වර්ෂයන්හිදී අලාභයන් සිදුවූ වාහන අනතුරු පිළිවෙලින් 08 ක් හා 01ක් සම්බන්ධයෙන් පරීක්ෂණ නිලධාරින් පත්කර තිබුණද මෙතෙක් කිසිදු වාර්තාවක් ලබා දී නොතිබුණි. එසේම 2020 වර්ෂයේදී වාහන අනතුරු 05 කට සිදුවූ අලාභ සම්බන්ධයෙන් කිසිදු නිලධාරියකු 2021 මාර්තු 31 දින තෙක් පත්කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ වන විට මු.රෙ. 104 පරීක්ෂණ සඳහා කමිටු 6ක් පත් කර ඒ අනුව රාජකාරි පවරා ඇති බව හා ඉදිරියේදී මෙම තත්වයන් වළක්වා ගැනීම සඳහා සැලසුම් සහගත වැඩ පිළිවෙලක් සකස් කර ඇත. | අමාත්‍යාංශය සතු වාහන සම්බන්ධ අනතුරු (2019/2020) හා අලාභ හානි ප්‍රතිපූර්ණය කිරිමේදී මු.රෙ. 103 හා මු.රෙ. 104 ට අනුකූලව කටයුතු කිරිම පිළිබඳ වර්තමාන තත්ත්වය පහත පරිදි වේ.<br>• පරීක්ෂණ කටයුතු අවසන් කොට ඇති වාර්තා ගණන 07කි.<br>• ලේකම්තුමාගේ අත්සනට ඉදිරිපත් කොට ඇති වාර්තා ගණන 03කි.<br>• විගණන නිලධාරීන් සඳහා ලබා දී ඇති ගණන 07කි.<br>( කමිටු වාර්තා ලැබී ඇති අතර එම වාර්තා අතිරේක ලේකම් (පාලන) සහ ජ්‍යෙෂ්ඨ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | සහකාර ලේකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ලේකම්තුමාගේ අත්සනට ඉදිරිපත් කල යුතුවේ)<br>• පරීක්ෂණ කටයුතු සිදුවෙමින් පවතින වාර්තා ගණන 08කි.<br>2022 අප්‍රේල් 30 දිනට පෙර අවසන් කිරීමට අපේක්ෂිතයි. |
| 06. | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කි.මී. 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් හෝ එන්ජීමට සම්බන්ධ අළුත්වැඩියාවකට පසුව යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් චක්‍රලේඛය නිකුත් කළ දින සිට මෙතෙක් එසේ කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ වන විට පරීක්ෂා කිරීම ආරම්භ කර ඇත. | අමාත්‍යාංශය සතු සියලුම සංචිත වාහන වල 2020/2021 වර්ෂවලදී ඉන්ධන පරීක්ෂාව සිදුකර අවසන් බව. |

| | | | | |
|---|---|---|---|---|
| 07. | 2009 ජූනි 17 දිනැති අංක 9/2009 (1) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍ය කාර්ය මණ්ඩලය තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රය මගින් සනාථ කිරීම කළ යුතු බව සඳහන් වුවද අමාත්‍ය කාර්ය මණ්ඩලය එසේ කර තිබූ බවට විගණනයට තොරතුරු අනාවරණය නොවීය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිළිතුරු දක්වා නැත. | ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීම පිළිබඳ අමාත්‍ය කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇති බව. |
| 08. | අමාත්‍යාංශය යටතේ පවතින කර්මාන්තපුර 32හි ඉඩම් කට්ටි **(Plots)** 913 ක් පැවතිණි. 2020 දෙසැම්බර් 31 දින වන විට ඉන් 627 ක විවිධ ආයෝජනවල නිරත ආයෝජකයින්ගේ කර්මාන්තද, පොදු පහසුකම් සඳහා 104ක්ද, ආයෝජකයින්ට ලබා දීමට යෝජිත භූමි 66 ක්ද වූ අතර ඉඩම් කට්ටි **(Plots)** 118 ක් එනම්, මුළු ඉඩම් කට්ටි වලින් සියයට 13ක ප්‍රමාණයක් කර්මාන්තකරුවන්ට ලබා නොදී නිශ්කාර්යව පැවතුණි. | සුදුසු ආයෝජකයින් තෝරා ඉඩම් ලබාදී කර්මාන්ත ආරම්භ කරවීමට කටයුතු කළ යුතුය. | 2020.01.24 දින කර්මාන්තපුරවල පවතින හිස් ඉඩම් කට්ටි පිළිබඳව භාෂා ත්‍රිත්වයෙන්ම පුවත්පත් 03ක දැන්වීමක් පළ කර ඇති බව. | 2022 වර්ෂයේ ජනවාරි මාසයේදී නව ඉඩම් කොටස් 93ක් ආයෝජකයන් සඳහා බදු පදනම මත ලබා දී ඇති අතර මෙම ඉඩම් කොටස් අතර 2021 වර්ෂයේදී පුළුල් කරන ලද කළුතර කර්මාන්තපුරයේ ඉඩම් කොටස් 17ක් ද වේ. ඒ අනුව දැනට පවතින හිස් ඉඩම් ප්‍රමාණය ඉඩම් කට්ටි 69 ක් බව. |

| | | | | |
|---|---|---|---|---|
| 09. | අමාත්‍යාංශය විසින් මන්නාරම කර්මාන්තපුරය තුල යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් 2019 ජුනි 30 වන විට රු.මිලියන 306.96 ක වියදමක් දරා තිබුණද 2019 ඔක්තෝබර් 15 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී එහි එකදු කර්මාන්තශාලාවක් හෝ ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. තවද කර්මාන්තපුරය තුල ආයෝජකයන් වෙනුවෙන් රු.මිලියන 100.05 ක පිරිවැයක් දරා අමාත්‍යාංශය විසින් එක් ගොඩනැගිල්ලක් වර්ග අඩි 20,000 බැගින් වූ කර්මාන්තශාලා ගොඩනැගිලි 02 ක් ඉදිකර තිබුණු අතර එහි ආයෝජනය කිරීමට මෙතෙක් ආයෝජකයෙකු ඉදිරිපත් නොවීම නිසා එම ගොඩනැගිලි නිෂ්කාර්යව පවතුණි. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ යුතු අතර වැඩ අවසන් කරන ලද ගොඩනැගිලි අදාල අරමුණු ඉටුකර ගැනීම සඳහා භාවිතා කළ යුතුය. | වැළැක්වීමටගත් ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | මන්නාරම කර්මාන්තපුරයන් අක්කර 2 රූඩ් 2 පර්චස් 19.74ක් හා ඉදි කර ඇති ගොඩනැගිලි 2ක ජේ.ජේ. මිල්ස් ආයතනය වෙත වසර 35ක බදු පදනම මත 2022 ජනවාරි මස 06වන දින ලබා දෙන ලදී. ඒ අනුව එම ආයතනය සිදු කිරීමට බලාපොරොත්තු වන ආයෝජනය රු.මිලියන 260 ක් වන අතර අපේක්ෂිත රැකියා උත්පාදනය 718කි. |
| 10. | වැලිඔය කර්මාන්තපුරයෙහි කර්මාන්ත සඳහා වෙන්කර ඇති භූමි ප්‍රමාණය අක්කර 40 ක් වූ | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටු | -එම- | ඇඟලුම් ආශ්‍රිත නිශ්පාදන සිදු කරන ආයෝජකයන් තිදෙනෙක් සඳහා එම ගොඩනැගිලි 3 ලබා දී |

| | | | | |
|---|---|---|---|---|
| | අතර අමාත්‍යාංශය විසින් ඒ සඳහා දරා තිබුණු සමස්ථ වියදම රු.මිලියන 256.94 ක් විය. 2019 දෙසැම්බර් 31 දිනට කිසිදු කර්මාන්තයක් ස්ථාපිත කර නොතිබුණි. අමාත්‍යාංශය විසින් 2019 වර්ෂය වන විට රු. මිලියන 178.78 ක වියදමක් දරා කර්මාන්තශාලා, ගොඩනැගිලි 03 ක් ඉදිකර තිබුණද එම ගොඩනැගිලි තුල කර්මාන්ත ආරම්භ කිරීමට කිසිදු ආයෝජකයෙකු ඉදිරිපත් වී නොතිබුණෙන් එම ගොඩනැගිලි නිෂ්කාර්යව පැවතුණි. | කිරීමට කටයුතු කළ අතර වැඩ අවසන් කරන ලද ගොඩනැගිලි අදාල අරමුණු ඉටු කර ගැනීම සඳහා භාවිතා කළ යුතුය. | | ඇති බව හා ඇඟලුම් ආශ්‍රිත නිශ්පාදන කර්මාන්තශාලා 3ක් ඉහත ආයෝජකයන් තිදෙනා විසින් පවත්වාගෙන යනු ලබන බව. මේ දක්වා සිදු කර ඇති පෞද්ගලික ආයෝජනය රු.මිලියන 278 ක් බව හා උත්පාදනය කර ඇති රැකියා ප්‍රමාණය 610 ක් බව. |
| 11. | මුසලි ඇගළුම් හා ඒ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධන ව්‍යාපෘතියේ මූලික කටයුතු වෙනුවෙන් 2015 වර්ෂයේදී පාර්ශවයන් 3 කට රු. මිලියන 167.9 ක් ගෙවා තිබුණද ඉඩම් අත්කර ගැනීම සම්බන්ධ ගැටළු හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබූ අතර 2020 ජූලි 01 දින වන විටත් එම මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කල යුතු වීම හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු වීම. | -එම- | මේ සම්බන්ධයෙන් ගෙවා ඇති මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා සාකච්ඡා කරමින් පවතින බව. |

| | | | | |
|---|---|---|---|---|
| 12. | අමාත්‍යාංශය සතු වාහන 05 ක් වර්ෂ 1-3 අතර කාල පරාසයක සිට අළුත්වැඩියා කිරීමකින් තොරව නිශ්කාර්යව පැවතිණි. මෙම වාහන 05 තුල 2012, 2013, 2014 වර්ෂවල මිලදී ගත් මෝටර් රථ 03 ක්ද ඇතුලත් විය. | කඩිනමින් අළුත්වැඩියාවට යොමුකළ යුතු අතර නවීන වාහන පරික්ෂාකාරීව භාවිතා කළ යුතුය. | -එම- | 2012,2013 සහ 2014 වර්ෂවල මිල දී ගත් වාහන වනුයේ පිළිවලින් KW-8777, KY-3709, GA-8170 අංක දරණ වාහන වේ. මෙහි දී Discovery රථ 2ක අළුත්වැඩියා කිරීමට රු.මිලියන 200ක් පමණ වැයවන බවට ඇස්තමේන්තු කැඳවීමේ දී සඳහන් වූ අතර එම අළුත්වැඩියාවන්ට අදාල ප්‍රතිපාදන නොලැබීම මත අළුත්වැඩියාවන් සිදු කිරීමට නොහැකි වී ඇති බව. අංක GA-8170 දරන රථයට එතරම් මුදලක් වැය නොවන අතර මෙම කාර්යය ප්‍රසම්පාදන අංශයට බාර කර ඇතත් මේ දක්වා එම රථය ද අළුත්වැඩියා කර නොමැති බව භාවිතයෙන් ඉවත් කර තිබූ 65-9992 KG-0791 යන වාහන මේ වන විට අළුත්වැඩියා කර ධාවනයට යොදා ඇති බව. |

| | | | | |
|---|---|---|---|---|
| 13. | නංවමු ලංකා ජාතික වැඩසටහන යටතේ පරිපාලන, පුහුණු හා වෙනත් වියදම් ලෙස රු.16,772,403ක් වැයකර දිවයින පුරා පුහුණු වැඩසටහන් පවත්වා තිබුණු අතර බදුල්ල, මාතලේ හා මහනුවර දිස්ත්‍රික් ප්‍රතිලාභීන්ට බෙදාහැරීම සඳහා 2019 අග හා 2020 මාර්තු මසට පෙර මිලදී ගත් රු.මි.55.8 ක් වටිනා භාණ්ඩ කාර්මික සංවර්ධන මණ්ඩල ප්‍රධාන කාර්යාලයට රැගෙනවිත් වසරක වැඩිකාලයක් ගතවී තිබුණද ඒවා ප්‍රතිලාභීන් වෙත බෙදාහැර නොතිබුණි. ඒවායේ වගකීම් කාලයද ඉක්මවමින් ගබඩා කිහිපයක අපිළිවෙලකට ගොඩගසා නිශ්කාර්යව රඳවා තිබුණි. | මෙතෙක් බෙදා නොහැර පවතින මෙම භාන්ඩ කඩිනමින් ප්‍රතිලාභීන් වෙත බෙදා හැරීමට කටයුතු කළ යුතුය. | -එම- | උක්ත ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් මෙතෙක් නොබෙදා ඇති භාණ්ඩ මුළු දිවයිනම ආවරණය වන පරිදි ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිත කර්මාන්ත පෝෂණයෙන් ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ගෘහ ව්‍යවසායක ජවය ව්‍යාපෘතිය හරහා සුදුසු ප්‍රතිලාභීන් වෙත බෙදා දීමට සැලසුම් කර ඇති බව. |
| 14. | අමප/16/1424/723/039 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථාන ව්‍යාපෘතිය (CERA) ආරම්භ කිරීමට අවශ්‍ය යන්ත්‍ර මිලදී ගැනීමට හා | වැය කළ මුදල නිශ්කාර්ය වීමට නොදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමට කටයුතු කළ යුතුය. | -එම- | කර්මාන්ත අමාත්‍යතුමාගේ නිර්දේශ මත සභාපතිවරයෙකු හා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල |

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල ගොඩනැගිල්ලක් නවීකරණය කිරීමට රු.මිලියන 120 ක් පමණ වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා බඳවා ගත් විධායක නිලධාරියාට 2017 සැප්තැම්බර් සිට 2018 ඔක්තෝබර් දක්වා කාලයට මසකට රු.725,000 බැගින් වැටුප් හා දීමනා ලෙස එකතුව රු.මිලියන 11 ක් පමණ ගෙවා තිබුණද සමාගමක් වශයෙන් ලියාපදිංචි කර අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම කර නොතිබුණි. මෙම ව්‍යාපාරයේ අසාර්ථකත්වය මත කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති මෙම ව්‍යාපෘතිය 2018 දෙසැම්බර් 28 දිනැති 2013 /14 දරණ ගැසට් පත්‍රය මගින් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත පවරා තිබූ අතර නැවත 2020 අගෝස්තු සිට කර්මාන්ත අමාත්‍යාංශය යටතට පවරා තිබුණි. තත්ත්වය එසේ තිබිය දී 2020 නොවැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති බව හා අදාල අමාත්‍ය මණ්ඩල තීරණය ලද පසු මෙම ව්‍යාපෘතියේ කටයුතු නැවත ආරම්භ කිරීමට කටයුතු සම්පාදනය කරනු ඇති බව.

| | | | | |
|---|---|---|---|---|
| | තීරණ අංක 20/1725/320/025 පරිදි ව්‍යාපෘතියට අදාල යන්ත්‍රෝපකරණ කොළඹ 10, ට්‍රේස් සිටි වෙත ගෙන යාමට තීරණය කර තිබුණි. | | | |
| 15. | 2020 ඔක්තෝබර් 06 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අමාත්‍යාංශය වෙත පවරන ලද ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සඳහා අමාත්‍යාංශයට අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරින් 277 දෙනෙකු ලබා දී ඇත. කෙසේ වුවද මෙම නිලධාරින් සඳහා අමාත්‍යාංශය විසින් වැටුප් හා වේතන ගෙවුවද අමාත්‍යාංශයේ හා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ අනුමත කාර්යය මණ්ඩලය තුල මෙම කාර්යය මණ්ඩලය ඇතුලත් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ හෝ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ අනුමත කාර්යය මණ්ඩලයට මෙම සංවර්ධන නිලධාරින් ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වේ. | -එම- | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කරන ලදුව අනුමැතිය ලද බව හා මෙම අමාත්‍යාංශයට අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන් 275 දෙනෙකු කාර්යය මණ්ඩලයට ඇතුළත් කිරීමට කටයුතු කරන ලදි. |

## 16. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය | | | | |
| පුනරාවර්තන | 1,827,032,360 | 2,419,098,000 | 1,144,420,000 | 5,390,550,360 |
| මූලධන | 9,991,773,000 | 13,079,892,000 | 3,370,840,000 | 26,442,505,000 |
| එකතුව | 11,818,805,360 | 15,498,990,000 | 4,515,260,000 | 31,833,055,360 |
| සත්‍ය වියදම් | | | | |
| පුනරාවර්තන | 1,640,844,319 | 1,890,080,956 | 1,074,868,999 | 4,605,794,274 |
| මූලධන | 4,015,814,108 | 4,832,504,621 | 2,829,763,731 | 11,678,082,460 |
| එකතුව | 5,656,658,427 | 6,722,585,577 | 3,904,632,730 | 16,283,876,734 |
| වසර අග ඉතිරිවීම් | | | | |
| පුනරාවර්තන | 186,188,041 | 529,017,044 | 69,551,001 | 784,756,086 |
| මූලධන | 5,975,958,892 | 8,247,387,379 | 541,076,269 | 14,764,422,540 |
| එකතුව | 6,162,146,933 | 8,776,404,423 | 610,627,270 | 15,549,178,626 |

## 19. ධීවර අමාත්‍යාංශය

ශීර්ෂය - 151

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| 01. | 2018 වාර්ෂික ඇස්තමේන්තු මඟින් ධීවර ප්‍රජාව බල ගැන්වීමේ ව්‍යාපෘතියට වෙන් කළ මුදලින් රු.මිලියන 4 ක් ධීවර සංස්ථාවට ලබාදී තිබුණි. විශේෂ නීතියකින් සැපයෙන අධිකාර බලයක් නොමැතිව එම මුදලින් සංස්ථාව ත්‍රිකුණාමලයේ මත්ස්‍ය වෙළඳ සංකීර්ණයෙහි තීන්ත ආලේප කිරීමේ වියදම් රු.මිලියන 3.7 ක් හා විදුලි පද්ධතිය අළුත්වැඩියා වියදම් රු.235,221 ක් වශයෙන් 2017 වර්ෂයේ වියදම් පියවා ගැනීමට යොදවා තිබුණි. | මුදල් රෙගුලාසි 200(2) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු මඟින් හා විශේෂ නීතියකින් සැපයෙන අධිකාර බලයක් මත වියදම් දැරිය යුතු වීම. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නොවෙනස්ව පවතී. |
| 02. | ධීවර අමාත්‍යාංශය ඒ ඒ වර්ෂය සඳහා ප්‍රතිපාදන ඉතිරි වී නොතිබිය දී හා ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට බැඳී තිබීම් නිරීක්ෂණය විය. ඒ අනුව 2018 වර්ෂයේ දී වැය විෂයයන් 10 ක් සඳහා රු.මිලියන 627 ක් සඳහා ද 2019 වර්ෂයේ දී වැය විෂයයන් 3 ක් සඳහා රු.මිලියන 47.99 ක් සඳහා ද 2020 වර්ෂයේ දී එක් වැය විෂයයක් සඳහා රු.මිලියන 4.9 ක් සඳහා ද ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා බැඳීම් ඇති කරගෙන තිබුණි. | ප්‍රතිපාදන මත පමණක් වියදම් සඳහා බැඳීම් ඇති කරගත යුතුය. | එවැනි බැඳීම් ඇතිකර නොගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නොවෙනස්ව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| **03.** | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල රු.21,959,713 ක් වටිනා කාර්යාල ගොඩනැගිලි 2019 වර්ෂය තුල හුවමාරු වූ (Transfer) අයිතම වශයෙන් අපහරණයන් යටතේ දක්වා තිබුණ ද අපහරණය කර තිබුණු ගොඩනැගිලි පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අපහරණය කර තිබුණු ගොඩනැගිලි පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එසේම පවතී. |
| **04.** | **කරෛයිනගර් බෝට්ටු අංගනයේ පහසුකම් වැඩි දියුණු කිරීම** | | | |
| | (අ) බෝට්ටු අංගනයේ ඉන්ටර් ලොග් ගල් ඇතිරීම වෙනුවෙන් වූ පිරිවිතරය වර්ග මිලිමීටරයට නිව්ටන් 20 ක $(20\ N/mm^2)$ ශක්තියෙන් යුතු ගල් වෙනුවට ප්‍රමිතියෙන් අඩු වර්ග මිලිමීටරයට නිව්ටන් 9.73 සිට 18 දක්වා පරාසයක ගල් වෙනුවෙන් රු.මිලියන 14.76 ක් ගෙවා තිබුණි. | ප්‍රමාණ පත්‍රයේ සඳහන් පිරිවිතරයට අනුව සපයා ඇතිරීමට කටයුතු කළ යුතු වීම. | ක්‍රියාමාර්ග ගෙන නැත. | ප්‍රමිතියෙන් තොර ද්‍රව්‍ය සපයා ගෙවීම් කර වසර 3 කට ආසන්නව ඇතත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| | (ආ) බෝට්ටු අංගනයේ ඉන්ටර් ලොග් ගල් ඇතිරීමට පෙර භූමිය සකස් කරගැනීම සඳහා ප්‍රමාණ පත්‍රයේ සඳහන් නොවූ ABC මිශ්‍රණය වෙනුවෙන් අනුමැතියකින් තොරව ඝණ මීටර් 1,054.61 ක් සඳහා රු.මිලියන 8.89 ක් ගෙවා තිබුණි. | -එම- | -එම- | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | (ඇ) බෝට්ටු අංගනයේ පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ පැකේජ 3 ක් යටතේ රු.මිලියන 238.8 ක්වූ ඉදිකිරීම් 2019 මාර්තු 22 දින නිමකර අමාත්‍යාංශය වෙත භාරදී තිබුණ ද 2019 ජුනි 30 දින වනවිටත් බෝට්ටු අංගනය භාවිතයට ගෙන නොතිබුණි. | වැඩ නිමකිරීම් සහතිකයක් ඉදිරිපත් කිරීමෙන් පසු ඵලදායීව භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වීම. | අමාත්‍යාංශය විසින් සී-නොර් පදනමට භාර දීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| **05.** | මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමට මිරිදිය ජලාශ සඳහා මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීමේ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත රු.මිලියන 30 ක අරමුදල් සැපයීම 2008 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණු අතර 2019 වර්ෂය දක්වා අඛණ්ඩව ඒ වෙනුවෙන් මුදල් වෙන්කර වියදම් දරා තිබුණි. 2008 ජුලි 02 දිනැති අංක 08/1248/351/016 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට 2008 ජුලි මස 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මෙම ව්‍යාපෘතියට රු.මිලියන 30 බැගින් වාර්ෂික ඇස්තමේන්තුවට ඇතුළත් කිරීමට අනුමැතිය ලබාදී තිබුණ ද එම පත්‍රිකාවට ශ්‍රී ලංකා මහා බැංකුවේ අදහස් දැක්වීම අනුව වසර 5 ක දී ධීවර කර්මාන්තයේ යෙදෙන්නන්ගේ ආදායම වැඩිවීම හේතුවෙන් ස්වයං මූල්‍යකරණයකට යොමු වීම අවශ්‍ය බව දක්වා තිබුණි. එහෙත් අමාත්‍යාංශය විසින් මෙම වැය විෂයය සඳහා වර්ෂ 05 ක් ඉක්මවා තවත් වර්ෂ 07 ක් අඛණ්ඩව රු.මිලියන 30 බැගින් අධිකාරිය වෙත අරමුදල් වෙන්කර දී තිබුණ ද ධීවර කර්මාන්තයේ යෙදෙන්නන්ගේ ආදායම වැඩිවීම සලකා ස්වයං මූල්‍යකරණයකට යොමු කිරීමක් පිළිබඳව පසුවිපරම් කිරීමක් හෝ අධිකාරියේ ක්‍රියාකාරකම් පිළිබඳ අධීක්ෂණයක් හෝ කළ බවට තොරතුරු නොතිබුණි. | මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීමේ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත වාර්ෂිකව ප්‍රතිපාදන ලබාදීම නවතා ස්වයං මූල්‍යකරණයකට යොමු කළ යුතුය. | පසුවිපරම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2020 වර්ෂයේදී රු.30,160,000 ක් වෙන්කර රු.30,150,719 ක් වැය කර තිබුණද පසු විපරම් කිරීමක් හෝ අධීක්ෂණයක් කළ බවට තොරතුරු නොවීය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| **06.** | 2019 වර්ෂය සඳහා ධීවර වරායන් හා නැංගුරම් පොළවල් ඉදිකිරීම ඇතුලු ක්‍රියාකාරකම් 20 ක් සඳහා රු.මිලියන 1586.57 ක මුදලක් වෙන්කර තිබුණු අතර වර්ෂය තුල ධීවර වරායන් 05 ක් ඉදිකිරීම ඇතුලුව ක්‍රියාකාරකම් 11 ක් සඳහා රු.මිලියන 1066.78 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ. | | | | |
| | (අ) | කළමැටිය ධීවර වරාය ඉදිකිරීම 2014 වර්ෂයේ ආරම්භකර 2017 වර්ෂයේ දී අවසන් කළ යුතුව තිබුණ ද 2019 වර්ෂයේ දී ද රු.මිලියන 105.24 ක් වැයකර තිබුණි. නමුත් වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් ඉක්මගොස් තිබුණ ද ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබුණි. | අපේක්ෂිත කාලපරිච්ඡේදය තුල කාර්යයන් අවසන් කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | ප්‍රමාදයන් වළක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නැත. | ඉදිකිරීම් වැඩ අවසන් කර මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට පියවර ගෙන නැත. |
| | (ආ) | රු.මිලියන 350 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ 2018 ජුනි අවසන් කළ යුතුව තිබුණු මිරිස්ස හරිත ධීවර වරාය ඉදිකිරීමේ ඉතිරි වැඩ වෙනුවෙන් 2019 වර්ෂය සඳහා රු.මිලියන 18 වෙන්කර තිබුණ ද ඒ සඳහා කිසිදු මුදලක් වැය කළ බවක් හෝ ප්‍රගතියක් හෝ ලබා නොතිබුණි. | ඉදිකිරීම් නිමකරවාගෙන භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | -එම- | 2016 අයවැය යෝජනාවක් මත 2016–2020 දක්වා මුදල් වෙන්කිරීම් කර තිබුණ ද ඉදිකිරීම් වැඩ අවසන් කර නැත. |
| **07.** | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු වෙත පවරා තිබූ මෝටර් රථය වලංගු රියැදුරු බලපත්‍රයක් රහිතව එම නිලධාරියා බීමතින් ධාවනය කර 2018 | | රාජකාරියේ දී සිදුකරන විෂමචාරයන් පිළිබඳව ආයතන සංග්‍රහයේ xvii | විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නැති අතර දැනට මෙම |

| | | | |
|---|---|---|---|
| ජුනි 05 දින අනතුරුව පත්කර අමාත්‍යාංශයට රු.997,824 ක අලාභයක් සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් අත්හිටවූ සිර දඬුවම් නියම කර රු.10,500 ක දඩ නියම කර තිබුණු අතර අනුමැතියකින් හා විධිමත් ක්‍රියාපටිපාටියකින් තොරව නිලධාරියා විසින් රු.423,000 ක් වැයකර වාහනය අලුත්වැඩියා කර අමාත්‍යාංශයට භාර දී තිබුණි. | පරිච්ඡේදය 2 අනුව අදාල නිලධාරීන්ට එරෙහිව තනතුර කුමක් ද නොබලා විනය නියෝග ක්‍රියාත්මක කළ යුතු වීම. | | නිලධාරියා ඉඩම් අමාත්‍යාංශයේ සේවය කරනු ලබයි. |

## 8. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| ඇස්තමේන්තු වෙන්කිරීම් | පුනරාවර්තන | 1,315,080,000 | 1,383,200,000 | 240,000,000 | 2,938,280,000 |
| | මූලධන | 5,600,000,000 | 4,421,300,000 | 265,500,000 | 10,286,800,000 |
| | **එකතුව** | **6,915,080,000** | **5,804,500,000** | **505,500,000** | **13,225,080,000** |
| ශුද්ධ ප්‍රතිපාදනය | පුනරාවර්තන | 1,663,910,000 | 1,432,800,000 | 240,000,000 | 3,336,710,000 |
| | මූලධන | 7,339,451,000 | 4,721,300,000 | 315,500,000 | 12,376,251,000 |
| | **එකතුව** | **9,003,361,000** | **6,154,100,000** | **555,500,000** | **15,712,961,000** |
| සත්‍ය වියදම | පුනරාවර්තන | 1,620,827,042 | 1,414,897,713 | 231,480,121 | 3,267,204,876 |
| | මූලධන | 3,361,965,224 | 2,407,484,287 | 294,386,107 | 6,063,835,618 |
| | **එකතුව** | **4,982,792,266** | **3,822,382,000** | **525,866,228** | **9,331,040,494** |
| වසර අග ඉතිරිවීම් | පුනරාවර්තන | 43,082,958 | 17,902,287 | 8,519,879 | 69,505,124 |
| | මූලධන | 3,977,485,776 | 2,313,815,713 | 21,113,893 | 6,312,415,382 |
| | **එකතුව** | **4,020,568,734** | **2,331,718,000** | **29,633,772** | **6,381,920,506** |

## 20. සංචාරක අමාත්‍යාංශය

**ශීර්ෂය - 159**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය කළ මතය

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01. සූර්ය විදුලි පහන් කණු සවි කිරීමට වැඩ විෂයක් යටතේ එකක් රු. 30,000 කට සිදුකර තිබුණි. එම කාර්යයට අමතර වැඩ විෂයක් යටතේ එකක් රු.151,200 කට එකඟ වීම හේතුවෙන් රු. 6,423,600 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | අනාවරණය කරගත හැකි අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණි. | අමතර වැඩ විෂයයක් යටතේ වැඩිපුර ගෙවීම් සිදුකර තිබුණි. |
| 02. 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන චක්‍රලේඛය ප්‍රකාරව 2020 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැළැස්මේ යාවත්කාලීන කරන ලද සංවිධාන සටහන සහ අනුමත කාර්යය මණ්ඩලය හා දැනට සේවයේ නියුතුව සිටින කාර්යය මණ්ඩලය පිළිබඳ දත්ත ඇතුලත්කර නොතිබුණු අතර ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද 2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්යය සාධන වාර්තාව පිළියෙල කල යුතුව තිබුණ නමුත් එය පිළියෙල කර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | චක්‍රලේඛයට අනුගත වී 2020 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික කාර්යය සාධන වාර්තාව පිළියෙල කළ යුතු වීම. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛයට අනුකූලවී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 03. | රජයේ මුදල්, ආදායම්,මුද්දර හෝ බඩු බාහිරාදිය, භාරගැනිම හෝ භාරව සිටිම, නැතහොත් රජයේ මුදල්, මුද්දර නැතහොත් බඩු බාහිරාදිය බෙදා හැරිම හෝ නිකුත් කිරිම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු නිලධාරින් ද, රජයේ ගිණුමට අදාල වවුචර,සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද, ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවද, අමාත්‍යාංශයේ ඇතැම් නිලධාරින්ගෙන් එසේ ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප ආඥා පනත අනුව කටයුතු කලයුතු වීම. | රජයේ නිලධාරින්ගේ ඇප තැබීම් වලට අදාලව මෙම අමාත්‍යාංශයේ නිලධාරින් රාජ්‍ය සේවා අන්‍යොන්‍ය ඇපකාර සංගමයේ ඇප තැනපත් කිරිම සඳහා ඉල්ලුම් කර ඇති බව. | නිලධාරින්ගෙන් ඇප ලබා ගෙන නොතිබුණි. |

## 04. ප්‍රතිපාදන උපයෝජනය

| | | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|---|
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | පුනරාවර්තන | 438,760,000 | 266,210,000 | 144,454,000 | **849,424,000** |
| | මූලධන | 479,900,000 | 902,150,000 | 219,913,000 | **1,601,963,000** |
| | එකතුව | 918,660,000 | 1,168,360,000 | 364,367,000 | **2,451,387,000** |
| **ශුද්ධ ප්‍රතිපාදන** | පුනරාවර්තන | 438,040,200 | 266,210,000 | 144,454,000 | **848,704,200** |
| | මූලධන | 855,619,800 | 902,150,000 | 219,913,000 | **1,977,682,800** |
| | එකතුව | 1,293,660,000 | 1,168,360,000 | 364,367,000 | **2,826,387,000** |
| **සත්‍ය වියදම** | පුනරාවර්තන | 119,036,945 | 263,463,754 | 135,996,936 | **518,497,635** |
| | මූලධන | 338,991,345 | 372,031,694 | 159,449,244 | **870,472,283** |
| | එකතුව | 458,028,290 | 635,495,448 | 295,446,180 | **1,388,969,918** |
| **වසර අග ඉතිරිය** | ප්‍රනරාවර්තන | 319,003,255 | 2,746,246 | 8,457,064 | **330,206,565** |
| | මූලධන | 516,628,455 | 530,118,306 | 60,463,756 | **1,107,210,517** |
| | එකතුව | 835,631,710 | 532,864,552 | 68,920,820 | **1,437,417,082** |

**21. පරිසර අමාත්‍යාංශය**

ශීර්ෂය - 160

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරික්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | පරිසර මාවත වැඩසටහන 2017 වර්ෂයෙන් පසුව ඉදිරියට ගෙනයාමට අපොහොසත් වීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා ළඟාවීමට නොහැකි වී තිබුණි. | අදාළ කාර්යය නිම කිරීමට අවශ්‍ය විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ සලකා බැලිය යුතුය. | ජාතික පාරිසරික ක්‍රියාකාරි සැලැස්මේ හරිත නගර වැඩසටහන ඇතුළත් කිරීම. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම වැඩසටහන සම්බන්ධව නිශ්චිත හඳුනාගැනීම් සිදුකර නොතිබුණි. |
| 02. | අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ල ඉදිකර වසර 1 ½ පමණ ගතවී තිබුණද ඊට අදාල ප්‍රමාණපත්‍ර රේට් අනුමත කර නොතිබුණි. එසේ තිබියදීත් ඇස්තමේන්තු වටිනාකමින් සියයට 88 ක් එනම් රු.මිලියන 991.22ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් සම්බන්ධ ප්‍රමාණපත්‍ර සඳහා විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදී එම අමාත්‍යාංශයේ අදාල අධ්‍යක්ෂවරයා සමග සාකච්ඡා කර ඇත. රේට් අනුමත කිරීමේ ප්‍රමාදයන් වලක්වා ගැනීම අමාත්‍යාංශයට පාලනය කරගත නොහැකි කරුණක් වී ඇති බව දන්වා ඇත. | අමාත්‍යාංශයේ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ප්‍රමාණ පත්‍ර රේට 2022 ජනවාරි වන විටත් අනුමත කර නොතිබුණි. |
| 03. | අළුත්වැඩියාකර ධාවනයේ යෙදවිය හැකි තත්ත්වයේ පවතින වාහන 08 ක් මාස 02 සිට අවුරුදු 06 ක කාලයක් ධාවනයේ යොදවා නොතිබුණි. | අළුත්වැඩියා කළ යුතු වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. | KK-9635 දරන මෝටර් රථය අළුත්වැඩියා කිරීම සඳහා දේශීය නියෝජිතායතනය ඇස්තමේන්තු ගත | මුදල් ප්‍රතිපාදන නොමැතිවීම. හේතුවෙන් අමාත්‍යාංශ පරිශ්‍රයේ රඳවා තබා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | මුදලින් සියයට 50 ක අත්තිකාරම් ඉල්ලුම් කර ඇති නිසා එම අළුත්වැඩියා කිරීම මේ දක්වා ප්‍රමාද කර ඇත. HQ - 4331 ජීප් රථය අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් වී නොතිබීම මත එය ප්‍රමාද වී ඇත. මේ සඳහා රු.මිලියන 2.7 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති අතර එවැනි මුදලක් වියදම් කිරීම ආර්ථික වශයෙන් ඵලදායීවේද යන්න පිළිබඳ නිර්දේශය ලබාදිම සඳහා කමිටුවක් පත් කර ඇති බව දක්වා ඇත. එම කමිටුවේ නිර්දේශය අනුව ඉදිරි කටයුතු කරන බව වාර්තා කර ඇත. | |
| 04. | ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු අතර එය ප්‍රතිපත්තිවලට පමණක් සීමා වී තිබුණි. | අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කර නිවැරදිව අපද්‍රව්‍ය කළමනාකරණය කළ යුතුය. | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලයෙන් අනුමත වී ඇති අතර, එහි විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණය ද ඇතුළත් කර ඇත. | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අනුමත කර තිබුණද ඉලෙක්ට්‍රොනික භාණ්ඩ නිෂ්පාදකයන්ගේ විස්තිරණ වූ වගකීම් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | යටතේ රෙගුලාසි 2022 ජනවාරි 31 දින වන විටත් නිකුත්කර නොතිබුණි. |
| 05. | ඇස්තමේන්තුගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් 33,536,000 ක් වූ ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදලේ කොරියානු ණය ආධාර මත ක්‍රියාත්මක සන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2015 ජුනි 29 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. එහෙත් 2020 මැයි වන විටත් ව්‍යාපෘතියේ සැලසුම් අදියරේ කටයුතු පමණක් අවසන් කර තිබුණි. මේ නිසා ව්‍යාපෘති කාලසීමාව 2021 දක්වා දීර්ඝ කර තිබුණි. එසේම මෙම ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 6 ½ ක් ගත වී ඇතත්, බිම් පිරවුම් 04 හි ඉදිකිරීමේ කටයුතු මේ දක්වාම ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි ඊට අදාළ කාර්ය සාධනයන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය අමාත්‍ය මණ්ඩලය මගින් අවසන් කර තිබුණද ඉදිරි කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය හඳුනාගෙන නොතිබුණි. |
| 06. | අමාත්‍යාංශයේ කළමනාකරණ සේවයේ නිලධාරියකු විසින් සිදු කර තිබූ වංචාවක් සම්බන්ධයෙන් රු.260,361 ක මුදලක් අයවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොපියවූ | අත්තිකාරම් පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | අයකර ගැනීම පිළිබඳ උපදෙස් විනය බලධාරින්ගෙන් විමසා ඇති බව. | 2022 ජනවාරි 31 වන විටත් අදාල මුදල අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අග්‍රිම ශේෂයක් ලෙස එම මුදල ගිණුම්වල දක්වා තිබුණි. | | | |
| 07. | මුදල් රෙගුලාසි 891(i) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වාගත යුතු වුවත් අමාත්‍යාංශය විසින් එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව. | 2022 ජනවාරි වන විටත් ඇපලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| 08. | 2019 වර්ෂයේදී සුහුරු දේශගුණික විපර්යාස නගර ව්‍යාපෘතිය සඳහා සුදුසු සුහුරු නගර තෝරා ගැනීමේදී යාවත්කාලීන වූ දත්තයන් භාවිතා කර නොතිබුණි. ව්‍යාපෘතිය මගින් තාක්ෂණික සහය ලබාදෙන අතර අනුගත වීම් (Adaptation) හා අවම කිරීම් (Mitigation) වශයෙන් අදියර 02 කින් සමන්විත විය. මේ සඳහා අමාත්‍යාංශය 2020 ජූලි මස වර්ෂයක කාලයකට ගිවිසුම් ගතව තිබුණද එම කටයුතු නිමකර නොතිබුණි. | ව්‍යාපෘති වලින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යාවත්කාලීන දත්ත පදනම් කර ගනිමින් ව්‍යාපෘති සැලසුම් කල යුතු අතර නියමිත කාලය තුළ නිමකළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ව්‍යාපෘතිය 2220 ජනවාරි දක්වාම නිමකර නොතිබුණි. |
| 09. | ශබ්ද දූෂණය පාලනය සම්බන්ධයෙන් දැනට පවතින රෙගුලාසි සංශෝධනය කර නව රෙගුලාසි හඳුන්වාදීමටත්, බහුවිධ වාහන නලා මෙරටට ගෙන්වීම තහනම් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග 2021 ජුනි වන විටත් ගෙන නොතිබුණි. | නව රෙගුලාසි හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. | මේ සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් සමඟ රැස්වීම් කිහිපයක් පරිසර අමාත්‍යාංශයේදී පවත්වා ඇති බව. ඒ අනුව, පරිසර අධිකාරිය විසින් අදාල | 2022 ජනවාරි වනවිටත් රෙගුලාසි නිකුත් වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | රෙගුලාසීන් සංශෝධනය කිරීමටත්, ක්‍රියාත්මක කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට පැවරීමට යෝජනා වී ඇති බවත්, මේ වන විට පරිසර අධිකාරිය විසින් අදාල රෙගුලාසීන් සංශෝධනය කරමින් පවතින බවත් වාර්තා කර ඇත. | |
| 10. | දේශගුණික විපර්යාසය මගින් මෙරටට ඇතිවීමට ඇති අහිතකර බලපෑම් අවම කිරීම සඳහා දේශගුණික විපර්යාස බලපෑම් සඳහා අනුහුරුවීමේ ජාතික සැලැස්ම 2016 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමටත් ඒ සඳහා අරමුදල් සපයා ගැනීමට ජාතික අනුවර්තික අරමුදලක් පිහිටුවීමටත් සැලසුම් කර තිබුණද එම අරමුදල පිහිටුවා නොතිබුණි. | සැලසුම් කරන ලද කාලය වර්ෂ 04 කින් ඉක්මවා ඇති බැවින් අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කල යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | 2022 ජනවාරි දක්වාම අරමුදල පිහිටුවා නොතිබුණි. |
| 11. | හානිකර ආක්‍රමණශීලි ශාක හා සත්ව විශේෂ මෙරටට පැමිණීම වැලැක්වීම හා එම ශාක හා සතුන් විනාශ කිරීම සඳහා නව පනතක් කෙටුම්පත් කිරිමේ යෝජනාව 2009 වර්ෂයේදී පරිසර හා | පනත ස්ථාපිත කර ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය | ආක්‍රමණශීලි ශාඛ හා සත්ව විශේෂ මෙරටට ගෙන්වීම වැළැක්වීම හා එම ශාක හා සත්ව විශේෂ විනාශ කිරීමට අදාල වන ආගන්තුක ජීවී විශේෂ විධිවිධාන | 2022 ජනවාරි වන විටත් පනත අනුමත කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ස්වාභාවික සම්පත් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබුණි. එම යෝජනාව 2009 ජනවාරි 22 දින අමප/09/0047/359/001 මගින් අනුමත කර තිබුණද විගණිත දිනය දක්වා නව පනතක් ස්ථාපිත වී නොතිබුණි. | | පිළිබඳ පනත කෙටුම්පත් කර අවසන් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත නොවැම්බර් 08 දිනැතිව යවා ඇති බව. | |
| 12. | මව් කිරිවල ශරීරයට අහිතකර වන "dioxin – like" (DL) ප්‍රමාණයක් අඩංගු වී තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා 2019 අගෝස්තු 07 වන දින පරිසර අමාත්‍යාංශ ලේකම් සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් ගිවිසුමකට එළඹ තිබුණි. මේ සඳහා රු.1,000,000 ක මුදලක් වැය කිරීමට එකඟ වී ඇතත්, 2021 අප්‍රේල් 09 දින වන විට අවස්ථා දෙකකදී රු.600,000 මුදලක් පමණක් වැයකර තිබුණි. | වියදම් කරන ලද මුදලේ කාර්ය සාධනය පරීක්ෂා කල යුතුය. | ව්‍යාපෘතියේ ගිවිසුම අනුව ගිවිසුම් අත්සන් කරන අවස්ථාවේදී ගෙවීමට නියමිත රු.300,000 (ගිවිසුම් ගත මුදලින් 30%) හා දෙවන ගෙවීම් සඳහා අදාල කාර්යන් නිමකිරීමෙන් පසු අදාළ මුදල වන රු.300,000 මුදල වශයෙන් රු.600,000 ක් ගෙවන ලද බවත්, ගිවිසුමට අදාල අනෙකුත් කටයුතු මෙතෙක් ඉටු කර නොමැති බැවින් එම කටයුතු අවසන් වන තෙක් ඉතිරි මුදල් ගෙවීම් කල නොහැකි බවත් වාර්තා කර ඇත. | 2022 ජනවාරි වන විටත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි. |
| 13. | 2019 දෙසැම්බර් 19 දින පැවැත්වූ 15 වන මෙහෙයුම් කමිටු රැස්වීමේදී (Steering Committee) පැස්සුම් | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එහි කාර්යසාධන නිර්නායක හඳුනාගැනීම හා එහි | ආපදා මවුවරුන් හඳුනාගැනීම හා රෝහල්වලින් සාම්පල ලබාගැනීමේ කටයුතු | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | ආයතනවල (Welding plait) සේවයේ නියුතු නිලධාරීන්ගේ පවුල්වලින් සහ ප්‍රථම දරු උපතින් සති දෙකක් මව්කිරි සාම්පල් භාවිතයෙන් 2020 මාර්තු වන විට නියැදි ලබාගත යුතු බවට දක්වා තිබුණද 2021 අප්‍රේල් 09 දින වන විටත් මේ සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | ප්‍රායෝගික ක්‍රියාත්මක කිරිමේ හැකියාව කාලීනව පසුවිපරම් කල යුතුය. | මෙතෙක් ඉටුකර නොමැති බව. | |
| 14. | අමාත්‍යාංශයේ ගබඩාවේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බව 2019 වර්ෂයේදී ද දක්වා තිබූ අතර 2020 වර්ෂයේදීද එම අඩුපාඩු එසේම පවතින බව නිරීක්ෂණය විය. | සැලසුම් පිලියෙල කල යුතුවේ. | දැනට මෙම අමාත්‍යාංශයේ ගබඩාවට අමතර ඉඩකඩ සොයා ගැනීම අපහසු වී ඇති බවත්, ඉදිරියේදී අමාත්‍යාංශයේ අංශ වෙනස් කිරීමක් සිදුවන විට මේ සඳහා අවශ්‍ය අමතර ඉඩකඩ වෙන් කර ගැනීමට කටයුතු කිරීමට අවධානය යොමු කර ඇති බවත් දන්වා ඇත. | 2022 ජනවාරි වන විටත් මෙම තත්ත්වයම පැවතුණි. |
| 15. | අනුමත සේවක සංඛ්‍යාව 258 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 229 ක් විය. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 29 ක් විය. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 18 ක පුරප්පාඩු වූ අතර එහි ප්‍රතිශතය සියයට 62 ක් ක් විය. ඒ අනුව එය අමාත්‍යාංශයේ කාර්යසාධනයට ඍජුව බලපාන බව නිරීක්ෂණය විය. | අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනිම හෝ කාර්යමණ්ඩලය සංශෝධනය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | එක් එක් සේවාවන්ට අදාලව අනුමත කරන ලද තනතුරු පුරප්පාඩු 18 ක් පවතින බවත් ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ තනතුරු අනුමත කර ගැනීමට අමාත්‍යාංශය ඉල්ලුම්කර නැති බවත් පරිසර අමාත්‍යාංශයේ | -එම- |

| | |
|---|---|
| ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ අනුමත තනතුරු 05 ක් හා 2019 වර්ෂයේ සිට කාර්මික නිලධාරී විදුලි හා ජල හා ගොඩනැගිලි යන තනතුරු පුරප්පාඩුව පැවතුණි. සංවර්ධන නිලධාරි අතිරික්ත සේවක සංඛ්‍යාව 05 ක් විය. | පෙර කාර්යමණ්ඩලය ඇතුළත් නොවූ සහ වර්තමානයේ අවශ්‍යතාවයක් නොවන කෘෂිකර්ම සේවයේ හා ඉංජිනේරු සේවයේ තනතුරු සඳහා අනුමැතිය සංශෝධනය කර දෙන ලෙස ඉල්ලුම්කර ඇති බවත් වාර්තා කර ඇත. |

## 16. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---:|---:|---:|---:|
| **ශුද්ධ ප්‍රතිපාදනය** | රු. | රු. | රු. | රු. |
| පුනරාවර්තන | 3,895,079,000 | 4,297,435,000 | 961,350,000 | 9,153,864,000 |
| මූලධන | 39,674,885,000 | 37,378,953,000 | 321,714,105 | 77,375,552,105 |
| එකතුව | 43,569,964,000 | 41,676,388,000 | 1,283,064,105 | 86,529,416,105 |
| **සත්‍ය වියදම්** | | | | |
| පුනරාවර්තන | 3,856,999,780 | 3,544,129,514 | 945,595,233 | 8,346,724,527 |
| මූලධන | 34,117,241,430 | 22,170,392,899 | 232,023,196 | 56,519,657,525 |
| එකතුව | 37,974,241,210 | 25,714,522,413 | 1,177,618,429 | 64,866,382,052 |
| **වසර අග ඉතිරිවීම්** | | | | |
| පුනරාවර්තන | 38,079,220 | 753,305,486 | 15,754,768 | 807,139,474 |
| මූලධන | 5,557,643,571 | 15,208,560,101 | 89,690,909 | 20,855,894,581 |
| එකතුව | 5,595,722,791 | 15,961,865,587 | 105,445,677 | 21,663,034,055 |

## 22. වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

**ශීර්ෂය - 161**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වනජීවී භාරය වසා දැමීමට කටයුතු කළ යුතු බව දක්වා තිබුණ ද අමාත්‍යාංශය චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඇවර කිරීමට කටයුතුකර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඇවර කිරීමට කටයුතු කළ යුතුය. | වනජීවී භාරය වසා දැමීම සඳහා 2019 සැප්තැම්බර් 20 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලද අතර, 2019 ඔක්තෝම්බර් 30 දිනැති අමප/19/2674/106/043 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කිරීම. | 2022 ජනවාරි වන විටත් 2019 ඔක්තෝම්බර් 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| 02. | මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද වාහන අනතුරු 04 ක් සම්බන්ධව අනතුර සිදු වී මාස 5 ත් අවුරුදු 4 ත් අතර කාලයක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පූර්ණ වාර්තා ලබා දීමට කටයුතු කරමින් පවතී. | 2022 ජනවාරි වන විටත් පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 03. | වාහන අනතුරුවලට අදාලව රු.2,855,858 ක අලාභ සිදුවී තිබුණි. මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ එම අලාභ සටහන් කර නොතිබුණි. | වාහන අනතුරුවලට අදාළ අලාභ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. | ඉදිරි වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කිරීම. | - |
| 04. | 2017 පෙබරවාරි 01 දිනැති අංක අමප/16/26/98/708/039 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නව අභය භූමි ප්‍රකාශයට පත් කිරීම, ජාතික අභය භූමි තත්වයට උසස් කිරීම, ස්වභාවික රක්ෂිතයක් බවට පත් කිරීම හා අභය භූමි මායිම සංශෝධනය සිදු කළ යුතු වුවද කලාවැව ජාතික උද්‍යානය හා මාදුගඟ අභය භූමියේ මායිම් සංශෝධනය කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු කළ යුතුය.. | **(i)** කලාවැව ජාතික උද්‍යානය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් වී නොමැති අතර ප්‍රතිපාදන සපයා ගැනීමෙන් පසු මැනුම් කටයුතු සිදු කිරීම.<br>**(ii)** මාදුගඟ අභය භූමියේ මායිම් සංශෝධනය කිරීම මේ වන විටත් සිදු කරමින් පැවතීම. | 2022 ජනවාරි වන විටත් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු කර නොතිබුණි. |
| 05. | 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ සමස්ත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 26 ක් හා අතිරික්ත 01 ක් පවතින බව නිරීක්ෂණය විය. | පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීමටත් අතිරික්ත කාර්ය මණ්ඩලය ඉවත් කිරීමටත් කටයුතු කළ යුතුය. | පුරප්පාඩු තනතුරු සම්බන්ධයෙන් කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කිරීම. | 2022 ජනවාරි වන විටත් පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 06. ප්‍රතිපාදන උපයෝජනය

| | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|
| | ------- | -------- | -------- | --------- |
| | රු. | රු. | රු. | රු. |
| **ඇස්තමේන්තුගත** | | | | |
| **ප්‍රතිපාදනය** | | | | |
| පුනරාවර්තන වියදම් | 192,250,000 | 266,210,000 | 100,113,000 | 558,573,000 |
| මූලධන වියදම් | 852,000,000 | 902,150,000 | 1,356,152,000 | 3,110,302,000 |
| මුළු වියදම | 1,044,250,000 | 1,168,360,000 | 1,456,265,000 | 3,668,875,000 |
| **ශුද්ධ ප්‍රතිපාදනය** | | | | |
| පුනරාවර්තන වියදම් | 192,250,000 | 266,210,000 | 105,743,500 | 564,203,500 |
| මූලධන වියදම් | 852,000,000 | 902,150,000 | 1,364,201,500 | 3,118,351,500 |
| මුළු වියදම | 1,044,250,000 | 1,168,360,000 | 1,469,945,000 | 3,682,555,000 |
| **සත්‍ය වියදම** | | | | |
| පුනරාවර්තන වියදම් | 151,203,942 | 263,463,754 | 104,020,195 | 518,687,891 |
| මූලධන වියදම් | 434,653,773 | 372,031,674 | 1,149,630,065 | 1,956,315,512 |
| මුළු වියදම | 585,857,715 | 635,495,428 | 1,253,650,260 | 2,475,003,403 |
| **වසර අග ඉතිරි වීම්** | | | | |
| පුනරාවර්තන වියදම් | 41,046,058 | 2,746,246 | 1,723,305 | 45,515,609 |
| මූලධන වියදම් | 417,346,227 | 530,118,306 | 214,571,435 | 1,162,035,968 |
| මුළු වියදම | 458,392,285 | 532,864,552 | 216,294,740 | 1,207,551,577 |

## 23. ජල සම්පාදන අමාත්‍යාංශය

**ශීර්ෂය - 166**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 තත්ත්වාගණනය කළ මතය
2019 තත්ත්වාගණනය කළ මතය
2020 තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | ගංවතුර ආධාර වෙනුවෙන් 2017 වර්ෂයේ දී වෙනත් ආයතනයකින් ලද රු. මිලියන 10 ක පරිත්‍යාග මුදල් රෙගුලාසි සංග්‍රහයේ 170 (2) (අ) ඡේදය ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර නොකර තැන්පත් ගිණුමේ රදවාගෙන තිබූ අතර එම මුදලින් ගංවතුර ආධාර නොවන වෙනත් කටයුතු සඳහා 2017, 2018 හා 2019 යන වර්ෂයන්හිදී පිළිවෙලින් රු.1,000,678 ක් හා රු.1,494,865 ක් හා රු.712,057 ක් වශයෙන් වැය කොට තිබුණි. | මුදල් රෙගුලාසි 170 (2) (අ) ප්‍රකාරව මෙම මුදල් රාජ්‍ය ආදායමට බැර කළ යුතුය. | මෙම පරිත්‍යාග 2017,2018 හා 2019 වර්ෂවල දී ගංවතුරෙන් හානියට පත් පවුල් සඳහා ආධාර ලබා දීම, මෙත්සරණ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ වූ වියදම් සහ වතුර ටැංකි බෙදාහැරීම යන කාර්යයන් සඳහා වියදම් දරන බව. | වර්තමාන තත්ත්වය වාර්තා කර නොමැත. |
| 02. | 2019 ජූනි 27 දිනැති අංක 03/2019 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛය ප්‍රකාරව වර්තමාන සේවා ස්ථානයේ වසර 05 කට වැඩි කාලයක් සේවයේ නියුතු නිලධාරීන් ස්ථාන මාරු වීම් වලට යටත් වුවද 2007 වර්ෂයේ සිට සේවයේ නියුතු සංවර්ධන නිලධාරී හා කළමනාකරණ | ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාන මාරුවීම් නිසි කාලය තුල ලබා දිය යුතු වීම. | සේවා ස්ථානයේ වසර 5 කට වැඩි කළමනාකරණ සේවා නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්ගේ විස්තර රාජ්‍ය සේවා හා පළාත් සභා හා පළාත් පාලන | මෙතෙක් ස්ථාන මාරුවීම් ලබා දී නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | සේවා නිලධාරී යන තනතුරු වලට අයත් නිලධාරීන් 25 ක් ස්ථාන මාරු වීම් නොලබා 2020 වර්ෂය අවසාන වන විටත් අඛණ්ඩව සේවයේ නිරත වී සිටි බව නිරීක්ෂණය විය. | | අමාත්‍යාංශය වෙත යවා ඇති බව. | |
| 03. | 2015 ජූලි 01 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 09 (අ) ඡේදය ප්‍රකාරව වාහන අයිතිය ආයතනය වෙත පවරා ගැනීමකින් තොරව 2020 වර්ෂයේ දී වාහන 04 ක් අපහරණය කිරීමට කටයුතු කර තිබුණි. | වාහන අපහරණය සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ව්‍යාපෘති වල භාවිතා කරන ලද ධාවනයට සුදුසු තත්ත්වයේ නොමැති වාහන මෙසේ අපහරණය කර ඇති බව | අපහරණය කිරීමේ දී පවරාගැනීමකින් තොරව සිදු නොකිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |
| 04. | අමාත්‍යාංශය විසින් සෘජුව ක්‍රියාත්මක කරන ලද 2018 වර්ෂය තුළ නිම කළ යුතුව පැවති කාලීන වකුගඩු රෝග නිවාරණ වැඩසටහන, ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, වැසි ජල ටැංකි ස්ථාපනය කිරීමේ වැඩසටහන සහ SACOSAN වැඩසටහන 2020 වර්ෂය අවසානය වන විටත් අපේක්ෂිත පරිදි නිම කර ගැනීමට නොහැකිව පැවතුණි. | වර්ෂය ආරම්භයේදී සැලැසුම් කළ පරිදි අදාළ ප්‍රගතීන් කරා ළඟා වීමට කටයුතු කළ යුතු ය. | භාණ්ඩාගාරයෙන් අක්මුදල් නිසි පරිදි නොලැබීම, කොවිඩ් 19 ව්‍යාප්තියෙන් ඇති වූ අහිතකර බලපෑම් යනාදිය හේතුවෙන් අපේක්ෂිත භෞතික ප්‍රගතිය ළඟා කර ගැනීමට 2020 වසරේ ද නොහැකි වූ බව. | වර්තමාන තත්ත්වය වාර්තා කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 05. | මහ පරිමාණ ජලසම්පාදන හා මලාපවහන ව්‍යාපෘතින් 11 ක් සම්බන්ධයෙන්, 2020 අවසන් කාර්තුමය ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත භෞතික ප්‍රගතිය ලබා කර ගැනීමට අපොහොසත්ව තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය. | වර්ෂය ආරම්භයේදී සැලසුම් කළ පරිදි අදාල ව්‍යාපෘති ප්‍රගතිය කරා ළඟා වීමට කටයුතු කළ යුතු වීම. | COVID 19 වසංගත තත්වය, කොන්ත්‍රාත් කරුවන්ගේ දුර්වල කාර්යසාධනය, පාරිසරික බලපෑම්, ඉඩම් නිරවුල් කර ගැනීමේ ප්‍රමාදයන් වැනි හේතූන් මේ සඳහා බලපා ඇති බව වාර්තා කර ඇත. | - එම - |
| 06. | අමාත්‍යාංශය විසින් ඍජුව ක්‍රියාත්මක කරන ලද හා 2020 වර්ෂය තුළ නිම කළ යුතුව තිබූ ව්‍යාපෘති 07 ක් වර්ෂය අවසානය වන විටත් අපේක්ෂිත පරිදි නිම කර ගැනීමට නොහැකිව පැවතුණි. | වර්ෂය ආරම්භයේ දී සැලසුම් කළ පරිදි අදාල ව්‍යාපෘති ප්‍රගතිය කරා ළඟා වීමට කටයුතු කළ යුතු වීම. | COVID 19 වසංගත තත්වය හේතුවෙන් රට වසා දැමීම ඇතුළු විවිධ කරුණු බලපා ඇති බව. | - එම - |
| 07. | වකුගඩු රෝග නිවාරණ වැඩ සටහන යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ ජල සම්බන්ධතා ලබාදීමේ ව්‍යාපෘතිය තුලින් නව ජල සම්බන්ධතා 650ක් ලබා දීමට ඉලක්ක කර තිබූ නමුත් 2020 වර්ෂය අවසානයට නව ජල සම්බන්ධතා 165ක් පමණක් ලබා දී තිබුණි. 2019 වර්ෂයේ එකී ව්‍යාපෘතිය වෙනුවෙන් ලද රු. 1,033,826 ක මුදල අදාල කායීය සඳහා යොදා නොගෙන 2020 වර්ෂයේදි රජයේ ආදායමට බැරකර තිබුණි. | ව්‍යාපෘතීන්ගෙන් අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට කටයුතු කල යුතු වීම. | නිර්දේශිත අඩු ආදායම් ලාභී නාම ලේඛණයට අනුව පාරිභෝගිකයින් 880 ක් සඳහා නව ජල සැපයුම් ලබා දෙන ලද බව. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| 08. | කලාපීය හවුල්කරුවන්ගේ සහභාගීත්වයෙන් වේගවත් ක්‍රියාකාරි ඉගෙනුම් වැඩ මුළුවක් සඳහා 2019 වර්ෂයේදි පොදු තැන්පත් ගිනුමේ තැන්පත් කර තිබූ රු.337,050 ක් හා රු.159,109 ක් වූ මුදල් අදාල කාර්‍යය සඳහා යොදා නොගෙන 2020 වර්ෂයේදි රජයේ ආදායමට බැර කර තිබුණි. | මු.රෙ. 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වීම. | ඉසව් කළමනාකරණය වෙනුවෙන් වැයවෙතැයි අපේක්ෂා කරනු ලැබූ මුදල් ඉතිරි වීම හේතුවෙන් රු337,050. ක් හා රු .රු 159,109. රාජ්‍ය ආදායමට බැරකරන ලද බව. | - එම - |
| 09. | යථෝක්ත කාරණය වෙනුවෙන් 2019 වර්ෂයේදි පොදු තැන්පත් ගිනුමේ රඳවා තිබූ රු.1,065,500ක මුදලින් අදාල අරමුණින් බැහැරව ජල ටැංකි මිලදී ගැනීම සඳහා රු. 1,048,593 ක් වැය කර තිබුණි. | ව්‍යාපෘතීන් වෙනුවෙන් ලැබී ඇති ප්‍රතිපාදන පරිබාහිර කටයුතු වෙනුවෙන් උපයෝජනය නොකල යුතු වීම. | මෙම ප්‍රතිපාදන මගින් කොවිඩ් 19 පැතිරීම අවම කිරිම සඳහා පාසල් වෙත ජල ටැංකි ලබා දීමට කටයුතු කරන ලද බව. | - එම - |
| 10. | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යය සාධනය, ඉඩම් නිරවුල් කර ගැනීමේ ප්‍රමාදයන්, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන්, පාරිසරික හා නැවත පදිංචි කිරීමේ ප්‍රමාදයන් යනාදි කරුණු හේතුවෙන් අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණයට යටත් වන විදේශ මූල්‍යාන ව්‍යාපෘති 12 ක් සඳහා නිම කිරීම් කාලය ඉක්මවා කොන්ත්‍රාත් දිගුවන් ලබාදී ඇති බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් එම ව්‍යාපෘති නිම කිරීමේ කාලය 2020 දෙසැම්බර් | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | ව්‍යාපෘති සඳහා කාලදිගු ලබා දීමට හේතුවූ කරුණු නිරාකරණය වී ඇති බැවින් නියමිත කාලසීමාවට අනුව ව්‍යාපෘති අවසන් කිරීමේ හැකියාව පවතින බව. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | 31 දින 82 සිට දින 1460 කාල පරාසයක සැලකිය යුතු ප්‍රමාදයක් පවතින බව ද නිරීක්ෂණය විය. | | | |
| 11. | කුඩා පරිමාණ ව්‍යාපෘතියක් වූ අන්දරගස්යාය ව්‍යාපෘතිය 2017 වර්ෂයේ ආරම්භ කොට 2020 අප්‍රේල් මාසයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණ ද 2020 දෙසැම්බර් 31 දිනට දින 245 ක ප්‍රමාදයකින් පසුවත් එම ව්‍යාපෘතිය නිම කිරීමට අපොහොසත්වී තිබුණි. | -එම- | වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | වර්තමානය වන විට දී අවශ්‍ය කරන අමුද්‍රව්‍ය සැපයීම් කොන්ත්‍රාත්තුව හා DI බට ඇතිරීම් කටයුතු හා බෙදාහැරීම් නල සවිකර අවසන් කර ඇති බව. |
| 12. | අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද 2020 දෙසැම්බර් 31 දිනට අවසන් කල යුතුව පැවති තිස්සමහාරාම ජල සම්පාදන ව්‍යාපෘතිය හා ත්‍රිකුණාමල ජල සම්පාදන ව්‍යාපෘතිය 2020 වර්ෂය අවසානය වන විටත් අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකිව පැවතුණි. | ව්‍යාපෘති සැලසුම් කළ පරිදි නිම කළ යුතුය. | - එම - | මෙම ව්‍යාපෘතිය 2023.02.23 වන විටදී අවසන් කිරීම සඳහා නව කොන්ත්‍රාත්තුවක් පිරිනමා ඇත. |
| 13. | රාජ්‍ය වියදම් කළමනාකරණයට අදාල 2010 මැයි 14 දිනැති අංක සීජ් /1/17/1 දරන ජනාධිපති කාර්යාල ලිපියේ 3.3 ඡේදය ප්‍රකාරව ජල සම්පාදන අමාත්‍යවරයා විසින් පරිහරණය කරනු ලබන ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් අංක CBG-7786 දරන වාහනය සඳහා මුදල් හා ක්‍රම සම්පාදන | ලබා දී ඇති ජනාධිපති කාර්යාල උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් ගරු මුදල් අමාත්‍යතුමා ගෙන් මෙම රථය ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා ගෙන ඇති බව | වර්තමාන තත්ත්වය වාර්තා කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | | | |
| 14. | අමාත්‍යාංශය විසින් 2018, 2019 සහ 2020 යන වර්ෂයන්හි දී පිළිවෙලින් වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන 11 ක්, 22 ක් සහ 07 ක් පරිහරණය කර තිබුණි. | වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන පරිහරණය කිරීමේ දී ඒවා විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ජල සම්පාදන මණ්ඩලයෙන් ලද වාහන හැර අනෙකුත් වාහන අමාත්‍යාංශය නමට පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | - එම - |
| 15. | ජල සම්පාදන අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේ දී වාහන 02 ක් ද, 2020 වර්ෂයේ දී වාහන 03 ක් ද, පලාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව, ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියට හා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙතද මුදාහැර තිබුණි. | වෙනත් ආයතන වලට මුදාහල වාහන නැවත ලබා ගැනීමට හෝ ඒවා විධිමත් පරිදි මුදා හැරීමට කටයුතු කළ යුතු වීම. | වාහන අවශ්‍යතාවය මත එම ආයතන දෙක සඳහා ලේකම්තුමාගේ අනුමැතිය ඇතිව එම රථ ලබා දී ඇති බව. | - එම - |
| 16. | හිටපු රාජ්‍ය ලේකම්වරයා මෙම අමාත්‍යාංශට පත්වීම් ලබා පැමිණීමේදී රැගෙන විත් තිබූ කුලී පදනම මත ලබා ගත් වාහනය සඳහා එකී වාහනය සැපයූ ආයතනය සමඟ අමාත්‍යාංශ ලේකම් විසින් නව කුලී ගිවිසුමකට ඇතුලත් වී තිබුණි. කෙසේ වෙතත්, අදාල නිලධාරියා නැවත ස්ථාන මාරු වී යාමෙන් පසු එකී වාහනය 2020 ජනවාරි සිට අප්‍රේල් දක්වා | අනාර්ථික ගනුදෙනු වැලැක්වීමට කටයුතු කල යුතු වීම. | මෙම රථය 2020 ජනවාරි සිට අප්‍රේල් මාසය දක්වා ලබා දීම සඳහා නිලධාරියකු නොමැති වීම හේතුවෙන් එය සංචිතයේ ධාවන කටයුතු වලට යොදාගන්නා ලද බව. | වර්තමාන තත්ත්වය වාර්තා කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | නිශ්කාර්යව තිබීම හේතුවෙන් ඒ වෙනුවෙන් ගෙවන ලද රු. 837,772 ක කුලී වියදම අමාත්‍යාංශයට අතිරේක වැය බරක් වී තිබුණි. | | | |
| 17. | අමාත්‍යාංශය විසින් 2018, 2019 හා 2020 යන වර්ෂයන්හි දී පිළිවෙලින් සේවකයින් 85 ක්, 18 ක් සහ 17 දෙනෙකු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් අමාත්‍යාංශ රාජකාරී සඳහා යොදවාගෙන තිබුණි. එකී සේවකයින් හා නිලධාරීන් වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු. 37,988,182 ක මුදලක් ජල සම්පාදන මණ්ඩලයට ප්‍රතිපූර්ණය කළ යුතුව තිබුණි. | වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත් අදාල ආයතන වෙත නැවත නිදහස් කළ යුතු වීම. | අමාත්‍යාංශයේ පවතින පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවා පලාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් යවා ඇති බව සහ සේවා අවශ්‍යතාවය මත ජාතික ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරීන්ගේ සේවය ද ලබා ගැනීමට සිදු වී ඇති බව. | ජාතික ජල සම්පාදන මණ්ඩලයෙන් අමාත්‍යාංශය වෙත නිදහස් කර ඇති නිලධාරීන්ගේ වර්තමාන තත්ත්වය 15 කි. |

## 18. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|
| ---------------- | ----------- | ----------- | ----------- | ----------- |
| ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන | | | | |
| - පුනරාවර්තන | 198,610,000 | 203,000,000 | 312,737,000 | 714,347,000 |
| - මූලධන | 34,811,740,000 | 53,605,795,000 | 75,667,563,000 | 164,085,098,000 |
| **එකතුව** | **35,010,350,000** | **53,808,795,000** | **75,980,300,000** | **164,799,445,000** |
| සත්‍ය වියදම් | | | | |
| - පුනරාවර්තන වියදම් | 177,957,134 | 188,371,099 | 311,721,848 | 678,050,081 |
| - මූලධන වියදම් | 32,330,743,333 | 48,656,897,094 | 65,384,967,368 | 146,372,607,795 |
| **එකතුව** | **32,508,700,467** | **48,845,268,193** | **65,696,689,216** | **147,050,657,876** |
| වසර අග ඉතිරිවීම් | | | | |
| - පුනරාවර්තන වියදම් | 20,652,866 | 14,628,901 | 1,015,152 | 36,296,919 |
| - මූලධන වියදම් | 2,480,996,667 | 4,948,897,906 | 10,282,595,632 | 17,712,490,205 |
| **එකතුව** | **2,501,649,533** | **4,963,526,807** | **10,283,610,784** | **17,748,787,124** |

## **24.** වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය

ශීර්ෂය - 176

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය නොකළ මතය

2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| 01. | අමාත්‍යාංශය විෂය පථයට අයත් නොවූ සූරියවැව ජාත්‍යාන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම් සඳහා ලබාගත් ණය මුදල් පියවීම සඳහා වෙනත් මූලධන වැය විෂයයන්ගෙන් මු.රෙ.66 යටතේ රු.650,000,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණද එසේ මාරු කරගත් සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.<br>කෙසේ වුවද එම ණය මුදල සඳහා වූ පොළී ලෙස පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මත රු. 278,835,112 ක් 2018 නොවැම්බර් 28 දින අමාත්‍යාංශය විසින් මහජන බැංකුව වෙත ගෙවා තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතුයි. | අවශ්‍යතාවය අනුව 176-2-4-26-2509 වැය විෂය සඳහා මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරුකර ගැනීම සිදු කලද වියදම් දැරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් අක්මුදල් සපයා ගැනීමට නොහැකිවීම මත ප්‍රතිපාදන ඉතිරි වූ බව හා එම මුදල 2018 වර්ෂයේ බැඳීමක් ලෙස දක්වා ඇති බව. | 2021 දෙසැම්බර් 21 දින වන විට ණය මුදලේ කොටස් ගෙවීම් ලෙස රු.329,238,238 ක් හා පොලී ගෙවීම් ලෙස රු.380,156,151 ක් ගෙවා තිබුණි. |
| 02. | යාපනය අර්ධද්වීපය හා දූපත් අතර මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා විධිමත් කිරීමේ අරමුණ ඇතුව 2016 වර්ෂයේදී නාවික ලේකම් කාර්යාලයේ යාපනය දිස්ත්‍රික් උප කාර්යාලය හා දියත් මඟ (Slipway) | ව්‍යාපෘති මනාව සැලසුම් කර ක්‍රියාත්මක කල යුතු අතර සාධාරණ කාල සීමාවන් තුලදී කටයුතු නිම කර | 2019 වර්ෂයේදී ප්‍රතිපාදන සලසා ඇතත් අක්මුදල් ලබා ගැනීමේ අපහසුතාවය නිසා යටිතල පහසුකම් | 2021 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ වැඩ අවසන් කර මහජන උපයෝජනය සඳහා යොදවා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිකිරීම යන ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. අදාල ඉදිකිරීම් 2017 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට සැලසුම් කර තිබුණද 2018 දෙසැම්බර් 31 දින වන විට මූලික ඉදිකිරීම් පමණක් අවසන්ව පැවති අතර 2020 ජූලි 31 වන දින වන විටත් ඉදිකිරීම් අවසන් කර මහජන උපයෝජනය සඳහා යෙදවීමට නොහැකිව තිබුණි. | මහජන උපයෝජනය සඳහා යෙදවීමට කටයුතු කල යුතු වීම. | සපයා ගෙන මහජන උපයෝජනය සඳහා යෙදවීමට බලාපොරොත්තු වන බව. | |
| 03. | සිංහරාජ ඒකාබද්ධ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන යටතේ ගාල්ල, මාතර, කළුතර හා රත්නපුර යන දිස්ත්‍රික්ක වල මාර්ග 978ක්, ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘති 58ක්, අධ්‍යාපන ව්‍යාපෘති 52ක් හා වෙනත් ව්‍යාපෘති 61 ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 710 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර 2019 වර්ෂය තුළ රු. මිලියන 274ක් පමණක් වැයකර තිබුණි. ඒ ඒ දිස්ත්‍රික්ක වල සිදු කල ව්‍යාපෘති සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබුණු කාර්ය සාධන වාර්තාව අනුව ව්‍යාපෘති 159ක් පමණක් ක්‍රියාත්මක කර තිබූ අතර ඉන් 18ක භෞතික ප්‍රගතිය සියයට 50ට අඩු මට්ටමක පැවතුණි. | වාර්ෂික ඇස්තමේන්තු වලට අනුගතව අපේක්ෂිත කාලරාමුව තුල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු වීම. | වාර්ෂික ඇස්තමේන්තු වල දැක්වෙන ඉලක්ක එවකට දක්ෂිණ සංවර්ධන විෂය පවරා තිබූ අමාත්‍යාංශය විසින් ලබා දී ඇති බව,<br>මෙම අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති 159ක් අනුමත කර ඇති බව හා එයින් ව්‍යාපෘති 131ක 100% ප්‍රගතියක් පෙන්නුම් කර ඇති බව.<br>මුදල් අමාත්‍යාංශය විසින් 2019 නොවැම්බර් 20 සිදු කල දැනුම් දීම මත රත්නපුර දිස්ත්‍රික්කයේ | වරාය හා නාවික අමාත්‍යාංශය යටතට මෙම විෂය ලබාදීමෙන් පසු එය ව්‍යාපෘති 159ක් ලෙස සංශෝධනය කර ඇත. එම ව්‍යාපෘති වලින් 2019.12.31 දිනට ව්‍යාපෘති 131 ක් 100% ප්‍රගතියක් ලගා කර ගෙන ඇත.<br>මෙම වැඩසටහනට අදාල ගොනු 2020.01.13 දින කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයට පැවරීම නිසා වර්තමාන ප්‍රගතිය වාර්තා කිරීමට |

| | | | | |
|---|---|---|---|---|
| | | | ව්‍යාපෘති 06ක් ක්‍රියාත්මක කර නොමැති බව. | හැකියාවක් නොමැති බව. |
| 04. | ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ILO සම්මුතියට අනුව, සියලුම ශ්‍රී ලාංකික නාවිකයන් සඳහා ජීව ලක්ෂණ සහිත අනන්‍යතා ලියවිල්ලක් නිකුත් කිරීමට 215 වර්ෂයේ සිට සැලසුම් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 20ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර රු. මිලියන 53.46ක් වැය කර තිබුණි. ක්‍රියාකාරී සැලසුම අනුව, ව්‍යාපෘතියට අදාල කර්යයන් අතරින් මෘදුකාංග සංවර්ධනය කිරීමේ කාර්යය සියයට 50කින් හා අනෙකුත් උපකරණ අත්පත් කරගැනීම් සියයට 80කින් අවසන් කිරීමට අපේක්ෂිත වුවද, වර්ෂය අවසානයට අත්පත්කර ගෙන තිබුණු ප්‍රගතිය සියයට 20ක් පමණක් වී තිබුණි. මේ හේතුවෙන් 2020 ජූලි 31 දින වනවිටත් ජීව ලක්ෂණ සහිත අනන්‍යතා පත්‍රයක් සැලසුම් කර අවසාන කර නොතිබුණි. | නිශ්චිත කාලරාමුව තුල අපේක්ෂිත කාර්යය සාධන මට්ටම කරා එළඹීම තුලින් ඉලක්කවෙත ලගාවීමට කටයුතු කල යුතු වීම. | නාවිකයන් සඳහා ජෛවමිතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ ව්‍යාපෘතිය 2020 මැයි 05 දින අවසන් වීමට නියමිත අතර මෘදුකාංග නිර්මාණය අවසන්ව ඇතත් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කාඩ්පත් ආනයනය කල නොහැකි බැවින් නිකුත් කිරීම් ප්‍රමාද වී ඇති බව. | 2022 පෙබරවාරි 18 මෙම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර ජෛවමිතික හැඳුනුම්පත් 1500 කට වැඩි ප්‍රමාණයක් නිකුත් කර ඇති බව. |
| 05. | සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉංජිනේරුමය අංශ වලට අයත් නාවික වෘතිකයන්ද ඇතුලුව ජ්‍යෝෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 15 ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 22ක් සහ ද්විතියික මට්ටමේ තනතුරු 35ක්ද පුරප්පාඩුව පැවතුණි. | අමාත්‍යාංශයේ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වා ගත යුතු වීම. | ජ්‍යෝෂ්ඨ මට්ටමේ තනතුරු සඳහා ස්ථිර හා කොන්ත්‍රාත් පදනම බඳවා ගැනීම සඳහා අදාල අනුමැතියන් ඉල්ලා ඇති බව හා | ඉංජිනේරුමය අංශවලට අයත් නාවික වෘතිකයන් බඳවා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බව හා ඒකාබද්ධ සේවයේ තනතුරු සහා |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඒකාබද්ධ සේවයේ තනතුරු පිරවීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත කීප අවස්ථාවක දන්වා ඇති බව. | ඒකාබද්ධ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපි යොමුකර ඇති බව. |
| 06. | අමාත්‍යාංශයෙන් ස්ථාන මාරු වී ගිය නිළධාරින්ගෙන් 2018,2019 සහ 2020 වර්ෂයන්හි අයවිය යුතු ණය ශේෂ පිළිවෙළින් රු.462,459, රු. 171,403 සහ රු. 171,402 වූ අතර මෙම ශේෂ වර්ෂ 16 කට වැඩි කාලයක් අය කර ගත නොහැකිව ඉදිරියට ගෙන එමින් පැවතුණි.<br>තවද 2018,2019 හා 2020 වර්ෂයන්හි වැඩ තහනම් කල හා සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ රු.293,470 ක් හා රු. 21,140ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ නිරවුල් කර ගැනීම සඳහා කටයුතු කලයුතු බව. | ස්ථාන මාරු වී ගිය නිළධාරින්ගෙන් අයවිය යුතු රු. 171,403 වූ ණය ශේෂ කපා හැරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කර ඇති බව හා වැඩ තහනම් කල නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.293,470 ක ණය ශේෂ මහාධිකරණ නඩු තීන්දුව මත ඔහුට හිමි පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව.<br>සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය | තිදෙනෙකුගේ ණය ශේෂ අංක 0/2020 දරන චක්‍රලේඛ උපදෙස් අනුව කපාහැර ඇති බව දෙදෙනෙකුගේ ණය ඉදිරියේදී කපාහැරීමට කටයුතු කරන බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ශේෂ පිළිබඳ ප්‍රගතියක් පෙන්වීම අපහසු බව දන්වා ඇත. | |
| 07. | නාවික ලේකම් කාර්යාලය විසින් 1971 අංක 52 දරණ වෙළඳ නැව් පනත හා එහි සංශෝධන මත අය කරනු ලබන අනුකූලතා සහතික, අඛන්ඩ මුදා හැරීමේ සහතික හා අනුපිටපත් නිකුත් කිරීමේ ගාස්තු යන ගාස්තු වර්ග තුන හැරුණු විට කාණ්ඩ 10කට අයත් අනෙකුත් ගාස්තු වර්ග 50කට අධික සංඛ්‍යාවක් 2006 වර්ෂයෙන් පසුව 2020 වර්ෂය තෙක් කිසිදු සංශෝධනට ලක්කර නොතිබුණි. | 01/2018 හා 2018 ජනවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි කටයුතු කල යුතු බව | සේවා සම්පාදනයේදී අය කරනු ලබන ගාස්තු 15% කින් වැඩිකරමින් සකස් කරන ලද ගාස්තු සංශෝධන කෙටුම්පත 2018.02.12 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව කට ඉදිරිපත් කරන ලද බව, යෝග්‍ය පරිදි ගාස්තු සංශෝධන කෙටුම්පතක් සකස්කර ඉදිරිපත් කරන ලෙස රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් වාචිකව අප වෙත උපදෙස් ලබා දී ඇති බව හා ඒ අනුව ලේකම්ගේ අනුමැතියෙන් පත් කරන ලද කමිටුවක් විසින් නැවත ගාස්තු සංශෝධන | ගාස්තු සංශෝධන අනුමැතිය සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |

කෙටුම්පත
සකස්කර
2019.02.30 දින
රාජ්‍ය මුදල්
දෙපාර්තමේන්තු
වේ අනුමැතියට
ඉදිරිපත් කර ඇති
බව. අනතුරුව එම
ගාස්තු සංශෝධන
කෙටුම්පත පිළිබඳ
සාකච්ඡාවක්
භාණ්ඩාගාර
නියෝජ්‍ය
ලේකම්ගේ
ප්‍රධානත්වයෙන්
පවත්වා ඇති බව
හා එම
සාකච්ඡාවේදී
නාවික
ක්ෂේත්‍රයන්ට
අදාළ
ආයතනයන්ගේ
අදහස් හා
යෝජනා
ලබාගෙන නැවත
සංශෝධන
කෙටුම්පත
ඉදිරිපත් කරන
ලෙස භාණ්ඩාගාර
නියෝජ්‍ය ලේකම්
විසින් උපදෙස්
ලබා දී ඇති බව.
කොවිඩ් 19
හේතුවෙන් නාවික

ක්ෂේත්‍රය පරිහානියට ලක් වී ඇති අවස්ථාවක ගාස්තු වැඩි කිරීමට විරුද්ධ බවට අදහස් ඉදිරිපත් වී ඇති බව හා නැවත සාකච්ඡාවක් පවත්වා නාවික ක්ෂේත්‍රයට බලපෑමක් ඇති නොවන පරිදි ගාස්තු සංශෝධන කෙටුම්පත සංශෝධනය කර නැවත කඩිනමින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව.

## 08. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය<br>--------- | 2018<br>-------<br>රු. | 2019<br>--------<br>රු. | 2020<br>--------<br>රු. | එකතුව<br>---------<br>රු. |
|---|---|---|---|---|
| **ශුද්ධ ප්‍රතිපාදනය** | | | | |
| පුනරාවර්තන වියදම් | 509,565,000 | 869,586,000 | 754,301,000 | 2,133,452,000 |
| මූලධන වියදම් | 3,,394,619,040 | 3,113,790,000 | 227,144,000 | 6,735,553,040 |
| මුළු වියදම | 3,904,184,040 | 3,983,376,000 | 981,445,000 | 8,869,005,040 |
| **සත්‍ය වියදම** | | | | |
| පුනරාවර්තන වියදම් | 490,329,791 | 837,976,255 | 749,369,759 | 2,077,675,805 |
| මූලධන වියදම් | 1,056,799,250 | 1,543,551,566 | 17,353,158 | 2,617,703,974 |
| මුළු වියදම | 1,547,129,041 | 2,381,527,821 | 766,722,917 | 4,695,379,779 |
| **වසර අග ඉතිරි වීම්** | | | | |
| පුනරාවර්තන වියදම් | 19,235,209 | 31,609,745 | 4,931,241 | 55,776,195 |
| මූලධන වියදම් | 2,337,819,790 | 1,570,238,434 | 209,790,842 | 4,117,849,066 |
| මුළු වියදම | 2,357,054,999 | 1,601,848,179 | 214,722,083 | 4,173,625,261 |

## 25. නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය

ශීර්ෂය - 192

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 තත්ත්වාගණනය කළ මතය

| විගණනයේ නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01. අංක අමප/1610738/703 /033 දරන 2016 මැයි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික බල ඇණියක් මාලි රාජ්‍ය තුල ස්ථාපිත කිරීමට අවශ්‍ය අවි ආයුධ, සන්නද්ධ රථ, ප්‍රවර්ථන වාහන, සන්නිවේදන උපකරණ ඇතුළු අනෙකුත් උපකරණ මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. මේ සඳහා නිලධාරීන් 320 දෙනෙකුට 2016 වර්ෂයේදී පුහුණුව ලබාදී තිබුණි. තවද 2017 හා 2018 වර්ෂ දෙකේදී රු. මිලියන 792 ක් උපකරණ මිලදී ගැනීම සඳහා වැයකර තිබුණ අතර එම උපකරණ කටුකුරුන්ද කඳවුරේ ගබඩා කර තිබුණි. එහෙත් එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා එක්වීම 2019 මැයි මාසය වන විටත් ඉටුවී නොතිබුණි. | ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයා ගැනීම ඇතුළු අරමුණු ඉටුකර ගැනීමට ආරම්භකර ඇති ව්‍යාපෘතිය සඳහා විශාල කාල පමාවක් සිදුව ඇති බැවින් නොපමාව ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ළඟාකර ගත යුතුය. | සාම සාධක රාජකාරී සඳහා පිටත්වීමට අවශ්‍ය ඉතිරි වාහන හා උපකරණ මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතින බව. | මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂය අවසාන වන විට රු. මිලියන 1110 ක් වැයකර ඇත. රු. මිලියන 1933 ක මුළු වියදම් ඇස්තමේන්තුවක් තුල ඉතිරි වාහන හා උපකරණ සපයා ගැනීමෙන් පසු අදාල පරීක්ෂණ සම්පූර්ණකර 2022 වර්ෂය තුල සාමසාධක රාජකාරී සඳහා පිටත්කිරීමට අපේක්ෂා කරයි. |

## 02. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | | 2018 |
|---|---|---|
| 1. | විගණන මතය | තත්ත්වාගණනය කළ මතය |
| 2. | ශුද්ධ ප්‍රතිපාදනය | |
| | - පුනරාවර්තන | 8,343,394,000 |
| | - මූලධන | 3,923,460,000 |
| | එකතුව | 12,266,854,000 |
| 3. | සත්‍ය වියදම | |
| | - පුනරාවර්තන වියදම් | 7,800,629,840 |
| | - මූලධන වියදම | 2,233,635,125 |
| | එකතුව | 10,034,264,965 |
| 4. | වසර අග ඉතිරිවීම් | |
| | - පුනරාවර්තන වියදම් | 542,764,160 |
| | - මූලධන වියදම් | 1,689,824,875 |
| | එකතුව | 2,232,589,035 |

## 26. කම්කරු අමාත්‍යාංශය

**ශීර්ෂය - 193**

මූලා‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 තත්ත්වාගණනය කළ මතය

2019 තත්ත්වාගණනය කළ මතය

2020 තත්ත්වාගණනය කළ මතය

| විගණන නිරීක්ෂණය | | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | 2019 දෙසැම්බර් 31 දිනට සේවය අතහැර ගොස් වසර 5 කට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබූ කලමණාකාර සහකාර නිලධාරිනියකගෙන් අයකර ගත යුතු රු.138,501 ක් අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.4.1 වගන්තියේ දැක්වෙන පරිදි අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | වර්තමාන ණය ශේෂ අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කිරීම හා පැරණි ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය සියලු පියවර ගැනීම. | පැරණි ණය ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය සියලු පියවරයන් ගෙන ඇති බව. | කම්කරු අමාත්‍යාංශයේ සේවය කරන ලද මෙම නිලධාරිනිය 2014 ජූනි 25 දින විදේශගත වී ඇති බව ආගමන විගමන පාලක විසින් දන්වා ඇති බැවින් ඇයට විරුද්ධව නීතිපතිවරයාගේ මග පෙන්වීම මත නඩු පැවරීමට කටයුතු කර ඇත. එහි තීන්දුව ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම. |
| 02. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් කම්කරු අමාත්‍යාංශයේ ලේකම් නමින් ලියාපදිංචි කර ඇති වාහන ලැයිස්තුවේ පැවති වාහන 09 ක් දැනට අමාත්‍යාංශය සතුව නොපැවතුණි. | අමාත්‍යාංශය නමින් ලියාපදිංචි රථවාහන වල භෞතික පැවැත්ම හා ඒවායේ වර්තමාන භාවිතය පිළිබඳ යාවත්කාලීන තොරතුරු පවත්වාගතයුතු වීම. | අමාත්‍යාංශය සතු සියළුම වාහන හා ඒවායේ භෞතික පැවැත්ම හා වර්තමාන භාවිතය සම්බන්ධයෙන් විධිමත් තොරතුරු පද්ධතියක් | දැනට අමාත්‍යාංශය සතුව නොමැති මෙම වාහන කම්කරු අමාත්‍යාංශය/ කම්කරු හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති බව මෝටර් රථ ප්‍රවාහන |

| | | | | |
|---|---|---|---|---|
| | | | යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇති බව. | දෙපාර්තමේන්තුව සනාථ කර ඇත. එවකට අමාත්‍යාංශය යටතේ පැවති වෘත්තීය පුහුණු අධිකාරියෙන් 2021 ජූලි 08 දින මෙම වාහන පිළිබඳ තොරතුරු තිබේ නම් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති අතර මෝටර් රථ ප්‍රවාහන පලාත් කොමසාරිස් වෙතින් 2020 ජූලි 08 දින මෙම වාහන සම්බන්ධයෙන් ආදායම් බලපත්‍ර නිකුත් නොකරන ලෙස දැනුම් දී මීට පෙර ආදායම් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ තොරතුරු ඉල්ලා ඇත. මෙම තොරතුරු ලද පසු අදාල ආයතනවලට අයිතිය පවරාදීමට කටයුතු කරනු ලබන බව. |
| 03. | සේවයේ නියුක්තව සිටියදී සේවකයින්ට වන මාරක නොවන අනතුරු හා මාරක අනතුරු හේතුවෙන් සේවායෝජක ආයතන වෙතින් වන්දි කොමසාරිස් කාර්යාලය අයකරගත් වන්දි මුදල්වලින් | වන්දි ආඥා පනතේ රෙගුලාසි ප්‍රකාරව හදිසි අනතුරුවලින් මියයන සේවා නියුක්තිකයන්ගේ යැපෙන්නන් සඳහා කඩිනමින් සහන | වන්දි ආඥා පනත යටතේ අනතුරුවලින් මියයන සේවා නියුක්තිකයන්ගේ යැපෙන්නන් සඳහා වන වන්දි මුදල් කඩිනමින් නිරවුල් | 2020.12.31 වන විටත් නිදහස් කර නොමැතිව තැන්පත් ගිණුමෙහි පැවති ශේෂයන් මේ වන විටත් නිදහස් කිරීමට ඇති ලිපි ගොනු සංඛ්‍යාව 8 ක් වන අතර |

| | | | | |
|---|---|---|---|---|
| | 2020 දෙසැම්බර් 31 වන විට රු.6,837,248 ක ශේෂයක් නිරවුල් නොකර පැවතුණි. සේවකයින් හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ නිවැරදි තොරතුරු නොමැතිවීම, ප්‍රතිලාභීන්ගේ වන්දි මුදල් ගෙවීමට අදාල ලියකියවිලිවල අඩුපාඩු පැවතීම හා ඒවා කාර්යාලය වෙත ඉදිරිපත් නොකිරීම යනාදී හේතු නිසා මෙම වන්දි මුදල් ගෙවීමට නොහැකිව පැවතුණු අතර එහි ප්‍රමාද කාලය මාස 05 සිට වර්ෂ 04 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. | ලැබෙන පරිදි කටයුතු කලයුතුවීම. | කිරීමට අවශ්‍ය සෑම පියවරක්ම ගනු ලබන බව. | එහි වටිනාකම රු.1,858,312.87 ක් වේ. මෙම ගොනු සම්බන්ධයෙන් පෞද්ගලිකව අවධානය යොමුකර තැන්පත් ගිණුමේ පවත්නා ශේෂයන් නිරවුල් කිරීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් සකස් කර ඇති බව. |
| 04. | 2016 අයවැය යෝජනා යටතේ ජූලි වර්ජකයන්ට සහන සැලසීමේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා 2016 අගෝස්තු 18 දින ජාතික අයවැය අධ්‍යක්ෂකගේ අංක BD/GPS/JS/2/14-2015 දරන ලිපිය මගින් ලබාදී තිබූ උපදෙස්වලට අනුව කටයුතු කරමින් අයදුම්පත් නිර්දේශ කිරීම සඳහා විධිමත් ක්‍රියාවලියක් සකස් කර නොතිබුණි. ඒ හේතුවෙන් විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයින්ගේ අයදුම්පත් නිර්දේශ කිරීම, ප්‍රතිලාභ ලැබූ පුද්ගලයන්ගේ අයදුම්පත් නිර්දේශ කිරීම, පිළිගත | ජූලි වර්ජකයන් සඳහා දීමනා නිර්දේශ කිරීමේදී අයවැය දෙපාර්තමේන්තුව විසින් ලබාදී තිබූ උපදෙස් පිළිපදිමින් ප්‍රතිලාභීන් පිළිබඳ වඩාත් නිවැරදි තොරතුරු මත පදනම්ව නිර්දේශ නිකුත් කිරීම සිදුකල යුතු වීම. | ජූලි වර්ජකයින් සඳහා දීමනා නිර්දේශ කිරීමේදී අයවැය දෙපාර්තමේන්තුව ලබාදී තිබූ උපදෙස් පරිදි ප්‍රතිලාභීන් පිළිබඳ වඩාත් නිවැරදි තොරතුරු මත පදනම්ව නිර්දේශ නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු ඉටුකර ඇති බව. | විගණන විමසුමේ දක්වා අති පරිදි අයදුම්පත්‍ර නිර්දේශ කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම හේතුවෙන් අතිරේකව ගෙවන ලද රු.1,000,000 (රු.250,000 × 4) ක මුදල අදාල ප්‍රතිලාභීන් වෙතින් නැවත අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇති බව. |

| | | | | |
|---|---|---|---|---|
| | නොහැකි දිවුරුම් ප්‍රකාශ සමඟ අයදුම්පත් නිර්දේශ කිරීම වැනි කටයුතු සිදුකර තිබුණි. 2020 දෙසැම්බර් මාසය වන තෙක් මෙම ක්‍රියාවලිය විධිමත්ව සිදු කර නොතිබුණි. එකම පුද්ගලයාගේ අයදුම්පත් දෙවරක් නිර්දේශ කිරීම නිසා පුද්ගලයින් 4 දෙනෙකු සඳහා රු.1,000,000 ක් වැඩිපුර ගෙවා ඇති බව නියැදි විගණන පරීක්ෂාවකදී අනාවරණය විය. | | | තවදුරටත් අදාල ප්‍රතිලාභීන් කරුණු වසන්කර මෙසේ දෙවරක් දීමනා ලබාගෙන ඇති බවට හා එසේ ලිපිලේඛන ඉදිරිපත් කිරීමෙන් සිතාමතා හෝ නොදැනුවත්වම රජයේ මුදල් අවභාවිතා කිරීමකට සහභාගී වී ඇති බවට දැනුම්දී එසේ අතිරේකව ලබාගත් මුදල් කඩිනමින් නිරවුල් කරන ලෙස ප්‍රතිලාභීන් හට අදාල ලිපියකින් දක්වා ඇත. |
| 05. | 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා තරඟාවලි 3ක් සඳහා රු.මිලියන 59.1 ක් වැය කරමින් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ ප්‍රධාන අරමුණක් වන ඵලදායිතා තරඟාවලිය හා සම්මාන උළෙල පැවැත්වීම හා ආයතන තෝරාගෙන සම්මාන ලබාදීම යනාදී කරුණු සිදුකලද සම්මාන ලබන ආයතනවල එම තත්ත්වය අඛණ්ඩව පවත්වාගෙනයාම පිළිබඳව පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදුකර නොතිබුණි. | සම්මාන ලබාගත් ආයතනවල ඵලාදායීතාවය අඛණ්ඩව පවත්වා ගැනීමට පසුවිපරම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමද අවශ්‍යා වේ. | ඵලදායීතා සම්මාන ලබාගත් ආයතනයන්හි ඵලදායිතාවය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මගින් පසුවිපරම් ක්‍රියාවලියක් සිදුකිරීමට අවශ්‍යා විධිවිධාන සකස් කර ඇති බව. | මේ පිළිබඳව ප්‍රාදේශීය නිලධාරීන් දැනුවත් කොට ඇති අතර 2020 ඵලදායිතා සම්මාන උළෙල අවසන් වූ පසු ආයතන අධීක්ෂණය කිරීම එම නිලධාරීන්ගේ වාර්ෂික ඉලක්කයන්ට ඇතුලත් කෙරෙනු ඇති බව. |

| | | | | |
|---|---|---|---|---|
| 06. | අමාත්‍යාංශයට අනුබද්ධිත සියලු ආයතන මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන් එක් කාල සීමාවකදී එක් දිස්ත්‍රික්කයක සිදුකිරීම තුලින් සේවා සේවක ප්‍රජාවට වඩාත් කාර්යක්ෂම සේවාවක් අරමුණු කරගෙන ජංගම සේවා වැඩසටහන් ක්‍රියාත්මක වී තිබුණි. නමුත් පසුගිය වසර 05 ක තොරතුරු විශ්ලේෂණයේදී නිරීක්ෂණය වූයේ ජංගම සේවා පවත්වා තිබුණේ බදුල්ල දිස්ත්‍රික්කයේ 04 ක් රත්නපුර දිස්ත්‍රික්කයේ 03 ක් හා කොළඹ දිස්ත්‍රික්කයේ 01 ක් වශයෙනි. එහෙත් අනෙක් දිස්ත්‍රික්කවල ජංගම සේවා නොපැවැත්වීමට හේතුන් හා බදුල්ල හා රත්නපුර දිස්ත්‍රික්කවල ජංගම සේවා කිහිපයක් පැවැත්වීමට අදාල නිර්ණායකයන් පිළිබඳව විගණනයට කරුණු අනාවරණය නොවුණි. | අරමුණු අනුව සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ජංගම සේවා පැවැත්වීම සිදුකල යුතු වීම. | සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ජංගම සේවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විධිවිධාන සකස් කරන බව. | ඉදිරියේදී ජංගම සේවා වැඩසටහන් පැවැත්වීමේදී කම්කරු දෙපාර්තමේන්තුවේ එක් එක් දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් හා ප්‍රධාන කාර්යාලයීය දත්ත පද්ධතිය පරීක්ෂා කර, අවශ්‍යතා විශ්ලේෂණයක් සිදුකර වැඩි වශයෙන් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ සම්බන්ධ ගැටළු හා අනෙකුත් අදාළ ගැටළු පවතින ප්‍රදේශ තෝරාගෙන ජංගම සේවා වැඩසටහන් පැවැත්වීමට කටයුතු සැලසුම් කරනු ලබන බව. |
| 07. | වන්දි මුදල් නොගෙවීම නිසා වරෙන්තු වශයෙන් පවතින උසාවි 08 කට අදාල නඩු ගොනු 48 ක් පැවති අතර අනතුර වාර්තා වූ දින සිට 2020 දෙසැම්බර් 31 දින වන විටත් අවුරුදු 04 ත් අවුරුදු 24 ත් අතර කාල පරාසයක වන්දි ලෙස අයකරගත යුතු මුදල | වන්දි ආඥා පනතේ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාල මුදල් කඩිනමින් ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කලයුතු වීම | වන්දි ආඥා පනත අනුව කටයුතු කරන බව. | වරෙන්තුකර ඇති නඩු ගොනු 2 ක ඉල්ලුම්කරු මියයාම හා ඉල්ලුම්කරු විදේශගතවීම මත එම ගොනු බහා තබා ඇත. ඒ අනුව මෙම වරෙන්තු ගොනු 48 න් එක් ගොනුවක කටයුතු |

රු.12,988,494 ක් බව නිරීක්ෂණය විය.

අවසන් කර වන්දි මුදල් ලබාදී ඇති අතර ගොනු 03 ක් කටයුතු කිරීමට නොහැකි වීම මත බහා තබා ඇත.

ඉතිරි නඩුගොනු සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවයන් වෙතින් ඔවුන්ගේ චංචල දේපල වෙන්දේසි කර අදාල මුදල් අයකර දෙන ලෙස ඉල්ලා මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ටාර් වෙත වරින්වර ලිපි යොමුකර ඇත. එමෙන්ම, එම අවස්ථාවේදීම ඉල්ලුම්කාර පාර්ශවයන් වෙතද මහේස්ත්‍රාත්වරයා හමුවී වගඋත්තරකාර පාර්ශවයන් වෙතින් වන්දි මුදල් ලබාගැනීමට අවශ්‍ය කටයුතු ඉටුකර දෙන මෙන් ඉල්ලීම් කරන ලෙසද දැනුවත් කර ලිපි යවා ඇත.

පනත සංශෝධනයෙන් පසුව නව

| | | | | |
|---|---|---|---|---|
| | | | | රෙජිස්ටාර්වරයෙකු පත්කර ගැනීමෙන් අනතුරුව මෙම කටයුතු වඩා කාර්යක්ෂමව හා කඩිනම්ව ඉටුකරගත හැකි වනු ඇතැයි අපේක්ෂා කරන බව. |
| 08. | වන්දි කොමසාරිස් කාර්යාලය වෙත වන්දි මුදල් තැන්පත් කලද නියම යැපෙන්නන් සොයාගැනීමට නොහැකිවීම නිසා වන්දි මුදල් බෙදා නොදී ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කම්කරු වන්දි කොමසාරිස් නමින් වෙන් වෙන් වශයෙන් ගිණුම් 6 ක් පවත්වා තිබූ අතර ඒවායෙහි තැන්පත් කර තිබූ මුදල 2020 දෙසැම්බර් 31 දිනට රු.2,023,095 ක් බව අනාවරණය විය. | වන්දි ආඥා පනතේ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාල මුදල් කඩිනමින් ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කලයුතු වීම | වන්දි අඥා පනත අනුව සේවා නියුක්තිකයින් සඳහා කඩිනමින් සහන සැලසීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | වන්දි ලබා ගැනීම සඳහා නීත්‍යානුකූල හිමිකරුවන් ඉදිරිපත් නොවීම නිසා කම්කරු වන්දි කොමසාරිස් නමින් ඉතිරි කිරීමේ ගිණුම් 06 ක තැන්පත් කර ඇති බව.<br>කම්කරු වන්දි ආඥා පනතේ නව සංශෝධනය මගින් කම්කරු වන්දි අධිකරණය සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් රෙජිස්ටාර්වරයෙකු පත් කිරීමට නියමිත බැවින් ඉදිරියේදී මෙම ගැටළු සහගත කටයුතු නිරවුල් කිරීමට පහසුවනු ඇති බව.<br>එමෙන්ම නව සංශෝධනය මගින් යැපෙන්නෙකු නොමැති අවස්ථාවකදී |

| | | | | |
|---|---|---|---|---|
| | | | | වන්දි මුදල ආපසු සේවා යෝජකට ගෙවීමට අවශ්‍ය විධිවිධාන සලසා ඇති බැවින් ඉදිරියේදී මෙම ගැටළුව නිරවුල් වනු ඇත.<br>කෙසේ වුවද, මෙම අපහසුතාවයන් මධ්‍යයේ වුවද අදාල වන්දි ලබාදීම සඳහා ගතහැකි විකල්ප ක්‍රමවේදයන් පිළිබඳ සොයා බැලීමට කටයුතු යොදා ඇත. |
| 09. | රැකියාවේ නියුතුව සිටියදී සිදුවූ මාරක අනතුරු හේතුවෙන් මියගිය සේවකයින්ගේ බාලවයස්කරුවන්ට හිමි වූ වන්දි වයස් පූර්ණත්වයට පත් වූ පසු එම මුදල් ඔවුන් වෙත ලබාදීම සිදුකල යුතු වුවද 2020 දෙසැම්බර් 31 දින වන විට වයස පූර්ණත්වයට පත්ව ප්‍රතිලාභ නිදහස් නොකරන ලද ගිණුම් 534 ක් පැවති අතර එම වන්දි මුදල්වල වටිනාකම රු.20,861,229 ක් විය. ඒ තුල රු.11,782,761 ක් වූ 2016 වර්ෂයට පූර්ණත්වයට පත් ගිණුම් 459 ක්ද රු.8,563,187 ක් වූ 2020 වර්ෂය තුළ පූර්ණත්වයට පත් ගිණුම් 66 ක්ද විය. | බාල වයස්කරුවන්ට හිමි වන්දි මුදල් වයස් පූර්ණත්වයට පත් බාල වයස්කරුවන් වෙත කඩිනමින් නිදහස් කිරීමට කටයුතු කලයුතු වීම. | බාල වයස්කාර ගිණුම් නිදහස් කිරීමට අවශ්‍ය විධිවිධාන සලසා ඇති බව.<br>2016 මාර්තු මස සිට බාලවයස්කාර ගිණුම් පරිගණක දත්ත පද්ධතියක් ආරම්භ කර එයට ඒ වන විට නිදහස් නොකරන ලද සියළුම බාලවයස්කාර ගිණුම් තොරතුරු ඇතුලත් කර ඇත. මෙම දත්ත පද්ධතිය අනුසාරයෙන් වයස අවුරුදු 18 සම්පූර්ණ වූ වහාම ඔවුන්ට ඒ බව ලිපියක් මගින් දැනුම් දී අදාල කාල | 2020.12.31 දින වන විටත් වයස් සම්පූර්ණත්වයට පත්ව ප්‍රතිලාභ නිදහස් නොකර පැවති ගිණුම් සංඛ්‍යාව 534 ක් හා එහි වටිනාකම රු.20,816,229 ක් ව තිබුණි. එයින් 2021 සැප්තැම්බර් 30 දින වන විට රු.9,132,173.31 වටිනාකම වූ ගිණුම් 44 ක් නිදහස් කර තිබේ. එදිනට ඉතිරි වූ ශේෂය ගිණුම් 490 ක් පවතින අතර එහි වටිනාකම රු.11,684,055.69 කි. |

සීමාවේදී ගිණුම් නිදහස් කිරීමට කටයුතු කරනු ඇත. මේ හේතු කොටගෙන 2016 වර්ෂයෙන් පසුව වයස සම්පූර්ණ වී ඇතත් නිදහස් කර නොගත් ගිණුම් ප්‍රමාණය ඉතා සුළු ප්‍රමාණයක් බව.

තවද, 2022 ජනවාරි 31 වන විට 2016 ට පෙර ගිණුම්වලින් 7 ක් හා 2016 ට පසු ගිනුම්වලින් 19 ක් ලෙස නිදහස් කර ඇත. ඒ අනුව 2016 ට පෙර ගිණුම් 442 ක් හා 2016 ට පසු ගිණුම් 11 ක් නිදහස් කිරීමට ඉතිරිව පවතී.

කෙසේ වෙතත්, නිදහස් කලයුතු ගිණුම් සංඛ්‍යාව ස්ථාවරව පැවතියද තැන්පතු මුදල් සඳහා පොලී මුදල් එකතුවන බැවින් තැන්පතු ශේෂය අඛණ්ඩව ඉහළ යයි.

10. **ප්‍රතිපාදන උපයෝජනය**

| | | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|---|
| ශුද්ධ | පුනරාවර්තන | 258,927,400 | 242,000,000 | 677,150,000 | 1,178,077,400 |
| ප්‍රතිපාදනය | මූලධන | 780,737,000 | 147,000,000 | 25,100,000 | 952,837,000 |
| | එකතුව | **1,039,664,400** | **389,000,000** | **702,250,000** | **2,130,914,400** |
| සත්‍ය | පුනරාවර්තන | 212,527,535 | 207,949,839 | 630,012,263 | 1,050,489,637 |
| වියදම | මූලධන | 66,415,327 | 111,078,799 | 17,774,542 | 195,268,668 |
| | එකතුව | **278,942,862** | **319,028,638** | **647,786,805** | **1,245,758,305** |
| ඉතිරිවීම් | පුනරාවර්තන | 46,399,865 | 34,050,161 | 47,137,737 | 127,587,763 |
| | මූලධන | 714,321,673 | 35,921,201 | 7,325,458 | 757,568,332 |
| | එකතුව | **760,721,538** | **69,971,362** | **54,463,195** | **885,156,095** |

## 27. තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

**ශීර්ෂය - 194**

| මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය | | |
|---|---|---|
| | 2018 | - තත්ත්වාගණනය කළ මතය |
| | 2019 | - තත්ත්වාගණනය කළ මතය |
| | 2020 | - තත්ත්වාගණනය කළ මතය |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 41 වන වගන්තිය අනුව ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය ක්‍රියාකාරිත්වය සඳහා විධිමත් මූල්‍ය ක්‍රියාපටිපාටියක් සහ පරිපාලන රෙගුලාසි සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග පැනවීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය ක්‍රියාකාරිත්වය සඳහා විධිමත් මූල්‍ය ක්‍රියාපටිපාටියක් සහ පරිපාලන රෙගුලාසි සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග පැනවිය යුතු වීම. | ලබා දී ඇති නිර්දේශ අනුව ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | නියෝග ප්‍රකාරව ත්‍රෛයිමාසිකව දේශීය හෝ විදේශීය මාර්ග වලින් ඔපිම්පික් කමිටුව වෙත ලැබුණු සියළු මුදල් උපකරණ සහ වෙනත් සම්පත් පිළිබදව වාර්තා අමාත්‍යවරයා වෙත සැපයීමටත් , ත්‍රෛයිමාසිකව ඔපිම්පික් කමිටුව ඉටු කරණු ලබන කටයුතු සම්බන්ධයෙන් ප්‍රගති වාර්තා අමාත්‍යවරයාට සැපයීමටත් කටයුතු කරන බව. |
| 02. | අමාත්‍යාංශය විසින් වැල්විටිතුරේ පිහිනුම් තටාකය ඉදිකිරීම, දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා ඇකඩමියේ මීටර් 400 ක කෘත්‍රිම ධාවන පථය ඉදිකිරීම සහ එහි වැසිකිළි | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි හා අවශ්‍යතා හඳුනාගෙන සැලැසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව | ප්‍රමාදයන් මඟ හැරීම සඳහා සුදුසු පියවර අනුගමනය කර ඇති බව. | මීටර් 400 කෘතිම ධාවන පථය<br>i. පැවති Covid – 19 වසංගත තත්ත්වය හා ආනයන සීමා හේතුවෙන් නියමිත කාල සීමාව තුළ මීටර් 400 කෘතිම ධාවන |

| | | | | |
|---|---|---|---|---|
| | පද්ධතියේ හා පිවිසුම් මාර්ග සකස් කිරීම, කුරුණෑගල මලියදේව විද්‍යාලීය වෙඩි තැබීමේ සහ දුනු විදීමේ මධ්‍යස්ථානයක් ඉදි කිරීම යන ව්‍යාපෘති 04 ක් සඳහා රු.මිලියන 429.39 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යාපෘතින් සඳහා රු.මිලියන 222.48 වැයකර තිබුණි. මෙම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂයේදී සහ 2019 මැයි වනවිට නිම කළ යුතු වුවද එම කාල වලදී නිම කර නොතිබුණි. | ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | | පථය නිම කිරීමට නොහැකි වී ඇති අතර 2022 පෙබරවාරි මාසයේ දී මෙම ව්‍යාපෘතිය සියලු වැඩ නිමකර අමාත්‍යාංශය වෙත භාර දීමට නියමිතය. වැසිකිළි පද්ධතිය හා පිවිසුම් මාර්ගය සකස් කිරීමේ ව්‍යාපෘති වල වැඩ නිම කළ කොටස් කොන්ත්‍රාත්කරු විසින් මෙම අමාත්‍යාංශය වෙත භාර දී ඇති අතර වැඩ නිසි පරිදි නිම නොකළ කොටස් සඳහා ඇවර කළ හානි (Liquidated damages) අය කරගෙන ඇත. මේ වන විය ඉදි කිරීම් අවසන් අදියර පවත්වාගෙන යාම සඳහා වැල්වැයිතුරෙයි නගරසභාව වෙත භාර දී ඇත. |
| 03. | 2016 වර්ෂයේදී රු.මිලියන 108.87 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන යටතේ නුවරඑළිය ක්‍රීඩා නිවහන ඉදිකිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණු අතර එය 2017 සැප්තැම්බර් මාසයේදී නිමකළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි හා අවශ්‍යතා හඳුනාගෙන සැලැසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | ප්‍රමාදයන් මඟ හැරීම සඳහා සුදුසු පියවර අනුගමනය කර ඇති බව. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි අවශ්‍යතා හඳුනාගෙන විධිමත් පරිදි සැලැසුම් පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කරන බව. |

| | | | | |
|---|---|---|---|---|
| | අවසාන වන විට එම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 30.26 ක් වැයකර තිබුණද එහි කටයුතු නිමකර නොතිබුණි. | | | |
| 04. | අමාත්‍යාංශයේ විදුලි ජනක යන්ත්‍රය හා වායු සමීකරණ පද්ධතියේ 2017 වර්ෂය සඳහා නඩත්තු කිරීමට ආයතන 07 කින් මිල ගණන් කැඳවා තිබුණි. ඉන් එක් ලංසුකරුවෙකු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර නැවත වරක් ලංසු කැඳවීමකින් තොරව එම සැපයුම්කරුට රු.මිලියන 2.52 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2018 වර්ෂයේ නඩත්තු කටයුතු සඳහා නැවත මිල ගණන් කැඳවීමකින් තොරව පූර්ව සැපයුම්කරුටම රු.මිලියන 2.77 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | සේවයේ සතුටුදායක නම් පමණක් හා ආර්ථික වශයෙන් ඵලදායි නම් දීර්ඝ කිරීම අනුමත කරන බව ලේකම්වරයා විසින් දන්වා ඇත. මේ සඳහා 2018 වර්ෂයට අදාළව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමක් සිදු නොවුණද එහිදී ආර්ථික වශයෙන් අවාසියක් සිදු වී නොමැති බව. | වර්තමාන තත්ත්වය ඉදිරියේදී වාර්තා කරමි. |
| 05. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව දේපල පිරියත හා උපකරණ වටිනාකම රු.1,513,388,244 ක් වූ අතර මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව එය | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කිරීමට අවධානය යොමු විය යුතු වීම. | නොනිමි වැඩවල වටිනාකම, නිම් ස්ථාවර වත්කම්වල වටිනාකම ගණන් බැලීමේදි | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කිරීමට කටයුතු කරන බව. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.2,334,438,176 ක් වූයෙන් රු.821,049,932 ක් වූ මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. | | ඉවත්වන බැවින් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් ගිණුම්ගත වී නොමැති බව. | |
| 06. | 2018 වර්ෂයේ රු.1,000,000 ක ප්‍රතිපාදන මත ඉදිකර තිබුණ නොර්වුඩ් සන්රයිස් ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළව ක්‍රීඩාංගණයේ මීටර් 62.55 ක් දිගට හා මීටර් 4 ක් උසට දැල් ආවරණ යෙදූ බවට දක්වා රු.953,888 ක් ගෙවීම් කර තිබුණද, යොදා තිබූ දැල් ආවරණවල උස මීටර් 3.2 ක් වූයෙන් රු.190,778 ක අධිගෙවීමක් සිදුකර රු.66,772 ක් පමණක් කොන්ත්‍රාත්කරුගෙන් නැවත අයකර ගෙන තිබුණි. කම්බි දැලෙහි ඉහළ සහ පහළ කොටස අපේක්ෂිත පරිදි නිමවා නොතිබුණ බැවින් නියමිත රේටය අනුව ගෙවීම කිරීම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටුකිරීමට හැකිවන පරිදි හා අවශ්‍යතා හඳුනාගෙන සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුලත ඉටුකිරීමට කටයුතු කල යුතු වීම. | විගණනයේදී අනාවරණය වූ ගැටළු නිරාකරණය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් වෙත 2020 දෙසැම්බර් 03 දින දැනුම් දී ඇති බව. | අධි ගෙවීම නිර්දේශ කළ නිලධාරීන්ට එම කරුණු පෙන්වා දෙමින් විධිමත්ව රාජකාරි ඉටුකිරීමට කටයුතු කරන ලෙස අභ්‍යන්තර චක්‍රලේඛයක් මඟින් දැනුම් දී ඇති බව. |

| | | | | |
|---|---|---|---|---|
| 07. | උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් තුංතොට පාලම අසල ඇවිදින මංතීරුවක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගත මුදල රු.7,460,000 ක් වූ අතර මංතීරුව සඳහා වැය කර තිබූ සම්පූර්ණ මුදල රු. 9,436,900 ක් වූයෙන් ගිවිසුම් ගත මුදල ඉක්මවා රු. 1,976,900 ක් ගෙවා තිබුණි.<br>මංතීරුව ඉදි කරන ලද ප්‍රදේශය වර්ෂා කාලයේදී සම්පූර්ණයෙන්ම ජලයෙන් යටවන බැවින් මංතීරුවට යාබදව ඉදිකර තිබූ වාහන අංගනය සම්පූර්ණයෙන් වතුරට ගසා ගෙන ගොස් තිබුණු අතර මංතීරුවේ පිහිටා ඇති කුඹුක් ගස් 20 ක් නිසා මෙම මංතීරුව, ඇවිදීම සඳහා භාවිතා කළ නොහැකි තත්වයක පැවතුණි .මංතීරුවට පස් සපයා අතුරා තැලීම වෙනුවෙන් එකක් සඳහා රු. 900 බැගින් සන මීටර් 3500 ක් සඳහා රු.3,150,000 ක් ඇස්තමේන්තු කර තිබුණද කළ වැඩ වාර්තා අනුව සන මීටර් 6320 ක් සඳහා | -එම- | මෙම කරුණු පිළිබඳ අනිකුත් අංශ මගින් තොරතුරු ලබා ගෙන සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මෙම මංතීරුවේ ඉදිකිරීම් කටයුතු සිදුකළ කොන්ත්‍රාත් ආයතනය විසින් උඩුබද්දාව ප්‍රාදේශීය සභාව වෙත මෙම මංතීරුව භාර දී ඇති අතර 2018.03.08 දිනැති ලිපිය මඟින් එම මංතීරුව ප්‍රාදේශීය සභාව භාරගත් බව දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | රු. 900 බැගින් රු. 5,688,000 ක් වැය කර තිබීම හේතුවෙන් ඇස්තමේන්තු මුදල ඉක්මවා රු. 2,538,000 ක් ගෙවා තිබුණි | | | |
| 08. | දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා ඇකඩමියේ මීටර් 400 කෘතිම ධාවන පථය, වැසිකිළි පද්ධතිය හා පිවිසුම් මාර්ගය සකස් කිරීමේ ව්‍යාපෘති 2 ක් සඳහා පිළිවෙලින් රු. මිලියන 310 ක් සහ රු.මිලියන 15.16 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර 2019 වර්ෂයේදී එම ව්‍යාපෘති සඳහා පිළිවෙලින් රු.මිලියන 183.85 ක් සහ රු.මිලියන 10.3 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘති දෙකෙහි ඉදිකිරීම් වැඩ පිළිවෙලින් 2018 දෙසැම්බර් 30 දින හා 2018 අප්‍රේල් 29 දින නිමකළ යුතුව තිබුණද, 2019 වර්ෂය අවසන් වන විටත් නිමකර නොතිබුණි. | -එම- | පැවති Covid – 19 වසංගත තත්ත්වය හා ආනයන සීමා හේතුවෙන් නියමිත කාල සීමාව තුළ මීටර් 400 කෘතිම ධාවන පථය නිම කිරීමට නොහැකි වූ බව. වැඩ නිසි පරිදි නිම නොකළ කොටස් සඳහා ඇවර කළ හානි (Liquidated damages) අය කරගෙන ඇත. | 2022 පෙබරවාරි මාසයේ දී මෙම ව්‍යාපෘතිය සියලු වැඩ නිමකර අමාත්‍යාංශය වෙත භාර දීමට නියමිතය. වැසිකිළි පද්ධතිය හා පිවිසුම් මාර්ගය සකස් කිරීමේ ව්‍යාපෘති වල වැඩ නිම කළ කොටස් කොන්ත්‍රාත්කරු විසින් මෙම අමාත්‍යාංශය වෙත භාර දී ඇති බව. |
| 09. | කුරුණෑගල මලියදේව විද්‍යාලීය වෙඩි තැබීමේ සහ දුනු විදීමේ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 12.23 ක | -එම- | මෙම ව්‍යාපාතියේ පළමු අදියර 2020.05.15 දින | කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය 2020.07.26 දින කුරුණෑගල මලියදේව විද්‍යාලය වෙත භාර දී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රතිපාදන සලසා තිබුණු අතර 2019 වර්ෂයේදී රු.මිලියන 7.43 ක් වැය කර තිබුණි. 2018 නොවැම්බර් 03 දින නිමකළ යුතු මෙම ව්‍යාපෘතිය 2019 මැයි 23 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණද 2019 දෙසැම්බර් වන විටත් වැඩ නිමකර නොතිබුණි. | | වන විට අවසන් කර ඇති බව. | |
| 10. | අංක 2016/250(i) හා2016අගෝස්තු 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය පරිදි අත්තිකාරම් ගෙවීමේදී එක් එක් අත්තිකාරම් වෙනුවෙන් කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම හා කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම් යටතේ වෙනම ගිණුම් අංකයක් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත යුතු බව දන්වා තිබුණද, ව්‍යාපෘතියක් සඳහා ලබාදී තිබුණු රු.16,633,062 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගිණුම්ගතකර නොතිබුණි. අත්තිකාරම් මුදලින් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.15,503,089 ක වටිනාකමද | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අත්තිකාරම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. | ඉදිරියේදී මෙම අඩුපාඩු සිදු නොවන පරිදි කටයුතු කරනු ලබන බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව. |

| | | | | |
|---|---|---|---|---|
| | ගිණුමේ දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | | | |
| 11. | වර්ෂ 2 සිට 5 දක්වා පැරණි තැන්පතු 34 ක එකතුව රු.16,183,793 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් ඉදිරියේදී නිදහස් කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලබන බව. | මින් රු.170,000 තැන්පතු 2022 ජනවාරි නිදහස් කර ඇත. ශේෂය රු.16,013,793 ක තැන්පතු සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. |
| 12. | නුවරඑළිය නගරයේ ක්‍රීඩා අමාත්‍යාංශයට අයත් හෙක්ටයාර් 34.5 ක් වන ඉඩමක ක්‍රීඩා පුහුණුවීම් ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දරා ගැනීම් හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් ඉදිකිරීමට යෝජිත උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වසර 03 ක් තුළ සිදු කිරීමටත් එහි කොන්ත්‍රාත් වටිනාකම යුරෝ 75,528,700 ක් වූ පිරිවැයෙන් සියයට 70 ක් එක්සත් රාජධානියේ අපනයන මූල්‍ය ආයතනය මගින් සපයා ගැනීමටත් ඉතිරි සියයට 30 මහජන බැංකු මගින් සපයා ගැනීමටත් ණය ගිවිසුම් අත්සන් කර තිබුණි. ණය | ක්‍රීඩකයින් ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒමට අදාළ පුහුණුවීම් කටයුතු සිදු කිරීම සඳහා යටිතල පහසුකම් සැලසීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයන් ගත යුතු වීම සහ ව්‍යාපෘති අප්‍රමාදව ක්‍රියාත්මක කර නියමිත කාල වකවානුවල නිම කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම ව්‍යාපෘතිය මේ අවස්ථාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයට ප්‍රමුඛ ව්‍යාපෘතියක් නොවන බව අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇති බැවින් ව්‍යාපෘතිය අවලංගු කිරීම සුදුසු බව අමාත්‍යාංශය නිරීක්ෂණය කර අංක MOYS/PLN/05/04 සහ 2021.02.08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය | නුවරඑළිය ඉහළ උන්නතාංශ ක්‍රීඩා පුහුණු සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අවලංගු කිරීම හේතුවෙන් එහි ණය මුදල ක්‍රීඩා සහ අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා යෙදවීම සම්බන්ධයෙන් වන යෝජනාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව. අවලංගු කිරීමෙන් පැන නගින ගෙවීම් පිළිබඳ අධ්‍යනය කර වාර්තා කිරීම සඳහා තාක්ෂණික ඇගයුම් කමිටුවක් ද පත් කර ඇති බව. |

සැලසුම් ගාස්තු ලෙස යුරෝ 264,492.34 ක් එනම් රු.51,047,021 ක් ණය පහසුකම් සපයනු ලබන බැංකුව වෙත ගෙවා තිබුණි. 2019 වර්ෂය තුළ මුළු වියදම රු.53,551,631 ක් වූ අතර 2019 වර්ෂයේ මුල් කාර්තුවේදී මෙම ව්‍යාපෘතිය ජනතා අයිතියට පත් කිරීමට අපේක්ෂා කර තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතිය 2020 වර්ෂයේදී ව්‍යාපෘතිය නවතා දැමීම හේතුවෙන් ඒ සඳහා වැය කළ මුළු වියදම නිෂ්කාර්ය වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

ඉදිරිපත් කර ඇත. එම අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව අංක අමප/21/0242/329/001 සහ 2021/02/22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් නුවරඑළිය ඉහළ උන්නතාංශ ක්‍රීඩා පුහුණු සංකීර්ණය ඉදිකිරීම සඳහා අදාළ ආයතනය සමග එළඹ ඇති කොන්ත්‍රාත් ගිවිසුම සහ මොරටුව විශ්වවිද්‍යාලය සමඟ එළඹි උපදේශන ගිවිසුම අවලංගු කිරීමටත්, මහජන බැංකුව සමඟ එළඹි ණය ගිවිසුම් පිළිබඳ සාකච්ඡා කර එම ගිවිසුම් ගත ණය මුදල සුදුසු වෙනත් සංවර්ධන

| | | | | |
|---|---|---|---|---|
| | | | ව්‍යාපෘතියක් සඳහා යෙදවීමට හෝ අවලංගු කිරීමටත්, මෙම ණය ගිවිසුම සහ කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කිරීමෙන් සිදුවන සේවා ගාස්තු (ණය සැකසුම් ගාස්තු ද ඇතුළත්ව) අත්හැරීම සඳහාත් මහා භාණ්ඩාගාරයේ ලේකම්ට බලය පැවරීමටත් අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමටත් අනුමැතිය ලැබී ඇත. වෙළඳ හා උපදේශන ගිවිසුම්ද අවලංගු කර ඇත. | |
| 13. | අමාත්‍යාංශය විසින් රාජ්‍ය ආයතනයන් වෙත එකතුව රු.153,345,000 ක් වටිනා වාහන 15 ක් ලබාදී තිබුණු අතර එම වාහන භාවිතා කරනු ලබන පාර්ශවයන් | අදාළ වාහන අප්‍රමාදව පවරා දීමට කටයුතු කර වත්කම් කළමනාකරණය නියමිත පරිදි සිදු කළ යුතු වීම | වාහන 13 ක් පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව හා වාහන 02 ක් | මිනිස් බල රැකියා දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති **KC 4211** වාහනය නැවත අමාත්‍යාංශය වෙත ලබා |

| | | | | |
|---|---|---|---|---|
| | වෙත පවරා දී නොමැති බව නිරීක්ෂණය විය. | | තාවකාලික පදනමින් පවරා දී ඇති බව. | දෙන ලෙස දන්වා ඇති බව. |
| 14. | අමාත්‍යාංශය විසින් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් රු.9,100,000ක් වටිනා මෝටර් වාහනයක් භාවිතා කරනු ලබන අතර එම වාහනය අමාත්‍යාංශය වෙත පවරා ගෙන නොතිබුණි. | බාහිර ආයතන වෙතින් ලබාගත් වත්කම් විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළයුතු වීම | වාහනයේ ලියාපදිංචි සහතිකය බැංකුව මඟින් නිදහස් කර අමාත්‍යාංශය වෙත ලබා නොදීම නිසා පවරා ගැනීම කල් ගත වී ඇති බව. | වාහනයේ ලියාපදිංචි සහතිකය බැංකුව මඟින් නිදහස් කර අමාත්‍යාංශය වෙත ලබා දී ඇති අතර පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. |

## 15. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය | පුනරාවර්තන | 525,400,000 | 1,271,989,868 | 2,718,685,000 | 4,516,074,868 |
| | මූලධන | 4,521,550.000 | 2,331,245,132 | 2,464.242,000 | 9,317,037,132 |
| | එකතුව | 5,046,950,000 | 3,603,235,000 | 5,182,927,000 | 13,833,112,000 |
| සත්‍ය වියදම | පුනරාවර්තන | 430,256,591 | 1,135,974,676 | 2,612,325,797 | 4,178,557,064 |
| | මූලධන | 1,278,817,735 | 990,442,609 | 1,506.877,006 | 3,776,137,350 |
| | එකතුව | 1,709,074,326 | 2,126,417,285 | 4,119,202,803 | 7,954,694,414 |
| වසර අග ඉතිරිවීම් | පුනරාවර්තන | 95,143,409 | 136,015,192 | 106,359,203 | 337,517,804 |
| | මූලධන | 3,242,732,265 | 1,340,802,523 | 957,364,994 | 5,540,899,782 |
| | එකතුව | 3,337,875,674 | 1,476,817,715 | 1,063,724,197 | 5,878,417,586 |

## 28. වාරිමාර්ග අමාත්‍යාංශය

ශීර්ෂය - 198

මූලාා ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 -තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ආයතනය විසින් ගෙන ඇති වැලැක්වීමේ ක්‍රියාමාර්ග** | **අදාළ ක්‍රියාමාර්ගයන්හි වර්ථමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| 01. | ඉදි කරමින් තිබුණු පිටවානක් ඉහළ සිට පහළට මීටර් 1 ක් පමණ දුරට ස්ථාන 09 කින් පුපුරා ගොස් තිබීම, එක් ස්ථානයක් පාදමේ සිට ඉහළටම පුපුරා තිබීම සහ පිටවාන ඉදි කිරීම සඳහා යොදා තිබෙන කොන්ක්‍රීට් පදම් (Curing) නොකිරීම යන අඩුපාඩු විය. | ප්‍රමිතියෙන් තොර ඉදිකිරීම් කටයුතු කිරීම පිළිබදව සොයා බලා කටයුතු කිරීම. | මෙම ඉරිතැලීම් මඟින් කිසිදු ජල කාන්දුවක් සිදු වී නොමැති බව. | මේ වන විට එම ඉරිතැලීම් සඳහා විශේෂ සිමෙන්ති මිශ්‍රණයක් යොදා ඇත. |
| 02. | මුදියන්නැගම වැව වටා වාහන ගමන් කළ හැකි වන පරිදි වැව් බැම්මට යා කර පස් දමා මාර්ගයක් ඉදි කර වැවට ජලය ගලා එන වැවේ පෝෂිත ප්‍රදේශය වන වැව් ඉහත්තාව අවහිර කර තිබුණි. වැවට හානි වන පරිදි වැව වටා වැව ඉහත්තාවේ මාර්ගයක් සකස් කිරීම නිසා එල්ලංගා පද්ධතියටද හානි වී තිබුණි. | වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ දී එල්ලංගා පද්ධතිය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම. | වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් විමසීමක් කර ඇති බව. | 2022 පෙබරවාරි වනවිටත් එම තත්ත්වයේම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| 03. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් කුඩාගලේ වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2016, 2017 සහ 2018 යන වර්ෂවලදී අමාත්‍යාංශයෙන් රු.6,195,216 ක් වැය කර තිබුණ ද වැවේ සොරොව්ව කැඩී තිබුණු බැවින් වැවේ එකතුවන ජලය වගා කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි. කුඩා ගලේ වැවෙන් පෝෂණය වන මුළු කුඹුරු අක්කර 95 න් අක්කර 32 රූඩ් 03 පර්චස් 30 ක් එක් පුද්ගලයෙකු විසින් පාරම්පරික ගොවීන්ගෙන් මිලදී ගෙන තිබුණි. එම ප්‍රමාණය මුළු කුඹුරු ප්‍රමාණයෙන් සියයට 34 ක් පමණ වී තිබුණි. 2019 ජනවාරි 09 දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී එම කුඹුරු අක්කර 95 ම වගාකර නොතිබුණු අතර වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය කර තිබෙන මුළු මුදල වූ රු.6,195,216 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන් වෙනත් වැය ශීර්ෂ සඳහා වියදම් දැරීමට අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර යෝජිත කුඹුරු වගා කිරීමට අවශ්‍ය කටයුතු කිරීම. | යොජිත කුඹුරු වගාකිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | 2022 පෙබරවාරි වන විටත් කටයුතු සිදුකර නැත. |
| 04. | 2017 වර්ෂයේ හිටපු අමාත්‍යවරයා වෙත ලබා දී තිබූ රු.640,354 ක් වටිනා වත්කම් ආපසු පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් ආපසු පවරාගැනීමට කටයුතු කිරීම. | මෙම භාන්ඩවලින් කොටසක් මේ වන විට අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත පැවරීමට කටයුතු කරන අතර ඉතිරි භාණ්ඩවල වටිනාකම ගෙවීමට හිටපු | වටිනාකම ගෙවීමට එකඟ වී ඇත. 2022 පෙබරවාරි වන විටත් ගෙවීම් සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම් කැමැත්ත පල කරන ලදි. ඒ අනුව කමිටුවක් පත් කර එම භාණ්ඩවල වටිනාකම මුදල් රෙගුලාසි අනුව ගණනය කර එම නිලධාරිනිය වෙත දන්වා ඇති බව. | |
| 05. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සතු කුඹුක්කඩවල වැවේ අයිතිය වාරිමාර්ග අමාත්‍යාංශය වෙත පවරා ගැනීම හා ප්‍රතිසංස්කරණය කිරීමට අදාල අධිකාරී බලයක් ලබා ගෙන නොතිබිය දී ගල්ගමුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් රු.11,535,000 ක ඇස්තමේන්තුවක් සකස් කර වැව් බැම්මේ ඇති ගස් 140 ක් ඉවත් කිරීමට ලකුණු කර තිබුණි. | අමාත්‍යාංශයට අයත් නොවන කාර්යයන් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක නොකිරීම. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක වයඹට ජලය ව්‍යාපෘතිය යටතේ ජලය ලබා දීමට යෝජිත සාලික කෙත් රජදහන , සුළු වාරිමාර්ග යටතට අයත් වන වාරි කර්මාන්ත 35ක් ප්‍රතිසංස්කරණය සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් අනුමැතිය ලබා දී ඇත. කුඹුක්කන්කඩවල වැව ද මෙම වැව් 35ට අයත් වන වැවකි. මේ නිසා මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වාරිමාර්ග | 2022 පෙබරවාරි වන විටත් එම තත්වයේම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | | දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය ලබා දුන්න ද ප්‍රතිපාද නොලැබීම හේතුවෙන් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර නොමැති බව. | |
| 06. | කොත්මලේ පුහුණු ආයතනයට අනුමත කාර්යය මණ්ඩලය 30 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 14 ක් වූයෙන් තනතුරු 16 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු පිරවීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතු වීම හෝ අනවශ්‍ය තනතුරු වේ නම් ඒවා යටපත් කිරීමට කටයුතු කිරීම. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව. | පුරප්පාඩු පිරවීමට 2022 පෙබරවාරි දක්වා කටයුතු කර නැත. |
| 07. | අනුමත තනතුරු 06 කට නියමිත සංඛ්‍යාව ඉක්මවා 15 දෙනෙකු බඳවා ගෙන තිබුණි. අනුමත කම්කරු තනතුරු 04 කට බඳවා ගෙන නොතිබුණු අතර කොන්ත්‍රාත් පදනම මත 28 දෙනෙකු බඳවා ගෙන වැටුප් හා දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.19,577,330 ක් ගෙවා තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය අනුව කටයුතු කිරීම. | පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම හා අවශ්‍ය අනුමැතීන් ලබා ගන්නා බව. | අවශ්‍ය සේවකයන් සඳහා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට හා පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| 08. | කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තනතුරු නාම 05 ක් සඳහා 06 දෙනෙකු ආයතනය විසින් බඳවා ගෙන තිබුණි. කළමනාකරණ සහකාර තනතුරු 1 ක් අනුමත කර තිබුණ ද ඒ සඳහා 10 දෙනෙකු ද අනියම් පදනම මත කම්කරුවන් 25 දෙනෙකු ද බඳවා ගෙන තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1285 හා 2016 ජූලි 01 දිනැති ලිපිය ප්‍රකාරව කටයුතු කිරීම. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගන්නා බව. | අදාළ අනුමැතීන් ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. කළමනාකරණ සහකාර තනතුරු (ලිපිකරු) 10ක් නොව 8ක් පමණක් ඇත. ඒ සඳහාද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතීන් ලබාගෙන ඇත. |
| 09. | කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය සඳහා කථිකාචාර්ය තනතුරු 07 ක් අනුමත කර තිබුණ ද එම කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට කටයුතු නොකර බාහිර දේශකයන් ඒ සඳහා යොදවා ගෙන තිබුණි. 2017 සහ 2018 වර්ෂවල පිළිවෙලින් බාහිර දේශකයන් 25 දෙනෙකුට සහ 11 දෙනෙකුට රු.1,100,835 ක් හා රු.699,400 ක් වශයෙන් එකතුව රු.1,800,235 ක මුදලක් ගෙවා තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1285 හා 2016 ජූලි 01 දිනැති ලිපිය ප්‍රකාරව කටයුතු කිරීම. | කථිකාචාර්ය පුරප්පාඩු තනතුරු 07 සම්පූර්ණ කරන බව. | අවශ්‍ය බඳවා ගැනීම් සිදු කර ගැනීම සඳහා වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. |
| 10. | අමාත්‍යාංශය යටතේ ඇති කෘෂිකර්ම**,** ග්‍රාමීය ආර්ථික කටයුතු**,** වාරිමාර්ග**,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන යන අංශ වල සේවය කර සේවය අතහැර ගිය නිලධාරීන් **29** | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.6 වගන්තිය | ක්‍රියාමාර්ග ගෙන නැත. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙනෙකුගේ එකතුව රු.**793,931** ක් වූ අය විය යුතු ණය ශේෂයන් වර්ෂ **05** ක කාලයක් ඉක්මවා ගොස් තිබුණද එම ණය ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රකාරව කටයුතු කිරීම. | | |
| 11. | වාරිමාර්ග අංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු **09** ක, තෘතීයක මට්ටමේ තනතුරු **01** ක, ද්විතියක මට්ටමේ තනතුරු **01** ක සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු **10** ක පුරප්පාඩු පැවතියද එම තනතුරුවලට බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම. | අදාල පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කරන ලෙස රාජ්‍ය සේවා , පලාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත හා වාරිමාර්ග දෙපාර්තමේනුතව වෙත දන්වා යවා ඇත. | නව අමාත්‍යාංශ ප්‍රතිස්ථාපනය වීමත් සමඟ ජ්‍යෙෂ්ටය මට්ටමේ . තෘතියික මට්ටමේ හා ද්විතියක මට්ටමේ පුරප්පාඩු කිහිපයක් සම්පූර්ණ කර ඇත. |
| 12. | ඇස්තමේන්තු සකස්කිරීමේ දී අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව වෙන්කිරීම් සිදු කිරීම සහ සැලැසුම් කරන ලද පරිදි වැඩ කටයුතු සිදු නොකිරීම යන හේතු නිසා වැය විෂයයන් 10ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.20,125,000 ක් වූ ශුද්ධ වෙන්කිරීම් වලින් එකතුව රු.8,698,120 ක් හෙවත් සියයට 43 ක් ඉතිරි වී තිබුණි. වැය විෂයයන් යටතේ වූ ඉතිරිය සියයට 20 ත් සියයට 96 ත් අතර පරාසයක් ගෙන තිබුණි. | වෙන් කරන ලද ප්‍රතිපාදන උපරිමව උපයෝජනය කිරීමට කටයුතු කිරීම. | හැකිතාක් දුරට තාත්වික ලෙස ප්‍රතිපාදන අවශ්‍යතාවය සැලසුම් කරන ලෙස ව්‍යාපෘති හා උප ආයතනවලට උපදෙස් දෙන ලද බව, භාණ්ඩාගාරය සමග ඉතා සමීපව කටයුතු කර හැකිතාක් අවශ්‍යතාවය අනුව අක්මුදල් ලබාගැනීමට කටයුතු කරන ලද බව. | ප්‍රතිපාදන හා අක්මුදල් මනා ලෙස කළමනාකරණය කිරීමට කටයුතු කර ඇත. |
| 13. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන ලද තොරතුරු පද්ධතිට දිනපතා යාවත්කාලීන | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255 / 2017 ට | දිනපතා සිගාස් පද්ධතිය වෙත ඇතුළත් කරන ලද | සෑම උප ආයතනයක්ම සිගාස් පද්ධතිය වෙත |

| | | | | |
|---|---|---|---|---|
| | කිරිම සඳහා සෑම වියදම් ඒකකයක් විසින්ම බැඳීම් බැරකම් හා එම බැරකම් නිදහස් කිරීම් පිලිබඳ තොරතුරු එම වෙබ් අඩවියට උත්පනය **(Up lord)** කළ යුතු බවට චක්‍රලේඛ මගින් උපදෙස් ලබා දී තිබුණ ද ඊට අනුකූලව එම තොරතුරු යාවත්කාලීන කර නොතිබුණි. | අනුකූලව බැරකම් පිලිබඳ වාර්තා කල යුතු වීම. | බැඳීම් හා බැරකම් ප්‍රමාණය එදිනම සිගාස් වෙබ් පිටුව වෙත උඩුගත කිරීමට කටයුතු කර දිනපතා යාවත්කාලීන කරන ලෙස සෑම උප ආයතන වෙතම උපදෙස් ලබා දී ඇත. එමෙන් ම අදාළ උප ආයතන විසින් සිගාස් වෙබ් පිටුව වෙත උඩුගත කරන බැඳීම් හා බැරකම් ලැයිස්තුව විද්‍යුත් තැපැල හරහා අමාත්‍යාංශය වෙත ගෙන්වා ගෙන සැසඳීම් කිරීම. | ඇතුළත් කරන ලද බැඳීම් හා බැරකම් ප්‍රමාණය සිගාස් වෙබ් පිටුව වෙත උඩුගත කර යාවත්කාලීන කර ඇත |
| 14. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 134(2) DMA/1-2019 ප්‍රකාරව වර්ෂය ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන සැලැස්ම විගණකාධිපති වරයාගේ එකඟත්වය ලබාගෙන සකස් කිරීමට කටයුතු කල යුතු වේ. | විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලද බව. | විගණකාධිපතිවරයා ගේ එකඟත්වය ලබාගෙන අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කරනු ලැබේ. |
| 15. | අංක 05/2008 දරන හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් | අදාල චක්‍රලේඛ විධිවිධානය න්ට අනුකූලව පුරවැසි | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2022 පෙබරවාරි දක්වාම එලෙස කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සම්පාදනය කොට ක්‍රියාත්මක කර නොතිබුණි. | සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර ක්‍රියාවට නැංවිය යුතු වේ. | | |
| 16. | අල්ලෙයි යෝජනා ක්‍රමයේ දකුණු ඉවුරේ මාර්ගය, කන්තලේ වෙන්දසන් ප්‍රධාන ඇලේ ප්‍රධාන ඇල මාර්ගය සහ පාකිරන්වෙට් නව මාර්ගය දේශගුණික අවබලපෑම් අවම කිරිමේ ව්‍යාපෘතිය යටතේ රු.**19,705,471** ක වියදමින් සංවර්ධනය කර ඇත. කෙසේ වෙතත්, ඉහත සඳහන් මාර්ගවල මීටර් **400** ක් මීටර් **2850** ක් සහ මීටර් **100** ක් පිළිවෙලින් වෙනත් සංවර්ධන ව්‍යාපෘතියක් යටතේ කාපට් අතුරා කොන්ක්‍රීට් කර තිබුණි. ඒ අනුව මෙම මාර්ග සංවර්ධනය සඳහා ව්‍යාපෘතිය යටතේ වැය කළ මුදල අනාර්ථික වියදමක් විය. | නිමකර ඇති මාර්ගයේ කොටස් නැවත කොන්ත්‍රාත් දීමට කටයුතු නොකළ යුතු අතර එලෙස සිදු කිරීම සම්බන්ධයෙ න් ක්‍රියාමාර්ග ගත යුතු වීම. | මෙය ඇස්තමේන්තු කර, ප්‍රසම්පාදන කටයුතු කිරීමට ගත වූ කාලය තුල වෙනත් ව්‍යාපෘතියක් මඟින් නිමකර ඇත. එබැවින් නැවත මෙම කාර්යය සඳහා ප්‍රතිපාදන වෙන් නොකරන ලෙසට උපදෙස් දෙන ලද බව. | මෙම මුදල එම ඇස්තමේන්තුවේ ඉදිරියක් ලෙස පෙන්වා ඇත. ඒ අනුව එම පාර සකස්කර ඇත. |
| 17. | කන්තලේ පෙරාරු මාර්ගයේ රු.**468,285** ක් වැයකර බෝක්කු දෙකක් ඉදිකර තිබුණද, අදාළ පාරවල් මේ දක්වා ඉදි කර නොතිබීම හේතුවෙන් එම බෝක්කු දෙක වර්ෂ දෙකක් තිස්සේ භාවිතා කර නොතිබුණි. | කොන්ත්‍රාත්තු වට අදාළ මාර්ගද සංවර්ධනය කල යුතු වීම. | ගොවි සංවිධානය තුල පැවති අදහස් විෂමතාවය හේතුවෙන් එක් බෝක්කුවක ඉදිකිරීම් නතර කිරිමට සිදු වී ඇති අතර අනෙක් බෝක්කුව ඉදිකිරීමට ඉඩම් අත්පත් කරගත යුතු නිසා ඒ සඳහා | මෙම මුදල එම ඇස්තමේන්තුවේ ඉදිරියක් ලෙස පෙන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතිය තුල නොමැති වීම හේතුවෙන් එම බොක්කුවේ ඉදිකිරීම්ද නතර කරන ලද බව. | |
| 18. | වාරිමාර්ග අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කර ඇති මහවැලි වම් ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා හා කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ඉඩම් අක්කර **6000** කට වාරි ජලය සැපයීම සහ ඝන මීටර් මිලියන **2** ක පානීය ජලය සැපයීම ව්‍යාපෘතියේ අරමුණ විය. **2020** දෙසැම්බර් **31** දිනට රු.**134,955,993** ක් වියදමක් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ. වාරිමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කර අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව මේ සඳහා දැනටත් ශක්‍යතා අධ්‍යයන ඉටුකර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ **(Department of National Planning)** අනුමැතිය ලබාගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන **90** ක විදේශ ණය ලබාගැනීම සඳහා වන ණය ගිවිසුම මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා සෞදි අරමුදලේ නියෝජිතයන් සමඟ **2017** | ව්‍යාපෘතිවලට අදාල ඉඩම් පවරා ගැනීම කාලීනව සිදු කර ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව, MG Sugar ආයතනය හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලද නමුත් මෙය රටවල් දෙකක් අතර හා MG Sugar ආයතනය සමඟ අත්සන් කරන ලද ත්‍රි පාර්ශිවික ගිවිසුමක් නිසා මෙම ඉඩම් ලබා දීමේ ගැටළුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට විසඳිය නොහැකි වේ. මේ සම්බන්ධව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව හා ගුණරුවන් කමිටුව සමඟද වාරිමාර්ග දෙපාර්තමේන්තුව සාකච්ඡා කර මෙම ගැටළුව විසඳීමට කටයුතු කර ඇති බව දක්වා ඇත. නමුත් එය | 2022 පෙබරවාරි වන විටත් එම තත්වයේම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ දී අත්සන් කර තිබුණද කන්තලේ සීනි කර්මාන්ත ශාලාවට අයත් ඉඩම් අත්පත් කර ගැනීමේදී මතුව ඇති ගැටළු හේතුවෙන් විදේශ ණය මුදල් ලබා දීම අත්හිටුවා තිබුණි. | | සාර්ථක වී නොමැත. නමුත් කන්තලේ සීනි සමාගමට උක් වගාව සඳහා අනිවාර්යයෙන් ජලය ලබා දිය යුතු බැවින්, ඒ පිළිබඳවා අධ්‍යයනය කර මෙම ගැටළුව විසඳන ලෙස වාරිමාර්ග අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන සමඟ සාකච්ඡා කර ඇත. ඒ අනුව මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ සීනි සමාගමට ජල ගැටළුව විසඳීමට කරනු ලබන ශක්‍යතා අධ්‍යනයට මෙම යොජනාව ද ඇතුලත් කර ඇත. ඒ අනුව වියදම් ලබා දෙන බව. | |
| 19. | ඉහත ව්‍යාපෘතියට අදාල පරිසර ඇගයීම් වාර්තාව **(EIA)** ව්‍යාපෘතිය ආරම්භ කර වසර **4** ක් ඉක්ම වී තිබුණද **2021** අප්‍රේල් **30** දින දක්වා එය සම්පූර්ණ කර නොතිබුණි. | ව්‍යාපෘතියට අදාළ පරිසර ඇගයීම් කාලීනව සිදු කිරීමට කටයුතු කිරීම. | ව්‍යාපෘතියට අදාල පරිසර ඇගයීම් වාර්තාවට අනුමැතිය ලබා ගැනීමට හා මෙම පාරිසරික ඇගයීම් කරනු ලබන | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබුණු පසු පරිසර ඇගයීම් වාර්තාව අවසන් කළ හැක. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ආයතනයේ අවසන් බිල්පත් ගෙවීමට අදාල තොරතුරු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව. | |
| **20.** | මෙම ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයෙකු ඇතුළු **27** දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් පත් කර **2017** වර්ෂයේ සිට **2020** මැයි මස දක්වා වැටුප් ගෙවා ත්‍රිකුණාමල ප්‍රදේශයේ ව්‍යාපෘති කාර්යාලයක් පවත්වාගෙන ගොස් තිබුණු අතර **2017** සිට **2020** දක්වා කාල සීමාව තුල රු.මිලියන **135** ක් වැය කර තිබුණි. | ව්‍යාපෘති කාර්ය මණ්ඩලය විසින් වර්ෂ 04 ක් තුල ඉලක්ක ගත අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියාකර ඇති ආකාරයෙහි පවත්නා දුර්වලතා හඳුනාගෙන ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වලක්වා ගැනිමට අවශ්‍ය අභ්‍යන්තර පාලනය ශක්තිමත් කල යුතු වීම. | මෙම ව්‍යාපෘති කාර්යාලය මඟින් ව්‍යාපෘතියට අවශ්‍ය මූලික කාර්යයන් ඉටු කර ඇති බව. | 2022 පෙබරවාරි වනවිට මෙම ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන යනු නොලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| 21. | ඉහත ව්‍යාපෘතිය යටතේ ඉටු කිරීමට නියමිතව තිබුණු**,** කින්නියා **,** කන්තලේ ප්‍රදේශයේ වාරි වැවක් ඉදි කිරීම**,** මීටර් **15** ක ධාරිතාවයෙන් යුත් කළු ගඟ ජලාශ ඉදි කිරීම**,** ඇල මාර්ග **03** ක් ඉදි කිරීම සහ නින්තරවේදි ප්‍රදේශයේ නව ඉඩම් අක්කර **3000** ක් වගා කිරීම යන කාර්යයන් සඳහා ඉඩම් පවරා ගෙන නොතිබුණු අතර **2020** දෙසැම්බර් **31** දින වනවිට ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. තවද ඉදි කර තිබුණු ගෙඩනැගිලි **2** ක් ඉදි කිරීම් කටයුතු නිම කිරීමකින් තොරව අත් හැර දමා තිබුණි. | අතරමඟ වැඩ නවතා දමා ඇති ගොඩනැගිලි වැඩ නිම කිරිමට හා ඵලදායි කාර්යක් සඳහා භාවිතයට අවශ්‍ය පාර්ශවයන් වෙත භාරදීමට කටයුතු කල යුතු වේ. | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ සීනි සමාගමට ජල ගැටළුව විසඳීමට කරනු ලබන ශක්‍යතා අධ්‍යනයට මෙම යොජනාව ද ඇතුලත් කර ඇති බව. | ශක්‍යතා අධ්‍යන වාර්තාව ලැබුණු පසු ඉදිරි කටයුතු සඳහා මෙම ගොඩනැගිලි භාවිතයට ගනු ලැබේ. |
| 22. | අදාල කර්තව්‍යයන් නිසි පරිදි ඉටු නොවීම හේතුවෙන් අපේක්ෂිත පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම තුල**,** එමගින් අපේක්ෂිත ආර්ථික හා සාමාජීය ප්‍රතිලාභ මහජනතාව වෙත ලබා දීමට නොහැකි වී තිබුණි. මේ සඳහා දරන ලද රු.මිලියන **135** ක පිරිවැය අනාර්ථික වියදමක් වී තිබුණි. | ව්‍යාපෘතිය නිම කර අරමුණු ප්‍රතිලාභ මහජනයාට ලබා දීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර ව්‍යාපෘතිය නතර කිරීමට හේතු පරීක්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කරන ලද පෝෂණ ප්‍රදේශයන් සඳහා ජලය ලබා දිය යුතුව ඇත. මේ සඳහා මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන මගින් ශක්‍යතා අධ්‍යන සිදු කරනු ලබන බව. | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන මගින් කරනු ලබන ශක්‍යතා අධ්‍යනයෙන් පසු ලබා දෙන විසඳුම් ක්‍රියාත්මක කිරීම මගින් මෙම ගැටළුව විසඳීමට අපේක්ෂා කෙරේ. |

| | | | | |
|---|---|---|---|---|
| 23. | පහල මල්වතු ඔය ජලාශ සඳහා වන පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සකස් කිරීම් කටයුතු **2013** වර්ෂයේදී මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්) සමාගම වෙත පවරා තිබුණි. එම ආයතනය විසින් අදාල වාර්තාව **2018** මැයි මස ඉදිරිපත් කර තිබුණි. පාරිසරික ඇගයීම් තාක්ෂණික කමිටුව (**EIA Tech Team)** විසින් එම වාර්තාවේ සඳහන් කරුනු හා ක්ෂේත්‍රයේ පවත්නා තත්වයන් අතර පරස්පරතාවයන් පවතින බව නිරික්ෂණය කර තිබුණි. | පාරිසරික ඇගයීම් වාර්තා නිසි කාලයට සිදු කළ යුතු අතර ඒ පිළිබඳව පැනනැඟී ඇති ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට කටයුතු කල යුතු ය. | වනජීවි දෙපාරිතමේන්තුව මඟින් ඉඩම් ලබා නොගන්නා අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් පවරා එම දෙපාර්තමේන්තුවේ එකඟතාවය අනුව ලබා ගැනීම, පරිසර කළමනාකරණ සැලැස්ම (ENP) සකස් කිරීමට අවශය කාර්ය නිර්දේශය.(TOR) අමාත්‍ය මණ්ඩල සංදේශ අංක අමප/16/0778/279/016 පරිදි වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වන MCB/CECB හෝ ඊට අනුබද්ධ ආයතනයක් වන CESL මඟින් ඉටු කර ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු සඳහා කටයුතු කරමින් පවතින බව. | අංක 08/ETA1water/09/2011 හා 2021 /01/20 දැනැති පාරිසරික බලපෑම් වාර්තාවට අනුව මහවිලච්චිය -320 HA , සෙට්ටිකුලම-480HA සහ කළුවිල,නාරවේල-2012-HA යන කාර්යයන් අනුමත වී ඇත. |
| 24. | පහළ මල් වතු ඔය ජලාශ ව්‍යාපෘති යටතේ ජලාශයට අයත් භූමි ප්‍රදේශය සම්බන්ධයෙන් වූ පාරිසරික බලපෑම් ඇගයීම් අධ්‍යයන වාර්තාව සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලැබී නොතිබුණි. තවද ජලාශයට | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව, ඉඩම් | අදාල ආයතන සමඟ ඍජුව සම්බන්ධ වෙමින් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කර ගැනීම. | *2021/01/20 දින පාරිසරික බලපෑම් වාර්තාව සඳහා අනුමැතිය ලැබී ඇති අතර * වන්දි ගෙවීම, විකල්ප ඉඩම් ලබා |

| | | | | |
|---|---|---|---|---|
| | යටවන ඉඩම් අක්කර **13,349** ක මැනුම් කටයුතු අවසන් කර තිබුණද එම ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබීම, ජලාශ ඉදිකිරිම හේතුවෙන් බලපෑමට ලක්වන පවුල් සඳහා ගෙවිය යුතු වන්දි සම්බන්ධයෙන් එකඟත්වයකට පැමිණ නොතිබීම, එම පවුල් නැවත පදිංචි කිරීමට හඳුනා ගත් ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කර බිම් කොටස් බෙදා වෙන් කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම, ජලාශය ඉදිකිරීම ආරම්භ කිරිම සඳහා අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග සම්පූර්ණ කර නොතිබිම සහ පහල මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා **2019** අගෝස්තු **30** දින මුල්ගල් තැබීම වෙනුවෙන් සංවිධානය කල උත්සවය සඳහා රු.**22,088,598** ක් වැය කර තිබීම යනාදී අඩු පාඩු නිරික්ෂණය විය. | පවරා ගැනීම ආදී කටයුතු සිදු කිරීම කල යුතු ය. | මුල් ගල තැබීමේ උත්සවය, අතිගරු ජනාධිපතිතුමා ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු රජයේ මැති ඇමතිවරු විශාල ප්‍රමාණයක් සහභාගීව පැවැත් වූ ජාතික උත්සවයක් විය. ජනාධිපති හා අග්‍රාමාත්‍ය ආරක්ෂක අංශවල ද එකඟතාවය සහිතව එම උත්සවය සංවිධානය කළ යුතු වූ බැවින් හා අදාල ප්‍රමිතියන් තිබිය යුතු වැවින් එම උත්සවය සඳහා විගණන විමසුමේ සඳහන් මුදලක් වැය කිරීම නිවැරදි බව. | දීම, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා යෝජනාවලිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව හරහා අමාත්‍ය මණ්ඩල සංදේශය අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. නැවත පදිංචි කිරීම සඳහා කළුවිල, නාරංවිල ප්‍රදේශයේ ඉඩම් කට්ටි කිරීමේ සැලැස්ම (BOD)සකස් කර ඇත. පහල මල්වතුඔය ජලාශ ව්‍යාපෘතිය ඉදිකිරීම් කටයුතු 2021 මාර්තු මස ආරම්භ කළ අතර වේල්ලේ කටයුතු සිදු කරමින් පවතී. |
| 25. | දේශගුණික අවබලපෑම් අවම කිරිමේ ව්‍යාපෘතිය මන්නාරම යෝධ වැවෙහි වම් ඉවුර ඇල බැම්ම දෙපස තණ පිඩලි අල්ලා සංවර්ධන කිරිම වෙනුවෙන් රු.**4,544,430** ක් ගෙවා තිබුණි. භෞතික පරික්ෂාවට අනුව කොන්ත්‍රාත්කරු විසින් නියමිත පරිදි ඇල බැම්ම දෙපස පිඩලි අල්ලා නොතිබුණු අතර ඒ හේතුවෙන් බැම්මේ දෙපස සෝදා | සැලැසුම් කළ පරිදි ඉදිකිරීම් සිදු කිරීමට කටයුතු කල යුතු වේ. | මෙම කොටස් නිවැරදි කිරීමට උපදෙස් ලබාදෙන ලද බව හා තවද ගවයින් ගැවසෙන ස්ථානයේ ඉදිකිරීම් සිදු කිරීමේදී ඊට සරිලන නිර්මිත සැකසීමට උපදෙස් ලබාදෙන ලද බව. | නිවැරදි කිරීම් කර ඇති බව. |

| | | | | |
|---|---|---|---|---|
| | පාලුවට ලක්වී තිබුණි. තවද බැම්මේ මතුපිට පළල මීටර් **4** ක් වනසේ ඉදි කල යුතුව පැවතුණද මතුපිට පළල නියමිත ප්‍රමාණයට ඉදි කර නොතිබුණු අතර විවිධ අගයන්ගෙන් යුතු විය. ඒ හේතුවෙන් බැම්මට හානි සිදු විමට ඉඩකඩ පැවතුණි. | | | |
| 26. | මන්නාරම වෙල්ලක්කඹ්ඹු ජලාශයේ වැව් බැම්ම ඉදි කිරිම සඳහා වු පස් එම ස්ථානයේ සිට කිලෝ මිටර් **1.2** ක් දුරින් ප්‍රවාහනය කරන බව මූලික ඇස්තමේන්තුවේ සඳහන් වුවද කොන්ත්‍රාත්කරු විසින් වැව් බැම්ම සඳහා අවශ්‍ය පස් වැව් පතුලෙන් ලබා ගෙන තිබුණි.තවද වැව් බැම්මේ පිඩලි ඇල්ලීම සඳහා වැඩ අයිතම **6.4** යටතේ රු.**659,214** යටතේ ඇස්තමේන්තු කර තිබුණද එම වැඩ අයිතමය ඉටු කිරිමකින් තොරව කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතු වේ. | ඒ සඳහා ගෙවීම් නොකිරීමට හා ප්‍රමිතිය පරීක්ෂා කිරීමට ද උපදෙස් ලබාදෙන ලද බව. | ඒ සඳහා ගෙවීම් නොකරන ලද අතර ඒ අනුව කොන්ත්‍රාත්තුවේ ඉතිරියක් විය. |
| 27. | සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලය **179** ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය **139** ක් විය. ඒ අනුව**,** ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු **09** ක**,** තෘතියික මට්ටමේ තනතුරු **02** ක **,** ද්වීතියික මට්ටමේ තනතුරු **27** ක සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු **02** ක් වශයෙන් | තනතුර අවශ්‍යතා සමාලෝචනය ට ලක් කර අවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරිමට | අදාල පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කරන ලෙස රාජ්‍ය සේවා , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත හා වාරිමාර්ග දෙපාර්තමේන්තව | නව අමාත්‍යාංශ ප්‍රතිස්ථාපනය වීමත් සමඟ ජ්‍යෙෂ්ටය මට්ටමේ . තෘතියික මට්ටමේ හා ද්වීතියක මට්ටමේ පුරප්පාඩු කිහිපයක් සම්පූර්න කර ඇත. |

පුරප්පාඩු **40** ක් පැවතුණි. ඒවා කටයුතු කල වෙත දන්වා යවා ඇති සම්පූර්ණ කිරිමට කටයුතු කර යුතු වේ. බව. නොතිබුණි.

## 28. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|
| -------- | ------- | ------ | ------- | -------- |
| | රු. | රු. | රු. | රු. |
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | | | | |
| - පුනරාවර්ථන වියදම් | 515,647,000 | 510,640,000 | 316,865,000 | 1,343,152,000 |
| - මූලධන වියදම් | 13,466,559,000 | 16,896,290,000 | 38,287,215,000 | 68,650,064,000 |
| | ----------------- | ------------------- | ------------------- | ------------------- |
| - එකතුව | 13,982,206,000 | 17,406,930,000 | 38,604,080,000 | 69,993,216,000 |
| | =========== | =========== | =========== | =========== |
| සත්‍ය වියදම | | | | |
| - පුනරාවර්ථන වියදම් | 497,624,537 | 476,063,852 | 305,468,534 | 1,279,156,923 |
| - මූලධන වියදම් | 7,340,710,321 | 7,884,904,949 | 29,148,936,905 | 44,374552,174 |
| | ------------------ | ------------------- | ------------------- | ------------------- |
| - මුළු වියදම | 7,838,334,858 | 8,360,968,801 | 29,454,405,439 | 45,653,709,098 |
| | =========== | =========== | =========== | =========== |
| වසර අග ඉතිරිවීම් | | | | |
| - පුනරාවර්ථන වියදම් | 18,022,463 | 34,576,147 | 11,396,465 | 63,998,075 |
| - මූලධන වියදම් | 6,125,848,678 | 9,011,385,051 | 9,138,278,095 | 24,275,511,824 |
| | ------------------ | ------------------- | ------------------- | ------------------- |
| - මුළු වියදම | 6,143,871,141 | 9,045,961,198 | 9,149,674,560 | 24,339,506,899 |
| | =========== | =========== | =========== | =========== |

## 29. ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය - 121**

මූලා ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය කළ මතය

| විගණන නිරීක්ෂණ | | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ පියවර | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | සේවය හැර ගිය, මියගිය, විශ්‍රාමික, වැඩ තහනම් කළ සහ වෙනත් නිළධාරීන්ගෙන් අයකර ගත යුතු වර්ෂ 05 ක් ඉක්මවූ ණය ශේෂය රු.493,140 ක් 2020 දෙසැම්බර් 31 දිනටත් අයකර ගෙන නොතිබුණි. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ශේෂයන් අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල 04කින් කටයුතු කරමින් සිටින බව. | ණය අයකර ගැනීම අවිනිශ්චිතව පවතී. |
| 02. | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | අමාත්‍යාංශයේ සියලුම නිළධාරින් වෙත අංක 07/2019 දරන චක්‍රලේඛය නිකුත් කරමින් ඇප මුදල් තැන්පත් කිරීම සම්බන්ධයෙන් විධිවිධාන යොදා ඇති බව. | ඇප ලේඛනයක් පවත්වා නැත. |
| 03. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල 08කින් මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා 2018 වර්ෂයේදී 1/20 දීමනාවක් ලෙස රු.1,634,326 ක් ගෙවා තිබුණි . | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වීම. | ආයතන සංග්‍රහය හා චක්‍රලේඛ විධිවිධානවලින් බැහැරව ගෙවීම් සිදුනොකරන ලෙස ගෙවීම් කාර්යාල දැනුවත් කර ඇති බව. | ආයතන සංග්‍රහයට පටහැනිව ගෙවූ මුදල අයකරගැනීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නැත. |

| | | | | |
|---|---|---|---|---|
| 04. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව 2020 වර්ෂය දක්වා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වීම | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව. | පුහුණු සැලැස්මක් සකස් කර තිබුණද මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නැත. |
| 05. | 2017 වර්ෂයේදී විදුලි උත්පාදක යන්ත්‍ර 111 ක් රු. 4,995,000 කට මිලදී ගෙන තිබුණ අතර එයින් විදුලි උත්පාදන යන්ත්‍ර 16 ක් මිලදී ගත් දින සිට කිසිදු ප්‍රයෝජනයකින් තොරව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ තබා තිබුණි. | විදේශාධාර ව්‍යාපෘතිවලින් ලැබෙන මුදල් ආර්ථිකභාවයෙන්, කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. | නව ගබඩා පහසුකම් ඇති කිරීමෙන් පසු විදුලි උත්පාදන යන්ත්‍ර 08ක් මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දී ඇති බව. | විදේශාධාර ඵලදායීව උපයෝජනය කර නැති අතර විදුලි ජනක යන්ත්‍ර 08 ක් ගබඩාවේ ඉතිරිව ඇති බව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් විසින් වාර්තා කර ඇත. |
| 06. | අපරික්ෂාකාරී හා අධික වේගයෙන් වාහනය ධාවනය හේතුවෙන් 2018 වර්ෂයේ අවස්ථා 02 කදී රු.4,849,189 ක අලාභයක් සිදුවී තිබුණි. | මෝටර් වාහන ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී මෙවැනි දේ සිදු නොවීමට රියදුරන් වෙත උපදෙස් ලබා දී ඇති බව. | රියදුරන් වෙත උපදෙස් ලබා දුන් බවට ලිඛිත තහවුරුවක් නොවීය. |
| 07. | 2020 වර්ෂයේ ස්වදේශ කටයුතු අංශයේ පොත් අනුව හා භාණ්ඩාගාර සටහන් අනුව අත්තිකාරම් ශේෂයන් අතර රු.8,432,382 ක වෙනසක් විය. | සැසඳීම් කර නිවැරදි ශේෂයන් දැක්වීමට කටයුතු කළ යුතු වීම. | වෙනසින් රු.1,031,409ක් 2021 වර්ෂයේදී නිරවුල් කර ඇත. | රු.7,400,973 ක වෙනසක් නිරවුල් කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| 08. | ඉ- ග්‍රාම නිලධාරී ව්‍යාපෘතියේ මෘදුකාංග සංවර්ධනය සඳහා 2020 වර්ෂයේදී රු.15,352,353 ක් වැයකර තිබුණ ද ඊට අදාලව ග්‍රාම නිලධාරින් පුහුණු කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘතියෙන් ප්‍රයෝජන ලබා ගත හැකි පරිදි ග්‍රාම නිලධාරීන් පුහුණු කළ යුතු වීම. | ICTA තීරණවලට ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාව අනුව, ඉ-ග්‍රාම නිලධාරි ව්‍යාපෘතිය යටතේ පෙර සැලසුම් කර තිබූ කටයුතු කිහිපයක් තාවකාලිකව අත්හිටුවීමට හෝ සංශෝධනය කිරීම. (දත්ත එකතු කිරීමේ පෝරම මුද්‍රණයද තිවකාලිකව අත්හිටුවීම.) | ගෘහ/පුරවැසි දත්ත එක් රැස් කිරීමේ ක්ෂේත්‍ර ක්‍රියාවලිය සම්පූර්ණ කළ නොහැකි වීම නිසා අදාල කාර්යය සිදු වී නොතිබුණි. |

## 9. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය | | | | |
| පුනරාවර්තන | 8,441,409,390 | 8,832,300,000 | 20,595,705,000 | 37,869,414,390 |
| මූලධන | 12,896,063,610 | 12,170,493,000 | 7,050,724,000 | 32,117,280,610 |
| එකතුව | 21,337,473,000 | 21,002,793,000 | 27,646,429,000 | 69,986,695,000 |
| සත්‍ය වියදම | | | | |
| පුනරාවර්තන | 8,068,054,437 | 8,448,373,450 | 20,264,508,771 | 36,780,936,658 |
| මූලධන | 10,604,851,448 | 7,363,654,808 | 5,425,975,237 | 23,394,481,493 |
| එකතුව | 18,672,905,885 | 15,812,028,258 | 25,690,484,008 | 60,175,418,151 |
| වසර අග ඉතිරි වීම් | | | | |
| පුනරාවර්තන | 373,354,953 | 383,926,550 | 331,196,229 | 1,088,477,732 |
| මූලධන | 2,291,212,162 | 4,806,838,192 | 1,624,748,763 | 8,722,799,117 |
| එකතුව | 2,664,567,115 | 5,190,764,742 | 1,955,944,992 | 9,811,276,849 |

## 30. ජාතික උරුම, ප්‍රාසාංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 401

ජාතික උරුම, ප්‍රාසාංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

(අමාත්‍යාංශය 2020 අගෝස්තු 09 දින ආරම්භ කර ඇත.)

**ප්‍රතිපාදන උපයෝජනය**

| **විස්තරය** | **2020** | |
|---|---|---|
| ----------- | ------- | |
| විගණන මතය | තත්ත්වාගණනය කළ මතය | |
| | **2020** | **එකතුව** |
| | රු. | රු. |
| | ------ | -------- |
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | | |
| - පුනරාවර්ථන වියදම් | 237,400,000 | 237,400,000 |
| - මූලධන | 369,500,000 | 369,500,000 |
| - එකතුව | 606,900,000 | 606,900,000 |
| ශුද්ධ ප්‍රතිපාදනය | | |
| - පුනරාවර්ථන | 237,400,000 | 237,400,000 |
| - මූලධන | 379,500,000 | 379,500,000 |
| - එකතුව | 616,900,000 | 616,900,000 |
| සත්‍ය වියදම | | |
| - පුනරාවර්ථන වියදම් | 178,076,611 | 178,076,611 |
| - මූලධන වියදම් | 352,113,548 | 352,113,548 |
| - එකතුව | 530,190,159 | 530,190,159 |
| වසර අඟ ඉතිරිවීම් | | |
| - පුනරාවර්ථන වියදම් | 59,323,389 | 59,323,389 |
| - මූලධන වියදම් | 27,386,452 | 27,386,452 |
| - එකතුව | 86,709,841 | 86,709,841 |

## 31. ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 402

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - 2020 තත්ත්වාගණනය කළමතය

**ප්‍රතිපාදන උපයෝජනය**

| **විස්තරය** | | **2020** | **එකතුව** |
|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය | පුනරාවර්තන | 444,823,000 | 444,823,000 |
| | මූලධන | 940,099,000 | 940,099,000 |
| | එකතුව | 1,384,922,000 | 1,384,922,000 |
| සත්‍ය වියදම | පුනරාවර්තන වියදම් | 400,928,100 | 400,928,100 |
| | මූලධන වියදම් | 554,799,270 | 554,799,270 |
| | එකතුව | 955,727,370 | 955,727,370 |
| වසර අග ඉතිරිවීම් | පුනරාවර්තන වියදම් | 43,894,900 | 43,894,900 |
| | මූලධන වියදම් | 385,299,730 | 385,299,730 |
| | එකතුව | 429,194,630 | 429,194,630 |

## 32. කාන්තා හා ළමා සංවර්ධන,පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන,පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය - 403**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

මෙම අමාත්‍යාංශයේ ශීර්ෂය හා නම 2018 – 2020 කාලපරිච්ඡේදය තුලදී පහත සඳහන් ලෙස වෙනස්වී තිබුණි

| ශීර්ෂය අංකය | නම | වර්ෂය |
|---|---|---|
| 120 | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | 2018 |
| 120 | කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය | 2019 |
| 120 | කාන්තා හා ළමා කටයුතු සහ සමාජ සංවර්ධන අමාත්‍යාංශය | 2020 අගෝස්තු දක්වා |
| 403 | කාන්තා හා ළමා සංවර්ධන,පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන,පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | 2020 සැප්තැම්බර් සිට |

| විගණන නිරීක්ෂණය | | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ගය | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | ජාතික ප්‍රමුඛතා හා අවශ්‍යතා මෙන්ම ජාත්‍යන්තර ප්‍රමිතීන් ද සැලකිල්ලට ගනිමින් ළමුන් හා කාන්තාවන් ආර්ථික, සමාජයීය හා අධ්‍යාපනික වශයෙන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය නෛතික, ආයතනික, මානව සම්පත් සේවා හා යටිතල පහසුකම් සම්පාදනය කිරීම, වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක | මෙහෙවරට අනුකූලව ක්‍රියා කිරීම සඳහා ප්‍රතිපත්ති බලාත්මක කර ක්‍රියාත්මක කළ යුතු වීම. | ළමුන් අධ්‍යාපනික වශයෙන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සම්බන්ධ අවධානය යොමු කිරීමේ දී ජාතික ළමාරක්ෂක අධිකාරිය විසින් | මෙහෙවරට අනුකූලව ක්‍රියා කිරීම සඳහා අදාළ ප්‍රතිපත්ති බලාත්මක කර ක්‍රියාත්මක කිරීම සඳහා 2021 දෙසැම්බර් 31 දක්වාම කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීම අමාත්‍යාංශයේ මෙහෙවර වුවද, ළමා හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා සම්පාදනය කළ නීති හා සකස් කල ප්‍රතිපත්ති බලාත්මක කර ක්‍රියාත්මක කර නොතිබුණි. | | අනිවාර්ය අධ්‍යාපනය කඩවීම පිළිබඳව අධිකාරිය වෙත වාර්තා වූ පැමිණිලි සම්බන්ධව අවශ්‍ය මැදිහත්කරණය අවශ්‍ය අවස්ථාවලදී ලබා දී ඇති බව. | කර නොතිබුණි. |
| 02. | 2001 වර්ෂයේ දී රු.මිලියන 25 ක් වැය කර බියගම කාන්තා නේවාසිකාගාරයක් ඉදිකර තිබුණ ද 2020 අගෝස්තු 27 විගණන දින වන විටත් එම ඉඩම විධිමත් පරිදි පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතු වීම. | පවරා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | නාගරික සංවර්ධන අධිකාරියට හා ප්‍රාදේශීය ලේකම්වරයාට පවරා ගැනීමේ කටයුතු සම්බන්ධව දැනුම් දී ඇතත් 2021 දෙසැම්බර් 31 දක්වාම පිළිතුරක් ලැබී නොමැති බව. |

## 03. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|
| | ------- | ------- | -------- | ------- |
| | රු. | රු. | රු. | රු. |
| ඇස්තමේන්තුගත | | | | |
| ප්‍රතිපාදනය | 1,135,903,000 | 7,093,994,000 | 20,757,530,000 | 28,987,527,000 |
| - පුනරාවර්තන | 1,523,660,000 | 1,585,690,000 | 15,233,520,000 | 18,342,870,000 |
| - මූලධන | 2,659,563,000 | 8,679,684,000 | 35,991,050,000 | 47,330,397,000 |
| - මුළු වියදම | | | | |
| ශුද්ධ ප්‍රතිපාදනය | | | | |
| - පුනරාවර්තන | 6,958,323,000 | 7,096,098,000 | 20,755,030,000 | 34,809,45 |
| - මූලධන | 1,630,583,453 | 1,847,093,000 | 15,236,020,000 | 18,713,69 |
| - මුළු වියදම | 8,588,906,453 | 8,943,191,000 | 35,991,050,000 | 53,523,14 |
| සත්‍ය වියදම් | | | | |
| පුනරාවර්තන | 6,846,824,913 | 6,766,891,849 | 19,012,387,668 | 32,626,10 |
| මූලධන | 1,150,883,055 | 1,551,139,660 | 14,710,337,460 | 17,412,36 |
| මුළු වියදම් | 7,997,707,968 | 8,318031,509 | 33,722,725,128 | 50,038,46 |
| වසර අග ඉතිරි වීම් | | | | |
| පුනරාවර්තන | 111,498,087 | 329,206,151 | 1,742,642,332 | 2,183,34 |
| මූලධන | 479,700,398 | 295,953,340 | 525,682,540 | 1,301,3 |
| මුළු වියදම් | 591,198,485 | 625,159,491 | 2,268,324,872 | 3,484,6 |

## 33. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 404

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2020 තත්ත්වාගණනය කළමතය

| විගණන නිරීක්ෂණය/ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | ආස්ථිත්වය විසින් ගනු ලැබූ වැලැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01. රාජ්‍ය අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා වැය විෂයන් 12 කට අදාළව වෙන්කළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු.6,171,757 ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි. | අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීමට වාර්ෂිකව සලසනු ලබන ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | කාර්යමණ්ඩලය, වාහන, කාර්යාල පහසුකම් ආදී අවශ්‍යතා අවම මට්ටමින් භාවිත කරමින් රාජ්‍ය අමාත්‍යාංශයේ කටයුතු පවත්වා ගෙන යාමත් **covid – 19** තත්ත්වය මත පුහුණු පාඨමාලා ඇතුළු කාර්යයන් ක්‍රියාත්මක කළ නොහැකි වීමත් මෙසේ ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වූ බව. | 2021 වර්ෂයේද විවිධ කාර්යයන් ඉටු කළ නොහැකි වීමෙන් ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| **02.** | මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව මාරු කරන ලද ප්‍රතිපාදන වලින් අවස්ථා 05 කදී එකතුව රු.3,599,760 ක් වූ ප්‍රතිපාදනයන් ඉතුරුව පැවති අතර එය සියයට 30 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි. | -එම- | -එම- | -එම-. |
| **03.** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 756 (6) ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකර එම වාර්තා 2021 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2021 ජූලි 31 දින වන විටත් අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය සිදු කර අදාළ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කළ යතුය. | 2021 වර්ෂයේ සිට මු.රෙ. ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ සිදුකිරිමට කටයුතු කරන බව | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදුකර ඇත. |
| **04.** | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2020 වර්ෂයේ අදාළ ගිණුම් කාලපරිච්ඡේදය සඳහා රාජ්‍ය අමාත්‍යංශය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුවීම. | අළුතින් පිහිටුවන ලද මෙම අමාත්‍යංශයට නිත්‍ය කාර්යය මණ්ඩලයක් නොසිටීම හා නිශ්චිත කාර්යාල පරිශ්‍රයක් නොතිබීම හේතුවෙන් 2020 වර්ෂයේ අදාළ කාලපරිච්ඡේදය අදාළ ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙළ කිරීමට අවකාශ නොලැබුණු බව | 2021 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| **05.** | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව රාජ්‍ය අමාත්‍යංශය විසින් දැනුවත් වී, රාජ්‍ය අමාත්‍යංශය අදාළ කර ගත හැකි තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනා ගෙන නොතිබුණි. | අමාත්‍යංශයට අදාළ තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනා ගත යුතුවීම. | ජාතික අධ්‍යාපන ආයතන විෂය මාලා සංශෝධන හා විදුහල්පතිවරුන් හා ගුරුවරුන් පුහුණු කිරීම මත සියළු කටයුතු ආරම්භ කරමින් ක්‍රියාත්මක කරමින් යන බව | 2021 වර්ෂයට අදාළව ද තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන නොතිබුණි. |

**06.** ප්‍රතිපාදන උපයෝජනය

| | 2020 | එකතුව |
|---|---|---|
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ------- | --------- |
| | රු. | රු. |
| පුනරාවර්ථන වියදම් | 517,554,000 | 517,554,000 |
| ප්‍රාග්ධන වියදම් | 1,725,630,000 | 1,725,630,000 |
| මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | 2,243,184,000 | 2,243,184,000 |
| සත්‍ය වියදම | | |
| - පුනරාවර්ථන වියදම් | 505,863,603 | 505,863,603 |
| - මූලධන වියදම් | 1,603,921,588 | 1,603,921,588 |
| මුළු වියදම් | 2,109,785,191 | 2,109,785,191 |
| වසර අග ඉතිරි වීම් | | |
| - පුනරාවර්ථන වියදම් | 11,690,397 | 11,690,397 |
| - මූලධන වියදම් | 121,708,412 | 121,708,412 |
| මුළු ඉතිරිවීම් | 133,398,809 | 133,398,809 |

## 34. විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 405

| | | |
|---|---|---|
| මූලා‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය | - 2018 - | 2020 වර්ෂයේදී මෙම අමාත්‍යාංශය පිහිටුවා ඇත. |
| | - 2019 | |
| | - 2020 - | තත්ත්වාගණනය කළමතය |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| **01.** | 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට ආපසු ගෙවිය යුතුව තිබුණු එකතුව රු.2,908,690ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමකින් තොරව වරාය සංවර්ධන ව්‍යාපෘතියේ බැංකු ගිණුමට මාරු කර තිබුණි. | වර්ෂ අවසාන ඉතිරි මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු වේ. | ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නොවෙනස්ව පවතී. |
| **02.** | පර්යේෂණ හා සංවර්ධන කාර්යය යටතේ මූලධන වියදම් දැරීමට ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (NARA) වෙත වෙන් කරන ලද රු.7,773,000ක මුදල ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ (NAQDA) ප්‍රාග්ධන වියදම් දැරීමට මාරු කිරීම සඳහා යොදා ගෙන තිබුණි. එම නියෝජිතායතනයේ (NARA) පර්යේෂණ ක්‍රියාවලි සඳහා අරමුදල් උපයෝජනය සියයට | පර්යේෂණ කටයුතු සඳහා ප්‍රතිපාදනය කළ අරමුදල් ඒ සඳහා යෙදවීමට කටයුතු කළ යුතු වේ. | ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත ප්‍රතිපාදන මාරු කිරීමක් සිදුකර ඇති බැවින් ක්‍රියාමාර්ගයක් ගෙන නැත. | නොවෙනස්ව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | 64.5ක් වූ බැවින් අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතිවලට සාපේක්ෂව පර්යේෂණ කටයුතු සඳහා අරමුදල් යෙදවීම අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | | | |
| **03.** | ආයතනය විසින් ඉදිරිපත් කළ බැරකම් ලේඛනය අනුව වැය විෂයයන් 2ක් සඳහා වාර්ෂික ප්‍රතිපාදිත මුදලින් ඉතිරි වූ රු.95,000ක ප්‍රමාණය ඉක්මවා රු.15,006,102ක බැරකම් හා බැඳීම් ඇති කරගෙන තිබුණි. | ඒ ඒ වැය විෂයයන් සඳහා වෙන්කළ මුදල ඇතුළත වියදම් දැරීමට කටයුතු කළ යුතු වේ. | ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නොවෙනස්ව පවතී. |
| **04.** | රාජ්‍ය අමාත්‍යාංශයට වෙන්කළ ප්‍රතිපාදනවලින් සියයට 97කට සමාන රු.260,097,285 ක් ජාතික ජලජීවී සංවර්ධන අධිකාරියේ **(NAQDA)** සංවර්ධන ව්‍යාපෘති 05කට වැයකර තිබුණ ද එම අරමුදල් අදාල කාර්යයන්වලට යෙදවීම පිළිබඳ පසු පරීක්ෂා කිරීමක් අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි. | ව්‍යාපෘතිවලට වැයකළ අරමුදල් අදාල කාර්යයන්වලට යෙදවීම සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමත් පසුවිපරම් කටයුතුත් කළ යුතු වේ. | කාර්යය භාරයන් අධීක්ෂණය කිරීමට හෝ පසු පරීක්ෂාවක් කිරීමට හෝ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පසුවිපරම් සිදුකළ බව හෝ ප්‍රගති වාර්තා හෝ ඉදිරිපත් කර නොතිබුණි. |
| **05.** | සංවර්ධන මූලධන වෙන්කිරීම් යටතේ රු.203,973,000 ක් සමාලෝචිත වර්ෂය තුළ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට ලබා දී තිබුණ ද ඉදිරිපත් කළ ප්‍රගති වාර්තාව අනුව මෙම ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 29 ක් සඳහා රු.196,200,000ක් පමණක් වැය | -එම- | -එම- | -එම- |

කර තිබුණි. සිදු කරනු ලබන කාර්යයන් හා ප්‍රතිලාභ ලබන්නන් කවරේ ද යන්න සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීම සඳහා ගොනුවක් නඩත්තු කර නොතිබූ අතර අදාල මුදල් නියමිත සංවර්ධන කාර්යයටම යොදවා තිබුණේ ද යන්න පිළිබඳව පසුවිපරමක් සිදු කර තිබුණු බවක් ද නිරීක්ෂණය නොවීය.

## 06. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | | 2020 | එකතුව |
|---|---|---|---|
| | | රු. | රු. |
| ඇස්මේන්තු වෙන්කිරීම - | පුනරාවර්තන | 1,306,800,000 | 1,306,800,000 |
| | මූලධන | 2,928,100,000 | 2,928,100,000 |
| | **එකතුව** | **4,234,900,000** | **4,234,900,000** |
| ශුද්ධ ප්‍රතිපාදනය - | පුනරාවර්තන | 1,306,800,000 | 1,306,800,000 |
| | මූලධන | 2,928,100,000 | 2,928,100,000 |
| | **එකතුව** | **4,234,900,000** | **4,234,900,000** |
| සත්‍ය වියදම - | පුනරාවර්තන | 1,294,688,401 | 1,294,688,401 |
| | මූලධන | 2,497,992,619 | 2,497,992,619 |
| | **එකතුව** | **3,792,681,020** | **3,792,681,020** |
| වසර අග ඉතිරිවීම් - | පුනරාවර්තන | 12,111,599 | 12,111,599 |
| | මූලධන | 430,107,381 | 430,107,381 |
| | **එකතුව** | **442,218,980** | **442,218,980** |

## 35. සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂ 406**

**ප්‍රතිපාදන උපයෝජනය**

| විස්තරය | | 2020 |
|---|---|---|
| විගණන මතය | | තත්ත්වාගණනය කළ මතය රු. |
| ආරම්භක ප්‍රතිපාදනය | - පුනරාවර්තන වියදම් | 275,565,000 |
| | මූලධන වියදම් | 463,250,000 |
| | මුළු ප්‍රතිපාදනය | 738,815,000 |
| ශුද්ධ ප්‍රතිපාදනය | - පුනරාවර්තන වියදම් | 275,565,000 |
| | මූලධන වියදම් | 464,750,000 |
| | මුළු ප්‍රතිපාදනය | 740,315,000 |
| සත්‍ය වියදම | - පුනරාවර්තන වියදම් | 256,657,245 |
| | මූලධන වියදම් | 278,439,166 |
| | මුළු ප්‍රතිපාදනය | 535,096,411 |
| වසර අග ඉතිරිවීම් | - පුනරාවර්තන වියදම් | 18,907,755 |
| | මූලධන වියදම් | 186,310,834 |
| | මුළු ප්‍රතිපාදනය | 205,218,589 |

❖ මෙම රාජ්‍ය අමාත්‍යාංශය 2020 අගෝස්තු මාසයේදී පිහිටුවා ඇති නිසා 2018 හා 2019 වර්ෂ සඳහා ගිණුම් ඉදිරිපත් කර නැත.

## 36. වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 408

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - 2020 - තත්ත්වාගණනය කළ මතය

**ප්‍රතිපාදන උපයෝජනය**

| **විස්තරය** | | **2020** | **එකතුව** |
|---|---|---|---|
| --------- | | ------ | -------- |
| | | රු. | රු. |
| ඇස්මේන්තු වෙන්කිරීම - | පුනරාවර්තන | **677,210,000** | **677,210,000** |
| | මූලධන | 91,720,000 | 91,720,000 |
| | **එකතුව** | **768,930,000** | **768,930,000** |
| ශුද්ධ ප්‍රතිපාදනය - | පුනරාවර්තන | 677,210,000 | 677,210,000 |
| | මූලධන | 91,720,000 | 91,720,000 |
| | **එකතුව** | **768,930,000** | **768,930,000** |
| සත්‍ය වියදම - | පුනරාවර්තන | 642,616,138 | 642,616,138 |
| | මූලධන | 82,028,736 | 82,028,736 |
| | **එකතුව** | **724,644,874** | **724,644,874** |
| වසර අග ඉතිරිවීම් - | පුනරාවර්තන | 34,593,862 | 34,593,862 |
| | මූලධන | 9,691,264 | 9,691,264 |
| | **එකතුව** | **44,285,126** | **44,285,126** |

**37. අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය (ආපදා කළමනාකරණ අංශය)**

**ශීර්ෂය - 409**

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය | 2018 | - තත්ත්වාගණනය කළ මතය |
| | 2019 | - තත්ත්වාගණනය කළ මතය |
| | 2020 | - තත්ත්වාගණනය කළ මතය |

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01. 2017 වර්ෂයේ සිදු වූ ගංවතුර සහ නායයාම් නිසා අධි අවදානම් කාරී ප්‍රදේශවල ජීවත්වන පවුල් 1,444ක් හඳුනාගෙන තිබුණි. එම පවුල්වලින් පවුල් 699ක් නැවත පදිංචි කිරීම සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබූ රු.මිලියන 624.39ක් උපයෝජනය කර තිබුණද නැවත පදිංචි කිරීම සඳහා ලබා දී තිබුණේ රු.මිලියන 121.25 ක් පමණි. ඉන් රු.මිලියන 33.4ක් යොදාගෙන නිවාස 167ක අත්තිවාරම පමණක් ඉදිකර තිබුණි. | ඉවත්කිරීමට හඳුනාගත් පවුල් ඉවත්කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු අතර ප්‍රතිපාදන අදාළ අරමුණ සඳහාම යොදා ගත යුතුය. | දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් තෝරාගන්නා ලද කොන්ත්‍රාත්කරුවකු මගින් නිවාස ඉදිකරදීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | අනුමත මුදල් සීමාව තුළ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ නිවාස ඉදි කිරීමට කටයුතු කරමින් පවතී. |
| 02. රත්නපුර, ඇහැලියගොඩ අවදානම් ප්‍රදේශවල ජීවත් වන පවුල් 312 ක් හඳුනාගෙන තිබුණු නමුත් පවුල් 97 ක් | කඩිනමින් පහසුකම් සැලසීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් තිබිය යුතුය. | - එම - | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | නැවත පදිංචිකිරීම සඳහා ඉඩම් 02 ක් හඳුනා ගැනීම පමණක් සිදුකර තිබුණි. අයගම ප්‍රදේශයේ පවුල් 264 ක් හඳුනාගෙන තිබුණු නමුත් නිවාස ඉදිකිරීම ආරම්භකර තිබුණේ පවුල් 151 ක් සඳහා පමණි. ඉතිරි පවුල් 113 සඳහා ඉඩම් හඳුනාගැනීම පමණක් සිදුකර තිබුණි. | | | |
| 03. | ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ මත මහනුවර දිස්ත්‍රික්කයේ පවුල් 2,098 ක් හඳුනාගෙන ස්ථිර නිවාස ඉදිකිරීමට පවුල් 328 ක් තෝරාගෙන තිබුණි. දොළුව ප්‍රදේශයේ නැවත පදිංචිකිරීමට යෝජිත පවුල් 49 කින් කිසිදු පවුලක් නැවත පදිංචිකර නොතිබුණි. බෙරවිල ප්‍රදේශයේ පවුල් 162 ක් පදිංචිකරවීම සඳහා කුරුඳුවත්ත නගරයට ආසන්න අක්කර 25 ක ඉඩමක් තෝරාගෙන ඒ සඳහා රු. මිලියන 35.40 ක ප්‍රතිපාදන මහනුවර දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඉන් පවුල් 153 ක් සඳහා රු.මිලියන 30.60 ක් ගෙවා තිබුණි. නමුත් පවුල් 125 ක් අධි අවදානම් කලාපවලම පදිංචිව තිබුණි. උඩුනුවර අධි අවධානම් කලාපවල ජීවත් වන පවුල් 112 ක් සඳහා | අවදානම් සහිත ප්‍රදේශවල ජනතාව සඳහා කඩිනමින් පහසුකම් සැලසීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් යෙදිය යුතුය. | - එම - | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | රු.මිලියන 30.80 උපයෝජනය කර නොතිබුණි. | | | |
| 04. | ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8 වන පරිච්ඡේදයේ 2 (අ) පරිදි අමාත්‍යාංශය විසින් ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම පිළියෙල කළ යුතු බැවින් නව සැලැස්මක් පිළියෙල කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් රු. මිලියන 02 ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලබා දී තිබුණි. කෙසේවෙතත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි. | ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ කටයුතු අවසන් කළයුතුය. | සැලැස්ම සකසා අවසන් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතී. | ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම අවසන් අදියරේ පවතී. |
| 05. | චීන රජයේ පරිත්‍යාගයකින් කුරුණෑගල දිස්ත්‍රික්කය වෙත ලබා දී තිබූ ජල බවුසර් 09 ක් ප්‍රදේශයේ මාර්ගවල ධාවනය කිරීමට නොහැකි වීම, ක්‍රියාත්මක කිරීමේ හා නඩත්තු කිරීමේ අපහසුතා හේතුවෙන් නිෂ්ක්‍රීයව පැවතුණි. | ජල බවුසර් ප්‍රයෝජනයට ගත හැකි ස්ථාන වෙත යැවීමට කටයුතු කළ යුතුය. | රියදුරන් සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදෙන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දී ඇත. | පුහුණුවීම් ලද නිලධාරීන් හරහා දිස්ත්‍රික්කවල බවුසර් රථ ධාවනය සඳහා අනුයුක්ත කරන අනෙකුත් රියදුරන් සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදෙන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 06. | දේශීය හා විදේශීය පරිත්‍යාගශීලින්ගෙන් සහ චීන රජයෙන් ලැබී තිබුණු රු.මිලියන 294.73 ක අරමුදල ආපදා සහන සේවා කටයුතු සඳහා යොදාගැනීමට ප්‍රමාණවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | පරිත්‍යාගශීලින්ගෙන් ලැබෙන ආධාර ඔවුන් පරිත්‍යාග කළ අරමුණු ලඟා කරගැනීමට යෙදවිය යුතුය. | මෙම මුදල් නායයෑම් අධි අවධානම හේතුවෙන් ඉවත්කරන ජනතාව නැවත පදිංචිකරවීම සඳහා යොදාගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | විගණකාධිපති නිර්දේශ අනුව කටයුතු කරනු ලැබේ. |
| 07. | කළුතර දිස්ත්‍රික්යේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක ප්‍රතිලාභීන් 267 දෙනෙකුට ඉඩම් මිලදී ගැනීමට රු. මිලියන 105.7 ක් සහ එම ඉඩම්වල නිවාස ඉදිකිරීම රු. මිලියන 245.1 ක් ලෙස එකතුව රු. මිලියන 350.8 ක ප්‍රතිලාභ ලබා දී තිබුණද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක ප්‍රතිලාභීන් 139 දෙනෙකු නිවාස නිමකර නොතිබුණි. | ලබාදුන් ප්‍රතිලාභ උපයෝජනය කර නිවාස ඉදිකිරීමට අවශ්‍ය තාක්ෂණය සම්බන්ධයෙන් පරීක්ෂා කර අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. | - එම - | - එම - |
| 08. | නිවාස හානි වූ ප්‍රතිලාභීන්ට ආරක්ෂිත ස්ථානයක නිවසක් ඉදිකිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13ක ප්‍රතිලාභීන් 135 වෙත රු.මිලියන 92 ක් ගෙවා තිබුණ ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක ප්‍රතිලාභීන් 72 ක් නිවාස ඉදිකිරීම් නිමකර නොතිබුණි. නිවසක් සහිත ඉඩමක් මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක ප්‍රතිලාභීන් | ලබාදුන් ප්‍රතිලාභ උපයෝජනය නොකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. | ප්‍රතිලාභ උපයෝජනය නොකර ඉදිකිරීම් කර නොමැති ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් ලිඛිතව මෙන්ම වාචිකව දැනුවත් කිරීම සිදු කර ඇත. | ඉදිකිරීම් කර නොමැති ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් ලිඛිතව මෙන්ම වාචිකව වරින් වර දැනුවත්කරමින් වැඩසටහනෙහි අරමුණු ඉටුකරගැනීමට |

| | | | | |
|---|---|---|---|---|
| | 122 දෙනෙකු රු. මිලියන 179.6 ක් ලබා දී තිබුණ ද ප්‍රාදේශිය ලේකම් කාර්යාල 02 ක ප්‍රතිලාභීන් 12 දෙනෙකු නිවසක් සහිත ඉඩමක් මිලදීගැනීමට කටයුතු කර නොතිබුණි. | | | කටයුතු කරනු ලබන බවට වාර්තා කර ඇත. |
| 09. | ලීටර 1000 ජලටැංකි මිලදී ගැනීමේ දී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තිය පරිදි ජාතික තරඟකාරී පදනම මත ලංසු කැඳවීම සිදුකර නොතිබුණි. | නියඟයෙන් සිදුවන ආපදාවන් සම්බන්ධයෙන් කල්තබා සූදානම් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගතව ප්‍රසම්පාදන සිදුකළ යුතුය. | හදිසි ප්‍රසම්පාදන කටයුතු ඇතිවීම වැළැක්වීම සඳහා මාණ්ඩලික නිලධාරීන් විසින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිවේදනය පිළිබඳ දැඩි අවධානය යොමු කර ඇත. | විගණකාධිපති නිර්දේශය අනුව ඉදිරියේදී කටයුතු සිදුකරන බවට වාර්තා කර ඇත. |

## 10. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ශුද්ධ ප්‍රතිපාදනය | පුනරාවර්තන වියදම | 6,214.14 | 2,667.78 | 20,595.71 | 29,477.63 |
| | මූලධන වියදම | 5,761.12 | 9,164.05 | 7,050.72 | 21,975.90 |
| | එකතුව | **11,975.26** | **11,831.83** | **27,646.43** | **51,453.53** |
| සත්‍ය වියදම | පුනරාවර්තන වියදම | 6,079.64 | 2,295.16 | 20,264.51 | 28,639.31 |
| | මූලධන වියදම | 4,836.96 | 5,396.81 | 5,425.98 | 15,659.74 |
| | එකතුව | **10,916.60** | **7,691.97** | **25,690.49** | **44,299.05** |
| වසර අග ඉතිරිවීම් | පුනරාවර්තන වියදම | 134.50 | 372.62 | 331.20 | 838.32 |
| | මූලධන වියදම | 924.16 | 3,767.24 | 1,624.75 | 6,316.15 |
| | එකතුව | **1,058.66** | **4,139.86** | **1,955.94** | **7,154.47** |

## 38. සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 410

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2020 - තත්ත්වාගණනය කළ මතය

**ප්‍රතිපාදන උපයෝජනය**

| **විස්තරය** | | **2020**<br>**රු.** | **එකතුව**<br>**රු.** |
|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය - | පුනරාවර්තන වියදම් | 925,630,000 | 925,630,000 |
| | මූලධන වියදම් | 3,107,590,000 | 3,107,590,000 |
| | එකතුව | 4,033,220,000 | 4,033,220,000 |
| සත්‍ය වියදම - | පුනරාවර්තන වියදම් | 901,253,909 | 901,253,909 |
| | මූලධන වියදම් | 2,594,526,430 | 2,594,526,430 |
| | එකතුව | 3,495,780,339 | 3,495,780,339 |
| වසර අග ඉතිරිවීම් - | පුනරාවර්තන වියදම් | 24,376,091 | 24,376,091 |
| | මූලධන වියදම් | 513,063,570 | 513,063,570 |
| | එකතුව | 537,439,661 | 537,439,661 |

## 39. නාගරික සංවර්ධන, වෙරළ සංරක්‍ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය - 411**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2020 - තත්ත්වාගණනය කළ මතය

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්වය |
|---|---|---|---|
| 01. **ශීර්ෂය -411** නාගරික සංවර්ධන, වෙරළ සංරක්‍ෂණ , අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | | | |
| (අ) **කලාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය** | | | |
| කොල්ලුපිටිය සිට දෙහිවල ඇල දක්වා යෝජිත විනෝදාස්වාද මුහුදු වෙරළ තීරය නිර්මාණය කිරීම, යෝජිත වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම්, කිඹුලා ඇල (බ්ලූමැන්ඩල්) ප්‍රදේශය සංවර්ධනය කිරීම සහ යෝජිත වැලිසර සැපයුම් සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම යන මූලික සංරචක 3 2020 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීම සඳහා බස්නාහිර කලාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය ස්ථාපනය කර තිබුණි. 2020 ඔක්තෝම්බර් දක්වා මෙම ව්‍යාපෘතිය සඳහා රු. 170,388,967ක් වැයකර | අතහැර දමන ලද ව්‍යාපෘති ඉටුකිරීමට පියවර ගත යුතුය. | කොල්ලුපිටිය සිට දෙහිවල ඇල දක්වා යෝජිත විනෝදාස්වාද මුහුදු වෙරළ තීරය නිර්මාණය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සහ අදාල සංවර්ධන කටයුතු නිසා සිදුවන බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා (EIA) සකසා අවසන්ව ඇති බව.<br>යෝජිත සැපයුම් හා සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝග්‍ය බවට ජාතික ක්‍රම සම්පාදන | (i) ව්‍යාපෘති ප්‍රදේශයට ප්‍රවේශ වීම සඳහා සුදුසු මාර්ග නිර්මාණය කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා පැවැත්වා තිබුණු අතර සංකල්පීය සැලසුම් ලැබීමට නියමිතය.<br>(ii) දැනට ව්‍යාපෘති භූමි ප්‍රදේශයේ පදිංචිව සිටි අනවසර පදිංචිකරුවන්ගෙන් 35 දෙනෙකු |

| | | |
|---|---|---|
| ඇති නමුත් බ්ලූමැන්ඩල් ආශ්‍රිත ප්‍රදේශ සංවර්ධනය කිරීම හා වැලිසර සැපයුම් සේවා මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘති සංරචක අතහැර දමා තිබුණු බව නිරීක්ෂණය විය. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2020 ඔක්තෝම්බර් 31 දින සිට නාගරික සංවර්ධන අධිකාරියට පවරා තිබුණි. | දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන ඇති අතර එය සක්‍රීයව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති බව. | පුනරුත්ථාපනය කර තිබුණි.<br>(iii) ආයෝජකයන් තෝරා ගැනීම සඳහා ලංසු කැඳවීමට අදාල ලිපි ලේඛන (REP) කෙටුම්පත් කර ඇත.<br>(iv) බ්ලූමැන්ඩල් කසල අංගනය ආශ්‍රිත ප්‍රදේශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය පමණක් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර ඇත.<br>(v) යෝජිත සැපයුම් සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම - වැලිසර ව්‍යාපාතිය වත්තල සංවර්ධන සැලැස්මට ඇතුලත් කර ඉදිරියට කිරීමට ඇති හැකියාව පිළිබඳව පූර්ව අධ්‍යයනයක් සිදු කිරීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) **විද්‍යා හා තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය**<br>---------------------------------<br>ඉහත ව්‍යාපෘතිය යටතේ මාලඹේ, හෝමාගම, කඩුවෙල අතුරුගිරිය යන නගර පිහිටි ප්‍රදේශය, කලාප 05 කට වෙන්කර සංවර්ධනය කිරීමට අපේක්ෂිතව පැවති අතර මෙය 2017 මාර්තු 01 දින ආරම්භ කර 2023 මාර්තු 01 දින අවසන් කිරිමට නියමිතව තිබුණි. 2020 වර්ෂය තුල රු.මිලියන 238.7 ක් වැයකර එම ව්‍යාපෘතියේ එක් සංරචකයක් වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ මාර්ග 04ක් සංවර්ධනය කිරීමට කටයුතු කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා පිහිටුවා ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්යමණ්ඩල වැටුප් හා දීමනා සහ අනෙකුත් මෙහෙයුම් වියදම් ලෙස 2017 සිට 2020 දෙසැම්බර් 31 අවසන් වන විට රු. 146,215,139ක් වැයකර තිබුණු අතර 2020 සැප්තැම්බර් 31 දින මෙම ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරියට පවරා ඇති නමුත් 2021 ඔක්තෝම්බර් 30 දින දක්වා එම ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ආයෝජන අවදානම අවම වන අයුරින් හා මහජනතාවට ප්‍රතිලාභ ලැබෙන අයුරින් ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතුය. | මෙම ව්‍යාපෘතියට අදාල විෂය පථය ක්‍රියාත්මක කිරීමට අදාල යටිතල පහසුකම් සැපයීමට ව්‍යාපෘතින් 04ක් ක්‍රියාවට නංවන ලද බව. එම ව්‍යාපෘති වලින් දෙකක් මේ වන විට වැඩ අවසන් කර ඇති අතර ඉතිරි ව්‍යාපෘති 2 වැඩ මෙම වසර තුල අවසන් කිරීමට නියමිතව ඇති බව.<br>2020.09.30 දින වන විට ව්‍යාපෘති කාර්යයන් ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇත. | මෙම ව්‍යාපෘතියට අදාල යටිතල පහසුකම් සැපයීමට මාර්ග තුනක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඉන් 2කක වැඩ අවසන් කර ඇති අතර, එක මාර්ගයක වැඩ කටයුතු අවසන් අදියරේ පවතී. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් පිහිටුවා තිබූ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කටයුතු අවසන් කර එහි කටයුතු 2020.09.30 දින සිට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇති බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | **බස්නාහිර කලාපයේ මහනගර සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය** | | | |
| | මෙම ව්‍යාපෘතිය 2015 මැයි මස ආරම්භ කරන ලද අතර එය 2017 සැප්තැම්බර් මස නිමකර තිබුණි. ව්‍යාපෘති වෙනුවෙන් වැයකර තිබුණු මුළු මුදල රු.330,226,769 ක් විය. කෙසේවුවද 2018 වර්ෂය සිට 2020 සැප්තැම්බර් 30 දක්වා රු. 38,351,301 ක් ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා, මෙහෙයුම් වියදම් ලෙස වියදම් දරමින් බස්නාහිර කලාපීය සැලසුම් ව්‍යාපෘති නමින් නව ව්‍යාපෘති ලෙස පැරණි ව්‍යාපෘතියම ඉදිරියට පවත්වාගෙන ගොස් තිබුණු අතර 2020 සැප්තැම්බර් 30 දින මෙම ව්‍යාපෘතිය අවසන් කර නාගරික සංවර්ධන අධිකාරියට පැවරීමට කටයුතු කර තිබුණි. | ව්‍යාපෘතිය නිමකරන කාල රාමුවක් හෝ ව්‍යාපෘතිය මඟින් සිදුකල යුතු විශේෂ කාර්යයක් නොමැතිව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නොකල යුතු අතර කලාප නගර සංවර්ධනය සඳහා සැලසුම් සකස් කර තිබේනම් එම සැලසුම් ප්‍රසිද්ධියට පත්කළ යුතුය. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මෙම සැලසුම් ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇති බව. මෙම ව්‍යාපෘතිය මඟින් සැලසුම් සකස් කිරීමෙන් පසු එම ව්‍යාපෘති කායර්යයන් අඩුකර සුළු කාර්ය මණ්ඩලයක් මඟින් මහානගර සැලසුම් මඟින් හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සහයෝගය ලබා දීම එම කාර්ය මණ්ඩලය මඟින් සිදු කර ඇති බව. | මහනගර සැලසුම්කිරීමේ ව්‍යාපෘති වල කාර්ය මණ්ඩලය මඟින් ඉටුකරන ලද කාර්යයන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා එම ඒකකයේ කටයුතු අවසන් කර ඇති බව. |
| (ඈ) | **මහකොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය** | | | |
| | මහකොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය යටතේ දියවන්නා ඔය පුළුල් කිරීම සඳහා අත්‍යාවශයම ඉඩම් පමණක් පවරා ගැනීමේ කාර්යයන් සඳහා අදාල ආයතන ප්‍රමාණවත්, පියවර ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් පවරාගෙන තිබුණු එක් | රාජ්‍ය සම්පත් සුරක්ෂිත කර නාස්තිය වළක්වමින් පවරාගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි මුදල් තක්සේරු කිරීම සහ වන්දි ගෙවීම | වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | නඩුවේ තීන්දුවට විරුද්ධව මොන්ට්‍රෝස් පුද්ගලික සමාගම නැවත වරක් අභයාචනා කරතිබුණු අතර එකී අභියාචනා තීන්දුවද ශ්‍රී ලංකා |

| | | |
|---|---|---|
| ඉඩමකට හිමිකම් කියූ විදේශීය සමාගමක් විසින් වන්දි ගෙවීම ප්‍රමාද වීම මත ආයෝජන ආරවුල් නිරවුල් කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානය වෙත ශ්‍රී ලංකා රජයට එරෙහිව නඩු පවරා තිබුණි. ගොනුකල නඩුව සඳහා විදේශ නීති උපදේශකයන්ගේ සහාය ලබාගැනීම වෙනුවෙන් සහ ඒ වෙනුවෙන් පෙනී සිටි නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ විදේශ ගමන් වෙනුවෙන් සමාලෝචිත (2020) වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශය විසින් රු.342,979,860 ක මුදලක් අනාර්ථිකව වැයකර තිබුණ නමුත් මේ දක්වාම එම නඩු කටයුත්ත නිමවී නොමැති බවද නිරීක්ෂණය විය. | ප්‍රමාදවීම අවම කිරීමට කටයුතු කල යුතුය. | ජනරජයට වාසිදායක ලබාදී තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් GBP 338,162.34 ක ප්‍රමාණයක් හා අභියාචනා නඩුවේ නඩු ගාස්තු වශයෙන් GBP 40,000.00 ක ප්‍රමාණයක් ද මොන්ට්‍රොස් පුද්ගලික සමාගමෙන් අයවිය යුතුව ඇත. මොන්ට්‍රෝස් පුද්ගලික සමාගම විසින් මුදල් ගෙවීම මේ වන තෙක් සිදු කර නොමැති බැවින් බේරුම්කරණ නඩුවේ නියෝගය ලන්ඩන් මහාධිකරණය මඟින් බලාත්මක කිරීම සඳහා උසාවි ගාස්තු ලෙස තවත් GBP 10,000.00 ක මුදලක් වැය වන |

| | | | | |
|---|---|---|---|---|
| | | | | බව 2021.10.27 දින ශ්‍රී ලංකා ජානරජය වෙනුවෙන් පෙනී සිටි ලන්ඩන් හි Clyde & Co. නීතිඥ සමාගම නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. |
| (ඉ) | **මහකොළඹ සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය** | | | |
| (i) | පරිසර විද්‍යාඥයින් විසින් සහ මහනගර හා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හා එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ප්‍රධාන ක්‍රමවේදය ලෙස කසල ප්‍රතිචක්‍රීකරණය කිරිම , කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය හා ජීව වායු ඒකක පිහිටුවීම බව හදුනාගෙන තිබුණු අතර අවසාන තාවකාලික විසඳුම කසල රඳවනය ඉදිකිරිම බව පෙන්වා දී තිබුණි.<br>නමුත් අනෙකුත් කරුණු කෙරෙහි අවධානය යොමු නොකොට තාවකාලික විසඳුම වන කසල පිරවුමක් ඉදිකිරිමට 2017 මැයි 16 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇමරිකන් ඩොලර් 120 කට එනම් රු. මිලියන 19,127 කට | පරිසර විද්‍යාඥයින් විසින් හදුනාගෙන තිබුණු මූලික විසඳුම් කෙරෙහි අවධානය යොමුකල යුතුය. | එවකට කොළඹ නගරයේ පැවති කසල බැහැර කිරීමේ ගැටළුව උග්‍රතත්ත්වයට පිලියමක් වශයෙන් තාවකාලිකව එම කසල අරුවක්කාලු කසල රඳවනයට දැමීමට කටයුතු කරන ලද බව. | අරුවක්කාලු කසල අංගනය ඉදිකිරීම සඳහා ලෝක බැංකු ණය ආධාර ලබා ගැනීමට එම ආයතන සමඟ සාකච්ඡා ගණනාවක් පවත්වා ඇතත්, එම ණය ආධාර ලබාගැනීම සාර්ථක වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අනුමැතිය ලැබී ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. | | | |
| (ii) | ඉහත ව්‍යාපෘතිය කසල හුවමාරු මධ්‍යස්ථාන, දුම්රිය මාර්ග සහ කසල රදවනය ඉදිකිරීමේ කාර්යය සඳහා කොන්ත්‍රාත්රුවෙකු තෝරාගැනීමේදී රජයේ සහ ලෝකබැංකු ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව විනිවිදභාවයකින් සිදුකර නොමැති බැවින් නැවත ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට ලෝක බැංකු සමාලෝචන කණ්ඩායම නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණද මෙම ව්‍යාපෘතිය කඩිනමින් නිමකල යුතු බවට හේතු දක්වා ප්‍රසම්පාදන කටයුතු නැවත සිදු නොකිරීම හේතුවෙන් ලෝක බැංකුව විසින් එකගවූ ඇමරිකන් ඩොලර් 700,000 ක ලෝක බැංකු ආධාර අහිමි වී තිබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය රුපියල් මිලියන 19,127 කට දේශීය අරමුදලින් කිරීමට සිදුව තිබුණු අතර 2020 දෙසැම්බර් 31 වන විට මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන16,186ක වියදමක් රජය විසින් දරා තිබුණි. | විදේශීය ආධාර ලබාගත හැකි මාර්ගයකින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියා කල යුතු වේ. | අදාල කසල අංගනය ඉදිකිරීමට මූල්‍ය පහසුකම් සැපයීමට ලෝක බැංකුව මුලදී එකඟතාවය පලකර තිබුනත්, පසුව අරමුදල් ලබා දීමට කටයුතු නොකල බැවින් මෙම ව්‍යාපෘතියේ කටයුතු ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන මත ඉදිකිරීම් ආරම්භ කිරීමට සිදු වී ඇත | දුම්රිය ඒන්ජින් 04, දුම්රිය දෙපාර්තමේන්තු වේ පරීක්ෂාවෙන් පසු 2020.09.03 වන දින අමාත්‍යාංශය වෙත ලබාදී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | අරුවක්කාලු සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ බිම්පිරවුම ඉදිකිරීමේ වැඩකටයුතු 2018 ජනවාරි 01 දින ආරම්භ කර 2019 ජුනි 30 වන විට අවසන් කිරිමට යෝජිතව පැවතියද අවස්ථා 05 කදී දින දීර්ඝ කරමින් පවතින අතර මෙම ව්‍යාපෘතිය යටතේ බහාලුම් වැගන් 34 ක් ප්‍රසම්පාදනය කරගැනීම සඳහා ගිවිසුම් කාලය ඉකුත්විම හේතුවෙන් අවලංගු කර තිබුණි. බහාලුම් පෙට්ටි 94 ක් 2020 වර්ෂය අවසානයේදී ලැබීමට නියමිතව තිබුණද පෙට්ටි රඳවා තබා ගැනීමට සුදුසු ස්ථානයක් වෙන්කරගෙන නොමැති බැවින් ඒවා සැපයීම ප්‍රමාදකරන ලෙස උපදෙස් ලබාදී තිබුණි. දුම්රිය එන්ජින් කට්ටල 04 ක් 2019 දෙසැම්බර් 31 වන විට රු. 8,271,224 ක් වැයකර ආනයනය කරවාගෙන තිබුණු නමුත් කසල හුවමාරු මධ්‍යස්ථාන ඉදිකිරීමේ ප්‍රමාදය හේතුවෙන් 2020 දෙසැම්බර් 31 වන විටද එමගින් අපේක්ෂිත කාර්යයභාරය සඳහා යොදවාගැනීමට නොහැකි වී තිබුණි. | රජයේ මුදල් නිශ්කාර්යව ආයෝජනය කිරීමෙන් වන අලාභයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. | පලාවී සිට අරුවක්කාලු දක්වා දුම්රිය මාර්ගය සෑදීම සඳහා Insee සමාගම හා අප අතර නිශ්චිත එකගතාවයකට නොපැමිණි බැවින් එම කටයුතු ආරම්භ වීම ප්‍රමාද වූ බව. අපද්‍රව්‍ය බහාලුම් වැගන් 34ක් ගෙන ඒමේ කොන්ත්‍රාත් ගිවිසුමමේ කොන්දේසියකට අනුව නිෂ්පාදකයන් විසින් ඉදිරිපත් කරන ලද තාක්ෂණික සැලසුම් වල ඇති දෝෂ හේතුවෙන් ඒ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොලැබීම නිසා අපද්‍රව්‍ය බහාලුම් වැගන් 34 ක් ගෙන ඒම ප්‍රමාද වී ඇති බව. කන්ටේනර් පෙට්ටි 94ක් 2020 වර්ෂය අවසානයේදී ලැබීමට නියමිතව තිබුනද ඒවා රඳවා තබා ගැනීමට සුදුසු ස්ථානයක් නොමැති හෙයින් ගෙන්වීම ප්‍රමාද කරන ලද බව හා කෙසේ හෝ කන්ටේනර් පෙට්ටි | දුම්රිය ඒන්ජින් 04 මගී ප්‍රවාහනය සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවට අවසර ලබා දී තිබුණි. කන්ටේනර් ආනයනය සඳහා ණයවර ලිපි වල කාලය දීර්ඝ කිරීමට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබීනොතිබුණි. දුම්රිය ගැල් 34ක් සැපයීමේ කොන්ත්‍රාතුව 2021 අප්‍රේල් මස 28 වන දින අවලංගු කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ කටයුතු මේ වන විට අවසන් අධියරේ සිදුවෙමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | එම කාර්යයන් සඳහා රු. මිලියන 13,646ක් වැයකර තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය 79% ක් බව නිරීක්ෂණය විය. | | 94 මෙම වර්ෂයේ (2021) මාර්තු මස ගෙන ඒමට නියමිතව ඇති බව. . | |
| (ඊ) | **මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - නගර සංවර්ධන සංරචකය (3K ව්‍යාපෘතිය)** ---------------------------------- | | | |
| (i) | කොළඹ නගරයේ අධික රථවාහන තදබදයට විසඳුමක් සැපයීම අරමුණු කරගත් මෙම ව්‍යාපෘතිය 2007 දී අන්තර්ජාතික ජපන් බැංකුව (JICA) හා ඇතිකරගත් ණය ගිවිසුමක් අනුව මුල්‍යනය කරමින් පැවති අතර 2015 මැයි මස වන විට JICA ආයතනයේ සැපයීමට එකඟ ව තිබු ජපන් යෙන් මිලියන 1,180 ක මුළු මුදල උපයෝජනය කර තිබුණි. ඒ අනුව 2015 මැයි මාසයෙන් පසුව මුළුමනින්ම භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ දුර්වල ක්‍රියාකාරිත්වය මත තවදුරටත් කාලය දීර්ඝ කරමින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පවත්වාගෙන ගොස් තිබූ අතර ව්‍යාපෘතිය නියමිත කාල වකවානුව තුල නිම | ව්‍යාපෘතික් ආරම්භකිරීමේ මූලික අරමුණු ඉටුකිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘතිය නියමිත කාලසීමාව තුල නිම කිරීමට කටයුතු කල යුතුය. | මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීමට ඉඩම් සංවර්ධන කාර්යයන් අවසන් කර, බස් පර්යන්තය ඉදිකිරීම ආරම්භ කරන විට JICA ආයතනයේ ලබා දී තිබූ සම්පූර්ණ මුදල උපයෝජනය කර අවසන් වූ බව. සංවර්ධන කාර්යයන් අවසන් කිරීමට දේශීය අරමුදල් ලබා දීම සිදු කල යුතු බවට වූ එකගතාවය මත අදාල ප්‍රතිපාදන අනුමත වූ බව. මූලික ඉදිකිරීම කාර්යයන් 2018 අවසන්ව ඇත. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රේඛීය අමාත්‍යාංශයේ දැනුම්දීමට අනුව සහ | 2187/27 හා 2020.08.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව මෙම ව්‍යාපෘතිය ප්‍රවාහන අමාත්‍යාංශය වෙත මාරු වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | නොකිරීම මත භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.මිලියන 110 කට අධික මුදලක් ව්‍යාපෘතියේ පරිපාලන හා මෙහෙයුම් කටයුතු සඳහා වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතියේ 2019 වර්ෂය සඳහා ඉලක්කගත මා කුඹුර බහු මධ්‍ය මධ්‍යස්ථානයෙහි අතිරේක කාර්යයන් ඉටුකිරීමේ භෞතික ප්‍රගතිය සියයට 9 ක් පමණක් බව නිරීක්ෂණය විය. | | ජාතික සැලසුම් දෙපාර්තමෙන්තුවේ අනුමැතිය මත එම සංවර්ධන කාර්යයන් සිදු කරන ලද බව. සංවර්ධන කාර්යයන් සිදු කරන අතරතුර මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ ප්‍රවාහන සැලසුම් ක්‍රියාත්මක කිරීමට සිදු වූ බව හා බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම සඳහා වන ආයතන ව්‍යුහයක් නොතිබීම නිසා එම මෙහෙයුම් කටයුතුද ව්‍යාපෘතිය මගින්ම ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලද බව. | |
| (ii) | මහ කොළඹ ප්‍රවාහන ජාල වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ කඩවත, කඩුවෙල, කොට්ටාව නගර සංවර්ධන සඳහා පමණක් 3K ව්‍යාපෘතිය නමින් කරගෙන ගිය ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති පිරිවැය වැරදි ලෙස අර්ථකථනය කර, කාර්ය මණ්ඩලයේ 10 දෙනෙකුට තමන් එතෙක් ලබන ලද වැටුපට වඩා ඉහල වැටුපක් ලැබිය යුතු බවට අමාත්‍යාංශ ලේකම්ගෙන් අනුමැතියක් ලබාගෙන | වැරදි තොරතුරු ඉදිරිපත් කර ගෙවීම් ලබාගත් නිලධාරීන්ගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම වැටුප් ගෙවීම සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් ලබාගන්නා ලද පැහැදිලි කිරීම සඳහා DMS/7777/GCVT හා 2017.10.02 දිනැති ලිපිය මගින් මේ සම්බන්ධව පැහැදිලි කිරීම ලබා දී ඇති බව. ඒ අනුව, 3K ව්‍යාපෘතිය සඳහා වෙනම කාර්ය මණ්ඩලයක් අනුමත කර දී ඇති බවත්, | මහ කොළඹ ප්‍රවාහන ජාල වැඩි දියුණු කිරීමේ (3K) ව්‍යාපෘතියේ කටයුතු දැනට ප්‍රවාහන අමාත්‍යාංශය වෙත පැවරී ඇති බැවින් අංක SMUD/F/16/AQ /3K/T-01 හා 2021.3.09, 2021.06.11 දිනැති ලිපි මගින් |

| | | |
|---|---|---|
| චක්‍රලේඛ උපදෙස් අභිබවා හිඟ වැටුප් ලෙස රු.1,906,200 ක මුදලක් ලබාගෙන තිබුණි. එකී වැරදි සහගත ගෙවීම අයකර ගැනීමට අමාත්‍යාංශය මගින් මේ වන තෙක් විධිමත් පියවර ගෙන නොතිබුණි. | කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව ව්‍යාපෘතියේ පිරිවැය පදනම් කරගෙන වැටුප් ගෙවන ලෙස උපදෙස් ලබාදී ඇති බව. | මෙම මුදල් ගෙවීම පිළිබඳ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර, ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දී ඇති බව. |

## 02. ප්‍රතිපාදන උපයෝජනය

| | | 2020 | එකතුව |
|---|---|---:|---:|
| **විස්තරය** | | **රු.** | **රු.** |
| ශුද්ධ ප්‍රතිපාදනය | පුනරාවර්තන | 1,346,262,576 | 1,346,262,576 |
| | මූලධන | 26,670,171,000 | 26,670,171,000 |
| | එකතුව | 28,816,433,576 | 28,816,433,576 |
| සත්‍ය වියදම | පුනරාවර්තන | 20,267,619,586 | 20,267,619,586 |
| | මූලධන | 20,893,915,366 | 20,893,915,366 |
| | එකතුව | 20,893,915,366 | 20,893,915,366 |
| වසර අග ඉතිරිවීම් | පුනරාවර්තන | 719,966,796 | 719,966,796 |
| | මූලධන | 6,402,551,414 | 6,402,551,414 |
| | එකතුව | 7,122,518,210 | 7,122,518,210 |

## 40. විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 412

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය | 2018 | - තත්ත්වාගණනය කළ මතය |
| | 2019 | - තත්ත්වාගණනය කළ මතය |
| | 2020 | - තත්ත්වාගණනය කළ මතය |

**ප්‍රතිපාදන උපයෝජනය**

| **විස්තරය** | | **2018** | **2019** | **2020** | **එකතුව** |
|---|---|---|---|---|---|
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | පුනරාවර්තන | 633,030,000 | 567,300,000 | 623,100,000 | 1,823,430,000 |
| | - මූලධන | 53,025,000 | 12,200,000 | 29,100,000 | 94,325,000 |
| | එකතුව | 686,055,000 | 579,500,000 | 652,200,000 | 1,917,755.000 |
| සත්‍ය වියදම | පුනරාවර්තන වියදම | 560,985,919 | 539,377,238 | 598,559,798 | 1,698,922,955 |
| | - මූලධන වියදම | 5,933,640 | 9,540,638 | 25,107,729 | 40,582,007 |
| | එකතුව | 566,919,559 | 548,917,876 | 663,667,527 | 1,739,504,962 |
| වසර අග ඉතිරිවීම් | - පුනරාවර්තන වියදම | 72,044,081 | 27,922,762 | 24,540,202 | 124,507,045 |
| | - මූලධන වියදම | 47,091,360 | 2,659,362 | 3,992,272 | 53,742,994 |
| | එකතුව | 119,135,441 | 30,582,124 | 28,532,474 | 178,250,039 |

## 41. සමෘද්ධි, ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය - 414**

**විගණන අස්ථිත්‍යයේ නම**

2018- 124 - සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය

2019 – 124 - ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

2020 – 414 - සමෘද්ධි, ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ---------------------- | ------------------- | ----------------------- | -------------------- |
| 01. | අමාත්‍යාංශය බදු ගොඩනැඟිල්ලක පවත්වාගෙන යනු ලබන අතර සියළු නඩත්තු කටයුතු බදුකරු විසින් දරනු ලැබේ. එසේ තිබියදී ගොඩනැඟිලි ඉදිකිරීම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම, නඩත්තු කටයුතු සඳහා අයවැය ප්‍රතිපාදන මඟින් වැය විෂයයන් 3 ක් සඳහා එකතුව රු.2,690,000 ක් වෙන්කර තිබුණි. මෙම ප්‍රතිපාදිත මුදලින් රු.2,227,681 ක් එනම් සියයට 82.8 ක් ඉතිරිවී තිබුණි. ඒ අනුව අවශ්‍යතා හඳුනා නොගෙන ඒ ඒ වැය විෂය සඳහා ප්‍රතිපාදනය වෙන්කර ගෙන තිබුණි. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරිමට කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කරන විට මේ සම්බන්ධයෙන් වඩාත් සැලකිලිමත් වන ලෙස අදාල නිලධාරින් දැනුවත් කර ඇති බව. | අවශ්‍යතා හඳුනා ගෙන ඒ ඒ වැය විෂය සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කර නොතිබුණු බව. |
| 02. | නේවාසිකාගාරය සහ මුළුතැන්ගෙයි අවශ්‍යතාවයන් සඳහා මිළදී ගත් රු.3,385,762 ක උපකරණ නේවාසිකාගාර අළුත්වැඩියා කිරීම ප්‍රමාද වීම හේතුවෙන් වර්ෂ 03 ක | අවශ්‍යතාවයන් අනුව මිලදී ගැනීමත් නිසි වේලාවට බෙදා හැරීමත් සිදුකළ | තිබ්බිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් මගින් අලුත් වැඩියා කටයුතු ආරම්භ කිරීමට සැලැසුම් කර තිබු | අවශ්‍යතාවයන් අනුව මිලදී ගැනීමත් නිසි වේලාවට බෙදා හැරීමත් සිදුකර |

| | | | | |
|---|---|---|---|---|
| | පමණ කාලයක් ගබඩාවේ රඳවාගෙන තිබුණි. එසේම මෙසේ මිළදී ගන්නා ලද විදුලි උපකරණවලට ලබාදී තිබූ සහතික කාලයද අදාල උපකරණ භාවිතා නොකරම කල් ඉකුත්වී තිබූ බවද නිරීක්ෂණය විය. | යුතු වීම . | අතර එයින් පසුව අදාල භාණ්ඩ එම ස්ථානයන්හි ස්ථානගත කිරීමට තීරණය කර ඇති බව. | නොතිබුණු බව. |
| 03. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1647 (අ) හා 1994 අගෝස්තු 3 දිනැති අංක 26/92 (1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශය සතු වාහන 50 ක් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වාර්ෂිකව වාහන සමීක්ෂණය සිදු කිරීමට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලද බව. වාහන සමීක්ෂණය සඳහා කමිටුවක් පත් කර ඇති අතර සමීක්ෂණ කටයුතු සිදුකරමින් පවතින බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.. |
| 04. | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.104,105 සහ 110 2016 වර්ෂයේදී අනතුරට පත්ව තිබුණු වාහනයක් අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.10,713,494 ක් වැයකර තිබූ අතර, රක්ෂණ වන්දි ලෙස 2018 වර්ෂයේදී රු.8,557,877 ක් ලැබී තිබුණි. මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 හා 105 ප්‍රකාරව ප්‍රාරම්භක හා අවසාන පරීක්ෂණ සිදුකර වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණි. මේ හේතුවෙන් දරන ලද රු.2,155,617 ක් වූ වියදම අමාත්‍යාංශයට පාඩුවක්වී තිබුණි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම | මෙ සම්බන්ධ මුරෙ 104 අනුව විමර්ෂණයක් සිදු කර ඇති අතර හානි හා පාඩු ලේඛණයෙහි මෙය සටහන් කර ඇති බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 05. | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය විසින් කෘෂිකර්ම අධි කළාප පිහිටුවීම සඳහා 2016 වර්ෂයේදී බෙන්තොට වතුයායේ මහ හීන්තැන්න ඉඩමෙන් අක්කර 64 ක් රු.108,780,000 ක් ගෙවා 2018 වර්ෂයේදී ඉඩම පවරා ගැනීමට අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද පැවරීමේ කටයුතු සිදු කර නොතිබු අතර ඉදිරි කාලයේදී පැවරීමේ පදනම යටතේ සංවර්ධනය කිරීමට අමාත්‍යාංශයට අවසර ලබාදී තිබුණි. 2020 පෙබරවාරි 26 දින සිදු කරන ලද බිම් පරීක්ෂාවේදී අක්කර 64 ක් වූ මුළු බිම් ප්‍රමාණයම සම්පූර්ණයෙන්ම වල් බිහිවී තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර ඒ සඳහා වැය කරන ලද මුදල් නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතු වීම. | 2020 හා 2021 වර්ෂයන් යටතේ ලැබී තිබූ ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ඉඩමේ සංවර්ධන කටයුතු සිදුකර ඉඩම් කැබිලි කර මැනීම සිදුකිරීම, මාර්ග සංවර්ධනය, ජලය හා විදුලිය ඇතුලු යටිතල පහසුකම් සැපයීම මේ වන විට සිදුකර ඇති අතර ප්‍රතිලාභීන් අතර ඉඩම් කැබලි බෙදා දීමටද වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රමාදවී ඇති අතර නුදුරු දිනක දී එය අවසන් කර ගොඩනැගිලි ඉදිකිරීම සිදු කරන බව. | ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 06. | සමාජ ගැටළු පිළිබඳ පර්යේෂණ සඳහා වූ ව්‍යාපෘතිය වර්ෂයක් තුල අවසන් කිරීම සඳහා රු.5,000,000 ක ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී රු.2,183,000 ක් වියදම් කර ව්‍යාපෘති යෝජනාවලිය සකස් කිරීම පමණක් සිදුකර තිබුණි. | වර්ෂය තුළ ආරම්භ කරන ලද ව්‍යාපෘති නියමිත කාලය තුල අවසන් කිරීමට කටයුතු කළ යුතු වීම. | 2020, 2021 වර්ෂයන්හි දී වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ඉල්ලීමට කටයුතු කරන ලද නමුත් මේ දක්වා ලැබී නොමැති බව සහ මේ දක්වා මේ පර්යේෂණය සිදු කර නොමැති බව. | ව්‍යාපෘති නියමිත කාලය තුල අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 07. | 2018 අගෝස්තු 01 දින රක්ෂණාවරණය අවසන්වූ වාහනයක් 2018 අගෝස්තු 24 දින අනතුරට පත්ව තිබුණු අතර අනතුර මගින් වාහනයට සිදුවූ අලාභය රු.6,783,254 ක් බව අමාත්‍යාංශය විසින් සිදුකරන ලද පරීක්ෂණ වාර්තාව මගින් තක්සේරු කර තිබුණි. මෙම අනතුර සම්බන්ධයෙන් මු.රෙ.104 (1)(අ) ප්‍රකාරව අමාත්‍යාංශය විසින් සිදු කරන ලද පරීක්ෂණයේ වාර්තාව අනුව වාහනයේ අලාභය වාහනය භාවිතා කරන ලද නිලධාරියාගෙන් සහ රියදුරුගෙන් අයකර ගත යුතු බවට තීරණය වී තිබුණි. තවද, පොදු දේපල අවභාවිතා කිරීම සම්බන්ධයෙන් එම නිලධාරීන්ට විරුද්ධව නීතිමය පියවර ගත යුතු බවත් ප්‍රවාහන විෂය භාර නිලධාරි විසින් වාහනය භාරදීමේදී නොසැලකිලිමත් ලෙස කටයුතු කර ඇති බවත් සඳහන් කර තිබුණි. කෙසේවුවද, සිදුවී ඇති අලාභය 2020 දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ.104 ප්‍රකාරව කටයුතු කර අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම අලාභය වාහනය භාවිතා කරන ලද නිලධාරියාගෙන් හා රියදුරුගෙන් අය කර ගැනීම සඳහා මේ වන විට නඩු පවරා ඇති බැවින් නඩු තීන්දුව ලද වහාම අය කර ගැනීම් සිදු කරනු ලබන බව 2021-08-18 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත. | අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **08.** | ආර්ථික හා සමාජීය මානසික අගාධයට වැටී සිටින ග්‍රාමීය දිළිඳු ජනවතාවගේ දිළිඳුකම පිටු දැකීම හා ග්‍රාම සංවර්ධන කටයුතු දියුණුකිරීම මඟින් නව සංවර්ධන ක්‍රමවේදයක් හඳුන්වාදීම ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනයේ මූලික අරමුණ විය. මේ සඳහා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම මඟින් ක්‍රියාකාරකම් 10 ක් වෙනුවෙන් | ව්‍යාපෘතියේ මූලික අරමුණු ඉටුකර ගත හැකි ලෙස කටයුතු කිරීම. | බොරුල්ලේ පිහිටි ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය ඉතා පැරණි ගොඩනැගිල්ලක් බැවින් එහි අළුත්වැඩියා කටයුතු අදියර කිහිපයක් යටතේ නිම කරන ලද අතර දැනට ඇත්තේ | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | රු. මිලියන 16.02 ක් වෙන්කර තිබූ අතර එහි මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 9.07 ක් විය. ආයතනයේ මූලික අරමුණ ඉටු කර ගැනීමට ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු වෙනුවට රු. මිලියන 8 ක් වැය කර කාර්යාල උපකරණ මිලදී ගැනීම හා ගොඩනැගිලි අළුත්වැඩියාවන් කර තිබුණි. | | අවසන් අදියරෙහි කටයුතු පමණි. අළුත්වැඩියා කටයුතු අවසන් වූ නේවාසිකාගාරය, ප්‍රධාන රැස්වීම් ශාලා 02 ක්, ආපන ශාලාව හා රැස්වීම් ශාලාවට පිවිසුම් මාර්ගය දැනට වැඩ නිම කර ඇත.ඒ අනුව බාහිර හා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් ආරම්භ කර ඇති බැවින් අපේක්ෂිත අරමුණු ඉටු වෙමින් පවතින බව. | |
| 09. | සමාලෝචිත වර්ෂයේ අවුරුදු 70 ඉක්ම වූ අඩු ආදායම්ලාභී වැඩිහිටියන්ට රු. 2,000 ක මාසික දීමනාවක් ලබාදීමට වැඩිහිටියන් 416,667 දෙනෙකුට දිස්ත්‍රික්ක 25 ක් සඳහා රු.10,000,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී වැඩිහිටියන් 410,647 ක් වෙනුවෙන් රු.9,855,532,716 ක් දීමනා ලබා දී තිබුණි. ඒ අනුව අනුමත කරන ලද 6,020 දෙනෙකුට දීමනා ලබා දී නොතිබුණි. | සුදුසුකම් සපුරන වැඩිහිටියන් උපරිමයක් වෙත දීමනා ලබාදීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු මෙතෙක් ලැබී නැත. | වාර්තා කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 10. | සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්ම වැඩිහිටි දීමනාව ගෙවීමෙන් පසුව සාරාංශ වියදම් වාර්තාවක් සෑම මාසයක් අවසන්වී ඊළඟ මාසයේ 15 දිනට පෙර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යැවිය යුතුය. එසේම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ලබාදෙන වාර්තාවන්වලින් සාරාංශ වාර්තාවක් සකස් කර ඊළඟ මාසයේ 30 දිනට පෙර ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයට එවිය යුතුය. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් 2018 ඔක්තෝබර් 15 දිනැති එන්එස්ඊ/ඊඑල් /01/2018 චක්‍රලේඛය මගින් දන්වා ඇතත් අදාල වාර්තා එවීම ප්‍රමාද තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව වැඩිහිටි දිමනාවට හිමිකම ලබාගත් නමුත් දිමනාව ලබානොගත් පුද්ගලයන් පිළිබඳ දිස්ත්‍රික්ක 25 න් දිස්ත්‍රික්ක 11 ක් වෙතින් සාරාංශ වාර්තා ලබාගෙන නොතිබුණි. මේ අතර දීමනා ලබා ගැනීමට පොරොත්තු ලේඛණගත සංඛ්‍යාව 157,720 ක් වී තිබුණි. | ප්‍රතිපාදන උපරිම උපයෝජනය තුළින් වැඩිහිටියන් වෙත සහන සැළසීමට කටයුතු කල යුතු වීම. | පිළිතුරු මෙතෙක් ලැබී නැත. | -එම- |
| 11. | දිස්ත්‍රික්ක 25 තුළින් හඳුනාගෙන තිබූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව 13,863 ක් වශයෙන් පොරොත්තු ලේඛණයක් සකස් කර තිබුණු නමුත් වාර්ෂිකව දීමනාව ලබාගන්නා දිස්ත්‍රික්ක 11 ට අමතරව අනිකුත් දිස්ත්‍රික්කවල වකුගඩු රෝගීන් වෙත මෙම දීමනාව ලබාදීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව දිස්ත්‍රික්ක 14 ක වකුගඩු | සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි රෝගීන්ට සහන සැළසීමට කටයුතු කල යුතු වීම. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් 2019 වසර සඳහා ප්‍රතිපාදන නොමැති බව 2019.06.28 දිනැති ලිපිය මඟින් දන්වා එවන ලදී. එබැවින් පොරොත්තු | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | රෝගීන් 7,684 ක් සම්පූර්ණයෙන්ම දීමනාව ලබාදීමෙන් බැහැරවී තිබුණි. | | ලේඛණගත පිරිස සඳහා ගෙවීම සිදු කළ නොහැකි විය.<br>කෙසේ වෙතත් නිරන්තරයෙන් කරන ලද ඉල්ලීම්වල ප්‍රතිඵලයක් ලෙස සියලුම ආකාරයේ වකුගඩු රෝගින් ට ගොදුරු වු පිරිස් සඳහා සියදුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි රු5000 ජීවනාධාරය ගෙවීමට 2020 සැප්තැම්බර් මාසයේ සිට අණුමැතිය ලැබුණි.<br>එබැවින් 2020 වසර වන විට පොරොත්තු ලේඛනගත සිට නව ප්‍රතිලාභීන් 13849ක් සඳහා ගෙවීම ආරම්භ කර ඇත. | |
| 12. | තෘතීක හා ද්විතීක මට්ටමේ සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු පිළිවෙලින් 17 ක් හා 18 වශයෙන් අනුමත වුවද තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 289 ක් හා 53 ක් වීම හේතුවෙන්, අනුමත ප්‍රමාණය ඉක්මවා 307 ක් සේවයේ යොදවා තිබුණි. | කටයුතු කඩිනම් කර පරිපාලන ගැටළු විසඳා ගත යුතු වීම. | මෙතෙක් කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලැබී නොමැත. | කටයුතු කඩිනම් කර පරිපාලන ගැටළු විසඳාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 13. | 2020 සැප්තැම්බර් 04 දිනැති අංක DMS/SM/02 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියේ 05 ජේදය අනුව මෙම අමාත්‍යාංශය ජනතා කේන්ද්‍රීය රජයේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනිම සඳහා අමාත්‍යාංශයේ විෂය පථය යටතේ සඳහන් කාර්යයන්, කර්තාව්‍යයන්, ප්‍රමුඛතාවයන් සහ ඊට අදාල ඉලක්ක ලගා කර ගැනිමේදී අදාල ක්ෂේත්‍රයන්හි විශේෂ දැනුම් හා නිපුණතාවන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩල දායකත්වයක් අවශ්‍යා වන බව හඳුනාගෙන තිබුණි. තවද එම කරුණු සැලකිල්ලට ගෙන කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීම් කල යුතු වූ අතර ඒ සඳහා විධිමත් පරිදි යෝජනා ඉදිරිපත් කරන ලෙස දක්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අදාල ක්ෂේත්‍රයන්හි විශේෂ දැනුම් හා නිපුණතාවන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩල යොදවා ගැනීමට කටයුතු කළ යුතු වීම. | කාර්ය මණ්ඩලය අනුමත කර දෙන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත නැවත නැවත යොමු කර ඇත. මෙතෙක් අනුමැතිය ලැබී නොමැති බව. | අදාල ක්ෂේත්‍රයන්හි විශේෂ දැනුම් හා නිපුණතාවන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩල යොදවා ගැනීමට කටයුතුකර නොතිබුණි. |
| 14. | බොරැල්ල ග්‍රාම සංවර්ධන පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ අධ්‍යක්ෂ තනතුර 2018 අගෝස්තු මාසයේ සිට පුරප්පාඩුව පැවතුණි. තවද එම ආයතනයේ නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ තනතුරු 02 ක් ද දීර්ඝ කාලීනව පුරප්පාඩු පැවති අතර, අනුමත බඳවා ගැනීමේ පරිපාටියට බැහැරව නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු සේවයේ යොදවා තිබුණි. මේ හේතුවෙන් ආයතනයේ කාර්යභාරය ඉටුකර ගැනීම ගැටළුකාරී තත්ත්වයක පැවතුණි. | ආයතනයේ කාර්ය භාරයන් පවත්වා ගෙන යාම සඳහා ස්ථිර අධ්‍යක්ෂවරයකු පත්කළ යුතු වීම. | අධ්‍යක්ෂ තනතුරෙහි රාජකාරි ආවරණය සඳහා නිලධාරියෙකු පත් කර ඇති අතර පුරප්පාඩුව ඇති තනතුරු සම්පූර්ණ කර දෙන මෙන් රාජ්‍ය සේවා පලාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කර ඇත. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ iii | ආයතනයේ කාර්ය භාරයන් පවත්වා ගෙන යාම සඳහා ස්ථිර අධ්‍යක්ෂවරයකු පත්කර නොතිබුණි. |

ශ්‍රේණියේ
නිලධාරියෙකු විසින්
ආයතනයේ අධ්‍යක්ෂ
තනතුරෙහි රාජකාරී
ආවරණය කරනු ලබන
බව.

15. **ප්‍රතිපාදන උපයෝජනය**

| විස්තරය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 13,412,928,000 | 17,021,812,000 | 6,744,724,000 |
| - පුනරාවර්තන වියදම් | | | |
| - මූලධන වියදම් | 750,870,000 | 2,629,800,000 | |
| | | | 935,806,000 |
| - මුළු ප්‍රතිපාදන | 14,163,798,000 | 19,651,612,00 | 7,680,530,000 |
| සත්‍ය වියදම් | 12,864,851,412 | 15,119,715,01 | 6,709,642,423 |
| - පුනරාවර්තන වියදම් | | | |
| - මූලධන වියදම් | 432,962,895 | 2,061,722,472 | 723,835,594 |
| - මුළු වියදම් | 13,297,814,307 | 17,181,437,53 | 7,433,478,017 |
| වසර අග ඉතිරි වීම් | 548,076,588 | 1,902,096,919 | 35,081,577 |
| - පුනරාවර්තන වියදම් | | | |
| - මූලධන වියදම් | 317,907,105 | 568,077,528 | 211,970,406 |
| - මුළු ඉතිරිවීම් | 865,983,693 | 2,470,174,447 | 247,051,983 |

## 42. ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය - 415**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - 2018 තත්ත්වාගණනය කළ මතය
2019 තත්ත්වාගණනය කළ මතය
2020 තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගෙන ඇති වැළැක්වීමේ ක්‍රියාමාර්ග | අදාල ක්‍රියාමාර්ගයන්හි වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක විසින්, ලේකම් නිවාස, හා සංස්කෘතික කටයුතු අමතන ලද 2017 දෙසැම්බර් 29 දිනැති BD/RDS/123/1/9/4 ලිපියෙන් ඉදිරියේ දී නිවාස ව්‍යාපෘති ආරම්භ කිරීමේ දී ඒ සඳහා අවශ්‍ය ඉඩම් පවරා ගැනීමේ කටයුතු වහාම අවසන් කිරීමට ක්‍රියා කළ යුතු බව අවධාරණය කර තිබුණද වර්තමානයේද ඉඩම් අත්පත් කර ගැනීමකින් තොරව 2018 වර්ෂයේ දී නිවාස ඉදිකිරීම් කටයුතු සිදු කර ඇති බව අනාවරණය විය. | නිවාස ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ඉඩම් පවරා ගැනීම් හෝ අත්පත් කර ගැනීම් කල යුතුය. | මෙතෙක් නිසි ක්‍රියාමාර්ග ගෙන නොමැත. | මෙතෙක් ඉඩම් පවරා ගෙන නැත. |
| 02. | ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ලට අදාල ඉඩමේ භුක්තිය 1999 සැප්තැම්බර් 30 දින ගම්පහ ප්‍රාදේශීය ලේකම් වෙතින් භාරගෙන තිබුණද අදාල ඉඩම පවරා නොගෙන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් වියදම් දරා කාර්යාල | ඉඩම් පවරා නොගෙන ගොඩනැගිලි ඉදි කිරීම තුලින් කුලී ගෙවීම වලක්වා ගැනීම සඳහා ඉඩම් පවරාගෙන | මෙතෙක් නිසි ක්‍රියාමාර්ග ගෙන නොමැත. | ඉඩම පවරා ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ගොඩනැගිල්ල ඉදිකර අධිකාරියේ කාර්යාලය පවත්වා ගෙන ගොස් තිබුණි. ගම්පහ ප්‍රාදේශීය ලේකම් විසින් ඉහත ගොඩනැගිල්ලට කුලී මුදල් වශයෙන් 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.2,280,000 ගෙවන ලෙස 2016 සැප්තැම්බර් 29 දිනැති ගම්/ප්‍රාලේ/2/2/2/39(4) ලිපියෙන් දැනුම් දී තිබුණි. මේ වන විටත් කාර්යාලය පවත්වාගෙන යන අතර, 2018.12.31 දක්වාම අදාල ඉඩම පවරා ගෙන නොතිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීම් කල යුතුය. | | |
| 03 | ඉදිකරන ලද නිවාස ව්‍යාපෘති සඳහා ජලය නොමැති වීම හේතුවෙන් නිවාසලාභීන් පදිංචි කරවීමේ ගැටළු පැන නැගී ඇති අවස්ථා විගණනයේ දී අනාවරණය විය. මොනරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2016 වර්ෂයේ ආරම්භ කරන ලද බොරළුවලයාය ආදර්ශ ගම්මානයේ නිවාස 36 ක් ජාතීය ජල පහසුකම් නොමැති වීමෙන් 2018 වර්ෂයේ දී ජනතා අයිතියට පත් කිරීම ගැටළු සහගත වී තිබුණි. | නිවාස ව්‍යාපෘති සඳහා ශක්‍යතා අධ්‍යනයක් කර අදාල නිර්දේශ අනුව ක්‍රියා කල යුතු වීම. | -එම- | ගම්මානයට මෙතෙක් ජලය ලබා ගෙන නොමැත. |
| 04. | රත්නපුර ගල්කඩුවත්ත ඉඩම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා දීම සඳහා රු.8,686,000 ගෙවන ලෙස 2000 මැයි 06 දින නාගරික සංවර්ධන අධිකාරිය දන්වා තිබුණි. එම මුදල 2012 මාර්තු 20 ගෙවා තිබුණද ප්‍රමාදවීම හේතුවෙන් ඉඩම ජාතික නිවාස සංවර්ධන අධිකාරියට පවරා දීමට රු.145,530,000 ක නව තක්සේරු | සාකච්ඡා කර වර්තමානයේ පවතින තත්වය නිවැරදි කල යුතුය. | -එම- | ඉඩම් පවරාගෙන නැත. නිවාස සංවර්ධන අධිකාරිය ගෙවා ඇති මුදල නැවත නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | වටිනාකමක් ගෙවන ලෙස නැවතත් නාගරික සංවර්ධන අධිකාරිය දැනුම් දී තිබුණි. | | | |
| 05. | උදා ගම්මාන (ආදර්ශ ගම්මාන) වැඩසටහන් (නව) ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1790 ක් වූ අතර 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාවට අනුව මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දරා ඇති වියදම රු.මිලියන 1084 ක් විය. ඒ අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 60 ක් වී තිබුණි. එසේ වුවද 2019 ජනවාරි සිට 2020 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුල ඉලක්කගත නිවාස සංඛ්‍යාව 12,843 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ නිම කළ යුතු නිවාස සංඛ්‍යාව නිශ්චිතව දක්වා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වහල දක්වා නිම කර තිබූ නිවාස සංඛ්‍යාව 2523 ක් වූ අතර සම්පූර්ණ වශයෙන් නිමවූ නිවාස සංඛ්‍යාව 480 ක් විය. | ඉලක්ක ගත කාර්යභාරය සම්පූර්ණ කළ යුතුය. | ඉලක්කයන් ලඟා කර ගැනීමට පසු විපරම් කටයුතු කරමින් ක්‍රියාත්මකවීමක් දක්නට ඇත. | නිවාස 485ක් නිමකර ඇත. ඉතිරි නිවාස සම්පූර්ණ වශයෙන් නිමකර නොමැත. |
| 06. | ග්‍රාම ශක්ති ආදර්ශ ගම්මාන නිවාස වැඩ සටහන් (අවිච්ඡේද) ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු කළ මුදල රු.මිලියන 450 ක් වුවද වියදම රු.මිලියන 365 ක් වීමෙන් වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය සියයට 81 ක් විය. 2018 ජනවාරි සිට 2019 සැප්තැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදයට ඉලක්කගත නිවාස සංඛ්‍යාව 1,352 ක් වන අතර, නිමවූ නිවාස සංඛ්‍යාව 443 ක් පමණක් විය. | නියමිත කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට හැකි වන පරිදි සැලසුම් සකස් කළ යුතුය. | 2018 වර්ෂයෙන් පසු ප්‍රතිපාදන නොමැති අතර ව්‍යාපෘතියේ ප්‍රගතිය සම්බන්ධයෙන් පසුවිපරමක් නොමැත. | නිමවූ නිවාස 443ක් වූ අතර ඉන්පසු ඉදිකිරීමේ ප්‍රගතියක් නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 07. | උතුරු නැගෙනහිර නිවාස යෝජනා ක්‍රමය (අවිච්ඡේද) සඳහා සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 972 ක් වු අතර, දරා ඇති වියදම රු. මිලියන1,241 ක් විය. කාල පරිච්ඡේදයට ඉලක්කගත නිවාස ඉදිකිරීම් සංඛ්‍යාව වු 7,809 න් සමාලෝචිත වර්ෂය අවසාන වන විට සම්පූර්ණ වශයෙන්ම නිම කල නිවාස 3,589 ක් විය. ඒ අනුව 2019.12.31 දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 46 ක් විය. | -එම- | -එම- | සම්පූර්ණ වශයෙන් නිමකල නිවාස 3,589 ක් විය. ඉන්පසු කිසිඳු ප්‍රගතියක් නොවීය. |
| 08. | වැලි ඔය නිවාස යෝජනා ක්‍රමය සඳහා සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 66 ක් වු අතර වියදම රු. මිලියන 32 ක් වීමෙන් මූල්‍ය ප්‍රගතිය සියයට 48 ක් විය. 2019 වර්ෂයේ ඉලක්කගත නිවාස ඉදිකිරීම් සංඛ්‍යාව 256 ක් වුවද, එක් නිවසක් හෝ සම්පූර්ණ කර නොතිබූ අතර වහල දක්වා නිම කර තිබූ නිවාස සංඛ්‍යාව 27 ක් විය. | -එම- | -එම- | වහල දක්වා නිමවූ නිවාස 27ක් වූ අතර ඉන්පසු කිසිඳු ප්‍රගතියක් නොවීය. |
| 09. | ගංවතුරෙන් හානි වූ නිවාස වැඩිදියුණු කිරීමේ නිවාස වැඩසටහන (මුලතිව්,කිලිනොච්චිය) සඳහා සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1292 ක් වු අතර වියදම රු.මිලියන 530 ක් වීමෙන් මූල්‍ය ප්‍රගතිය සියයට 41ක් විය. 2019 ජනවාරි සිට 2020 ජුනි දක්වා වූ කාල පරිච්ඡේදයට ඉලක්කගත නිවාස වැඩි දියුණු කිරීම් සංඛ්‍යාව 4796 ක් වුවද එක් නිවසක් හෝ නිම කර නොතිබුණි. | -එම- | -එම- | වහල දක්වා ඉදිකල නිවාස 82 ක්වූ අතර ඉන්පසු ඉදිකිරීමේ ප්‍රගතියක් නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | 2019 වර්ෂය අවසාන වන විට වහල දක්වා නිම කර තිබූ නිවාස සංඛ්‍යාව 82 ක් විය. | | | |
| 10. | විසිරි නිවාස වැඩිදියුණු කිරීමේ (නව) වැඩසටහන සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 150 ක් වූ අතර වියදම රු.මිලියන 87 ක් වීමෙන් මූල්‍ය ප්‍රගතිය සියයට 58 ක් විය. 2019 ජනවාරි සිට 2020 ජුනි දක්වා වූ කාල පරිච්ඡේදයට ඉලක්කගත නිවාස සංඛ්‍යාව 3000 ක් වුවද නිම කළ නිවාස 394 ක් වූ අතර ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 13 ක් විය. | -එම- | -එම- | නිමකළ නිවාස 394ක් වූ අතර ඉන්පසු ඉදිකිරීම් ප්‍රගතියක් නොවීය. |
| 11. | ඉන්දියන් ආධාර යටතේ ක්‍රියාත්මක වන පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමි නිවාස ව්‍යාපෘතිය 2018 වර්ෂයේ ආරම්භ කර 2019 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව තිබුණද මේ වන විට එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නතර වී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂයේ මෙතෙක් දරා ඇති වියදම රුපියල් මිලියන 47ක් බවද භෞතික ප්‍රගතිය සියයට 30 බවද අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව අනුව නිරීක්ෂණය විය. | ඉලක්කගත කාර්යයන් සම්පූර්ණ කළ යුතු වේ. | කටයුතු පසුවිපරම් නොවේ. | 2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බව. |
| 12. | ඉන්දියන් ආධාර යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් ව්‍යාපෘති 04හි අමාත්‍යාංශ ප්‍රගති වාර්තා අනුව 2020 දෙසැම්බර් 31 දින වන විට ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොවීය. | ඉලක්කගත කාර්යයන් සම්පූර්ණ කළ යුතු වේ. | ප්‍රතිලාභීන්ට නිවාස නිම කිරීමට පෙර මුදල් ලබාදීමට ක්‍රියා කරමින් පවතින බව. | නිම කළ නිවාස 280ක් වූ අතර ඉදිරියේ දී නිම කිරීමට කටයුතු කරමින් පවතින බව. |

| | | | | |
|---|---|---|---|---|
| 13. | අමාත්‍යාංශය සතු වාහන 09ක් ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයට ලබාගෙන ඇති අතර මෙම වාහන 2020.12.31 දින තෙක් මෙම අමාත්‍යාංශයට භාර දී නොතිබුණි. | මෙම වාහන අමාත්‍යාංශයට නැවත ලබා ගත යුතු වේ. | අදාල අමාත්‍යාංශය ජනාධිපති ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් වෙත ලිපි යොමු කර දැනුවත් කර ඇත. | මෙතෙක් වාහන ලැබී නැත. |
| 14. | මහා භාණ්ඩාගාරය හරහා මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගත් PD 9553 සහ KX 7872 අංක දරන වාහනවල කල්බදු කාලය අවසන් වී ඇතත් 2020.12.31 තෙක්ම අමාත්‍යාංශයට පවරා ගෙන නොතිබුණි. | මෙම වාහන කඩිනමින් අමාත්‍යාංශයට පවරා ගත යුතු වේ. | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇත. PD 9553 වාහනය කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත අදාල ලේඛනය යොමු කර ඇතත් මෙතෙක් පවරාගෙන නොමැත.<br><br>KX 7872 වාහනයේ මුල් ලියාපදිංචි සහතිකය බැංකුවෙන් ඉල්ලා ලිපි යවා ඇත. | මෙතෙක් පවරාගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 15. | 2018 අයවැය යෝජනාවට අනුව 1972 අංක 07 දරන ගෙවල් කුළී පනත මෙතෙක් සංශෝධනය කර නොතිබුණි. | මෙම පනත කඩිනමින් සංශෝධනය කළ යුතු වේ. | කටයුතු කර නොමැත. | මෙතෙක් ඉටුකර නොමැත. |
| 16. | 2020 දෙසැම්බර් 31 දින දක්වා රාජ්‍ය ආයතනවලින් අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික කමිටු අනුමැතිය ලබා ගැනීමට එවා තිබූ කොන්ත්‍රාත් 38ක් සඳහා 2020 වර්ෂය අවසාන වන විටත් ඇගයීම් කර අනුමැතිය ලබා දී නොතිබුණි. | ස්ථාවර තාක්ෂණික කමිටු අනුමැතීන් ලබා දීම් ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතු වේ. | කටයුතු මන්දගාමීව සිදු කරයි. | මෙතෙක් අනුමැතිය ලබා දී ඇත්තේ ව්‍යාපෘති 09ක් සඳහා පමණි. |
| 17. | නිවාස යෝජනා ක්‍රම යටතේ නිවාස ඉදිකර ඇති පෞද්ගලික ඉඩම් 64 ක සංඛ්‍යාවක් මුදල් ගෙවා පවරා ගත යුතු වන අතර 2019 වර්ෂයේ ඉඩම් 08 ක් සඳහා වන්දි ගෙවා තිබුණි. තවදුරටත් වන්දි ගෙවා පවරා ගැනීමට ඉඩම් 56 ක ප්‍රමාණයක් 2020.12.31 දිනට පැවතුණි. | අදාළ පාර්ශවයන්ට වන්දි ගෙවා කඩිනමින් ඉඩම් පවරා ගත යුතු වේ. | කටයුතු මන්දගාමීව සිදු කරයි. | මෙතෙක් ඉටු කර නොමැත. |
| 18. | රජයේ කර්මාන්තශාලාව ප්‍රතිසංවිධානය කිරීම වෙනුවෙන් පත්කල විද්වත් කමිටු වාර්තාව 2020 වර්ෂයේ අවසාන වන විටද ඉදිරිපත් කර නොතිබුණි. | විද්වත් කමිටු වාර්තාව ලබා ගැනීමට කටයුතු කර එම වාර්තාවේ නිර්දේශයන් අනුව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කළ යුතු වේ. | විද්වත් කමිටු වාර්තාව අනුව කටයුතු කිරීමට සැලසුම් කරන බව. | මෙතෙක් ඉටු වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 19. | වන්දි මුදල ඉල්ලුම් කර ඇති ඉඩම් මීට වසර 20කට පෙර අත්පත් කර ගෙන නිවාස ඉදිකර ඇති බව නිරීක්ෂණය වන අතර, අදාළ ඉඩම් හිමියන්ට වන්දි මුදල් ගෙවා නොතිබුණි. | වන්දි මුදල් ඉල්ලුම්කර ඇති විට ඒ පිළිබඳ පරීක්ෂා කර බලා ගෙවිය යුතු වේ. | මෙතෙක් නිසි ක්‍රියාමාර්ග ගෙන නොමැත. | වන්දි මුදල් ගෙවා නොමැත. |
| 20. | පෞද්ගලික හා රජය සතු ඉඩම් පවරා නොගෙන නිවාස ඉදිකර නිවාසලාභීන් පදිංචි කර තිබුණද එම පදිංචිකරුවන්ට ඔප්පු ලබා නොදීම හේතුවෙන් නිවාසවල නීත්‍යානුකූල අයිතිය ලැබී නොතිබුණි. | පදිංචි නිවාසලාභීන්ට ඔප්පු ලබා දීමට කටයුතු කළ යුතු වේ. | අදාල ඉඩම් පවරා දෙන ලෙස අදාල ආයතනයන් වෙත ලිඛිතව දන්වා ඇත. | කටයුතු කරමින් පවතී. |

## 21. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
| --- | --- | --- | --- | --- |
| | ------- | ------- | ------- | --------- |
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | | | | |
| පුනරාවර්තන | 407,600,000 | 1,496,000,000 | 1,433,660,000 | 3,337,260,000 |
| මූලධන | 10,117,000,000 | 11,594,300,000 | 4,287,602,000 | 25,998,902,000 |
| **මුළු ප්‍රතිපාදනය** | **10,524,600,000** | **13,090,300,000** | **5,721,262,000** | 29,336,162,000 |
| ශුද්ධ ප්‍රතිපාදනය | | | | |
| පුනරාවර්තන | 442,697,271 | 2,198,250,000 | 1,433,660,000 | 4,074,607,271 |
| මූලධන වියදම් | 10,946,362,729 | 12,763,150,000 | 4,338,702,000 | 28,048,214,729 |
| **මුළු ශුද්ධ ප්‍රතිපාදනය** | **11,389,060,000** | **14,961,400,000** | **5,772,362,000** | 32,122,822,000 |
| සත්‍ය වියදම | | | | |
| පුනරාවර්තන | 417,915,142 | 2,096,473,004 | 1,397,092,753 | 3,911,480,899 |
| මූලධන | 9,225,845,963 | 11,906,009,550 | 3,800,875,480 | 24,932,730,993 |
| මුළු වියදම | 9,643,761,105 | 14,002,482,554 | 5,197,968,233 | 28,844,211,892 |
| වසර අග ඉතිරිවීම් | | | | |
| පුනරාවර්තන | 24,782,129 | 101,776,996 | 36,567,247 | 163,126,372 |
| මූලධන වියදම් | 1,720,516,766 | 857,140,450 | 53,782,652 | 2,631,439,868 |
| -මුළු වියදම | 1,745,298,895 | 958,917,446 | 90,349,899 | 2,794,566,240 |

43. දේශීය වෙදකම් ප්‍රවර්ධන ,ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 416

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතය:- 2018 :- අදාළ නොවේ.

2019 :- අදාළ නොවේ.

2020 :- තත්ත්වාගණනය නොකළ විගණන මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ----------------------- | -------------------- | -------------------- | -------------------- |
| 01. | විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු වාහන ලැයිස්තුව තුළ වාහනවල පිරිවැය සඳහන්ව නොතිබුණු අතර එම ලැයිස්තුවේ ඇතුළත්ව තිබුණු මෝටර් බයිසිකල් 48 ක, අමාත්‍ය කාර්ය මණ්ඩලය පරිහරණය කරන වාහන 06 ක සහ අපහරණය සඳහා වෙන්කරන ලද වාහනයක පිරිවැය ගිණුම්ගත කර නොතිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශය සතු සියලුම වාහනවල පිරිවැය ගිණුම්ගත කළ යුතුය | වාහනවල පිරිවැය සහිත වත්කම් ලේඛනයක් පිළියෙල කරමින් පවතින බව , යතුරුපැදි 48 ඔසුගොවි ව්‍යාපෘතිය සඳහා මිලදී ගෙන ඇති බව හා සීස / ඔසුගොවි සමාගම ඈවර කිරීමට සූදානම්ව යතුරුපැදි ලියාපදිංචි සහතික අමාත්‍යාංශය වෙත එවා ඇති නමුත් වත්කම් වටිනාකම පිළිබඳව විස්තර ඉදිරිපත් කර නැති බැවින් ඉදිරියේදී පත් කරනු ලබන කමිටුවක් මඟින් වටිනාකම් තක්සේරු කිරීමට කටයුතු කරන බව ,අමාත්‍ය | 2022 අප්‍රේල් 25 වන විටද වාහනවල පිරිවැය සහිත වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර අපහරණය සඳහා වෙන්කරන ලද වාහනය පවරාගෙන පිරිවැය ගිණුම්ගත කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කාර්ය මණ්ඩල වාහනවල අයිතිය මෙම රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා නොමැති බව , අපහරණය සඳහා ලබාදී තිබුණු වෑන් රථය තාවකාලිකව පරිහරණයට ලබා දුන් වාහනයක් වන බව හා එහි අයිතිය පවරා ගැනීමට කටයුතු කරමින් සිටින බව. | |
| 02. | මුදල් රෙගුලාසි 110 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව හානි හා පාඩු ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර පිළියෙල කර තිබුණු හානි හා පාඩු ලේඛණය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතින බව. | 2022 අප්‍රේල් 25 වන විටද හානි පාඩු ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. |
| 03. | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2018 අංක 19 දරණ විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව, අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය කර, ඒ අනුව පද්ධතිය | 2022 අප්‍රේල් 25 වන විටද අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචන සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරන බව. | |
| 04. | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය අමාත්‍යාංශය සතු වාහනවල දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳව පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුය. | 2021 වර්ෂයේදී සිදු කරන බව. | 2022 අප්‍රේල් 25 වන විටද චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| 05. | තාත්විකව හා හැකිතාක් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් සිදු වූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත පුනරාවර්තන වැය විෂයන් 4 ක් සඳහා සලසා තිබුණු රු.8,650,000 ක් වූ ප්‍රතිපාදන රු.10,927,850 ක් දක්වාද, මූලධන වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.500,000 ක් වූ ප්‍රතිපාදනය රු.900,000 ක් දක්වාද මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් මගින් වැඩි කරගෙන තිබුණි. | ආයතනයේ දැක්ම හා මෙහෙවර අනුව සකස් කෙරෙන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වන ක්‍රියාකාරකම් සැලකිල්ලට ගෙන නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කළ බව හා එසේ ප්‍රතිපාදන මාරු කර ගැනීමට හේතු දක්වා ඇති බව. | 2021 වර්ෂය සඳහාද තාත්විකව හා හැකිතාක් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. |
| 06. | අමාත්‍ය කාර්යාලයේ වැටුප් හා වේතන සඳහා ප්‍රතිපාදනය රු.4,700,000 ක් වූ අතර අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා රු.3,875,000 ක් හෙවත් වැටුප් හා වේතනවලින් සියයට 82 කට සමාන ප්‍රතිපාදන සලසා තිබුණි. | -එම- | 2020 අගෝස්තු 31 දින දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් දරන ලද වියදම ද ආවරණය කර ගැනීමට හැකිවන පරිදි වැටුප් හා වේතන හා අතිකාල හා නිවාඩු දින වැටුප් ඇතුළු අනෙකුත් වැය | 2021 වර්ෂයේදී අතිකාල හා නිවාඩු දින වැටුප් ප්‍රතිපාදනය වැටුප් හා වේතනවලින් සියයට 37.5 ක් විය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | විෂයයන් සඳහා ප්‍රතිපාදන සලසා දී ඇති බව. | |
| 07. | මුදල් රෙගුලාසි 94 (1) විධිවිධාන වලට පටහැනිව, පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 05 ක රු.136,153 ක් වූ ඉතිරිවීම් ඉක්මවා රු.2,837,253 ක බැරකම් වලට බැඳී තිබුණු අතර 2020 වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණු වැය විෂයන් 02 ක 2020 දෙසැම්බර් 31 දිනට රු.84,992 ක බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2020 වර්ෂය සඳහා අතුරු සම්මත ගිණුම් මඟින් ලබාදුන් ප්‍රතිපාදන බැරකම් නිරවුල් කිරීමට ප්‍රමාණවත් නොවූ බව . | 2021 වර්ෂයේදී බැරකම් වලට බැඳීම අවම මට්ටමක පවතී. |
| 08. | ස්ථාන මාරුවී ගොස් වර්ෂ 5 ඉක්මවූ නිලධාරියකුගෙන් අයවිය යුතු රු.288,618 ක් ද, සේවය අතහැර ගොස් වර්ෂ 1 ත් 2 ත් අතර කාලයක් ගතවූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.297,095 ක්ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි. | ස්ථාන මාරුවීම හෝ සේවය අවසන් කිරීම සිදුවන අවස්ථාවේදීම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | රු.288,618 ක මුදල අය වී ඇති නමුත් ස්ථාන මාරුව ගිය සේවා ස්ථානය විසින් ගිණුම් නිරවුල් නොකිරීම මත ශේෂය ඉතිරිවී ඇති බව හා එය කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගන්නා බව. | 2022 අප්‍රේල් 25 වන විටද රු.297095අයකර ගෙන නොතිබුණි |
| 09. | ප්‍රාග්ධන වියදම් යටතේ ආයුර්වේද ඖෂධ සංස්ථාවට යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 5 ක් ලබාදී තිබුණු නමුත් එම මුදල් උපයෝජනය කර නොතිබුණි. | අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනවලට ලබාදෙන ප්‍රාග්ධන ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීම පිළිබඳව කාලීනව පසු විපරම් සිදු කළ යුතුය. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | 2022 අප්‍රේල් 25 වන විටද අදාළ යන්ත්‍රය මිල දී ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 10. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත්කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2018 අංක 19 දරන ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2022 අප්‍රේල් 25 වන විටද අභ්‍යන්තර විගණනවරයෙකු පත් කර නොතිබුණි. |

11. **ප්‍රතිපාදන උපයෝජනය**

| **විස්තරය** | **2020** | **එකතුව** |
|---|---:|---:|
| | රු. | රු. |
| **ඇස්මේන්තුගත** | | |
| **ප්‍රතිපාදනය** | | |
| පුනරාවර්තන | 136,000,000 | 136,000,000 |
| මූලධන | 21,500,000 | 21,500,000 |
| **එකතුව** | **157,500,000** | **157,500,000** |
| | | |
| **ශුද්ධ ප්‍රතිපාදනය** | | |
| පුනරාවර්තන | 136,000,000 | 136,000,000 |
| මූලධන | 21,500,000 | 21,500,000 |
| **එකතුව** | **157,500,000** | **157,500,000** |
| - | | |
| **සත්‍ය වියදම** | | |
| පුනරාවර්තන | | |
| වියදම | 131,308,691 | 131,308,691 |
| මූලධන වියදම | 16,795,389 | 16,795,389 |
| **මුළු වියදම** | **148,104,080** | **148,104,080** |
| | | |
| **වසර අග ඉතිරිවීම්** | | |
| පුනරාවර්තන | 4,691,309 | 4,691,309 |
| මූලධන | 4,704,611 | 4,704,611 |
| **එකතුව** | **9,395,920** | **9,395,920** |

44. වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 417

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018- තත්වාගණනය කල මතය

2019 - තත්වාගණනය කල මතය

2020 - තත්වාගණනය කල මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | මුදල් රෙගුලාසි 702(3) අනුව අමාත්‍යාංශය විසින් අත්සන් කරන ලද සියලුම කොන්ත්‍රාත්තු වල පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. | වැවිලි මානව සංවර්ධන භාරය විසින් අදාළ වතු සමූපකාර සමිති සමග එළඹී කොන්ත්‍රාත් ගිවිසුම්වල පිටපත් ඉදිරියේදී විගණනය සඳහා ලබා දීමට කටයුතු කරන බව. මෙම අමාත්‍යාංශයට අදාල ඍජුව ඇති කොන්ත්‍රාත් ගිවිසුම් වල පිටපත් ද විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | වර්ථමාන තත්වය නොවෙනස්ව පවතියි |
| 02. | ක්‍රියාකාරී සැලැස්ම අනුව 2020 ජූනි 30 දිනට නිමකිරිමට අපේක්ෂිත අවිච්ඡේද නිවාස සංඛ්‍යාව 1710 ක් විය.ඒ සඳහා රු.මිලියන 680.79 ක් වැය කරමින් 2020 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් නිමකරන ලද නිවාස ප්‍රමාණය 700 ක් වූ අතර එය අපේක්ෂිත නිමවුම් | ක්‍රියාකාරී සැලැස්ම තුලට ඇතුලත් කරනු ලබන කාර්යයන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය. | පැවැති කොවිඩ් වසංගත තත්වය හමුවේ ද සංචරණ සීමා පැනවීම් යනාදිය නිසා ඉදිකිරීම් කටයුතුවල තිබුණු ප්‍රමාදයන් හේතුවෙන් සහ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අපේක්ෂිත භෞතික ප්‍රගතිය අත්කර ගැනීමට නොහැකි වූ බව. | අපේක්ෂිත භෞතික ප්‍රගතිය අත්කර ගැනීමට නොහැකි ව ඇත |

| | | | | |
|---|---|---|---|---|
| | මට්ටමෙන් සියයට 40.9 ක භෞතික ප්‍රගතියක් බව නිරීක්ෂණය විය. | | | |
| 03. | නාය යෑමෙන් අවතැන් වූ පුද්ගලයන් වෙනුවෙන් අයිලා වත්ත කොටසේ නිවාස 47ක් ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේ රු.47,000,000ක් අනුමත වී තිබුණි. එම නිවාස ඉදිකිරීම සඳහා 2018 පෙබරවාරි 12 දින වැවිලි මානව සංවර්ධන භාරය විසින් අයිලා වත්ත වතු සේවක සමූපකාර සමිතිය සමඟ එක් නිවසකට රු.950,000 බැගින් වූ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව එම නිවාස ව්‍යාපෘතිය 2018 සැප්තැම්බර් 12 දින වන විට නිම කළ යුතු වූවත්, විගණන දිනය වූ 2019 දෙසැම්බර් 31 දින වන විටත් සිදු කර තිබෙන්නේ නිවාස ඉදිකිරීමේ පලමු අධියර දක්වා පමණි. | මහජනයා වෙත සේවා ඉටු කිරිමේදී ප්‍රමුඛතාවය ලබාදිය යුතු කාර්යයන්ට මූලිකත්වය දී නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලැසුම් විධිමත් පරිදි සකස් කළ යුතුය. | වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | මේ වන විට මෙම නිවාස ව්‍යාපෘතියේ නිවාස **15**ක් සඳහා **V-I** වන අදියර දක්වා ද නිවාස ඒකක **19**ක් සඳහා **V-II** අදියර දක්වා ද ගෙවීම් සිදු කර ඇත. ඉදිකිරීම් කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇත. |
| 04. | අමාත්‍යාංශය විසින් වැවිලි ක්ෂේත්‍රයේ සැමට මූලික යටිතල පහසුකම් සහිත සුරක්ෂිත නිවාස හා වාසස්ථාන හිමිකරදීමේ ප්‍රධාන අරමුණින් ක්‍රියාත්මක කරන ලද | නිවාස ව්‍යාපෘති තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ළඟාකර ගැනීමට උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව කටයුතු කල යුතුය. | විවිධ හේතුන් පවසා ප්‍රතිලාභීන් මෙම නිවාස භාර ගැනීමට ඉදිරිපත් නොවීම හේතුවෙන් ප්‍රතිලාභීන් වෙත භාර දීමට නොහැකි වී ඇති බව හා ප්‍රතිලාභීන් වෙත භාර නොදුන් නිවාස පිළිබඳ | වර්ථමාන තත්වය නොවෙනස්ව පවතියි |

නිවාස ව්‍යාපෘති තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ළඟාකර ගැනීමේ ප්‍රගතිය අනුව හරිත රන් නිවාස වැඩසටහන යටතේ 2020 දෙසැම්බර් 31 දිනට නිවාස ඒකක 4007 ක් සම්පූර්ණ කර තිබුණද ප්‍රතිලාභීන් වෙත ප්‍රධානය කර තිබුණේ ඉන් නිවාස ඒකක 2225 ක් පමණක් වූ අතර එය සම්පූර්ණ කරන ලද ප්‍රමාණයෙන් සියයට 55 කි. 2016, 2017 හා 2018 යන වර්ෂ වලදී යටිතල පහසුකම් සහිතව සම්පූර්ණ කරන ලද නිවාස 177 ක් ද යටිතල පහසුකම් රහිතව සම්පූර්ණ කරන ලද නිවාස 574 ක් ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රතිලාභීන් වෙත ප්‍රදානය කර නොතිබුණු අතර 2018 වර්ෂයෙන් පසු කාලපරිච්ඡේදය තුළ සම්පූර්ණ කරන ලද නිවාස ප්‍රතිලාභීන් වෙත ප්‍රදානය කර නොතිබුණු බව විගණනයට ඉදිරිපත් කරන ලද වාර්තා අනුව නිරීක්ෂණය විය.

තොරතුරු සොයා බලා, ඒවා නිවාස අවශ්‍යතාවය සහිත වෙනත් ප්‍රතිලාභීන් වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු කිරීමට සටහන් කර ගත් බව.

| | | | | |
|---|---|---|---|---|
| 05. | අමාත්‍යාංශය 2015,2016,2017 හා 2018 වසර වලදී කලාප 07ක වතු 55ක් ආවරණය කරමින් රු.292,025,000ක් වටිනා නිවාස ඒකක 1159 ප්‍රතිලාභීන් වෙත ණය පදනම මත ලබා දී තිබුණි.ඉන් නිවාස ඒකක 282ක් වෙනුවෙන් අයවිය යුතු රු.77,550,000න් කිසිදු මුදලක් 2020 දෙසැම්බර් 31 වන විටත් අයකරගෙන නොතිබුණි. | නිවාස වෙනුවෙන් අයවිය යුතු මුදල් ඉක්මණික්ම අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී මේ සම්බන්ධව ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව විගණනය වෙත වාර්තා කිරීමට කටයුතු කරන බව. | -එම- |
| 06. | සමාලෝචිත වර්ෂයේ නිවාස ව්‍යාපෘතිය යටතේ නව නිවාස 150ක් ඉදිකිරීමට අදාළව ඉන් ෆෝර්ඩීස් වතුයායේ නිවාස ඒකක 19ක් ඉදිකිරිම සඳහා කිසිදු කාර්යයන් ආරම්භකර නොතිබියදී 2020 දෙසැම්බර් 31 දිනට රු.570,000ක් කළමනාකරණ ගාස්තු ලෙස වැවිලි මානව සංවර්ධනභාරය වෙත ගෙවීම් කර තිබුණි. | අදාල ව්‍යාපෘති සම්බන්ධ ගෙවීම් නිසි අධීක්ෂණයකින් හා පාලනයකින් යුතුව කල යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. | මෙම මුදල් මේ වන තෙක් අය කරගෙන නැත |
| 07. | කොටියාගල වතු යායේ යෝජිත නිවාස 184 කින් 42ක් පමණක් නිම කර ඇති අතර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ 2016 මැයි 23 | අත්තිකාරම් ගෙවීමේදී නිසි අධීක්ෂණයෙන් පසුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | මෙම ස්ථානයේ නිවාස 184ක් සැලසුම් කළ නමුත් ස්ථානයේ ඇති පාරිසරික ගැටලුකාරී තත්ත්වය නිසා නිවාස 42ක් පමණක් නිම | වැඩිපුර ගෙවා තිබු මුදල අයකර නැත |

| | | | | |
|---|---|---|---|---|
| | දිනෙන්ද පසුව එනම් 2016 ජූනි 08 දින ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමණාකරන අංශය මඟින් අදාල වාර්තාව ලබාගෙන එහි සඳහන් නිර්දේශයන් පිළිබඳව සැලකිලිමත්ව කටයුතු නොකිරීම හේතුවෙන් නිවාස 42 ක නිවාස ලාභීන් භාර ගෙන නොතිබුණි. නමුත් ඒ සඳහා අනුමත ඇස්තමේන්තුව වන රු.26,830,910, ඉක්මවා 2018 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්කරුට රු.40,443,527ක් ගෙවා තිබීම හේතුවෙන් එදිනට රු.13,612,617ක් වැඩිපුර ගෙවා තිබුණි. | සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුව මුදල් නිදහස් කල යුතු වීම හා අලාභය අයකර ගැනීමට කටයුතු කල යුතුය. | කිරීමට සිදු වූ බව, අධික වියදම් හේතුවෙන් ඔහු වැඩ බිම අතහැර යන ලද අතර මේ පිළිබඳ අවස්ථා ගණනාවකදී දැනුම් දී ඇති බව, ඔහුට විරුද්ධව කටයුතු කිරීමට ඉක්ටාඩ් ආයතනය දැනුවත් කර පියවර ගැනීමට කටයුතු කර ඇති බව. | |
| 08. | ඉහත දැක්වෙන නිවාස 42 ප්‍රතිලාභීන් විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට 2018 සැප්තැම්බර් 10 දින වෙනත් ආයතනයක් වන බැරුන්ඩිනා ආයතනය සමග රු.මිලියන 7ක ගිවිසුමකට එකඟ වී 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 6.84ක් ගෙවා තිබුණි. අනුමත ප්‍රතිපාදන ඉක්මවා සිදුවන මෙම වැය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුව හා රජයට අලාභයක් නොවන අයුරින් කොන්ත්‍රාත් ක්‍රියාත්මක කළ යුතුය. | අඩු පාඩු සකසන තෙක් නිවාස වල පදිංචියට යා නොහැකි බව නිවාස ලාභීන් දන්වා ඇති බව. වැඩ නවතා තිබූ බැවින් නිවාස වලට හානි කර ඇති බැවින් ඒ සඳහා ඇස්තමේන්තු සකසා ටෙන්ඩර් කිරීමට කාලයක් යන බැවින් අමාත්‍යාංශයේ වෙනත් ව්‍යාපෘති ඉටු කරන බැරුන්ඩිනා ආයතනයටම පැවරීමට කටයුතු කළ බව. | වර්ථමාන තත්වය නොවෙනස්ව පවතියි |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීම් ද ඉහත මුදලට අමතරව රජයට අලාභයක් වී ඇත. | | | |
| 09. | 2016 අගෝස්තු මාසයේ වෙන් කළ වාහනයකට සිදුවූ අනතුරකදී තුන්වන පාර්ශවීය රක්‍ෂණයක් පමණක් සිදු කර තිබීම හේතුවෙන් එය අළුත්වැඩියා කිරීමට රු.1,032,130 ක් වැයකර තිබුණි. 2018 ඔක්තෝබර් 25 දින ඉදිරිපත් කරන ලද මුදල් රෙගුලාසි 104(4) වාර්තාවෙන් අනතුරට වගකිවයුතු නිලධාරින් දෙදෙනාගෙන් අළුත්වැඩියා වියදම අයකර ගැනීමට නිර්දේශය කර තිබුණත්, 2020 අගෝස්තු 30 දින වන විටත් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරිපත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. | මු.රෙ.104 (4) යටතේ පවත්වන ලද පරීක්ෂණයේ අවසන් වාර්තාවට ඇතුලත් වාහනයට වූ අලාභය අධ්‍යක්ෂ ජනරාල්ගෙන් සහ රියදුරුගෙන් අයකර ගැනීමට නියෝග කර ඇති බව හා එම නිලධාරීන් දෙදෙනා සේවයෙන් ඉල්ලා අස්වී ඇති බව. පෞද්ගලික ලිපි ගොනු ආශ්‍රයෙන් ඔවුන්ගේ තොරතුරු ලබාගෙන අදාල මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | වර්ථමාන තත්වය නොවෙනස්ව පවතියි |
| 10. | 2009 සිට 2014 වර්ෂය දක්වා නිකුත් කරන ලද වතු නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව පැවති පේලි නිවාස හෝ තාවකාලික මඩු වැනි දෑ නැවත භාරදීමේ එකඟතාවය මත නව නිවාස භාරදීම සිදු කළ යුතුය. නුවරඑළිය දිස්ත්‍රික්කය තුල සිදුකරන ලද ක්ෂේත්‍ර | අමාත්‍ය මණ්ඩල තිරණය අනුව කටයුතු කල යුතුය. | වාර්තා කර නැත. | වර්ථමාන තත්වය නොවෙනස්ව පවතියි |

| | | | | |
|---|---|---|---|---|
| | පරික්ෂාවේදි නිවාස ප්‍රතිලාභීන් වෙත ලබාදුන් වතු 17ක අංශ 22ක පැවති නිවාස 491කින් වතු 15ක අංශ 20 කට අදාලව පැරණි පේළි නිවාස ඉවත් කර නොතිබුණි. ඒ අනුව එම පැරණි නිවාස වලින් ඉවත්වීම සිදු නොවීම හේතුවෙන් එම ඉඩම් වෙනත් කටයුතු සඳහා භාවිතා කිරිමක් සිදු නොකර එම ප්‍රතිලාභීන්ගේ පවුල් විසින්ම තවදුරටත් භාවිතා කර තිබුණි. | | | |
| 11. | ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් නිවාස ව්‍යාපෘති සඳහා වූ මාර්ගෝපදේශය අනුව නිවාස ප්‍රතිලාභින් තේරීමේදි වත්තේ ලියාපදිංචි සේවකයකු වීම අනිවාර්ය විය යුතු වේ. අමාත්‍ය මණ්ඩල තිරණ ප්‍රකාරව නිවාස ලබාදීමේ දී නායයාම් අවධානමට මුහුණ දුන් හා අවධානම් සහිත ප්‍රදේශ වල වතු සේවයේ නියුතු පවුල්වල අයට ආධාර ලෙස හා අනිකුත් වතු වල සේවය කරනු ලබන පවුල් සඳහා ණය හා ආධාර මිශ්‍ර පදනම මත ලබා දීමට තිරණය කර | අමාත්‍ය මණ්ඩල තිරණය අනුව කටයුතු කල යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. | වර්ථමාන තත්වය නොවෙනස්ව පවතියි |

| | | | | |
|---|---|---|---|---|
| | එය ක්‍රියාත්මක වන නමුත් 2019 නොවැම්බර් 25 සිට 29 දින දක්වා සිදුකරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදි එම නිර්නායක උල්ලංඝනය කරමින් නිවාස ලබාදී ඇති බව නිරීක්ෂණය විය. එනම් හැටන් හා නුවරඑළිය කළාපයේ පරීක්ෂා කල නිවාස 986කින් නිවාස 14ක් එම වත්තේ සේවය නොකරන අය වෙත ලබා දී තිබු බව නිරීක්ෂණය විය. | | | |
| 12. | නුවරඑළිය ප්‍රදේශයේ රු. 2,300,000ක් වටිනා නිවාස 03ක් ලබාදුන් ප්‍රතිලාභින් විසින් ඒවා භුක්ති විදිමෙන් තොරව වෙනත් පාර්ශවයන්ට කුලියට ලබා දී තිබු බව. | -එම- | -එම- | -එම- |
| 13. | නිවාස ව්‍යාපෘතිය ආරම්භයේ සිටම නිවාස ඉදිකිරීම් වැවිලි මානව සංවර්ධන භාරය මගින් ක්‍රියාත්මකකර අධීක්ෂණය කරනු ලබන අතර හරිත රන් නිවාස ව්‍යාපෘති සඳහා 6%ක් කළමණාකරණ ගාස්තු ගෙවනු ලබයි. ඒ අනුව 2018 වර්ෂය තුල රු.45,781,306ක් ද 2019 වර්ෂය තුල රු. 53,650,870ක් ද ගෙවා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුව කොන්ත්‍රාත් ක්‍රියාත්මක කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. | වැවිලි මානව සංවර්ධන භාරය හෝ වතු සමුපාකාර සමිති සමග ගිවිසුමක් ඇතිකරගෙන නොමැත |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. නමුත් කළමණාකාර ගාස්තු ගෙවීම සඳහා ලබාගත් අනුමැතියක් නොතිබුණ අතර ව්‍යාපෘති අධීක්ෂණයට හෝ කළමණාකරණ ගාස්තු ගෙවීමට වැවිලි මානව සංවර්ධන භාරය හෝ වතු සමුපාකාර සමිති සමග ගිවිසුමක් ද නොතිබුණි. | | | |
| 14. | 2018 වර්ෂයේදී වතු නිවාස වැඩසටහනේ ප්‍රතිලාභීන්ගෙන් නිවාස ණය අයකර රු.19,991,707 ක් රජයේ ආදායමට බැර කර ඇතත්, 2018 වර්ෂයේ ණය නැවත අය කිරීම රු.21,610,543 බව දක්වා තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේදී ණය නැවත අය කිරීම් රු.1,618,836 ක් අඩුවෙන් රජයේ ආදායමට බැර කර තිබුණි. | එකතු කරන සියලුම ණය හා පොලිය රජයේ ආදායමට බැර කළයුතුය. ඒ ඒ කාලපරිච්ඡේද වලට අය විය යුතු ණය වාරික හා පොලියද ගණනය කර හිඟ මුදල් අයකර ගැනීමටත්, නිවැරදිව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුවේ. | මේ වන විට සංවර්ධන අංශය විසින් පවත්වා ගෙන යනු ලබන වාර්තා අනුව, 2017 වර්ෂය තුළ අය කර ගනු ලැබූ මුලු ණය අයකිරීම් ප්‍රමාණය රු.9,270,607.11 වන අතර 2018 වර්ෂය තුළ ණය අයකිරීම් ප්‍රමාණය රු. 21,610,542.98 ක් බව. | වර්ථමාන තත්වය පිළිබඳ තොරතුරු ලබාදි නොමැත. |
| 15. | 2018 වර්ෂයට පෙර ආරම්භ කර නිම නොකරන ලද නිවාස ව්‍යාපෘති හා 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක හරිත රන් නිවාස යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් වැවිලි මානව සංවර්ධන භාරය මඟින් ක්‍රියාත්මක කර අධීක්ෂණය කිරීම සඳහා කොන්ත්‍රාත් වටිනාකමින් | නිසි අනුමැතියක් ලබා ගත යුතු අතර හා නීතියානුකූලව වගකීම පැවරීමට ගිවිසුමකට එළඹිය යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | සියයට 6 ක් ගෙවීමට ව්‍යාපෘති ඉදිකිරීම් මගපෙන්වීම් සංග්‍රහයෙන් එකඟවී තිබුණි. ඒ අනුව 2018 වර්ෂය තුළ සියයට 6 ක කළමණාකරණ ගාස්තුව රු.45,781,306 ක් ගෙවා තිබුණි. එසේ වුවද, නිවාසවල වටිනාකම සඳහා 2015 හා 2017 වර්ෂවල අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමේදී හෝ මෙම කළමනාකරණ ගාස්තු ගෙවීම සඳහා අනුමැතියක් ලබාදී ඇති බවට විගණනයේදී තහවුරු නොවුණි. | | | |
| 16. | කොටියාගල වතු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් නිවාස 184 කින් 42ක් පමණක් නිම කර ඇති බව හා ඉතිරි නිවාස ඉදිකිරීම කොන්ත්‍රාත්කරු 2017 ජූනි මාසයෙන් පසුව නතර කර ඇති බවත් දන්වා තිබුණි. ඒ වෙනුවෙන් ගෙවීමට හැකි උපරිම මුදල රු.26,830,910 ක් වුවද, 2017 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවා ඇති මුදල රු.31,964,677 ක් විය . | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුව කොන්ත්‍රාත් ක්‍රියාත්මක කළ යුතුය. | මෙම ස්ථානයේ නිවාස 184ක් සැලසුම් කළ නමුත් ස්ථානයේ ඇති පාරිසරික ගැටලුකාරී තත්ත්වය නිසා නිවාස 42ක් පමණක් නිම කිරීමට සිදු වූ බව.<br>සිදු වූන අධික වියදම් හේතුවෙන් ඔහු වැඩ බිම අතහැර දමන ලද අතර මේ පිළිබඳ අවස්ථා ගණනාවකදී දැනුම් දුන් බව හා ඔහුට විරුද්ධව කටයුතු කිරීමට ඉක්වාඩ් ආයතනය දැනුවත් කර පියවර ගැනීමට කටයුතු කර ඇති බව. | මුදලක් වැඩිපුර ගෙවවු මුදල රු.5,133,766 අය කර නැත |

| | | | | |
|---|---|---|---|---|
| | ඒ අනුව රු.5,133,766 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | | | |
| 17. | 2017.01.17 දින සමාගම් පනත යටතේ සීමිත ඇපකර සමාගමක් ලෙස ස්ථාපිත කරන ලද වැවිලි මානව සංවර්ධන භාරයට (පීඑච්ඩීටී) වතුයායේ පීඑච්ඩීටී විසින් ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු. 87,678,522 ක් ගෙවීම් කර තිබුනද එම කොන්ත්‍රාත් කරුවන් හා සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී රජයේ මාර්ගෝපදේශ හෝ වෙනත් නීති හා රෙගුලාසි අමාත්‍යාංශය විසින් අනුගමනය කර නොතිබුණි. | -එම- | පිලිතුරු ලබා දී නොමැත. | කොන්ත්‍රාත් කරුවන් හා සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී රජයේ මාර්ගෝපදේශ හෝ වෙනත් නීති හා රෙගුලාසි අමාත්‍යාංශය විසින් අනුගමනය නොකරයි . |
| **18.** | ප්‍රසම්පාදන මාර්ගෝපදේශනයේ හා ප්‍රසම්පාදන මඟපෙන්වීමේ 3.9.4 ඡේදය ප්‍රකාරව සමූපකාර සමිති වෙත එකතුව රු.මිලියන 2 කට වඩා වැඩි කොන්ත්‍රාත් නොදිය යුතු අතර නිශ්චිත කාලයක් තුල සමිතියක් විසින් ඉටුකරනු ලබන මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාව තුනකට නොවැඩි විය යුතු බව දන්වා තිබුණි. එසේ | -එම- | -එම- | මිලියන 2 කට වඩා වැඩි කොන්ත්‍රාත් සමූපකාර සමිති වලට තවමත් ලබා දේ |

| | | | | |
|---|---|---|---|---|
| | වුවද වැවිලි මානව සංවර්ධන භාරය මඟින් ඉටුකරනු ලබන සියලුම කොන්ත්‍රාත් ඉදිකිරීම් සඳහා අමාත්‍යාංශය වෙනුවෙන් වතු සේවක නිවාස සමූපකාර සමිති සමඟ ගිවිසුම්ගතවී ඉදිකිරීම් කරනු ලැබීමෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දක්වා ඇති සීමාවන් ඉක්මවා කටයුතු කර තිබුණි. | | | |
| 19. | තිරසර සංවර්ධන අභිමතාර්ථ වලට අනුව පේලි නිවාස වල ජීවත් වන වැවිලි ප්‍රජාව වෙත 2020 වසර අවසන් වන විට, පානීය ජල පහසුකම්, විදුලිය සහ පිවිසුම් මාර්ග සහිතව තම අයිතියට වෙන්වූ පර්චස් 07ක භූමියක් සමඟ නිවාස ඒකක 3234 ක් හිමිකර දීම ලෙස ක්‍රියාකාරි සැලැස්ම තුල දක්වා තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විට නිවාස ඒකක 2059ක් ඉදිකිරීම් සම්පූර්ණ කර ඇති නමුත්, ඉදිකළ නිවාසද නිසි ප්‍රමිතයට නොමැති වීම හේතුවෙන් හැටන් හා නුවරඑළිය ප්‍රදේශයේ පරීක්ෂා නියැදියට අනුව පමණක් | 2020 වසර අවසන් වන විට තිරසර සංවර්ධන අභිමතාර්ථ වලට අනුව යෝජිත ඉලක්ක ළඟා කර ගැනීමට හැකි වන ලෙස කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නොමැත | වර්තමාන තත්වය පිළිබඳ තොරතුරු ලබාදී නොමැත . |

නිවාස 281ක් ප්‍රතිලාභීන් භාර ගැනීම හෝ පදිංචිවීමට කටයුතු කර නොතිබුණි.

**20. ප්‍රතිපාදන උපයෝජනය**

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය - පුනරාවර්තන | 346,375,000 | 373,350,000 | 397,628,000 | 1,117,353,000 |
| මූලධන | 3,406,706,000 | 4,294,509,000 | 1,395,377,000 | 9,096,592,000 |
| එකතුව | 3,753,081,000 | 4,667,859,000 | 1,793,005,000 | 10,213,945,000 |
| සත්‍ය වියදම - පුනරාවර්තන | 316,297,335 | 367,886,321 | 375,075,626 | 1,059,259,282 |
| මූලධන | 2,258,524,724 | 2,656,701,001 | 1,255,362,868 | 6,170,588,593 |
| එකතුව | 2,574,822,059 | 3,024,587,322 | 1,630,438,494 | 7,229,847,875 |
| වසර අග ඉතිරිවීම් - පුනරාවර්තන | 30,077,665 | 5,463,679 | 22,552,374 | 58,093,718 |
| මූලධන | 1,148,181,276 | 1,637,807,999 | 140,014,132 | 2,926,003,407 |
| එකතුව | 1,178,258,941 | 1,643,271,678 | 162,566,506 | 2,984,097,125 |

**45. බන්ධනාගාර කලමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

**ශීර්ෂය 418**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වත්මන් තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | වැඩ තහනමට ලක්වූ නිළධාරීන් දෙදෙනකුගෙන් අයවිය යුතු ආපදා ණය ශේෂයන් වන රු. 229,320 ක මුදල වර්ෂ 05 කට වැඩි කාලයක් ගතවී ඇතත් එම ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නියමිත කාල සීමාව තුළදී ණය ශේෂ අයකර ගත යුතු බව. | ණයශේෂ අයකර ගැනීමට නිතිමය කටයුතු ආරම්භ කර ඇති බව. | ණයශේෂ තවමත් අයකරගෙන නොමැත. |
| 02. | 2020 නොවැම්බර් 30 දිනැති අංක 06/2020 දරන චක්‍රලේඛයේ (i) 23 හා 24 ඡේද ප්‍රකාරව වැඩ හා කුලී අත්තිකාරම් ශේෂ පවරාගනු ලබන වැය ශිර්ෂ විසින් එම ශේෂ ගිණුම්ගත කිරිම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් තම වැය ශිර්ෂ යටතේ වෙන වෙනම ගිණුම් අංක ලබාගත යුතු විය. එහෙත් අමාත්‍යාංශ ගොඩනැගිලි කුලී අත්තිකාරම් රු.6,600,000 ක් හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ වැඩ අත්තිකාරම් | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අත්තිකාරම් මුදල් ආපසු ලබාගන්නා අවස්ථාවේදී රජයේ ආදායමට බැර කරන ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලැබී ඇති බව. | 2021 වර්ෂයේදිද ගිණුම්ගත කර නෙමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | මුදල් රු.33,456,588 ක් ද ගිණුම්ගත කර නොතිබුණි. | | | |
| 03. | පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය විසින් සේනපුර හා කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානවල නේවාසිකාගාර ඉදිකිරිම වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දින රු. 7,529,768 ක අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි. ගිවිසුම්ගත වීමට ප්‍රථම ඉදිකිරීම් භූමියේ අයිතිය නිත්‍යානුකූල පවරාගැනීමකින් හා ගොඩනැඟිලි සැලසුම් අනුමත කරවාගැනීමකින් තොරව වැඩ ආරම්භ කිරිම හේතුවෙන් අතරමඟ ඉදිකිරීම් කටයුතු නතර කිරිමට සිදුවී තිබුණි. | නිත්‍යානුකූල කටයුතු සිදු කිරිමෙන් අනතුරුව ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ යුතු බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුව ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ බව සහ ඉඩමේ අයිතිය පිළිබඳ ගැටළුවත් කාර්යාංශය වරින් වර අමාත්‍යාංශ 4 ක් යටතට පත්වීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අඩාල වී ඇති බව. | භූමියේ අයිතිය නිත්‍යානුකූලව පවරාගෙන ඇති අතර කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කරමින් පවති. |
| 04. | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2/2017 දරන චක්‍රලේඛයේ 2(i)ඡේදය ප්‍රකාරව වාහනවල අයිතිය විධිමත්ව පවරා දීමට කටයුතු කළ යුතු බව දක්වා ඇතත්, අමාත්‍යාංශය සතුව පැවති වටිනාකම රු. 84,400,000 ක් | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අනුමැතිය ලද වහාම සියළුම වාහන නිත්‍යානුකූලව පැවරීමේ කටයුතු සිදුකිරීමට සැලසුම් කර ඇති බව. | නිත්‍යානුකූලව පැවරීමේ කටයුතු සිදුකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | වටිනා වාහන 13 ක් 2019 වර්ෂයේදි බාහිර ආයතන වෙත මුදාහැර තිබුණත් එහි නිත්‍යානුකූල අයිතිය එම ආයතන වෙත පැවරීමට කටයුතු කර නොතිබුණි. | | | |
| 05. | මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු කාර්යය මණ්ඩලය ලබාදුන් වහාම වැඩ ආරම්භ කරන බව. | මෙතෙක් පිහිටුවා නොමැත. |
| 06. | අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය73 ක්ද,තථ්‍යකාර්ය මණ්ඩලය 61 ක්ද වීමෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 12 ක් විය. | අනුමත කාර්යමණ්ඩල තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු බව. | පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර තිබූ බව වේ. | පුරප්පාඩු පියවීමට කටයුතු කර නොතිබුණි. |

**07. ප්‍රතිපාදන උපයෝජනය**

| විස්තරය | 2020 |
|---|---|
| | රු. |
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | |
| පුනරාවර්තන වියදම් | 216,915,000 |
| මූලධන වියදම් | 417,876,000 |
| එකතුව | 634,791,000 |
| ශුද්ධ ප්‍රතිපාදන - පුනරාවර්තන වියදම් | 218,315,000 |
| - මූලධන වියදම් | 417,876,000 |
| එකතුව | 636,191,000 |
| සත්‍ය වියදම් - පුනරාවර්තන වියදම් | 210,333,172 |
| - මූලධන වියදම් | 289,713,657 |
| එකතුව | 500,046,829 |
| ඉතිරිවීම් | |
| - පුනරාවර්තන වියදම් | 7,891,828 |
| - මූලධන වියදම් | 128,162,343 |
| එකතුව | 136,144,171 |

## 46. කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය - 419**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - තත්ත්වාගණනය කළ මතය (2020)

**ප්‍රතිපාදන උපයෝජනය**

| විස්තරය | 2020 | එකතුව |
|---|---|---|
| | රු. | රු |
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | | |
| - පුනරාවර්තන | 74,080,000 | 74,080,000 |
| - මූලධන | 7,100,000 | 7,100,000 |
| - මුළු ප්‍රතිපාදන | 81,180,000 | 81,180,000 |
| සත්‍ය වියදම් | | |
| - පුනරාවර්තන | 45505,836 | 45505,836 |
| - මූලධන | 2,175,407 | 2,175,407 |
| - මුළු වියදම් | 47,681,243 | 47,681,243 |
| වසර අග ඉතිරි වීම් | | |
| - පුනරාවර්තන | 28,574,164 | 28,574,164 |
| - මූලධන | 4,924,593 | 4,924,593 |
| - මුළු ඉතිරිවීම් | 33,498,757 | 33,498,757 |

## 47. පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය - 420**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය කළ මතය

| විගණකාධිපති වාර්තාවේ ඇතුළත් ප්‍රධාන අඩුපාඩු | | විගණකාධිපතිගේ නිර්දේශය | ආස්ථිත්‍යය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| **01.** | වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේදී මුදල් රෙගුලාසි 50 මගින් අවධාරණය කර ඇති කරුණු පිළිබඳ අවධානය යොමු නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයයන්වල මෙන් ම පුනරාවර්තන වැය විෂයයන්වල මුළු ප්‍රතිපාදනය ම ඉතිරි වූ අවස්ථා හා මුළු ප්‍රතිපාදනයෙන් 50%ට වඩා වැඩියෙන් ඉතිරි වී තිබූ අවස්ථා පැවතුණි. | ඇස්තමේන්තු සකස් කිරීමේදී අතාත්වික නොවන පරිදි පිළියෙල කිරීමට හා නියමිත පරිදි ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | අනිවාර්ය ඉතිරි කිරීම්, වියදම් සීමා කිරීම, අපේක්ෂිත අක්මුදල් නොලැබීම, රටේ පැවති වසංගත තත්ත්වය ආදී විවිධ හේතු මත ප්‍රතිපාදන ඉතිරි වී ඇති බවට වාර්තා කර ඇත. | විගණන නිරීක්ෂණය මගින් පෙන්වා දී ඇති කරුණු නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| **02.** | මුදල් රෙගුලාසි උපදෙස් නොසලකා වැය විෂයයන් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 94(I) විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. | අයවැය ප්‍රතිපාදනවල ඉතිරියට වඩා බැරකම් වටිනාකම ඉක්මවා ඇති බව පිළිගෙන තිබුණද වැළැක්වීම සඳහා ගත් ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | එලෙස ම පවතී. |
| **03.** | 2020 සැප්තැම්බර් 04 දිනැති අංක DMS/SM/10 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියේ උපදෙස්වලට පටහැනිව නව රාජ්‍ය අමාත්‍යාංශයේ ව්‍යාපෘති | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අනුව කටයුතු කළ යුතුය. | අදාළ දීමනා ගෙවීම මේ වනවිට අත්හිටුවා ඇති අතර, වැඩිපුර ගෙවීම් ඇත්නම් අයකර ගැනීමට අවශ්‍ය උපදෙස් දී ඇත. | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කළමනාකරණ ඒකකය සඳහා අනුමත කර ඇති වැටුප් හා දීමනාවලට අමතරව වැටුප් හා දීමනා ගෙවා තිබුණි. ඒ අනුව එම අංශයේ සේවයේ නියුතු අතිරේක ලේකම්වරයාට වැටුපෙන් සියයට 50ක් එනම් මාසිකව රු.56,150ක් බැගින් සහ ප්‍රසම්පාදන විශේෂඥවරයා සහ ඉංජිනේරු උපදේශකවරයා (වාරිමාර්ග) සඳහා එක් නිලධාරියෙකුට මාසිකව රු.107,000ක් බැගින් වනසේ 2020 සැප්තැම්බර් මාසයේ සිට වැටුප් ලෙස රු.1,080,600ක් ලෙස වැඩිපුර ගෙවා තිබුණි. | | | |
| **04.** | 2018 පෙබරවාරි 05 දිනැති, අංක 01/2018 දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ අනු අංක 1.12 ප්‍රකාරව සහනදායී මෝටර් රථ බලපත්‍ර ලබා දීමේදී නියමිත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට පමණක් මෝටර් රථ බලපත්‍ර ලබා දිය යුතු විය. එහෙත් පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත සහ පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත රජයේ සංවර්ධන ව්‍යාපෘතිවල වසර 9ක සේවා කාලයක් සම්පූර්ණ නොකළ ද මෝටර් රථ බලපත්‍ර නිකුත් කර තිබුණි. | වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගෙන් උපදෙස් විමසා ඒ අනුව කටයුතු කළ යුතුය. | පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරයා වසර 9ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවට ලේඛන පරීක්ෂා කිරීමෙන් තහවුරු කරගෙන ඇති නිසාත් පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂකවරයා සඳහා, අංක 01/2013 චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව වරලත් ඉංජිනේරුවරයෙකු වීම සහ රජයේ සංවර්ධන ව්‍යාපෘතියක වසර 9ක් | ලේකම්වරයා විසින් පත් කරන ලද කමිටුවක් මගින් අධ්‍යයනය කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සම්පූර්ණ වීම යන කරුණු පදනම් කරගෙන කමිටුවක් මගින් බලපත්‍ර නිර්දේශ කොට ඇති නිසාත් බලපත්‍ර ලබා දී ඇති බවට වාර්තා කර තිබුණි. එහෙත් ඒවායේ නිවැරදි බව සනාථ කෙරෙන සාක්ෂි ඉදිරිපත් නොවූ අතර වැළැක්වීම සඳහා ගත් ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි. | |
| **05.** | පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු හා අනුකූලතා නිලධාරි වශයෙන් සේවය කරන නිලධාරියාගේ සේවා කාලය සම්පූර්ණ වී තිබුණි. එහෙත් චක්‍රලේඛයේ 01.02(iv) ඡේදය අනුව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත් පසුව කොන්ත්‍රාත් පදනම මත මෙම අංක 01/2013 දරන වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ සඳහන් සුදුසුකම් ලබන තනතුරක් සඳහා පත් කර ඇති නිලධාරීන්ට සහනදායී පදනමට මෝටර් රථ බලපත්‍ර හිමි නැති බවට උපදෙස් ලබා දී තිබියදී මෝටර් රථ බලපත්‍රයක් ලබා දී තිබුණි. | -එම- | අංක 01/2013 චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව වරලත් ඉංජිනේරුවරයෙකු වීම, රජයේ සංවර්ධන ව්‍යාපෘතියක වසර 9ක් සම්පූර්ණ වීම යන කරුණු පදනම් කරගෙන කමිටුවක් මගින් බලපත්‍ර නිර්දේශ කොට ලබා දී ඇති බව වාර්තා කර තිබුණද විගණන නිරීක්ෂණය මගින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳව ගෙන ඇති ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| **06.** | විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව හා මුදල් රෙගුලාසි 137 (1), (2), (3), (4) හා 138හි විධිවිධාන පිළිබඳ සැලකිල්ලක් නොදක්වා "ඊ-පළාත් පාලනය" නම් වූ පරිගණක පද්ධතියේ සහායක හා නඩත්තු සේවා සඳහා පුද්ගලික සමාගමකට 2018 වර්ෂයේදී රු.මිලියන 9.6ක් ගෙවා තිබුණි. එහෙත් 2019 වර්ෂය ආරම්භ වන විටත් අකර්මණ්‍ය වී තිබු මෙම පරිගණක පද්ධතියේ සහායක හා නඩත්තු සේවාවන් සපයා නොතිබුණි. | වියදම් අනුමත කිරීමේදී හා සහතික කිරීමේදී විධිමත් පරිදි ක්‍රියා කිරීම. | මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් ලබාදී ඇති නිර්දේශ හා අනෙකුත් කරුණු සැලකිල්ලට ගෙන අදාළ ගෙවීම් සිදුකර ඇති බව වාර්තා කර තිබුණද විගණන නිරීක්ෂණයේ පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි. | elg-01 ලෙස හඳුන්වාදුන් එම මෘදුකාංගය වෙනුවට elg-02 ලෙස නව මෘදුකාංගයක් සකස් කිරිම සඳහා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය සමඟ ගිවිසුම් ගත වීමට අවශ්‍ය මූලික කටයුතු සකස් කරමින් පවතින බව වාර්තා කර ඇත. |
| **07.** | 2018 මාර්තු 08 දින ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශයේ පළාත් පාලන ආයතන 30ක ඊ-පළාත් පාලන පද්ධතිය ක්‍රියාත්මක වන බව සඳහන් කර තිබු අතර ඒ අනුව **"2017 සහ 2018 වර්ෂ සඳහා ඊ-පළාත් පාලන පද්ධතියට සහාය හා නඩත්තු සේවා සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ M/S hsenid Business Solution** නැමැති **පුද්ගලික සමාගම වෙතින් ලබා ගැනීම යෝජනා කරමු**" යනුවෙන් සඳහන් කර තිබුණි. මෙම කැබිනට් සංදේශයට 2018 මාර්තු 27 දින අංක අමප/18/0512/744/003-1 හා 2018 අප්‍රේල් 24 දිනැති කැබිනට් තීරණයෙන් අනුමැතිය ලැබී තිබුණි. | විධිමත් පරීක්ෂණයක් තුළින් අඩුපාඩු හා වගකිව යුතු පුද්ගලයින් හඳුනාගෙන ඉදිරි කටයුතු කිරීම යෝග්‍ය වේ. | කැබිනට් සංදේශය ඉදිරිපත් කරන අවස්ථාව වන විට පළාත් පාලන ආයතන 30ක මෙම පද්ධතිය ක්‍රියාත්මකව පැවති බවත්, ඊ-පළාත් පාලන පද්ධතිය තුළ ගොඩනැගිලි ඉදිකිරීම් බලපත්‍ර ලබා දීම ඇතුළු ක්‍රියාකාරකම් සඳහා වූ පහසුකම් සලසා තිබුණු බවත් එසේම ඒ අවස්ථාව වන විට තවත් ආයතන 50කට ද එම පද්ධතිය හඳුන්වා දීමට සැලසුම් කර තිබුණු බවත් වාර්තා කර | මෙම තත්ත්වය තවදුරටත් නිවැරදි වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | එසේ වුව ද කැබිනට් සංදේශය මගින් කැබිනට් මණ්ඩලය වෙත පහත සඳහන් පරිදි නිවැරදි නොවන තොරතුරු සපයා තිබුණි.<br>- 2018 මාර්තු 08 දින වන විට පළාත් පාලන ආයතන 30ක මෙම පද්ධතිය ක්‍රියාත්මක වන බව සඳහන් කිරීම.<br>- පළමු අදියර යටතේ ගොඩනැගිලි ඉදිකිරීම් බලපත්‍රය ලබාදීම හා සියලු නිත්‍ය ආදායම් රැස්කිරීමේ ක්‍රියාකාරකම් සිදු කරන බව සඳහන් කිරීම.<br>- 2018 ජූනි මාසයේ තවත් පළාත් පාලන ආයතන 50ක මෙම තොරතුරු පද්ධතිය හඳුන්වා දීමට සැළසුම් කර ඇති බව සඳහන් කිරීම. | | තිබුණද විගණන නිරීක්ෂණයේ පෙන්වා දී ඇති අඩුපාඩු පිළිබඳ දැඩි අවධානය යොමුකර නොතිබුණි. | |
| **08.** | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාගේ භාවිතය සඳහා 2010 ඔක්තෝම්බර් 25 දින ජනාධිපති කාර්යාලයට අයත් වෙඩි නොවදින ජීප් රථයක් ලබා දී තිබුණි. හිටපු අමාත්‍යවරයාගේ උපදෙස් මත එම වාහනය අලුත්වැඩියාව සඳහා දේශීය නියෝජිත ආයතනය වෙත 2014 ජූනි 11 දින යොමුකර තිබූ අතර, වාහනයේ හානි වී ඇති ඉදිරිපස හා | අලාභහානි සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකිරීම. | මෙම ජීප් රථය ජනාධිපති කාර්යාලය වෙත භාර දීමට කටයුතු කරනු ලැබූ බව සහ එම කාර්යාලය මෙතෙක් ඒ සඳහා ඉදිරිපත් වී නොමැති බව වාර්තා කර ඇත. | මේ දක්වාත් භාර දී නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | පසුපස වීදුරු අලුතින් දැමීම සඳහා රු.මිලියන 16.22 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. එසේ වුව ද අලුත්වැඩියාව සඳහා රු.මිලියන 3.23 ක බිල්පතක් 2015 සැප්තැම්බර් 30 දිනැතිව ඉදිරිපත් කර තිබුණ ද ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ගෙවීම් සිදුකර නොතිබුණි. මෙම ගෙවීම සිදුකර වාහනය ලබා ගත්ත ද භාවිතයට ගත හැකි තත්ත්වයක නොපවතින අතර එවැනි වාහනයක් භාවිත කිරීමේ අවශ්‍යතාවයක් ද නොවන බව නිරීක්ෂණය වේ. | | | |
| **09.** | මු.රෙ.571(3) ප්‍රකාරව වර්ෂ දෙකකට වැඩි තැන්පතු රජයේ ආදායමට බැර කළ යුතු නමුත් තැන්පතු ගිණුම් ශේෂ 328 ක රු.91,713,104ක් රජයේ ආදායමට බැර කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571(3) විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. | 2021 ඔක්තෝබර් 31 දින වන විට තැන්පතු ගිණුමේ ශේෂය රු.මිලියන 29කි. කාලය ඉක්මවූ තැන්පතු රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමින් පවතී. | මෙහි සඳහන් තැන්පතු රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් ශේෂ 133ක එකතු වටිනාකම රු.මිලියන 61.89ක් වූ ශේෂයක් පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| **10.** | නාගරික කසළ භාවිතයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනයේ ඉදිරි පියවරක් ලෙස දිනකට කසළ ටොන් 50ක භාවිතයෙන් කොම්පෝස්ට් ටොන් 17ක නිෂ්පාදන ධාරිතාවක් සහිත ජපානයේ නිෂ්පාදිත කොම්පෝස්ට් යන්ත්‍ර 9ක් පළාත් මට්ටමෙන් ස්ථාපිත කිරීමට අංක අමප/17/1375/744/005–II/ටීබීආර් හා 2017 ජූලි මස 19 දින කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබූ අතර ඒ අනුව 2017 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 935.69 ක වියදමෙන් කොම්පෝස්ට් නිෂ්පාදන යන්ත්‍ර 9ක් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැරව මිලදීගෙන තිබුණි. යන්ත්‍ර සවිකිරීම සඳහා වූ ගොඩනැගිලි ඉදිකිරීම් කොන්ත්‍රාත් 9ක් රු.මිලියන 733.26කට කොන්ත්‍රාත්කරුවන් 6 දෙනෙකු වෙත පිරිනමා තිබුණි. එහෙත් 2017 වර්ෂයේදී රු.මිලියන 935.69ක වියදමෙන් මිලදී ගත් කවෂිමා කොම්පෝස්ට් යන්ත්‍ර 9න් 4ක් සවි කිරීම සඳහා වූ ගොඩනැගිලි ඉදිකිරීම් අවසන් කර නොතිබීම හේතුවෙන් එම යන්ත්‍ර භාවිතයට ගැනීමට 2021 ජුනි 30 වන විටත් අපොහොසත් ව තිබුණි. | නව ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ප්‍රථම ශක්‍යතා අධ්‍යයනයක් කිරීමට කටයුතු කළ යුතු අතර මිලදී ගත් යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම හා අපේක්ෂිත ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. ගිවිසුම්ගත කාලපරිච්ඡේදය තුළ ඉදිකිරීම් නිමකරවා ගැනීමට කළමනාකාරීත්ව යේ අවධානය යොමු විය යුතුය. | ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයේ අනුග්‍රහය මත නියැදියක් ලෙස මෙරටට ලබා දුන් කවෂිමා යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව වසරක පමණ කාලයක් සිදුකළ අධ්‍යයනයකින් පසුව මෙම යන්ත්‍ර මිලදී ගත් බවත් පසුව පැන නැගුණු මහජන විරෝධතා හේතුවෙන් යන්ත්‍ර සවිකිරීම ප්‍රමාද වූ බවත් ඉදිරියේදී යන්ත්‍ර සියල්ල ම ප්‍රයෝජනයට ගත හැකි බවත් වාර්තා කර තිබුණි. අපේක්ෂිත ආදායම උපයා ගැනීම සඳහා දැනටමත් සැලසුම් කර ඇති බව කොම්පෝස්ට් මිල ඉදිරියේදී වැඩිකිරීමට ද අපේක්ෂිත බවද වාර්තා කර ඇත. | යන්ත්‍ර 9න් 8ක සවිකිරීම් අවසන් කර ඇති බවට වාර්තා වුව ද දඹුල්ල හා කුරුණෑගල හැර අනෙකුත් යන්ත්‍ර වල නිෂ්පාදන ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| **11.** | 2017 වර්ෂයේ මිලදී ගත් කොම්පෝස්ට් යන්ත්‍ර 9 අතුරින් 5ක් කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා යොදා ගෙන තිබුණ ද එම යන්ත්‍ර මගින් දිනකට අපේක්ෂිත නිෂ්පාදන මට්ටම වූ කසල ටොන් 50 ක් භාවිතා කර කොම්පෝස්ට් ටොන් 17 ක් නිෂ්පාදනය කළ යුතු වුවද එසේ කර නොතිබුණි. | ආයෝජිත මුදලෙන් අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර දීමට කටයුතු කළ යුතු වේ. | පරීක්ෂා කිරීමට සටහන් කර ගත් බව වාර්තා කළද අඩුපාඩු වැළැක්වීමටගත් ක්‍රියාමාර්ග වාර්තා කර නොමැත. | දඹුල්ල දිගම්පතන යන්ත්‍රය උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක වන බවට වාර්තා වුව ද සුළු අලෙවි ආදායමක් පමණක් ලබාගෙන තිබුණි. |
| **12.** | ලංකාපුර, හම්බන්තොට හා කෑගල්ල යන ස්ථාන 03හි ස්ථාපිත යන්ත්‍ර සඳහා දෛනිකව ලැබෙන කසළ ප්‍රමාණය දිනකට ටොන් 5කට වඩා අවම අඩු මට්ටමක පවතින අතර එම යන්ත්‍ර 02න් කොම්පෝස්ට් නිෂ්පාදනයක් සිදු කර නොතිබුණි. | -එම- | කොම්පෝස්ට් නිෂ්පාදනයට ප්‍රමාණවත් පරිදි කසළ නොලැබෙන බව පමණක් වාර්තා කර ඇත. | නිෂ්පාදන ප්‍රගතියක් අත්කරගෙන නොමැත. |
| **13.** | කොම්පෝස්ට් නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා මේ වන විට මිලදී ගෙන ස්ථාපිත කර ඇති යන්ත්‍රවලට අමතරව තවත් යන්ත්‍ර 12ක් මිලදී ගැනීමට කැබිනට් මණ්ඩලය අනුමැතිය ලබාදී තිබුණි. ස්ථාපිත කර ඇති යන්ත්‍ර ඌන උපයෝජිතව පැවතියදී තවත් යන්ත්‍ර මිලදී ගැනීම අනාර්ථික වියදමක් බවට පත්වීමට ඉඩ තිබෙන බව නිරීක්ෂණය කෙරේ. | නව යන්ත්‍ර මිලදී ගැනීමට පෙර මිලදී ගත් යන්ත්‍රවලින් අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත්ත ද මෙතෙක් මිලදී ගෙන නොමැති බව වාර්තා කර ඇත. | දඹුල්ල දිගම්පතන සවිකළ යන්ත්‍රය හැර අනෙකුත් සියලු යන්ත්‍ර තවදුරටත් ඌන උපයෝජිතව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| **14.** | අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති 6ක් රු.මිලියන 121.8 ක් වියදම් දැරීමෙන් පසු ඉදිකිරීම් නිම නොකර අත්හැර දමා තිබුණි. | ව්‍යාපෘති නිමකර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | ඉදිකිරීමට අවශ්‍ය පරීක්ෂණ කටයුතු අවසන් නොවීම, ප්‍රතිපාදන වෙන් නොවීම, ඉඩම් නිදහස් නොවීම හා මහජන විරෝධතා හේතුවෙන් අත්හැර දමා ඇති බව වාර්තා කර ඇත.<br>බෙලිඅත්ත නගර සංවර්ධනය සඳහා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ අධිකාරියට ලබා දෙන ලද රු.මිලියන 63ක අත්තිකාරම් මුදල පාලම් ව්‍යාපෘතියේ බදු කුලිය සඳහා හිලව් කිරීමට කටයුතු සිදු කරන බවද වාර්තා කර ඇත. | 2022 පෙබරවාරි 10 දින වන විටත් මේ පිළිබඳ ප්‍රමාණවත් ප්‍රගතියක් වාර්තා නොවීය. |
| **15.** | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ජාතික ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් කම්පැක්ටර් රථ 100 ක් ප්‍රසම්පාදනය කර පළාත් පාලන ආයතන වෙත බෙදා හැරීම සඳහා 2017 අගෝස්තු 14 දින ජාතික පුවත්පත්වල අදාළ ප්‍රසම්පාදන දැන්වීම පළ කර තිබූ අතර එහි 4වන ඡේදයෙහි "මෙම ප්‍රසම්පාදනය ශ්‍රී ලංකාවේ ලංසුකරුවන්ට විවෘත ය. හවුල් ව්‍යාපාරවලට ද අයදුම් කළ හැක." යනුවෙන් ශ්‍රී ලංකා ලංසුකරුවන්ට | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ පළමු පරිච්ඡේදයේ සඳහන් අරමුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2(b) ප්‍රකාරව ලංසු ලේඛන ගාස්තු ගෙවන ඕනෑ ම අයෙකුට ලංසු ලේඛන ලබා ගැනීමට හැකියාවක් ඇති බව පමණක් වාර්තා කර ඇති බව පමණක් වාර්තා කර ඇත. | කම්පැක්ටර් යන්ත්‍ර මිලදී ගෙන පළාත් පාලන ආයතන වෙත බෙදා හැර තිබේ. එකී වාහනවල සේවා සැපයීම සඳහා ගිවිසුමක් ද නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | පමණක් සීමාකර තිබුණි. එහෙත් දේශීය නියෝජිත ආයතනයක් පවා නොමැතිව විදේශ ගමන් බලපත්‍රය සමඟ ඉදිරිපත් වූ චීන ජාතිකයෙකු වෙත ද ලංසුපත් නිකුත් කර තිබුණි. එසේම ලංසු තොරතුරු ලේඛනයේ ද විදේශීය ලංසුකරුවන් පිළිබඳ සඳහන් වී නොතිබුණි. | | | |
| **16.** | ඉහත ප්‍රසම්පාදන සඳහා ලංසු ඉදිරිපත් කළ ලංසුකරුවන් 14 දෙනාගෙන් 04 දෙනෙකු ම කැබිනට් මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන මණ්ඩලය ගෙන තිබූ තීරණයට එරෙහිව අභියාචනා මණ්ඩලය වෙත අභියාචනා ඉදිරිපත් කර තිබුණි. විදේශීය ලංසු කරුවෙකු වීම හේතුවෙන් ලංසුව ප්‍රතික්ෂේප කිරීමට හැකියාව තිබියදී එක්ස්ඉසඩ්වයි හොංකොං (XZY Hong Kong) සමාගම අභියාචන මණ්ඩලයට ඉදිරිපත් කළ කරුණු ගැන පමණක් සලකා ලංසුවට අදාළ සැපයීම් කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණි. | -එම- | කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද කරුණු සැලකිල්ලට ගත් අභියාචනා මණ්ඩලය, අදාළ ආයතනය වෙත කොන්ත්‍රාත්තුව පිරිනමන ලෙස සෘජුව අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කර ඇති බව වාර්තා කර තිබුණද විගණන නිරීක්ෂණයෙන් පෙන්වා දී ඇති අඩු පාඩුව පිළිබද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | -එම- |
| **17.** | ඉහත ප්‍රසම්පාදන සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත ප්‍රසම්පාදන මණ්ඩලය විසින් තාක්ෂණික හා මූල්‍ය පළපුරුද්ද තහවුරු නොවීම හේතු කරගෙන ලංසුව ප්‍රතික්ෂේප කළ බව ලංසුකරු වෙත දන්වා තිබුණද එහිදී දේශීය නියෝජිතයෙකු රහිතව විදේශීය | -එම- | ලංසුව ප්‍රතික්ෂේප වීමට බලපෑ තාක්ෂණික හේතු ලංසුකරු වෙත ලිඛිතව දන්වා යවා ඇති බව වාර්තා කර ඇත. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | සමාගමට ලංසු ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැතිවීම පිළිබඳ සටහන් කර නොතිබුණි. ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව මෙන් ම ප්‍රසම්පාදන මණ්ඩලය ද ලංසුකරුගේ මූලික අඩුපාඩුව මඟහැර තිබුණි. | | | |
| **18.** | අඩුපාඩු සහිතව ඉදිරිපත් වූ ඉහත සඳහන් විදේශීය සමාගමේ ලංසුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඇගයීමට ලක්ව නොමැති බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් වාහන මිල ගණන් තීරණය වීමට හේතු වන නිෂ්පාදිත රට, තාක්ෂණික අංග, කල්පැවැත්ම, සේවාවන් හා අමතර කොටස් ලබා ගැනීමේ හැකියාව, ශක්තිමත් බව, භාවිත කරන්නන්ගේ ආරක්ෂාව හා වාහන සම්බන්ධයෙන් ඇති කීර්ති නාමය මෙන් ම සුන්බුන් අගය කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | -එම- | අදාළ ලංසුකරු මූලික ඇගයීම්වලදී ප්‍රතික්ෂේප වන බැවින්, විස්තරාත්මක ලංසු ඇගයීමක් සඳහා එම ලංසුව ඉදිරියට ගෙනැවීත් නැති බව වාර්තා කර ඇත. | -එම- |
| **19.** | එක්සත් රාජධානිය, නෙදර්ලන්තය ආදී රටවල පෞද්ගලික බැංකුවලින් එකී රටවල අපනයන සංවර්ධනය කිරීමේ ණය ලෙස ලබා දී ඇති ණය මුදල් භාවිතයෙන් ඉදිකෙරෙන පාලම් සඳහා ස්ථාන තෝරා ගැනීම පිළිබඳ විධිමත් ක්‍රමවේදයක් නොපැවති අතර ව්‍යාපෘති කාර්යමණ්ඩලයක් පැවතිය ද ඒකාබද්ධිත විශාල ප්‍රමාණයේ කොන්ත්‍රාත් **(Turn Key)** | විධිමත් පරිදි පාලම් ඉදිකළ යුතු ස්ථාන පිළිබඳව සොයා බැලීම. | නව පාලම් සඳහා ස්ථාන තෝරාගැනීමේ ක්‍රමවේදය නැවත වරක් අධ්‍යයනය කරන ලද බවත් එම ක්‍රමවේදය තුළ නව පාලම් ඉදිකිරීම සඳහා ඵලදායි ස්ථාන හඳුනා ගැනීමට පාදක කරගත යුතු නිර්නායක හා ඒ මත පදනම්ව ඵලදායි ස්ථාන තෝරා | යූරෝ මිලියන 50.67ක වටිනාකමින් පාලම් 200ක් සවි කිරීමේ නව ව්‍යාපෘතියක කටයුතු ආරම්භ කර තිබුණ ද පාලම් ස්ථාන තෝරා ගැනීමේ ක්‍රියාවලිය |

| | | | | |
|---|---|---|---|---|
| | ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය සම්බන්ධව ප්‍රමාණවත් දායකත්වයක් ලැබී නොතිබුණි. | | ගැනීම සඳහා යොදා ගන්නා ශක්‍යතා අධ්‍යයන ක්‍රියාමාර්ගයක් ද අන්තර්ගත බව අධ්‍යයනයේදී අනාවරණය වී ඇති බවත් එම ක්‍රමවේදය තුළින් සෘජු ආර්ථික ප්‍රතිලාභ හෝ සෘජු සමාජයීය ප්‍රතිලාභ ලැබෙන අයුරින් පාලම් ඉදි කළ යුතු ස්ථාන වෙන්කර හඳුනා ගැනීමට ඉඩ සැලසී ඇති බවත් වාර්තා කර තිබුණි. | වැඩිදියුණු කර නැත. |
| **20.** | ගිවිසුම් අනුව පාලම් සවිකළ යුතු ස්ථාන හඳුනාගැනීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් දියත් කර නොතිබුණු අතර පාලම් ස්ථානගත කළ යුතු ස්ථාන තීරණය කිරීමේදී පාලමක් සඳහා වන පිරිවැය හා එම පාලමෙන් ප්‍රයෝජන ගනු ලබන්නන් සංඛ්‍යාව හා අනාගතයේදී සිදුවිය හැකි වර්ධනයන් සලකා ප්‍රමාණවත් පිරිවැය ප්‍රතිලාභ විග්‍රහයකින් පසුව ස්ථාන තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම වසර 100කට වැඩි කාලයක පැවැත්මක් අපේක්ෂාවෙන් සවිකරනු ලැබුව ද පාලමේ කොන්ක්‍රීට් ඉදිකිරීම පිළිබඳ කිසිදු ප්‍රමිති පාලන කටයුත්තක් සිදු කර නොතිබුණි. | කොන්ක්‍රීට් ඉදිකිරීම් පිළිබඳ තත්ත්ව පරීක්ෂණ ක්‍රියාවලියක් අනුගමනය කළ යුතුය. | ඉහත 19 හි සඳහන් කළ පරිදි නව පාලම් ස්ථාන තෝරා ගැනීමේ නිර්ණායක හා ශක්‍යතා අධ්‍යයන අනුසාරයෙන් මූලික පියවර ලෙස ඒකාබද්ධ ස්ථාන පරීක්ෂණයක් තුළින් ස්ථානීය ශක්‍යතාවය අධ්‍යයනයට ලක් කරනු ලබන බව හා මේ සඳහා වූ ඒකාබද්ධ කණ්ඩායමේ සාමාජිකයන් ලෙස පළාත් ව්‍යාපෘති ඉංජිනේරුවරයා ද, කොන්ත්‍රාත් නියෝජිත ආයතනයේ ඉංජිනේරුවරයා ද, ප්‍රජා | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | | මූලිකයෙකු හෝ ස්ථානය යෝජනා කළ පාර්ශවය සහභාගි වන බව වාර්තා කර ඇත. එහිදී ලබාගන්නා නිරීක්ෂණ අනුව එම ස්ථානය නව පාලමක් ඉදිකිරීම සඳහා සුදුසු ද/නුසුදුසු ද යන්න මූලිකව නිර්ණය කරනු ලබන බව දක්වා ඇත. | |
| **21.** | වානේ පාලමක අවශ්‍යතාවයක් නොමැතිව ආයෝජනය කරන ලද මුදලට සාපේක්ෂව ප්‍රතිලාභයක් හිමි නොවන මෙන් ම බෝක්කු ඉදි කළ යුතු ස්ථානවල විශාල ප්‍රමාණයේ පාලම් ඉදිකර ඇති අවස්ථා නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. | ආයෝජනය කරනු ලබන මුදලට සාපේක්ෂව ආර්ථික හා සමාජයීය ප්‍රතිලාභ පිළිබඳ අධ්‍යයනය කර අවශ්‍යතාව මත ස්ථාන තෝරාගත යුතු වීම. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණද වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ගයන් වාර්තා කර නැත. | -එම- |

**22. ප්‍රතිපාදන උපයෝජනය**

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| ශුද්ධ ප්‍රතිපාදනය | 1,294,192,000 | 1,510,550,000 | 728,300,000 | 3,533,042,000 |
| පුනරාවර්තන | | | | |
| - මූලධන | 16,800,203,000 | 18,672,200,000 | 32,678,402,000 | 68,150,805,000 |
| එකතුව | 18,094,395,000 | 20,182,750,000 | 33,406,702,000 | 71,683,847,000 |
| සත්‍ය වියදම් | | | | |
| පුනරාවර්තන | 922,843,827 | 453,357,524 | 705,753,173 | 2,081,954,524 |
| මූලධන | 14,139,638,919 | 7,476,259,180 | 30,339,168,356 | 51,955,066,455 |
| එකතුව | 15,062,482,746 | 7,929,616,704 | 31,044,921,529 | 54,037,020,979 |
| වසර අග ඉතිරිවීම් | | | | |
| පුනරාවර්තන | 371,348,173 | 1,057,192,476 | 22,546,827 | 1,451,087,476 |
| මූලධන | 2,660,564,081 | 11,195,940,820 | 2,339,233,644 | 16,195,738,545 |
| එකතුව | 3,031,912,254 | 12,253,133,296 | 2,361,780,471 | 17,646,826,021 |

## 48. නිපුණතා සංවර්ධන,වෘත්තීය අධ්‍යාපන,පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය - 421**

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - | **2018** | තත්ත්වාගණනය කල මතය |
| | 2019 | ඡේද පමණක් සපයා ඇත. |
| | 2020 | තත්ත්වාගණනය නොකල මතය |

| **වර්ෂය** | **ශීර්ෂය** | **අමාත්‍යාංශයේ නම** |
|---|---|---|
| 2018 | 197 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය |
| 2019 | 104 | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ තරුණ කටයුතු අමාත්‍යාංශය |
| 2020 | 421 | නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය |

| **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|
| 01. වාර්ෂිකව පාසල් පද්ධතිය තුලින් විශ්වවිද්‍යාල ප්‍රවේශය හෝ විධිමත් වෘත්තීය පුහුණුවක් හෝ නොලබන 150,000 ක් පමණ වූ තරුණ ප්‍රජාවට ගැලපෙන පරිදි වෘත්තීය පුහුණු අවස්ථා සඳහා පහසුකම් සම්පාදනය වී නොතිබුණි.<br><br>සමාලෝචිත වර්ෂයට අදාලව විගණනයට ලබා දුන් තොරතුරු අනුව විශ්වවිද්‍යාල හා විද්‍යායතන ඇතුළු ආයතන 367 කින් වෘත්තීය | නව වෘත්තීය පුහුණු අවස්ථා හා අවශ්‍යතා හඳුනාගත යුතු වීම සහ ඒ සඳහා නව පාඨමාලා ඇරඹීම හා පවත්නා පුහුණු ආයතන තවදුරටත් සංවර්ධනය කිරීමට කටයුතු කල යුතු වීම. | පාඨමාලා සඳහා ආයතන වෙත බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය දෙගුණ කිරීමේ කාර්යයට (අඩුම වශයෙන් සියයට 50කින්) ආයතන යොමු කිරීමට කළමණාකරණ කමිටු රැස්වීමේදී තීරණය වූ අතර ඒ අනුව ආයතන ප්‍රධානීන් විසින් සිසුන් බඳවා ගන්නා ප්‍රමාණය වැඩි කර ගැනීමට දැනට කටයුතු කරමින් පවතින බව. | වර්තමානයේ නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතන 19 ක් හා එක් දෙපාර්තමේන්තුවක් තුලින් පුහුණු අවස්ථා සංවර්ධනය හා වෘත්තීය පුහුණුව වැඩි දියුණු කිරීමේ ක්‍රියාමාර්ග රාශියක් |

| | | | | |
|---|---|---|---|---|
| | පුහුණුව සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම් 81,563 ක් විය. එසේම පුහුණු මධ්‍යස්ථාන මගින් පවත්වාගෙන යන පාඨමාලා සඳහා බඳවා ගත හැකි උපරිම සිසුන් ප්‍රමාණය බඳවා ගැනීමට එම ආයතන විසින් ප්‍රමාණවත් පියවර ගෙන ඇති බවත් නිරීක්ෂණය නොවිය. | | | ගෙන ඇතත්, එම ආයතනයන් තුලින් ප්‍රමාණවත් පරිදි පාසැල් මට්ටමේ සිට තරුණ ප්‍රජාව දක්වා මෙම අංශයන් කෙරෙහි යොමු කරවීමේ දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණවත් පරිදි සිදුවී නොමැති බව. |
| 02. | වෘත්තීය පුහුණු ආයතන තුලින් බිහිකරන වෘත්තිකයින් දේශීය සහ විදේශීය රැකියාවන්හි කර්මාන්ත අවශ්‍යතාවයන්ට නොගැලපීම, විවිධ වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ආයතන විසින් හඳුන්වාදී ඇති පාඨමාලා අනුගමනය කරන පුහුණු ක්‍රමවේදයන් එම අවශ්‍යතා සඵල කිරීමට තරම් ප්‍රමාණවත් නොවීම, ප්‍රමුඛ කර්මාන්ත ඉලක්ක කර පාඨමාලා සංවර්ධනය වී නොතිබීම, රැකියා අභිමුඛ පාඨමාලා අවම වීම මෙන්ම කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය නොවීම හේතුවෙන් ශ්‍රම වෙළඳපොලෙහි රැකියා සහ නිපුණතා අතර නොගැලපීමක් ඇතිවීම, | තරුණ, කාන්තා හා ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලද කාණ්ඩ අතර පවතින ඉහත සේවා වියුක්තිය ආර්ථිකයේ දිගින් දිගටම පවතින ගැටළුවක් බවට පත් වී ඇත. මේ හේතුවෙන් ශ්‍රම වෙළඳපොලට ගැලපෙන පරිදි ශ්‍රම බලකායක් බිහි කිරීමට කටයුතු කලයුතු වීම. | Automobile ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය වැඩි දියුණු කිරීම සහ කාන්තා රැකියා ප්‍රවර්ධනය කිරීම සඳහා නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන මගින් පහත සඳහන් නව පාඨමාලා 2 හඳුන්වා දී ඇති අතර කාන්තා රැකියා අවස්ථා වැඩි ක්ෂේත්‍රයන් හඳුනාගෙන නව පාඨමාලාවන් සකස් කිරීමද තවදුරටත් සිදු කරමින් පවතී. වර්තමානයේදී විදේශීය රැකියා අවස්ථා පිළිබඳ වැඩි අවධානය යොමු කරමින් අදාල පියවර ඉටු කිරීමට නියමිත බව හා ඉදිරියේදී ශ්‍රම වෙළඳපොල සඳහා ශ්‍රමිකයන් පිළිගත් සහතික සහිත අයවලුන් | (i) සංචාරක, ඉදිකිරීම්, නිෂ්පාදනය, තොරතුරු තාක්ෂණය සහ සෞඛ්‍ය යන ක්ෂේත්‍ර සඳහා නිපුණතා සභා (Skill Sector Council) පිහිටුවා ඇත. වෘත්තීය පාඨමාලා විෂය මාලාවන් සංවර්ධනය කිරීමේදී ඉහත සභාවල දායකත්වය ලබා ගනු ලැබෙන බව හා ඒ අනුව රැකියා වෙළඳපළ නොගැලපීම වළක්වා ගැනීමට කටයුතු කරමින් සිටින බව. |

| | | | | |
|---|---|---|---|---|
| | කුසලතා නොගැලපීම මෙන්ම රැකියා ඉලක්ක කරගත් පුහුණු පාඨමාලා නොමැතිවීමෙන් රැකියා වෙළඳපලට උචිත ශ්‍රම බලකායක් ඇති කර ගැනීම අපහසු වී ඇත. | | ලෙස උසස් මට්ටමකට ගෙන ඒමට නියමිත බව. | |
| 03. | ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ හා අධ්‍යාපන හැකියාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (KOICA) 2017 වර්ෂයේ ආරම්භ කිරීමට අපේක්ෂා කර තිබුණද ඊට සුදුසු ඉඩමක් අත්පත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | සැලසුම්ගත ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව නිම කිරීම තුලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත යුතු වීම. | 2017 වර්ෂයේ සිට සුදුසු ඉඩම් යෝජනා වී අත්පත් කර ගැනීම් සිදු වුවත් ඇතිවූ විවිධ ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් හා ඉඩම්වල පාරිසරික වාර්තා සතුටුදායක තත්වයේ නොපැවතුණු බව හා මේ වන විට ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) පිහිටි ඉඩමෙන් කොටසක් අත්පත් කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | 2017 වර්ෂයේ සිට වර්තමානය දක්වාම මෙම තත්ත්වය පෙන්වා දී ඇතත් ඊට අදාල අවසන් ශක්‍යතා අධ්‍යයන වාර්තාව (EIA) ලබාගෙන එම ව්‍යාපෘතියෙහි වැඩ කටයුතු ආරම්භ කර නොතිබුණි. |
| 04. | තෘතියික හා අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති වෘත්තීය පුහුණු පාඨාමාලා පවත්වන සියළුම ආයතන 2017 වර්ෂයේ සිට තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කර එහි ගුණාත්මකභාවය සම්බන්ධයෙන් සහතිකයක් කොමිෂන් සභාවෙන් | පාඨමාලාවන්හි ගුණාත්මකභාවය පවත්වා ගැනීමට ආයතන නිසි තත්ත්ව කළමනාකරණයක් පවත්වාගත යුතු වීම. | වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ග වාර්තා නොවේ. | පුහුණු ආයතනයන්හි පවතින සම්පත්වල අඩුපාඩු හේතුවෙන් සියළුම පුහුණු ආයතනයන්හි තත්ව කළමණාකරණ පද්ධති ස්ථාපනය කිරීමේ දුෂ්කරතාවයන් පවතින බව සහ NVQ 05 සහ 06 යන |

| | | | | |
|---|---|---|---|---|
| | ලබාගත යුතු බව නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ 2016 පෙබරවාරි 26 දිනැති MSDVT/SSDP/2016-1 දරන චක්‍රලේඛයෙන් අනිවාර්ය කර තිබුණි. එහෙත් වෘත්තීය පාඨමාලා පවත්වන පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ලියාපදිංචි ආයතන 2740 ක් දිවයින පුරා පිහිටා තිබුණද, 2019 නොවැම්බර් 19 වනවිට ඉන් ආයතන 224 ක් පමණක් තත්ත්ව කළමනාකරණ සහතිකය ලබාගෙන තිබුණි. | | | මට්ටම්වල පාඨමාලා පවත්වන පුහුණු ආයතන තුළ තත්ව කළමණාකරණ පද්ධති ස්ථාපනය කිරීම වර්තමානයේ අනිවාර්ය කර ඇති බව. |
| 05. | 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා NVQ 5, 6 පාඨමාලා සම්පූර්ණ කර පුහුණු ආයතනවලින් බැහැරවන උපාධි මට්ටමේ පාඨමාලා හැදෑරීමට අපේක්ෂිත සිසුන් එකතුව 7099 කින් විශ්වවිද්‍යාලයේ ධාරිතාවය අනුව සිසුන් 1,920 ක් පමණක් බඳවාගෙන තිබුණි. මේ හේතුවෙන් ජාතික වෘත්තීය සුදුසුකම 5, 6 පාඨමාලා හදාරන උපාධි අපේක්ෂිත සිසුන්ට විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව අහිමි වී තිබුණි. | උපාධි මට්ටමේ පාඨමාලා හැදෑරීමට අපේක්ෂිත සිසුන් සියළු දෙනාට ඒ සඳහා අවස්ථාව සැලසෙන පරිදි විශ්වවිද්‍යාල ධාරිතාවය වැඩි කල යුතු වීම. | -එම- | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් ක්ෂේත්‍රයේ අවශ්‍යතාවයට ගැලපෙන නව පාඨමාලා හඳුන්වාදීම හා නව විෂය මාලා පිළියෙල කිරීම සිදු කර ඇතත් වර්තමානයේ එම ඩිප්ලෝමාධාරී සියලුම දෙනාට උපාධි ලබාගැනීමේ අවස්ථාව අහිමි වී ඇති බව. |

| | | | | |
|---|---|---|---|---|
| 06. | විශ්වවිද්‍යාල විද්‍යායතන 6 හි දැනට ජාතික වෘත්තීය සුදුසුකම 5, 6 මට්ටමේ පාඨමාලා 22 ක් පවත්වනු ලබයි. උපාධි මට්ටමේ පාඨමාලා පවත්වනු ලබන වෘත්තිය තාක්ෂණ විශ්වවිද්‍යාලය ඉහත පාඨමාලාවන්ට සමාන්තරව ගොඩනැගිලි සේවා තාක්ෂණය, ආහාර සැකසුම් තාක්ෂණය, සිනමාව හා රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණය, ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලාව, ඉදිකිරීම් තාක්ෂණ පාඨමාලාව, හෝටල් කළමනාකරණ පාඨාමාලාව හා මෙකාට්‍රොනික්ස් පිළිබඳ උපාධි පාඨමාලා 7 ක් පමණක් පවත්වනු ලැබේ. විද්‍යායතනවල පවත්වනු ලබන අනෙකුත් පාඨමාලා 15ක් සඳහා සමාන්තර පාඨමාලා නොමැති වීම හේතුවෙන් එම පාඨමාලා හදාරන සිසුන්ට තමන් හැදෑරූ විෂය ධාරාවෙන් උපාධි මට්ටම දක්වා අධ්‍යාපනය ලබා ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | ජාතික වෘත්තීය සුදුසුකම 5,6 මට්ටමේ පාඨමාලාවන්ට සමාන්තරව උපාධි මට්ටම දක්වා හැදෑරීමට හැකිවන පරිදි වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාඨමාලා ඇති කල යුතු වීම. | -එම- | වර්තමානයේදී විශ්වවිද්‍යාල විද්‍යායතන 06 හි පවතින ජාතික වෘත්තීය සුදුසුකම් 5,6 මට්ටමේ පාඨමාලා සියල්ලම සඳහා ඊට සමාන්තර උපාධි පාඨමාලා පවත්වාගෙන යනු නොලබන බව. |

| | | | | |
|---|---|---|---|---|
| 07. | 2017 ජුනි 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව 2017 – 2019 මධ්‍යකාලීන අයවැය රාමුව යටතේ රු.මි. 434 පිරිවැයක් දරමින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා විශ්වවිද්‍යාල විද්‍යායතනයක් ස්ථාපිත කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී රුපියල් මිලියන 50 ක් වෙන්කර තිබූ අතර එම මුදලින් විශ්වවිද්‍යාලය වටා තාප්පයක් ඉදිකිරීම හා විශ්වවිද්‍යාලය ඉදිකිරීම සඳහා උපදේශනාත්මක සේවා ලබා ගැනීමට සුදුසු ආයතනයක් තෝරා ගැනීම ඇතුළු වියදම් කීපයක් දැරීම සඳහා රු. 5,897,359 ක මුදලක් වියදම් කර තිබුණි. ජාතික වෘත්තීය සුදුසුකම් 5 හා 6 මට්ටම්වල පාඨමාලා ආරම්භ කිරීම සඳහා 2020 වන විට මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 20 ක් | ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු වීම. | -එම- | අවශ්‍ය නීතිමය රාමුව ලැබී තිබුණත්, අවශ්‍ය ප්‍රතිපාදන නොමැතිවීම මත ඉදිකිරීම් කටයුතු නැවතී ඇති බව. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර එම මුදලින් 2019 ඔක්තෝබර් 15 දිනට රු. 3,034,324 ක මුදලක් විද්‍යායතන භූමියේ කාර්යමණ්ඩල නේවාසිකාගාරයක් ඉදිකිරීම හා උපදේශන සේවා සැපයීම සඳහා වැය කර තිබුණි. | | | |
| 08. | 2017 සැප්තැම්බර් 12 පැවති අමාත්‍ය මණ්ඩල තීරණයකට හා 2017 නොවැම්බර් 9 දිනැති MF/NB/CM/2017/202 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලිපිය පරිදි 2017 අයවැය යෝජනා යටතේ මාතර ජාතික වෘත්තීය පුහුණු ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා වෙන්කරන ලද රු.මිලියන 200 උපයෝජනය කර ගනිමින් එහි මූලික ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමටත්, ඉතිරි පිරිවැය නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ ප්‍රතිපාදනවලින් දැරීමේ අපේක්ෂාවෙන් කිලිනොච්චිය ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ සිසුන් 400 දෙනෙකු සඳහා රු. මිලියන 300 ක සමස්ථ පිරිවැයක් යටතේ ශිෂ්‍ය | ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු වීම. | 2017අයවැය යෝජනා යටතේ, 2017සැප්තැම්බර් 12 දින යෝජිත ව්‍යාපෘතියේ නිර්මාණය, කොන්ත්‍රාත් හා ඉදිකිරීමේ කළමනාකරණය සහ ඉදිකිරීම් හා පශ්චාත් ඉදිකිරීම් සුපරීක්ෂණය සඳහා උපදේශකයෙකු තෝරා ගැනීම ප්‍රමාද වූ බව. පසුගිය වර්ෂවලදී 2018 සහ 2019 නිපුණතා ආංශික සංවර්ධන අංශයට වෙන් වූ මූල්‍ය ප්‍රතිපාදන සීමා වීම, අමාත්‍යාංශ නිතර වෙනස් වීම, ප්‍රසම්පාදන කමිටුවට සාමාජිකයින් පත් කිරීම ප්‍රමාද වීම සහ රාජකාරීමය හේතු මත සෞඛ්‍ය කමිටු ප්‍රසම්පාදන සාමාජිකයින් ඉවත් වීම යන හේතූන් නිසාද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වූ බව. | විවිධ වූ හේතු මත මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වී ඇති අතර වර්තමානයේදී රජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර ඇති කරගත් ගිවිසුම් 2022 ජුනි 30 දක්වා දීර්ඝ කිරීමට දෙපාර්ශවයම එකඟ වී ඇති බව. |

| | | | | |
|---|---|---|---|---|
| | නේවාසිකාගාරයක් ඉදිකිරීමට අනුමත කර තිබුණි. 2018 වර්ෂයේ වෙන් කරන ලද මුදලින් උපදේශක සේවා ගාස්තු ගෙවීම සඳහා රු. 6,028,015 ක මුදලක් වියදම් කර තිබුණු අතර, 2019 වර්ෂය සඳහා රු. මිලියන 100 ක මුදලක් වෙන් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම නේවාසිකාගාරය ඉදිකිරීම සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම පමණක් සිදු කර තිබුණි. කෙසේ වුවද, උක්ත නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය 2020 වසරේ අවසන් වීමට නියමිතව පවතී. මෙම තත්ත්වය 2018 වර්ෂයේදීද පෙන්වා දී තිබුණි. | | | |
| 09. | 2010 අප්‍රේල් 29 දිනැති අංක 146 දරන අයවැය චක්‍රලේඛය පරිදි නව අමාත්‍ය මණ්ඩලය පත්වීමට පෙර පැවති අමාත්‍යාංශයන්හි සියළුම අමාත්‍යවරුන්ගේ නියෝජ්‍ය/ අමාත්‍යවරුන්ගේ කාර්යමණ්ඩල වෙත ලබාදී තිබූ සියළු වාහන ආපසු අදාල අමාත්‍යාංශ වෙත ලබාදිය යුතු විය එහෙත් 2017 මැයි මස අමාත්‍ය මණ්ඩල | චක්‍රලේඛයට අනුව කටයුතු කල යුතු වීම. | අමාත්‍ය මණ්ඩල සංශෝධන සමඟ ගරු අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් වෙනුවෙන් වෙන් කරන ලද වාහන ඔවුන් විසින් පත්ව යනු ලබන නව අමාත්‍යාංශ වෙත රැගෙනයාම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගතව ඇති බව. | මේ වන විට වාරි මාර්ග අමාත්‍යාංශය මඟින් එම අමාත්‍යාංශයට රැගෙන ගොස් ඇති රථ සඳහා අදාල පැවරුම් ලේඛන 2021.12.14 දින ලබා දී ඇති අතර පැවරීම් කටයුතු සිදුකරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | සංශෝධනයෙන් පසු අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත ලබාදී අමාත්‍යාංශයේ නමට තිබූ වාහන 01 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අමාත්‍යාංශය වෙත භාරදී නොතිබුණි. | | | අංක CAO – 8445 දරණ රථය සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංකBD/GPS/2017/ Vehicle Remittal (II) හා 2021.11.24 දිනැති ලිපිය මඟින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් වාහනවල කල් බදු වාරික ගෙවා අවසන් වී ඇති බව හා ඒ අනුව පවරා ගන්නා ලෙසත් දන්වා ඇති බව. |
| 10. | 2015 මාර්තු 31 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2015 චක්‍රලේඛය පරිදි මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව වෙනත් ආයතන වෙත මාරු කල නොහැක. එසේ වුවද, එවැනි අනුමැතියකින් තොරව කල්බදු ක්‍රමයට අත්පත් කරගෙන තිබූ වාහනයක් ගරු රාජ්‍ය අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල සංශෝධනයෙන් පසු නව අමාත්‍යාංශ වෙත රැගෙන ගොස් තිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කල යුතු වීම. | ජනාධිපති ලේකම් කාර්යාලයට අයත්ව පැවති රථය එවකට මෙම අමාත්‍යාංශයේ අමාත්‍යවරයා පැමිණීමේදී රැගෙන එන ලද වාහනයක් බව හා අමාත්‍යවරයා අමාත්‍යාංශයෙන් ඉවත්ව යන අවස්ථාවේදී භාවිතා කරනු ලැබූ මෙම වාහනයද අදාල අමාත්‍යාංශය වෙත රැගෙන ගොස් ඇති බව. | ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් අංක KX – 5289 දරන රථය වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය වෙත රැගෙන ගොස් ඇති අතර එය පවරා දෙන ලෙස වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයයේ ලේකම්ගේ අංක MPS/AD/4-1/22-V හා 2017.08.08 දිනැති ලිපියෙන් ජනාධිපති ලේකම් අමතා අංක KX – 5289 දරන රථය වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයට |

පවරා දෙන ලෙස ඉල්ලීමක් සිදු කර ඇත.මෙම රථය සඳහා නිපුණතා සංවර්ධන හා වෘත්තිය පුහුණු අමාත්‍යාංශයට අයත් නොවන බැවින් මෙම රථය පැවරීමට හැකියාවක් නොමැත.තවද මෙම රථයේ පවරා ගැනීම් කටයුතු වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය මඟින් කටයුතු සිදු කරන බව තහවුරු කර ඇත.

අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංකBD/GPS/2017/ Vehicle Remittal (II) හා 2021.11.24 දිනැති ලිපිය මඟින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් වාහනවල කල් බදු වාරික ගෙවා අවසන් වී ඇති බවත් ඒ අනුව පවරා ගන්නා ලෙසත් දන්වා ඇත.ඒ අනුව පැවරුම් කටයුතු සිදු කරමින් පවතින බව. මේ දක්වා මෙම පැවරීම් කටයුතු අවසන් වී නොමැත.

| | | | | |
|---|---|---|---|---|
| 11. | දිවයින පුරා පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අමාත්‍යාංශයේ නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන් 264 ක් අනුයුක්ත කර තිබියදී ණයලාභීන් පිළිබඳ පසුවිපරම් පරීක්ෂණය සඳහා 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව පෞද්ගලික ආයතනයකට රු. 1,730,625 ක් වැයකර තිබුණි. කෙසේ වුවද, තෝරාගත් ණයලාභීන් කිහිපදෙනෙකු සමඟ විගණනය විසින් සිදුකල දුරකථන සංවාද අනුව ණයලාභීන්ගේ ප්‍රගතිය සම්බන්ධයෙන් ප්‍රමාණවත් පසුවිපරමක් සිදුකර නොතිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කලයුතු වීම. | සාර්ථක හා විනිවිදභාවයකින් යුක්තව සමීක්ෂණයක් සිදු කිරීම සඳහා බාහිර ආයතනයකින් සමීක්ෂණය සිදු කිරීමට අමාත්‍යාංශ ලේකම් විසින් උපදෙස් හා අනුමැතිය ලබා දී ඇති බව. එම සමීක්ෂණයෙන් හඳුනාගත් අසතුටුදායක තත්ත්වයන් පිළිබඳ ප්‍රගතිසමාලෝචන රැස්වීමේදී සාකච්ඡා කර ඊට අදාල ප්‍රගතිය සම්බන්ධයෙන් නිරන්තර පසු විපරමට ලක්කර ඇති බව. | ණයලාභීන් පිළිබඳව පසු විපරම් කිරීම සම්බන්ධයෙන් නිපුණතා සංවර්ධන නිලධාරීන් සම්බන්ධ කර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇතත් මේ දක්වා ක්‍රියාත්මක වී නොමැති බව. |
| 12. | පර්යේෂණ හා නව නිපැයුම් අංශයේ සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රගති වාර්තාවට අනුව එකතුව රු. මිලියන 784.36 ක් වූ ව්‍යාපෘති 14 ක් ආරම්භ කර නිම කිරීමට සැලසුම් කර තිබුණද එම ව්‍යාපෘතිවල ප්‍රගතිය සියයට 34 සිට සියයට 89 දක්වා වූ පරාසයක | අපේක්ෂිත ප්‍රගතිය උපරිම මට්ටමින් ලබා ගැනීමට ක්‍රියා කල යුතුවීම. | මෙම ව්‍යාපෘතීන් ව්‍යාපෘති වශයෙන් නොව වැඩසටහන් ලෙස හඳුනා ගත හැකි අතර ඉන් 11 ක් ආයතන වලට ලැබුනු ප්‍රතිපාදන යොදා ගනිමින් ආයතනයේ වාර්ෂික සැලැස්මට අනුව ක්‍රියාත්මක කරන ලද ඒවා වන බව. | කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් හා අවශ්‍ය අරමුදල් නිසි කලට නොලැබීම, නිලධාරී හිඟය, සමහර ව්‍යාපෘති සඳහා වියදම් අධික වීම වැනි හේතු මත මෙවැනි ප්‍රගතියක් පෙන්නුම් නොකරන බව වාර්තා කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | පැවති අතර ප්‍රගතිය සියයට 75 ට වඩා අඩු ව්‍යාපෘතීන් 11 ක් පවතින බව නිරීක්ෂණය විය. | | මේවායේ ප්‍රගතිය අඩු මට්ටමක පැවතීමට විවධ වූ හේතු ගණනාවක් බලපා තිබූ බව. | |
| 13. | 2018 වර්ෂයේ ජනවාරි මාසයේදී ආරම්භ කර එම වර්ෂය අවසාන වනවිට නිම කිරීමට නියමිතව තිබූ රු. මිලියන 80 ක් පිරිවැය වූ Social Innovation Lab ව්‍යාපෘතිය සහ රු. මිලියන 70 ක් පිරිවැය වූ Improving Degraded Soil නම් වූ ව්‍යාපෘතින්හි ප්‍රගතිය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පිළිවෙලින් සියයට 70 ක් සහ සියයට 64 ක් විය. | අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට ක්‍රියා කල යුතුවීම. | මෙම ව්‍යාපෘතිය අවුරුදු කිහිපයක් පුරා සිදු කරන ව්‍යාපෘතියක් වන අතර 2020 වර්ෂයට ඉලක්කය වූයේ 15% ක් වන අතර එයින් 90% ක් එනම් 15% න් 14% සපුරා ගෙන ඇති බව හා ඉතිරිය තවත් වර්ෂ කිහිපයකදී අවසන් කිරීමට සැලසුම් කර ඇති බව. | මෙම ව්‍යාපෘතිය තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇති බව. |
| 14. | මෙම තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා 2015 – 2030 දක්වා කාල පරාසය නම් කරඇති අතර ඒ සම්බන්ධයෙන් 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතේ නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයට අදාල වන අරමුණු කෙරෙහි දෙඅංශය විසින් අවධානය යොමුකර එම අරමුණු හඳුනාගෙන තිබුණ ද ඉෂ්ඨ කරගැනීමට අපේක්ෂා කල | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කල යුතුය. | වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ග වාර්තා නොවේ. | කොවිඩ් තත්ත්වය හමුවේ වුව ද එම අරමුණු ආයතනික ක්‍රියාකාරකම්වල ආයතන ක්‍රියාකාරී සැලැස්ම හරහා බද්ධ කර ඒ තුළින් එම අරමුණු සක්ෂාත් කර ගැනීමට විශේෂ ප්‍රයත්නයක් යොදන ලද බව හා ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන වලදී ඒ පිළිබඳ ව අවධානය යොමු කිරීමට ද කටයුතු |

| | |
|---|---|
| අරමුණු සමාලෝචිත වර්ෂය තුල අපේක්ෂා කල අයුරින්ම ළඟා වී නොමැති බව නිරීක්ෂණය විය. | කරන ලද බව. |

## 15. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2018 | 2019 | 2020 | එකතුව |
|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය - පුනරාවර්තන | 4,636,340,800 | 4,774,020,000 | 6,202,905,000 | 15,613,265,800 |
| - මූලධන | 4,379,172,200 | 4,682,876,000 | 4,659,455,000 | 13,721,503,200 |
| එකතුව | **9,015,513,000** | **9,456,896,000** | **10,862,360,000** | **29,334,769,000** |
| | | | | |
| සත්‍ය වියදම් - පුනරාවර්තන | 4,358,309,079 | 4,621,693,330 | 5,956,656,060 | 14,936,658,469 |
| - මූලධන | 3,315,129,398 | 3,398,538,751 | 4,078,948,582 | 10,792,616,731 |
| එකතුව | **7,673,438,478** | **8,020,232,081** | **10,035,604,642** | **25,729,275,201** |
| | | | | |
| වසර අග ඉතිරි වීම් | | | | |
| - පුනරාවර්තන | 278,031,721 | 152,326,670 | 246,248,940 | 676,607,331 |
| - මූලධන | 1,064,042,801 | 1,284,337,249 | 580,506,418 | 2,928,886,468 |
| එකතුව | **1,342,074,522** | **1,436,663,919** | **826,755,358** | **3,605,493,799** |

## 49. දහම් පාසල් , පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය - 422**

**ප්‍රතිපාදන උපයෝජනය**

| **විස්තරය** | **2022** |
|---|---:|
| | **රු.** |
| ශුද්ධ ප්‍රතිපාදනය - පුනරාවර්තන | 4,393,600,000 |
| - මූලධන | 178,800,000 |
| එකතුව | **4,572,400,000** |
| | |
| සත්‍ය වියදම් - පුනරාවර්තන | 4,367,651,199 |
| - මූලධන | 161,170,104 |
| එකතුව | **4,528,821,303** |
| | |
| වසර අග ඉතිරි වීම් - පුනරාවර්තන | 25,948,801 |
| - මූලධන | 17,629,896 |
| එකතුව | **43,578,697** |

## 50. ඖෂධ නිෂ්පාදන , සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය - 423**

**ප්‍රතිපාදන උපයෝජනය**

| ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | මුළු වියදම | ඉතිරිය |
|---|---|---|---|
| රු. | රු. | රු. | රු. |
| **85,930,000,000** | **85,950,500,000** | **84,261,977,817** | **1,688,522,183** |

## 51. වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 424

මූලාා ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතය:-තත්ත්වාගණනය කළ මතය

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| ---------------------- | --------------------- | ------------------------------ | -------------------- |
| අමාත්‍යාංශයේ පුරප්පාඩු තනතුරු 30 ක් වූ අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 10 ක, තෘතියික මට්ටමේ තනතුරු 04 ක, ද්විතික මට්ටමේ තනතුරු 07 ක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 09 ක පුරප්පාඩු පැවතුණි. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. | අමාත්‍යාංශය සතුව ඇති රාජකාරී ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් නිලධාරීන් පිරිසක් නොමැති බව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. |

## 02. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2020 | එකතුව |
|---|---:|---:|
| | -------- | --------- |
| | | රු. |
| **ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය** | | |
| පුනරාවර්තන වියදම් | 33,953,000 | 33,953,000 |
| මූලධන වියදම් | 7,100,000 | 7,100,000 |
| මුළු වියදම | 41,053,000 | 41,053,000 |
| **ශුද්ධ ප්‍රතිපාදනය** | | |
| පුනරාවර්තන වියදම් | 33,953,000 | 33,953,000 |
| මූලධන වියදම් | 7,100,000 | 7,100,000 |
| මුළු වියදම | 41,053,000 | 41,053,000 |
| **සත්‍ය වියදම** | | |
| පුනරාවර්තන වියදම් | 17,115,784 | 17,115,784 |
| මූලධන වියදම් | 3,166,370 | 3,166,370 |
| මුළු වියදම | 20,282,154 | 20,282,154 |
| **වසර අග ඉතිරි වීම්** | | |
| පුනරාවර්තන වියදම් | 16,837,216 | 16,837,216 |
| මූලධන වියදම් | 3,933,630 | 3,933,630 |
| මුළු වියදම | 20,770,846 | 20,770,846 |
| **ප්‍රමාණාත්මක ආදායම්** | | |
| ඇස්තමේන්තුගත ආදායම | - | - |
| සත්‍ය ආදායම | - | - |

**52. වී හා ධාන්‍ය කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය**

ශීර්ෂය - 425

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - තත්ත්වාගණනය නොකළ (2020)

**ප්‍රතිපාදන උපයෝජනය**

| විස්තරය | | 2020 |
|---|---|---|
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදන - පුනරාවර්තන | | **1,108,700,000** |
| | මූලධන | **3,696,100,000** |
| | | **----------------** |
| | එකතුව | **4,804,800,000** |
| සත්‍ය වියදම් | පුනරාවර්තන | **1,037,515,611** |
| | මූලධන | **3,127,335,269** |
| | | **-----------------** |
| | එකතුව | **4,164,850,880** |
| වසර අග ඉතිරි වීම් | - පුනරාවර්න වියදම් | **71,184,389** |
| | | **568,764,731** |
| මූලධන වියදම් | | **---------------** |
| | එකතුව | **639,949,120** |

## 53. පොහොර නිෂ්පාදන සැපයුම් රසායන පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය -426

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - තත්ත්වාගණනය නොකළ මතය (2020)

| විස්තරය | | 2020<br>රු. |
|---|---|---|
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදන - පුනරාවර්තන | | **38,202,600,000** |
| මූලධන | | **7,000,000** |
| එකතුව | | **38,209,600,000** |
| සත්‍ය වියදම් | - පුනරාවර්තන වියදම් | **36,832,332,595** |
| මූලධන වියදම් | | **5,184,412** |
| එකතුව | | **36,837,517,007** |
| වසර අග ඉතිරි වීම් | - පුනරාවර්න වියදම් | **1,370,267,405** |
| මූලධන වියදම් | | **1,815,588** |
| එකතුව | | **1,372,082,993** |

**54. පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය**

**ශීර්ෂය - 427**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018- තත්ත්වාගණනය කළ මතය

2019 - විගණනය කෘෂිකර්ම අමාත්‍යාංශය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ------------------------ | ------------------- | --------------------------- | -------------- |
| 01. | ධාවන තත්වයේ නොපවතින වාහන 2020.12.31 දිනට පෙර අපහරණය කළ යුතු වුවත් අංක 251- 0747 , JR - 2899 , හා 65-6120 දරන ධාවනයට නුසුදුසු තත්වයේ පවතින වාහන 03 ක් අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල් කර පැවතිණි . | 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 5/ 2020 02 අ) වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. | අංක 251- 0747 දරණ වෑන් රථය අලුත්වැඩියා කිරීම සඳහා 2021 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ අලුත්වැඩියා කිරීමට කටයුතු කරනු ලැබේ. ඉතිරි වාහන 2 අපහරණය කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | වර්තමාන තත්ත්වය නොවෙනස්ව පවතී. |
| 02. | දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරිම වැඩසටහන් යටතේ කාන්තාවන් සවිබල ගැන්වීම තුලින් නිෂ්පාදනය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය සඳහා අයවැය ප්‍රතිපාදන මගින් රු.මි. 3.67 ක් ලැබි තිබුණ ද ඉන් රු.මි. 1.67 ක් එනම් 45.5% වැයකර ඇතත් අත්කරගත් භෞතික ප්‍රගතිය 30% ක් විය | නියමිත කාලවකවානුව තුල ව්‍යාපෘතිය ඉටුකිරීමට හැකි වන අයුරින් සැලසුම් විධිමත් පරිදි සැලසුම් පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටුකිරීමට කටයුතු කළ යතුය. | 2020 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන මඟින් රුපියල් මිලියන 3.70 ක් ලැබී ඇති බව. 2020.12.31 වන විට රුපියල් මිලියන 3.63 ක් වියදම් කර ප්‍රතිලාභීන් 80 ක් සඳහා ප්‍රතිලාභ ලබා දී ඇති බව සහ ඒ අනුව මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය 100% ක් බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| 03. | සූකර කර්මාන්ත සංවර්ධන වැඩසටහන සඳහා අස්තමේන්තුගත කරන ලද රු.මි. 10 ක් සඳහා අයවැය ප්‍රතිපාදන ලෙස රු.මි. 2.44 ලැබී ඇති අතර ඉන් රු.මි. 1.54ක් හෙවත් 63% වැයකර ඇතත් අත්කරගත් භෞතික ප්‍රගතිය 45%බව නිරික්ෂණය විය. | සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර නියමිත කාල රාමුව ඇතුළත ඉටුකිරීමට කටයුතු කළ යුතුය. | Covid 19 තත්වය හේතුවෙන් පළාත් අධ්‍යක්ෂකවරුන් විසින් කළ යුතු මූලික කටයුතු කර ගැනීම සඳහා කාල වේලා නොතිබුණ බැවින් වසරේ මුල් කාර්තුවේ ලබා දුන් ඉලක්ක අනුව රුපියල් මිලියන 1.10 වැය කර ප්‍රතිලාභී ගොවිපොළ 22 ක් පමණක් සම්පූර්ණ කිරීමට හැකි වූ බව. | -එම- |
| 04. | කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළවල් ඇතිකිරිම සඳහා අයවැය ප්‍රතිපාදන ලෙස රු.මි. 2.78ක් ලැබ් ඇති අතර වැය කර ඇති මුදල රු.මි. 3.28 ක් බැවින් ප්‍රතිපාදන ඉක්මවා වැයකර ඇති මුදල රු.මි. 0.5 කි. එසේ වුවද මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කර ඇති රු.මි. 2.6 ක උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොමැති බව නිරික්ෂණය විය. | -එම- | ප්‍රතිපාදන ඉක්මවාගොස් නොමැති බව. | -එම- |
| 05. | අභිජනන ගොවිපොළවල් ස්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ ගොවිපොළවල් ස්ථාපිත කිරීම සඳහා රු.මි. 39.5 ක්ද කාර්යසාධනය මැන බැලීම සඳහා රු.මි. 0.5 ක්ද වශයෙන් ක්‍රියාකාරී සැලැස්ම තුල රු.මි. 40 ක් ඇස්තමේන්තු කර තිබු නමුත් ප්‍රගති වාර්තාවෙහි දක්වා ඇත්තේ | 2020 වර්ෂය සඳහා වෙන් වීතිබූ ප්‍රතිපාදන ප්‍රමාණය මිලියන 40 ක් වුවද පළමු අතුරු සම්මත ගිණුම මගින් වෙන් කර තිබූණේ මිලියන 8.0ක් පමණක් බව. පළමු අතුරු සම්මත ගිණුම | චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධන වාර්තා සකස්කර නොමැත. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන රු.මි. 7.5 ක් ලෙස බැවින් රු.මි. 32.5 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද අයවැය ප්‍රතිපාදන ලෙස රු. මි. 3.23 ක් ලැබී ඇති අතර එම ප්‍රතිපාදන වලින් රු.මි. 1.23 ක් හෙවත් 38% ක් වැයකර අත් කරගත් භෞතික ප්‍රගතිය 25% ක් බව දක්වා ඇතත් එම භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් නොවිණි. | මඟින් මිලියන 8.0 ක මුදලක් වෙනුකරනු ලැබූවද දෙවන අතුරු සම්මත ගිණුමෙන් වෙන්කර තිබුණේ රු.මි. 0.5 ක් හා තුන්වන අතුරු සම්මත ගිණුමෙන් මිලියන 3.25 ක් පමණක් බව. Covid-19 වර්ෂ අවසානයේ මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 5.47 ක් බව. | | |
| 06. | බඩල්ගම නව කිරි සැපයුම් මධ්‍යස්ථාන ස්ථාපිතකිරිම සඳහා රු.මි. 300 ක් ඇස්තමේන්තු කර ඇති අතර ඉන් රු.මි. 262.3 ක් අයවැය ප්‍රතිපාදන මගින් ලැබි ඇතත් වැය කර ඇත්තේ රු.මි. 74.91 ක් බැවින් ප්‍රතිපාදන ඉතිරිවීම් රු.මි. 187.39 හෙවත් 71.44 % ක් බව නිරීක්ෂණය විය | ව්‍යාපෘතිය ඉටුකිරීමට හැකි වන අයුරින් විධිමත් පරිදි සැලසුම් පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටුකිරීමට කටයුතු කළ යුතු වීම | මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් විදෙස් අරමුදල් ප්‍රතිපාදන යටතේ (12) රුපියල් මිලියන 58.60 ක් වියදම්ව ඇති අතර, දේශීය අරමුදල් ප්‍රතිපාදන (17) යටතේ ව්‍යාපෘතියෙහි ආනයනයනට අදාළ බදු මුදල් ගෙවීම සහ දේශීය ඉදි කිරීම් වලට අදාළ බදු (VAT) ගෙවීම් ප්‍රතිපූර්ණය වෙනුවෙන් 2020 වර්ෂය තුළ රුපියල් මිලියන 16.31 ක වියදමක් දරා ඇති බව. උද්ගතවූ Covid 19 වසංගත ඇතිවූ සීමා හේතුවෙන් ව්‍යාපෘතියෙහි ඉදි කිරීම් සහ සවි කිරීම් කටයුතු සීමා කිරීමට සිදු වු බව. | වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවීය. |
| 07. | දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය විසින් 2017 වර්ෂයට අදාළව පිළියෙල කල ක්‍රියාකාරී | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි | මේ වන විට පිටුපස රථගාල සකස් කිරීම හා අපහරණ ටැංකිය සකස් | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | සැලැස්මට අනුව රු.මිලියන 39.5 ක් වටිනා ව්‍යාපෘති 05 ක් අනුමත කර තිබුණද, එම වර්ෂය අවසාන වන විට එකඳු ව්‍යාපෘතියක් හෝ ආරම්භ කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සැලැසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | කිරීමේ කටයුතු අවසන් කර ඇති බව. ආරක්ෂක කැමරා සවි කිරීම, නව වැසිකිලි පද්ධතියක් ඉදි කිරීම, රැස්වීම් ශාලාවේ පඩිපෙළ ඉදි කිරීමේ කටයුතු මෙම වර්ෂය තුළ සිදු කිරීමට නියමිත බව. | |
| 08. | කොළඹ, අම්පාර හා මහනුවර දිස්ත්‍රික්කවල පිහිටි ආර්ථික මධ්‍යස්ථාන 08 ක් පරීක්ෂාවේදී, ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර මධ්‍යස්ථානය ඉදිකරන ස්ථානය නිසිපරිදි හඳුනා නොගැනීමට ඇගයීම් නිර්ණායක සකස් කර ඊට අනුකූලව සුදුසු අයදුම්කරුවන් විනිවිදභාවයෙන් යුතුව තෝරා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් මධ්‍යස්ථාන 06 ක් අරමුණට පටහැනිව ක්‍රියාත්මක වන බවත්, තවත් මධ්‍යස්ථානවල වැඩි කඩකාමර සංඛ්‍යාවක් වසා දමා ඇති බවත් නිරීක්ෂණය විය. | විශේෂ ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ කිරීමට අරමුණු වූ ගොවීන්ගේ කෘෂි නිෂ්පාදන සෘජුව අලෙවිකර ගැනීමටත් තරගකාරී මිලක් නිෂ්පාදකයින් සඳහා ලබා දීමටත් සහ පාරිභෝගිකයින් සඳහා සාධාරණ මිලක් ලබාදීමටත් අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගෙන ආර්ථික මධ්‍යස්ථානයන් සක්‍රීයව පවත්වාගෙන යාමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම කළ යුතු වීම. | අමාත්‍යාංශය සහ කළමනාකරණ භාරයන් සමඟ එක්ව ආර්ථික මධ්‍යස්ථාන සක්‍රියව පවත්වාගෙන යාමට අවශ්‍ය පියවරයන් මේ වන විට ගෙන ඇති බව. | -එම- |
| 09. | සමූපකාර තොග වෙළඳ සංස්ථාව මඟින් දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ රු.මිලියන 42.75 ක් වැය කර ඉදිකර තිබූ වර්ග අඩි 14,536 ක් වූ දෙමහල් බැංකු සංකීර්ණ ගොඩනැගිල්ල වර්ෂ 06 කට ආසන්න කාලයක සිට භාර | වත්කම් කාර්යක්ෂමව උපයෝජනය කිරීමට පියවර ගතයුතුය . | මෙම ගොඩනැගිල්ල විධිමත් පරිදි භාර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | ගැනීම හෝ භාරදීමක් සිදු නොවී අදාළ කාර්යය සඳහා යොදා නොගෙන නිශ්කාර්යව තිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | | | |
| 10. | 2004 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු දියර කිරි ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ කිරි අලෙවි සැල් 1,250 පිහිටුවීමට සැලසුම් කර තිබුණි. 2013 වර්ෂය වන විට ඉන් අලෙවි සැල් 685 ක් පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ අමාත්‍යාංශය විසින් ආරම්භ කර තිබුණි. සක්‍යතා අධ්‍යයනයකින් තොරව ආරම්භ කිරීම හේතුවෙන් මෙම අලෙවි සැල් 147 ක් පමණක් 2018 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාත්මක තත්වයේ පැවතුණි. | කිරි නිෂ්පාදනය වැඩි කිරීමට විශාල වැයක් දැරු නමුත්, දියර කිරි පරිභෝජනය වැඩි කිරීමට අවශ්‍ය මෙම අලෙවිසැල් වැසීයාම අවම කිරීම සඳහා අමාත්‍යාංයේ සෘජු අධීක්ෂණයක් සිදුකළ යුතුවීම. | දියර කිරි පරිභෝජනය වැඩි කිරීම සඳහා ආරම්භ කළ කිරි අලෙවි සැල් වල මුලදී අලෙවිකිරීම සඳහා අවසර දී තිබුනේ දියර කිරි පමණක් වන අතර කිරි අලෙවියෙන් පමණක් ඒවා නඩත්තු කිරීම වූ බව. අනෙකුත් ග්‍රොසරි අයිතමයන් ද අලෙවි කිරීමට අවසර දී අලෙවි සැල් දිගටම පවත්වා ගෙන යාමට අවශ්‍ය පසුබිම සකසන ලද බව. | විවිධ හේතු මත අළෙවිසැල් වැසීගොස් ඇති අතර, අලෙවිසැල් 58 පමනක් ක්‍රියාත්මක වේ |
| 11. | වෙළෙඳපොල මිල ස්ථායිකරණය ඇති කිරීමට මෙන්ම පසු අස්වනු හානිය අවම කිරීම සඳහා පෞද්ගලික අංශය මඟින් කළමනාකරනය කරනු ලබන ශීතාගාර 5ක් ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේදී රු.මිලියන 2,000 ක් හා 2017 වර්ෂයේ රු.මිලියන 500 ක් වශයෙන් ප්‍රතිපාදන වෙන්කර තිබුණි. 2016 වර්ෂයේදී කිසිදු මුදලක් වැය නොකල අතර 2017 වර්ෂය තුල රු.මිලියන 53.4 ක් වැය කර ව්‍යාපෘතියේ මූලික කාර්යයන් ඉටු කළද, නිසි | පිරිවැය අධික ව්‍යාපෘති තාත්වික හා නිවැරදි තොරතුරු මගින් නිවැරදි සක්‍යතා අධ්‍යයන වාර්තා සැකසීමෙන් අනතුරුව ප්‍රතිපාදනවලින් උපරිම ඵලදාවක් ලැබෙන සේ යෙදවීමට අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම යෙදීය යුතු වීම. | එකඟ වන බව වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවීය . |

| | | | | |
|---|---|---|---|---|
| | පරිදි ශාක්‍යතා අධ්‍යයනයක් නොකිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් ඉඩම් නොමැති වීම හේතුවෙන් 2019 අප්‍රේල් මාසය දක්වාම එම ව්‍යාපෘතිය නැවත ආරම්භ කර නොතිබුණි. | | | |
| 12. | 2016 පෙබරවාරි 24 වන දින සිට වසර 03 ක් සඳහා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන විශිෂ්ඨත්ව පුහුණු ප්‍රවේශය සඳහා වූ හවුල්කාරිත්ව එකඟතා ගිවිසුමකට ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් හා නවසීලන්තයේ මහ කොමසාරිස්වරයා විසින් නවසීලන්ත ඩොලර් මිලියන 2.5 ක අරමුදලක් ඇති කිරීම සඳහා අත්සන් කෙරිණි. එම විදේශාධාර ගනුදෙනු විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් මාර්ගයෙන් ඉටු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 හි 2 ඡේදයට අනුව විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් මත විදේශාධාර ගණුදෙනු ගිණුම් තැබීම් සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම සකස් කළ යුතු වේ. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා නොවේ. | -එම- |
| 13. | ශක්‍යතා වාර්තාව අනුව කිරිගවයකුගේ ගැබ් ගැනීමේ ප්‍රතිශතය සෑම වර්ෂයකම සියයට 80 ක් බව පෙන්වා ඇත. නමුත් කෘතිම සිංචනය මඟින් දිවයින තුළ මේ වන විට සිංචන සඵලතාව සියයට 25ක සිට සියයට 30 ක් අතර පරාසයක් විය. | දත්ත පද්ධතියක් සකස් කොට නිසි අධීක්ෂණය කල යුතු වීම. | තොරතුරු නිරවද්‍ය නොවන බව වාර්තා කර ඇත. | -එම- |
| 14. | කිරි නිෂ්පාදනය වැඩි කිරීම මඟින් කිරිපිටි ආනයනය අඩුකිරීමට හා දියර කිරි | කිරි ගවයින් ආනයනය කිරීමට සමගාමීව, දියර කිරි | -එම- | කිරි පිටි ආනයනය 2019 සහ |

| | | | | |
|---|---|---|---|---|
| | පරිභෝජනය වැඩිකිරීමට කිරි ගවයන් ආනයන ව්‍යාපෘතිය යටතේ 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු. මිලියන 6,435 ක විදේශ ණය ලබා ගෙන ගවයින් 9,500 ක් ආනයනය කර පශු සම්පත් මණ්ඩලයට හා අමාත්‍යාංශය යටතේ පෞද්ගලික ගොවීන් වෙත බෙදා හැර තිබුණි. එසේ වුවද, 2011 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 84.02 ක්ව පැවති ආනයනික කිරිපිටි ප්‍රමාණය, ක් 2018 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 99.03ක් දක්වා වැඩිවී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ ඉටුවී නොතිබුණි. | පරිභෝජනය වැඩිකිරීමට හා කිරි පිටි ආනයනය අඩු කිරීමට ප්‍රතිපත්ති සකස් විය යුතු වීම. | | 2020 වර්ෂවලදී පිළිවෙලින් මෙට්‍රික් ටොන් 93.2 ක් හා 97.2 ක් විය. |
| 15. | ව්‍යාපෘතියේ අසාර්ථකත්වය හේතුවෙන් 2018 වර්ෂයේ ආනයනයට නියමිත සතුන් 2500 ක් 2019 අගෝස්තු දක්වාම ආනයනය නැවත්වීමට සිදුවී තිබුණි. මේ තත්ත්වය මත 2018, 2019 හා 2020 වර්ෂවලදී ගෙන්වීමට නියමිත කිරි ගවයින් ප්‍රමාණය පිළිවෙලින් 2,500, ක් 7,500 ක් හා 5,000 ක් සඳහා 2018 මැයි මාසයේදී ගෙවා ඇති අත්තිකාරම් මුදල පිළිවෙලින් රු. මිලියන 291.61 ක්, රු. මිලියන 874.83 ක් හා රු.මිලියන 583.22 ක් ලෙස එකතුව රු.මිලියන 1,749.67 ක් විය. තවද එම මුදල් සඳහා | තිරසාර සංවර්ධනයට අනුගතවීමට පශු සම්පත් ක්ෂේත්‍රයේ විෂය දැනුම සහිත කණ්ඩායමක් මගින් ක්‍රමවත් අධ්‍යයනයක් සිදුකොට දීර්ඝ කාලීන සැලසුම් පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ හෝ අමාත්‍යාංශය යටතේ සකස් කිරීමට කටයුතු කල යුතුය . | ව්‍යාපෘතියට සම්බන්ධ ගොවීන් සහ බාහිර පාර්ශවයන් විසින් තවදුරටත් රජයෙන් සහන ලබා ගැනීමේ අරමුණින් ගෙන යන අනර්ථකාරී උත්සාහයන් නිසා ව්‍යාපෘතිය අසාර්ථක ලෙස පෙන්නුම් කර ඇති බව. නිසි උපදෙස් පරිදි ගොවිපල කළමණාකරණය කරන ගොවිපල අපේක්ෂිත ප්‍රතිඵල ලබා ඇති අතර එකම වර්ගයේ සතුන් විවිධ ගොවිපල වල සාර්ථක අසාර්ථක වීම | ගෙවා ඇති අත්තිකාරම් මෙවනතෙක් නිරවුල් නරගෙන නොතිබුනි |

| | |
|---|---|
| පොලිය සහ විදේශ විනිමය අවප්‍රමාණය වීමේ අලාභය ඉදිරියේදී දැරීමට සිදුවන බව පෙන්වා දෙනු කැමැත්තෙමි. | කළමනාකරණයේ දුර්වලතාවයක් බව පැහැදිලි වන බව. |

16. **ප්‍රතිපාදන උපයෝජනය**

| විස්තරය | 2018 | 2020 | එකතුව |
|---|---|---|---|
| | රු. | රු. | |
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | | | |
| - පුනරාවර්තන | 1,197,910,000 | 369,038,600 | 1,566,948,600 |
| - මූලධන | 5,076,200,000 | 150,561,400 | 5,226,761,400 |
| - මුළු ප්‍රතිපාදන | 6,274,110,000 | 519,600,000 | 6,793,710,000 |
| සත්‍ය වියදම් | | | |
| - පුනරාවර්තන | 783,988,566 | 366,336,918 | 1,150,325,484 |
| - මූලධන | 3,492,092,658 | 148,669,602 | 3,640,762,260 |
| - මුළු වියදම් | 4,276,081,224 | 515,006,520 | 4,791,087,744 |
| වසර අග ඉතිරි වීම් | | | |
| - පුනරාවර්තන | 413,921,434 | 2,701,682 | 416,623,116 |
| - මූලධන | 1,584,107,342 | 1,891,798 | 1,585,999,140 |
| - මුළු ඉතිරිවීම් | 1,998,028,776 | 4,593,480 | 2,002,622,256 |

## 55. මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 428

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2020 - තත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ පියවර | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 06 අනුව තවදුරටත් වාර්තා කළයුතු මූල්‍ය නොවන වත්කම් තිබේ නම් ඒවා නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ තක්සේරු කළ අගයට ගිණුම් ගත කළ යුතු විය. එසේ වුවද 2020 දෙසැම්බර් 18 දින හා 2020 දෙසැම්බර් 22 දින වාරිමාර්ග අමාත්‍යාංශයෙන් ලද වාහන 10 ක් නිසි පරිදි පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කල යුතුය. | වාරිමාර්ග අමාත්‍යාංශයෙන් ලද වාහන 10 න් 09 ක් පවරාගෙන ඇති බව. අනෙක් වාහනය තාවකාලික පදනම මත ලබාදුන් එකකි. පවරාගත් වාහන 09 න් 04 ක් ගිණුම්ගත කර ඇති බව. | ඉතිරි වාහන 05 හි වටිනාකම තක්සේරු කිරීමෙන් පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| 02. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය | අමාත්‍යාංශයට අදාල අනුමත කාර්ය මණ්ඩලය තුළ පුරප්පාඩුව පවතින අභ්‍යන්තර විගණක තනතුර පිළිබඳව කිහිපවරක් රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලිඛිතව දැනුවත් කර ඇති බව, ඒ සඳහා සුදුසු නිලධාරියෙකු පත් කරන ලෙස 2021 ඔක්තෝබර් | 2022 වර්ෂය සඳහා වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ උපදෙස් පිට අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම ආරම්භ |

| | | |
|---|---|---|
| ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 14 දින අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනින් යුත් ලිපියක්ද යොමු කර ඇති බව. | කර ඇති බව හා අවදානම් ලේඛනය සකස් කරමින් පවතින බව. |

## 03. ප්‍රතිපාදන උපයෝජනය

| | | 2020 | එකතුව |
|---|---|---|---|
| | | රු. | රු. |
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | පුනරාවර්තන | 89,502,954 | 89,502,954 |
| | මූලධන | 128,160,425 | 128,160,425 |
| | එකතුව | 217,663,379 | 217,663,379 |
| ශුද්ධ ප්‍රතිපාදනය | පුනරාවර්තන | 89,502,954 | 89,502,954 |
| | මූලධන | 128,160,425 | 128,160,425 |
| | එකතුව | 217,663,379 | 217,663,379 |
| සත්‍ය වියදම් | පුනරාවර්තන | 70,705,216 | 70,705,216 |
| | මූලධන | 115,526,897 | 115,526,897 |
| | එකතුව | 186,232,113 | 186,232,113 |
| වසර අග ඉතිරි වීම් | පුනරාවර්තන | 18,797,737 | 18,797,737 |
| | මූලධන | 12,633,528 | 12,633,528 |
| | එකතුව | 31,431,265 | 31,431,265 |

## 56. ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 429

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2020- තත්වාගණනය කළ මතය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ආයතනය විසින් ගෙන ඇති වැලැක්වීමේ ක්‍රියාමාර්ග | අදාළ ක්‍රියාමාර්ගයන්හි වර්ථමාන තත්ත්වය |
|---|---|---|---|
| 01. **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ** මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මු.රේ 756 ප්‍රකාර භාණ්ඩ සමික්ෂණ වාර්ත ඉදිරිපත් කිරිමට කටයුතු කල යුතුය. | වාර්මාර්ග අමාත්‍යාංශය හා ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ජාවත්ත පරිශ්‍රය තුල එකම ස්ථානයක ස්ථාපිත වී පැවතීම හේතුකොටගෙන රාජ්‍ය අමාත්‍යාංශයේ නව අංශය ස්ථාපිත කිරීමේදී වාරිමාර්ග අමාත්‍යාංශයේ ඉන්වෙන්ටිවලට අයත් භාණ්ඩ හුවමාරු කර ගැනීම හේතුවෙන් 2020 වර්ෂය තුල රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් වෙනවෙනම භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීමට නොහැකිවූ බව සහ ජාවත්ත පරිශ්‍රය තුල පවතින සියලුම භාණ්ඩ වෙනුවෙන් වාරිමාර්ග අමාත්‍යාංශ යටතේ | ප්‍රවර්තන වර්ශයේදි භාණ්ඩ සමික්ෂණය කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | භාණ්ඩ සම්බන්ධයෙන් පවත්නා වාර්තා ඉදිරිපත් කර ඇති බව. තවද 2021 වර්ෂයේදී භාණ්ඩ පවරා ගෙන ස්ථාවර වත්කම් ලේඛන හා ඉන්වෙන්ට් ලේඛන යාවත්කාලීන කර පවත්වා ගෙනයාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | |
| 02. | මුදල් රෙගුලාසි 103(1)(අ) ප්‍රකාරව හදිසි අනතුර සිදු වූ අවස්ථාවේ බලධාරින් වෙත වාර්තා කල යුතු වුව ද වාහනයක් අනතුරට ලක්වී තිබුණ ද එසේ වාර්තා කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය | රාජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්තව කටයුතු කරනු ලබන රියදුරකු විසින් මෙම රථය අනතුරට භාජනය වන අවස්ථාවේදී ධාවනය කර ඇති අතර රජයේ දේපළ පරිහරණය පිළිබඳව අනවබෝධය හේතුකොටගෙන මුදල් රෙගුලාසි 103 ප්‍රකාරව කටයුතු කර නොමැති අතර ඉදිරියේ දී මෙවැනි අවස්ථාවක ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව සියලුම රියදුරන් දැනුවත් කර ඇති බව. | වර්තමාන තත්ත්වය වාර්තා කර නොමැත. |
| 03. | සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රාජ්‍ය අමාත්‍යාංශය විසින් බාහිර පාර්ශවයන්ට අයිති පිරිවැය රු.137,900,000 ක | බාහිර පාර්ශවයට අයත් වත්කම් පවරා | අමාත්‍යාංශයට අයිතිය පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව හා 2021 හා වර්ෂය තුල | අමාත්‍යාංශයට අයිතිය පවරා ගැනීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කර |

| | | | | |
|---|---|---|---|---|
| | මෝටර් වාහන 13 ක් භාවිතා කරමින් පැවති අතර ඒවා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගැණීමට කටයුතු කල යුතු වේ. | ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | නොතිබුණි. |
| 04. | සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලය 70 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 31 ක් විය. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 39 ක් විය. | තනතුරු අවශ්‍යතා සමාලෝචනයට ලක්කර අවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වීම. | අනුමත කාර්යය මණ්ඩලය සම්බන්ධයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාශය වෙතින් ඉල්ලීම් සිදු කළද, වර්ෂය අවසානය වන තෙක්ම නිලධාරීන් අනුයුක්ත නොකරන ලද බව. පවතින පුරප්පාඩු පුරවාදෙන ලෙස රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් කිහිප විටකම ඉල්ලීම් සිදු කර ඇති බව හා පුරප්පාඩු 39ක් පවතින බව. | පුරප්පාඩු තවදුරටත් පවති |

05. **ප්‍රතිපාදන උපයෝජනය**

| විස්තරය | 2020 | එකතුව |
| --- | --- | --- |
| -------- | ------- | --------- |
| | රු. | රු. |
| <u>ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය</u> | | |
| පුනරාවර්ථන | 34,925,000 | 34,925,000 |
| මූලධන | 81,975,000 | 81,975,000 |
| එකතුව | 116,900,000 | 116,900,000 |
| <u>සත්‍ය වියදම</u> | | |
| පුනරාවර්ථන | 15,203,598 | 15,203,598 |
| මූලධන | 61,055,822 | 61,055,822 |
| මුළු | 76,259,420 | 76,259,420 |
| <u>වසර අග ඉතිරිවීම්</u> | | |
| පුනරාවර්ථන | 19,721,402 | 19,721,402 |
| මූලධන ව | 20,919,178 | 20,919,178 |
| මුළු වියදම | 40,640,580 | 40,640,580 |

## 57. ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය - 430**

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - තත්ත්වාගණනය කළ (2020)**

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01. ඉඩම් අමාත්‍යාංශය සතු වාහන 12 ක් මෙම අමාත්‍යාංශයේ භාවිතය සඳහා ලබා දී තිබුණ ද ඒවායේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. කෙසේ වුවද 2021 පෙබරවාරි මස ඉන් වාහන 05 ක් නැවත ඉඩම් අමාත්‍යාංශය වෙතද, වාහන 7ක් පළාත් පාලන හා ස්වදේශීය කටයුතු අමාත්‍යාංශය වෙතද පවරා දී තිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශය සතු වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වේ. | නිරීක්ෂණයන් සමග එකඟ වී තිබුණු අතර වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි. | 2020 අගෝස්තු 09 දිනැති අංක 2187/27 ගැසට් නිවේදනය අනුව ස්ථාපිත කරනු ලැබූ මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යභාරය 2021 පෙබරවාරි 16 දින ඉඩම් අමාත්‍යාංශයට එකතු කිරීම සමගම රාජ්‍ය අමාත්‍යාංශයේ ඒ දක්වා සියලු කටයුතු 2021 මාර්තු 31 දිනට අවසන් කරන ලෙස උපදෙස් ලබාදී තිබුණි. |

## 02. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | | 2020 | එකතුව |
|---|---|---|---|
| | | රු. | රු. |
| ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | - පුනරාවර්තන වියදම් | 46,400,000 | 46,400,000 |
| | - මූලධන වියදම් | 3,300,000 | 3,300,000 |
| | - මුළු වියදම | **49,700,000** | **49,700,000** |
| මු.රෙ.66/69 මාරු කිරීම් | -පුනරාවර්තන වියදම් | (996,000) | (996,000) |
| | - මූලධන වියදම් | 996,000 | 996,000 |
| | - මුළු වියදම | - | - |
| සත්‍ය වියදම | - පුනරාවර්තන වියදම් | 19,693,333 | 19,693,333 |
| | - මූලධන වියදම් | 2,806,915 | 2,806,915 |
| | - මුළු වියදම | **22,500,248** | **22,500,248** |
| වසර අග ඉතිරි වීම් | - පුනරාවර්තන වියදම් | 25,710,667 | 25,710,667 |
| | - මූලධන වියදම් | 1,489,085 | 1,489,085 |
| | - මුළු වියදම | **27,199,752** | **27,199,752** |

## 58. පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 431

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2020 : තත්ත්වාගණනය කල මතය

| විගණන නිර්දේශය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 66 ක් වූ අතර, එයින් 38 ක් පුරප්පාඩුව පැවතුණි. | අත්‍යාවශ්‍යම පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වීම. | අමාත්‍යාංශය අලුතින් ආරම්භ කරන ලද බැවින් 2020 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවති බව, ඉතා කඩිනමින් එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරන බව. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 01. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2020 | එකතුව |
| --- | --- | --- |
| ---------- | ------ | -------- |
| | රු. | රු. |
| ශුද්ධ ප්‍රතිපාදනය - පුනරාවර්තන | 1,081,500,000 | 1,081,500,000 |
| - මූලධන | 1,081,350,000 | 1,081,350,000 |
| | ------------------ | ------------------ |
| එකතුව | 2,162,850,000 | 2,162,850,000 |
| | =========== | =========== |
| සත්‍ය වියදම් - පුනරාවර්තන වියදම් | 1,042,214,510 | 1,042,214,510 |
| - මූලධන වියදම් | 1,010,500,583 | 1,010,500,583 |
| | ------------------ | ------------------ |
| එකතුව | 2,052,715,093 | 2,052,715,093 |
| | =========== | =========== |
| වසර අග ඉතිරි වීම් - පුනරාවර්තන වියදම් | 39,285,490 | 39,285,490 |
| - මූලධන වියදම් | 70,849,417 | 70,849,417 |
| | ---------------- | ---------------- |
| එකතුව | 110,134,907 | 110,134,907 |
| | ========== | ========== |

## 59. උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 432

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - 2020 : තත්ත්වාගණනය නොකළ මතය

| විගණන නිර්දේශය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 73 ක් වූ අතර, එයින් 14 ක් පුරප්පාඩුව පැවතුණි. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවිය යුතුය. | අමාත්‍යාංශය අලුතින් ආරම්භ කරන ලද බැවින් 2020 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවති බව සහ ඉතා කඩිනමින් එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරන බව. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 02. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2020 | එකතුව |
| --- | --- | --- |
| ---------- | ------ | -------- |
| | රු. | රු. |
| ශුද්ධ ප්‍රතිපාදනය - පුනරාවර්තන | 462,000,000 | 462,000,000 |
| - මූලධන | 2,290,841,000 | 2,290,841,000 |
| | | ------------------ |
| එකතුව | 2,752,841,000 | 2,752,841,000 |
| | =========== | =========== |
| සත්‍ය වියදම් - පුනරාවර්තන වියදම් | 410,459,590 | 410,459,590 |
| - මූලධන වියදම් | 2,248,973,755 | 2,248,973,755 |
| | ------------------ | ------------------ |
| එකතුව | 2,659,433,345 | 2,659,433,345 |
| | =========== | =========== |
| වසර අග ඉතිරි වීම් - පුනරාවර්තන වියදම් | 51,540,410 | 51,540,410 |
| - මූලධන වියදම් | 41,867,245 | 41,867,245 |
| | --------------- | --------------- |
| එකතුව | 93,407,655 | 93,407,655 |
| | ========== | ========== |

## 60. ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 433

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - තත්ත්වාගණනය කළ (2020)

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ ක්‍රියාමාර්ගය | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | 2020 වර්ෂයේ සංවර්ධන වැඩ සටහන් ව්‍යාපෘති 11 ක ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,250 ක් විය. එසේ වුව ද, එම ව්‍යාපෘතිවල වියදම රු. මිලියන 723 ක් පමණක් වූයෙන් රු. මිලියන 527 ක් ඉතිරි වී තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයට ඉතිරිය සියයට 42 ක් වී තිබුණි. | මු.රෙ. 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වීම. | කොරෝනා ව්‍යාප්තිය හේතුවෙන් ව්‍යාපෘතිවල අපේක්ෂිත කාර්ය සාධනය ලබා ගැනීමට නොහැකි වූ බව. | වාර්තා කර නොමැත. |
| 02. | වර්ෂය තුල නිරවුල් කළ හැකිව තිබූ හා 2020 වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල වටිනාකම රු. 868,184 ක් වන වියදම් 2020 වර්ෂය අවසානය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදාල ගෙවීම් හිමිකම් ලබන නිලධාරීන් විසින් වවුචර් විධිමත්ව ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙම වර්ෂය තුළ ගෙවීම් සිදු කිරීමට නොහැකි වූ බවට හේතු ලෙස වාර්තා කර ඇතත් එවැනි වැරදි වලක්වා ගැනීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නොතිබුණි. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| 03. | 2020 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා අවස්ථා 04 ක දී විවිධ කාර්යයන් සඳහා නිකුත් කළ රු. 130,988 ක තත්කාර්යය අතුරු අග්‍රිම මුදල් රෙගුලාසි අංක 371 ප්‍රකාරව අදාල කාර්යය අවසන් වූ වහාම නිරවුල් කර නොතිබුණි. | තත්කාර්යය අතුරු අග්‍රිම අදාල කාර්යය අවසන් වූ වහාම නිරවුල් කළ යුතු වීම. | අත්තිකාරම් නියමිත දිනට පියවීමට අදාල නිළධාරීන් දැනුවත් කර ඇති බව. | - එම - |
| 04. | 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6. ඡේදය ප්‍රකාරව 2020 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2021 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුව ද 2021 අප්‍රේල් 30 දින වන විටත් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කළ යුතු වීම. | Covid-19 වෛරස් තත්වය හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණය නියමිත දිනට සිදු නොකළ අතර පසුව සමීක්ෂණය සිදු කර 2021 දෙසැම්බර් 15 දින විගණකාධිපති වෙත භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර ඇති බව. | - එම - |
| 05. | 2009 ජුනි 17 දිනැති අංක 09/2009 (1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍ය කාර්යය මණ්ඩලය තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීම් යන්ත්‍රය මගින් සනාථ කල යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීම් යන්ත්‍රය මගින් සනාථ කල යුතු වීම. | අමාත්‍ය කාර්ය මණ්ඩලයේ පැමිණීම සහ පිටවීම 2009 ජුනි 17 දිනැති චක්‍රෙල්ඛයට අනුව සටහන් කළ යුතු බව දන්වා ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් තුමිය වෙත ලිපියක් යොමු කර ඇති බව. | දෛනික පැමිණීම හා පිටවීම ප්‍රායෝගිකව සටහන් කළ නොහැකි බව අමාත්‍යාංශය වෙත ලිපියකින් දැනුම් දී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 06. | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1. ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශයේ වාහන සඳහා ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව වාහනවල ඉන්ධන පරීක්ෂාවන් සිදු කල යුතු වීම. | ඉදිරියේදී ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට නියමිතව ඇති බව. | ඉන්ධන දහන පරීක්ෂාව සිදු නොකරයි. |
| 07. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2020 වර්ෂය සඳහා අමාත්‍යාංශය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කොට තිබුණ ද, එම චක්‍රලේඛයේ ඡේද අංක 3 ප්‍රකාරව එහි ඇතුළත් විය යුතු ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල විස්තර, අක්මුදල් අවශ්‍යතකා සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වීම. | ඉදිරියේ දී නියමිත පරිදි කටයුතු කරන බව. | වාර්තා කර නැත. |
| 08. | අමාත්‍යාංශය ක්‍රියාත්මක කොට තිබූ හඳුනා නොගත් වකුගඩු රෝගවලට ගොදුරු වූ ප්‍රදේශ සඳහා සුරක්ෂිත පානීය ජලය සැපයීම යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ මහවැව ධර්මාරාම විද්‍යාලයට රු. මිලියන 4ක ප්‍රතිපාදන යොදාගනිමින් නැනෝ | සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටු කළ යුතු වීම හා විගණනයට ඉදිරිපත් කරන තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කර ගත යුතු වීම. | පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් සියළු පාසල් වසර පුරා වසා දැමීම නිසා එම ව්‍යාපෘති දෙක අවලංගු කර ඒ වෙනුවට පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සංගට්ටීකුලම | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | පිල්ටරයක් සපයා සවිකර දීමට සැලසුම් කර තිබූ අතර විගණනයට ඉදිරිපත් කර තිබූ කාර්ය සාධන ප්‍රගති වාර්තාවේ ද එම කාර්යය ඉටුකර ඇති බවට සඳහන් කොට තිබුණි. කෙසේ වෙතත් එම ව්‍යාපෘතිය භෞතිකව සිදු කර නොතිබුණු බව විගණනයේ දී අනාවරණය විය. | | දෙටන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිරිපහදු යන්ත්‍ර දෙකක් ස්ථාපිත කරන ලද බව. | |
| 09. | අමාත්‍යාංශය විසින් ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩි දියුණු කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ මැණික්කඩවර හා පල්ලේගම ග්‍රාමීය ජල සැපයුම් ව්‍යාපෘතිය, පොළොන්නරුව බිංපොකුණුගම ග්‍රාමීය ජල සැපයුම් ව්‍යාපෘතිය සහ මාදොල ඇහැළියගොඩ ප්‍රදේශයේ දිනකට කියුබික් මීටර් 100 ධාරිතාවයෙන් යුත් ජල පිරිපහදු පිරියත සවිකිරීම යන ව්‍යාපෘතින්ගෙන් සහ නිදන්ගත වකුගඩු රෝගයෙන් පීඩාවට පත් ප්‍රදේශවල ජලය ආශ්‍රිතව වැළඳෙන රෝග නිවාරණ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ හබරණ , එප්පාවල හා හම්බන්තොට දක්වා නල | සැලසුම් කළ පරිදි අදාල ව්‍යාපෘති ප්‍රගතිය ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මැණික්කඩවර හා පල්ලේගම ග්‍රාමීය ජල සැපයුම් ව්‍යාපෘති 2022 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට නියමිත බව, බිංපොකුණුගම ග්‍රාමීය ජල සැපයුම් ව්‍යාපෘතිය සහ මාදොල ඇහැළියගොඩ ප්‍රදේශයේ දිනකට කියුබික් මීටර් 100 ධාරිතාවයෙන් යුත් ජල පිරිපහදු පිරියත සවිකිරීම යන ව්‍යාපෘතින් 2021 දෙසැම්බර් 31 වන විට නිම කර ඇති බව. | මැණික්කඩවර හා පල්ලේගම ග්‍රාමීය ජල සැපයුම් ව්‍යාපෘතිය, 2021 දෙසැම්බර් 31 වන විට ජල ටැංකිය, ළිඳ හා පොම්පාගාරය ඉදි කිරීම නිම කර ඇත. සියයට 60 ක ප්‍රගතියක් වාර්තා වේ. බිම් පොකුණුගම ග්‍රාමීය ජල සැපයුම් ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරුට 2021 දෙසැම්බර් 15 දින භාර දී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | එළීම, ග්‍රාමීය ප්‍රදේශ සහ පාසල් සඳහා ප්‍රතිආශ්‍රිත ජල පිරිපහදු උපකරණ සපයා සවි කිරීම, ජලයේ ගුණත්වය පරීක්ෂා කිරීම හා කළමනාකරණය, නුවර දිස්ත්‍රික්කය තුල නැනෝ ෆිල්ටර් 05ක් සැපයීම, සවිකිරීම හා ජනතා අයිතියට පත් කිරීම යන ව්‍යාපෘතින්ගෙන් 2020 වර්ෂය අවසානයට අපේක්ෂිත නිමවුම් මට්ටම ලඟා කර ගැනීමට අමාත්‍යාංශය අපොහසත් වී තිබුණි. | | | |
| 10. | ජාතික ප්‍රජා ජල අභිමානී ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරනු ලැබූ හා 2019 දෙසැම්බර් 31 දිනට අවසන් කළ යුතුව පැවති පිරිවැය රු. මිලියන 1,778 ක් වූ ව්‍යාපෘති 123 කින් පිරිවැය රු. මිලියන 597 ක් වූ ව්‍යාපෘති 35 ක් 2020 වර්ෂය අවසානය වන විටත් නිම කර නොතිබුණි. තව ද, ඒ අතරින් රු. 59,218,151 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත මාතර දිස්ත්‍රික්කයේ පොරම්බකනන්කෙ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ක්‍රියාත්මක කර තිබූ ප්‍රතිභා | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම හා ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් සෘජු අධීක්ෂණයක් සිදු කළ යුතු වීම. | දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර වූ විදුලිය ලබා ගැනීමේ, නල එළීම සඳහා මාර්ග පළුදු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම, ජල ප්‍රභව වෙත ලඟා වීම සඳහා අනුමැතිය ලබා ගැනීම වැනි කාර්යයන් සිදු කර ගැනීම සඳහා අපේක්ෂා කළ කාලයට වඩා වැඩි කාලයක් ගත වීම මේ ප්‍රමාදයට හේතු වූ බව. | වර්තමාන තත්ත්වය වාර්තා කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රජා මූල සංවිධානයේ ව්‍යාපෘති කටයුතුවල 2020 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 40 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | | | |
| 11. | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ 2018, 2019 හා 2020 වර්ෂයන්හීදී ආරම්භ කර තිබූ ව්‍යාපෘති අතරින් 2020 දෙසැම්බර් 31 දිනට වැඩ නිම කළ යුතුව පැවති පිරිවැය රු. 50,483,201 ක් වූ ව්‍යාපෘති 25 ක වැඩ 2020 වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබූ අතර එයින් ව්‍යාපෘති හතරක භෞතික ප්‍රගතිය සියයට 50 ට වඩා පහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | - එම - | - එම - | - එම - |
| 12. | මුන්දලම පිරිපහදු පිරියත ඉදිකිරීම, නල ළිං ඉදිකිරීම සහ මහනුවර, අම්පාර හා මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි පවතින ජල යෝජනා ක්‍රම හයක තත්වය වර්ධනය කිරීම සඳහා 2020 වර්ෂය තුළ රු.මි. 25.4 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද එම ව්‍යාපෘති 2020 වර්ෂය තුල ආරම්භ කිරීමට අමාත්‍යාංශය කටයුතු කර | සැලසුම් කළ ආකාරයට ව්‍යාපෘති ආරම්භ කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම හා ක්‍රියාකිරී සැලැස්ම පිළයෙල කිරීමේදී මූලිකත්වය ලබා දිය යුතු රටේ පවතින අවශ්‍යතා පිළිබඳව අවධානය යොමු කළ යුතු වීම. | පසු කාලීනව සිදු කරන ලද ජංගම සේවාවන්වල දී ලද යෝජනා හදිසි අවශ්‍යතාවයන් ලෙස සලකා ප්‍රමුඛතාවය ලබා දීමේදි වකුගඩු රෝගය අධික ලෙස පැතිරී ඇති ප්‍රදේශ වන අනුරාධපුර , පොළොන්නරුව හා කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි ස්ථාන දහයක නැනෝ පිරිපහදු | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණි. කෙසේ වෙතත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත නොවූ අනුරාධපුරය දිස්ත්‍රික්කය තුල නැනෝ පිල්ටර් 05ක් ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ නැනෝ පිල්ටර් 02ක් හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ නැනෝ පිල්ටර් 03ක් සපයා සවිකිරීම යන ව්‍යාපෘතීන් ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂය තුළ දී සිදු කර තිබුණි. | | යන්ත්‍ර ස්ථාපිත කර සියයට සියයක් අවසන් කරන ලද බව හා එබැවින් මෙම යෝජනා ඉවත් කිරීමට සිදු වූ බව. | |
| 13. | රාජ්‍ය අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන 06 ක් අමාත්‍යාංශය විසින් 2020 වර්ෂය තුල පරිහරණය කර තිබුණි. | වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන පරිහරණය කිරීමේ දී ඒවා විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | දැනට අමාත්‍යාංශය සතුව වාහන 13 ක් පවතී. |
| 14. | එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත්කොට ඇති තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ න්‍යාය පත්‍රය - 2030 ප්‍රකාරව අමාත්‍යාංශය විසින් ළඟාකර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු සහ ඒ සම්බන්ධයෙන් වන ඉලක්ක, අරමුණු ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශයේ කාර්යභාරය | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට අදාල ක්‍රියාමාර්ග ගත යුතු වීම. | - එම - | මේ වන විට තිරසර සංවර්ධන සභා මගින් තිරසර සංවර්ධන 06 වන ඉලක්කය වෙනුවෙන් මාසික ප්‍රගතිය සම්බන්ධීකරණය මෙම අමාත්‍යාංශය මගින් සිදු වෙයි. |

| | | | | |
|---|---|---|---|---|
| | හා සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් යනාදිය හඳුනාගෙන නොතිබුණි. | | | |
| 15. | සෑම සේවක කාණ්ඩයක් යටතේම අනුමත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 63 සිට සියයට 100 දක්වා වූ ඉහළ පරාසයක් ගන්නා බව නිරීක්ෂණය විය. එය අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 77 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. | අවශ්‍ය පරිදි අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීම හෝ අත්‍යවශ්‍ය තනතුරු සඳහා වන පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතු වීම. | - එම - | ජ්‍යෝෂ්ඨ සහ ද්විතියික මට්ටමේ තනතුරු කිහිපයක් සඳහා නිලධාරීන් බඳවාගෙන ඇත. |

## 16. ප්‍රතිපාදන උපයෝජනය

| <u>විස්තරය</u> | **<u>2020</u>** |
|---|---|
| <u>ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය</u> | |
| - පුනරාවර්තන | **33,669,000** |
| - මූලධන | **<u>1,251,331,000</u>** |
| - එකතුව | **<u>1,285,000,000</u>** |
| <u>සත්‍ය වියදම</u> | |
| - පුනරාවර්තන | **21,358,101** |
| - මූලධන | **<u>731,492,982</u>** |
| - එකතුව | **<u>752,851,083</u>** |
| <u>වසර අග ඉතිරිවීම්</u> | |
| - පුනරාවර්තන | **12,310,899** |
| - මූලධන | **<u>519,838,018</u>** |
| - එකතුව | **<u>532,148,917</u>** |

## 61. ගුදම් පහසුකම්, බහාලුම් අංගන,වරාය සැපයුම් පහසුකම් සහ බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 434

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - 2020 -තත්වාගණනය නොකල මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01. | විවිධ රාජ්‍ය ආයතන වලට අයත් වාහන 9 ක් මෙම අමාත්‍යාංශය පරිහරණය සඳහා ලබාගෙන ඇතත් එම වාහනවල අයිතිය මෙතෙක් පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | 2017 දෙසැම්බර් 13 දිනැති පවරා අංක 259/2017 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල බව. | එම වාහන 2 ක් දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කරමින් පැවතීම. වාහන 5 ක් තාවකාලික පදනමෙන් මෙම අමාත්‍යාංශය වෙත පරිහරණය සඳහා ගෙන ඇති බැවින් එසේ අයිතිය පවරා ගැනීමක් සිදු කර නොහැකි බව දැක්වීම. | 2022 පෙබරවාරි 9 දිනට වාහන 3 ක් දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර ඇත. |
| 02. | අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2020 දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරු සංඛ්‍යාව 52 ක් වූ අතර එදිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාව 46 ක් විය. | අමාත්‍යාංශයේ කාර්ය හා කර්තව්‍යය ඉටු කිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වා ගත යුතු බව. | පුරප්පාඩු පවතින තනතුරු සඳහා නිලධාරීන් පත් කරන ලෙස අදාළ අංශ වලට දන්වා ඇත. | 2022 පෙබරවාරි 9 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 32 ක් වී තිබුණි. |
| 03. | අමාත්‍යාංශයේ රු.2,472,680,000 ක් වූ වැය විෂයයන් 18 කට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිය | මු.රෙ.50 හි සඳහන් නියමයන්ට අනුකූලව ඇස්තමේන්තු පිළියෙල කල යුතු බව | ඉතිරි වීම් වල වටිනාකම වූ රු.976,062,195 ක අගයෙන් 98% ක්ම අදාල වන්නේ ජපන් ආධාර යටතේ | ආයතනය විසින් මාසිකව වැය විෂයයන්ට අදාලව ශුද්ධ ප්‍රතිපාදනයන්,ඒවායෙහි |

| | | | | |
|---|---|---|---|---|
| | සියයට 39 ක්, එනම් රු.976,062,195 ක් විය.එම ඉතිරිය, වැය විෂයයන් සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් සියයට 12 සිට සියයට 99 ක් දක්වා වූ පරාසයක් තුල පැවතුණි. | | ක්‍රියාත්මක වූ ත්‍රිකුණාමලය වරායේ වරාය හා නාවික කටයුතු වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතියට අදාල ඉතිරිකිරීම් වේ.එම ප්‍රතිපාදන අවුරා තැබීම් කරන ලෙසට ජාතික අයවැය අධ්‍යක්ෂක ජනරාල් වෙත දන්වා ඇත.කෙසේ නමුත්ඉදිරි වර්ෂවලදී ඉතිරිකිරීම් අවම කර, ලබා දෙන ප්‍රතිපාදන උපයෝජනය කෙරෙන පරිදි කටයුතු කිරීමට අභ්‍යන්තර ක්‍රියාමාර්ග ගෙන ඇත. | ඉතිරිවීම් ආදිය සමාලෝචනයන් සිදුකරමින් ගැටළු නිරාකරණයට කටයුතු කිරීම. |
| 04. | වැය විෂයයන් 11 කට අදාලව රු.70,390,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම වර්ෂය තුල උපයෝජනය කර නොතිබුණි. | මු.රෙ.50 හි සඳහන් නියමයන්ට අනුකූලව ඇස්තමේන්තු පිලියෙල කල යුතු බව | 2021 වර්ෂයේ දී තත්වයන් වලක්වා ගැනීමට අභ්‍යන්තර ක්‍රියාමාර්ග ගෙන ඇත. | ආයතනය විසින් මාසිකව වැය විෂයයන්ට අදාලව ශුද්ධ ප්‍රතිපාදනයන්,ඒවායෙහි ඉතිරිවීම් ආදිය සමාලෝචනයන් සිදුකරමින් ගැටළු නිරාකරණයට කටයුතු කිරීම. |

**05. ප්‍රතිපාදන උපයෝජනය**

| විස්තරය | | 2020 | එකතුව |
|---|---|---|---|
| විගණන මතය | | | |
| ශුද්ධ ප්‍රතිපාදනය | පුනරාවර්තන රු. | 12,440,000 | 12,440,000 |
| | මූලධන රු. | 2,537,460,000 | 2,537,460,000 |
| | එකතුව රු. | 2,549,900,000 | 2,549,900,000 |
| සත්‍ය වියදම | පුනරාවර්තන රු. | 8,791,007 | 8,791,007 |
| | මූලධන රු. | 1,494,444,980 | 1,494,444,980 |
| | එකතුව රු. | 1,503,235,987 | 1,503,235,987 |
| වසර අග ඉතිරිවීම් | පුනරාවර්තන රු. | 3,648,993 | 3,648,993 |
| | මූලධන රු. | 1,043,015,020 | 1,043,015,020 |
| | එකතුව රු. | 1,046,664,013 | 1,046,664,013 |

## 62. ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය - 435**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - තත්තවාගණනය නොකළ මතය
(2020 අගොස්තු 08 දින අමාත්‍යාංශය පිහිටුවා තිබුණි)

| විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැලැක්වීමේ පියවර | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01. අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කර තිබූ පාලම් සංවර්ධන නියමු ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 09ක් වෙනුවෙන් රු. මිලියන 17.97ක් ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වුවද පාලම් ව්‍යාපෘතීන් 06ක් පමණක් රු.මිලියන 5.53ක් වියදම දරා ඉදිකිරීමට ආරම්භ කර තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිවල ප්‍රගතිය සියයට 33 සිට සියයට 41 ක පරාසයක පැවතිනි. | සැලසුම් කල කාලපරිච්ඡේදය තුල ව්‍යාපෘති කඩිනමින් නිම කිරිමට කටයුතු කල යුතුය. | වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ග වාර්තා කර නැත. | 2021 වර්ෂයේදී සැලසුම් කල පරිදි පාලම් සහ මාර්ග ඉදිකිරිම් සිදු කර නොතිබූ අතර ප්‍රගතිය පහල මට්ටමක පැවතුනි. |
| 02. ග්‍රාමීය පාලම් සංවර්ධනය යටතේ 2020 වර්ෂයේදී දිස්ත්‍රික්ක 12 ක ව්‍යාපෘති 53 ක් වෙනුවෙන් රු.මිලියන 813.52 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විට එයින් රු.මිලියන 278.90 ක් හෙවත් සියයට 34 ක් පමණක් වැය කර තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තා | -එම- | -එම- | වර්තමාන තත්ත්වය වාර්තා කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අනුව ග්‍රාමීය පාලම් ව්‍යාපෘති 59 ක් හඳුනාගෙන ඉන් පාලම් 36ක කොන්ත්‍රාත් පමණක් ප්‍රදානය කර තිබුණි. මින් ව්‍යාපෘති 13 ක ප්‍රගතිය සියයට 50 ට අඩු මට්ටමක පැවතුනි. | | | |
| 03. | පාලම් 100 ක් ඉදිකිරීම් ව්‍යාපෘතිය අමාත්‍යාංශය මඟින් සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව වෙත ලබා දී ඒ සඳහා රු.මිලියන 30 ක අත්තිකාරම් මුදලක් 2020 දෙසැම්බර් 31 ගෙවා තිබුණි. 2021 මාර්තු 31 දිනට ඉදිරිපත්කර තිබූ ප්‍රගති වාර්තාව අනුව පාලම් 11 ක් පමණක් වැඩ ඉටුකරමින් පැවතුණි. ඒ සඳහා මුලු අත්තිකාරම් මුදලින් රු. මිලියන 8ක් හෙවත් සියයට 27ක් පමණක් වැයකර තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 4.5ක් තරම් පහල මට්ටමක පැවතුනි. | කොන්ත්‍රාත් කාලය තුල ව්‍යාපෘති නිම කරවා ගැනිම සඳහා අවදානය යොමු කල යුතුය | මෙම ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කල ප්‍රතිපාදන නොලැබුණු නිසා සැලසුම් කල පරිදි ව්‍යාපෘති ආරම්භ කිරිමට නොහැකි වූ බව. 2021 ආරම්භ කරන ලද පාලම් ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය නිර්මාණ හා සංවර්ධන නීතිගත සංස්ථාව වෙත ලබා දුන් අත්තිකාරම් මුදල හිලව් කර ඇති බව. | 2020 වර්ෂයේදී ලබා දී තිබූ රු.මිලියන 30 ද ඇතුලත්ව 2021 වර්ෂයේදී රු.මිලියන 186.6 ක් වැය කර පාලම් 33ක වැඩ නිම කර ඇත. |

**04. ප්‍රතිපාදන උපයෝජනය**

| | | 2020 | එකතුව |
|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන |
| ශුද්ධ ප්‍රතිපාදනය | පුනරාවර්තන වියදම් | 26.53 | 26.53 |
| | මූලධන වියදම් | 6,173.1 | 6,173.1 |
| | එකතුව | **6,199.63** | **6,199.63** |
| තත්‍ය වියදම් | පුනරාවර්තන වියදම් | 15.48 | 15.48 |
| | මූලධන වියදම් | 4,917.22 | 4,917.22 |
| | **එකතුව** | **4,932.70** | **4,932.70** |
| වසර අග ඉතිරිවීම් | පුනරාවර්තන වියදම් | 11.04 | 11.04 |
| | මූලධන වියදම් | 1,259.27 | 1,259.27 |
| | **එකතුව** | **1,270.31** | **1,270.31** |

## 63. වාහන නියාමනය, බස්රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 436

විගණන මතය                                   තත්ත්වාගණනය කළ මතය

**2020 අගෝස්තු 09 දිනැති අංක2187/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ආරම්භ කරන ලදී.**

**පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තරම් නිරීක්ෂණ නොවීය**

**ප්‍රතිපාදන උපයෝජනය**

| විස්තරය | | 2020 | එකතුව |
|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය | පුනරාවර්තන රු. | 12,302,940,000 | 12,302,940,000 |
| | මූලධන රු. | 7,528,810,000 | 7,528,810,000 |
| | එකතුව රු. | 19,831,750,000 | 19,831,750,000 |
| සත්‍ය වියදම | පුනරාවර්තන රු. | 12,130,617,739 | 12,130,617,739 |
| | මූලධන රු. | 1,427,882.189 | 1,427,882.189 |
| | එකතුව රු. | 13,558,499,928 | 13,558,499,928 |
| වසර අග ඉතිරිවීම් | පුනරාවර්තන රු. | 172,322,261 | 172,322,261 |
| | මූලධන රු. | 6,100,927,811 | 6,100,927,811 |
| | එකතුව රු. | 6,273,250,072 | 6,273,250,072 |

## 64. ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ශීර්ෂය - 437

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - තත්ත්වාගණනය නොකළ මතය (2020)

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 01. 2020 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය යටතේ වාහන 11 ක් පැවති නමුත් එම වාහන 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02(ii) ඡේදය ප්‍රකාරව විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන විධිමත්ව පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වීම. | අතපසු වූ රාජකාරී ඉදිරියේදී ක්‍රමානුකූලව යථාවත් කරනු ලබන අතර වාහන පවරා ගැනීම ද ඒ අනුව සිදු කිරීමට අපේක්ෂිත බව. | වාහන විධිමත්ව පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. . |
| 02. මූල්‍ය ප්‍රකාශනයෙහි පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි (සටහන - (i) ) අංක PG 9548 දරන කැබ් රථයෙහි 2020 සැප්තැම්බර් 16 දින සිදු වූ අනතුර පිළිබඳ සිදුවීම වාර්තා කර නොතිබුණි. | අමාත්‍යාංශය විසින් මෙම අනතුර මඟින් සිදු වූ අලාභය ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | කොවිඩ් වසංගත තත්ත්වය මත ප්‍රාරම්භක වාර්තාව ප්‍රමාද වී ඉදිරිපත් කර ඇතත් පූර්ණ වාර්තාව අලුත්වැඩියාව අවසන් වූ වහාම ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව සහ අලාභ තක්සේරුව ගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලබන බව. | මේ දක්වා මෙම අලාභය ගිණුම් ගත කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 03. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) ඡේදය අනුව අමාත්‍යාංශයක ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් එම අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කටයුතු විධිමත්ව සිදු කිරීමට අභ්‍යන්තර විගණකවරයෙකු කඩිනමින් පත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී වැඩ බැලීමේ පදනම මත හෝ අභ්‍යන්තර විගණක තනතුරට නිලධාරියෙකු පත් කර ගැනීමට කටයුතු කරන බව. | අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි. |

## 02. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2020 | එකතුව |
| --- | --- | --- |
| | (රු.) | (රු.) |
| ශුද්ධ ප්‍රතිපාදනය | | |
| - පුනරාවර්තන | 58,774,000 | 58,774,000 |
| - මූලධන | 227,890,000 | 227,890,000 |
| එකතුව | 286,664,000 | 286,664,000 |
| සත්‍ය වියදම් | | |
| - පුනරාවර්තන | 48,537,013 | 48,537,013 |
| - මූලධන | 226,622,288 | 226,622,288 |
| එකතුව | 275,159,302 | 275,159,302 |
| වසර අග ඉතිරිවීම් | | |
| - පුනරාවර්තන | 10,236,987 | 10,236,987 |
| - මූලධන | 1,267,712 | 1,267,712 |
| එකතුව | 11,504,699 | 11,504,699 |

## 65. සමුපකාර සේවා , අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ, රාජ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය - 438**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - තත්ත්වාගණනය කළ මතය (2020)

**<u>ප්‍රතිපාදන උපයෝජනය</u>**

| විස්තරය | 2020 | එකතුව |
|---|---|---|
| ----------- | ------- | ---------- |
| | (රු.) | (රු.) |
| ඇස්තමේන්තු ප්‍රතිපාදනය | | |
| - පුනරාවර්තන | 549,180,000 | 549,180,000 |
| - මූලධන | 11,560,000 | 11,560,000 |
| එකතුව | 560,740,000 | 560,740,000 |
| | | |
| ශුද්ධ ප්‍රතිපාදනය | | |
| - පුනරාවර්තන | 563,180,000 | 563,180,000 |
| - මූලධන | 17,560,000 | 17,560,000 |
| එකතුව | 580,740,000 | 580,740,000 |
| සත්‍ය වියදම | | |
| - පුනරාවර්තන | 547,952,830 | 547,952,830 |
| - මූලධන | 13,997,060 | 13,997,060 |
| එකතුව | 561,949,890 | 561,949,890 |

## 66. බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇගළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය - 439**

මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය - තත්ත්වාගණනය කළ මතය (2020)

**ප්‍රතිපාදන උපයෝජනය**

| විස්තරය | 2020 | එකතුව |
|---|---|---|
| ----------- | ------- | ---------- |
| | (රු.) | (රු.) |
| ඇස්තමේන්තු ප්‍රතිපාදනය | | |
| - පුනරාවර්තන | 31,700,000 | 31,700,000 |
| - මූලධන | 215,680,000 | 215,680,000 |
| එකතුව | 247,380,000 | 247,380,000 |
| ශුද්ධ ප්‍රතිපාදනය | | |
| - පුනරාවර්තන | 31,700,000 | 31,700,000 |
| - මූලධන | 215,680,000 | 215,680,000 |
| එකතුව | 247,380,000 | 247,380,000 |
| සත්‍ය වියදම | | |
| - පුනරාවර්තන | 13,628,290 | 13,628,290 |
| - මූලධන | 206,928,271 | 206,928,271 |
| එකතුව | 220,556,561 | 220,556,561 |
| ඉතිරිය | | |
| පුනරාවර්තන | 18,071,710 | 18,071,710 |
| මූලධන | 8,751,729 | 8,751,729 |
| එකතුව | 26,823,439 | 26,823,439 |

## 67. මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

**ශීර්ෂය - 440**

මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය : 2018, 2019 - 2020 අගොස්තු 09 වන දින ස්ථාපිත කර ඇත.

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණ | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 (මාර්ගෝපදේශය) හි 3.1 වගන්තිය පරිදි අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන ඇමුණුම් ලෙස මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් කල යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලට ඇමුණුම් ලෙස අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන ඇතුලත් කල යුතුවේ. | ඉදිරි වර්ෂ වල එසේ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | 2021 වර්ෂයේදී ගිණුම් සමඟ ඉරිපත් කර ඇත. |
| 2. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 (මාර්ගෝපදේශය) 6 හි 7 (vi) වගන්තිය පරිදි භාණ්ඩාගාර ශේෂය හා අමාත්‍යාංශයේ මුදල් පොතට අනුව භාණ්ඩාගාරයට පියවිය යුතු අගය අතර වෙනස ගැලපීම සඳහා අක්මුදල් ගැලපීම් ගිණුමක් පිළියෙල කර නොතිබුණි. | අක්මුදල් ගැලපීම් ගිණුමක් පිළියෙල කිරීමට කටයුතු කල යුතුවේ. | ඉදිරි වර්ෂ වල එසේ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | 2021 වර්ෂයේ මුදල් සැසඳුම් ප්‍රකාශය ඉදිරිපත් කර ඇත. |
| 3. | පුනරාවර්තන වියදම්<br>------------------------<br>වැඩසටහන් 1 හා වැඩසටහන් 2 යටතේ පුනරාවර්තන වියදම් සඳහා අයවැය ඇස්තමේන්තුගත ශුද්ධ ප්‍රතිපාදනය රු.මි.107.65 ක් වූ අතර ඉන් උපයෝජනය කර | වෙන්කල ප්‍රතිපාදන උපයෝජනය කර අමාත්‍යාංශයේ අරමුණු කාර්යක්ෂමව සාක්ෂාත් කරගැනීමට | දක්වා ඇති සංඛ්‍යාව නිවැරදි වේ. | 2021 වර්ෂයේ පුනරාවර්තන වැය විෂයන් 5 ක හා ප්‍රාග්ධන වැය විෂයන් 3 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 60 ට වඩා |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණේ රු.මි.17.59 ක් පමණකි. මේ අනුව රු.මි.90.06 ක පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 83.66 ක් විය. | කටයුතු කල යුතු වේ. | | ඉතිරි කර තිබුණි. |
| 4. | මූලධන වියදම්<br>-------------------<br>වැඩසටහන් 1 හා 2 යටතේ ප්‍රාග්ධන වියදම් සඳහා අයවැය ඇස්තමේන්තුගත ශුද්ධ ප්‍රතිපාදනය රු.මි. 22.00 ක් වූ අතර තථ්‍ය වියදම රු.මි.9.38 ක් විය. මේ අනුව රු.මි. 12.62 ක්වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණු අතර එය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 57.36 ක් බව නිරීක්ෂණය විය. | වෙන්කල ප්‍රතිපාදන උපයෝජනය කර අමාත්‍යාංශයේ අරමුණු කාර්යක්ෂමව සාක්ෂාත් කරගැනීමට කටයුතු කල යුතු වේ. | දක්වා ඇති සංඛ්‍යාව නිවැරදි වේ | 2021 වර්ෂයේ මූලධන වැය විෂයන් 3 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 60 ට වඩා ඉතිරි කර තිබුණි. |
| 5. | දේපල පිරියත හා උපකරණ<br>-------------------------------<br>භාණ්ඩාගාර සටහන් අනුව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.38,449 ක් වුවද අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ එම ශේෂය රු.80,949 ක් වූයෙන් රු.42,499 ක වෙනසක නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර සටහන් සමඟ ගිණුම්වල දැක්වෙන ශේෂ සසඳා නිවැරදි අගය දැක්වීමට කටයුතු කළ යුතුවීම. | ඉදිරියේදී භාණ්ඩාගාර සටහන් සමඟ අමාත්‍යාංශ ගිණුම් අනුව ශේෂ සසඳා නිවැරදි අගය දැක්වීමට කටයුතු කරන බව දන්වමි. | 2021 ගිණුම්වල නිවැරදි කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| 6. | වැය විෂයයන් 07 කට අදාලව සමාලෝචිත වර්ෂයේ එළඹී තිබුණු බැරකම් රු.787,632 ක් බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | වර්ෂයට අදාලව එළඹී ඇති බැරකම් හා බැදීම් පිළිබඳ ප්‍රකාශය සම්පූර්ණ හා නිවැරදි ලෙස පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. | මේ පිළිබඳව නිශ්චිතව පරීක්ෂා කර පිළිතුරු ලබාදීමට ප්‍රමාණවත් ස්ථිර කාර්ය මණ්ඩල නොමැති වීම. | 2022 වර්ෂයේ බැරකම් නිරවුල් කර ඇත. |
| 7. | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්,එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | තත්ත්වය එලෙසම පවතී. |
| 8. | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කාර්ය මණ්ඩල ලබා නොදීම හේතුවෙන් අභ්‍යන්තර විගණන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී ඇත. | 2021 දෙසැම්බර් අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 9. | ශ්‍රී ලංකාව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ තරඟකාරී ජාත්‍යන්තර මධ්‍යස්ථානය බවට පත් කිරීම උදෙසා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, මගපෙන්වීම තුළින් දේශීය කර්මාන්ත නගා සිටුවීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් පහත කාර්යභාරයන් අමාත්‍යාංශය විසින් ඉටුකල යුතුව තිබුණි.<br>(අ) වටිනාකම එකතු කිරීමෙන් තොරව ඛනිජ සම්පත් අපනයනය කිරීම සීමා කර, වටිනාකම් එකතු කළ ඉහළ අපනයන ආදායමක් ලබා ගත හැකි නිෂ්පාදන බවට පත්කර අපනයනය කිරීම.<br>(ආ) දැනට භූගතව හා සාගර අභ්‍යන්තරයේ ඇතැයි සැලකෙන ඛනිජ සම්පත් නූතන අධිතාක්ෂණය භාවිතයෙන් ගවේෂණය කර රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට යොදා ගැනීම. | නව රාජ්‍ය අමාත්‍යාංශයය යටතේ අරමුණු සාක්ෂාත් කර කර ගැනිම වෙනුවෙන් ප්‍රතිපත්ති හා සැලසුම් පිළියෙල කර කාර්යභාරයන් කාර්යක්ෂමව ඉටු කල යුතුය. | අමාත්‍යාංශයට පැවරී ඇති ප්‍රතිපත්ති සම්පාදනය හා කාර්යයන් ඉටු කිරීමට කටයුතු කර ඇත. එහි ප්‍රගතිය කාර්යසාධන වාර්තාවේ දක්වා ඇත. | 2022 වර්ෂයේ කාර්යභාරයන් ඇතුලත් කර ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ඈ) මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම.<br>(ඇ) ජාතික අයවැය ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.<br>(ඉ) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය යන ව්‍යවස්ථාපිත ආයතනවල විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.<br>මෙම කාර්යභාරයන් ඉටු කිරීම හා ඒ සඳහා වූ ප්‍රතිපත්ති හා සැලසුම් පිළියෙල කිරීම කෙරෙහි අමාත්‍යාංශයේ ප්‍රමාණවත් අවධානයක් මෙතෙක් යොමු වී නොතිබුණි. | | | |
| 10. | 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාලව ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම වර්ෂය ආරම්භ වීමට පෙර පිළියෙල කර ඒ අනුව ක්‍රියාත්මක කළ යුතුවේ. | 2020 වර්ෂයේ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ඇත. එහි පිටපතක් ඉදිරිපත් කර ඇත. | ක්‍රියාකාරි සැලසුම් 2022 වර්ෂයේදී විගණනයට ලබාදෙන ලදි. |

| | | | | |
|---|---|---|---|---|
| 11. | තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගෙන තිබුණද ඒවා ක්‍රියාත්මක කිරීම කෙරෙහි ප්‍රමාණවත් අවධානය යොමුවී නොතිබුණි. | හඳුනාගෙන තිබුණු තිරසාර සංවර්ධන අරමුණු කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු වේ. | හඳුනාගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කෙරේ. | 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුමට ඇතුලත් කර ඇත. |
| 12. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි. | ජාතික විගණන පනතේ විධිවාධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කල යුතුය. | කාර්ය මණ්ඩල ලබා නොදිම හේතුවෙන් අභ්‍යන්තර විගණන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී ඇත. | 2021 දෙසැම්බර් අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ඇත. |
| 13. | සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලය 40 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 6 ක් විය. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 34 ක් විය. | සේවා අවශ්‍යතාව සැලකිල්ලට ගෙන අනුමත කාර්ය මණ්ඩල වල පුරප්පාඩු සම්පූර්ණ කර රාජ්‍ය අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනිම සඳහා කඩිනම් පියවර ගත යුතුය. | තනතුරු, පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස රාජ්‍ය සේවා, පලාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත. බඳවා ගැනිම් පරිපාටිය අනුමැතියට ඉදිරිපත් කර එහි සංශෝධන ඉදිරිපත් කෙරෙමින් පවතී. | තත්ත්වය එලෙසම පවතී. |

## 14. ප්‍රතිපාදන උපයෝජනය

| විස්තරය | 2020 | එකතුව |
|---|---|---|
| විගණන මතය | | |
| ශුද්ධ ප්‍රතිපාදනය - පුනරාවර්තන | 107,650,000 | 107,650,000 |
| - මූල්‍ය | 22,000,000 | 22,000,000 |
| එකතුව | 129,650,000 | 129,650,000 |
| | | |
| සත්‍ය වියදම් - පුනරාවර්තන | 90,067,999 | 90,067,999 |
| -මූල්‍ය | 9,376,040 | 9,376,040 |
| එකතුව | 99,444,039 | 99,444,039 |
| | | |
| වසර අග ඉතිරි වීම් - පුනරාවර්තන | 17,582,001 | 17,582,001 |
| - මූල්‍ය | 12,623,960 | 12,623,960 |
| එකතුව | 30,205,961 | 30,205,961 |